# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

(පළමුවන කාණ්ඩය)

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

(පළමුවන කාණ්ඩය)

අමරදාස රත්නපාල

තායිවානයේ තායිපේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ ප්‍රධාන අනුශාසක, තායිවානයේ තායිපේ ශ්‍රී රතනජෝති ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති, තායිවානයේ ප්‍රධාන සංඝනායක රත්මලාන ශ්‍රී විජයාරාමවාසි, බණ්ඩාරගම විදාගම ධර්ම චක්‍ර ළමා පදනමේ සහ ලියෙන් සිං ළදරු පාසලේ නිර්මාතෘ, ත්‍රිපිටකවේදී ධර්ම කීර්ති ශ්‍රී බෝදාගම චන්ද්‍රිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි, මෙම දහම් පොත තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලදි.

**ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම**
**විදාගම,**
**බණ්ඩාරගම**


Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org


**This book is strictly for free distribution, it is not to be sold.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

# පෙරවදන

අභිධර්මයෙහි එන්නේ පරමාර්ථ ධර්ම සතරෙකි. සත්ත්ව-සන්තානයෙහි පහළ වන තාක් සිත් **චිත්ත පරමාර්ථ** වශයෙනුත් හැම සිත්හි ලැබිය හැකි තාක් හොඳ නොහොඳ ගුණ විශෙෂයන් **චෛතසික පරමාර්ථ** වශයෙනුත්, මේ චිත්ත චෛතසික නම්වූ නාම ධර්මයනට ආධාර වූ ශරීරයෙහි ලැබිය හැකි තාක් ද්‍රව්‍ය සමූහය **රූප පරමාර්ථ** වශයෙනුත්, මේ නාමරූප හෙවත් පංචස්කන්ධ සංඛ්‍යාත සත්ත්වයාම පිළිබඳ වුවත් චිත්ත චෛතසිකයන් හා සම්ප්‍රයෝග ලක්ෂණයෙන්වත්, රූපයන් හා කලාප බන්ධන වශයෙන්වත් කිසි-කලෙකත් නොබැඳෙන බැවින් ඒකාන්ත කෙවල (තනි) ධර්මයක් වූ ද, සොවාන් ආදී සතර මඟින් දක්නාතෙක් ප්‍රත්‍යක්ෂයෙන් නොපෙනෙතත් නිත්‍යව නොවෙනස්ව පවත්නා වූ නිර්වාණ ධර්මය **නිර්වාණ පරමාර්ථ** වශයෙනුත් අභිධර්මයෙහි අඳුන්වාදී ඇත. අභි-ධර්මපිටකයට අයත් සප්තප්‍රකරණයෙහි ම එන්නේ මේ සතර පර-මාර්ථ පිළිබඳ විස්තර ය.

ආභිධර්මිකයන්ගේ ආදර ගෞරවාදරයට බඳුන් වූ **අභිධර්මාර්ථ සංග්‍රහය** නම්වූ ග්‍රන්ථරත්නයට දිඹුලාගල මහා කස්සප සඟරජ මාහිමි-පාණන් ගේ ශිෂ්‍ය සාගරමතී සාරිපුත්ත ස්වාමීන්ද්‍රයන් විසින් ඉතා ව්‍යක්ත ලෙස සැපැයුණු සන්නයක් ඇත. මේ හැර මේ ග්‍රන්ථය සඳහා ලියැවුණු ටීකා සන්න හා පරිවාර ග්‍රන්ථයෝ ද බොහෝ වෙති.

උගතුන්ගේ සිතැදගත් මේ අභිධර්මාර්ථ සංග්‍රහය ම අනුව යමින් **අමරදාස රත්නපාල දෙස්තර මහත්මා** විසින් මහත් වෑයෙමකින් සපයා ඇති මේ **අභිධර්මාර්ථ ප්‍රදීපිකා** නම්වූ ග්‍රන්ථයෙහි අභිධර්ම කාරණා ඉතා විසිතුරුවත්, විසදවත් ලියා ඇති බව කිය යුතුය.

කාණ්ඩ සතරෙකින් හා දෙදහසකට අධික පිටු ගණනකින් යුතුව මෙතරම් විස්තර විභාග සහිතව ලියැවුණු මේ සා විශාල අනෙක් අභිධර්ම ග්‍රන්ථයක් මෙතෙක් මේ රටෙහි ලියැවී නැතිසේ ය.

නවීනයනට මෙන් ම ප්‍රවීනයනට ද මේ ග්‍රන්ථය බෙහෙවින් උපකාර වනුවා පමණක් නොව මෙය ජනකාන්ත ද වනුවා ඇත. වෛද්‍යවෘත්තියෙහි යෙදෙන ගමනේ මෙබඳු වටිනා ග්‍රන්ථයක් ලියා බෞද්ධ ධර්ම සාහිත්‍ය පොෂණය කිරීම ගැන කවුරුනුත් රත්නපාල මහතාට කෘතඥ විය යුතු බව කියනු කැමැත්තෙමි.

**පියදස්සී ස්ථවිර.**

1964 ජූලි 8 වෙනිද
බම්බලපිටියේ
වජිරාරාමයේ දී ය.

# හැඳින්වීම

අභිධර්මාර්ථ ප්‍රදීපිකා නම් වූ මේ පොත අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් සම්පාදනය කරන ලද්දකි. අභිධර්ම පිටකයට අයත් සප්තප්‍රකරණයන්හි ඇතුළු වූ ධර්මාර්ථයන් පිඩුකොට ත්‍රිපිටකධර අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිත **අභිධර්මාර්ථ සංග්‍රහය** නම් ග්‍රන්ථය බොහෝ කලෙක සිට අභිධර්මය උගන්නවුනට මහෝපකාරී විය. බුදුරජාණන් වහන්සේ විසින් දෙසිත ත්‍රිපිටක ධර්මයෙහි සඳහන් වන ධර්මාර්ථයන් මනාව වටහාගැනීමට පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනීමක්වත් තිබිය යුතුය. මෝහයෙන් මඩනා ලද පුහුදුන් සිත් සතන් මිථ්‍යාමත වලින් මුදවා පිරිසුදු සම්‍යග් දෘෂ්ටියෙහි යොදවා ගැනීම ධර්මඥානයෙන්ම කළ යුත්තකි. කුසලාකුසල ධර්මයන් හැඳින එහි ඉෂ්ටා'නිෂ්ට විපාකයන් දැනගැනීමටත් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මාවබෝධය පිණිස වැඩිය යුතු සමථ විදර්ශනා භාවනානුයෝගයටත් ඉවහල්වන ධර්ම සමූහය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ඇතුළත් වේ. එබැවින් ධර්මය ඉගෙනීමෙහි කැමැත්ත ඇති, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් තියුණු කර ගැනීමට උත්සාහ දරන සත්පුරුෂයන් හට අභිධර්මාර්ථ සංග්‍රහය වැනි අන් ග්‍රන්ථයක් නැතැයි කිව යුතුය.

පෙර ධර්ම විනයධර උතුමන් විසින් ඉතා ගෞරවයෙන් ආචාර්‍ය්‍ය පරම්පරානුගත විධි නොයික්මවා තම සිසුන් පිරිසුදු ශීලයෙහි පිහිටුවා ධර්මඥානය ලබාදීමෙන් පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ශාසනය රැකගත් බව ශාසන ඉතිහාසයෙන් හෙළිවේ. පසු කලෙක විදෙශයෙන් පැමිණි අන්‍ය ලබ්ධිකයන්ගේ නපුරු බලපෑම් නිසාත් වෙනත් නොයෙක් අවහිරකම නිසාත් පිරිහෙන්නට ගිය මේ සසුන, කලින් කල පහළවූ ගිහි පැවිදි උතුමන්ගේ උත්සාහයෙන්, අතුරු දහන් වන්නට ඉඩ නොදී රැකගත් හෙයින් අදත් සැදැහැතියන්හට දහම් ඉගෙනීමටත් පිළිවෙත් පිරීමටත් ඉඩ ඇත්තේමය. නුවණත්, ශ්‍රද්ධාවත්, උත්සාහයත් ඇතොත් භික්ෂූන් වහන්සේට දහම් ඉගෙන පිළිවෙත් පිරීමට එතරම් අවහිරයක් නම් නැත. එහෙත් එවැනි භාග්‍යයක් නැතිව නොයෙක් දුෂ්කරතා මධ්‍යයෙහි රැකීරක්ෂා ගේ දොර වැඩ කටයුතු ආදියෙහි යෙදී සිටින සැදැහැවත් ගිහි පින්වතුන්හට වරින් වර නොයෙක් මාතෘකායෙන් කැරෙන ධර්ම දේශනා හැර පිළිවෙලින් ධර්මය

ඉගෙනීමට ක්‍රමයක් නැති හෙයින් පින්පව් හැඳින ගැනීමට පවා නොහැකිව ඔවුන් ශ්‍රද්ධාදි ගුණයන්ගෙන් පිරිහෙමින් ලෝකයේ නන් දෙසින් ගලා එන මිථ්‍යා මතවලට ඇබ්බැහි වෙමින් ධර්මයට පිටුපායන්නා සේ පෙනෙන්නට ඇත.

භාග්‍යයකට මෙන් මෑතෙක සිට ධර්මධර ස්වාමීන් වහන්සේලා සහ උගත් ගිහි උතුමන් විසින්ද ධර්මය උගන්නවුන්ගේ ප්‍රයෝජනය පිණිස හෙළ බසින් දහම් පත් පොත් මුද්‍රණය කරවා පළකර හැරීමත් ධර්ම පංක්ති පැවැත්වීමත් නිසා ගිහි පින්වතුන්හට ධර්මය උගෙනීමට මගක් සැලසී ඇතිබව සඳහන් කළ යුතුය.

මෙයට දසවසකට පමණ පෙර කොළඹ තරුණ බෞද්ධ සමිතියේ එවකට ප්‍රධාන ලේකම් ධූරය දැරූ සී. ටී. පෙරේරා මහත්මාටද ධර්ම පංක්තියක් ඇරඹීමේ ආවශ්‍යකතාවය වැටහී අපට ආරාධනා කෙළෙන් වර්ෂ 1954 ක් වූ මැයි මස 3 වන දින කොළඹ තරුණ බෞද්ධ සමිති ශාලාවේදී **"පරමාර්ථ ධර්ම පංක්තිය"** නමින් ධර්ම පංක්තියක් අරඹා එතැන් සිට අද වන තෙක් නොකඩවා සති පතා එම ධර්ම පංක්ති පවත්වාගෙන යමි. අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් එහි ඇතුළු ධර්මයන් හැකිතාක් ලිහිල් බසින් විස්තර කරදීමේ ප්‍රතිඵලයක් වශ-යෙන් ඒ ඒ ධර්ම කොටස් එම ආකාරයෙන්ම මුද්‍රණය කොට පළකළ-හොත් ලක්දිව නොයෙක් පළාත්වල සිටින පින්වතුනටද ඉන් මහත්සේ එල ලැබිය හැකි බව බොහෝ දෙනාගේ අදහස වූයෙන් එම පාඩම් මුද්‍රණය කොට ධර්ම දනයක් වශයෙන් නොමිළයේ බෙද හැරීමට සී. ටී. පෙරේරා මහත්මාම ඉදිරිපත් විය. කටයුතු අධික දුෂ්කර කාලයක් වූයේ වී නමුත් බොහෝ දෙනාට වන ධර්ම ලාභය සළකා ධර්ම පත්‍රිකා ලියා දීමට භාර ගෙන අවකාශ ඇති පරිදි එය කර දුනිමි. සුළු වශයෙන් කිරීමට අදහස් කළ කටයුත්ත විස්තර ඇතිව ධර්මය උගෙනීමට කැමති පින්වතුන් ඇති බව දැන ගන්නට ලැබුන හෙයින් අපට ඇති අනවකාශයත් ප්‍රකාශක භවතුන්හට දරන්නට සිදු-වන වියදමත් නොසලකා ධර්ම ලාභයම සළකා පිටු දෙදහසකට අධික ප්‍රමාණයක් ලියා මුද්‍රණය කරවා නොමිළයේ බෙද හරින්නට හැකි විය. මේ පත්‍රිකා පිළිවෙලින් මුද්‍රණය කරවා බෙද හරින්නට සී. ටී. පෙරේරා මහත්මා දැරූ උත්සාහයත් වියදම් කළ ප්‍රමාණයත් බොහෝය. මේ ධර්ම දනමය පුණ්‍ය කර්මයෙහි ඇති වැදගත් කම

වටහාගත් වෙනත් සැදැහැවතුන් විසින්ද නොයෙක් වර මුදල් පරිත්‍යාග කිරීම් ආදියෙන් ඒ මහත්මාට අනුබල දුන් බවද සතුටින් හඳහන් කළ යුතුය. පිටු 500 කින් පමණ යුත් අවසාන පරිච්ඡේදය කොළඹ තරුණ බෞද්ධ සමිතියේ පාලක මණ්ඩලය භාර ගෙන ඒ සමිතියේ වියදමින් මුද්‍රණය කරවා දීම මේ සත් කෘත්‍යයට විශෙෂ රුකුලක් විය.

වර්ෂ 1959 දී ආරම්භ කළ **''පරමාර්ථ ධර්ම පත්‍රිකා''** සියල්ල මුද්‍රණය කිරීමත් බෙද හැරීමත් පුරා අවුරුදු සතරක් මුළුල්ලේම සිදු විය. එක් වරකට මුද්‍රණය කළ හැකි වූයේ පත්‍රිකා සීමා සහිත ප්‍රමාණයක් බැවින් පසුව මේ ධර්මය උගන්නට අදහස් කළ පින්වතුන්හට මුල් පරිච්ඡේද ලබා ගැනීමට නොහැකි වූයෙන් නැවතත් මුද්‍රණය කරවා දෙන ලෙස නොයෙක් පළාත්වලින් ආරාධනා ලදිමි. එහෙයිනි මේ පොත මෙසේ මුද්‍රණය කරන්නට සිදු වූයේ.

අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් එහි එන ධර්මයන් පිළිබඳ විස්තර විවරණයක් මෙහි ඇතුළත් කළ හෙයින් මේ පොතට **''අභිධර්මාර්ථප්‍රදීපිකා''** යන නම යෙදුවෙමි. අභිධර්මාර්ථ සංග්‍රහ පාලියත්, එහි භාවයත් ඒ ඒ පරිච්ඡේද වලට මුලින් යොද ඇත. කාණ්ඩ සතරක් හැටියට පළ වන මේ ග්‍රන්ථයෙහි පළමු කාණ්ඩයෙහි **චිත්ත සංග්‍රහවිභාග** නම් වූ ප්‍රථම පරිච්ඡේදය ද, **චෛතසික සංග්‍රහ විභාග** නම් වූ ද්වීතීය පරිච්ඡේදය ද, **ප්‍රකීර්ණක සංග්‍රහ විභාග** නම් වූ තෘතිය පරිච්ඡේදයද, **වීථි සංග්‍රහ විභාග** නම් වූ චතුර්ථ පරිච්ඡේදය ද, **වීථිමුක්ත සංග්‍රහ විභාග** නම් වූ පඤ්චම පරිච්ඡේදය ද, ඇතුළත් වේ. දෙවන කාණ්ඩයෙහි **රූප සංග්‍රහ විභාග** නම් වූ ෂට්ඨම පරිච්ඡේදය, සහ **සමුච්චය සංග්‍රහ විභාග** නම් වූ සප්තම පරිච්ඡේදය ද, තුන්වන කාණ්ඩයෙහි **ප්‍රත්‍යය සංග්‍රහ විභාග** නම් වූ අෂ්ටම පරිච්ඡේදය ද, සතරවන කාණ්ඩයෙහි **කර්මස්ථාන විභාග** නම් වූ නවවන පරිච්ඡේද යද ඇතුළත් වේ.

මේ පොත ලිවීමේදී **විශුද්ධි මාර්ගය, අත්ථසාලිනී** නම් වූ දම් **සඟුණු අටුවාව, විභංග අටුවාව** ආදී අභිධර්මග්‍රන්ථ උපයෝගී කර ගත් බව සඳහන් කරනු කැමැත්තෙමු.

විශෙෂයෙන් පාලි භාෂාවෙහි වැඩි දැනීමක් නැති පින්වතුන්ගේ ප්‍රයෝජනය සලකා මේ ධර්ම විවරණය හැකිතාක් ලිහිල් බසින් ලියා ඇති බවත් පෙළ අටුවාවන්හි එන පාලි පාඨ මෙහි නොයෙදූ බවත් සළකනු මැනවි.

මේ පොත හදරන භවතුනට අභිධර්මය පිළිබඳ යම් කිසි දැනීමක් ඇති කර ගත හැකි වූයේ නම් එයම අපගේ වැයමෙහි ප්‍රතිඵලයක් හැටියට සලකමි.

මෙබඳු ග්‍රන්ථයක් ලියන්නට තරම් අවශ්‍ය මූලික ශාස්ත්‍ර ඥානයත්, ධර්ම ඥානයත් ජීවිතයේ මුල් අවධියේ ම මට ලබා දුන් මා ගුරුදෙව් **දන්ගෙදර සිරි සරණපාල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ** සහ ධර්ම සාකච්ඡාදියෙන් මට පිහිට වූ **පැළෑණේ සිරි වජිරඤාණ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත්** නමස්කාර පූර්ව කෘතඥතායෙන් සිහි කොට පින් දෙමි. එසේ ම නැසීගිය මා දෙමාපිය ගුරුවරාදීන්ටද මෙහි පින් අනුමෝදන් කරමි.

පෙර වදනක් ලියා දෙමින් මට අනුග්‍රහ කළ වජිරාරාමවාසී **පියදස්සි** හිමිපාණන්ට ද, සෝදුපත් බලා දුන් පින්වතුන්ට හා ප්‍රකාශක භවතුන්ට ද කෘතඥ වෙමි.

**සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!**

**අමරදස රත්නපාල.**

# පටුන

## ප්‍රථම පරිච්ඡේදය


| | |
|---|---|
| අ: ස: පෙළ ... ... ... ... ... | 1 |
| භාවය ... ... ... ... ... | 6 |
| පරමාර්ථ ධර්ම සතර ... ... ... | 17 |
| චිත්ත සංග්‍රහ විභාගය ... ... ... | 19 |
| සිතේ ප්‍රභෙද ... ... ... ... | 25 |
| කාමාවචර සිත් ... ... ... ... | 30 |
| අකුසල් සිත් දෙළොස ... ... ... | 31 |
| අහේතුක සිත් අටළොස ... ... ... | 43 |
| කාමා: සොභන සිත් සූවිස්ස ... ... | 58 |
| රූපාවචර සිත් පසළොස ... ... ... | 70 |
| අරූපාවචර සිත් දෙළොස ... ... ... | 83 |
| ලොකොත්තර සිත් අට ... ... ... | 90 |
| ,, සිත් සතළිස ... ... ... | 105 |


## ද්විතීය පරිච්ඡේදය


| | |
|---|---|
| අ: ස: පෙළ ... ... ... ... ... | 108 |
| භාවය ... ... ... ... ... | 115 |
| චෛතසික සංග්‍රහ විභාගය ... ... ... | 122 |
| අඤ්ඤසමානචෛතසිකරාසිය ... ... | 125 |
| අකුසල චෛතසික රාශිය ... ... | 138 |
| සොභන චෛතසිකරාශිය ... ... | 154 |
| චෛතසිකයන්ගේ සම්ප්‍රයොග නය ... ... | 182 |
| නියතා'නියත යොගී චෛතසිකයෝ ... ... | 192 |
| චෛතසිකයන්ගේ සංග්‍රහ නය ... ... ... | 193 |
| ලොකො: සිත් සතළිසේ සංග්‍රහනය ... ... | 193 |
| මහග්ගත සිත් සත්විස්සේ සංග්‍රහනය ... | 196 |
| කාමා: සො: සිත් සූවිස්සේ ,, ... ... | 198 |
| අකුසල් සිත් දෙළොසේ ,, ... ... | 205 |
| අහේතුක සිත් අටළොසේ ,, ... ... | 208 |

## තෘතීය පරිච්ඡේදය


| | |
|---|---|
| අ: ස: පෙළ ... ... ... ... ... | 217 |
| භාවය ... ... ... ... ... | 223 |
| ප්‍රකීර්ණක සංග්‍රහ විභාගය ... ... ... | 230 |
| වේදනා සංග්‍රහය ... ... ... | 231 |
| හේතු ,, ... ... ... ... | 235 |
| කෘත්‍ය ,, ... ... ... ... | 240 |
| ද්වාර ,, ... ... ... ... | 255 |
| ආරම්මණ ,, ... ... ... ... | 266 |
| වස්තු ,, ... ... ... ... | 285 |


## චතුර්ථ පරිච්ඡේදය


| | |
|---|---|
| අ: ස: පෙළ ... ... ... ... ... | 291 |
| භාවය ... ... ... ... ... | 297 |
| වීථි සංග්‍රහ විභාගය ... ... ... ... | 304 |
| පඤ්චද්වාර චිත්ත වීථි ... ... ... | 305 |
| අතිමහන්තාරම්මණ වීථිය ... ... | 315 |
| මහන්තාරම්මණ වීථි ... ... ... | 317 |
| පරිත්තාරම්මණ වීථි ... ... ... | 319 |
| අතිපරිත්තාරම්මණ වීථි ... ... ... | 321 |
| මනොද්වාර චිත්ත වීථි ... ... ... | 323 |
| කාම ජවන වීථි ... ... ... | 324 |
| නිද්‍රාව හා ස්වප්න ... ... ... | 331 |
| අර්පණා ජවන වීථි ... ... ... | 331 |
| මාර්ග චිත්ත වීථි ... ... ... | 339 |
| අභිඥා වීථි ... ... ... ... | 353 |
| ඵල සමාපත්ති වීථි ... ... ... | 362 |
| නිරොධ සමාපත්තිය ... ... ... | 363 |
| අර්පණා නියමය ... ... ... ... | 369 |
| විපාක නියමය ... ... ... ... | 373 |
| තදරම්මණ නියමය ... ... ... ... | 375 |
| ජවන නියමය ... ... ... ... | 379 |

මරණාසන්න වීථි ... ... ... ... 381
පුද්ගල භේදය ... ... ... ... 389
ඒ ඒ පුද්ගලයන්ට ලැබෙන සිත් ... ... 391
භූමි භේදය ... ... ... ... 397

## පඤ්චම පරිච්ඡේදය

අ: ස: පෙළ ... ... ... ... ... 401
භාවය ... ... ,.. ... ... 409
වීථි මුක්ත සංග්‍රහය ... ... ... ... 419
භූමි චතුෂ්කය ... ... ... ... 419
අපාය භූමි ... ... ... ... 419
කාම සුගති භූමි ... ... ... ... 425
රූපාවචර භූමි ... ... ... ... 432
අරූපාවචර භූමි ... ... ... ... 447
ප්‍රතිසන්ධි චතුෂ්කය 450
අපාය ප්‍රතිසන්ධිය ... ... ... ... 450
කාම සුගති ප්‍රතිසන්ධිය ... ... ... 451
රූපාවචර ප්‍රතිසන්ධිය ... ... ... 452
අරූපාවචර ප්‍රතිසන්ධිය ... ... ... 452
කර්ම චතුෂ්කය ... ... ... ... 453
(කෘත්‍ය භේදයෙන්) ජනක කර්මය ... ... 454
... ... උපත්ථම්භක කර්මය ... 455
... ... උපපීළක කර්මය ... ... 457
... ... උපඝාතක කර්මය ... ... 457
(විපාකාදන ක්‍රමයෙන්) ගරුක කර්මය ... ... 459
... ... ...ආසන්න කර්මය ... 463
... ... ...ආචීර්ණ කර්මය ... ... 466
... ... ...කටත්තා කර්මය ... 466
(විපාක දෙන කාලක්‍රමයෙන්) දිට්ඨධම්මවේදනීය කර්මය 467
... ... ... උපපජ්ජ වේදනීය කර්මය 472
... ... ... අපරාපරියවේදනීය කර්මය 473
... ... ... අහෝසි කර්මය ... 475
අකුසල කර්ම ... ... ... ... 475

| | |
|---|---|
| අකුසල කාය කර්ම ... ... ... | 476 |
| අකුසල වචී කර්ම ... ... ... | 481 |
| අකුසල මනො කර්ම ... ... ... | 485 |
| කාමාවචර කුසල කර්ම ... ... ... | 498 |
| රූපාවචර කුසල කර්ම ... ... ... | 513 |
| අරූපාවචර කුසල කර්ම ... ... ... | 513 |
| (විපාක දන ස්ථාන භෙදයෙන්) අකුසල කර්ම ... | 517 |
| ... ... ...කාමාවචර කුසලකර්ම ... | 518 |
| ... ... ...රූපාවචර කුසල කර්ම ... | 521 |
| ... ... ...අරූපාවචර කුසල කර්ම ... | 524 |
| චුති ප්‍රතිසන්ධි ක්‍රමය ... ... ... | 525 |
| ආයුක්ෂය මරණය ... ... ... | 525 |
| කර්මක්ෂය මරණය ... ... ... | 526 |
| උභයක්ෂය මරණය ... ... ... | 527 |
| උපච්ඡෙදක මරණය ... ... ... | 527 |
| මරණාසන්නයෙහි ලැබෙන අරමුණු ... ... | 529 |

# අභිධම්මත්ථ සඞ්ගහො

## පඨමො පරිච්ඡෙදො

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

1. සම්මා සම්බුද්ධ මතුලං—සසද්ධම්ම ගණුත්තමං
අභිවාදිය භාසිස්සං – අභිධම්මත්ථ සඞ්ගහං

2. තත්ථ වුත්තාභිධම්මත්ථා – චතුධා පරමත්ථතො
චිත්තං චෙතසිකංරූපං – නිබ්බානමිති සබ්බථා.

3. තත්ථ චිත්තං තාව චතුබ්බිධං හොති. කාමාවචරං, රූපාවචරං, අරූපාවචරං, ලොකුත්තරං චෙති.

4. තත්ථ කතමං කාමාවචරං? සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකංති ඉමානි අට්ඨපි ලොභසහගත චිත්තානි නාම.

5. දොමනස්ස සහගතං පටිඝසම්පයුත්තං අසංඛාරික මෙකං සසංඛාරික මෙකංති ඉමානි ද්වෙපි පටිඝසම්පයුත්ත චිත්තානිනාම,

6. උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්තමෙකං, උපෙක්ඛා සහගතං උද්ධච්ච සම්පයුත්තමෙකංති ඉමානි ද්වෙපි මොමූහ චිත්තානි නාම.

7. ඉච්චෙවං සබ්බථාපිද්වාදස අකුසල චිත්තානි සමත්තානි.

8. අට්ඨධා ලොභමූලානි – දොසමූලානිචද්විධා
මොහමූලානි චද්වෙති – ද්වාදසාකුසලාසියුං

A

9. උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සොතවිඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, දුක්ඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනචිත්තං, උපෙක්ඛාසහගතං සන්තීරණ චිත්තං චේති ඉමානි සත්තපි අකුසලවිපාක චිත්තානි නාම.

10. උපෙක්ඛාසහගතං කුසලවිපාකං චක්ඛුවිඤ්ඤාණං, තථා සොතවි ඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, සුඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛා සහගතං සම්පටිච්ඡන චිත්තං, සොම නස්සසහගතං සන්තීරණ චිත්තං, උපෙක්ඛා සහගතං සන්තීරණ චිත්තඤ්චෙති ඉමානි අට්ඨපි කුසලවිපාකාහෙතුක චිත්තානි නාම.

11. උපෙක්ඛා සහගතං පඤ්චද්වාරාවජ්ජන චිත්තං තථා මනොද් වාරාවජ්ජන චිත්තං, සොමනස්ස සහගතං හසිතුප්පාද චිත්තඤ්චෙති ඉමානි තීණිපි අහෙතුක කිරිය චිත්තානි නාම.

12. ඉච්චේවං සබ්බථාපි අට්ඨාරස අහෙතුක චිත්තානි සමත් තානි.

13. සත්තාකුසලපාකානි – පුඤ්ඤපාකානි අට්ඨධා
ක්‍රියා චිත්තානි තීණීති – අට්ඨාරස අහෙතුකා.

14. පාපාහෙතුක මුත්තානි – සොභනානීති වුච්චරෙ
එකූනසට්ඨිචිත්තානි – අථෙක නවුතීපිවා

15. සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරික මේකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්ප යුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරික මෙකංති ඉමානි අට්ඨපි කාමාං වචර කුසල චිත්තානි නාම.

16. සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛා- රික මෙකං සසංඛාරික මෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං

අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්ප යුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකංති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර විපාක චිත්තානි නාම.

17. සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරික මෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණ විප්පයුත්තං අසඞ්ඛාරික මෙකං, සසඞ්ඛාරික මෙකංති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර කිරිය චිත්තානි නාම.

18. ඉච්චෙවං සබ්බථාපි චතුවීසති සහෙතුක කාමාවචර කුසල විපාක කිරිය චිත්තානි සමත්තානි.

19. වෙදනා ඤාණ සඞ්ඛාර – භෙදෙන චතුවීසති,
සහෙතු කාමාවචර – පුඤ්ඤපාක ක්‍රියා මතා.

20. කාමෙතෙවීස පාකානි – පුඤ්ඤාපුඤ්ඤානි වීසති
එකාදස ක්‍රියා චෙති – චතුපඤ්ඤාස සබ්බථා.

21. විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන කුසල චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන කුසල චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන කුසල චිත්තං, සුඛෙකග්ගතාසහිතං චතුත්ථජ්ඣාන කුසල චිත්තං, උපෙක්ඛෙකග්ගතාසහිතං පඤ්චමජ්ඣාන කුසල චිත්තඤ්චෙති ඉමානි පඤ්චපි රූපාවචර කුසල චිත්තානි නාම

22. විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන විපාක චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන විපාක චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන විපාක චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන විපාක චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන විපාකං චිත්තං චෙති ඉමානි පඤ්චපි රූපාවචර විපාක චිත්තානි නාම.

23. විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන කිරිය චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන කිරිය චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන කිරිය චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන කිරිය චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කිරිය චිත්තං චෙති ඉමානි පඤ්චපි රූපාවචර කිරිය චිත්තානි නාම.

24. ඉච්චෙවං සබ්බථාපි පණ්ණරස රූපාවචර කුසල විපාක කිරිය චිත්තානි සමත්තානි.

25. පඤ්චධාඣාන භෙදෙන - රූපාවචර මානසං
පුඤ්ඤපාක ක්‍රියා භෙද – තං පඤ්චදසධා භවෙ.

26. ආකාසානඤ්චායතන කුසල චිත්තං, විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තං, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තං, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර කුසල චිත්තානි නාම.

27. ආකාසානඤ්චායතන විපාක චිත්තං, විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තං, ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තං, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාක චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර විපාක චිත්තානි නාම.

28. ආකාසානඤ්චායතන කිරිය චිත්තං, විඤ්ඤාණඤ්චායතන කිරිය චිත්තං, ආකිඤ්චඤ්ඤායතන කිරිය චිත්තං නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කිරිය චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර කිරිය චිත්තානි නාම.

29. ඉච්චෙවං සබ්බථාපිද්වාදස අරූපාවචර කුසලවිපාක කිරිය චිත්තානි සමත්තානි.

30. ආරම්මණප්පභෙදෙන – චතුධාරූප්පමානසං
පුඤ්ඤපාකක්‍රියා භෙද – පුනද්වාදසධායිතං

31. සොතාපත්තිමග්ග චිත්තං, සකදාගාමි මග්ග චිත්තං, අනාගාමිමග්ග චිත්තං, අරහත්තමග්ග චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි ලොකුත්තර කුසල චිත්තානි නාම.

32. සොතාපත්ති ඵල චිත්තං, සකදාගාමිඵල චිත්තං, අනාගාමි ඵල චිත්තං, අරහත්ත ඵල චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි ලොකුත්තර විපාක චිත්තානි නාම.

33. ඉච්චෙවං සබ්බථාපි අට්ඨ ලොකුත්තර කුසල විපාක චිත්තානි සමත්තානි.

34. චතුමග්ගප්පභෙදෙන – චතුධා කුසලංතථා,
පාකං තස්ස ඵලත්තාති – අට්ඨධානුත්තරං මතං.

35. ද්වාදසා කුසලා නෙවං – කුසලානෙකවීසති
ඡත්තිං සෙව විපාකානි – ක්‍රියා චිත්තානි වීසති.

36. චතුපඤ්ඤාසධා කාමෙ – රූපෙපණ්ණරසීරයෙ.
චිත්තානිද්වාදසාරූපෙ – අට්ඨධානුත්තරෙ තථා

37. ඉත්ථ මෙකූනනවුති – ප්පභෙදං පන මානසං
එකවීස සතංවාථ – විභජන්ති විචක්ඛණා.

38. කථමෙකූනනවුතිවිධං චිත්තං එකවීස සතං හොති, විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තඤ්චෙති ඉමානි පඤ්චපි සොතාපත්ති මග්ග චිත්තානි නාම.

39. තථා සකදාගාමි මග්ග, අනාගාමිමග්ග, අරහත්තමග්ග චිත්තඤ්චෙති සමවීසති මග්ග චිත්තානි, තථාඵලචිත්තානිචෙති සමචත්තාළිස ලොකුත්තර චිත්තානි භවන්ති ති.

40. ඣානඞ්ග යොග භෙදෙන – කත්වෙකෙකන්තු පඤ්චධා
වුච්චතා නුත්තරං චිත්තං – චත්තාළීස විධං'ති ච.

41. යථාච රූපාවචරං – ගය්හතානුත්තරං තථා,
පඨමාදිඣාන භෙදෙ – ආරුප්පඤ්චා පි පඤ්චමෙ
එකාදස විධංතස්මා – පඨමාදික මීරිතං
ඣාන මෙකෙක මන්තෙතු – තෙවිසති විධංභවෙ.

42. සත්තතිංස විධං පුඤ්ඤං – ද්විපඤ්ඤාසවිධං තථා,
පාකමිච්චාහු චිත්තානි – එකවීස සතං බුධා, ති

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ චිත්ත සඞ්ගහ විභාගො නාම
පඨමො පරිච්ඡෙදෙ.

---

# අභිධර්මාර්ථ සංග්‍රහය

## ප්‍රථම පරිච්ඡේදය

**(භාවය)**

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

1. සද්ධර්මය හා ආර්‍ය්‍ය සඞ්ඝයා සහිත අතුලයවූ සම්මා සම්බුදුන් වහන්සේ වෙසෙසින් නමස්කාර කොට අභිධර්මාර්ත්ථ සංග්‍රහ නම්වූ ග්‍රන්ථය කියමි.

2. අභිධර්මදෙශනායෙහි සර්වප්‍රකාරයෙන් වදළ අභිධර්මාර්ත්ථයෝ , චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යයි පරමාර්ථ වශයෙන් චතුර්විධ වෙ.

3. එයින් චිත්තය තෙම, කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලෝකුත්තර යයි සතර වැදෑරුම් වේ.

4. එහි කාමාවචර චිත්තය කවරේද? සොමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්තය එකකි, සසඞ්ඛාරික චිත්තය එකකි, සොමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්තය එකකි. සසඞ්ඛාරික චිත්තය එකකි, උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්තය එකකි, සසඞ්ඛාරික චිත්තය එකකි, උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්තය එකක්, සසඞ්ඛාරික චිත්තය එකකි. මේ අට දෙන ද ලොභ සහගත චිත්තයෝ නම් වෙත්.

5. දෙමනස්ස සහගත පටිඝසම්ප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්තය එකකි, සසඞ්ඛාරික චිත්තය එකකි, මේ දෙදෙන ද පටිඝ සම්ප්‍රයුක්ත චිත්තයෝ නම් වෙත්.

6. උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත එකකි, උපෙක්ඛා සහගත උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත එකකි. මේ දෙදෙනද මෝමූහ චිත්තයෝ නම් වෙත්.

7. මෙසේ සර්වප්‍රකාරයෙන් දෙළොස් අකුසල චිත්තයෝ සමාප්තයහ.

8. ලොභමූල සිත් අටය, දෙසමූල සිත් දෙකය, මොහ මූල සිත් දෙකයයි අකුසල් සිත් දෙළොසෙක් වෙත්.

9. උපෙක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණයද, එසේම සොත විඤ්ඤාණය ද, ඝාණ විඤ්ඤාණය ද, ජිව්හා විඤ්ඤාණය ද, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය ද, උපෙක්ඛා සහගත සම්පටිච්ඡන චිත්තයද, උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයද, යන මේ සත් දෙන අකුසල විපාක චිත්තයෝ නම් වෙත්.

10. උපෙක්ඛාසහගත කුසලවිපාක චක්ඛුවිඤ්ඤාණය ද, එසේම සොත විඤ්ඤාණය ද, ඝාණ විඤ්ඤාණය ද, ජිව්හා විඤ්ඤාණය ද, සුඛසහගත කාවිඤ්ඤාණය ද, උපෙක්ඛා සහගත සම්පටිච්ඡන

චිත්තයද, සොමනස්ස සහගත සන්තීරණ චිත්තය ද, උපෙක්ඛා සහ ගත සන්තීරණ චිත්තය ද යන මේ අට දෙන කුසල විපාක අහේතුක චිත්තයෝ නම් වෙත්.

11. උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන චිත්තයද, එසේම මනොද්වාරාවජ්ජන චිත්තය ද, සොමනස්ස සහගත හසිතුප්පාද චිත්තයද, යන මේ තිදෙන අහේතුක ක්‍රියා චිත්තයෝ නම් වෙත්.

12. මෙසේ සර්වප්‍රකාරයෙන් අටළොස් අහේතුක චිත්තයෝ සමාප්තයහ.

13. අකුසල විපාක සිත් සතය, කුසල විපාක සිත් අටය, ක්‍රියා සිත් තුනය යි අහේතුක චිත්තයෝ අටළොසෙක් වෙත්.

14. අකුසල් සිත් සහ අහේතුක සිත් කෙරෙන් මුක්ත වූ එකුන් සැටක් වූ හෝ අනූඑකක් වූ හෝ චිත්තයෝ සොභන සිත් යයි කියනු ලැබෙත්.

15. සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි, සසඞ්ඛාරික සිත එකකි. සොමනස්ස සහගත ඤාණවිප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්තය එකකි, සසඞ්ඛාරික චිත්තය එකකි, උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්තය එකකි, සසඞ්ඛාරික චිත්තය එකකි, උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසඞ්ඛාරික චිත්-තය එකකි. සසඞ්ඛාරික චිත්තය එකකි. මේ අට දෙන කාමාවචර කුසල් සිත් නම් වෙත්.

16. සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි, සසඞ්ඛාරික සිත එකකි. සොමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි. සසඞ්ඛාරික සිත එකකි, උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි. සසඞ්ඛාරික සිත එකකි. උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි. සසඞ්ඛාරික සිත එකකි. මේ අට දෙන ද සහේතුක කාමාවචර විපාක සිත් නම් වෙති.

17. සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි. සසඞ්ඛාරික සිත එකකි. සොමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි. සසඞ්ඛාරික සිත එකකි. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි, සසඞ්-ඛාරික සිත එකකි. උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසඞ්ඛාරික සිත එකකි. සසඞ්ඛාරරික සිත එකකි. මේ අට දෙන ද සහේතුක කාමාවචර ක්‍රියා සිත් නම් වෙත්.

18. මෙසේ සර්වප්‍රකාරයෙන්ම සූවිස්සක් වූ සහේතුක කාමාවචර කුසල විපාක ක්‍රියා සිත් සමාප්තයහ.

19. සහේතුක කාමාවචර කුසල විපාක ක්‍රියා සිත් වේදනා. ඤාණ, සඞ්ඛාර භෙදයෙන් සූවිස්සෙකැයි දන්නා ලදහ.

20. කාමාවචර විපාකසිත් තෙවිස්සකි, කුසලාකුසල සිත් විස්සකි, ක්‍රියාසිත් එකොළොසෙකි. මෙසේ සර්වප්‍රකාරයෙන් සූපනසෙක් වේ.

21. විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත ප්‍රථමධ්‍යාන කුසල් සිත, විචාර පීති සුඛ එකග්ගතා සහිත ද්‍විතියධ්‍යාන කුසල් සිත, පීති සුඛ එකග්ගතා සහිත තෘතියධ්‍යාන කුසල් සිත, සුඛ එකග්ගතා සහිත චතුර්ථධ්‍යාන කුසල් සිත, උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමධ්‍යාන කුසල් සිත යන මේ පස් දෙන ද රූපාවචර කුසල් සිත් නම් වෙත්.

22. විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත ප්‍රථමධ්‍යාන විපාක සිත, විචාර පීති සුඛ එකග්ගතා සහිත ද්‍විතියධ්‍යාන විපාක සිත, පීති සුඛ එකග්ගතා සහිත තෘතියධ්‍යාන විපාක සිත, සුඛ එකග්ගතා සහිත චතුර්ත්ථධ්‍යාන විපාක සිත, උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමධ්‍යාන විපාක සිත යන මේ පස් දෙන ද රූපාවචර විපාක සිත් නම් වෙත්.

23. විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත ප්‍රථමධ්‍යාන ක්‍රියා සිත, විචාර ප්‍රීති සුඛ එකග්ගතා සහිත ද්‍විතියධ්‍යාන ක්‍රියා සිත, ප්‍රීති සුඛ එකග්ගතා සහිත තෘතියධ්‍යාන ක්‍රියා සිත, සුඛ එකග්ගතා සහිත

චතුර්ත්ථධ්‍යාන ක්‍රියා සිත, උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමධ්‍යාන ක්‍රියා සිත යන මේ පස් දෙන ද රූපාවචර ක්‍රියා සිත් නම් වෙත්.

24. මෙසේ සර්වප්‍රකාරයෙන්ම පසළොසක් වූ රූපාවචර කුසල විපාක ක්‍රියා සිත් සමාප්තයහ.

25. රූපාවචර චිත්තය ධ්‍යාන භෙදයෙන් පස් වැදෑරුම් වේ. එය කුසල විපාක ක්‍රියා භෙදයෙන් පසළොස් වැදෑරම් වේ.

26. ආකාසානඤ්චායතන කුසල්සිත, විඤ්ඤාණඤ්චායතන කුසල් සිත ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත යන සතර දෙන ද අරූපාවචර කුසල් සිත් නම් වෙත්.

27. ආකාසානඤ්චායතන විපාක සිත, විඤ්ඤාණඤ්චායතන විපාකසිත, ආකිඤ්චඤ්ඤායතන විපාකසිත, නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන විපාක සිත යන සතර දෙන ද අරූපාවචර විපාක සිත් නම් වෙත්.

28. ආකාසානඤ්චායතන ක්‍රියා සිත, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත, ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිත, නෙව සඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිත යන සතර දෙන ද අරූපාවචර ක්‍රියා සිත් නම් වෙත්.

29. මෙසේ සර්වප්‍රකාරයෙන් දෙළොසක් වූ අරූපාවචර කුසල් විපාක ක්‍රියා සිත් සමාප්තයහ.

30. ආරම්මණ භෙදයෙන් අරූපාවචර සිත සතර වැදෑරම් වේ. නැවත කුසල විපාක ක්‍රියා භෙදයෙන් දෙළොස් ආකාරයකින් සිටී යේය.

31. සොතාපත්ති මාර්ග සිත, සකදගාමී මාර්ග සිත, අනාගාමී මාර්ග සිත, අරහත්ත මාර්ග සිත යන මේ සතර දෙන ලොකොත්තර කුසල් සිත් නම් වෙත්.

32. සොතාපත්ති ඵල සිත, සකදගාමී ඵල සිත, අනාගාමී ඵල සිත, අරහත්ත ඵල සිත යන මේ සතර දෙන ලොකෝත්තර විපාක සිත් නම් වෙත්.

33. මෙසේ සර්වප්‍රකාරයෙන් ලොකොත්තර කුසල විපාක සිත් අට සමාප්තයහ.

34. සතර මාර්ගයාගේ භෙදයෙන් ලොකෝත්තර කුසලය චතුර් විධ වේ. විපාකය ඒ කුසලයාගේ ම ඵලය බැවින් සතර විධ වේ. මෙසේ ලොකෝත්තර සිත අට වැදෑරුම් යයි දන්නා ලදී.

35. අකුසල් සිත් දෙළොසෙකි. කුසල් සිත් එක් විස්සෙකි. විපාක සිත් සතිසෙකි. ක්‍රියා සිත් විස්සෙකි.

36. කාමාවචර සිත් සූපනසෙක, රූපාවචර සිත් පසළොසෙක, අරූපාවචර සිත් දෙළොසෙක, ලොකෝත්තර සිත් අටෙක.

37. මෙසේ කියන ලද ප්‍රභෙදයෙන් සිත් එකුන් අනූ වෙක. ප්‍රාඥයෝ එය එක්සිය විසිඑකක් කොට බෙදත්.

38. එකුන් අනූ ප්‍රභෙද ඇති සිත එක් සිය විසි එකක් වන්නේ කෙසේ ද? විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත ප්‍රථමධ්‍යාන සොතාපත්ති මග්ග සිත, විචාර පීති සුඛ එකග්ගතා සහිත ද්‍විතියධ්‍යාන සොතාපත්ති මග්ග සිත, පීති සුඛ එකග්ගතා සහිත තෘතියධ්‍යාන සොතාපත්ති මග්ග සිත, සුඛ එකග්ගතා සහිත චතුත්ථධ්‍යාන සොතාපත්ති මග්ග සිත, උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමධ්‍යාන සොතාපත්ති මග්ග සිත යන පස් දෙන සොතාපත්ති මාර්ගසිත් නම් වෙත්.

39. එසේ ම සකදගාමී මග්ග සිත ද, අනාගාමී මග්ග සිත ද, අරහත්ත මග්ග සිත ද ඒක්වීමෙන් මාර්ග සිත් විස්සෙක් වේ. එසේම ඵලසිත් ද විස්සෙක. මෙසේ ලොකොත්තර සිත් සමසතළිසෙක් වෙති.

40. ධ්‍යානාඞ්ගයොග භෙදයෙන් එක් එක් ලොකෝත්තර චිත්තය පස් පස් වැදෑරුම් කොට ලොකොත්තර සිත් සතළිස් වැදෑරුම් වන්නේ යයි කියනු ලැබේ.

41. ප්‍රථමධ්‍යානාදි භේදයෙන් රූපාවචර චිත්තය යම් සේ ගනු ලැබේ ද, එසේ ම ලොකෝත්තර සිත ද, එම ධ්‍යාන භේදයෙහිලා ගනු ලැබේ. අරූපාවචර චිත්තය පඤ්චම ධ්‍යානයෙහිලා ගනු ලැබේ. එහෙයින් ප්‍රථම ධ්‍යානාදී එක් එක් ධ්‍යානයක් හා යෙදෙන චිත්තය එකළොස් එකොළොස් වැදෑරුම් වේ. අන්තිම වූ පඤ්චමධ්‍යානය හා යෙදෙන චිත්තය තෙවිසි වැදෑරුම් වේ.

42. කුසල් සිත් සත්තිසෙකි. එසේම විපාක සිත් දෙපනසෙකි. මෙසේ ප්‍රාඥයෝ සිත් එක් සිය විසි එකක් කීහු.

මෙසේ අභිධර්මාර්ත්ථ සංග්‍රහයෙහි චිත්තසඞ්ගහ විභාගනම් වූ ප්‍රථම පරිච්ඡේදය නිමි.

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

## ප්‍රථම පරිච්ඡේදය

අනාදිමත් කාලයක් සසර සැරිසරමින්, ප්‍රමාණ කළ නො හැකි දුක් විඳිමින්, සසරින් එතර විය නොහැකිව, අසරණව සිටින, ප්‍රථග් ජනවූ අප හැම දෙනාටම අද ඇති එකම පිහිට බුදුරජාණන් වහන්සේ විසින් යහපත් කොට දේශනා කර වදාළ ශ්‍රී සද්ධර්මයයි. මේ ධර්මය හොඳ හැටි අසා ඉගෙණ සිත්හි දරාගෙණ, එහි වූ පරිදි අවඩිකව පිළිපැදීමෙන් අප කාගේත් නිෂ්යාවවූ අර්හත් ඵලයට පැමිණ සසරින් මිදෙනු මිස අන් මඟක් නැති බව අප විසින් පළමුකොට වටහා ගත යුතුව තිබේ.

අබුද්ධොත්පාද කාලයන්හි භව සම්පත් ලැබීමට උපකාර වන ධර්ම මාර්ග හා පිළිවෙත් ඇතිවන නමුත්, නිර්වාණ මාර්ග පිළිවෙත අසන්නටවත් ලැබෙන්නේ බුද්ධොත්පාද කාලයක පමණකි. එබැවින් මෙවැනි පර්යාප්ති ශාසනය පවත්නා කාලයක ධර්මයෙන් ප්‍රයෝජනය නොගතහොත් දුකසේ ලබාගත් අපගේ මේ මනුෂ්‍යාත්ම භාවය නිෂ්ඵල වනු ඒකාන්තය. මෙයට පෙර බුද්ධොත්පාද කාල යන්හි රැස් කළ කුසල කර්මවල විපාක ශක්තිය අප හැමදෙනා තුලම පවතී. පින් නොමේරූ බැවින් පෙර ශාසන වලදී නිර්වාණ මාර්ගාව බොධය කළ නොහැකි විය. මතු කාලයේදීවත් කෙලෙස් නසා සසරින් එතරවනු කැමැති පුද්ගලයන් විසින් දැන් දැන්ම ධර්මාව බෝධය පිණිස වීර්‍ය කටයුතු. ශ්‍රද්ධා ආදී ගුණ වඩා, දාන–සීලාදී කුසල් කරමින්, සමථ විදර්ශනාදී චිත්ත භාවනා වඩමින්, අප්‍රමාදව විසිය යුතුයි. මාර්ගාවබෝධය පිණිසත් කෙලෙස් නැසීම පිණිසත් උපකාර නොවන අනවශ්‍ය ප්‍රශ්න මතුකොට, වාද විවාද ඇති කර මින් තර්ක කරමින් කල් නොයවා, නෛර්‍යාණික වූ ශ්‍රී සද්ධර්මය හොඳ හැටි අවබෝධ කර ගැණීමට උත්සාහ කටයුතුයි. ධර්මය මනාව දැනගත් සැදැහැවතුන් විසින්ම ධර්ම රසය විඳිනු මිස ධර්මය නොදත්, නුවණ මඳ අයට එම රසය විඳිනු නොහැකිය.

මෙකල බොහෝ පින්වත්හු ධර්මය ඉගෙණීම යයි කියා බුද්ධාගම පිළිබඳ ඉතිහාසයද, නොයෙක් චරිත කථා ආදිය ද කියවමින් තෘප්තියට පැමිණෙති. ඇතැම් අය ගැඹුරු ධර්මයෙන් අපට වැඩක් නැත. අපි පව් කරන්නෝ නොවෙමු නම්, අනුන්ට ඊර්ෂ්‍යා ක්‍රෝධ නොකරන්නෙමු නම් එය ප්‍රමාණ වෙත් යයි සළකති. ශ්‍රද්ධා භක්ති පෙරදැරිව එසේ කළ හොත් ඇතැම් විට ඔවුන්ට ස්වල්පවූ භව සම්පත් විඳීමට හැකිවනු මිස එයට වැඩි ඵලයක් ලැබීමට නුපුළුවන. තවද, සමහරු මහජන සේවාවන්හි යෙදී, ගිලනුන්ට උපස්ථාන කිරීම, අනාථ වූවන් රැකීම, ග්‍රාමසංවර්ධන කටයුතු කිරීම, පත්පොත් මුද්‍රණය කොට ප්‍රචාරය කිරීම යනාදී නොයෙක් වැදගත් කටයුතු කරමින් කල් යවති. මේ කටයුතු ද මහත්ඵල මහානිසංස කර ගැණීමට නම්, කුසලා කුසල කර්මයන් පිළිබඳවත්, එහි විපාකත්, එය ලැබෙන සැටිත්, අකුසලයන්ගෙන් වෙන්ව ඤාණසම්ප්‍රයුක්ත කුසල් රැස් කරණ සැටිත්, නිවන් මඟට එම කුසල් යොදවන සැටිත්, මනාව ඉගෙණ ගත යුතුයි. තවද, ඇතැම් නුවණ ඇති පින්වතුන් ශ්‍රද්ධා-සීලාදී යහපත් ගුණයන් වැඩීම පිණිසත්, ක්ලේශ ප්‍රහාණය පිණිසත්, උත්සාහ නොකොට, නොයෙක් ලාභසත්කාර ගරු බුහුමන් උපාධි තනතුරු අපේක්ෂා කරමින් ධර්මය ඉගෙණීමෙහි යෙදෙති. ඔවුන්ද, ධර්මයෙන් නිසිඵල ලබන්නෝ නොවෙති. කාමයන් වඩවන, ඉන්ද්‍රියන් පිනවන අරමුණුවල සිත් අලවන, නැටුම්, ගී කීම, වැයීම් විසුළු දැකුම්, සැරසීම් ආදී කුසල පක්ෂයෙන් ඈත් කොට අකුසල පක්ෂයට ම බරකරවන,කටයුතුවල යෙදීමෙන් සසර තරකර ගැනීමක් මිස එයින් මිදීමක් නම් නොලැබෙන්නේ ය. ධර්මය නොදත්, කායවාක් සංවරයෙහි නොපිහිටි, නොදැමුණු බෞද්ධ පිරිස් අතර, නොයෙක්, දුශ්චරිත හා දමරික ක්‍රියා ඇතිවීම පුදුමයට කරුණක් නොවේ. මේ ආදී නොයෙක් කරුණු සළකා ධර්ම මාර්ගය කුමක්දැයි සොයාගැණීමට උත්සාහ කටයුතුයි.

ප්‍රතිවේධය හෙවත් මාර්ගඵලාධිගමය පිණිස අවශ්‍ය ධර්ම තුනෙකි. එනම් ශීල සමාධි ප්‍රඥා යන තුනයි. කායවාක් සංවරය මනාකොට ඇතිකර ගැණීමට ඉවහල්වන, සිව් පිරිසිදු සිල් පරම කොට ඇති, කුදුමහත් සීලයන්, තම සිත් සතන්හි ඇති කොට, ශීල විසුද්ධියෙන් යුක්තව, සම්මාවාචා සම්මා කම්මන්ත, සම්මා ආජීව යන ත්‍රිවිධ මාර්ගාඞ්ගයන් පළමු කොට වැඩිය යුතුවේ. මෙසේ

පිරිසිදුව අධිශීලයෙහි පිහිටා, චිත්ත භාවනා පිණිස වීර්‍යය කටයුතුවේ. සමථ විදර්ශනා භාවනා යුගනද්ධව වඩමින් අධිචිත්ත සංඛ්‍යාත සමාධියට පැමිණිය යුතුයි. මෙසේ වැඩීමෙන් සම්මා වායාම සම්මා සති සම්මා සමාධි යන ත්‍රිවිධ මාර්ගාඞ්ගයන් ඇති කරගත යුතුයි. මෙසේ ශීල සමාධි දෙකින් යුක්තව යම් විදර්ශනා ප්‍රඥාවක් ලැබීම පිණිස වීර්‍යය කරන්නෝ නම්, ඕහට ක්‍රමයෙන් චතුරාර්‍ය සත්‍ය පිළිබඳ ඥාණය වූ සම්මාදිට්ඨිය සහ සම්මාසඞ්කප්ප යන මාර්ගාඞ්ග දෙක සම්පූර්ණ වන්නේ ය. මෙසේ කෙලෙසුන් ගේ සමුච්ඡෙද ප්‍රහාණය පිණිස උවමනා මාර්ගාඞ්ග අට, මේ ක්‍රමයෙන් වඩා, අපගේ නිෂ්ඨාව වූ අර්හත් ඵල සම්පත්තියට පැමිණෙනු මිස, මෙයට වෙනස් පිළිවෙතක් මේ ශාසනයෙහි නැත. එබැවින් අප හැමදෙනා විසින්ම මේ ඒකායන මාර්ගය වැඩීම පිණිස නුවණත් වීර්‍යයත් යෙදිය යුතු.

ධර්මය පිළිබඳව සැලකිය යුතු අවබෝධයක් ඇතිකර ගැණීම පිණිස, එය ක්‍රමානුකූලව ඉගෙණීම කළයුතු වේ. එසේ ඉගෙණ ගනු කැමැති පින්වතුන්ගේ ශ්‍රද්ධාවත් ධර්මඥානයත් ක්‍රමයෙන් වැඩෙන අන්දමට සංක්ෂෙපයෙන් පිළියෙල කරන ලද මේ පොතට ඇතුළත් ධර්මය වෙනත් දහම් පත්පොත් කියවීමෙන්, නැවත නැවත කියවීමෙන්, නිතර භාවිතා කිරීමෙන්, ධර්මධර ගිහිපැවිදි උතුමන් ආශ්‍රයකිරීමෙන්, සාකච්ඡා කිරීමෙන්, දියුණු කරගත යුතු. රැකී රක්ෂා ගේදෙර කටයුතු බහුල ගිහියන්ට, ධර්මය ඉගෙණීම පිණිසත් භාවනාදීයෙහි යෙදීම් පිණිසත්, ඇති විවේකය ඉතා ස්වල්ප බැවින්, මෙය ඉතා දුකසේ කළ යුත්තකි. තම තමන්ට අයත් වැඩ කටයුතු , යුතුකම් ආදිය නොපිරිහෙලා ඉටු කරමින්, මෙලෝ දියුණුවත් සලසා ගනිමින් (පරලොව දියුණුවටත් සසරින් මිදීමටත්, උපකාර වන දහම් පිළිවෙතෙහි යෙදීමට කෙසේ නමුත් අවකාශ ලබා ගත යුතු.

දැන් අප විසින් කියා දෙන්නට අදහස් කරණ ධර්මය පිළිබඳව සුළු විස්තරයක් කිරීම කාලෝචිතයයි සිතමි.

අප බුදුරජාණන් වහන්සේ විසින් දේශනාකර වදාළ පර්‍යාප්ති ශාසනය නම් වූ ධර්ම විනය, පිටක වශයෙන් තුනකි. එනම් විනය පිටකය, සූත්‍ර පිටකය, සහ අභිධර්ම පිටකයයි. එයින් භික්ෂූම

පිළිබඳව දෙශනා කළ ශික්ෂා පිළිවෙත් ආදිය විනය පිටකයට ඇතුළත් වේ. සම්මුති දෙශනා වශයෙන් ඒ ඒ තැන්හි නොයෙක් පුද්ගලයන් අරහයා, ලෝකව්‍යවහාරය නොයික්මවා දේශනා කළ ධර්ම සමූහය සූත්‍ර පිටකයට ඇතුළත් වේ.

ලෝක ව්‍යවහාරයට හාත්පසින් වෙනස්වූ, කුසලා කුසල ස්කන්ධ, ධාතු ආයතන ආදී වශයෙන් පරම සත්‍යය හෙවත් පරාමාර්ත්ථ ධර්ම වශයෙන් දෙශනා කළ ධර්ම සමූහය, අභිධර්ම පිටකයට ඇතුළත් වේ. මෙසේ චතුරාර්‍ය්‍ය සත්‍යාවබොධයට උපකාර වන, මාර්ග ප්‍රතිපදාව සඳහා මේ ධර්ම සමූහය මැනවින් ඉගෙණ ගතයුතු වේ. විශෙෂයෙන් අප විසින් අදහස් කරන්නේ අභිධර්ම පිටකයට අයත් මූලික ධර්ම හෙවත් පරමාර්ථ ධර්ම පිළිබඳව ඉතා සංක්ෂෙප විස්තරයකි. මේ ධර්මයන් ස්වල්ප වශයෙන් වත් නොදන, ධර්මාර්ත්ථ වටහා ගැණීම අති දුෂ්කරය. සූත්‍ර දේශනාවන්හි ප්‍රකාශ වන ධර්මයන් තේරුම් ගැනීමට සහ විදර්ශනා භාවනා කිරීමෙන් නිසිඵල ලැබීමටද මේ ධර්ම ඥානය අවශ්‍යවේ. එබැවින් මේ ධර්ම විස්තරය හොඳ හැටි ඉගෙණීමට උත්සාහ කට යුතු.

බුද්ධ වචනය හෙවත් බුද්ධ දේශනාව සම්මුති දේශනා පරමාර්ත්ථ දේශනායයි දෙකොටසකට බෙදිය හැකිවේ. සත්ත්ව පුද්ගල, ස්ත්‍රී පුරුෂ, වෘක් ෂලතා, පෘථිවි, පර්වත, ගංගා, සමුද්‍ර ආදී වශයෙන් ප්‍රඥප්තිය, ලෝකෙව්‍යවහාරය, නොයික්මවා, ඒ ඒ පුද්ගල යන්හට පහසුවෙන් ධර්මාවබෝධය වන පිණිස වදළ දේශනා සම්මුති දෙශනා නම් වේ.

ලෝකයා විසින් ව්‍යවහාර කරණ ඒ ඒ දේ පිළිබඳව ඇති තත්වය, සැබෑ තත්වය හඳුන්වන, ස්කන්ධ, ධාතු ආයතන ආදී වශයෙන් ඒකාන්තයෙන් ම විද්‍යාමාන වූද සත්‍යවූද, තමන්ට අයත් ස්වභාවයෙන් අන් ස්වභාවයකට වෙනස් නොවන, උතුම් අර්ථ නම් වූ පරමාර්ථ ධර්ම දක්වා වදළ දේශනා පරමාර්ථ දේශනා නම් වේ.

මනුෂ්‍යයා යයි කියන විට, රූප දැකීමට ඇස් දෙකකුත්, ශබ්ද ඇසීමට කන් දෙකකුත්, ගඳ දැනීමට නාසයකුත්, රස දැනීමට දිවක්

සහිත මුඛයකුත්, ස්පර්ශය දැන ගැණීමට හැකි වන ශරීරයකුත් ඇති, හිසක් සහ අත් පා සහිත කඳක් ඇතිව, කථා කිරීම් ඇවිදීම් ආදී නොයෙක් ක්‍රියා කළ හැකි, ජීවත්වන, නොයෙක් දේ දැන ගන්නා සිතකුත්ඇති, අවයව රාශියකින් යුක්ත, කෙනෙක් බව දැනගනී. සම්මුතිය වශයෙන් මෙකී අවයව රාශිය එක් කළ විට මනුෂ්‍යයා යයි කියන නමුත්, මේ අවයවයන් වෙන් වෙන් වශයෙන් ගත් විට මනුෂ්‍යයා යයි කීමට කිසිවක් නැත. ඇස් කන් නාසාදී අවයවයන් නැවතත් වෙන් වෙන්ව පරීක්ෂා කළ විට, එය ද නොයෙක් සූක්ෂම වූ ද්‍රව්‍ය රාශියකින් යුක්ත බව පෙනේ. මෙකී සූක්ෂම වූ ද්‍රව්‍යයන් ද නැවතත් පරීක්ෂා කළ විට, ඇසට පවා නොපෙනෙන ද්‍රව්‍ය රාශියකින් යුක්ත බව වැටහේ. මෙකී ඇසට නොපෙනෙන අති සූක්ෂමවූ ද්‍රව්‍ය යන් යයි සළකන දෙයත්, බෙද වෙන්කොට දත හැකි වේ. මෙය මනුෂ්‍ය ඥානයට තබා දිව්‍යඥාණයටවත් නොවැටහෙන, සර්වඥතා ඥානයෙන්ම දැන වදළ, මූලාර්ත්ථ නම් වූ පරමාර්ත්ථ ධර්ම රාශියකි. මෙකී පරමාර්ත්ථ ධර්ම සමූහය, ඇසින් දැක්ක නොහැකි, අද්‍රව්‍යවූ ක්‍රියා විශෙෂයෙකි. මෙසේ සලකන විට මනුෂ්‍යයා යයි කියනු ලබන්නේ නාම රූප සමූහයක් මුත්, අන් කිසිවක් නොවන බව ධර්ම ඥානයෙන් දියුණු වූ නුවණට වැටහේ. විදර්ශනා භාවනා වඩන පුද්ගල තෙමේ මේ නාමරූප ධර්මයන්ගේ ත්‍රිලක්ෂණ වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණයන් මෙනෙහි කිරීමෙන් භාවනාමය ඥානයට අරමුණු කරගැණීමෙන්, කෙලෙස් නැසීමත් ලොකෝත්තර මාර්ග ඥානය ලැබීමත් සිද්ධකර ගන්නේ ය.

## පරමාර්ත්ථ ධර්ම සතර

**අභිධර්මයෙහි** හෙවත් සූත්‍ර දෙශනාදියට වඩා විශෙෂ වූ ධර්ම යෙහි වදළ අර්ථ අභිධමාර්ථ නම් වේ. ඒ ධර්මාර්ථ සියල්ලම **පරමාර්ථ ධර්ම** වශයෙන් සතරෙකි. එනම්:—

1. **චිත්ත පරමාර්ත්ථය**
2. **චෛතසික පරමාර්ත්ථය**
3. **රූප පරමාර්ත්ථය**
4. **නිර්වාණ පරමාර්ත්ථය** යන සතරයි.

මේ පරමාර්ත්ථ ධර්මයන්ට ඇතුළත් නොවන ධර්මයක් නැත. පරමාර්ත්ථ ධර්මයෝ වනාහි, ඇසට නො පෙනෙන, ද්‍රව්‍ය සංඛ්‍යාවට නො ගැනෙන, ක්‍රියා මාත්‍ර වූ, ශක්ති විශෙෂයකි. එමෙන් ම සත්‍ය වූ ද, විද්‍යමාන වූද, නො බෙදිය හැකි වූ ද, මූලාර්ත්ථ වශයෙන් ගැනෙන සිතින් ම අවබෝධ කටයුතු ගැඹුරු ධර්ම සමූහයකි.

1. **චිත්ත පරමාර්ථ** යයි කියනු ලබන්නේ සත්ත්වයා ගේ සිතට ය. එය අරමුණු දැනීමේ ශක්තියට කියන නමෙකි. රූප දැකීම, ශබ්ද ඇසීම, ගඳ දැනීම, රස දැනීම, ස්පර්ශය දැනීම, වෙනත් නොයෙක් දේ සිතීම යනා දී දැනීම් සියල්ල ම ඇතිවන්නේ චිත්ත පරමාර්ත්ථ ශක්තියෙනි.

2. **චෛතසික පරමාර්ථ** වනාහී සිත සමඟ පවත්නා සිතේ ස්වභාවය දැන ගැනීමට උපකාරවන ශක්ති විශෙෂයකි. චෛතසික නොමැතිව සිතක් හට නොගනී. සිතත් සමඟ එකට ඉපි ද, එකට නිරුද්ධවන, සිතේ අරමුණ ම ගෙණ සිත උපදින තැන ම උපදින මේ ධර්මයෝ සිතට ඇතුළත්වම ඇතිවන හෙයින් චෛතසික නම් වේ.

3. **රූප පරමාර්ථයෝ** නම් ඉහත කී චිත්ත, චෛතසික නම් වූ නාම පරමාර්ත්ථයන්ට වෙනස් වූ ක්‍රියා විශෙෂයකි. පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූත රූප සහ ඒ නිසා හටගත් උපාදා රූපයන්ගෙන් යුත්, මේ රූප 28, ශීතොෂ්ණ ආදී වූ විරුද්ධ ප්‍රත්‍යයන් ගෙන් පහර ලබන්නාවූ ද, පෙළනු ලබන්නාවූ ද, විනාශවනු ලබන්නාවූද, ධර්ම සමූහයකි. මේ රූප පරමාර්ථයන් මහත් රාශියක් එක් වීමෙන් ක්‍රමයෙන් ගස්, ගල් පර්වත , ශරීර ආදී වූ කුඩා, මහත් දෙය මවා පෑමේ ශක්තිය ඇති වේ. එය ද්‍රව්‍යයන් මෙන් පෙනෙතත්, ක්‍රියා සමූහයක ගේ විකාර ස්වභාවයකි. රූප පරමාර්ත්ථයෝ නාම පරමාර්ත්ථයන් මෙන් සියුම් නැත. එයට වඩා ඖදරික ය, රළු ය, මහත් ය.

4. **නිර්වාණ පරමාර්ථය** වනාහි ඉහත කී චිත්ත, චෛතසික, රූප යන ලෞකික වූ සංඛත වූ හෙවත් හේතු ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්ද වූ, ජාති, ජරා, මරණාදී ව්‍යසනයන්ට භාජන වූ, ඒ පරමාර්ථයන්ට වඩා හාත්පසින් ම වෙනස් වූ, ලෝකෝත්තර වූ,

අසංඛත වූ හෙවත් හේතු ප්‍රත්‍යයන් විසින් සකස් කරණු ලබන්නක් නො වන බැවින්ම, ජාති, ජරා, මරණාදියක් නැති, වාණ නම් වූ තෘෂ්ණාවෙන් නික්මුණ හෙයින් සියළු දුකින් මිදුනු, සංසිඳීම් සංඛ්‍යාත ශාන්ත වූ සැප ඇති, අනන්ත අප්‍රමාණ ගුණයන්ගෙන් යුක්ත වූ, ලෝකෝත්තර ඥාණයට අරමුණවන, ආර්‍ය්‍යයන් විසින් ම ප්‍රත්‍යක්ෂ කටයුතු ඉතා සූක්ෂම ධර්ම ධාතුවකි. මෙය නාම පරමාර්ත්ථ යක් වුව ද, චිත්ත, චෛතසික නම් වූ සංඛත නාම පරමාර්ථ යන්ට වඩා අතිශයින් සියුම් වූ, අවබෝධ කර ගැනීමට ඉතා දුෂ්කර වූ, ගැඹුරු වූ ඒකාන්තයෙන්ම විද්‍යමාන වූ ධාතුවකි. මෙසේ සැකෙවින් පරමාර්ත්ථ ධර්ම සතර හඳුන්වා දුන් නමුත් එහි විස්තර පසුව ප්‍රකාශ කරන්නෙමි.

# චිත්ත සඞ්ග්‍රහ විභාගය

සිත යයි කියනුයේ අරමුණු දැනීමේ ශක්තියට බව මෙයට ප්‍රථම ප්‍රකාශ කෙළෙමු. මනුෂ්‍යයා යයි කියන විට සිතක් සහිත වූ ශරීරයක් ඇති පුද්ගලයෙක් බව දනගනී. ශරීරයෙන් එම සිත පහ කළහොත් එම ශරීරයට, මෘත ශරීරය, මළ සිරුර, මළ කුණ යනාදී නම් ව්‍යවහාර කරණු ලැබේ. ගස්, ගල් පර්වත, දිය පොකුණු, ගංගා ආදියට සිත් නැති හෙයින් සත්ත්ව යන ව්‍යවහාරයක් නො ලැබේ. අචේතනික වස්තු සංඛ්‍යාවට ගැණේ. එබැවින් සිත සත්ත්වයන් පිළිබඳව ම ඇති ධර්මයකි. එක් සත්ත්වයෙක් කෙරෙහි ඇත්තේ එක් සිතක් නොව සිත් පරම්පරාවකි. මේ සිත් පරම්පරාවට අයත් සිත්, ඉතා වේගයෙන් ඉපිද නැතිවන බැවින් ද, අතරක් නැතිවම සිත් හටගන්නා බැවින් ද එක ම සිතක් මෙන් අපට වැටහේ. තව ද, එක්වර එක් සිතක් මුත්, සිත් දෙකක් හට නොගන්නා බව ද, එක් සිතක් එක අරමුණක් මුත් අරමුණු දෙකක් නොගන්නා බව ද, එසේ ම එක් සිතක් එකවර ගනු ලබන්නේ එක් අරමුණක එක් ස්වභාවයක් මුත් ස්වභා දෙකක් නොවන බව ද දත යුතුය.

තව ද, සිතේ විසිතුරු බව වටහා ගැනීමට, සිත් හටගන්නේ කෙසේ ද, සිතේ ආයුෂ කොපමණ ද, සිත් උපදින්නේ කවර තැනකද යනාදිය පිළිබඳව කරුණු ස්වල්පයක් දැන ගැනීම ප්‍රයෝජනවත් වේ.

**සිතක් හටගැනීමට** කරුණු කීපයක් සම්පූර්ණ විය යුතු ය. පළමු කොට පැවත එන සිත් පරම්පරාවක් තිබිය යුතුය. අඹ පල හටගන්නේ අඹ ගස් පරම්පරාවක මිස අන් තැනක නො වන්නා සේ සිත් හටගන්නේ සිත් පරම්පරාවකමය. එසේම එම අඹ ගස් පරම්පරාවේ මුල් අඹ ගස සොයා ඇවිදින පුද්ගලයා මුල් අඹ ගස නො දැක, එය දන්නා, දක්නා ඇසූ කෙනෙකුවත් නැති හෙයින් වෙහෙසට පත්වනු මිස අන් ඵලයක් නොලබන්නාක් මෙන්, මේ සිත් පරම්පරාවේ මුල් සිත හෙවත් පළමු සිත සෙවීමට තැත් කරන පුද්ගලයා අධික වෙහෙසට පත් වන්නේ මුලක් නැතිහෙයිනි. අනාදිමත් කාලයක් භවයෙන් භවයට පත් වෙමින් සසර සැරිසර මින් ආ පුද්ගලයාගේ පළමු භවය හෝ පළමු සිත අසවල් කාල යේදී යයි කීමට සමතෙක් නැත. යමෙක් එසේ කිවහොත් ඒ මුල් භවය හෝ සිත ඇතිවීමට හේතු දැක් විය යුතු ය. එය දැක් විය නොහැකි බැවින් දෙවියෙකුගේ හෝ බඹෙකුගේ හෝ මැවීමක් යයි සිතා මිථ්‍යාදෘෂ්ඨිය ගන්නේ ය. ඒ මැවුම්කාර දෙවියාගේ හෝ බ්‍රහ්මයාගේ පහළ වීමට හේතු ඔහුට දැක් විය නොහැකි බැවින් නිශ්ශබ්ද වන්නේ ය. මෙසේ සීමාරහිත කාලයක සිට පැවත එන මේ චිත්ත පරම්පරාවේම සිත් ඇතිවනු මිස අන් තැනක සිත් පහළ වීමට නුපුළුවන.

සිතක් හට ගැනීමට යම්කිසි අරමුණක් හමුවිය යුතු ය. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ධම්ම යන සය සිතට විෂයවන බැවින් ද, සිතින් සිතනු ලබන බැවින් ද අරමුණු නම් වෙති. ලෞකික වූ ද, ලෝකෝත්තර වූ ද, පරමාර්ථ වූද, පඤ්ඤත්ති වූද හැම දෙයක්ම මෙයට ඇතුළත් වේ. දුබලයෙකුට නැගිටීමට හැරමිටියක් උවමනා වන්නාක් මෙන් සිතක් හටගැනීමට ද අරමුණක් උවමනාවේ. අරමුණු මහත් රාශියක් හමුවන නමුත් එක් සිතක් විසින් ගනු ලබන්නේ එක් අරමුණකි. එසේ අරමුණක් ගෙණ ඇති වූ සිතට වෙනත් අරමුණක් ගැනීමට නුපුළුවන. ඒ නිසා පළමු සිත නැති වී ගියායින් පසු එම අරමුණම හෝ වෙනත් අරමුණක් රැගෙන පසු සිත පහළ වේ. මේ ක්‍රමයෙන් නොයෙක් අරමුණු රැගෙන සිත් ඉපි ද නැති වීමෙන් චිත්ත සන්තතිය පවතී. එක් භවයක් සිඳී වෙනත් භවයකට පත්වන විට ද මේ සිත් පරම්පරවා

අතරක් නොමැතිව හටගනිමින්, භවයෙන් භවයට පමුණුවමින්, සත්ත්වයා පෙළමින් සසර දුකට පත් කරනු ලැබේ.

එක් භවයෙකින් චුතවීමේ දී හෙවත් සත්ත්වයෙක් යම් ස්ථාන යක ඉපිද කලක් සිට මැරෙන මොහොතේ දී ඇතිවන අවසාන සිත චුති සිත යයි ද, එයට පසුව අතරක් නො මැතිව පහළවන දෙවන භවයෙහි පළමුවන සිත **ප්‍රතිසන්ධි සිත** යයි ද කියනු ලැබේ. පූර්ව භවය, පසු භවය හා සම්බන්ධ කරවන, සන්ධි කරවන හෙයින් ප්‍රතිසන්ධි නම් වේ. මෙසේ එක් භවයකට අයත් සිත් පරම්පරාව පටිසන්ධි සිතකින් ආරම්භ වී චුති සිතින් අවසන් වේ. පටිසන්ධි සිතින් පටන් ගත් මේ භවයට අයත් සිත් පරම්පරාව නොසිඳී, චුතිය දක්වා ඇති මේ භවය පැවැත්වීමේ අඞ්ගයක් වශයෙන් පවතින යම් තාක් සිත් වේ නම් එයට **භවාඞ්ග සිත්** යයි ව්‍යවහාර කරනු ලැබේ. මෙකී ප්‍රතිසන්ධි, භවාංග චුති නම් වූ සිත් තම තමන්ට අයත් ක්‍රියාව හෙවත් කෘත්‍යය වෙනස් වුවත්, ඒ සිත් විසින් ගනු ලබන අරමුණ එකක්ම වේ. එනම් පටිසන්ධි සිතින් ගත් අරමුණ ය. මේ අරමුණ කුමක් දැයි තේරුම් ගැනීම එතරම් පසසු නොවේ. චිත්ත වීථි සම්බන්ධව මනා දැනීමක් ඇති කෙනෙකුට නම් එතරම් අපහසු ද නො වේ.

මෙයට පෙර භවයෙහි දී මරණය ඇතිවීමට හෙවත් චුති සිත ඇති වීමට පෙර, මරණාසන්න චිත්ත විථිය නම් වූ සිත් පෙලක් ඇති වේ. එම චිත්ත විථියට අයත් සිත්වලට හමුවන අරමුණු තුන් ජාතියකි. එනම් කර්ම, කර්ම නිමිති සහ ගති නිමිති යන අරමුණු තුනයි. මේ අරමුණු තුනෙන් යම්කිසි අරමුණක් රැගෙන මේ චිත්ත වීථිය ඇති වී චුති සිතින් කෙළවර වේ. මේ මරණාසන්න චිත්ත වීථියේ ඇති වන කර්ම සිත්වන ජවන් සිත්වල ද අරමුණ මේ තුනෙන් එකෙකි. මතු භවයක් ඇති කිරීමේ විපාක ශක්තියක් ඇති මේ ජවන් සිත් පහක් ඇති වී, එයට පසුව ඇති වන චුති සිත ඉපි ද නැති වීමත් සමග ම, මතු භවයෙහි පහළවීම කරවන පටිසන්ධි සිත ඇති වේ. මේ පටිසන්ධි සිතේ අරමුණත් පෙර භවයෙහි මරණාසන්න චිත්ත වීථියෙහි ජවන් සිත්වල අරමුණත් එක ම බව දත යුතුය. මෙසේ සළකන විට පටිසන්ධි, භවාඞ්ග චුති යන සිත් තුනෙන් ගත් අරමුණ, එයට පෙර භවයෙන් ගත්

අරමුණක් මිස, මේ භවයේ දී ගත් අරමුණක් නොවන බව පැහැදිලි වේ. පටිසන්ධි සිත පිළිබඳව මෙසේ කරුණු ස්වල්පයක් දැන ගත්තේ වී නමුත්, එය කුමක් ද, එහි අරමුණ කුමක් දැයි දැන ගැනීමට අපට නුපුළුවන. අභිඥාලාභියෙකු හෙවත් විශිෂ්ට ඥාණයක් ඇති කෙනෙකු විසින් ම දැනගත යුතු වේ.

මේ පිළිවෙලින් පැවත එන සිත් පරම්පරාවේ මෙයට වෙනස් සිත් ද ඇතිවීමට අවකාශ තිබේ. මේ භවයේ පහළ වී, අරමුණු ගැනීමට උපකාරවන අවයව හෙවත් ද්වාර නම් වූ චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන ෂට් ද්වාරයන් මනාව පිහිටි පසු, එම දොරටුවලින් ඇතුල්වන අරමුණු ගෙන අළුත් අළුත් සිත් මේ සිත් පරම්පරාවේ හටගනී. එසේ අළුත් අරමුණක් ගැනීමේ දී පළමු පැවති භවාඞ්ග සිතේ අරමුණ චලනය වීමෙන් දුර්වල වී, එයට පසුව උපදින සිතේ දී එම අරමුණ ඉවත් වේ. මෙයට පසු ඇතිවන සිත අළුත් අරමුණ රැගෙන ඇති වී එහි ශක්තිය තිබෙන තාක්, සිත් කීපය කින් යුත් සිත් පෙළක් හෙවත් චිත්ත වීථියක් පහළ වේ. මේ සිත් පෙළ අවසන් වීම සමග ම නැවත උපදින්නේ භවාඞ්ග සිත් පරම්පරාව ය. නැවතත් අළුත් අරමුණක් හමු වූ විට එය ගැනීමට කැමැත්ත ඇතිවුව හොත්, ඉහත කී අන්දමට භවාංග සිත බිඳී අළුත් අරමුණ ඇති චිත්ත වීථිය ඇති වේ. යම් කලෙක අර්හත් ඵලයට පැමිණ, පිරිනිවන් පෑමක් වේ ද, ඒ තාක් කල් මේ සිත් පරම්පරාව නොසිඳී පවතී. මේ අතර නිරොධ සමාපත්තියට සම වැද සිටින කාලයේ දී ද, අසංඥ භූමියේ ඉපි ද සිටින අවස්ථාවේ දී ද තාවකාලික වශයෙන් සිත් හට ගැනීම නතර වේ.

**සිතේ ආයුෂ.** යහපත් ඇස්, කන්, නාසාදී ඉන්ද්‍රියයන් ඇති, හොඳ සිහියෙන් යුත් පුද්ගලයෙක් යම් තැනෙක සිටින විට, එතැන සහ අවට තිබෙන රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යනාදී අරමුණු අවස්ථා පරිදි ඒ පුද්ගලයාට හමුවේ, එවේලාවේ දී ඔහුට වැටහෙන්නේ එම රූප බැලීමත්, ශබ්ද ඇසීමත්, ගඳ දැනීමත්, රස දැනීමත්, ස්පර්ශය දැනීමත්, වෙනත් දේ සිතීමත්, කය සෙළවීමත්, කථා කිරීමත් යනා දී නොයෙක් දේ එකවර සිදු වන සැටියටය. නමුත් එක් සිතක් එකවර ගනු ලබන්නේ එක් අරමුණකි. ඉතා ස්වල්ප කාල යක දී මහත් රාශියක් සිත්, වෙන් වෙන් වශයෙන් අරමුණු රැගෙන,

ඉපි ද නැතිවන බැවින්, එකවර සිදුවන්නාක් මෙන් දැනේ. අසුරු සැනක් ගසන ඉතා ස්වල්ප කාලයේ දී මෙවැනි සිත් ලක්ෂ කෝටි ගණනින් ඇතිව නැති වේ. උපමාවකින් ද මෙය දැක්වීම දුෂ්කර වේ. මෙයින් එක් චිත්ත පරමාර්ථයකගේ ආයුෂ ඉතා ස්වල්ප බව වටහා ගත යුතු ය.

මේ හැම සිතකටම අවස්ථා තුනක් ඇත. එනම්, උප්පාද අවස්ථාව, ඨිති අවස්ථාව සහ භංග අවස්ථාව යන තුනයි. මේ එක් අවස්ථාවකට කුඩා චිත්තක්ෂණයක් යයි කියනු ලැබේ. කුඩා චිත්තක්ෂණයකට ආයුෂ ඇත්තේ එක් සිතක් පවතින කාලයෙන් තුනෙන් කොටසකි. රූප පරමාර්ථයකගේ ආයුෂ සිත් හෙවත් මහා චිත්තක්ෂණ 17 ක් නැතහොත් කුඩා චිත්තක්ෂණ 51 (17 × 3) පවත්නා කාලයක් බැවින් රූප පරමාර්ථයෝ චිත්ත පරමාර්ථයන්ට වඩා ඖදරික ය.

**සිත් උපදින තැන්** හෙවත් වස්තු සයකි. එනම් චක්ඛු වස්තුව සොත වස්තුව, ඝාණ වස්තුව, ජිව්හා වස්තුව, කාය වස්තුව, හදය වස්තුව යන සයයි. සිත් උපදින තැන් නිසා මෙයට වස්තු යයි කියනු ලැබේ. රූප දක්නා අකුසල විපාක සිත සහ කුසල විපාක සිත යන සිත් දෙක චක්ෂු ප්‍රාසද වස්තුවෙහි ද, එමෙන් ම, ශබ්ද අසන සිත් දෙක ශ්‍රොත ප්‍රසාද වස්තුවෙහි ද, ගඳ දැනෙන සිත් දෙක ඝාණ ප්‍රසාද වස්තුවෙහි ද, රස දැනෙන සිත් දෙක ජිව්හා ප්‍රසාද වස්තුවෙහි ද, ස්පර්ශය දැනෙන සිත් දෙක කාය ප්‍රසාද වස්තුවෙහි ද, අනිකුත් සියළුම සිත් හදය වස්තු රූපන ආශ්‍රය කර ගෙන ද උපදී මෙකී වස්තුවලින්ම අරමුණු ඇතුල් කරවබු නිසා ඒ සයට ද්වාර යන නාමය ද ලැබේ. එම ද්වාර සය නම් චක් ද්වාරය, සොත ද්වාරය ඝාණ ද්වාරය, ජිව්හා ද්වාරය කාය ද්වාරය සහ මනොද්වාරය සයයි. චක්ඛු ආදී පංචද්වාරයන් ඇස, කණ, නාසය, දිව කය යන තැන්හි පිහිටා තිබේ. මනොද්වාරය හදය වස්තුව ආශ්‍රය කර ගෙන පවතී. මෙකී ධර්ම සියල්ලම ඉතා සියුම් පරමාර්ථ ධර්ම බැවින් සිතින්ම අවබෝධ කටයුතු ය.

**සිත් පවතින තැන** ගැන මෙකල බොහෝ මත ප්‍රකාශ කරන බව පෙනේ. ශරීරය පිළිබඳව උසස් දැනීම් ඇති ශාස්ත්‍රඥයන්

ගේ ද, මනොවිද්‍යාඥයන් ගේ ද අදහස් වල හැටියට සිත පවතින්නේ මොලයේය, මේ ප්‍රශ්නය අප විසින් ධර්මානුකූලව නිරාකරණය කර ගත යුතුය. මනුෂ්‍යයෙකුගේ මව් කුස පිළිසිඳ ගැනීමේ දී, ප්‍රතිසන්ධි සිතත් සමගම කර්මයෙන් හටගත් රූප කලාප 3 ක් එනම්, කාය දසකය, භාව දසකය සහ වස්තු දසකය යන දසක 3 හෙවත් රූප 30 පහළ වන්නේ ය. මේ කලල රූප අවස්ථාවේ පටන් ක්‍රමයෙන් රූප පරම්පරාව වැඩීමෙන් නොයෙක් ශරීරාවයව සැදෙන්නට පටන් ගනී. ප්‍රසාද වස්තු ආදිය සම්පූර්ණ වන්නට සති 11 ක් පමණ ගත වේ. මොලය සැදී ක්‍රියාත්මක ශක්තිය දැක්වීමට සති 14 ක් පමණ ගත වේ යයි දැන ගෙන තිබේ. මොලය සැදෙන තාක් කල් සිත් පරම්පරාව නොසිඳී පැවතුනා නම්, ඒ පැවතුනේ කොතැන්හි දැයි විමසා බැලීමේ දී, එවකට සෑදී නැති මොලයෙහි නොව, පටිසන්ධියත් සමග උපන් වස්තු දසකයට අයත් හදය වත්ථු රූප සන්තතිය ආශ්‍රය කර ගෙන බව දත යුතුය. කර්ම ශක්තිය ඇති තාක් මෙම කර්මජ රූප පරම්පරාව පවතී. චුති සිත අවසන් වීම සමග ම කර්මජ රූප සන්තතිය ද අවසන් වේ. හදයවත්ථු රූප නිරුද්ධ වීමෙන් මේ භවයට අයත් චිත්ත සන්තතිය ද නිරුද්ධ වේ.

ඇතැම් විට මව්කුසින් බිහිවන කල්හි අඞ්ග විකල වූ ළදරුවන් උපදින බව පෙනේ. සමහර ළදරුවන්ට මොලයකුත් නැත. ඒ ළදරුවන්ගේ මරණය බිහි වී නොබෝ වේලාවකින් සිදුවන්නේ ය. මෙයට හේතුව ආශ්වාස ප්‍රශ්වාස කිරීම් ආදී ශරීරය පවත්වා ගැනීමට උවමනා අවශ්‍ය අවයව ක්‍රියා කරවීමට මොලයේ උපකාර වුවමනා බැවිනි. චක්ෂු ප්‍රසාද වස්තු ආදි ප්‍රසාද වස්තූන් ගේ නිරොගී භාවය රැක ගැනීමට ද මොලය උපකාර වේ. ඒ ප්‍රසාද වස්තූන් උපද්‍රව සහිත වූ කල්හි එහි උපදින සිත් හට ගැනීමට බාධා පැමිණේ. එබැවින් දැකීම, ඇසීම , ගඳ දැනීම, රස දැනීම්, ශාරීරික වේදනා දැනිම ආදී ක්‍රියාවන් සිදු කිරීමට මොලය අවශ්‍ය වේ. තව ද ළදරුවා බිහි වූවායින් පසු, හෘදය වස්තුව, පෙනහැලි ආදි අභ්‍යන්තර ශරීරාවයවයන් ක්‍රියා කරවීමටද මොලය උවමනා ය. ශරීර උෂ්ණය සම තත්වයෙන් පැවැත්වීම ද, ආහාර පැසවීම ද මොලය නිසා ඇති වේ. මේ ආදී කරුණු සළකා බලන කල්හි සිත පවත්වා ගැනීමට නොව ශරීරය පවත්වගැ‍ා නීමට මොලයේ පිහිට ලැබිය

යුතු බව ප්‍රත්‍යක්ෂ වේ. පීඩා සහිත වූ ක්ලාන්ත වූ අවයවයන් ඇති සිරුරක් ඇසුරු කරමින් පවතින සිත හෙවත් නාම කාය ද, ක්ලාන්ත ස්වභාවයට පත්වීමෙන් චිත්ත පරම්පරාව ද දුර්වල වේ. එබැවින් මේ සිත් පරම්පරාව කර්මජ වූ හදයවත්ථු රූප පරම්පරාව ආශ්‍රය කරමින් පවතින බව වටහා ගත යුතුය.

**සිතේ බලය,** ප්‍රමාණ කල නොහැකි ය. සිතින් අරමුණු කළ නොහැකි දෙයක් නැත. අතීත වූ ද, අනාගත වූද, වර්තමාන වූද, කාල නියමයක් නැත්තාවූ ද සියළුම අරමුණු සිතින් ගත හැකිවේ. සමාධි, ප්‍රඥා ආදිය වැඩීමෙන් ශක්තිමත්වූ සිතින් මේ භවය පමණක් නොව පෙර භවයන්හි විසූ පිළිවෙලද දත හැකි වේ. තමන් ගේ සිත පමණක් නොව අනුන් ගේ සිතද දැන ගැනීමේ ශක්තිය ඇති කර ගන්නට පිළිවන. අහසින් යෑම, පොළව කිමිදීම නොයෙක් දේ මැවීම ආදී ඍද්ධි පෑමටද මේ සිත සකස් කර ගත හැකි වේ. එමෙන්ම සත්ත්වයා දුකටත්, සැපතටත්, සතර අපායටත්, දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක ආදියටත් යවන්නේ සිත මය. සසර දුකින් මුදවා නිර්වාණ ධාතුවට පමුණු වන්නේත් සිතමය. බුදු, පසේ බුදු මහ රහත් බැව් ලබා දෙන්නේත් සිතමය. මේ සිත තරම් බලවත් අන් කිසිවක් ලෝකයේ නැත.

## සිතේ ප්‍රභෙද

**චිත්ත පරමාර්ථය** නමින් දක්වෙන මේ සිත සංක්ෂෙප වශයෙන් සිත් 89 ක් ද, විස්තර වශයෙන් සිත් 121 ක් ද වේ. මේ සියලුම සිත් නොයෙක් ක්‍රමවලට බෙදනු ලැබේ.

1. (1) **කාමාවචර සිත්** (2) **රූපාවචර සිත්** (3) **අරූපාවචර සිත්** (4) **ලෝකෝත්තර සිත්** ය යි භූමි වශයෙන් සතරෙකි.
2. (1) **කුසල් සිත්** (2) **අකුසල් සිත්** (3) **විපාක සිත්** (4) **ක්‍රියා සිත්** යයි ජාති වශයෙන් ද සතරෙකි.
3. (1) **සුඛ සහගත සිත්** (2) **දුක්ඛ සහගත සිත්** (3) **සොමනස්ස සහගත සිත්** (4) **දෙමනස්ස සහගත සිත්** (5) **උපෙක්ඛා සහගත සිත්** ය යි ද කොටස් පසෙකි.

4. (1) **සම්ප්‍රයුක්ත සිත්** (2) **විප්‍රයුක්ත සිත්** ය යි ද කොටස් දෙකෙකි.

5. (1) **අසංඛාරික සිත්** (2) **සසංඛාරික සිත්** ය යි ද කොටස් දෙකෙකි.

6. (1) **ලෞකික සිත්** (2) **ලෝකෝත්තර සිත්** ය යි ද කොටස් දෙකෙකි.

7. (1) **අහේතුක සිත්** (2) **සහේතුක සිත්** ය යි ද කොටස් දෙකෙකි.

8. (1) **අසොභන සිත්** (2) **සොභන සිත්** ය යි ද කොටස් දෙකෙකි.

**භූමි** – සත්ත්වයන් වසන ස්ථානයන්ටත්,සත්ත්වයන් පිළිබඳ යම් යම් අවස්ථාවන්ටත්, භූමි යයි කියනු ලැබේ. ලොකෝත්තර භූමිය නම්, කෙලෙස් නැසීමෙන්, දුක් නිරුද්ධ කිරීමෙන්, භවය සිඳීමෙන්, පුද්ගලයකු විසින් පැමිණෙන එක්තරා අවස්ථාවකි. අනිත් භූමි තුන සත්ත්වයන් වාසය කරණ ස්ථාන වේ. සත්ත්වයන් වසන ලෝක තුන් කොටසකි. එනම් කාම ලෝක, රූප ලෝක සහ අරූප ලෝක යන තුනයි. කාම ලෝක 11 කි. අපාය සතරත්, මනුෂ්‍ය ලෝකයත්, දිව්‍ය ලෝක සයත් ය. මෙයින් සතර අපායට කාම දුගතිය යයි ද, මනුෂ්‍ය ලෝකය සහ දිව්‍ය ලෝක සයට කාම සුගතිය යයි ද කියනු ලැබේ. මෙහි දුක් සැප දෙකම මිශ්‍රව පවතී. මේ කාම ලෝකවල හෙවත් එකොළොස් කාම භූමිවල වසන සත්ත්වයන්ට වැඩි වශයෙන් ඇතිවන සිත් **කාමාවචර සිත්** නම් වේ. මේ සිත් වලින් අරමුණු කරනු ලබන්නේ කාම අරමුණු යි. එනම් රූප, ශබ්ද, ගන්ධ, රස පොට්ඨබ්බ ආදියයි.

කාමයන්හි ආදීනව දැක කාමයන්ගෙන් මිදෙනු කැමැති පුද්ගලයන් විසින් චිත්ත භාවනා වඩා කාමයන්ගෙන් වෙන් වූ ධ්‍යාන කුසල් සිත් උපදවා ගනිති. මේ ධ්‍යාන සිත්, රූපාවචර ධ්‍යාන, අරූපාවචර ධ්‍යාන යයි දෙකොටසකි. රූපාවචර ධ්‍යාන යෙන් නොපිරිහී චුත වන පුද්ගලයන් රූප ලෝකවල ද, අරූපාවචර ධ්‍යානයෙන් නොපිරිහී චුත වන පුද්ගලයන් අරූප තලවල ද

උපදිති. රූපාවචර බ්‍රහ්මලෝක 16 කි. එයින් අසංඥසත්ත නම් බඹතලයෙහි රූප කාය මිස නාම කායයක් නැත. ඉතිරි රූප ලෝක 15 වෙහි වසන බ්‍රහ්මයන්ට වැඩි වශයෙන් ඇතිවන සිත් **රූපාවචර සිත්** නම් වේ.

**අරූපතල** සතරෙකි. එහි රූප කායයක් නැත. එහි ඇත්තේ නාම කාය පමණකි. අරූප තල සතරෙහි වසන අරූපී බ්‍රහ්මයන්ට වැඩි වශයෙන් ඇති වන සිත් **අරූපාවචර සිත්** නම් වේ. කාම සුගතියෙහි වසන පුද්ගලයන්ට ධ්‍යාන සිත් උපදවා ගත හැකි වන්නාක් මෙන් රූපාවචර අරූපාවචර ලෝකයන්හි වසන බ්‍රහ්මයන්ට කාම අරමුණු හමුවූ විට කාමාවචරසිත් පහළ වේ. ඉහත කී කාම භූමි 11 ත්, රූප ලෝක 16 ත්, අරූප ලෝක 4 ත් යන 31 ක් තලයට එක් සක්වළක් යයි කියනු ලැබේ. සත්ත්වයන් වසන මෙවැනි සක්වළවල් අනන්තය, අප්‍රමාණය.

තණ්හා දිට්ඨි වශයෙන් තදින් අල්වාගන්නා ලද; පංචුපාදනස්කන්ධ සංඛ්‍යාත ලෝකයෙන් ද, කාම ලෝක, රූප ලෝක, අරූප ලෝක යන තුන් ලෝකයෙන් ද එතර කරවන සියළු දුක්වලින් මුදවා, නිර්වාණ ධාතුවට පමණුවා ප්‍රථග්ජන ගෝත්‍රයෙන් එතර කොට, ආර්‍ය්‍ය භාවයට පමුණුවන මාර්ග සිත් සහ ඵල සිත් **ලොකොත්තර සිත්** යයි දත යුතු.

**කුසල්, අකුසල්, විපාක, ක්‍රියා** යයි සිත් ජාති සතරෙකි. නරක අයහපත් පාප ගති නසන අර්ථයෙන් **කුසල්** නම් වේ. මේ කුසල් සිත් හෙවත් කුසල කර්ම, යහපත් සැප විපාක උපදවති.

කුසලයන්ට ප්‍රතිවිරුද්ධ වූ නොයෙක් දුක් විපාක උපදවන සිත් **අකුසල් සිත්** නම් වේ.

මේ කුසල් සහ අකුසල් සිත් කර්ම සිත් යයි ව්‍යවහාරවේ. මේ කර්මයන් ගේ ඵලය හෙවත් විපාක වශයෙන් ඇතිවන සිත් **විපාක සිත්** නම්. අඹ පැලයක් රෝපණය කිරීමේ දී කැමති වන්නේ ඒ අඹ ගස වර්ධනය වී, මල් ඵල හටගෙන ක්‍රමයෙන් මේරූ, පැසුණු බවට හෙවත් පාක බවට පැමිණි අඹ ගෙඩි හෙවත්

ඵල ලබා ගැනීමය. එමෙන් ම කුසලාකුසල කර්ම කිරීමේ දී, කර්ම ශක්තිය පැසුණු බවට පැමිණීමේ දී ඒ කර්මයන්ට අනුකූලව දුක් හෝ සැප ගෙන දෙන්නා වූ **විපාක සිත්** හටගනී. කුසල කර්ම හේතුවෙන් ඉෂ්ට වූ යහපත් වූ සැප විපාක ද, අකුසල කර්ම හේතුවෙන් අනිෂ්ඨ වූ, අයහපත් වූ දුක් විපාක ද ලැබෙන්නේ ය.

කුසල් ද නොවූ, අකුසල් ද නොවූ විපාක ද නොවූ සිත් **ක්‍රියා සිත්** නම් වේ. මේ සිත්වල විපාක ශක්තියක් නැත. එය ක්‍රියා මාත්‍රයක් පමණය. වැඩි වශයෙන් ක්‍රියා සිත් පහළ වන්නේ රහතන් වහන්සේලාටය. කෙලෙස් නැසූ හෙයින් අකුසල් සිත් හටගන්නේ නැත. මතු භවයක් නැති හෙයින් කුසල් සිත් ද හටනොගනී. පෘථග්ජන වූ අපට ද ක්‍රියා සිත් 2 ක් පමණක් ඇතිවේ.

සෑම සිතකම අරමුණු රසය විඳ ගැණීමේ ශක්තියක් ඇත. එයට **වේදනාව** යයි කියනු ලැබේ.

මිහිරි වූ කායික සැප වේදනා සහිත සිත **සුඛ සහගත සිත** නම් වේ.

අමිහිරි වූ කායික දුක්ඛ වේදනා සහිත සිත **දුක්ඛ සහගත සිත** නම් වේ.

ඉෂ්ට අරමුණේ මිහිරි රසය සතුටින් විඳිනා සැප වේදනා සහිත සිත **සොමනස්ස සහගත** සිත නම් වේ.

අනිෂ්ට අරමුණේ අමිහිරි රසය නොකැමැත්තෙන් විඳින දුක් වේදනා සහිත සිත **දෙමනස්ස සහගත** සිත නම් වේ,

මධ්‍යස්ථ අරමුණේ මිහිරිද නොවූ, අමිහිරිද නොවූ රසය, කැමැත්තෙනුත් නොව, අකැමැත්තෙනුත් නොව විඳින උපෙක්ඛා වේදනා සහිත සිත උපෙක්ඛා සහගත සිත නම් වේ.

සුඛ සහගතවූ සිත කුසල විපාක වශයෙන් ලැබේ. දුක්ඛ සහගතවූ සිත අකුසල විපාක වශයෙන් ලැබේ. සොමනස්ස සහගත සිත් කුසල් අකුසල් දෙක්හිම ලැබේ. දෙමනස්ස සහගත සිත් අකුසල් සිත්හිම ලැබේ. උපෙක්ඛා සහගත සිත් ද කුසල් අකුසල් දෙක්හිම ලැබේ.

යම් කිසි විශෙෂ ගති නොහොත් ශක්තිවලින් යුක්තවූද ඒ හා සමග යෙදුනාවූද සිත් **සම්ප්‍රයුක්ත සිත්** නම් වේ.

එවැනි විශෙෂ ශක්තියක් හා නොයෙදුනු සිත් **විප්‍රයුක්ත සිත්** නම් වේ.

දිට්ඨිය, ඤාණය, පටිඝය, විචිකිච්ඡාව, උද්ධච්චය යනාදි විශෙෂ ධර්ම සිත්හි සම්ප්‍රයුක්ත වේ.

යම් කිසි මෙහෙයීමක්, උනන්දුකරවීමක්, අනුබලයක් නොමැතිව ස්වභාවයෙන් ම තියුණුව හටගන්නා සිත් **අසංඛාරික** සිත් නම් වේ.

තමන් ගේ හෝ අනුන් ගේ මෙහෙයීමෙන්, උනන්දු කරවීමෙන්, අනුබල ලැබීමෙන් හටගන්නා සිත් **සසංඛාරික සිත්** නම් වේ.

සිතත් කයත් සැපවත්ව, කටයුතු කිරීමෙහි දක්ෂ බව හා මනා පුරුද්දක් ඇති විටෙක අසඞ්ඛාරික සිත් පහළ වේ. සිතත් කයත් ක්ලාන්තව බර බවට පැමිණි විටෙක සසඞ්ඛාරික සිත් ඇති වේ.

කාම ලෝක, රූප ලෝක, අරූප ලෝකවලට අයත් වූ සංඛතවූ හෙවත් හේතූන්ගෙන් හට ගන්නා වූද භව දුකට පමුණුවන්නා වූද කාමාවචර, රූපාවචර අරූපාවචර සිත් සියල්ල ම **ලෞකික සිත්** නම් වේ.

ඉහත කී ලෝකවලින් එතරවූ නිර්වාණය අරමුණු කරන, ආර්‍ය්‍ය භාවයට පමුණුවන, මාර්ග ඵල සිත් **ලොකෝත්තර සිත්** නම් වේ.

චිත්ත චෛතසිකයන්, අරමුණෙහි ස්ථිරව පිහිටුවීමට උපකාර වන බලවත් වූ ශක්ති කීපයක් තිබේ. සිත් උපදවන අන්‍ය හේතූන් ඇතත් මේ ශක්ති හෙවත් චෛතසික ධර්මයන්ට ඇතැම් සිත් හා සම්ප්‍රයුක්තව යෙදෙන බැවින් ''**හේතු**'' යන නාමය ලැබේ. **ලෝභ, දෝෂ, මෝහ** යන මේ චෛතසික තුන අකුසල් කිරීමේ දී අකුසල් සිත් සමග යෙදෙන බැවින් එයට **අකුසල හේතුයයි** ද කුසල පක්ෂ

යෙහි යෙදෙන **අලෝභ,, අද්වේෂ, අමෝහ**, යන චෛතසික තුන **කුසල හේතු** යයි ද ව්‍යවහාර කරණු ලැබේ. ගසක් පොළොවෙහි පිහිටීමට එම ගසේ මුල උපකාර වන්නාක් මෙන් මේ හේතු සයද සිත් හා සමග යෙදීමෙන් ස්ථිරව පිහිටුවීමට උපකාර වේ. එබැවින් එයටම "**මූල**" යන නාමය ද ව්‍යවහාර වේ.

මේ හේතු සයෙන් එකක් හෝ වැඩි ගණනක් යම් සිතක යෙදුන විට ඒ සිත **සහේතුක සිතක්** වේ. මේ හේතු නොයෙදුනු සිත් **අහේතුක සිත්** නම් වේ.

සිත්වල යෙදෙන චෛතසිකයන් අතර යහපත් වූද, සැප දයක වූද කුසල පක්ෂයට අයත් චෛතසික සමූහයක් ඇත. එයට සොභන චෛතසිකයෝ යයි කියනු ලැබේ. මේ සොභන චෛතසිකයන් හා යෙදුන සිත් **සොභන** සිත් යයි ද එසේ සොභන චෛතසික නැති සිත් **අසෝභන** සිත් යයි ද ව්‍යවහාර වේ.

# කාමාවචර සිත්

එකොළොස් කාම භූමියෙහි නොහොත් කාමලෝකයෙහි බහුලව පවතින, කාමලෝකයටම අයත්, කාමයන් පිළිබඳවූ සිත් **කාමාවචර සිත්** නම්.

මේ කාමාවචර සිත් සියල්ල 54 කි. මෙයින් සිත් 30 ක් අසොභනය 24 ක් සොභනය. අසොභන සිත් 30 න් සිත් 12 ක් අකුසල් සිත්ය. ඉතිරි සිත් 18 අහේතුක සිත්ය.

අකුසල් සිත් 12 න් සිත් 8 ක් ලෝභ මූල සිත්ය. සිත් 2 ක් ද්වේෂ මූල සිත් ය. සිත් 2 ක් මෝහ මූල සිත් ය.

අහේතුක සිත් 18 න්, සිත් 7 ක් අකුසල විපාක සිත්ය. සිත් 8 ක් කුසල විපාක සිත් ය, සිත් 3 ක් ක්‍රියා සිත්ය.

සොභන සිත් 24 න් සිත් 8 ක් මහා කුසල් සිත්ය. සිත් 8 ක් මහා විපාක සිත්ය. ඉතිරි සිත් 8 මහා ක්‍රියා සිත්ය.

## අකුසල් සිත් 12.

අකුසල් කිරීමට මෝහය ප්‍රධාන හේතුවකි. මෝහය නැති විටෙක අකුසලයකුත් නැත. මෝහය නම් අන්ධකාරයක් සේ, අරමුණු ස්වභාවය මුවහ කරන ගතියයි. මෝහයෙන් මුළාවූ සිතට ඇත්ත යුත්ත, සත්‍යය අසත්‍යය, වරද නිවරද, නොදනේ. එහෙයින් ඒ සිතින් අයහපතක්, වරදක් පාපයක් මිස යහපතක් කළ නොහැකිය. එබැවින් සැම අකුසල සිතකම **මෝහ මූලය** ඇති වේ.

මෝහයෙන් මුළාවූ යම් සිතකට ඉෂ්ට වූ ප්‍රියමනාප වූ හෝ මධ්‍යස්ථ වූ හෝ, රූප ශබ්දදී අරමුණක් හමුවූවිට ඒ අරමුණෙහි ඇලීමක්, ආශා කිරීමක් ඇති වේ. එයට ලෝභයයයි කියනු ලැබේ. මේ ලෝභය ද ඇතැම් අකුසල් සිත් උපදවන හේතුවකි හෙවත් අකුසල මූලයකි. මෝහ මූලය සහිත වූ මේ සිත්වල ලෝභ මූලය ප්‍රකට බැවින් ඒ සිත් **ලෝභමූල** සිත් නම් වේ.

එසේම මෝහයෙන් මුළාවූ යම් සිතකට අනිෂ්ට වූ, අප්‍රිය වූ, නොකැමැති වූ අරමුණක් හමුවූවිට, ඒ අරමුණ නිසා යම් කිපීමක් තරහ ගතියක් ඇති වේද, එයට **දෙෂ** යයි කියනු ලැබේ. මේ දෝෂයද ඇතැම් අකුසල් සිත් උපදවන හේතුවකි. හෙවත් අකුසල මූලයකි. මෝහ මූලය සහිත වූ මේ සිත්වල දෝෂ මූලය ප්‍රකට බැවින් ඒ සිත් **දෝෂමූල** සිත් නම් වේ.

ඇතැම් විටෙක මෝහය බලවත් වීමෙන් අරමුණ නිශ්චය කරගැණිමට නොහැකි වේ. එවිට අරමුණෙහි ඇලීමක් හෝ කිපීමක් ඇති වීමට අවකාශ නැත. මේ සිත්වල අවිනිශ්චිත ස්වභාවය හෝ නොසන්සුන් ගතිය හෝ ප්‍රකට වේ. මෝහ මූලය පමණක් බලවත්ව යෙදුන හෙයින් මේ සිත් **මෝහමූල** නම් වේ.

මේ පිළිවෙළට උපදින අකුසල් සිත්, මූල හෙවත් හේතුන්ගේ යෙදීම අනුව, තුන් කොටසකට බෙදනු ලැබේ. එනම් ලෝභ මූල සිත් 8ක් ද දෝෂ මූල සිත් 2 ක් හා මෝහ මූල සිත් 2 ක් ද වේ.

දස අකුසල් ආදී කොට ඇති සෑම අකුසල කර්මයක් ම මේ අකුසල් සිත් 12 න් සිද්ධවේ. දස අකුසල කර්ම නම්:— (1) ප්‍රාණඝාතය හෙවත් සතුන් මැරීම (2) අදත්තා දනය හෙවත් අන්සතු වස්තුව සොර සිතින් පැහැර ගැනීම (3) කාම මිථ්‍යාචාරය හෙවත් කාමයෙහි වරදවා හැසිරීම (4) මුසාවාදය හෙවත් බොරුකීම (5) පිසුණාවාචා හෙවත් කේලාම් කීම (6) ඵරුසාවාචා හෙවත් පරුෂ වචන කීම. (7) සම්ඵප්පලාප හෙවත් හිස් කථා කිරීම (8) අභිධ්‍යා හෙවත් අන් සතු වස්තුවට ආශා කිරීම – දැඩි ලෝභය (9) ව්‍යාපාදය හෙවත් අනුන්ගේ විනාශය පැතීම (10) මිථ්‍යා දෘෂ්ටිය හෙවත් වැරැදි ලබ්ධියයි.

මේ අකුසල කර්ම අඞ්ග සම්පූර්ණ වීමෙන් කර්මපථ බවට පැමිණ ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක ද ගෙන දෙති. අඞ්ග සම්පූර්ණ නොවූ අකුසලකර්ම ප්‍රවෘත්ති විපාක පමණක් දෙති.

මොහය සෑම අකුසලයන්ටම මූලික හේතුවක් යයි දක්වන ලදී. අඥානකම, මෝඩකම, මුළාව අවිද්‍යාව නොදැනීම යයි කියනු ලබන්නේත් මේ මොහයටමය. මේ මොහයෙන් මුළා වූ තැනැත්තාට මිස මුළා නොවූ තැනැත්තාට අකුසල් සිත් පහළ නොවේ.

අද ලෝකයේ බොහෝ නුවණ ඇති ශාස්ත්‍ර ඥණයෙන් ඉතා දියුණු වූ උසස් යයි සම්මත අය විසින් මෙකී ප්‍රාණ ඝාත, කාම මිථ්‍යාචාර සම්ඵප්පලාප ආදී නොයෙක් අකුසල් කරන බව රහසක් නොවේ. ශරීරයට සැප දියයුතු යයි සලකා සතුන් මරා හෝ මරවා ඔවුන්ගේ මාංශ සහ වෙනත් අවයවයන් නොයෙක් අයුරින් පිළියෙල කරවා අනුභව කරති. කරවති. බිත්තර වර්ග ද බිඳ හෝ බිඳවා ආහාරය පිණිස ගනිති. ක්‍රීඩාවක් යයි සලකා මසුන් ඇල්ලීම කරති. දූකෙළියෙහි යෙදෙති. මත් පැන් ද පානය කරති. අසරණ සත්ත්වයන් ඇල්ලීමට උගුල් අටවති. දඩයම් කරති.

තවත් උසස් විද්‍යාඥයෝ මොහොතකින් සත්ත්වයන් සහිත වූ රටවල් විනාශ කරවන පරමාණු ආයුධ නිපදවති.

ධර්මය අනුව සළකතොත් මේ අය මරණින් මතු මහා අපා දුකට පැමිණෙන බව ඒකාන්තය.

මේ හැර ඇතැම් අය මිථ්‍යා දෘෂ්ටිය වැළඳ ගෙන දේව නිර්මාණය සදකාලික ස්වර්ගය යනාදී දුෂ්ටි ගනිති.

කර්මය හා කර්මවිපාක පිළිබඳ විශ්වාසයක් නැති, මෙලොව සැප විඳීම පිණිසම උත්සාහ කරන, මේ අය ධර්මය නොදත් හෙයින් නොයෙක් අකුසල් කිරීම පුදුමයට කරුණක් නොවේ. ඔව්හු තමන් නො දනුවත්වම වරදක් යයි නොදන, නොයෙක් අකුසල් කොට අපාගත වෙති. මිථ්‍යා ලබ්ධිය ගනු ලබන්නේ මේ ධර්මඥානය නැති හෙයිනි. මොහය යයි කියනු ලබන්නේ ත් මේ නො දැනීමටය. ආරම්මණ තත්ත්වය නොවැටහීම මොහය වේ.

මෙකල ධර්මය උගත් බෞද්ධයෝ ද වරද දැන දැනත් පව්කම් කරති. ඔවුන්ගේ ඒ අකුසල කර්මවල විපාක නැත්තේ නොවේ. පාපයෙන් වැළකී කුසල් කිරීමට සසර කුසල් කළ පුරුද්ද ඇතිවිය යුතුයි. එසේ සසර පුරුදු කළ ගුණ ධර්ම ඇති පුද්ගලයා නොමඟ නොගොස් ධර්මයෙහි වහා හික්මෙන්නේ ය.

මෙතැන් සිට මේ අකුසල් සිත් දෙළොස වෙන් වෙන් වශයෙන් විස්තර කරණු ලැබේ. පළමු කොට ලොභමූල සිත් අට දක්වා පසුව දෝෂ මූල සිත් දෙක ද මෝහමූල සිත් දෙක ද දක්වේ.

ලෝභ මූල සිත් අට පළමුවෙන් දැක්වීමට ද හේතු ඇත්තේය. ලෝභය වනාහී සියළුම සත්ත්වයන්ගේ පටිසන්ධිචිත්තයට පසුව පහල වන පළමුවෙනි චිත්ත වීථියේදී ම ඇතිවන ධර්මයකි. යම් සත්ත්ව යෙකුගේ යම් භවයක පළමුව පිළිසිඳ ගැනීමක් වේද, ඕහට පළමුව ඇතිවන්නේ පටිසන්ධි විපාක සිතය. එයට අනතුරුව භවාඞග සිත් 15 හෝ 16 ක් පමණ ඉපිද නිරුද්ධ වේ. මීට පසුව ඇතිවන් නේ මනොද්වාරාවජ්ජන සිතයි. අනතුරුව තමා උපන් මේ භවයට ඇළුම් කිරීමක් වශයෙන් මේ ලෝභ මූල සිත් අට දෙනා අතුරෙන් යම්කිසි සිතක්, ජවන් සිත් වශයෙන් හත්වරක් ඉපිද නිරුද්ධවේ. එයට පසුව නැවත භවාඞග' සිත් පරම්පරාව ඇති වන්නේ ය.

මෙසේ ලෝභ මූල සිත් අට දක්වා එයට පසුව දෙෂ මූල සිත් දෙක දක්වන ලදී. ලොභ මූල සිත්හි ලෝභ, මොහ යන හේතු දෙකක් ඇත්තේ ය. මොහ හේතු ඇති දෝෂ මූල සිත් දෙක එයට අනතුරුව දක්වන ලදී. එක් හේතුවක් හෙවත් මෝහ හේතුව පමණක් ඇති මෝහමූල සිත් දෙක අවසාන වශයෙන් දක්වන ලදී.

## අකුසල් සිත් දොළොස
## ලොභමූල සිත් අට

1. **සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත.**
(සැප වෙදනා සහිත වැරැදි දැකීම සමග යෙදුන මෙහෙයීමක් නැති සිත.)
2. **සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත.**
(සැප වෙදනා සහිත වැරැදි දැකීම සමග යෙදුන මෙහෙයීමක් ඇති සිත.)
3. **සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත.**
(සැප වෙදනා සහිත වැරැදි දැකීම් සමග නොයෙදුන මෙහෙයීමක් නැති සිත.)
4. **සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත.**
(සැප වෙදනා සහිත වැරැදි දැකීම සමග නො යෙදුන මෙහෙයීමක් ඇති සිත.)
5. **උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත.**
(මැදහත් වෙදනා සහිත වැරැදි දැකීම සමග යෙදුන මෙහෙයීමක් නැති සිත.)
6. **උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත.**
(මැදහත් වෙදනා සහිත වැරැදි දැකීම සමග යෙදුන මෙහෙයීමක් ඇති සිත.)
7. **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත.**
(මැදහත් වෙදනා සහිත වැරැදි දැකීම සමග නොයෙදුන මෙහෙයීමක් ඇති සිත)
8. **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත.**
(මැදහත් වෙදනා සහිත වැරැදි දැකීම සමඟ නො යෙදුන මෙහෙයීමක් ඇති සිත.)

## පළමුවෙනි ලෝභමූල සිත

අපට හමුවන අරමුණු, ප්‍රියමනාප වූද, මධ්‍යස්ථ වූද, අප්‍රිය වූ ද, අරමුණු වෙති. ප්‍රියමනාප වූ අරමුණක් හමුවූ විට ඇති වන සතුටත්, ප්‍රීතියත් නිසා සැප වෙදනා උපදී. එයට **සොමනස්ස** යයි කියනු ලැබේ. සොමනස්සය සහිත සිත සොමනස්ස සහගත සිත නම්.

සොමනස්ස සහගත සිතක් හටගැනීමට උපකාර වන වෙනත් කරුණු නම්.

1. සොමනස්ස ප්‍රතිසන්ධිකයෙකුවීම හෙවත් සොම්නස් විපාක සිතකින් උපන් කෙනෙකු වීම.
2. නො ගැඹුරු අදහස් ඇතිවීම.
3. ජරා, ව්‍යාධි, රෝග ආදි ව්‍යසන හෙවත් විපත් වලින් මිදීම යනාදී යයි.

මේ සොම්නස ඇතිවීමත් සමගම අරමුණෙහි ඇලීම ස්වභාවයකි. ඇලීම සහිත සිත ලෝභමූල සිතකි. මෙසේ අරමුණු රසය විඳීමේදී ඒ අරමුණු ස්වභාවය ගැන වැරදි දැකීම් හෙවත් වැරදි ලෙස පිළි ගැනීමක් ඇති වන්නට පිළිවන. ඇතැම් අය කුසලාකුසල කර්ම නැත, කර්ම විපාක නැත, පරලොව නැත, දනයෙහි අනුසස් නැත, සීලයෙහි අනුසස් නැත, අන් සතු දෙය, තමන්ට රුචි නම්, ගත්තාට වරදක් නැත. තමා ගේ සැප විහරණය පිණිස සතුන්මරා මස් අනුභව කිරීමෙහි වරදක් නැත. කැමැති සේ කාමයෙහි හැසිරී මෙන් වරදක් සිදුවන්නේ නැත. මත් පැන් බීමෙහි දෙසක් නැත. තමන්ගේ නිදහසට හෝ ප්‍රයෝජනයට බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස්කථා කිරීම යනාදියෙහි වරදක් නැත. යනාදී වැරදි දැකීම් හෙවත් දෘෂ්ටි ඇත්තෝ වෙති. මෙයට **මිථ්‍යාදෘෂ්ටි** යයි කියනු ලැබේ. මේ මිථ්‍යාදෘෂ්ටිය ඇතිව යම් කර්මයක් කරණ විට ඇතිවන්නේ මිථ්‍යාදෘෂ්ටිය සහිත සිතකි. දිට්ඨිය දෙවැදෑරුම් වේ:- **සම්මාදිට්ඨිය** හෙවත් යහපත් නිවැරදි දැකිමත්, **මිච්ඡාදිට්ඨිය** හෙවත් අයහපත් වැරදි දැකීමත් ය. සම්මාදිට්ඨිය ඇති වන්නේ පිරිසිදු කුසල් සිතකය. මිථ්‍යාදෘෂටිය යෙදෙන්නේ අකුසල් සිත්හි පමණය. එබැවින් අකුසල් සිත් ගැන කියනවිට දිට්ඨිය යයි කියනු ලබන්නේ මිච්ඡාදිට්ඨියට බව දත යුතුයි. මේ දිට්ඨිය හා සමග යෙදුන සිත **දිට්ඨිගත සම්පයුත්ත** සිත නම් වේ.

මේ දිට්ඨිගත සම්පයුත්ත සිත ඇතිවීමට වෙනත් කරුණු ද ඇත. එනම්:—

1. මිච්ඡාදිට්ඨිය ඇත්තවුන් ආශ්‍රය කිරීම.
2. ධර්මයෙන් වෙන්ව වාසය කිරීම.
3. නොමනා වැරැදි කල්පනා බහුල කොට ඇතිවීම.
4. නුනුවණින් මෙනෙහි කිරීම, යනා දී යයි.

තවද, මේ සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සිත යම්කිසි මෙහෙයීමක්, අනුබලයක්, උනන්දු කරවීමක් නැතිව ස්වභාව යෙන්ම තියුණුව හටගන්නේ නම්, ඒ සිත අසංඛාරික සිතක් වේ. එවිට මේ පළමුවන සිත සොමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිතකි.

සිතක් අසංඛාරික වීමට උපකාරවන වෙනත් කරුණු නම්:—

1. අසංඛාරික විපාක සිතකින් ප්‍රතිසන්ධිය ගත් බවය.
2. සිත හා කය නිරෝගීව පැවැත්වීමය.
3. ඉවසීම බහුල බවය.
4. කටයුත්තෙහි මනා පුරුද්දක් ඇති බවය.
5. ඍතු, භොජන ආදිය යොග්‍ය පරිදි ලැබීම යනාදීයයි

දස අකුසල් අතුරෙන්, සොරකම් කිරීම, කාමමිථ්‍යාචාරය මුසාවාදය, පිසුණාවාචය, සම්ඵප්පලාපය, අභිධ්‍යාව සහ මිච්ඡාදිට්ඨිය යන අකුසල් හත ලොභමූල සිතින් සිදුවිය හැකි. එයින් ද කාමමිථ්‍යා චාරය, අභිධ්‍යාව සහ මිච්ඡාදිට්ඨිය ලොභ මූල සිතකින් මිස අන් සිතකින් සිදු නොවේ. එබැවින් මේ අකුසල් තුන ලොභමූල සිත් වලට නියතය. අනිත් අකුසල් සතර අනියතය.

## දෙවැනි ලොභමූල සිත

මේ දෙවැනි ලොභමූල සිත පළමුවෙනි ලොභ සිතට බොහෝ සෙයින් සමානය. වෙනස නම්:—සසංඛාරික වීමය. මෙහිදී මෙහෙයීමක්, අනුබලයක් උනන්දු කරවීමක් ඇතිවම සිත

හටගන්නේ ය. මේ සිතේ මැලි බවක්, බර බවක් ඇති වීමට අවකාශ තිබේ. ථිනමිද්ධය නම් වූ චිත්ත චෛතසික–යන්ගේ මැලි බව ඇති වන්නේ සසංඛාරික අකුසල් සිත්හි පමණකි.

### තුන්වැනි ලෝභමූල සිත

මේ සිතේ දිට්ඨිය හෙවත් වැරදි දැකීමක් යෙදී නැති බැවින් දිට්ඨිගත විප්පයුත්ත නම් වේ. අනිකුත් කරුණු වලින් පළමුවැනි ලොභමූල සිතට සමානය. කර්මඵල විශ්වාස නො කිරීමක් මේ සිතේ නැත. ප්‍රාණඝාත ආදී අකුසල කර්මවල අනිෂ්ඨ දුක් විපාක හා දන, සීල, භාවනාදී කුසල කර්මවල අනුසස් ද නො දන්නේ නොවේ. කර්මඵල අදහන්නේ වී නමුත්, ආශාව හෙවත් ලොභය මැඩ පැවැත්වා ගැනීමට නොහැකි බැවින් අකුසල් කරන්නේ ය. මෙය බොහෝ සෙයින් සසර පුරුද්ද නිසා ද ඇති වේ. තමන්ට ලාභ ප්‍රයෝජනය පිණිස ද, හිරිහැර කරදර වලින් මග හැරීම පිණිස ද, මිථ්‍යාදෘෂ්ටිය වැළඳ නොගත් අයට අකුසල් කිරීමේ දී මේ සිත පහළ වේ.

### සතරවැනි ලොභමූල සිත

මෙය දෙවැනි ලොභමූල සිතට බොහෝ සෙයින් සමානය. වෙනසනම් තුන්වැනි සිතෙහි මෙන් දිට්ඨිගත විප්‍රයුක්ත වීමය.

### පස්වැනි ලොභමූල සිත

මේ සිතට හමුවන අරමුණ මධ්‍යස්ථ අරමුණකි. එය ප්‍රියමනාප ද නොවේ. අප්‍රිය ද නොවේ. එහෙයින් සොම්නසත්, දොම්නසත් ඇතිවන්නට අවකාශ නැත. එබැවින්, මේ සිතෙහි වෙදනාව උපෙක්ඛා වෙදනාව නිසා ඒ සිත උපෙක්ඛා සහගත සිතක් වේ. සිතක් උපෙක්ඛා සහගත වීමට උපකාර වන වෙනත් කරුණු නම්:—

1. උපෙක්ඛා සහගත සිතකින් උපන් කෙනෙකු වීම.
2. ගැඹුරු අදහස් ඇති බව.
3. රෝග පීඩා ආදී ව්‍යසනයන්ගෙන් මිදීම යනාදි යයි.

මේ පස්වැනි ලොභමූල සිත අනිකුත් කරුණු වලින් පළමු වැනි ලොභමූල සිතට සමානය.

### සවැනි ලොභමූල සිත

මේ සිත දෙවැනි ලොභමූල සිතට බොහෝසෙයින් සමානය. වනස නම් මේ සිතේ වේදනාව සොම්නස නොව උපෙක්ඛා වීමය.

### සත්වැනි ලොභමූල සිත

මේ සිත තුන්වැනි ලොභමූල සිතට සමානය. වෙනස නම් වෙද නාව උපෙක්ඛා වීමය.

### අටවැනි ලොභමූල සිත

මේ සිත සතරවැනි ලොභමූල සිතට සමානය. වෙනස නම් වෙදනාව උපෙක්ඛා වීමය.

### ද්වේෂ මූල සිත් දෙක

1. **දෞමනස්ස සහගත පටිඝසම්පයුත්ත අසංඛාරික සිත** (දුක් වෙදනා සහිත පටිඝය හෙවත් කිපීමෙන් යුක්ත වූ මෙහෙයීමක් නැති සිත.)

2. **දෞමනස්ස සහගත පටිඝසම්පයුත්ත සසංඛාරික සිත** (දුක් වෙදනා සහිත පටිඝය හෙවත් කිපීමෙන් යුක්තවූ මෙහෙයීමක් ඇති සිත.)

### පළමුවෙනි ද්වේෂ මූල සිත

අමනාප වූ, අප්‍රිය වූ, නො කැමැති වූ අරමුණක් හමුවූ විට, ඒ අරමුණ නිසා සිතෙහි යම් අප්‍රසන්න බවක්, කිලිටි බවක් , දුක් සහිත බවක් හටගනී නම් එකල්හි **දෞමනස්ස** වෙදනාව උපදී.

මේ අරමුණ තමන් ට සතුරු බැවින්, එය නැති කිරීමට, නැසී මට පෙළීමට, කැමැති වේ. එයට **පටිඝය** ක්‍රෝධය, තරහව යයි කියනු ලැබේ. දෞම්නස් වේදනා සහිත වූ පටිඝය හා යෙදුන සිත

**දෙමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත** සිතය. මෙහෙයීමක්, අනු බලයක්, උනන්දු කරවීමක් නැතිව හටගන්නා මේ සිත අසංඛාරික සිතක් වේ.

මේ පටිඝ සිත ඇති වීමට ප්‍රධාන කරුණු නම්:

1. අමනාප අරමුණක් හමුවීම.
2. නිතර කිපෙන බව සහ තරහ ගති ඇති බව.
3. නුගත් කම.
4. අරමුණ ගැන දුර දිග කල්පනා නො කිරීම.

පටිඝ සිත් ඇති වූ විට, යහපත අයහපත, වරද නිවරද, නො පෙනේ. නිතරම සිතෙහි තැවීම ඇති කරන්නේ ය. කණගාටු වත්, සොකයත් ඇති වීමෙන් ශරීරයෙහි වියළි ස්වභාවයක් ද ඇති වේ. වර්ණය ද වෙනස් වේ. සිත තුල තැවීම ඉවසා ගත නො හැකිව හඬන්නට ද පටන් ගන්නේ ය. තද පරුෂ වචන ද මුවින් පිට වේ. අත් වලින් තම හිසටත් පපුවටත් ගසා ගනී. ළඟ තිබෙන යමක් රැගෙන, සමීපයෙහි සිටි කෙනෙකුට හෝ වස්තුවකට පහර දෙයි. පරපණ නැසීමටත් සිය පණ හානිකර ගැනීමටත් මෙයම හේතු වේ.

කෙනෙක් ජරාවට පැමිණෙන විට ද සොක කරන්නේ ය. නොයෙක් ශරීරාබාධ ඇතිවූ විටද, හිතවත් නෑ මිතුරන්ගේ විපතෙහිද, මරණයෙහි ද, අප්‍රියන් හමුවූ විට ද, ප්‍රියයන්ගෙන් වෙන් වූ විට ද, තමන් කැමති දේ නොලැබීමේදී ද, මේ පටිඝසිත් උපදී

තවද, අනුන්ගේ සම්පත, දියුණුව නොරුස්නා, නො ඉවසන බවයයි කියන ලද **ඊෂ්‍යාවද,** තම සම්පත අනුන්ට නො වේවායි සැඟ වීම ඇති මසුරු බව හෙවත් **මච්ඡරිය ද**, කළ වරද හා නො කළ යහපත ගැන පසුව තැවීම නම් වූ පසුතැවිල්ල හෙවත් **කුක්කුච්චයද** මේ ද්වේෂ සිත්හිම හට ගනී. මරණාසන්න කාලයේදී ද මේ සිත් බහුලව හට ගැනීමෙන් සතර අපා දුකට ද පමුණුව නු ලැබේ.

**ප්‍රාණඝාතය**, ප්‍රාණවධය, සත්ත්ව හිංසා කිරීම, **ඵරුෂ** වචන කීම අනුන් නැසේවා යි සිතන **ව්‍යාපාදය** මේ පටිඝ සිතෙහි නියතය.

සොරකම් කිරීම, බොරු කීම, කේලාම් කීම සහ සම්ඵප්පලාපය නම් වූ හිස් කථා කිරීම යන අකුසල් සතර මේ සිතෙහි අනියතය.

සතෙකුගේ මස් කෑමට ඉතා ආශාවෙන් සිටින විට ලොභ සිත් උපදී. නමුත් සත්ත්වයා ජීවත්ව සිටින තාක් කල් තම අදහස ඉටු කර ගැනීමට නුපුළුවන. සත්ත්වයා නො මළහොත් මස් කෑමකුත් නැත. ඒ නිසා තම අදහස ඉටුකර ගැනීමට බාධා කරන මේ සත්ත්ව යාගේ ප්‍රාණය සිඳීමට හෙවත් සත්වයා මැරීමට කැමැත්ත ඇති වේ. මෙතැන් පටන් ඔහුට ඇති වන්නේ පටිඝ සිත් ය. එවිට ආයුධයක් රැගෙන තම අතින් හෝ අනුන් ලවා හෝ ඒ සත්ත්වයාගේ ප්‍රාණයත් සිඳ දමන්නේ ය. ප්‍රාණඝාත අකුසල කර්ම පථය මේ පටිඝ සිතින් සම්පූර්ණ වන්නේ ය.

## දෙවැනි දෙෂමූල සිත

දෙවැනි දෙෂමූල සිත ද පළමුවෙනි දෙෂමූල සිතට බොහෝ සෙයින් සමානය. වෙනස නම් මේ සිතෙහි මෙහෙයීමක් අනුබල යක් උනන්දු කරවීමක් ඇති නිසා සසඞ්ඛාරික වීමය.

පෘථග්ජන පුද්ගලයන්ට වැඩි වශයෙන් පහළවන්නේ මේ පටිඝ සිත් බව අවබෝධ කරගෙන එයින් වැළකීම පිණිස සිහිනුව ණින් යුක්තව වාසය කළ යුතුයි.

## මොහමූල සිත් දෙක

1. **උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත** (මැදහත් වෙදනා සහිත වූ විචිකිච්ඡාව හෙවත් සැකය සමග යෙදුන සිත.)
2. **උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත** (මැදහත් වෙදනා සහිත වූ උද්ධච්චය හෙවත් නොසන්සුන්කම සමග යෙදුන සිත.)

මොහය බලවත්වූවිට, ප්‍රිය අරමුණ ප්‍රිය වශයෙන් ගැනීමට ද අප්‍රිය අරමුණ අප්‍රිය වශයෙන් ගැනීමට ද නොහැකි වේ. එවිට සොම්නස හෝ දෙම්නස ඇති වීමට අවකාශ නැත. ඒ වෙනුවට ඇතිවන්නේ උපෙක්ඛා හෙවත් මැදහත් වෙදනාවකි.

එමෙන්ම මොහය අධික වීමෙන්, අරමුණු කරන දෙය පිළිබඳව විනිශ්චයක් කරගන්නට නොහැකි වීමෙන් සැකය අවිශ්වාසය ඇතිවේ. එයට **විචිකිච්ඡාව** යයි කියනු ලැබේ. මේ විචිකිච්ඡාව කුසල් කිරීමට බාධා කරණ බැවින් එය නීවරණයක් ද වේ.

නොදන්නා යම් කරුණක් සම්බන්ධව සිතා, තමන්ට එය නිසි අන්දමින් විමසා ගැනීමට නොහැකි වීමෙන් ඇති වන සැකය, නීවරණ විචිකිච්ඡාව නොවේ. මෙහි දී අකුසල් වශයෙන් දක්වනු ලබන්නේ නීවරණ සැකයයි.

**විචිකිච්ඡාව** වනාහී බුද්ධාදි අට තැන සැකය යයි කියන ලදී. එනම්:—

1. බුදුරජාණන්වහන්සේ කෙරෙහි සැක කිරීම. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් යුත් ශරිරයක් ඇති කෙනෙකු විය හැකි ද, සියල්ල දත් ඥනයක් හෙවත් සර්වඥතාඥනයක් ඇත්ද, නැත් ද යනාදී වශයෙන් බුදුන්වහන්සේ කෙරෙහි සැක කිරීම.

2. **ධර්මය** ගැන සැක කිරීම – සතරමග, සතරඵල, නිර්වාණ නම් වූ නවලොකොත්තර ශ්‍රී සද්ධර්මයක් ඇත් ද නැත්ද යනා දී වශයෙන් ධර්මය කෙරෙහි සැක කිරීම.

3. **සංඝයා** කෙරෙහි සැක කිරීම – මාර්ගස්ථ පුද්ගලයන් සතර දෙනාය, ඵලස්ථ පුද්ගලයන් සතර දෙනයයි අනන්ත ගුණ ඇති අෂ්ටායඨ පුද්ගල මහාසංඝරත්නයක් ඇත් ද නැත්ද, සංඝරත්නය කෙරෙහි සිව්පස පිදීමෙහි අනුසස් ඇත් ද නැත් ද යන ආදී වශයෙන් සැක කිරීම .

4. **ශීලයෙහි** සැක කිරීම. කුඩු මහත් ශීලයන් රැකීමෙහි අනුසස් ඇත් ද නැත්දැ යි සැක කිරීම.

5. **පූර්වාන්තය** හෙවත් පෙර භවය ගැන සැක කිරීම. පෙර භවයක් අපට තිබුනා ද නැත් ද, මේ සත්ත්වයෝ අතීතයෙහි සිටියාද නැත් ද, යනාදී වශයෙන් සැක කිරීම.

6. **අපරාන්තය** හෙවත් මතු භවය ගැන සැක කිරීම. මරණින් මතු නවත් උත්පත්තියක් ඇත්ද නැත් ද යන සැකයයි.

7. **පූර්වාන්ත අපරාන්ත** දෙක්හි සැකය – පෙර භවය හා මතු භවය ගැන සැක කිරීමය.

8. **පටිච්ච සමුප්පාද ධර්ම** පිළිබඳ සැකය – අවිජ්ජා හේතුවෙන්ම සංස්කාරයෝ ඇතිවෙත්ද නැත්ද, යනාදී වශයෙන් හේතු ඵල ධර්මයන් ගැන උපදනා සැකයයි.

මේ ආදී වශයෙන් අට තැන සැක කිරීම නම් වූ විචිකිච්ඡාව සමග යෙදුන සිත විචිකිච්ඡා සම්පයුක්ත සිත නම් වේ.

## දෙවැනි මොහමූල සිත

දෙවැනි මොහමූල සිත උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතයි. උද්ධච්චය නම් සිතේ නොසන්සුන් බවයි. යම් අරමුණක්ගෙන සිතක් උපන් කල්හි ඒ සිතේ භංගය හෙවත් විනාශය දක්වාම ඒ අරමුණ අත් නොහරින්නේය. එය එකග්ගතා ශක්තියයි. කලබල ස්වභාවයක් නොමැතිව මේ එකග්ගතාවය දිගටම පවත්වාගන්නට හැකිවුවොත් සමාධිය ඇති කරගත හැකිවේ. යම් හෙයකින් කලබල ස්වභාවයක් ඇති වී නම් එකග්ගතා බලය හීනවීමෙන්, චංචල වීමෙන් ඒ සිතේ අනිකුත් සම්ප්‍රයුක්ත ධර්මයන්ද කලබල කොට නිසිසේ අරමුණ ගන්නට අවකාශ නොදී නොමගට හරවන්නේය. මොහය කරණකොට ගෙණ ඇතිවන මේ නොසන්සුන් කම කුසලය වළක්වා අකුසල පක්ෂයට පමුණුවන්නේය. කුසල් කිරීමට සිත සන්සුන් විය යුතුය. එබැවින් සෑම අකුසල් සිතකම නොසන්සුන් බව හෙවත් උද්ධච්චය ඇති වේ.

මොහය බලවත් වූ කල්හි මේ නොසන්සුන් කමද බලවත් වේ. ඒහෙතුවෙන් අරමුණ නිශ්චලව ගන්නට සම්ප්‍රයුත්ත ධර්මයන්ට ඉඩ නොදෙන්නේ ය. එවිට ඒ සම්ප්‍රයුක්ත ධර්මයන්ගෙන් කෙරෙන කටයුතු ඉටුකරන්නට නොහැකි වීමෙන් නොසන්සුන් බවම ප්‍රකට වේ, නැතහොත් උද්ධච්චය ප්‍රකට වේ. මෙසේ ඇති කල්හි යම්කිසි කරුණක් ගැන නිශ්චලව සිතන්නට ඔහුට නුපුළුවන.

බලවත් උද්ධච්චය හා සමග යෙදුන සිත උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත නම්වේ. මේ සිතෙහි වෙදනාව ද උපෙක්ඛා වෙදනාවවේ.

මේ මොහමූල සිත් දෙක, මෙහෙයීමක්, අනුබලයක්, උනන්දු කරවීමක් නොමැතිවම හටගන්නා බැවින් අසංඛාරික සංඛ්‍යාවට ගැනෙන්නේ ය.

## අහේතුක සිත් අටළොස

මේ අටළොස් අහේතුක චිත්තයන් අතුරෙන් අකුසල විපාකයෝ සත්දෙනෙකි. කුසල විපාකයෝ අටදෙනෙකි. ක්‍රියා චිත්තයෝ තිදෙනෙකි.

පළමුකොට මේසිත් අටළොසෙහි සාමාන්‍ය අර්ත්ථය දක්වා, පසුව මේ සිත් අහේතුක වන සැටිත්, විපාක වන සැටිත්, ක්‍රියා වන සැටිත් විස්තර කරණු ලැබේ. මෙහි විස්තර දැක්වීමත්, තේරුම් ගැණීමත්, එතරම් පහසු නොවන බැවින් ඉතා හොඳින් ඉගෙන සිත්හි දරාගැණීමට උත්සාහ කටයුතුයි.

## අහේතුක අකුසල විපාක සිත් සත

1. **උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත.**
   (මැදහත් වෙදනා සහිත රූප දක්නා සිත.)

2. **උපෙක්ඛා සහගත සොතවිඤ්ඤාණ සිත.**
   (මැදහත් වෙදනා සහිත ශබ්ද අසන සිත.)

3. **උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණ සිත.**
   (මැදහත් වෙදනා සහිත ගන්ධය දැනගන්නා සිත.)

4. **උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණ සිත.**
   (මැදහත් වෙදනා සහිත රස දැන ගන්නා සිත.)

5. **දුක්ඛ සහගත කාය විඤ්ඤාණ සිත.**
   (දුක් වෙදනා සහිත ස්පර්ශය දැනගන්නා සිත.)

6. **උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත.**
(මැදහත් වෙදනා සහිත අරමුණ පිළිගන්නා සිත.)

7. **උපෙක්ඛා සහගත සන්තීරණ සිත.**
(මැදහත් වෙදනා සහිත අරමුණ විමසා තීරණය කරණ සිත.)

## අහේතුක කුසල විපාක අට

1. **උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිත.**
2. **උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණ සිත.**
3. **උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණ සිත**
4. **උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණ සිත.**
5. **සුඛ සහගත කාය විඤ්ඤාණ සිත.**
(සැප වෙදනා සහිත ස්පර්ශය දැනගන්නා සිත.)
6. **උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත.**
7. **උපෙක්ඛා සහගත සන්තීරණ සිත.**
8. **සොමනස්ස සහගත සන්තීරණ සිත.**
(සැප වෙදනා සහිත අරමුණ විමසා තීරණය කරණ සිත.)

## අහේතුක ක්‍රියා සිත් තුන

1. **උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන සිත.**
(මැදහත් වෙදනා සහිත පඤ්චද්වාරයෙන් ගන්නා අරමුණු වලට සිත් පරම්පරාව යොමු කරණ සිත.)

2. **උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන සිත.**
(මැදහත් වෙදනා සහිත මනොද්වාරයෙන් ගන්නා අරමුණු වලට සිත් පරම්පරාව යොමුකරණ සිත.)

3. **සොමනස්ස සහගත හසිතුප්පාද සිත.**
(සැප වෙදනා සහිත සිනහ පහළකරණ සිත.)

මෙහි දක්වනලද අහේතුක අකුසල විපාක හත හා කුසල විපාක අට අතුරෙන් චක්ඛු විඤ්ඤාණාදි වශයෙන් විඤ්ඤාණ නමින් සිත් දසයකි. ඒ දහයට ද්විපඤ්ච විඤ්ඤාණයෝයයි කියනු ලැබේ.

මේ සිත් දහය හැර සම්පටිච්ඡනයෝ දෙදෙනෙක් සහ සන්තීරණයෝ තිදෙනෙක් ද වෙති. මේ සිත් බොහොසෙයින් සමාන බැවින්; සමාන සිත් එකට ගෙණ විස්තර කරනු ලැබේ.

## චක්ඛු විඤ්ඤාණ සිත් දෙක

මෙ චක්ඛු විඤ්ඤාණ සිත් උපදින්නේ චක්ඛුප්‍රසාද වස්තුවෙහි ය. චක්ඛු ප්‍රසාද වස්තුව නම් ඇසතුල පිහිටා තිබෙන, කර්ම හේතුවෙන් හටගත්, විශෙෂ රූප සමූහයකගේ ඔපය හෙවත් පැහැය ගෙණ දෙන ශක්තියකි. මේ ශක්තියට ප්‍රසාදරූපය යයි කියනු ලැබේ. චක්ඛු විඤ්ඤාණ නම් සිත ඉපදීමට ස්ථාන වන බැවින් මේ ප්‍රසාද රූපයට චක්ෂුප්‍රසාද වස්තුව යයි ද නම් වේ. මේ චක්ඛු විඤ්ඤාණය ඉපදීමට උපකාර වන රූප අරමුණ යයි කියනු යේ ඇසින් දකින රූප වලට ය. රූප සටහන දක්වන වර්ණය චක්ෂුප්‍රසාද වස්තුවෙහි දී හමුවීමෙන්, හැපීමෙන් චක්ඛු විඤ්ඤාණ නම් සිත හටගනී. මේ චක්ඛු විඤ්ඤාණය ද චිත්ත පරම්පරාවට අයත් එක් සිතකි. හෘදයවස්තුරූප ආශ්‍රය කරගෙන පවතින මේ චිත්ත පරම්පරාවට, යම් රූප අරමුණක් ගැණීමට කැමැත්ත ඇතිවෙතොත්, භවාඞ්ග සිතෙහි අරමුණ ක්‍රම යෙන් ඉවත්ව, සිත්පරම්පරාව අළුත් අරමුණට යොමුකරවන සිතක් ඇතිවී, තදනන්තරව, මේ චක්ෂු ප්‍රසාද වස්තුවෙහි දී හමුවන වර්ණය හෙවත් රූප අරමුණ ගෙන චක්ඛුවිඤ්ඤාණ සිත උපදී. මේ අරමුණ ගනු ලබන්නේ චක්ෂුප්‍රසාද වස්තුව නොව චක්ඛු විඤ්ඤාණ නම් වූ සිත බවද, අරමුණ හමුවන්නේ චක්ඛුප්‍රසාද වස්තුවෙහි බවද දතයුතුය.

ඇසට හමුවන රූප අප්‍රමාණය. ඒ රූප සියල්ලම දුටුවා යයි කීමට නුපුළුවන. යම් රූප සමූහයක් දකීමට කැමැත්ත ඇතිවෙතොත්, ඒ පිළිබඳව මනසිකාරය ඇති වීමෙන් උවමනා කළ රූප අරමුණ පමණක් ගෙන චක්ඛු විඤ්ඤාණයෝ පහළ වෙති. මේ රූපය දකීමට ආලෝකය ද උපකාර විය යුතුයි. ආලෝකය නොමැති නම් වර්ණය ප්‍රකට නොවේ. අන්ධකාරය පවතින විට එළියක් නැතිව රූප බැලීමට නොහැකි වන්නේ ඒ හේතුවෙනි.

චක්ඛු විඥ්ඥාණ සිත මෙසේ චක්ඛුප්‍රසාද වස්තුවෙහි ඉපිද නිරුද්ධ වීමෙන් පසු ඒ අරමුණම ගෙන ඇතිවන සිත් පෙලේ හෙවත් චිත්ත වීථියේ ඉතිරි සිත් පෙර මෙන් හෘදය වස්තු රූපය ආශ්‍රය කරගෙන මිස චක්ඛු ප්‍රසාද වස්තුවෙහි හට නොගන්නා බව දත යුතු. රූප සටහන ඇඳින ගැනීමට මෙවැනි චිත්ත වීථි කීපයක් ඇතිවිය යුතුයි. මේ චක්ඛු විඥ්ඥාණ නම් වූ සිත ඉපදීමට උපකාර වන කරුණු නම්:—

1. චක්ඛු ප්‍රසාදයාගේ නොපිරිහීම හෙවත් චක්ෂුප්‍රසාද වස්තුව යහපත්ව පිහිටීම,
2. රූප අරමුණක් හමුවීම,
3. ආලොකයෙන් රූපයට උපකාර ලැබීම,
4. මනසිකාරය.

ඇසට හමුවන මේ රූපයෝ ඇසතුල නොව පිටත පවතින රූප වෙති. ඒ රූප, තුබූ තැනින් අවුත් ඇසෙහි නොහැපෙන්නේය. ඈත තිබෙන රූපයන්ගේ වර්ණය හෙවත් ඡායාව පමණක් ඉතා සියුම් ලෙසින් ඇසට හමුවේ. ඉතා සියුම් වූ මේ වර්ණය, එලෙසම සියුම් වූ චක්ඛුප්‍රසාද වස්තුවෙහි හැපෙන්නේ ඉතා සියුම් ලෙසටය. පුළුන් පෙදක් පුළුන් පෙදක් හා ගැටෙන්නාක් මෙනි. එහෙයින් චක්ඛු විඥ්ඥාණ සිත අරමුණු රස විඳීමේදී සැප හෝ දුක් වේදනා ඇතිවීමට නුපුළුවන. උපෙක්ඛා වෙදනාව ඇතිවන්නේ ඒ වස්තු දුර්වලතාව හා කෘත්‍ය දුර්වලතාව ද ඇති හෙයිනි. අරමුණ හොඳහැටි අඳුනගත් පසු ඒ අරමුණ ප්‍රියමනාප නම් සොම්නස් සිත් ජවන් වශයෙන් පසුව පහළවේ. අප්‍රිය අරමුණක් නම් දොම්නස් හෙවත් පටිඝ සිත් පහළ වේ. එබැවින් මේ සිතට උපෙක්ඛා සහගත චක්ඛු විඥ්ඥාණ යයි කියනු ලැබේ.

ඉෂ්ටාරම්මණයක් හෙවත් ප්‍රියමනාප වූ, සැපදයක වූ, අරමුණක් හමුවූවිට අහේතුක කුසල විපාක චක්ඛු විඥ්ඥාණ සිත ද, අනිෂ්ටාරම්මණ හෙවත් අප්‍රිය වූ, දුක්ඛදයක අරමුණු හමුවූ විට අහේතුක අකුසල විපාක චක්ඛු විඥ්ඥාණ සිත ද ඇතිවන්නේය. මෙසේ ඉෂ්ටානිෂ්ට වශයෙන් අරමුණු බෙදනු ලබන්නේ මධ්‍යස්ථ පුද්ගලයන්ගේ පිළිගැණීමේ සැටියටය. මධ්‍යස්ථ පුද්ගලයන් විසින් බොහෝ කලක

සිට ඉෂ්ට යයි පිළිගන්නා ලද අරමුණු ඉෂ්ට නම් වේ. සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස ආදී වශයෙන් අරමුණු පිළිගන්නා ස්වභාවය වෙනස් වීමෙන්, පෙරලීමෙන්, ඉෂ්ට අරමුණු අනිෂ්ට වශයෙන් ද, අනිෂ්ට අරමුණු ඉෂ්ට වශයෙන්ද සැළකීමට අවකාශ තිබේ. ඇතැම් සත්ත්වයන්ට අසූචි සෙම්, සොටු ආදී අනිෂ්ට අරමුණු, සඤ්ඤා විපල් ලාස වශයෙන් පෙරළි ඉෂ්ටාලම්බන වශයෙන් වැටහී සොමනස් ජවන් උපදී. ඉෂ්ටාලම්බන වූ බුද්ධ රූපාදිය ද චිත්ත විපල්ලාසාදී වශයෙන් පෙරලී අනිෂ්ටාලම්බන වශයෙන් වැටහී දොම්නස් ජවන් උපදී. ඇතැම් විට ඉෂ්ටාලම්බනය ද එක් ද්වාරයකට ඉෂ්ට වශයෙන් ද අනික් ද්වාරයකට අනිෂ්ට වශයෙන් ද වැටහේ. කඩු දුනු ආදිය චක්ඛුද්වාරයට ඉෂ්ට වේ. නමුත් කායද්වාරයට අනිෂ්ඨ වේ. එමෙන්ම කායද්වාරයට ඉෂ්ට වූ සියුම් ද්‍රව්‍යයක් දුර්ගන්ධය නිසා ඝාණද්වාරයට අනිෂ්ට වේ. මෙසේ ඉෂ්ටානිෂ්ටාලම්බන විපල්ලාසාදි වශයෙන් හෝ ද්වාරවශයෙන් හෝ වෙනස් විය හැකි බව දත යුතුය. සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයන්ට අසූචි ආදී දර්ශනයෙන් අකුසලවිපාක චක්ඛු විඤ්ඤාණය ඉපදී, එයට අනතුරුව දෙෂමූල අකුසල් සිත් උපදී. ඒ අරමුණම සූකර ආදි සත්ත්වයන්ට හමු වූ කල්හි අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණය ඉපිද එයට අනතුරුව ලෝභමූල අකුසල් සිත් උපදී. නුවණ ඇති පුද්ගලයෙකුට ඒ අසූචි දර්ශනයෙන් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණය ඇතිවී, මාගේ ශරීරය තුලද මෙබඳු අසූචි ඇත්තේ යයි පිළිකුල මෙනෙහිකිරීමට හැකි වීනම්, ඕහට කාමාවචර ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් උපදී. බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලාට ඒ දර්ශනයෙන් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණය ඉපිද එයට අනතුරුව කාමාවචර මහා ක්‍රියා සිත් උපදී.

## ශොත විඤ්ඤාණ සිත් දෙක

මේ සිත් උපදින්නේ සොතප්‍රසාද වස්තුවෙහිය. එය පිහිටා තිබෙන්නේ කන් බිල ඇතුළෙහිය. චක්ෂුප්‍රසාදවස්තුව ගැන කරණ ලද විස්තරය අනුව මෙහි විස්තරය ද දත යුතුයි. ශබ්ද අරමුණ කන් සිදුරින් ඇතුල්වී ශ්‍රොතප්‍රසාද වස්තුවෙහි වදින්නේ ය. එවිට ඒ සොතප්‍රසාද වස්තුවෙහි ශබ්දය දැන ගන්නා සොත විඤ්ඤාණ නම් සිත පහළ වේ. ශබ්ද අරමුණත්, සොතප්‍රසාද වස්තුරූපයත් ඉතා සියුම් බැවින් ද දුර්වල බැවින් ද, කෘත්‍යයන් දුර්වල බැවින් ද, ඒ

සිතෙහි හටගන්නා වෙදනාව උපෙක්ෂා වෙදනාම වේ. සොත විඤ්ඤාණය ඉපදීමට උපකාරවන කරුණු නම්:—

1. සොතප්‍රසාද වස්තුවගේ නොපිරිහීම.
2. ශබ්දලම්බනයක් හමුවීම.
3. කන්සිදුර අවහිර නොවී, විවෘතව, අවකාශය පැවතීම.
4. මනසිකාරය.

මිහිරිවූද, ප්‍රියමනාපවූද, ශබ්ද අරමුණක් හමුවන්නේ කුසල විපාකයක් වශයෙනි. එවිට අහේතුක කුසලවිපාක සොතවිඤ්ඤාණය උපදී. අකුසල විපාක වශයෙන් හමුවන අමිහිරිවූද, අප්‍රියවූද, අරමුණ ගෙණ අහේතුක අකුසල විපාක සොත විඤ්ඤාණය උපදී.

## ඝාණ විඤ්ඤාණ සිත් දෙක

ඝාණ විඤ්ඤාණ යනු ගන්ධය දැනගන්නා සිතට නමෙකි. නාසය තුල පිහිටි ඝාණප්‍රසාද. වස්තුව ආශ්‍රයකරගෙන ඝාණ විඤ්ඤාණ සිත පහළවේ. කුසල විපාකයක් වශයෙන් ලැබෙන මිහිරි සුවඳ ආදිය අරමුණුකරගෙන අහේතුක කුසලවිපාක ඝාණ විඤ්ඤාණය ඇතිවේ. අකුශල විපාක වශයෙන් ලැබෙන අමිහිරි දුගඳ අරමුණු නිසා අහේතුක අකුසල විපාක ඝාණ විඤ්ඤාණය ලැබේ. ගන්ධ අරමුණ ඝාණ ප්‍රසාද වස්තුරූපයන්හි ගැටෙන කල්හි වස්තු දුර්වලතා කෘත්‍ය දුර්වලතාවන් නිසා ඝාණ විඤ්ඤාණ සිතෙහි වේදනාව ද උපෙක්ඛා වේ. ගන්ධය දැනීමට වාතය හෙවත් වායො ධාතුහුගේ උපකාරය අවශ්‍යය. වායො ධාතුව නැති කල්හි ගන්ධය නොපැතිරෙන්නේ ය.

ඝාණ විඤ්ඤාණය ඉපදීමට උපකාර වන කරුණු නම්:—

1. ඝාණ ප්‍රසාදයාගේ නොපිරිහීම.
2. ගන්ධාලම්බනයක් ලැබීම.
3. නාසිකා සිදුරෙන් වැදගන්නා වායො ධාතුහුගේ උපකාරය ලැබීම.
4. මනසිකාරය.

## ජිව්හා විඤ්ඤාණ සිත් දෙක

රස දැනගන්නා සිත ජිව්හා විඤ්ඤාණය නම් වේ. දිවෙහි පිහිටි ජිව්හා ප්‍රසාද වස්තුවෙහි මේ සිත හටගන්නේ ය. දිවෙන් වැදගන්නා රසය මේ ජිව්හා විඤ්ඤාණ සිතින් විඳියි. කුසල විපාක වශයෙන් ලැබෙන මිහිරි රසය විඳීමේ දී අහේතුක කුසල විපාක ජිව්හා විඤ්ඤාණය ද අකුසල විපාක වශයෙන් හමුවන අමිහිරි රස විඳීමේ දී අහේතුක අකුසල විපාක ජිව්හා විඤ්ඤාණය ද ඇති වන්නේය. රස දැනීමට දිවෙහි තෙත්ගතිය හෙවත් ආපො ධාතුව උපකාර වේ.

ජිව්හා විඤ්ඤාණය ඉපදීමට උපකාරවන කරුණු නම්:—

1. ජිව්හා ප්‍රසාදයාගේ නොපිරිහීම.
2. රසාලම්බනයක් හමුවීම.
3. දිවෙහි තෙත් ගතිය හෙවත් ආපොධාතුවෙන් උපකාර ලැබීම.
4. මනසිකාරය

වස්තු දුර්වලතා, කෘත්‍ය දුර්වලතා හේතුවෙන් මේ සිත් දෙක ද උපෙක්ඛා වෙදනා සහිත බව දතයුතු.

## කාය විඤ්ඤාණ සිත් දෙක

කයට හෙවත් ශරීරයට හමුවන ස්පර්ශ දැනගන්නා සිත කාය විඤ්ඤාණ නමි. මේ සිත් උපදින්නේ කායප්‍රසාද වස්තුවෙහි ය. මේ කාය ප්‍රසාද වස්තු රූපය, මහාභූතරූපයන්ගේ පැහැයකි. මෙයට හමුවන **පොට්ඨබ්බ** අරමුණ නම් වූ ස්පර්ශය, පඨවි, තේජො, වායො යන භූතත්‍රයකින් යුත්, අරමුණෙකි. ඇස්, කන් නාස, දිව ආදියට හමුවන රූප, ශබ්ද, ගන්ධ, රස අරමුණු උපාදරූපයන් බැවින් ඉතා සියුම් ය. සතර මහාභූතයන්ගෙන් සැදුනු, සසම්භාර කාය නම් වූ මේ ශරීරය ආශ්‍රය කරමින් පවතින මේ කාය ප්‍රසාද වස්තුවෙහි පොට්ඨබ්බ අරමුණ හැපීමේ දී කිණිහිරක් පිට පුළුන් පිඩක් තබා යකඩයකින් පහර දෙන කල්හි පුළුන් පිඩ

විනිවිදගොස් යකඩය කිණිහිරට තදින් හැප්පෙන්නාක් මෙන් ස්පර්ශයද ශරීරයට තදින් හැපෙන්නේය. එවිට උපෙක්ඛා වෙදනාවක් නොව, සැප හෝ දුක් වෙදනා හට ගන්නේ ය. කුසල විපාක වශයෙන්, මෘදුවූ, මිහිරි වූ ස්පර්ශ අරමුණු හමුවූ කල්හි **අහේතුක සුඛ සහගත කායවිඤ්ඤාණය ද**, අකුසල විපාක වශයෙන් හමුවන අමිහිරි රළු ස්පර්ශ ඇති කල්හි **අහේතුක දුක්ඛ සහගත කායවිඤ්ඤාණය** ඇති වන්නේ ය.

කායවිඤ්ඤාණයන්ගේ ඉපදීමට උපකාරවන කරුණු නම්:—

1. කායප්‍රසාදයාගේ නොපිරිහීම.
2. භූතත්‍රය සඞ්ඛ්‍යාත ස්පර්ශය හමුවීම.
3. ශරීරයෙහි ඇති තද ගතිය නම් වූ පඨවිධාතුහුගේ උපනිශ්‍රය හෙවත් උපකාරය ලැබීම.
4. මනසිකාරය.

## සම්පටිච්ඡන සිත් දෙක

අරමුණ මනා කොට පිළිගැනීම් වශයෙන් ඇතිවන සිත සම්පටිච්ඡන සිත නම් වේ. යම් කෙනෙකු විසින් ගෙනෙන ලද වස්තුවක්, පසුව පරීක්ෂාකර බැලීම පිණිස, පළමුකොට අතින් පිළිගන්නේ වේද, එමෙන්ම ඉහතකී ද්විපඤ්චවිඤ්ඤාණයන් විසින් ගෙණ එන ලද රූප ශබ්දාදි අරමුණු, පසුව සොයා බැලීම පිණිස මනාකොට පිළිගන්නා ආකාරයෙන් පහළවන සිත **සම්පටිච්ඡන** සිත නම් වේ. අකුසල විපාක විඤ්ඤාණයන් විසින් ගත් අනිෂ්ට අරමුණු පිළිගනිමින් උපදින සිත **අකුසල විපාක සම්පටිච්ඡන සිත** යයි ද, කුසල විපාක විඤ්ඤාණයන් ගත් ඉෂ්ට අරමුණු පිළිගනිමින් උපදින සිත **කුසල විපාක** සම්පටිච්ඡන සිත යයි ද දත යුතුයි. මේ සිතින් අරමුණු පිළිගැනීම පමණක් කරන හෙයින්, දුක් හෝ සැප වෙදනා නොඉපිද උපෙක්ඛා වෙදනාවම උපදී. චිත්තයන්ගේ කෘත්‍යය සහ සිත් යෙදෙන පිළිවෙල ආදිය දැන ගත් පසු මේ සිත් මෙයට වඩා හොඳින් අවබෝධ කරගැනීමට හැකි වේ.

## සන්තීරණ සිත් තුන

සම්පටිච්ඡන සිතින් පිළිගන්නා ලද අරමුණ විමසා බලන්නාක් මෙන් උපදින සිත **සන්තීරණ සිත** නම්. අතින් පිළිගන්නා ලද වස්තුව කෙබඳු දැයි හරිහැටි දැන ගැණීමට පෙර, ඒ වස්තුව මනා කොට පරීක්ෂා කළ යුතු වේ. එමෙන්ම, සම්පටිච්ඡන සිත විසින් පිළි ගන්නා ලද අරමුණ ගැන, ස්ථිරව නිශ්චය කර ගැනීමට ප්‍රථම , ඒ අරමුණ මනාකොට විමසා බැලීම් වශයෙන් මේ සන්තීරණ සිත ඇති වේ. අකුසල විපාක සම්පටිච්ඡන සිතින් පිළිගන්නා ලද අනිෂ්ට අරමුණ විමසා බලන සිත **අහේතුක අකුසල විපාක සන්තීරණ සිත** නම්. එමෙන් ම කුසලවිපාක සම්පටිච්ඡන සිතින් පිළිගන්නා ලද ඉෂ්ට අරමුණ විමසා බලන සිත **අහේතුක කුසල විපාක සන්තීරණ සිත** නම්. මේ කුසල විපාක සන්තීරණ සිත්, දෙකක් ම ලැබේ. එකක් උපෙක්ඛා සහගත ය. අනික සොමනස්ස සහගතය. අකුසල විපාක සන්තීරණ සිත උපෙක්ඛා සහගතය.

ඉෂ්ට අරමුණු, ඉෂ්ට මධ්‍යස්ථය, අතිඉෂ්ටය කියා දෙකොටසකට බෙදිය හැකි වේ. එයින් ඉෂ්ට මධ්‍යස්ථ අරමුණ විමසා බලන සිත උපෙක්ඛා සහගතය. අතිඉෂ්ට අරමුණ විමසා බලන සිත සොම නස්ස සහගතය. එහෙයින් කුසල විපාක සන්තීරණ සිත් දෙකක්ම ඇති බව සැළකිය යුතු.

උපෙක්ඛා සහගත සන්තීරණ සිත් දෙකින්, සන්තී රණ කෘත්‍ය පමණක් නොව තවත් කටයුතු ද කරණු ලැබේ. එයින් ප්‍රධාන කටයුත්ත නම් **පටිසන්ධි කෘත්‍යය යි.** අකුසල් සිත් දොළොස අතුරෙන් උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත හැර, ඉතිරි සිත් එකළොසින් යම් අකුසල කර්ම පථයක් සිදු වී, එහි පටිසන්ධි විපාකය ගෙනදීමට අවකාශ ලද හොත්, සතර අපායෙහි පටිසන්ධිය ගෙන දෙන්නේය. අපායෙහි පහළවන විට ඇතිවන පළමුවන සිත වූ පටිසන්ධි සිත, මේ අහේතුක අකුසල විපාක සන්තීරණ සිත වේ. එමෙන් ම ඉතා දුර්වල වූ කුසල කර්මයක පටිසන්ධි විපාක දෙනකල්හී, ජාති අන්ධ, ගොළු බිහිරි ආදී අංගවිකලත්වයක් ඇතිව හෝ, ඉතා දුක්ඛිත ජීවිතයක් ගත කරන මනුෂ්‍ය ආදී යෝනිවල

හෝ උත්පත්තිය ගෙන දෙන්නේ ය. එවිට පටිසන්ධි සිත වශයෙන් ලැබෙන්නේ අහේතුක කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතය. එබැවින් මේ අහේතුක උපෙක්ඛා සහගත සන්තීරණ සිත් දෙකට **අහේතුක පටිසන්ධි යුගලය යයි** කියනු ලැබේ. තව ද මේ සන්තීරණ සිත් තුනම ඇතැම් චිත්තවීථිවල ජවන් සිත්වලට පසුව, එම අරමුණම ගෙන තදලම්බන කෘත්‍ය සිද්ධ කරමින් චිත්ත වීථියේ කෙළවර ඇති වන විට එයට **තදලම්බන සිත්** යන නාමයද ව්‍යවහාර කරණු ලැබේ.

මෙතෙක් විස්තර කරණ ලද මේ පසළොස් කුසලාකුසල විපාක චිත්තයෝ අහේතුකම වෙති, ලෝභ, දෝෂ, මෝහ යන අකුසල හේතු හෝ ආලෝභ, අදෝෂ, අමෝහ යන කුසල හේතු හෝ මේ සිත්හි යෙදී නැති හෙයිනි.

කුසලාකුසල කර්මයන්ගේ ශක්තිය මෝරා පැසීම් බවට පැමිණී මෙන් **''විපාක''** නම් ලත් මේ අහේතුක විපාක සිත් පසළොස වස්තු දුර්වලතා, කෘත්‍ය දුර්වලතා ආදි වශයෙන් ඉතා දුර්වලය. හේතු ධර්මයෝ ඉතා බලවත් බැවින් දුර්වල සිත්වල නො යෙදෙන් නාහ. අකුසල කර්මයන්ගේ විපාක වශයෙන් ඇත්තේ මේ අහේතුක අකුසල විපාක සත පමණ ය. කුසලකර්මයන්ගේ විපාක වශයෙන් මේ අහේතුක කුසල විපාක අට සහ තවත් සහේතුක මහා විපාක අටක් ද ඇත. එහි විස්තර පසුව දක්වන්නෙමු.

ප්‍රතිසන්ධි විපාකය, ප්‍රවෘත්ති විපාක යයි විපාක කොටස් දෙකෙකි. යම් කර්මයක් හේතුකොට ගෙන මරණින් මතු යම් භවයක උත්පත්තිය ගෙන දෙන්නේ නම්, එය **පටිසන්ධි විපාක** නම්, උපන්නා වූ සත්ත්වයාහට යම් දුක් සැප ආදී විඳීමක් ගෙනදෙන්නේ නම් එය **ප්‍රවෘත්ති විපාක** නමි. උපන්නා වූ සත්ත්වයාහට ඉෂ්ටානිෂ්ට අරමුණු හමු වීමේ දී මේ විපාක සිත් කර්මයන්ට අනුකූලව ලැබෙති. මේ සිත් පසළොසින්, උපෙක්ඛා සහගත සන්තීරණ සිත් දෙක ප්‍රවෘත්ති විපාක පමණක් නොව අහේතුක ප්‍රතිසන්ධිය ද ගෙන දෙති. ප්‍රතිසන්ධි සිත මෙසේ ඉපිද නිරුද්ධවීමෙන් පසු එම සිත් ම, එම අරමුණම ගෙන, භවයාගේ පැවැත්මට අඩගයක් වශයෙන්, **භවාඞ්ග සිත්** නමින්, චිත්ත පරම්පරාව ඇති කොට, ඒ භවයෙහි අවසානය වූ මරණය හෙවත් **චූති සිතෙහි** භංගය දක්වා නො සිඳී පවතී.

උසස් පින්කම් හෙවත් උත්කෘෂ්ට කුසල කර්මයන්ගේ ප්‍රවෘත්ති විපාක වශයෙන් අහේතුක කුසල විපාක අට සහ සහේතුක කුසල විපාක අට ද ලැබෙන බව කලින් දක්වන ලදී. බලවත් වූ මහා විපාක සිත් වල **විපාක ආනිශංස** ගෙන දීමේ ශක්තියක් ඇත්තේ ය. විපාක ආනිශංසයෝ නම්, කුසලකර්ම බලයෙන් ලැබෙන ධන සම්පත්, වතුපිටි, ගේදොර, පිරිවර, යස ඉසුරු ආදී උසස් සැප විඳීමට උප කාරවන දේවල් ය. එවැනි හේතුසම්පත් ඇතියවුන්ට ඉතා ඉෂ්ට වූ රූප ශබ්ද, ගන්ධ, රස ස්පර්ශාදී අරමුණු හමුවූ විට ලැබෙන්නේ අහේතුක කුසල විපාක සිත්මය. කුසලකර්මය ඉතා දුර්වල නම් මහා විපාක සිත් කිසිවක් නො ලැබේ. අහේතුක විපාක සිත් අට පමණක් ලැබේ,

දුර්වල වූ කුසල කර්මයන්ගේ විපාක මේ ලෙසින් දුර්වල වීනම්, අකුසල කර්මයන්ගෙන්, සැප කිසිවක් නො ලැබී, දුක් පමණක් ලැබෙන බව කිවයුතු නොවේ. අකුසල් කළ සත්ත්වයන්ට අනිෂ්ට වූ රූප ශබ්දදී, සිත් දූෂ්‍ය කරවන අරමුණු ලැබීමෙන් අහේතුක අකු සල විපාක සිත් සත උපදින සැටි දක්වන ලදී. අකුසල කර්මය බලවත් වූ පමණට ලැබෙන අරමුණු ද වැඩියක් ම අනිෂ්ට වේ. එබැ වින් ඒ සත්ත්වයන්ට ලැබෙන දුක් සමූහය ද බලවත් විය යුතුයි.

පෘථග්ජන වූ හැම සත්ත්වයන් විසින් ම සසරදී කරණ ලද කුසලාකුසල කර්ම අනන්ත අප්‍රමාණ බැවින් දුක් සැප දෙකම වරින් වර විඳීම ස්වභාවයකි. සුගති ප්‍රතිසන්ධියක් ලැබූ කෙනෙකුට මේ හේතුවෙන් සැප දුක් මිශ්‍රව ලැබෙන හෙයින් දුක් විපාක වලින් වන චිත්ත පීඩා ආදිය, සැප විපාක ලැබෙන විට, තාවකාලිකව අමතක වන්නේ ය. නමුත් කුසල විපාක ගෙන දීමට අවකාශ නැති, දුගති ප්‍රතිසන්ධියක් ලැබූ කෙනෙකුට දුක් විපාක බලවත්ව දැනෙන් නේ ය. මනුෂ්‍ය ලෝක ආදී සුගතිවල ඉෂ්ටානිෂ්ට අරමුණු මිශ්‍රව ලැබෙ තත්, නරකාදී අපායයන්හි ඉෂ්ට අරමුණු ලැබෙන්නේ ඉතා කලාතුරෙ-කිනි. ඒ හේතුවෙන් අනිෂ්ට අරමුණු ගෙන ජීවිතාන්තය දක්වා විඳින බලවත් දුක් අප්‍රමාණ ය. සහේතුක කුසල කර්මයන්ගේ විපාක වශ යෙන් සහේතුක අහේතුක විපාක දෙකොටසක් තිබෙන්නාක් මෙන් සහේතුක වූ අකුසල කර්මයන්ට සහේතුක විපාක නොලැබී අහේතුක විපාක පමණක් ලැබීමට හේතුව කුමක් ද යනු බොහෝ

දෙනෙකු විසින් අසනු ලබන ප්‍රශ්නයකි. කුසල කර්මයන් ගේ විපාක වශයෙන් හමුවන ඉෂ්ට වූ රූප ශබ්ද දී අරමුණු නිසා, අහේතුක කුසල විපාක සිත් ඇති වී සතුටුවීමටත්, සැප වෙදනා විඳීමටත් හැකි වන්නේ ය. සහේතුක මහා විපාක සිත් වලින් සහේතුක ප්‍රතිසන්ධියක් ද ලබා දී, ප්‍රවෘත්ති විපාක වශයෙන් නොයෙක් සැප සම්පත් හා විපාක ආනිශංසයෝ ද ගෙන දෙනු ලැබේ. ලැබූ සම්පත් දියුණු කර ගැනීමට ද මේ මහා විපාකයෝ උපකාර වන්නාහු ය. අකුසල විපාක වශයෙන් විඳින්නට සිදු වන්නේ අනිෂ්ට වූ රූපාදී අරමුණු ලැබීමෙන් ඇති වන්නා වූ දුක් සමූහය පමණකි. අහේතුක අකුසල විපාක සත්දෙනා ගෙන් මේ සියළුම දුක් ඒ ඒ අකුසල කර්ම යන්ට අනුකූලව ලැබෙන්නේ නම් අන් සිතකින් ඇති ප්‍රයෝජනය කුමක් ද? සහේතුක අකුසල විපාක ඇති වෙතොත් එහි ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල හේතු යෙදිය යුතු වේ. මේ හේතු වලින් බලාපොරොත්තු වන්නේත් අකුසල දුක් විපාක බලවත් කර ගැනීම නම්, අහේතුක විපාකවලින් ඒ කටයුත්තම සිදුවන බැවින් සහේතුක අකුසල විපාක ඇතිවීමට අවකාශ නැති බව තේරුම් ගත යුතුයි. ප්‍රයෝජනයක් නැතිව සිත් හට නො ගන්නා බව ධර්ම ස්ව භාවයකි.

### අහේතුක ක්‍රියා සිත් තුන

අහේතුක සිත් සංඛ්‍යාවට ගැණෙන මේ ක්‍රියා සිත් තුන, කුසලා කුසල හේතු සයෙන් එකක් සමගවත් යෙදී නැති හෙයින් අහේතුක වෙති. මේ සිත්වල, කර්ම සිත් මෙන් විපාක ගෙණ දෙන ශක්තියක් නැත. එහි ඇත්තේ ක්‍රියා මාත්‍රයක් පමණ ය.

### උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන සිත

චක්ඛුද්වාරය, සොතද්වාරය, ඝාණද්වාරය, ජිව්හද්වාරය, කායද්වාරය යන දෙරටු පහෙන් හෙවත් පඤ්චද්වාරයෙන් වැද ගන්නා රූප, ශබ්ද, ගන්ධ, රස පොට්ඨබ්බ යන අරමුණුවලට සිත් පරම්පරාව යොමු කිරීමක් වශයෙන් පහළවන සිත පඤ්චද්වාරා වජ්ජන සිත නමි. චක්ඛුවිඤ්ඤාණාදි විඤ්ඤාණ සිතක් ඉපදීමට පෙර, මේ පඤ්චද්වාරාවජ්ජන සිත, ආවර්ජන කෘත්‍ය සිද්ධ කරමින්

ඉපිද නිරුද්ධ වේ. මේ සිත ඇති වන්නේ හෘදය වස්තු රූපය ආශ්‍රය කරගෙනය එහි අරමුණ එම චිත්තවීථිය ඉපදීමට හේතුවූ අළුත් වර්තමාන රූපාදි අරමුණු වලින් එකෙකි. නමුත් මේ සිතට අරමුණ හැඳින ගැනීමට ශක්තියක් නැත. එයට පසුව ඇතිවන චක්ඛු විඤ්ඤාණාදී විඤ්ඤාණ සිතින්ම අරමුණ දැන ගන්නේ වේ. මේ සිත දුර්වල ක්‍රියා සිතක් බැවින් උපෙක්ඛා වෙදනාවෙන් යුක්තය.

## උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන සිත

සිතින් ම හෙවත් මනොද්වාරයෙන් ම ගන්නා අරමුණු වලට සිත් පරම්පරාව යොමු කිරීම් වශයෙන් උපදින සිත **මනොද්වාරා වජ්ජන** සිත නමි. පඤ්චද්වාරයෙන් ගනු ලබන රූපාදි අරමුණු හැර අන් සියළු අරමුණු මනොද්වාරයෙන් හෙවත් සිතින් ම ගනු ලැබේ. මනොද්වාරික චිත්තවීථියක භවාඞ්ග සිත බිඳීමත් සමගම මේ සිත ආවජ්ජන කෘත්‍යය සිද්ධ කරමින් ඉපිද නිරුද්ධ වූවායින් පසු ජවන් සිත් පෙළ ඇති වේ. තවද මේ සිත පඤ්චද්වාර චිත්තවීථි යෙහිදී, අරමුණු විමසා බැලීම නම් වූ සන්තීරණ කෘත්‍යය සිද්ධ කරන සන්තීරණ සිත ඉපිද නිරුද්ධ වූවායින් පසු, ඒ අරමුණ මෙබඳු යයි ස්ථිර වශයෙන් නිශ්චය කිරීම හෙවත් වොට්ඨපන කෘත්‍ය සිද්ධ කර මින් උපදින්නේ ය. එවිට ඒ සිතට **වොට්ඨපන** සිත යයි ද කියනු ලැබේ. මේ ආවජ්ජන සිත් දෙකම චිත්ත වීථියේ මුල් අවස්ථාවේ උපදින හෙයින් දුර්වලය. කුසල් හෝ අකුසල් වීමට නුපුළුවන් බැවින් ක්‍රියා සිත් ම වේ. මේ සිත් දෙකම උපෙක්ඛා සහගතය.

## සොමනස්ස සහගත හසිතුප්පාද සිත

හසිතය යනු මද සිනහවට නමෙකි. සිනහ පහළ කිරීම් වශ යෙන් උපදින සිත **හසිතුප්පාද** සිත නමි. සිනහ පහළ කිරීමේදී සතුටක් ඇතිවන හෙයින් එහි වේදනාව සොම්නස වේ. සිනහ පහළ කිරීමට පමණක් මේ සිත රහතන් වහන්සේලාට ඇති වන හෙයින් එය **ක්‍රියා සිතක්** වේ. යම් පුද්ගලයෙකු ගේ සසර ගතියක් දැක, තමන්වහන්සේ ඒ ගතියෙන් මිදුනේ යයි යනාදී වශයෙන් සතු ටක් ඇති වන කල්හි මද සිනහ පහළ කරවන මේ සිත ජවනකෘත්‍යය

සිද්ධකරමින් උපදී. අලෝභ, අද්වේෂ, අමෝහ යන කුසල හේතු කිසිවක් මේ සිතෙහි යෙදී නැති හෙයින් දුර්වල වූ අහේතුක සිතක් ම වේ.

සිනහ පහළ කරන්නා වූ සිත් තවත් ඇත. ප්‍රිය වූ කාම අරමුණක් ලත් විටෙක හටගන්නා සොම්නස් සිත් වලින්, එනම් ලෝභ මූල සොමනස්ස සහගත සිත් සතර, සොමනස්ස මහා කුසල් සතර සහ මහා ක්‍රියා සතර ද යන සිත් දෙළොසින් ද, සිනහ පහළ කිරීම සිදුවේ. එයින් පෘථග්ජනයන්ට සොමනස්ස ලෝභමූල සිත් සතර සහ සොමනස්ස මහා කුසල් සතර ද ශෛක්ෂයන්ට හෙවත් සෝවාන්, සකෘදගාමි, අනාගාමි මාර්ග ඵලස්ථ පුද්ගල යන්ට සොමනස්ස දිට්ඨිගත විප්‍රයුක්ත සිත් දෙක සහ සොම්නස් මහා කුසල් සතර ද ඇති වේ. රහතන් වහන්සේලාට සොමනස්ස හසිතුප්පාදය සහ සොමනස්ස මහා ක්‍රියා සතර යන සිත් පහ ඇතිවේ. සර්වඥ බුදුවරයන් වහන්සේලා ට සොමනස්ස ඥාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් දෙක පමණක් ඇතිවේ. දැන් අප විසින් මෙතෙක් විස්තර කරණ ලද සිත් සියල්ලම, එනම් අකුසල් සිත් දෙළොසත්, අහේතුක සිත් අටළොසත් යන සිත් තිහම අශොභන සිත්නම් වේ. අහේතුක සිත් දහඅටම මෙහෙයීමක්, උනන්දු කරවීමක් නැතිව උපදින හෙයින් අසංඛාරික වේ.

අශොභන සිත් 30

- අකුසල් 12
  - ලොභමූල 8
  - දෙෂමූල 2
  - මොහමූල 2
- අහේතුක 18
  - අකුසල විපාක 7
  - කුසල විපාක 8
  - ක්‍රියා 3

| අශොභන සිත් 30 | සිත් සඛ්‍යාව | සුඛසහගත | දුක්ඛසහගත | සෝමනස්ස සහගත | දෝමනස්ස සහගත | උපේක්ඛා සහගත | සම්ප්‍රයුක්ත | විප්‍රයුක්ත | අසංඛාරික | සසංඛාරික |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් සිත් | 12 | — | — | 4 | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| අහේතුක අකුසල විපාක සිත් | 7 | — | 1 | — | — | 6 | — | 7 | 7 | — |
| අහේතුක කුසල විපාක සිත් | 8 | 1 | — | 1 | — | 6 | — | 8 | 8 | — |
| අහේතුක ක්‍රියා | 3 | — | — | 1 | — | 2 | — | 3 | 3 | — |
| මුළු ගණන | 30 | 1 | 1 | 6 | 2 | 20 | 8 | 22 | 25 | 5 |

# කාමසොභන සිත්

කාමාවචර සිත් පනස්හතරෙන්, අශොභන සිත් තිහ මෙයට පෙර විස්තර කරණ ලදී. ඉතිරි සිත් විසිහතර සොභන සිත් ය. ශ්‍රද්ධා, සති ආදී ශොභන චෛතසික යෙදෙන හෙයිනි. මේ කාමසොභන සිත් සියල්ල ම සහෙතුක වෙති. **අලොභ, අදෙෂ, අමොහ** යන හේතු තුනම යෙදෙන සිත් ත්‍රිහේතුක සිත් යයි ද, අලෝභ අදෙෂ යන හේතු දෙක පමණක් යෙදෙන සිත් ද්විහේතුක යයි ද ව්‍යවහාර වේ. මේ කුශල හේතු, අකුසල හේතුන්ට වඩා බලවත් ය. තාවකාලිකව හෙවත් තදඞ්ගප්‍රහාණ වශයෙන් අකුසල හේතු මර්දනය කිරීමට මේ කුසල් සිත් වලට ශක්තිය තිබේ.

මේ කාම සොභන සිත් විසිහතරෙන් සිත් අටක් මහා කුසල් සිත් ය. සිත් අටක් මහා විපාක සිත් ය. ඉතිරි සිත් අට මහා ක්‍රියා සිත් ය.

### කාමාවචර මහා කුසල් සිත් අට

1. **සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික කුසල් සිත.** (සැප වේදනා සහිත ඤාණය සමග යෙදුන මෙහෙයීමක් නැති කුසල් සිත.)
2. **සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික කුසල් සිත.** (සැප වෙදනා සහිත ඤාණය සමහ යෙදුන මෙහෙයීමක් ඇති කුසල් සිත.)
3. **සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික කුසල් සිත.** (සැප වෙදනා සහිත ඤාණය සමග නො යෙදුන මෙහෙයීමක් නැති කුසල් සිත.)
4. **සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික කුසල් සිත.** (සැප වෙදනා සහිත ඤාණය සමග නො යෙදුන මෙහෙයීමක් ඇති කුසල් සිත.)
5. **උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික කුසල් සිත.** (මැදහත් වෙදනා සහිත ඤාණය සමග යෙදුන මෙහෙයීමක් නැති කුසල් සිත.)

6. **උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික කුසල් සිත.**
(මැදහත් වෙදනා සහිත ඤාණය සමග යෙදුන මෙහෙයීමක් ඇති කුසල් සිත.)

7. **උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික කුසල් සිත.**
(මැදහත් වෙදනා සහිත ඤාණය සමග නො යෙදුන මෙහෙයීමක් නැති කුසල් සිත.)

8. **උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික කුසල් සිත.**
(මැදහත් වෙදනා සහිත ඤාණය සමග නො යෙදුන මෙහෙයීමක් ඇති කුසල් සිත.)

අකුසල් හෙවත් පාප ගති නසන බැවින් **කුසල්** නම් වේ. **ලෝභ දෙෂ, මෝහ** ආදී අකුසල මූලයන් නිසා ඇතිවන පාප ධර්මයන් මැඩ පවත්වා යහපත් මගට පමුණුවන්නාවූ, මනුෂ්‍යලෝක, දිව්‍ය ලෝක ආදී කාම සුගතින්හි ප්‍රතිසන්ධිය ඇති කොට මහත් වූ සැප සම්පත්, විපාක වශයෙන් ගෙණ දීමේ ශක්තිය ඇති කුශලකර්ම කිරීමේදී මේ සිත් පහළවේ. දන්දීම, සිල් රැකීම, භාවනා කිරීම, වතාවත් කිරීම, බණ ඇසීම, බණ දෙසීම, පින් පැමිණවීම යන ආදී උසස් පින්කම් කරන්නේත් මේ කුසල් සිත් අටෙනි.

පින්කම් කිරීමේදී ඉෂ්ට අරමුණු හමුවන්නේ නම් ඒ කුසල් සිත් සොමනස්ස සහගත වේ. ඉෂ්ට මධ්‍යස්ථ නම් උපෙක්ඛා සහගත වේ. ශ්‍රද්ධාවෙන් දනක් දෙනු කැමැති කෙනෙකුට, යොග්‍ය වූ දනවස්තුවක් ලැබීමත් ගුණවත් ප්‍රතිග්‍රාහකයෙකු හෙවත් දනවස්තුව පිළිගැණීමට සුදුසු පුද්ගලයෙකු ලැබීමත්, දන් දීමට සුදුසු කාලය පැමිණීමත්, යොග්‍ය ස්ථානයක් ලැබීමත්, උපකාර පිණිස කල්‍යාණ මිත්‍රයන් ලැබීමත්, පිරිසිදු සම්‍යග්දෘෂ්ටිය ඇති බවත්, ප්‍රති ග්‍රාහකයාගේ ගුණ දැනීමත් දන් දීමෙහි අනුසස් දැනීමත්, සොමනස්ස සහගත මහා කුසල විපාක සිතකින් ප්‍රතිසන්ධිය ලබා සිටීමත් යනාදී හේතූන් ඇති කල්හි ඒ දනමය පුණ්‍ය කර්මය **සොමනස්ස සහගත උසස් කුසල කර්මයක්** වන්නේ ය.

## කුසල් සිත සොමනස්ස විමට හේතු නම්

1. සොමනස්ස සිතකින් ප්‍රතිසන්ධිය ලබා සිටීම.
2. ශ්‍රද්ධාව බහුලව ඇති වීම.
3. පිරිසිදු සම්‍යග්දෘෂ්ටිය ඇති වීම.
4. කුසල කර්මයන්හි ඵල විපාක දැනීම.
5. ඉෂ්ට අරමුණු ලැබීම.
6. රොගපීඩාදි උපද්‍රවයන්ගෙන් වැළකීම.

මෙයින් යම් කරුණක් අඩුවීනම්, ඒ කුසල්සිත **උපෙක්ඛා සහගත වේ.** මෙසේ වෙදනා භෙදයෙන් මහා කුසල් සිත් සොමනස්ස සහගත, උපෙක්ඛා සහගත යයි දෙකොටසකට බෙදනු ලැබේ.

තවද, කුසල් කිරීමේදී **ඥාණය** හෙවත් අමෝහ සඞ්ඛ්‍යාත පඤ්ඤෙන්ද්‍රිය චෛතසිකය යෙදුනවිට, ඒ සිත **ඥාණ සම්ප්‍රයුක්ත සිතක්** වේ. ඥාණය නො යෙදුන සිත් **ඥාණ විප්‍රයුක්ත සිත්** නම්. මෙසේ ඥාණ භෙදයෙන් ද, කුසල් සිත් ඥාණ සම්ප්‍රයුක්ත, ඥාණ විප්‍රයුක්ත යයි දෙකොටසකට බෙදනු ලැබේ.

කර්ම හා කර්ම විපාක විශ්වාස කිරීමද, හේතුඵල ධර්මයන් විශ්වාස කිරීම ද, ධර්මාර්ත්ථ හොඳ හැටි දැනීම ද, පාපයන් ගෙන් වළකින උපාය දැනීම ද ඥාණය නම් වේ. මේ ඥාණය හෙවත් ප්‍රඥව සමග යෙදුන සිත **ඥාණ සම්ප්‍රයුක්ත සිතකි.** ලෞකික ශාස්ත්‍ර ආදිය පිළිබඳ මනා දැනීමක් ඇති, උගත් තැනැත්තා ඥාණවන්තයා යයි සාමාන්‍ය ලෝකයා විසින් පිළිගනු ලැබේ. නමුත් ඔහුගේ ඒ ඥාණවන්තකම නොයෙක් අකුසල් කිරීමටත්, තමන්ටත් අනුන්ටත් අයහපත සිදු කිරීම පිණිසත් පවතින්නට බැරිකමක් නැත. සතුන් මැරීම, මැරීමට උපකාර වන නොයෙක් අවි ආයුධ තැනීම, විෂ ද්‍රව්‍ය සෑදීම යනාදී නොයෙක් විපත් සළසන කටයුතු කිරීම මේ අයගෙන් සිදු වේ. කුසල් සිත්හි ඇතිවන ඥාණය මෙය නොවේ. ධර්මයේ සැටියට ඥාණවන්තයා කුසල් අකුසල් දැන අකුසලින් වෙන්වීමට උත්සාහ කරන්නේ ය. තමන්ටත් අනුන්ටත් යහපතක්ම සිදු කරන්නේ ය. සසර දුක් දැන එයින් මිදීමට වීර්‍ය්‍ය කරන්නේ ය. නුවණින් පමණක් නොව ගුණයෙන් ද උසස් වීමට උත්සාහ දරන්නේය. කුසල් සිත්හි යෙදෙන ඥාණය මෙබඳු යයි සැළකිය යුතුයි.

තවද, කොපමණ ආදර ගෞරවයෙන් අනුන්ට සංග්‍රහ කළත්. කණ බොන දෑ සපයා දුන්නත් ගේ දොර සාද දුන්නත්, කම්ඵල නො අදහන්නේ නම්, ඕ හට ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් ඇති නොවේ, මෙකී යහපත් කටයුතු කරණ ඔහුට ලැබෙන්නේ ද්විහේතුක ඤාණ විප්‍රයුක්ත කුසල් සිත් පමණ ය. පෙර ජාතිවල, ප්‍රඥාව ලැබීම පිණිස උපකාර වන කුසල්; එනම්, ධර්මවිනය ඉගෙනීම, ධර්මය කියාදීම, ධර්ම දේශකයන්ට සත්කාර කිරීම, ධර්මය ඉගෙණගන්නවුන්හට උපකාර කිරීම, නිරවද්‍ය ශිල්පශාස්ත්‍ර ඉගෙණීම යනාදී කුසල් කොට, ප්‍රාර්ථනා බලයක් ඇතිව උපන් පුද්ගලයන්ට මේ ඤාණය පහළ වන්නේ ය. තවද ප්‍රඥාදසකයට පැමිණ මුහුකළ නුවණක් ද තිබිය යුතුය. දනාදි පින්කම් කිරීමේ දී ලෝභ දෙෂ, මොහයන්ගෙන් ඒ කුසල චිත්තය පිරිවරකොට නොගතයුත්තේ ය. එනම් කුසලය කිරීමට පෙරත් කුසල් කළ පසුත් ඉතා පිරිසිදු සිත් පහළ කර ගත යුතුය. මේ ආදී කරුණු සම්පූර්ණ වූ විට උත්කෘෂ්ට ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් උපදී.

ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිතක් ඇතිවීමට උපකාරවන කරුණු නම්:

1. ත්‍රිහේතුක මහා විපාක සිතකින් ප්‍රතිසන්ධිය ලැබීම.

2. ශ්‍රද්ධා ආදී ධර්මයන්ගේ මෙරීම.

3. අකුසල් කෙරෙන් ඈත්වීම.

4. නුවණ වැඩෙන කටයුතු කිරීම.

මෙකී කරුණු අඩුවීනම් ඤාණ විප්‍රයුක්ත සිත් ඇති වේ.

ඉහත දක්වන ලද පරිදි කර්මඵල ආදිය, නුවණින් යුක්තව මෙනෙහි කිරීමට නො හැකි වූ, පුරුද්දෙන් දන්දීම සිල් සමාදන්වීම, මල්පිදීම, පූජා පැවැත්වීම ආදී පින්කම් කරන විට ඇතිවන්නේ මේ ඤාණ විප්‍රයුක්ත සිත්ය. කුඩා ළදරුවන් මව්පියන් අනුව විහාරයට යෑම, ගාථා කියා වැදීම, දන් පිළිගැන්වීම යනාදිය කරන්නේත් මේ ඤාණ විප්‍රයුක්ත සිතින් ය.

මෙහෙයීමක්, අනුබලයක්, උනන්දුකරවීමක් නො මැතිව කුසල් කරන විට අසංඛාරික කුසල් සිත් ද, මෙහෙයීමක්, උනන්දු කරවීමක් ඇති විටෙක සසංඛාරික සිත් ද ඇති වේ. දන් දීමේ දී, ඒ දන වස්තුව, අලෝභ චේතනාව පෙරදැරි කොට, කරුණාවෙන්, පිළි ගන්නා තැනත්තාගේ අතට දෙන්නේ වේද, ඒ දනයෙන් ලැබෙන කුසලානිශංසයන් ඒකාන්තයෙන් ම ලැබේවායි යන ස්ථිර අදහසක් ද ඇති වූයේ නම්, ඒ සිත අසංඛාරික වන්නේ ය. අනුන් සතුටු කරවන අදහසින් හෝ අනුන් ගේ නියෝගයකින් හෝ දනය පිළිගැන්වීමේදී සසංඛාරික සිත් උපදී.

සැකෙවින් මේ කුසල් සිත් අට උපදින සැටි මෙසේ දතයුතු යි.

1. මල් පහන් පිදීම්, දන්දීම්, සිල්රැකීම් ආදී පින්කම් ඉතා සතුටින්, ශ්‍රද්ධාව පෙරදැරි කොට, ආනිශංසද දැන, මෙහෙයීමක් නො මැතිව කරන කල්හි පළමුවෙනි **සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත** උපදී.

2. එයම මෙහෙයීමක් ඇතිව කරණකල්හි දෙවෙනි **සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත** උපදී.

3. කර්මඵල, ආනිශංස ආදිය සිහි නොකොට, පුරුද්දක් වශයෙන්, මෙහෙයීමක් නො මැතිව, කුසල් කරණ කල්හි තුන්වෙනි **සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත** උපදී.

4. මේ ලෙසින් මෙහෙයීමක් ඇතිව කරණ කල්හි සතර වැනි **සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත** උපදී.

5. පින්කම් කිරිමේ දී අදහස් පිරිදි සතුටුවීමට බාධා ඇතිවුවත් නුවණින් යුක්තව, මෙහෙයීමක් නොමැතිව කරණ කල්හි පස්වැනි **උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත** උපදී.

6. එයම මෙහෙයීමක් ඇතිව කරණ විට සවෙනි **උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත** උපදී.

7. සතුටත් නැතිව, නුවණින් තොරව, මෙහෙයීමක් නැතිව කුසල් කරණ කල්හි සත්වන **උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත** උපදී.

8. එසේම අනුන්ගේ මෙහෙයීමකින් කරණ කල්හි අට වැනි **උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත** උපදී.

දනයක් දීමට අදහස් කළ මොහොතේ පටන්, දන්දී අවසන් වනතෙක්, අන්කිසි සිතක් ඇති නොවී, මේ කුසල් සිත්ම ඇතිවන බව නො සිතිය යුතුයි. එමෙන්ම අට සිල් සමාදන් වූ තැන් පටන් පසුදින උදේ සිල්පවාරණය තෙක් මේ කුසල් සිත් හැර අන් සිතක් පහළ නො වන බව ද නොසිතිය යුතුයි. පින්කම් කිරීමේ දී, ඒ පින්කම ගැන සිහියෙන් යුක්තව සිටින මොහොතේ පමණක් ඇතිවන චිත්තවීථිවල, මේ සිත් අටෙන් එකක් ජවන් හෙවත් **කර්ම සිත්** වශයෙන් හත්වර බැගින් ඉපිද නිරුද්ධවෙන බව දත යුතුයි. මේ අතර ඊර්ෂ්‍යා, මාන ආදී පාප අදහසක් හෝ පින්කමකට සම්බන්ධ නැති විරුද්ධ අදහස් හෝ පහළවීමෙන් මේ පින්කම ද ඒ අකුසල් සිත් නිසා දුර්වල වන්නේය. මේ බැව් සලකා හැකිතාක් සිහියෙන් යුක්තවම කුසල් කිරීමට සිත්හි තබාගත යුතුය.

### කාමාවචර මහා විපාක සිත් අට

1. **සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අංසඛාරික විපාක සිත**
2. **සොමනස්ස සහගත ඤාණ සම්පයුත්න සසංඛාරික විපාක සිත**
3. **සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික විපාක සිත**
4. **සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික විපාක සිත**
5. **උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික විපාක සිත**
6. **උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික විපාක සිත**
7. **උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික විපාක සිත**
8. **උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික විපාක සිත**

කාමාවචර මහා කුසල් සිත් අටෙහි විපාක වශයෙන් ලැබෙන මේ මහාවිපාක සිත් අට ද, ඒ පිළිවෙලටම ඒ නම් වලින්ම හඳුන්වනු ලැබේ. කුසල විපාක වශයෙන් ඉෂ්ට වූ රූප ශබ්ද දී අරමුණු හමුවන

කල්හි චක්ඛුවිඤ්ඤාණාදී අහේතුක කුසල විපාක සිත් අට උපදින සැටි කලින් විස්තර කරන ලදී. දැන් විස්තර කරණු ලබන්නේ ඒ කුසලකර්මයන් ගේ සහේතුක විපාක සිත් අටය.

මේ මහා විපාක සිත් අටේ ම ප්‍රතිසන්ධි විපාක ශක්තිය හා ප්‍රවෘත්ති විපාක ශක්තිය ද ඇත්තේ ය.

මනුෂ්‍යලෝකය සහ දිව්‍යලෝක යන කාම සුගතීන්හි ප්‍රතිසන්ධිය ගෙනදීමේදී මේ මහා විපාක සිත් අටෙන් එකක් ප්‍රතිසන්ධි සිත වශයෙන් පහළ වේ. මේ විපාක සිත් ලැබෙන්නේ කුසල කර්මශක්තියට අනුකූලවය. ඤාණය යෙදීම හෝ නො යෙදීම අනුව මේ කුසල් සිත් ත්‍රිහේතුක උත්කෘෂ්ට, ත්‍රිහේතුක ඕමක, ද්විහේතුක උත්කෘෂ්ට, ද්විහේතුක ඕමක යයි සතර කොටසකට බෙදිය හැකිවේ.

ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසල කර්මයක ප්‍රතිසන්ධි විපාක වශයෙන් ඤාණසම්ප්‍රයුක්ත මහා විපාක සිත් සතරෙන් එකක් උපදී. හෙතෙමේ කාමසුගතියෙහි බොහෝ කලක් නොයෙක් සැප සම්පත් විපාක ආනිසංසයන් වශයෙන් විඳිමින් කල් යවන්නේ ය. සසර නොයෙක් ජන්මවල ඉපිද, මෙබඳු පින්කම් කොට, ඤාණය වඩා, භාවනාදිය කොට, ප්‍රාර්ත්ථනා බලයකුත් ඇතිව උත්පත්තිය ලැබූයේ නම්, ඕහට කල්‍යාණ මිත්‍රයන් ලැබීමෙන් බොහෝ වැඩ සිදුකර ගැණීමට අවකාශ ලැබෙන්නේය. භාවනා වැඩීමෙන් ධ්‍යානාදී ඵල ලබා ගැනීමට හැකිවන්නේ මුහුකුරාගිය ඤාණයක් ඇති මෙබඳු පුද්ගලයන්ටය. මාර්ගඵල ලබා ගැනීමට ද ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් අවශ්‍යමය. ඇතැම්විටෙක මෙවැනි හේතු සම්පත් නැති පුද්ගලයන් භාවනාදිය කොට ඵල ලබා ගැනීමට නො හැකිව සිත් දූෂ්‍යවීමෙන් සිහි විකලත්වයට ද පැමිණෙත්. දුර්වල වූ ත්‍රිහේතුක කුසලය, එනම් ඤාණය දියුණුනොවී ස්වල්ප වශයෙන් දැනුමක් ඇතිව කරණ කුසලය, ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ගෙන දීමට තරම් ශක්තිය නැති හෙයින් ද්විහේතුක ප්‍රතිසන්ධියක්ම ගෙනදෙන්නේ වේ. එවිට ප්‍රතිසන්ධිසිත වශයෙන් පහළවන්නේ ඤාණවිප්‍රයුක්ත මහා විපාක සිත් සතරින් එකකි. ඔහු මිනිස්ලොව ඉපිද ස්වල්ප වූ සම්පතක් ලැබ සතුටු වෙමින් කල් ගත කරන්නේය. ඒ සම්පත ලබා ගැණීමට ද බොහෝ වෙහෙස මහන්සි විය යුතුයි. ද්විහේතුක උත්කෘෂ්ට කුසලය හෙවත් අලොභ අද්වේෂ

යන හේතු දෙක පමණක් බලවත්ව යෙදෙන කුසල් සිත, ද්විහේතුක ප්‍රතිසන්ධියක් දෙන්නේ ය. එනම් ද්විහේතුක හෙවත් ඥාණවිප්‍රයුක්ත සිත් සතරින් එකක් පටිසන්ධි සිත වශයෙන් ලැබෙන්නේ ය. මේ පුද්ගලයා ද දුර්වල ත්‍රිහේතුක පුද්ගලයාට බොහෝ සෙයින් සමානය. කුසල කර්මය, දුර්වල වූ ද්විහේතුක හෙවත් දුර්වලව යෙදුන අලෝභ අදෙෂ හේතු ඇති, ඥාණවිප්‍රයුක්ත සිතකින් කරන ලද්දේ නම්, ඔහුට ඥාණවිප්‍රයුක්ත විපාක සිත් නො ලැබෙන්නේය. ඔහුගේ ප්‍රතිසන්ධිය ඇතිවන්නේ අහේතුක කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතිනි. දුගී දුප්පත් අඞ්ගවිකලත්වයෙන් යුත් නුවණ මඳ අසරණ මනුෂ්‍යයන් උපදින්නේ මේ දුර්වල කුසල කර්ම හේතුවෙන් බව දත යුතුයි. ඥාණයෙන් තොරව, අනුන් කුසල් කරන සැටි දැක, තරහයටත් ලෝකයාගේ පැසැසුම් ආදිය ලබා ගැනීම පිණිසත් කරන කුසල්, මේ දුර්වල ඥාණවිප්‍රයුක්ත කුසල්ය. අහේතුක සුගති ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයාට ඉෂ්ට අරමුණු ලැබුණත් එයින් සතුටුවීමට අවකාශ නො ලැබෙන්නේ ය. මනුෂ්‍යාත්මයෙන් ලැබිය යුතු උසස් ඵල ඔහුට නො ලැබේ.

මහා විපාක සිත් අටෙන් ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයාහට කර්ම ශක්තිය ඇති තාක් කල් ප්‍රවෘත්ති විපාක වශයෙන්ද මේ මහා විපාක සිත් අට කර්මයට අනුකූලව හටගන්නේ ය. ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසල් කළ තැනැත්තාට විපාක ආනිශංස වශයෙන් නොයෙක් සැප සම්පත් ලැබීමේ දී මේ මහා විපාක සිත් උපකාරවන්නේ ය. ඉෂ්ට අරමුණු හමුවීමෙන් චක්ඛුවිඤ්ඤාණාදී අහේතුක කුසල විපාක සිත් පළමු කොට ඉපිද, පසුව එයින් ඇතිවන සතුට විඳීමේදී මහා විපාක සිත් ලැබෙන්නේය. මේ සිත් සොළොසම කුසල කර්මයාගේ විපාකයෝ වන්නාහ.

අප හැම දෙනා විසින්ම සසරදී කළ නොයෙක් කුසලා කුසල කර්මයන් මිශ්‍රව තිබෙන හෙයින් ප්‍රවෘත්ති විපාක වශයෙන් මෙකී කාමාවචර විපාක සිත් සියල්ලම, එනම්, අහේතුක අකුසල විපාක සිත් සතත්, අහේතුක කුසලවිපාක සිත් අටත්, මේ සහේතුක මහා විපාක සිත් අටත් යන විපාක සිත් විසිතුනම අපට ලැබේ. බුද්ධාදී ආර්‍ය්‍යයන් වහන්සේලාට ද එසේ මය.

## කාමාවචර මහා ක්‍රියා සිත් අට

1. සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාරික ක්‍රියා සිත.
2. සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික ක්‍රියා සිත.
3. සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසංඛාරික ක්‍රියා සිත.
4. සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික ක්‍රියා සිත.
5. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාරික ක්‍රියා සිත.
6. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික ක්‍රියා සිත.
7. උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසංඛාරික ක්‍රියා සිත.
8. උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික ක්‍රියා සිත.

මේ මහා ක්‍රියා සිත් අට ද, කුසල් සිත් අටට බොහෝ සෙයින් සමානය. මෙහි ඇති වෙනස, කර්ම නොවන හෙයින් විපාක නො දෙන බවය. කර්ම ක්ෂය කළ රහතන් වහන්සේලාට පමණක් මේ සිත් ඇතිවන බැවින් **ක්‍රියා සිත්** නම් වේ. පෘථග්ජන වූ අපටත්, සෝවාන් සකෘදගාමී, අනාගාමී යන මාර්ගඵලස්ථ පුද්ගලයන්ටත්, මේ මහා ක්‍රියා සිත් පහළ නො වේ. බුදු පසේ බුදු මහරහතන් වහන්සේලාට මතු භවයක් නැති හෙයින්, කුසල් සිත් වෙනුවට මේ ක්‍රියා සිත් ඇතිවේ. ඉෂ්ටානිෂ්ට අරමුණු හමුවීමෙන් පහළ වන පඤ්චද්වාරික හෝ මනොද්වාරික චිත්තවීථිවල ජවන් සිත් වශයෙන් උන්වහන්සේලාට ඇතිවන්නේ මේ මහා ක්‍රියා සිත් අටෙන් එකක්ය. සියළුම අකුසල් මුල් සිඳ දවන ලද බැවින් අකුසල් සිත් දොළොස ඇති නොවේ. එසේම මතු භවයක් නැති නිසා කුසල කර්මයන් ගෙන් ප්‍රයෝජන නැති හෙයින් කුසල් සිත් අට ද ඇති නොවේ.

රහතන් වහන්සේලා සිහි නුවණින් යුක්තව යම් යම් කටයුතු කිරීමේ දී ඤාණසම්පයුත්ත මහා ක්‍රියා සිත් සතරෙන් එක් සිතක් ජවන් සිත් වශයෙන් පහළ වේ. පුරුද්දෙන් මෙන් යම් යම් කටයුතු කිරීමේ දී ඤාණ විප්‍රයුත්ත මහා ක්‍රියා සිත් සතරෙන් එකක් ඇති වේ. බුදුන් වහන්සේලාට ඤාණසම්ප්‍රයුත්ත ක්‍රියා සිත් මිස ඤාණ විප්‍රයුත්ත ක්‍රියා සිත් ඇති නොවන බව දක්වා තිබේ. අහේතුක සිත් අටළොස විස්තර කිරීමේ දී සොමනස්ස හසිතුප්පාද නම් අහේතුක ක්‍රියා සිතක් දක්වන ලදී. ඒ ක්‍රියා සිතත් සිනහ පහළ කරන විට රහතන් වහන්සේලාට පමණක් ඇතිවන බව ද මතක තබා ගත යුතුයි.

මේ කාමාවචර සිත් සූපනසෙන් (54) ඒ ඒ පුද්ගලයන්ට ඇතිවන සිත් මෙසේ දත යුතුයි.

**බුදුරජාණන් වහන්සේට:—**

හසිතුප්පාද සිත හැර අහේතුක සිත් සතළොස (17) මහා විපාක සිත් අට (8) ඤාණ සම්පයුත්ත මහා ක්‍රියා සිත් සතර (4) යන සිත් (29) ඇති වේ. ( ඇතැම් ආචායර්‍ය්‍යවරු, හසිතුප්පාදයත් ඤාණ විප්පයුත්ත ක්‍රියා සිත් සතරත් ඇති විය හැකි බව කියති.)

**රහතන් වහන්සේලාට**

අහේතුක සිත් අටළොස (18) මහා ක්‍රියා සිත් අට (8) මහා විපාක සිත් අට (8) යන සිත් 34 ඇතිවේ.

**අනාගාමි පුද්ගලයන්ට:—**

දිට්ඨිගත සම්පයුත්ත සිත් සතර (4) දෙමනස්ස සිත් දෙක (2) සහ විචිකිච්ඡා සිත ද යන සිත් සත හැර ඉතිරි අකුසල් සිත් පහ (5), හසිතුප් පාදය හැර ඉතිරි අහේතුක සිත් (17), මහා කුසල් සිත් අට (8), මහා විපාක සිත් අට (8) යන සිත් 38 ඇති වේ.

**සෝවාන් සහ සකෘදගාමි පුද්ගලයන්ට:—**

දිට්ඨිගත සම්පයුත්ත සිත් සතර සහ විචිකිච්ඡා සිත හැර ඉතිරි අකුසල් සිත් (7) සත හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක සිත් (17) මහා කුසල් සිත් (8) මහා විපාක සිත් (8) යන සිත් 40 ඇති වේ.

**පෘථග්ජනයන්ට:—**

අකුසල් සිත් දෙළොස (12) හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක සිත් (17), මහා කුසල් සිත් අට (8), මහා විපාක සිත් අට (8) යන සිත් 45 ඇති වේ.

# පුද්ගලයන්ට ලැබෙන කාමාවචර සිත්

| | අකුසල් සිත් 12 | | | | | අහේතුක සිත් 18 | | කාමසොභන සිත් 24 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් 4 | දිට්ඨිගත විප්‍රයුක්ත සිත් 4 | ද්වේෂමූල සිත් 2 | විචිකිච්ඡා සිත | උද්ධච්ච සිත | හසිතුප්පාදය හැර අහේතුක සිත් 17 | හසිතුප්පාද සිත | මහා කුසල් 8 | මහා විපාක 8 | ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා 4 | ඥාන විප්‍රයුක්ත මහා ක්‍රියා සිත් 4 | ලැබෙන සිත් ගණන |
| බුදුන් වහන්සේට ලැබෙන සිත් | — | — | — | — | — | 17 | — | — | 8 | 4 | — | 29 |
| රහතන්වහන්සේට ලැබෙන සිත් | — | — | — | — | — | 17 | 1 | — | 8 | 4 | 4 | 34 |
| අනාගාමි පුද්ගලයන්ට ලැබෙන සිත් | — | 4 | — | — | 1 | 17 | — | 8 | 8 | — | — | 38 |
| සොවාන් සකෘදාගාමි පුද්ගලයන්ට ලැබෙන සිත් | — | 4 | 2 | — | 1 | 17 | — | 8 | 8 | — | — | 40 |
| පෘථග්ජනයන්ට ලැබෙන සිත් | 4 | 4 | 2 | 1 | 1 | 17 | — | 8 | 8 | — | — | 45 |

# කාමාවචර සිත් සූපනසෙහි (54) ප්‍රභෙද

| සිත් | සිත් | සෞමනස්ස සහගත සිත් | දෞර්මනස්ස සහගත සිත් | සුඛ සහගත සිත් | දුක්ඛ සහගත සිත් | උපෙක්ඛා සහගත සිත් | සම්ප්‍රයුක්ත සිත් | විප්‍රයුක්ත සිත් | අසංඛාරික සිත් | සසංඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් සිත් | 12 | 4 | 2 | — | — | 6 | 8 | 4 | 7 | 5 |
| අහේතුක සිත් | 18 | 2 | — | 1 | 1 | 14 | — | 18 | 18 | — |
| කාමසොභන සිත් | 24 | 12 | — | — | — | 12 | 12 | 12 | 12 | 12 |
| එකතුව | 54 | 18 | 2 | 1 | 1 | 32 | 20 | 34 | 37 | 17 |

# රූපාවචර සිත් පසළොස

රූපාවචර බ්‍රහ්ම ලෝකයන්හි බහුලව පවත්නා සිත් **රූපාවචර සිත්** නමි. කාමයන් අරමුණු කරණ කාමාවචර සිත් වලට වඩා මේ සිත් උසස් ය, බලවත්ය, තැන්පත්ය, පිරිසිදුය. **රූපාවචර ධ්‍යාන සිත්** යයි ද මෙයටම නමෙකි. නුවණ ඇති පුද්ගලයන් විසින් කාමයන්හි ආදීනව දැන, එයින් මිදෙනු කැමැතිව, චිත්ත භාවනා වඩා, මේ **මහග්ගත** හෙවත් **ධ්‍යාන සිත්** උපදවා බොහෝ විවේකව වාසය කොට, නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ, මරණින් මතු බ්‍රහ්මලෝකයන්හි ඉපිද, දීර්ඝ කාලයක් බ්‍රහ්ම සම්පත් විඳින්නාහුය. තවද, ඇතැම් පුද්ගලයන් විසින් , ධ්‍යානයෙන් ලැබිය හැකි විවේක සම්පත්තිය දැන, මෙලොව දීම ධ්‍යාන සුව විඳිනු කැමැතිව, මේ ධ්‍යාන සිත් උපදවා ගනු ලැබේ.

නො හික්මුණු සිත, නොයෙක් කාම අරමුණු ගනිමින්, තැන්පත් කමක් නොමැතිව, නිතර කලබල සහිතව, ඉතා වේගයෙන් ඉපිද නිරුද්ධ වෙමින් මහත් වූ අවැඩ දුක් සාදන්නේය. මේ සිත යහපත් අරමුණක ස්ථිරව පිහිටා ගැනීමෙන්, හික්මවා ගැනීමෙන් බොහෝ වැඩ සාදගත හැකි වේ. සිත මනාව හික්මුණු කල්හි සමාධිය ඇති වේ. සසර පුරුදු කළ භාවනා ඇති කෙනෙක් නම් වහා ධ්‍යාන උපදවා ගෙන, ප්‍රඥා භාවනා ද වඩා විදර්ශනාඥානයන්ගේ උපකාරයෙන් චතුරාර්‍ය්‍ය සත්‍යයන් අවබෝධ කොට මාර්ගඵල ලබා සසරින් එතර වන්නේ ය. අප හැම දෙනා විසින් ම සසරින් මිදෙනු කැමැති නම්, එයට පූර්ව ප්‍රතිපද වශයෙන් සමථ විදර්ශනා භාවනා වැඩිය යුතු බැවින් පළමුකොට මේ ධ්‍යාන සිත් පිළිබඳවත්, එය ලබන සැටිත්, උපදවන පිළිවෙලත් එහි ආනිශංසත් හොඳින් අවබෝධ කටයුතු වේ.

**රූපාවචර සිත්** පසළොස අතුරෙන් සිත් පහක් **රූපාවචර කුසල් සිත්ය.** සිත් පහක් **රූපාවචර විපාක සිත්ය.** ඉතිරි සිත් පහ **රූපාවචර ක්‍රියා සිත්ය.** මේ සිත් සියල්ලම ලෞකික සිත්ය. එසේම **ඥාණ සම්ප්‍රයුක්තය, සොභනය, සසංඛාරිකය.**

## රූපාවචර කුසල් සිත් පස

1. **විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල් සිත.**
(විතක්ක, විචාර, පීති, සුඛ එකග්ගතා යන අඞග පසින් යුත් පළමුවැනි ධ්‍යාන කුසල් සිත.)

2. **විචාර පීති සුඛ එකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල් සිත.**
(විචාර, පීති, සුඛ, එකග්ගතා යන අඞග සතරින් යුත් දෙවැනි ධ්‍යාන කුසල් සිත.)

3. **පීති සුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන කුසල්සිත.**
(ප්‍රීති, සුඛ, එකග්ගතා යන අඞග තුනෙන් යුත් තුන්වැනි ධ්‍යාන කුසල් සිත.)

4. **සුඛ, එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල් සිත.**
(සුඛ එකග්ගතා යන අඞග දෙකෙන් යුත් සතර වැනි ධ්‍යාන කුසල් සිත.)

5. **උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසල් සිත.**
(උපෙක්ඛා එකග්ගතා යන අඞග දෙකින් යුත් පස්වැනි ධ්‍යාන කුසල් සිත.)

### ධ්‍යානය

''**ආරම්මණ උපනිජ්ඣාන**'' නම් වූ කසිණාදී අරමුණු කරා එලඹ සිහි නුවණින් යුක්තව බැලීම හෙවත් අරමුණු ලංකොට බැලීම යන අර්ථයෙන් **ධ්‍යාන** නම් වේ. විසිර පවත්නා,නොහික් මුණු සිතින් අරමුණු ඇති සැටි බැලීමට නොහැකි වේ. භාවනාවෙන් ලබාගත් සමාධියකින්ම, සිත එක අරමුණක ස්ථිරව පිහිටුවාගෙන, අරමුණ බැලිය යුතුයි. යම් කිසි වස්තුවක් හොඳ හැටි පරීක්ෂාකර බැලීමට කැමැති තැනැත්තා එම අරමුණ සමීපයෙහි තබා, අන් අර මුණු වලට සිත යොමු නොකොට, එමඅරමුණෙහිම සිතස්ථිරව පිහිටුවා බෙහෝ වේලා බලන්නේ වේද, ලං කොට බලන්නේ වේද වර්ණ

සටහන් ආදිය නොයෙක් ආකාරයෙන් බලන්නේවේද, ඕහට ඒ වස්තුව හැම ආකාරයෙන්ම ඉතා පිරිසිදුව වැටහෙන්නේ ය, එමෙන්ම කාමයන්ගෙන් වෙන්ව, භාවනාවෙහි යෙදී, යම් **පඨවි කසිණාදි** අරමුණක සිත පිහිටුවාගෙන, ඒ අරමුණ හොඳ හැටි බලන්නේ වේද, බොහෝ වේලා සිහි නුවණින් යෙදී බලන්නේ වේද, ඕහට ඒ අරමු-ණෙහි සිත එකඟ කර ගැනීමෙන් එහි හැම ආකාරයක් ම පිරිසිදුව වැටහෙන්නේ ය. මෙසේ එක් තැන් කර ගත් සමාධි සිතින්, අන් අරමුණු වළක්වා, ධ්‍යාන අරමුණෙහි සිත රඳවා ගැනීම් වශයෙන් මේ ධ්‍යාන සිත පහළ වේ.

තවද "**පච්චනීක ධම්මෙ ඣාපෙතීති ඣානංයයි**" කී පරිදි විරුද්ධ හෙවත් ප්‍රතිපක්ෂ නීවරණාදි ධර්මයන් දවන අර්ථයෙන් ද **ධ්‍යාන** නම් වේ. කුසලය වළක්වන, ධ්‍යානය වළක්වන, මාර්ගඵලාධිගමය වළක්වන, විරුද්ධ ධර්මයන් **නීවරණ** නම්. ඒ විරුද්ධ ප්‍රත්‍යයන් හෙවත් නීවරණයන් නැගී සිටිනතාක් කල්, කුසල් කිරීමට හෝ ධ්‍යාන ඉපදවීමට හෝ මාර්ගඵල ලැබීමට හෝ නො හැකි වේ.

මේ නීවරණ ධර්මයන්ගේ දුවීම හෙවත් ප්‍රහාණය සතර ආකාරය කින් සිදුවේ. එනම්, **තදංග ප්‍රහාණය විෂ්කම්භණ ප්‍රහාණය සමුච්-ඡෙද ප්‍රහාණය** සහ **පටිප්පස්සද්ධි ප්‍රහාණය** යන සතර ආහාරයෙනි.

**තදංග ප්‍රහාණය**. කාමාවචර කුසල කර්මයන්ගේ ක්ලේශ ප්‍රහාණය **තදංග ප්‍රහාණ** නම් වේ. කුසල් සිත්වලින් තම තමන්ට ප්‍රතිපක්ෂ වූ අකුසලයන් යටපත් කොට තබා ගනිති. කුසල් සිත් යම්තාක් පවතී නම්, ඒතාක් කල් විරුද්ධ වූ අකුසල ධර්මයන්ට නැගී සිටීමට අවකාශ නො ලැබෙන්නේ ය. අන්ධකාර රාත්‍රියක පහනක් දැල්වූ විට, ආලෝකය ඇති වී, අන්ධකාරය පහව යාමත්, පහන නිවීම සමඟම නැවත අන්ධකාරය මතු වීමත් සිදුවන්නාක් මෙන්, කාමාවචර කුසල් සිතින් අකුසල් නැසීම තදඞ්ග ප්‍රහාණ වශයෙන් සිදු වන්නේය. මේ තදඞ්ග ප්‍රහාණය, මහග්ගත සිත් හෙවත් ධ්‍යාන සිත් ඇති වන චිත්ත වීථි වල සහ මාර්ග සිත් ඇතිවන මාර්ග චිත්ත වීථි වල ද, ඒ ධ්‍යාන හා මාර්ග සිත්වලට පූර්ව භාගයෙහි පහළවන පරිකර්ම, උපචාර, අනුලෝම ගොත්‍රභූ නම්වූ කාමාවචර මහා කුසල් සිත් විසින් ම සිදුකරනු ලැබේ.

**විෂ්කම්භණ ප්‍රහාණය** නම් මහග්ගත චිත්තයන්ගේ ක්ලෙශ ප්‍රහාණයයි. ධ්‍යාන සිත් පවත්නා කල්හි රාගාදී කෙලෙස් මතු නොවන්නේය. ජලයෙන් පිරී පවත්නා පොකුණක, දිය පිට හටගත්තා වූ, දිය සෙවෙල් ආදියෙන් වැසී තිබෙන්නා වූ ජලය, භාජනයකින් ගන්නා කල්හි හෝ දණ්ඩකින් හරණා කල්හි හෝ ඒ දියසෙවෙල් යම්සේ ඉවත්ව යෙත් ද, එපරිද්දෙන් රූපාවචර ධ්‍යානාදිය උපදනා කල්හි, චිත්ත නමැති ජලය වසා සිටි, ක්ලෙශ නමැති දියසෙවෙල් ඈත්ව යෙති. ඒ ධ්‍යානලාභි තැනැත්තාගේ සන්තානයෙහි යම්තාක් කල් ධ්‍යාන සිත් නොපිරිහී පවතීද ඒතාක් කල් රාගාදී කෙලෙස් දුරුව පවතිත්. යම් කලෙක ධ්‍යානයෙන් පිරිහී ගියේ වීනම්, නැවත වතුර නො ගන්නා වූ ජලයෙහි දියසෙවෙල් වැතිර පවත්නාක් මෙන් රාගාදී ක්ලෙශයෝ නැවත මුවහ කර ගනිත්. මෙසේ ඇතිවන ක්ලෙශ ප්‍රහාණය **විෂ්කම්භණ ප්‍රහාණ** යයි.

**සමුච්ඡෙද ප්‍රහාණය** නම් සතර ලොකොත්තර මාර්ග චිත්තයන්ගෙන් කෙලෙස් නැසීමය. සෝවාන් ආදී ඒ ඒ මාර්ගයන් විසින් නැසිය යුතු කෙලෙස් නැවත නුපදනා පරිද්දෙන් නැසීම, **සමුච්ඡෙද ප්‍රහාණය** නම් වේ. යම් වෘක්ෂයකට හෙන පහරක් වැදීමෙන්, ඒ ගසේ මුල් හා සමඟ විනාශ වන්නාක් මෙන්, ඒ ඒ මාර්ග සිත් වලින් ඒ ඒ අකුසල යන් ඉතිරි නො කොට හාත්පසින් ම සහමුලින්ම ප්‍රහාණය කෙරෙත්.

**පටිප්පස්සද්ධි ප්‍රහාණය** නම් සතර ලෝකෝත්තර ඵල චිත්තයන්ගේ කෙලෙස් විධා සන්සිඳ වීමය. එනම් මාර්ග සිතකින් නැසූ කෙලෙස් විධා සන්සිඳු වීමක් වශයෙන් ඒ මාර්ග චිත්තයට අනතුරුව ඇතිවන ඵල සිත් වලින්, ඇතිවන සන්සිඳවීමය. යම් තැනෙක කුණු කසල ආදිය රැස් කොට ගින්නෙන් දවා අළු කොට, එහි උෂ්ණය සන්සිඳ වීම පිණිස පැන් කල දෙකක් හෝ තුනක් වත් කිරීමක් මෙනි. මෙකී ප්‍රහාණ විධි සතරින්, මේ රූපාවචර ධ්‍යාන චිත්තයෝ **නීවරණාදී** අකුසල ධර්මයන් **විෂ්කම්භණය** වශයෙන් නසන බව දත යුතුයි.

**නීවරණ ධර්මයෝ පස් දෙනෙකි. එනම්,**

1. **කාමච්ඡන්ද නිවරණය**
2. **ව්‍යාපාද නීවරණය**

3. ථිනමිද්ධ නීවරණය
4. උද්ධච්ච කුක්කුච්ච නීවරණය
5. විචිකිච්ඡා නීවරණය

**කාමච්ඡන්දය** යනු කාම වස්තූන් පිළිබඳ වූ බලවත් ආශාවට හෙවත් තෘෂ්ණාවට කියන නමෙකි. කාම තෘෂ්ණාව, සත්ත්වයා කාමභවයෙහි අලවා මහත් දුකට පමුණුවන කුසලයට බාධා කරණ, සමාධියට විපක්ෂ නීවරණ ධර්මයෙකි. මේ කාම තණ්හා වෙන් මිදෙනු කැමැති පුද්ගලයා, කාමයන්ගෙන් වෙන් වූ, විවේකස්ථානයකට පැමිණ, භාවනා කර්මයට යෝග්‍ය වූ අරමුණක් හෙවත් **කර්මස්ථානයක්** ගෙණ, භාවනා කොට සිතෙහි එකඟ බව හෙවත් **එකග්ගතාවය** උපදවා ගන්නේය. **එකග්ගතාවය** දියුණු වූ කල්හි **සමාධිය** ලැබෙන්නේ ය. මේ **එකග්ගතා චෛතසිකය** කාමච්ඡන්දය දුවීම පිණිස අඞ්ගයක් වශයෙන් ධ්‍යාන සිතෙහි යෙදෙන්නේය.

**ව්‍යාපාදය** යනු බලවත් ක්‍රෝධයට හෙවත්, වෛරයට කියන නමෙකි. මේ ව්‍යාපාදය, සිත් දූෂ්‍ය කරවන, කුසලයට බාධා කරණ නීවරණ ධර්මයකි. ප්‍රීතියෙන් හෙවත් සතුටින් සිටින අවස්ථාවක ක්‍රොධය මතු නොවන බැවින්, **ප්‍රීතිය** ව්‍යාපාදයට විරුද්ධ වූ ධර්මයකි. භාවනානුයෝගී පුද්ගල තෙමේ කමටහන් අරමුණෙහි සිත මනාකොට පිහිටුවා, අරමුණ ඉතා ප්‍රකටව සිතට වැටහුණු කල්හි, උපදනා බලවත් ප්‍රීතිය හේතු කොට ගෙණ ව්‍යාපාදයට නැගී සිටීමට අවකාශ නොදී, **ව්‍යාපාදය** විෂ්කම්භණ ප්‍රහාණ වශයෙන් දවනු ලැබේ. මේ **ප්‍රීති චෛත** සිකය ධ්‍යානාඞ්ගයක් වශයෙන් ධ්‍යාන සිතෙහි පහළ වන්නේ ය.

**ථිනමිද්ධය** යනු චිත්ත චෛතසිකයන්ගේ මලානික බවට හෙවත් මැලි බවට කියන නමෙකි. ක්ලාන්ත වූ පුද්ගලයා බරක් උසුලා ගත නො හැකිව බිම වැතිර සිටින්නාක්මෙන්, ථිනමිද්ධයෙන් පෙළනු ලැබූ තැනැත්තා, යහපත් අරමුණු ලංකොට බැලීමට නො හැකිව ක්ලාන්තව සිටී. යම්කිසි ශක්තිමත් පුරුෂයෙක් පැමිණ ක්ලාන්ත වූ පුරුෂයා අවදි කරවා උනන්දු කරවා, බර කරට උසුලා දී අභිමත තැනකට සැප සේ යාමට සලස්වන්නේ වේද, එමෙන්ම අරමුණෙහි සිත නැංවීමට ශක්තිය ඇති **විතර්ක** නම් චෛතසිකය, බලවත්ව හටගැනීමෙන් **ථිනමිද්ධ නම් වූ නීවරණය** දවා, අරමුණෙහි සිත

මනාකොට පිහිටුවා ගැණීමට උපකාර වන්නේ ය. මේ **විතර්ක චෛතසිකය** ද ධ්‍යානාඞ්ගයක් වශයෙන් ධ්‍යාන සිතෙහි පහළවන්නේය.

**උද්ධච්ච කුක්කුච්චය උද්ධච්චයනම්** සිතෙහි නොසන්සුන් බවය. **කුක්කුච්චය** නම් පසුතැවිල්ලය. මේ දෙකෙහිම, ප්‍රති පක්ෂ ධර්ම යන් සමාන බැවින්, එක්කොට ගෙන උද්ධච්ච කුක්කුච්ච නීවරණ යයි දක්වනු ලැබේ. මානසික දුකින්පෙළනු ලැබූ පුද්ගලයාගේ නොසන් සුන් බවත්, පසුතැවිල්ලත් ප්‍රකටය. යම් පරිද්දෙකින් සිතෙහි සුව පත් බවත් දියුණු බවත් ඇති කර ගැනීමට හැකි වී නම්, එවිට නොසන්සුන් බව සහ පසුතැවිල්ලද පහවී යෙත්. භාවනා අරමුණෙහි සිත මනාව පිහිටුවා ගැනීමෙ දී ඇතිවන ප්‍රීතිය නිසා සිතෙහි යම් **සුවපත් බවක්, මහත් බවක්** ඇතිවේ නම්, සියුම් සොම් සක් වූ මේ මානසික සැප වේදනාවට **සුඛයයි** කියනු ලැබේ. එබැවින් මේ සුඛය, ධ්‍යානාඞගයක් වශයෙන් ධ්‍යාන සිත්හි ඇතිවෙමින් **උද්ධච්ච කුක්කුච්ච** නීවරණය ද දවන්නේය.

**විචිකිච්ඡා** යනු බුද්ධාදී අටතැන පිළිබඳ සැකය වේ. මේ විචිකිච්ඡාව, කුසලය වළක්වන හෙයින් නීවරණයකි. යමක් සැක හැර දැන ගැනීමට නම්, එම අරමුණෙහි සිත මනාකොට හසුරුවා බැලිය යුතු වේ. බලවත් වූ විතර්කයෙන් අරමුණෙහි නැංවූ සිත ඒ අරමු-ණෙහි හැසිරවීම **විචාරය** නමි. මේ **විචාර චෛතසිකය** බලවත්ව අරමුණෙහි හසුරුවමින් මනා කොට පරීක්ෂාවෙන් බලන්නා හට, ඒ පිළිබඳ සියළුම සැක දුරු වන්නේය. එබැවින් මේ **විචාර** නම් වූ **චෛතසිකය** ධ්‍යානාඞ්ගයක් වශයෙන් ධ්‍යාන සිත්හි ඉපිද **විචිකිච්ඡා නීවරණය** දුරු කරන්නේ ය.

මෙසේ භාවනාවෙහි යෙදී සිටින යෝගාවචර තෙම, මෙකී ධ්‍යානාඞ්ග පස උපදවා, ඒ ඒ ධ්‍යානාඞ්ගයන් විසින් ප්‍රහීණ කළයුතු පඤ්ච නිවරණ ධර්මයන්, ක්‍රමයෙන් දුරු කොට ධ්‍යාන සිත් පිළිවෙලින් උපදවා ගන්නේය.

## රූපාවචර පළමුවෙනි ධ්‍යාන කුසල්සිත

ඉහතකී **විතක්ක**, **විචාර**, **පීති**, **සුඛ**, **එකග්ගතා** යන ධ්‍යානාඞ්ග පසෙන් ම යුක්තය. මේ සිත පළමු වරට ලබා ගත් යෝගාවචර තෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන් ගෙන් වෙන්ව විවේක යෙන් හටගත් ප්‍රීතියත්, සුඛයත් නැවත නැවත විඳිනු කැමැතිව, නැවත නැවතත් මේධ්‍යාන සිත් උපදවමින්, එහි ඇතුළත් ධ්‍යානාඞ්ග යන් ආවර්ජනය කරමින් **ආවජ්ජන** වසීයෙන් පුරුදු කරන්නේය. එමෙන් ම එම ධ්‍යානය වහ වහා උපදවමින් ධ්‍යාන සමාපත්තියට සමවදිමින් **සමාපජ්ජන** වසීයෙන් ද පුරුදු වන්නේය. තවද කාල නියමයක් අධිෂ්ඨාන කොට, ඒ කාල පරිච්ඡේදය තුල ධ්‍යාන සිත් නො බිඳී පවත්නා ලෙස **අධිෂ්ඨාන** වසීයෙන් ද පුරුදු වන්නේය. එපමණක් නොව ධ්‍යානයට සමවදිමින් සිට, කැමැති විටෙක ධ්‍යානයෙන් නැගිටීමට හැකිවනසේ **උට්ඨාන වසී**යෙන් ද පුරුදු වන්නේය. මෙසේ මනා කොට පුරුදු කරණ ලද ධ්‍යාන ඇත්තේ, ධ්‍යානාඞ්ගයන් නැවත නැවතත් ප්‍රත්‍යවෙක්ෂා කරමින් **ප්‍රත්‍යවෙක්ෂා වසී**යෙන් ද පුරුදු වන්නේ ය.

## රූපාවචර දෙවෙනි ධ්‍යාන කුසල් සිත

පළමුවැනි ධ්‍යාන සිත මෙසේ පස් ආකාරයකින් පුරුදු කළ තැනැත්තාට ථිනමිද්ධය ස්වල්පයක්වත් හටනොගන්නේය. එය නැසීමට උපදවා ගත් විතර්කය දැන් අනවශ්‍යය. දැන් පළමුවැනි ධ්‍යානයට වඩා සියුම් වූ ප්‍රණීත වූ දෙවෙනි ධ්‍යානය උපදවා ගැනීමට කැමැත්ත ඇති වන්නේය. මෙහි ඖදරික වූ විතර්කය ද දුරු කොට **විචාර**, **පීති**, **සුඛ එකාග්ගතා** යන ධ්‍යානාඞ්ග සතරෙන් යුත් දෙවෙනි ධ්‍යාන සිත උපදවා ගන්නේ ය. මේ දෙවෙනි ධ්‍යානයද ඉහත කී ලෙස පස්ආකාරයකින් පුරුදු කරමින් ප්‍රීතියත්, සුඛයත් විඳිමින් වාසය කරන්නේය.

## රූපාවචර තුන්වැනි ධ්‍යාන කුසල් සිත

පළමු ධ්‍යානයත් දෙවෙනි ධ්‍යානයත් පස් ආකාරයෙන් නැවත නැවතත් පුරුදු කොට, එයට වඩා ප්‍රණීත වූ තුන්වැනි ධ්‍යාන සිත උපදවා ගැනීමට කැමැත්ත පහළ වයාන න්නේය. ධසුවය විඳ

එහි ඵලය ගැන යම් සැකයක් ඇති වී නම් එය ද දුරු වූ හෙයින් විතක්ක, විචාර දෙකම දැන් අනවශ්‍ය, ඖදරික අඞ්ගයන් බව දැක, එය ද දුරුකොට, ඉතිරි ධ්‍යානාංග තුන ,ඉතා සියුම් වශයෙන් පුරුදු කරණ කල්හි, සමාධියෙන් හටගත් ප්‍රීතියත්, සැපයත් ඇති **පීති සුඛ එකග්ගතා** යන ධ්‍යානාඞ්ග තුනෙන් යුත් **තුන්වැනි ධ්‍යාන කුසල් සිත** උපදවා ගන්නේය.

## රූපාවචර සතරවැනි ධ්‍යාන කුසල් සිත

මේ ධ්‍යාන තුන පස් ආකාරයෙන් පුරුදු කොට, එයට වඩා ප්‍රණීත වූ සතරවැනි ධ්‍යාන සිත උපදවා ගනු කැමැතිව, නැවත භාවනා ආරම්භ කොට, ප්‍රීතියත් අනවශ්‍ය බව වැටහී එය ද දුරුකොට, **සුඛ එකග්ගතා** යන ධ්‍යානාංග දෙකින් යුත් **සතරවැනි ධ්‍යාන සිත** උපදවා ගන්නේය.

## රූපාවචර පස්වැනි ධ්‍යාන කුසල් සිත

දැන් ධ්‍යාන සිත් සතර පස් ආකාරයෙන් පුරුදු කොට, සිත බොහෝ සෙයින් තැන්පත් වී ඇති හෙයින් එයටත් වඩා සියුම් වූ, ප්‍රණීත වූ පස්වැනි ධ්‍යාන සිත උපදවා ගැනීම පිණිස වීර්‍ය්‍ය ආරම්භ කරන්නේය. මෙසේ සිත එකඟ වූ කල්හි හෙතෙම සැපය ද දුරු කිරීමෙන්, දුක ද දුරුකිරීමෙන්, පළමු කොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන්, දුක් නැත්තා වූ සැප නැත්තා වූ, **උපෙක්ඛා එකග්ගතා** යන අඞ්ග දෙකින් යුත් **පස්වැනි රූපාවචර ධ්‍යාන කුසල් සිත** උපදවා ගන්නේය.

## ධ්‍යාන ලැබීමට සුදුසුකම්

ධ්‍යාන උපදවා ගැනීමට හේතු සම්පත් තිබිය යුතුය.

1. ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ඇති පුද්ගලයෙකු වියයුතුය. එනම් **ඤාණ** සම්ප්‍රයුක්ත මහාවිපාක සිත් සතරින් එකක් ප්‍රතිසන්ධි සිත වශයෙන් ලබා සිටි කෙනෙක් විය යුතුයි.

2. සුගති අහේතුක, දුගති අහේතුක, ද්විහේතුක, පුද්ගලයන්, ශීල විසුද්ධිය මුදුන් පමුණුවා, බුදුන්වහන්සේ ආචාර්‍ය්‍ය කොට, කමට හන් ගෙණ, දිවිතෙක් භාවනා කෙළේ වී නමුත් ධ්‍යාන නො ලබයි. ඇතැම් විට තම අදහස් ඉටු නොවීමෙන්, කළ කිරීමට හෝ උන්මාද බවට හෝ පැමිණ, ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව නිෂ්ඵල දෙයකැයි, හිස් දෙය කැයි, වැරදි දෘෂ්ටි ගෙණ අපාගත වන්නේය.

3. **විපාකාවරණ**යෙන් නො මිදුණු, සුගති අහේතුක දුගති අහේතුක පුද්ගල තෙමේ, මතු ආත්මයෙහි ධ්‍යාන ලබමියි සිතා භාවනා කරන්නේ නම්, ඔහුගේ භාවනාව හිස් නො වන්නේය. දෙවෙනි, තුන්වැනි භවයෙහිවත් ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලැබ, භාවනා කර වහා ධ්‍යාන ලබන්නේය.

4. සසර භාවනා පුරුදු කළ කෙනෙක් ද විය යුතුය. එවිට හෙතෙම ගොයම් කමත් ආදියෙහි පවා වහාම කසිණ නිමිත්ත ලැබ ධ්‍යාන උපදවා ගනියි,

5. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලැබුණේ වී නමුත්, මේ ආත්මයෙහිම මව්පියන් මැරීම් ආදී පඤ්චානන්තරිය කර්ම කළවුන්ට, **කර්මාවරණ**ය නිසා ධ්‍යානය නො ලැබේ.

6. මහත් ධන සම්පත් ආදිය ඇති තැනැත්තා ද, වස්තු ලෝභය නිසා ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලැබුණේ වී නමුත් ධ්‍යානය නො ලබයි.

7. උපසම්පද භික්ෂූන් පාරාජිකාපත්තියට පැමිණ, ශ්‍රමණ ප්‍රතිඥවෙන් ශාසනයෙහි වසන තෙක්, ත්‍රිහේතුක ප්‍රතිසන්ධි වූවද, ධ්‍යාන නො ලබයි. ඔහු ගිහිව, පන්සිල් දශ සිල් ආදියෙහි පිහිටා භාවනා කළහොත් ධ්‍යාන ලබයි.

8. **ක්ලෙශාවරණ**යෙන් මිදුනු කෙනෙක් ද විය යුතුයි. මිථ්‍යා දෘෂ්ටිය බලවත් ක්ලෙශයක් බැවින් එයින් තොරව විසිය යුතුයි.

9. ධ්‍යානලාභී ආචාර්‍ය්‍යවරයෙකු හමුවෙහි පිරිසිදු ශීලයෙහි පිහිටා, උන්වහන්සේගෙන් අවවාද අනුශාසනා ගෙණ, තමන්ගේ

චරිතයට සුදුසු කමටහනක් ලබාගෙන, භාවනාවට යෝග්‍ය වූ ගොචර ස්ථානයකට එළඹ, තුනුරුවන්ට තමන් ගේ ජීවිතය පුද, භාවනා ආරම්භ කළ යුතුය. පිරිසිදු ශීලයෙහි නො පිහිටි යෝගාවචරයා හට සමාධිය නො ලැබේ. ගිහිව හෝ පැවිදිව හෝ සියළුම කාය වාක් දුශ්චරිතයන්ගෙන් වෙන්ව, නිවැරදි ජීවිකාවක් ඇතිව, කාම වස්තූන් කෙරෙහි ඇලීමක් නොමැතිව විසිය යුතුයි. භාවනාවට අගෝචර ස්ථානයන්හි ද සිත එකඟ කරගත නො හැකි වේ.

**අගොචර ස්ථාන** නම් මහා ආවාස, නව ආවාස, ජරා ආවාස, මහා මාර්ගාසන්න ආවාස, ගල්, පොකුණු, පලාපත්, මල්, ගෙඩි ජාති ඇති ආවාස, මහාජනයා ගැවසෙන ආවාස, නගරාසන්න ආවාස, දැව දඬු ඇති ආවාස, පටුන් අසල ආවාස, පිටිසර ආවාස, රාජ්‍ය සීමා අසල ආවාස, විශභාග රූපයන් හා පුද්ගලයන් ඇති ආවාස, අමනුෂ්‍යයන් ඇති ආවාස, කල්‍යාණ මිත්‍රයන් නැති ආවාස, ක්ෂෙත්‍රාසන්න ආවාස යන ආදියයි. මෙයින් වෙන් වූ, නො දුරු නො ලං, ගමනාගමනයට පහසු, සුදුසු කල්‍යාණ මිත්‍රයන් ඇති ස්ථාන, භාවනාවට යෝග්‍ය ස්ථාන හෙවත් **ගොචර ස්ථාන** නම් වේ. ඉහත කී අගෝචර ස්ථානයන්හි, මනුෂ්‍ය, අමනුෂ්‍ය, තිරිසන් ආදී සතුන්ගෙන් ද, වෙනත් සිත් ඇදගන්නා රූප ශබ්දදි නොයෙක් අරමුණු වලින් ද, උපද්‍රව පැමිණිය හැකි බැවින් භාවනාවට සුදුසු තැන් නොවන්නේ ය.

**කමටහන්** යනු භාවනා **කර්මයට** සුදුසු පඨවි කසිණාදි සතලිසක් අරමුණු අතුරෙන් එකකි. ඒ ඒ චරිතයන්ට සුදුසු **කමටහන්** නියම කර ඇති හෙයින්, ආචාර්‍ය්‍යයන් වහන්සේ විසින් **යෝගාවචරයා** විමසා, ඔහුගේ චරිතයට අනුකූල වූ කමටහනක් දීමෙන්, නිසි මග යවනු ලැබේ.

## ධ්‍යාන උපදවන පිළිවෙල

ධ්‍යාන ඉපදවීමට හේතු සම්පත් ඇති යෝගාවචර තෙම, ගොචර ස්ථානයකට එළඹ, පඨවි කසිණය කර්ම ස්ථාන වශයෙන් ගත්තේ වී නම්, පඨවි කසිණය නම් වූ පරි **කර්ම නිමිත්ත** ඉදිරියෙහි තබාගෙන පද්මාසනයෙන් හෝ හිඳ, ඒ නිමිත්ත දෙස බලමින්, ''පඨවි පඨවි'' යනාදී වශයෙන් **පරි කර්ම භාවනාව** ආරම්භ කරන්නේය. මෙසේ

භාවනා කරණ කල්හි, අන් අරමුණු වළක්වා ගනිමින්, පරි කර්ම නිමිත්තෙහි ම සිත නැවත්වීමෙන්, සිතෙහි එකඟ බව ඇති වී, ඒ පරිකර්ම නිමිත්තෙහි සියළු වර්ණ සටහන් ආදිය මනාව වැටහෙන්නේය. එවිට වට පිට බලන්නාවූ ද, ඇස් වසාගෙන බලන්නාවූ ද, ඔහුට, මේ නිමිත්ත මිස අන් කිසිවක් සිතට හමු නොවන්නේය. එසේ වැටහුණු කල්හි ඒ නිමිත්තට **උග්ගහ නිමිත්ත** යයි කියනු ලැබේ. දැන් මොහුට පරි කර්ම පිණිස ඉදිරියෙහි තබා ගත් කසිණ නිමිත්ත උවමනා නැති බැවින් , එය අත්හැර දමා, විවේකය ඇති අන් තැනකට එළඹ, සිතට වැටහුණු ඒ පඨවි නිමිත්ත නැවත මෙනෙහි කරමින් භාවනාවෙහි යෙදෙන්නේ ය. මෙසේ බොහෝ වේලා මේ **උග්ගහ නිමිත්ත** අරමුණුකොට භාවනාවඩනකල්හි, ඒ උග්ගහ නිමිත්ත විවෘත කොට ගෙණ පළමු වාරයෙහි කණාමැදිරි ආලෝකයක් පමණ වූ, අතිශයින් ප්‍රසන්න වූ **කසිණ ප්‍රතිභාග නිමිත්ත** යයි කියන ලද **කසිණා ලෝකය** උපදී. ඒ **කසිණා ලෝකය** උපන් මාත්‍රයකින් ධ්‍යානය නූපදී. ඒ ආලෝකය මහත් වේවායි නිකාන්තිය හෙවත් කැමැත්ත උපදවා ගෙණ, ඒ **කසිණාලෝකය** අරමුණු කොට ගෙණ ''පඨවි පඨවි'' යනාදී වශයෙන් නැවත භාවනා කරණ කල්හි, ඒ ආලෝකය අඟලක් දෙකක් පමණ මහත්ව වැටහෙන්නේ ය. එයට **පරිත්තාලම්බණ** යයි කියනු ලැබේ. මේ අවස්ථාවේ දී යෝගාවචරයාහට ධ්‍යානය උපදවා ගත හැකි වේ. එයින් සතුටට නො පැමිණ ආලෝකය තවත් මහත් කරුණු කැමැතිව, භාවනා කරණ කල්හි, ඒ ආලෝකය දෙළොස් අඟලක් පමණ මහත් වේ. එයට **මධ්‍යමාලම්භණ** යයි කියනු ලැබේ. මෙහිදී ද කැමැති නම් **ධ්‍යානය උපදවා** ගත හැකි වේ. මෙයිනුත් සතුටට නො පැමිණ **කසිණාලෝකය** තවත් මහත් කරුණු කැමැතිව භාවනා කරණ කල්හි සැම දිසාවන්හි ම පැතිර පවත්නා **අප්පමාණාලම්බණ** යයි කියනු ලබන මහත් වූ කසිණාලෝකය පහළ වේ. මේ ආලෝකය නිතර උපදවා ගත හැකි පරිද්දෙන් ආරක්ෂා කරන්නේ නම්, ඍද්ධිවිධඥනාදී පඤ්චාභිඥා උපදවා ගැනීමට ද, අරූපාවචර ධ්‍යාන උපදවා ගැනීමට ද පහසු වන්නේය.

මේ ධ්‍යාන සිත, එය පහළවන චිත්තවීථියේ එක් සිතක් බවත්, එයට අනතුරුව භවාඞ්ග සිත් නැවත නැවත හටගන්නා බවත්

නැවත නැවත ධ්‍යාන චිත්තවීථි උපදවා ගැනීමෙන් ධ්‍යාන සිත් රාශියක් පහළවන බව ද දත යුතුයි.

මේ රූපාවචර ධ්‍යාන කුසල් සිත් පහෙන් පළමු ධ්‍යාන සිත් සතර **සොමනස්ස සහගත සිත්** බවද, පස්වැනි ධ්‍යාන සිත උපෙක්ඛා සහගත බව ද මේ සිත් සියල්ලම සම්ප්‍රයුක්ත සිත් බවද, එසේම සසංඛාරික බවද දත යුතුය.

## රූපාවචර විපාක සිත් පහ

1. **විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන විපාක සිත.**
2. **විචාර පීති සුඛ එකග්ගතා සහිත දුතියජ්ඣාන විපාක සිත.**
3. **පීති සුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන විපාක සිත.**
4. **සුඛ එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන විපාක සිත.**
5. **උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන විපාක සිත.**

මේ රූපාවචර විපාක සිත් පහ රූපාවචර කුසල් සිත් පහට සමානය. රූපාවචර ධ්‍යාන කුසල් සිත් උපදවා, ඒ ධ්‍යානයෙන් නො පිරිහී චුතවීමක් ඇතිවේ නම්, ඒ ධ්‍යානයට සුදුසු වූ රූපාවචර බ්‍රහ්මලෝකයක ඔහුගේ පහළ වීමත් සමගම, මේ රූපාවචර විපාක සිත්වලින් එකක් පටිසන්ධි සිත වශයෙන් උපදින්නේ ය. එයට පසු එම භවයේ භවාඞ්ග සිතත්, චුති සිතත්, මේ විපාක සිතක් ම වේ. මෙසේ එක් එක් ධ්‍යාන සිතකට එක් එක් විපාක සිත බැගින් ඇති බව දත යුතුයි. වේදනා ආදී භෙදයන් කුසල් සිත්වලට කී පරිදි දත යුතුය.

## රූපාවචර ක්‍රියා සිත් පහ

1. **විතක්ත විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන ක්‍රියා සිත.**
2. **විචාර පීති සුඛ එකග්ගතා සහිත දුතියජ්ඣාන ක්‍රියා සිත.**
3. **පීති සුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන ක්‍රියා සිත.**
4. **සුඛ එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන ක්‍රියා සිත.**
5. **උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන ක්‍රියා සිත.**

රූපාවචර ධ්‍යාන සිත් පහ, රහත් නොවූ පුද්ගලයන්ට ඇති වූ කල්හි, **කුසල් සිත්** යයි ද, රහතන් වහන්සේලාට ඇති වූ කල්හි, **ක්‍රියා සිත්** යයි ද, කියනු ලැබේ. මේ ක්‍රියා සිත්හි වේදනාදී භෙද පෙර සේම දතයුතුයි. රහතන් වහන්සේලා මේ රූපාවචර ධ්‍යාන සිත් උපදවා ගනු ලබන්නේ විවේක සැපය විඳිනු සඳහාය. තවද, මේ රූපාවචර ධ්‍යාන මෙසේ උපදවා, අරූපාවචර ධ්‍යානයන් ද වඩා, අෂ්ට සමාපත්තිලාභීව, ඉහාත්මයෙහිම නිවන් සුව විඳීම යයි කියන ලද නිරොධ සමාපත්තියට සම වැදීම පිණිස ද, මේ ධ්‍යාන සිත් උපදවා ගන්නා බව දතයුතු- මතු භවයක් නැති හෙයින් විපාක ශක්තියක් නැති, ධ්‍යාන ක්‍රියා සිත් ම රහතන් වහන්සේලාට උපදින් නාහ.

මේ රූපාවචර ධ්‍යාන පස ලැබූ යෝගාවචර තෙමේ පස් වැනි ධ්‍යානය, ඉහත කියන ලද පස් ආකාරයෙන් පුරුදු කොට, **පඤ්චාභිඥ** උපදවන්නේය. මේ **පඤ්චාභිඥවෝ** පඤ්චමධ්‍යානයාගේ ම ආනිශංසයෝයි. පඤ්චාභිඥ නම් (1) **ඍද්ධි විධඥණය**. (2) **පර චිත්ත විජානනඥනය**. (3) **පුබ්බෙනිවාසානුස්සති ඤාණය.** (4) **දිව්‍යචක්ෂුරභිඥනය**. (5) **දිව්‍යශ්‍රොතඥනය** යන අභිඥ පසය. මේ අභිඥ ලබන පුද්ගලයෝ සදෙනකි. (1) කර්මවාදී ක්‍රියාවාදී තීර්ථක තවුස් ආදී ප්‍රථග්ජනයාය. (2) සාමාන්‍ය රහතන් වහන්සේය (3) අසූමහාශ්‍රාවකයෝය, (4) අග්‍ර ශ්‍රාවක දෙදෙනාවහන්සේය. (5) පසේ බුදුන්වහන්සේය. (6) සර්වඥ බුදුන්වහන්සේය. මෙයින් නො රහත් වූ සියළුදෙනාම **පඤ්චමධ්‍යාන කුසල් සිත** අභිඥ බවට පමුණුවා ගනී. රහත්වූ අන්‍ය ආර්‍ය්‍ය පුද්ගල පස්දෙනා වහන්සේ පංචමධ්‍යාන ක්‍රියා සිතින් අභිඥ උපදවා ගන්නා සේක.

**ඍද්ධිවිධ ඤාණය** ලබනු කැමති යෝගාවචර තෙමේ භූත කසිණ සතර සහ වර්ණ කසිණ සතර යන කසිණ අට වෙන් වෙන් වශයෙන් අරමුණු කොට අෂ්ටසමාපත්ති ඉපද විය යුතුයි. එය ද අනුලෝම පටිලෝම යනා දී වශයෙන් දහ හතර ආකාරයෙකින් පුරුදු කොට පංචමධ්‍යාන සිත උපදවා ගෙන එයට අනතුරුව ප්‍රත්‍යවෙක්ෂා ජවන චිත්තයන්ගේ කෙළවර අධිෂ්ඨාන කළ පරිදි සිය දහස් ගණන් රූප මැවීම, පොළොව කිමිදීම, අහසින් යාම යනා දී ඍද්ධි උපදවා ගන්නේ ය.

**පරචිත්තවිජානනඥානය** නම් අනුන්ගේ සිත් දැන ගන්නා නුවණය. එයට චෙතොපරියඥානය යයි ද කියනු ලැබේ. මෙතෙමේ ආලෝකය වඩා දිවැසින් අනුන් ගේ හෘදයවස්තුව බලා එහි පවතින ලේ ධාතුවෙහි වර්ණයෙන් සිත මෙබඳු යයි කියන්නේ ය. පෙර විසූ කඳ පිළිවෙල දක්නා නුවණ **පුබ්බෙ නිවාසානුස්සති ඤාණය** නමි. හෙතෙමේ තමා හිඳින ස්ථානයේ විස්තර පටන් ක්‍රමයෙන් ගත වූ තැන් සිතමින් පටිසන්ධිය දක්වා මෙනෙහි කොට, එයින් නො නැවතී පූර්ව ජන්මයෙහි චුතික්ෂණය ආදි වශයෙන් පෙර කඳ පිළිවෙල මෙනෙහි කරන්නේ ය.

**දිව්‍යචක්ෂුරභිඥානය** නම් භාවනා බලයෙන් නිපදවා ගත් ප්‍රඥා චක්ෂුසයෙන්, ඉතා ඈත රූප පවා දෙවියන්ගේ ඇස්වලින් බලන් නාක් මෙන් පිරිසිදුව දැකීමට උපදවා ගත් ඤාණයකි. සුගති දුගති දෙකට යන්නා වූ සත්වයන් ද, එයට හේතු වූ කර්ම ද ඒ නුවණින් දත හැකි වේ.

**දිව්‍ය ශ්‍රොතඥානය** නම් දෙවියන් ගේ ශ්‍රොතය මෙන් දුර ශබ්ද පවා ඇසිය හැකි ශ්‍රොත ධාතුවයි. මොහු විසින් පළමු කොට තමා අවට සියළුම ශබ්ද, පුද්ගලාදී වශයෙන් වෙන් කොට දත යුතුයි. මෙසේ පුරුදු කිරීමෙන් උවමනා විටෙක උවමනා ශබ්ද ඇසීමේ ඤාණයක් මොහුට ඇති වන්නේය. අභිඥලාභීන් ගේ ඤාණය ඒ ඒ පුද්ගලයන්ගේ වශයෙන් වෙනස් වේ. පෘථග්ජන අභිඥලාභී පුද්ගලයාගේ ඤාණය කදෙපැණියෙකුගේ ආලෝකයට බඳු වේ. සාමාන්‍ය රහතන්වහන්සේගේ ඤාණය තෙල්පහන් ආලෝකයක් මෙන් ද, අසූමහා ශ්‍රාවකයන් ගේ ඤාණය පන්දම් එළියක් මෙන් ද, අග්‍රශ්‍රාවකයන්ගේ ඤාණය පහන් තරු එළිය මෙන්ද, පසේ බුදුන් වහන්සේගේ ඤාණය චන්ද්‍රාලෝකය මෙන් ද, ලොවුතුරා බුදුන් වහන්සේගේ ඤාණය සූර්‍ය්‍යාලෝකය මෙන් ද දත යුතුය.

# අරූපාවචර සිත් දොළොස

අරූප ලොක සතරෙහි පවත්නා හෙවත් අරූප ලොකවලට අයත් සිත් **අරූපාවචර සිත්** නමි. රූපාවචර බ්‍රහ්ම ලොකවලට වෙනස් වූ ද, රූපකයක් හෙවත් ශරීරයක් නැති, නාමකය

පමණක් පවත්නා හෙයින් අරූප ලොක යයි කියනු ලැබේ. රූපාවචර පඤ්චමධ්‍යානය උපදවා ගත් යොගාවචර තෙමේ, කාම යන් ගෙන් වෙන් වූ නමුත්, මේ ශරීරය ඇති කල්හි කාය වාක් දුෂ් චරිතයන් කොට, මරණින් මතු සතර අපායෙහි ඉපි ද, මහත් වූ දුක් විඳින්නට සිදුවන බව දැක, සසර දුකට මුල් හේතුව මේ රූප යයි සළකා, රූපයට නින්ද කොට, රූපයක් නැති අරූප භවයක් ලැබිය හැකි නම් එය ම උතුමැ යි සිතා, රූපය අත්හරිනු පිණිස භාවනා කොට මේ අරූපධ්‍යාන සිත් උපදවා ගන්නේ ය.

**මේ අරූපාවචර ධ්‍යාන සිත්** සියල්ල දෙළොසකි. එයින් සිත් සතරක් **අරූපාවචර කුසල් සිත් ය.** සතරක් **අරූපාවචර විපාක සිත් ය.** ඉතිරි සිත් සතර **අරූපාවචර ක්‍රියා සිත් ය.** මේ අරූපා වචර සිත් දෙළොසත්, රූපාවචර සිත් පසළොසත් යන සිත් **සත්විස්ස (27)** මහග්ගත ධ්‍යාන සිත් නම්.

### අරූපාවචර කුසල් සිත් සතර

1. **ආකාශානඤ්චායතන කුසල් සිත** (අනන්ත වූ ආකාශය අරමුණු කොට පවත්නා කුසල් සිත.)

2. **විඤ්ඤාණඤ්චායතන කුසල් සිත.** (අනන්ත වූ විඤ්ඤා ණය අරමුණු කොට පවත්නා කුසල් සිත.)

3. **ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත.** (කිසිවක් නැති බව යන අභාව ප්‍රඥප්තිය අරමුණු කොට පවත්නා කුසල් සිත.)

4. **නෙව සඤ්ඤා නා සඤ්ඤායතන කුසල්සිත.** (සංඥාවක් ඇත්තේත් නැති නැත්තේත් නැති කුසල් සිත.)

රූපාවචර පඤ්චමධ්‍යානයට පසුව උපදවා ගත් මේ අරූපාවචර සිත් සියල්ල ම **උපෙක්ඛා එකග්ගතා** යන ධ්‍යානාඞ්ග දෙකින් යුක්ත වන බැවින් පඤ්චමධ්‍යාන සඞ්ඛ්‍යාවට ම ගැණෙන්නේ ය.

## ආකාශානඤ්චායතන කුසල් සිත

**ආකාශානඤ්චායතන** නම් වූ පළමුවැනි අරූපාවචර ධ්‍යානය උපදවනු කැමැති යොගාවචර තෙමේ, මේ රූපයෙහි දෙස් සොයන්නේ, මේ ශරීරය ඉතා දුක සේ පොෂ්‍ය කළ යුතු බවත්, එසේ ද වුවත් නොයෙක් ජරා, රෝග, ව්‍යාධි හටගන්නා බවත්, සතුරු උපද්‍රවාදීන් ගෙන් පෙළනු ලබන බවත්, නොයෙක් අන්තරාවන්ට මේ රූපය භාජනය වන බවත් යනාදී නොයෙක් ආදීනව දැක, මේ රූපයට පිළිකුල් කිරීම යුක්ති සහගත බවත් වටහා ගන්නේ ය. තව ද, රූපාවචර ධ්‍යාන උපදවා ගැනීමට උපකාර වූ, කසිණ මණ්ඩල යෙහි පැතිර පවත්නා වූ කසිණාලොක සඞ්ඛ්‍යාත රූපය ක්ලෙශ යන් ගේ විෂ්කම්භන ප්‍රහාණියට උපකාර වූ ප්‍රණීත රූපයක් වූ නමුත් මේ ශරීරය මෙන් කසිණාලොක රූපය දුකට හේතු නො වන්නේ නමුදු , රූප වශයෙන් සමාන බැවින්, මේ කසිණා ලොක රූපය ද ශරීරය මෙන් භය උපදවන්නේ දෝ හෝයි සිතා කසිණා ලොකය දුරු කරන්නට උත්සාහ දරන්නේ ය. මෙසේ සිතා භාවනා වඩන්නාවූ යොගාවචර තෙමේ, කසිණාලොකය කැමැති ප්‍රදේශයක පතුරුවා, ඒ ප්‍රදේශය සම්පූර්ණයෙන් ම කසිණාලෝකයෙන් පැතිර ගිය කල්හි මාගේ භාවනාවට පූර්වයෙහි මේ ආකාශයෙහි චන්ද්‍ර මණ්ඩල තාරකා රූපාදිය හොඳින් විද්‍යාමාන වූ නමුත්, දැන් මාගේ කසිණාලෝකයෙන් ඒ තාරකා රූපාදිය වැසී ගියේ යයි සිතා ඒ කසිණාලොකයෙහි නිකාන්තිය හෙවත් කැමැත්ත දුරු කොට, පළමු තිබුනා වූ තාරකා රූපාදිය දක්නට කැමැත්ත උපන් බැවින්, ඒ කාසිණාලොකය එක් ප්‍රදේශයකින්, ජනේල කවුලුවක් විවෘත කළාක් මෙන්, අතුරදහන් වී යයි. මෙයට **කිසුණු ඉගුළු ආකාශය** යයි කියනු ලැබේ. ඉක්බිති හෙතෙමේ **කිසුණු ඉගුළු ආකාශය** හෙවත් **කසිණුග්ඝාටිකාමාකාශ ප්‍රඥප්තිය** අරමුණු කොට ගෙණ, ''අනන්ත වූ ආකාශය, අනන්ත වූ ආකාශය'' යනාදී වශයන් භාවනා වඩන කල්හි අනන්ත වූ ආකාශ ප්‍රඥප්ති අරමුණෙහි සිත එකඟ වූ කල්හි, අනන්ත වූ ආකාශ අරමුණ ප්‍රකටව වැටහී ධ්‍යාන චිත්ත වීථිය පහළ වීමෙන් පරිකර්මාදී මහා කුසල් සිත් සතරට පසුව, උපෙක්ඛා එකග්ගතා යන ධ්‍යානාඞ්ග දෙකින් යුක්ත වූ ආකාශානඤ්චායතන කුසල් සිත එක් වරක් ඉපි ද නිැද්ධවීමෙන් නැවත භවාංග වේ.

## විඤ්ඤාණඤ්චායතන කුසල් සිත

ආකාශානඤ්චායතන ධ්‍යානලාභී යොගාවචර තෙම, ඒ ධ්‍යානය පළමු කී පරිදි පස් ආකාරයෙන් පුරුදු කොට, එම ධ්‍යාන සිතෙහි යෙදුන උපෙක්ඛා එකග්ගතාවන් නැවත නැවතත් ප්‍රත්‍යවෙක්ෂා කොට බලන කල්හි, ඒ ආකාශානඤ්චායතන කුසල් සිත රූපාවචර පඤ්චමධ්‍යාන සිතට ආසන්න බැවිනුත්, කසිණාලොක නමැති රූපය පතුරුවන ලද ආකාශයෙහි මේ ධ්‍යානය ලැබූ හෙයින්, එය දුන් ප්‍රණීත නොවේ යයි ද සිතා, එම ධ්‍යානයෙහි කැමැත්ත අත්හැර **විඤ්ඤාණඤ්චායතන** ධ්‍යානය උපදවනු කැමැතිව භාවනා වඩන්නේය. මෙසේ භාවනා වඩන්නා වූ හෙතෙමේ පළමු උපදවා ගත් ආකාශා නඤ්චායතන කුසල් සිතම අරමුණු කොට ගෙණ ''විඤ්ඤාණය අනන්තය, විඤ්ඤාණය අනන්තය'' යනාදී වශයෙන් වඩනා කල්හි අනන්ත වූ විඤ්ඤාණ සිත ප්‍රකටව වැටහී ධ්‍යාන චිත්ත වීථියක් පහළවීමෙන් පරිකර්මාදී කුසල් සිත්වලට අනතුරුව උපෙක්ඛා එකග්ගතා යන ධ්‍යානාඞ්ග දෙකින් යුත් **විඤ්ඤාණඤ්චායතන** කුසල් සිත එක් වරක් ඉපිද නිරුද්ධවීමෙන් පසු නැවත භවාඞ්ග වේ.

## ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත

විඤ්ඤාණඤ්චායතන ධ්‍යානලාභී යොගාවචර තෙමේ, ඒ ධ්‍යාන යද පළමු පරිදි පඤ්ච වසිතාවෙන් පුරුදු කොට, නැවත නැවතත් ඒ ධ්‍යානයට සමවදින කල්හි, ඒ ධ්‍යානයාගේ අරමුණ, ඖදරික යයි අත් හරින ලද්ද වූ ආකාශානඤ්චායතන කුසල චිත්තය ම බව දැන, එයට වඩා ප්‍රණීත වූ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය උපදවා ගනු කැමැතිව, ආකාශානඤ්චායතන ධ්‍යානයාගේ කිසිවක් නැත යන අභාව ප්‍රඥප්තිය අරමුණ කොට ගෙන ''කිසිවක් නැත, කිසිවක් නැත'' යනාදි වශයෙන් භාවනා වඩන කල්හි, ධ්‍යාන චිත්ත වීථිය පහළවීමෙන් පරිකර්මාදි කුසල් සිත්වලට අනතුරුව උපෙක්ඛා එකක්ගතා යන ධ්‍යානාඞ්ගයන් ගෙන් යුත් ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත එක් වරක් ඉපිද නිරුද්ධ වීමෙන් පසු නැවත භවාඞ්ග වේ.

## නෙව සඤ්ඤා නා සඤ්ඤා යතන කුසල් සිත

ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානලාභී යොගාවචර තෙමේ ඒ ධ්‍යානය පළමු පරිදි පස් ආකාරයෙන් පුරුදු කොට නොයෙක් වර ධ්‍යානයට සමවදිමින්, නැවත ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත විඤ්ඤාණඤ්චායතන සිතට ලං වූ බැවින්, එය ද අත්හැර, එයට වඩා ප්‍රණීත වූ නෙව සඤ්ඤා නා සඤ්ඤායතන සිත උපදවා ගනු කැමැතිව, ඒ ආකිඤ්-චඤ්ඤායතන ධ්‍යාන සිත ම අරමුණු කොට ගෙන එය, ''ශාන්තය, ප්‍රණීතය, ශාන්තය, ප්‍රණීතය'' යනාදී වශයෙන් භාවනා වඩන කල්හි, නැවතත් ධ්‍යාන චිත්තවීථිය පහළවීමෙන් පරිකර්මාදී කුසල් සිත් වලට අනතුරුව උපෙක්ඛා එකග්ගතා යන ධ්‍යානාඞ්ග දෙකින් යුත් **නෙව සඤ්ඤා නා සඤ්ඤායතන ධ්‍යාන සිත** එක් වරක් ඉපිද නිරුද්ධ වීමෙන් පසු නැවත භවාඞ්ග වේ. මෙහි **සඤ්ඤා** යන්නෙන් **සඤ්ඤා චෛතසිකය කී** නමුත්, ඒ සමග ම ඒ සිතෙහි යෙදෙන අනිකුත් චෛතසිකයන් ද ගත යුතු ය. ඉතා සියුම් බවට පත් කරන ලද මේ අරූපාවචර ධ්‍යාන සිතෙහි හා එහි යෙදී ඇති චෛතසිකයන් ගේ ද, ඇති බවක් හෝ නැති බවක් දැන ගැනීම පවා දුෂ්කර හෙයින් **නෙව සඤ්ඤා නා සඤ්ඤා** යයි නම් කරන ලදී.

සතර අරූප ධ්‍යානයන්ට සමාන වූ උපමාවක් නම්–මහා කාන්තාර යක් මැද මණ්ඩපයක් වෙයි. එහි බිම අසූචිවලින් පිරී තිබේ. සූර්‍ය තාපයෙන් ක්ලාන්ත වූ එක්තරා පුරුෂයෙක් දුවගෙණ විත්, මණ්ඩපය බලා එහි සෙවෙන ලැබීමට කැමැති ව, පය ගසන්නට තැනක් නො ලැබ, මදක් උඩ පැන මණ්ඩප පියසෙහි එක් කොනක් අල්වා ගෙන, එහි එල්ලී බිම ස්පර්ශ නො කොට සිටී. දෙවැනි පුරුෂයෙක් ද එසේ ම දුවගෙණ විත්, එල්ලෙන්නට තැනක් නො දැක, පළමු පුරුෂයා ගේ පයෙහි එල්ලී බිම ස්පර්ශ නො කොට සිටී. තුන්වැනි පුරුෂ යෙක් ද, විඩා සන්සිඳුවා ගැනීම සඳහා දුවගෙණ අවුත් බිම ස්පර්ශ කිරීමට තැනක් නො දැක, පළමු පුරුෂයා මෙන් මණ්ඩපයෙහි අනික් කෙළවරෙහි එල්ලී සිටී. සතරවැනි පුරුෂයෙක් ද, ඔහු පසු පසින් දුවගෙණ විත් තැනක් නො ලැබ තුන්වෙනි පුරුෂයා දැක ඔහු ගේ පයෙහි එල්ලී බිම ස්පර්ශ නො කොට සිටී.

මේ උපමාවෙහි කාන්තාරය නම් භයානක වූ සසරයයි. අසූචි යෙන් පිරි පොළව නම් කාම ලොක යයි. මණ්ඩපය නම් අරූප ලොක සතර ය.

පළමුවැනි පුරුෂයා—ආකාශානඤ්චායතන ධ්‍යානලාභී පුද්ගලයා ය.

දෙවැනි පුරුෂයා—විඤ්ඤාණඤ්චායතන ධ්‍යානලාභී පුද්ගලයා ය.

තුන්වැනි පුරුෂයා—ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානලාභී පුද්ගලයා ය.

සතරවැනි පුරුෂයා—නෙවසඤ්ඤා නා සඤ්ඤායතන ධ්‍යානලාභී පුද්ගලයා ය.

1. පළමුවැනි පුරුෂයා මණ්ඩප පියසෙහි එල්ලී සිටියාක් මෙන් **ආකාශානඤ්චායතන සිත** රූපාවචර පස් වැනි ධ්‍යානයට අරමුණු වූ කසිණ නිමිත්ත සිතින් අත්හැර ලබාගත් **ආකාශ** ප්‍රඥප්තිය අරමුණු කරයි.

2. දෙවැනි පුරුෂයා පළමුවැනි පුරුෂයා ගේ පයෙහි එල්ලී සිටියාක් මෙන්, **විඤ්ඤාණඤ්චායතන සිත,** ඒ ආකාශ ප්‍රඥප්තිය ද ඉක්මවා එය අරමුණු කොට උපන් **ආකාසානඤ්චායතන මහග්ගත චිත්තය** අරමුණු කරයි.

3. තුන්වැනි පුරුෂයා ද පළමුවැනි පුරුෂයා මණ්ඩපයෙහි කෙළවර එල්ලී සිටියාක් මෙන්, **ආකිඤ්චඤ්ඤායතන සිත,** ආකාශානඤ්චායතන සිත ද ඉක්මවා, එහි අභාවය වූ නැති බව හෙවත් **නාස්ථිභාව ප්‍රඥප්තිය** අරමුණු කරයි.

4. සතරවැනි පුරුෂයා තුන්වැනි පුරුෂයා ගේ පයෙහි එල්ලී සිටියාක් මෙන්, **නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සිත**

ඒ නාස්ථිභාව ප්‍රඥප්තිය ද ඉක්මවා එය අරමුණු කොට උපන් **ආකිඤ්චඤ්ඤායතන** මහග්ගත සිත අරමුණු කරයි.

## අරූපාවචර විපාක සිත් සතර

1. **ආකාශානඤ්චායතන විපාක සිත.**
2. **විඤ්ඤාණඤ්චායතන විපාක සිත.**
3. **ආකිඤ්චඤ්ඤායතන විපාක සිත.**
4. **නෙවසඤ්ඤා නා සඤ්ඤායතන විපාක සිත.**

මේ විපාක සිත් සතර ද එම කුසල් සිත් සතරට සමාන ය. අරූපාවචර ධ්‍යාන කුසල චිත්තයන් ගේ විපාක වශයෙන් පහළවන මේ විපාක සිත් සතර, එකී ධ්‍යානයෙන් නොපිරිහී චුතවන්නාවූ පුද්ගලයාට සුදුසු වූ අරූප තලයෙහි ප්‍රතිසන්ධි සිත වශයෙන් උපදී. ඒ භවයෙහි භවාඞ්ග සිතත්, චුති සිතත් එය ම වේ. රූපය පිළිකුල් කොට වඩනා ලද ධ්‍යාන ඇති බැවින් ඒ අත්බැව්හි රූපකයක් පහළ නොවී නාම කය පමණක් පහළ වේ. මේ අරූපතලයන්හි වසන පුද්ගලයන්ට බොහෝ ආයු ඇත්තාහ. ආකාශානඤ්චායතන භූමියෙහි ආයු මහා කල්ප විසි දහසක් බවත්, විඤ්ඤාණඤ්චායතන භූමියෙහි මහා කල්ප සතලිස් දහසක් බවත්, ආකිඤ්චඤ්ඤායතන භූමියෙහි මහා කල්ප හැට දහසක් බවත්, නෙවසඤ්ඤා නා සඤ්ඤායතන භූමියෙහි මහා කල්ප සූවාසූ දහසක් (අසූ හතර දහසක්) බවත් දත යුතු ය.

## අරූපාවචර ක්‍රියා සිත් සතර

1. **ආකාශානඤ්චායතන ක්‍රියා සිත.**
2. **විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත.**
3. **ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිත.**
4. **නෙවසඤ්ඤා නා සඤ්ඤායතන ක්‍රියා සිත,**

අරූපාවචර කුසල චිත්තයන්ට සමාන වූ මේ ක්‍රියා සිත් සතර රහතන් වහන්සේලා විසින් ම උපදවනු ලබන බැවින් ක්‍රියා සිත් වේ.

මේ අරූපාවචර සිත් දොළොස ම උපෙක්ඛා එකක්ගතා යන ධ්‍යානාඞ්ග දෙකින් ම යුක්ත බැවින් පඤ්චමධ්‍යානයට ඇතුළත් ය. එසේ ම සම්ප්‍රයුක්ත ය, සසංඛාරිකය.

ධ්‍යාන ලබන පුද්ගලයෝ, **තික්ඛ ප්‍රාඥයෝ ය. මන්ද ප්‍රාඥයෝය** යයි ද්විධ වේ. තියුණු නුවණින් වහා ධ්‍යාන උපදවන පුද්ගලයන් **තික්ඛ ප්‍රාඥයන්** වශයෙන් ද, එතරම් තියුණු නො වූ නුවණැති පුද්ගල යන් **මන්ද ප්‍රාඥයන්** වශයෙන් ද සලකනු ලැබේ. ධ්‍යාන සිත උපදින චිත්ත වීථියේ දී **මන්ද ප්‍රාඥ** පුද්ගලයන්ට පරිකර්ම උපචාර අනුලෝම, ගෝත්‍රභූ යන මහා කුසල් සිත් සතරක් ම ධ්‍යාන සිතට පූර්වයෙහි ඇති වේ. **තික්ඛ ප්‍රාඥයන්ට** උපචාර, අනුලෝම, ගොත්‍රභූ යන මහා කුසල් සිත් තුණ පමණක් ධ්‍යාන සිතට පූර්වයෙහි ඇතිවේ.

සර්වඥයන් වහන්සේ තික්ඛ ප්‍රාඥයන් හට වැඩ පිණිස සියළු ම රූපාවචර ධ්‍යානයෝ සතරක් වශයෙන් ද, මන්ද ප්‍රාඥයන් උදෙසා ධ්‍යානයෝ පස් දෙනෙක් ද දෙශනා කළ සේක. චතුෂ්ක නයින් ගත් විට රූපාවචර දෙවැනි තුන්වැනි ධ්‍යාන සිත් දෙක එකක් වශයෙන් ගනිනු ලැබේ. එවිට රූපාවචර ධ්‍යාන සිත් සතරත්, අරූපාවචර ධ්‍යාන සිත් සතරත් යන ධ්‍යාන සිත් අට දෙනා එක්කොට **අෂ්ට සමාපත්තිහු** යයි කියනු ලැබේ. පඤ්චක නයින් රූපාවචර සිත් පහත්, අරූපාවචර සිත් සතරත් යන ධ්‍යාන සිත් නවය එක්කොට ගෙණ "**නවානු පූර්ව විහාර සමාපත්ති**" යයි කියති. තව ද මේ චතුස්කය හා පඤ්චකය එක් කොට ගත් කල්හි **සුද්ධික නවකයයි** ද කියනු ලැබේ.

නිරොධ සමාපත්තියට සම වැද මේ ආත්මයෙහි නිවන් සැප විඳිනු කැමැති රහතන් වහන්සේලා විසින් මෙම අෂ්ට සමාපත්ති උපදවා ගන්නා බව දත යුතු ය.

## ලෝකෝත්තර සිත්

තණ්හා දිට්ඨි වශයෙන් තදින් අල්වා ගන්නා ලද පඤ්චුපාදනස්-කන්ධ සඞ්ඛ්‍යාත ලෝකයෙන් ද, කාම ලොක, රූප ලොක, අරූප ලොක යන තුන් ලොකයෙන් ද එතර කරවන අර්ථයෙන් ලොකෝත්-තර නම් වේ, ලොකයන් ගේ පැවැත්මට උපකාරවන කාමාවචර, රූපාවචර, අරූපාවචර නම් වූ ලෞකික කුසල් සියල්ල ම, ඒ ඒ පමණට තදඞ්ග, විෂ්කම්භන වශයෙන් අකුසල් ප්‍රහාණය කිරීමට

සමත් නමුත්, සසරින් එතර කිරීමට ශක්තියක් නැත. මේ ලොකොත්තර චිත්තයෝ සතර දෙනෙක්, මාර්ග සිත් වශයෙන් ඉපිද ඒ ඒ අකුසලයන් වෙන් වෙන්ව සතර වරකට සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් නසා, සසරින් එතර කොට, නිවණට පමුණුවා, එයට අනතුරුව අතරක් නැති ව ලොකෝත්තර ඵල චිත්තයන් ඉපිද අකාලිකව ලැබෙන ඵලයන් ගේ උපකාරය ලැබ, පටිප්පස්සද්ධි ප්‍රහාණයෙන් කෙලෙස් විඩා සන්සිඳුවා ලන්නේ ය.

මේ ලොකෝත්තර සිත් සංක්ෂෙප වශයෙන් අටෙකි. එනම්, මාර්ග සිත් සතරත්, ඵල සිත් සතරත් ය. විස්තර වශයෙන් හෙවත් ලොකෝත්තර ධ්‍යාන සිත් වශයෙන් සතලිසකි.

## ලෝකෝත්තර සිත් අට

1. **සොතාපත්ති මග්ග සිත.** (පළමුවරට නිවන් මගට පැමිණෙන ආර්‍ය්‍ය මාර්ග කුසල් සිත.)

2. **සොතාපත්ති ඵල සිත.**

3. **සකදගාමි මග්ග සිත.** (එක් වරක් කාම භවයට පැමිණෙන ආර්‍ය්‍ය මාර්ග කුසල් සිත.)

4. **සකදගාමි ඵල සිත.**

5. **අනාගාමී මග්ග සිත.** (නැවත කාම භවයට නො පැමිණෙන ආර්ය මාර්ග කුසල් සිත.)

6. **අනාගාමි ඵල සිත.**

7. **අරහත්ත මග්ග සිත.** (සියලු කෙලෙසුන් නසා පූජ්‍ය භාවයට පත් ආර්ය මාර්ග කුසල් සිත.)

8. **අරහත්ත ඵල සිත.**

මේ මාර්ග සිත් සතර, ලොකයෙන් එතර කරවන හෙයින් ලොකෝත්තර වූ ද, නිවණට පමුණුවන අඞ්ගයන්ගෙන් යුක්ත වූ හෙයින් මාර්ග වූ ද, පව් නසන හෙයින් කුසල වූ ද සිත් සතරකි.

මෙහි මග්ග යන්නෙන් අදහස් කරණ ලද්දේ **ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයයි.** සියළු ම දුක්ඛයා ගේ අනුත්පාද නිරොධයට පැමිණෙන පිළිවෙත නම් වූ මේ මාර්ගයා ගේ අඞ්ගයෝ නම්— 1. **සම්‍යග් දෘෂ්ටිය**, 2. **සම්‍යග් සඞ්කල්පය**, 3. **සම්‍යග් වචනය**, 4. **සම්‍යග් කර්මාන්තය**, 5. **සම්‍යග් ආජීවය**, 6. **සම්‍යග් ව්‍යායාමය**, 7. **සම්‍යග් ස්මෘතිය**, 8. **සම්‍යග් සමාධිය** යන මොහු ය.

මේ මාර්ගාඞ්ගයෝ අට දෙනා එකක්ෂණිකව, එක් සිතෙහි, නිර්වාණය ම අරමුණු කොට ගෙන පහළවන බැවින්, මේ අට දෙන, ගේ සමුදය මාර්ගය නම් වේ. එක් පුද්ගලයෙකු ගේ සන්තානයෙහි මේ අෂ්ටාඞ්ගික මාර්ගය සතර වරෙක් මිස ඉන් වඩියක් නූපදනේය. ඒ සතර අවධියේ ම, නැසිය යුතු ඒ ඒ කෙලෙස් සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන්, නැවත නූපදනා පරිදි, වෙන් වෙන් ව නසන බැවින් වැඩියක් මාර්ග සිත් ඉපදීමෙන් කළ යුත්තක් නැති හෙයින් නූපදනේ ය. තව ද මේ මාර්ග චිත්තයෝ සතර දෙන, සතර වරෙක, කෘත්‍යයන් සතර බැගින් ඒකක්ෂණිකව සිද්ධ කරමින් උපදනාහුය. ඒ සතර කෘත්‍යයෝ නම්:—1. **දුක්ඛ සත්‍යය පිරිසිඳ දැනීම**,, 2. **සමුදය සත්‍යය පහ කිරීම**, 3. **නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂව දැනීම**, 4. **මාර්ග සත්‍යය වැඩීම** යන සතර ය.

යම් සේ තෙල් පහනක් දැල් වූ කල්හි පහන් වැටිය දැවීම ය. අන්ධකාරය නැසීමය. ආලෝකය පැතිරයාමය, තෙල් ක්ෂයවීම ය. යන මේ සතර කෘත්‍යයන් ඉදිරි පසු නො වී එකක්ෂණිකව කරන්නාක් මෙන්, මේ මාර්ග චිත්තයෙහි යෙදුන ප්‍රඥා චෛතසිකය නමැති ප්‍රදීපය එකක්ෂණිකව සතර කෘත්‍යයක් සිද්ධ කෙරේ. යම් සේ ප්‍රදීපය පහන් වැටිය දවා ද, එසේ ම මාර්ග ඥානය දුක්ඛ සත්‍යය පිරිසිඳ දනී. යම් සේ අඳුර නසා ද එසේ ම සමුදය සත්‍යය දුරු කෙරේ. යම් සේ එළිය පතුරුවා ද, එසේ ම මාර්ගයා ගේ වැඩීම සිදු වේ. යම් සේ තෙල් ක්ෂයවීම වේ ද, එසේ ම කෙලෙසුන් ගේ ගෙවීමට ප්‍රත්‍ය වූ නිරොධ සත්‍යය අරමුණු කිරීම් වශයෙන් සාක්ෂාත් කෙරේ. ඊට චතුස්සත්‍යාව බොධය යයි කියති.

මේ ලොකොත්තර මාර්ග චිත්තය කෙලෙස් නසන හෙයින් කුසල් ද වෙත්. සියළු සත්තිස්බොධිපාක්ෂික ධර්මයන් හා සම්ප්‍රයොග ලක්ෂණයන් මිශ්‍රව ලැබෙන හෙයින් මේ නිර්වාණමාර්ගයට **මිශ්‍රක මාර්ගය** යයි ද කියනු ලැබේ. මෙයට පූර්වයෙහි, බොධි සම්භාරයන් පිරීම් වශයෙන්, එකී ධර්මයන් වෙන් වෙන් ව රැස් කිරීමය යන **විවට්ටපාද** නම් වූ, **පූර්වභාග ප්‍රතිපත්ති** සංඛ්‍යාත **ලෞකික මාර්ගය ද** වැඩිය යුතු වේ. මෙකල්හි වසන්නාවූ, ගන බොල් කෙලෙස් ඇති, දීර්ඝ කාල යක් මුළුල්ලෙහි දනාදි සුචරිතයන් පිරීමෙන් තියුණු නො කරණ ලද ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් ඇති, නුමුහු කළ නුවණ ඇති, පෘථග්ජනයන් විසින් රැස් කරනු ලබන්නා වූ, භව සම්පත් සාද දීමෙහි පොහොසත් වූ, **වට්ටපාද** කුසල කර්මයෙන්, මේ ලෞකික ලොකොත්තර මාර්ග යන් ලැබිය නො හැකි ය. එසේ ද වුවත්, මෙ කල්හි කරනු ලබන්නා වූ දන ශීලාදි ලෞකික කාමාවචර කුසලයෙන්, නිවන් පැතුයේ වී නම්, ක්‍රමයෙන් තීක්ෂණ ඉන්ද්‍රියන් ඇති පුද්ගලයෙකු වීමට එය. උපනිශ්‍රය වන බැවින් නිවන් ම පතා දනාදී කුසල් කටයුතු ය.

මේ ආර්‍ය්‍ය මාර්ගය ලබනු කැමැත්තෙකු විසින් ශ්‍රාවක බොධි වශයෙන් නම්, යටත් පිරිසෙයින් කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දන ශීලාදී සුචරිතයන් පිරීමෙන් තියුණු කරන ලද, ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, සති, සමාධි, ප්‍රඥ සඞ්ඛ්‍යාත පඤ්චෙන්ද්‍රියන් ඇත්තා වූ, කෙලෙස් තුනී කළ සත්ත්වයෙක් ම විය යුතු ය. එසේ නොවී නම් දහස් ගණන් බුදුවරයන් වහන්සේලාට හමුවූවත්, මාර්ග ඵලාධිගමයක් නො කට හැකි වේ. බුදුවරයන් වහන්සේලා බුදු ඇසින් ලොව බලා වදරණ කල්හි ඒ බුද්ධ ඥනයට ගොදුරු වන්නේ, එබඳු පිරු පෙරුම් ඇති සත්පුරුෂ සමූහයාම ය. එසේ නො වූවෝ ගඳකිළිය සමීපයෙහි ම සිටියත්, උන් වහන්සේලා ගේ බුදු ඇසට හමු නොවන්නේ ම ය.

මෙසේ පිරු පෙරුම් ඇති ව, **විපාකාවරණයෙන්** මිදී, ත්‍රිහේතුක **ප්‍රතිසන්ධියක්** ලැබ, ආනන්තරිය අකුසල කර්මාදියක් නො කළ බැවින් **කර්මාවරණයෙන්** ද තොර ව රාජ්‍ය සම්පත් ආදී වූ කෙලෙස් උපදවන තැන්හි නො පිහිටි **ක්ලෙශාවරණ** නැත්තෙක්ව, සම්‍යග් දෘෂ්ටියෙහි පිහිටා පතිරූප දෙශ වාසය, පණ්ඩිත සේවනය, සද්ධර්ම ශ්‍රවණය, සහ නොපසු බට වීර්‍ය්‍යයෙන් ද, ක්‍රමයෙන් **ශීලවිසුද්ධිය, චිත්ත විසුද්ධිය, දිට්ඨි විසුද්ධිය, කඞ්ඛාවිතරණ විසුද්ධිය, මග්ගා-**

**මග්ග ඤාණ දස්සන විසුද්ධිය, ප්‍රතිපද ඤාණ දස්සන විසුද්ධිය,** යන ෂට් විසුද්ධීන් උපදවා, ඔවුන්ගේ වශයෙන් නොයෙක්වර ලබන ලද පූර්ව භාග මාර්ග ඇතිව, **චූල්ලසොතාපන්න** යයි කිය යුතු බවට පැමිණ, සත් වැනි විසුද්ධිය වූ **ඤාණදස්සන විසුද්ධි** අවස්ථාවෙන් **මිශ්‍රක මාර්ග** නම් වූ ලොකොත්තර වූ ආර්‍ය්‍ය මාර්ගය අධිගම කටයුතු වේ. සැකෙවින් කියතොත්, **පූර්වභාග ප්‍රතිපදය, මිශ්‍රක ප්‍රතිපදය** යන උභය මාර්ගය, නිවන් දක්නා ජාතියෙහි ම ලැබිය යුතු බවත්, දැනට අප විසින් කරනු ලබන්නා වූ, දාන ශීලාදී කාමාවචර වූ වට්ටපාද කුසලයන්, නෛර්‍ය්‍යාණික මාර්ග නො වෙතත්, නිවන් පැතුයේ වී නම්, ඊට උපනිශ්‍රය මාත්‍රයක් වන බවත් දත යුතු ය.

මෙසේ සළකන කල්හි, මේ ආත්ම භාවයෙහි නිවණට පැමිණී මට පූර්වභාගයේ දී, **ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය,** යන සතර පිරිසිදු ශීල සමූහය සම්පූර්ණ ව, අතිපරිසුද්ධව, ලොව්තුරා දහම් ලැබීමට උපකාර වන, **ශීල විසුද්ධි** වශයෙන් පිහිටිය යුතු වේ. මෙසේ ශීල විසුද්ධියෙන් පිරිසිදු ව, උපචාර සමාධිය, අර්පණා සමාධිය වශයෙන් දෙවැදෑරුම් වූ, විදර්ශනාවට පාදකවූ, කාමාවචර වූ ද, මහග්ගත වූ ද, සමාධීහු වඩා, **චිත්ත විසුද්ධියෙහි** පිහිටා තමා ගේ ආත්ම භාව සංඛ්‍යාත පඤ්චොපාදනස්කන්ධයෙහි නාම රූප මාත්‍රය ම මුත්, අනික් ආත්ම යයි ගන්නට යමක් නැතැයි , නාම රූපයන් ඇති සැටි දක්නා සම්මර්ශන ඥනයෙන් **දුක්ඛ සත්‍ය** නිශ්චය කොට දැකීම නම් වූ **දිට්ඨි විසුද්ධිය** උපදවා ගත යුතු ය. එසේ පිරිසිදු ව දක්නා දුක්ඛ සත්‍යයාගේ, අවිද්‍යා තෘෂ්ණාදී ප්‍රත්‍යයන් පිරිසිඳ දැනීමෙන් කාලත්‍රය විෂයෙහි ඉපදිය හැකි වූ සැක දුරු කොට පවත්නා විදර්ශනා ඥනය නම් වූ **කඞ්ඛා විතරණ විසුද්ධියෙන්** පිරිසිදු ව, **සමුදය සත්‍ය** ය නිශ්චය කොට දැනගන්නේ වේ. මේ සේ සැක හැර, සමුදය සත්‍යය පිළිබඳ ඤාණය පිරිසිදුවීමෙන් පසු, නැවත ත්‍රිලක්ෂණයන් අනෙක ප්‍රකාරයෙන් සම්මර්ශණය කරමින්, විදර්ශනා වඩන්නා වූ පුද්ගලයා හට, ඕභාසාදි දශ විධ විදර්ශනොප ක්ලෙශයන් පහළවීමේ දී මාර්ග යයි සිතා නො මගට යා හැකි බැවින්, ඒ නො මගින් වළක්වා, නිසි මඟ පාද දෙන්නා වූ **මග්ගාමග්ග ඥන දස්සන විසුද්ධියෙන්** පිරිසිදු වන්නේ ය. මෙසේ විදර්ශනොප ක්ලෙශයන්ගෙන් මිදී තිලකුණු මෙනෙහි කොට, පිළිවෙලින් ඉපිද විය යුතු වූ උදයව්‍යඥනාදී වූ නව මහා විදර්ශනා

ඥානයෝ පහළවීමෙන් **ප්‍රතිපද ඥාන දස්සන විසුද්ධියෙන් ද** පිරිසිදු වන්නේ ය. මේ නව මහා විදර්ශනා ඥානයන් පහළ වූ කල්හි මාර්ග ඵලාධිගමය පිණිස වැඩිය යුතු වූ අන්‍ය විදර්ශනාවක් නැති හෙයින්, මාර්ග චිත්ත වීථිය පහළ වී, අනුලෝම සිත්වලට අනතුරුව පෘථග්ජන ගොත්‍රයෙන් එතර කරවමින් ගොත්‍රභූ සිත ඉපිද නිරුද්ධ වූ කල්හි **ඥාන දස්සන විසුද්ධි** වශයෙන් **සොතාපත්ති මාර්ග** චිත්තය, නිවණ අරමුණු කොට, සතර කෘත්‍ය සිද්ධ කරමින්, ආයර්‍ය භාවයට පමුණුවමින් උපදින්නේ ය. එයට අනතුරුව ඵල සිත් දෙකක් හෝ තුනක් ඇති වී, නැසූ කෙලෙස් විඩා සන්සිඳුවා භවාඞ්ග ශ්‍රොතයට නැවත බස්නේ ය.

තව ද, පූර්ව භාග ප්‍රතිපත්ති සමයෙහි විදර්ශනාවට පාදකවූ ලෞකික ධ්‍යාන වඩන කල්හි සමථ බලය අධික වේ. අනිත්‍යානු දර්ශනාදි වශයෙන් විදර්ශනා වඩන කල්හි විදර්ශනා බලය අධික වේ. ලොකොත්තර මාර්ගයෙහි වූ කලී ඒ සමථ විදර්ශනා දෙදෙන ම සම බලව, යුගනඞ්ග ව, එක වියෙහි සම බරට යෙදූ ගොනුන් දෙදෙ-නෙකු මෙන් එක චිත්තයෙහි අඩු වැඩි නො වී යෙදෙති. එහෙයින් ලොකෝත්තර මාර්ගක්ෂණයෙහි සමථ බලය විදර්ශනා බලය යන බලයන් දෙදෙනා ගේ සම යොගය ලැබෙයි. තව ද, පූර්වභාග ප්‍රති පත්ති සමයෙහි සමථ බලය අධික කල්හි විෂ්කම්භන ප්‍රහාණ වශ යෙන් කෙලෙසුන් නැසීම ද, විදර්ශනා බලය අධික කල්හි තදඞ්ග ප්‍රහාණ වශයෙන් කෙලෙස් නැසීම ද, ලොකොත්තර මාර්ගක්ෂණ යෙහි උභය බල සමයොගය ඇති කල්හි සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් කෙලෙස් නැසීම ද සිද්ධ වේ.

මේ කෙලෙස් නැසීම සිදුවන්නේ කෙසේ දැයි සංක්ෂෙපයෙන් වත් දත යුතුය. කෙලෙස් නම් එකාන්තයෙන් සිත් සතන් කෙලෙ-සන්නා වූ ද, කිලිටි කරන්නාවූ ද, නාම ධර්මයන් බැවින්, සිතෙහි ම ඇතිවනු මිස අන් තැනෙක ඇති විය හැකි නො වේ. කුසල් අකුසල් දෙක ම එක සිතක එකවර නො ලැබිය හැකි බැවින් ද, මේ මාර්ග සිතින් එහි නැති ක්ලෙශයන් නසන්නේ කෙසේ දැයි සිතිය හැකි වේ. යම් වස්තුවක් පිහිටීමට භූමියක් උපකාර වන්නාක් මෙන් ද, භූමිය නැති තැන වස්තුව නො පිහිටන්නාක් මෙන් ද, කෙලෙස් ඇතිවීමට ද භූමියක් තිබිය යුතු ය. ඒ භූමිය නම් ත්‍රෛභූමික ස්කන්ධයෝ යි.

භූමි නම් වූ මේ උපාදානස්කන්ධයන්හි, ප්‍රත්‍යයක් ඇති කල්හි ඉපදිය හැකි වූ ක්ලෙශයෝ **භූමිලබ්ධ ක්ලෙශයෝ** වෙති. මේ භූමිලබ්ධ ක්ලෙශයන් ගේ නැවත කිසි කලෙකත් නූපදනා සේ වළක්වාලීම නම් වූ **අනුත්පාද නිරොධය**, මාර්ගයෙන් කෙලෙස් නැසීම බව දත යුතු ය.

මෙසේ විදර්ශනා භාවනාවට පූර්ව භාගයෙහි පිළිවෙළින් චතුපාරිසුද්ධ ශීලයන් සම්පූර්ණ කොට, ආනාපාන සති ආදි චිත්ත භාවනා වඩා, එයින් ලබන ලද චිත්තෙකග්ගතා නම් වූ බලවත් සමාධි ඇත්තේ, නීවරණ ධර්මාදි අකුසලයන් ගේ ප්‍රහාණය තදඞ්ග විෂ්කම්භන වශයෙන් සිද්ධ කොට, ධ්‍යානාඞ්ග උපදවා, එම ධ්‍යානාඞ්ග පාදක කොට ගෙන හෝ පාදක කොට නො ගෙන හෝ ප්‍රඥා භාවනා වඩා, එයින් උපදවන ලද නව මහා විදර්ශනා ඥාන ඇති ව, පිළිවෙළින් මාර්ග ඵලාධිගමය කරනු මිස මෙයට වඩා කෙටි මාර්ගයක් මේ ශාසනයෙහි දක්වා නැත. බුදු රජාණන් වහන්සේ ලොව පහළ වී වදාරණ කාලයෙහි, බොධි සම්භාරයන් පුරා සම්පූර්ණ කොට, මුහු කළ නුවණ ඇති ව, ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙන් දිව්‍ය මනුෂ්‍යාදී ආත්ම භාවයන් ලැබූ පුද්ගලයෝ, බුදු රජාණන් වහන්සේගෙන් හෝ ආර්‍ය්‍ය ශ්‍රාවකයන් වහන්සේලා ගෙන් හෝ, ස්වල්ප වූ ධර්ම මාත්‍රයක් අසා වහා චතුස් සත්‍යාව බොධය කළහ. ඒ හැම පුද්ගලයන් විසින් ම පෙර භවයන්හි නිවන් පතා, දන ශීලාදී පින්කම් කොට, සමථ, විදර්ශනා භාවනා පුරුදු කොට ක්ෂණයකින් වුව ද කීමාධිය ලබා ගැනීමට හේතු සම්පත් ඇති පුද්ගලයන් වූ බැවින්, වහා ධර්මාව බොධ කළ බව දත යුතු ය. එසේ ද වුවත්, එක් වරම අර්හත් මාර්ග ඥානය ලබා ගත නො හැකි වේ. පළමු කොට සොවාන් මාර්ග ඥානය උපදවා ගෙන, ඉක්බිති පිළි වෙළින් සකෘදගාමි, අනාගාමි, අර්හත් යන ඉතිරි මාර්ගයන්ට පැමිණෙන්නේ ය.

සොවාන් මාර්ග ඥානය හෙවත් පළමුවරට නිවන් මඟට පැමිණීම ඇතිවන්නේ කාම ලොක සහ රූප ලොක වල ප්‍රතිසන්ධි ලබා සිටින පුද්ගලයන්ට පමණ ය. බණ ඇසීම නම් වූ ''පරතො ඝොෂ ප්‍රත්‍යය'' සොවාන් වන කෙනෙකුට අවශ්‍යයෙන් ම උපකාර ධර්මයකි. ඇසීමට කන් නැති බැවින් කිසි කලෙකත් අරූප තලවල සෝවාන් මඟ නො ලැබෙන බව දත යුතු ය. කාම ලොක, රූප ලොකයන්හි

සොවාන් ඵලයට පැමිණි ආර්‍ය්‍ය පුද්ගලයෙකුට නම් අරූපධ්‍යාන උපදවා අරූප තලවල උත්පත්ති ලැබුණ විට, එම අරූප තලයකම ඉතිරි මාර්ග ඵල ලබා පිරිනිවන් පාන්නට හැකි බව දත යුතු.

## සොතාපත්ති මග්ග කුසල් සිත

මහා සමුද්‍රය කරා නො නැවතී වේගයෙන් ගලා බස්නා ජලය ඇති, ඇළ, දොළ, ගංගා සඞ්ඛ්‍යාත ශ්‍රොතයට හෙවත් සැඩ පහරට පළමුවරට බැස ගැනීම වැනි වූ නිවණට නො නැවතී පැමිණෙන තත්ත්වයට පළමු කොට බැස ගන්නා, මාර්ගාඞ්ග අට හා යෙදුන සිත **සොතාපත්ති කුසල් සිත** නම්. පෘථග්ජන ගොත්‍රය නසා ආර්‍ය්‍ය භාවයට පමුණුවන්නා වූ මේ සොතාපත්ති මග්ග සිත පළමුවැනි ලොකොත්තර සිත වේ.

දෙළොස් **අකුසල චිත්තයන් අතුරෙන් ලොභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරත්, මොහ මූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතත්** යන අකුසල චිත්තයෝ පස් දෙනා මේ සෝවාන් මාර්ග චිත්තයෙන් සමුච්ඡෙද වශයෙන් ප්‍රහාණය කරනු ලැබේ. එසේ ම **දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි** සහ **ද්වෙෂ මූල සිත් දෙකෙහි ද** යන අකුසල සිත් සදෙනා ගේ අපාය ගමනීය ශක්තියද මේ සොවාන් මාර්ග සිතින් නසන්නේ ය. තව ද **දස සංයොජනයන් අතුරෙන්, සක්කාය දිට්ඨි විචිකිච්ඡා, සීලබ්බත පරාමාස** යන ඕරම්භාගීය සංයොජනයන් තිදෙනා ද, **ක්ලෙශයන් අතුරෙන්, දිට්ඨි, විචිකිච්ඡා** යන දෙක ද, **මිච්ඡත්තයන් අතුරෙන් මිථ්‍යා දෘෂ්ටිය, මිථ්‍යා** වචනය (මුසාවාදය), **මිථ්‍යා කර්මාන්තය, මිථ්‍යා ආජීවය** යන සතර ද, **මාත්සර්‍ය්‍යයන්** පස් දෙනා ද, **විපර්‍ය්‍යාසයන් අතුරෙන් අනිත්‍යයෙහි** නිත්‍ය යයි **ද, අනාත්ම යෙහි ආත්ම යයි ද,** ගන්නා සංඥා, චිත්ත, **දිට්ඨි විපර්‍ය්‍යාසයන් හා, දුකෙහි සුව යයි ද, අසුභයෙහි සුභ යයි ද** ගන්නා **දිට්ඨි විපර්‍ය්‍යාසයන් ද, ග්‍රන්ථයන් අතුරෙන් ශීලබ්බත පරාමාස, ඉදං සත්‍යාභිනිවෙශ කාය** ග්‍රන්ථ දෙදෙනා ද, **අගති** ගමනයෝ සතර දෙනා ද, **ආශ්‍රවයන් අතු රෙන් දිට්ඨාශ්‍රවය ද, දිට්ඨිඕඝය** සහ **දිට්ඨි යෝගය ද,** නීවරණයන් **අතුරෙන් විචිකිච්ඡා නීවරණය ද,** එසේ ම **පරාමාශය ද** උපාදනයන් **අතුරෙන් දිට්ඨූ පාදන, සීලබ්බතූ පාදන, අත්තවාදූ පාදනයන් ද අනු ශයන් අතුරෙන් දිට්ඨි විචිකිච්ඡා අනුශයෝද, අකුසල කර්ම පථ**

**යන් අතුරෙන් ප්‍රාණ ඝාතය, අදත්තාදනය, කාම මිථ්‍යාචාරය, මුසා වාදය, මිථ්‍යා දෘෂ්ටිය** යන මොහු ද, ඉතිරි සියළු ම පාප ධර්මයන් ගේ අපාය ගමනීය භාවය ද මේ සොවාන් මාර්ග සිතින් සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් නසන බව දත යුතු ය.

මේ සොවාන් මාර්ග ඥානයට ''දස්සන'' යයි ද කියනු ලැබේ.

## සොතාපත්ති ඵල සිත

සොතාපත්ති මාර්ග සිතට අනතුරුව දෙකක් හෝ තුනක් ව ලැබෙන්නා වූ මේ ඵල චිත්තයෝ ද ඒකාන්තයෙන් ම නිවන් අරමුණු කොට ඇත්තා වූ ලොකොත්තර සිත් වූයේ වී නමුත් කුසල් නො වෙති. **ආනන්තරීක සමාධිය අකාලික විපාකය** යයි කියනු ලබන මේ විපාක අව්‍යාකෘත ධර්මයෝ වෙති. මේ ඵල චිත්තයෝ කුණු කසල දවා අලු කොට, උණුසුම නිවීමට පැන් කල දෙකක් හෝ තුනක් වත් කිරීමක් මෙනි. මාර්ගයෙන් නසන ලද කෙලෙස් ඇති එම සන්තානයෙහි සන්සිදීම් වශයෙන් උපදනා බැවින් පටිප්පස්සද්ධි ප්‍රහාණය යයි කියන ලද සන්සිදීම කරමින් ඉපිද නිරුද්ධවීමෙන් පසු චිත්ත සන්තතිය නැවත භවාඞ්ග වේ.

මේ සොවාන් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ ධ්‍යානලාභී නම් මරණින් මතු කාම භූමියෙහි නො ඉපිද ලබන ලද ධ්‍යානයට අනුව රූපා රූප භූමින්හි පටිසන්ධිය ලබා එහි දී ම ඉතිරි මාර්ග ඵල ලැබීමෙන් පිරිනිවන් පාන්නේ ය.

ධ්‍යාන නො ලැබූ හෙවත් ධ්‍යානය පාදක කොට නො ගෙන විදර්ශනා වඩා මාර්ගයට පැමිණි **ශුෂ්ක විදර්ශක සොවාන් පුද්ගල යෝ** තිදෙනෙකි.

1. **ඒක බීජී සොතාපත්ති පුද්ගලයා**–එක් වරක් පමණක් කාම භවයෙහි ඉපිද අර්හත්වය ලබා නිවන් දකී.

2. **කොලංකොල සොතාපත්ති පුද්ගලයා**–දෙවර සිට සයවර දක්වා කාම භවයන්හි ඉපිද අර්හත්වයට පැමිණ නිවන් දකී.

3. **සත්තක්ඛත්තු පරම සොතාපත්ති පුද්ගලයා**–සත් වරක් කාම භවයන්හි ඉපිද අර්හත්වයට පැමිණ නිවන් දකී.

මේ ශුෂ්ක විදර්ශකයා විසින් ලබන්නා වූ මාර්ගය ඒකාන්ත යෙන් ම ප්‍රථම ධ්‍යානයට සමාන වූ විතක්ක විචාර පීති සුඛ එකග්ගතා යන ධ්‍යානාඞ්ග පසකින් යුක්ත වන්නේ ය. **එහෙයින් ශුෂ්ක විදර් ශකයාට හෝ සමථ යානිකයාට හෝ ලැබෙන්නා වූ මාර්ගය ඒකාන්ත යෙන් ධ්‍යානාඞ්ගයන්ගෙන් නො මිදෙන්නේ මැ යි.**

## සකෘදගාමී මග්ග කුසල් සිත

සොතාපන්න ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ එම ආසනයේ හිඳ හෝ ඉන් පසු කාලයක හෝ දෙවැනි ආර්‍ය්‍ය භූමිය වූ සකෘදගාමී භූමියට පැමිණෙනු පිණිස පරිකර්ම භාවනා වශයෙන් නැවත විදර් ශනා වඩන්නේ ය. හෙතෙම පළමු මාර්ගය ලැබීමට පරිකර්ම කළ පරිද්දෙන් සියළු බොධ්‍යාඞ්ග ධර්මයන් පූර්වභාග ප්‍රතිපත්ති වශයෙන් නැවත නැවත තම සන්තානයෙහි උපදවා නාම රූප ධර්මයන් විදර්ශනා ඥානයෙන් පිරිසිඳ පිළිවෙලින් නව මහා විදර්ශනා ඥානයන් උපදවා ඉක්බිති පහළ වන්නා වූ දෙවෙනි මාර්ග චිත්ත වීථියේ දී අනුලෝම සිත්වලට අනතුරුව **චොදන සිත** පහළ වී නිරුද්ධ වූ පසු **සකෘදගාමී මග්ග කුසල චිත්තය** ඉපිද, දෙවැනි වරට සතර කෘත්‍යයක් සිද්ධ කරමින්, චතුස්සත්‍යාවබොධය කොට සකෘදගාමී ආර්‍ය්‍ය පුද්ගල භාවයට පැමිණෙන්නේය.

දෙවැනි ලොකොත්තර මාර්ග සිත වූ මේ සකෘදගාමී මග්ග කුසල් සිත, අකුසල් සිත් වශයෙන් යමක් ප්‍රහාණය නො කළේ වී නමුත්, **දිට්ඨිගත විප්පයුත්ත ලොභ මූල සිත් සතරත්, දෙෂ මූල පටිඝ සිත් දෙකත් යන අකුසල් සිත් සයෙහි සණ–බොල් බව නසමින්** තවත් දුරට තුනී කරන්නේ ය. තව ද, **සංයොජනයන්** අතුරෙන් **ඖදාරික වූ, කාම රාග, පටිඝයන් ද** මේ මාර්ග සිතින් නසන්නේ ය.

## සකෘදගාමි ඵල සිත

මේ සකෘදගාමි මාර්ග සිතට අනතුරුව සකෘදගාමි ඵල සිත් දෙකක් හෝ තුනක්, මන්ද ප්‍රාඥ, තික්ඛ ප්‍රාඥයන් ගේ වශයෙන්, ආනන්තරික සමාධියත් අකාලික විපාකයත් සිද්ධ කරමින් ඉපිද නිරුද්ධ වූ පසු චිත්ත සන්තතිය නැවත භවාඞ්ග වේ.

මේ සකෘදගාමි ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල තෙම ධ්‍යාන වැඩුයේ නම් මරණින් මතු තමන් ලත් ධ්‍යානයට අනුරූපව රූපාරූප භූමියෙහි ඉපිද එහිදී ම අර්හත්වයට පැමිණ නිවන් දකී.

ධ්‍යාන පාදක කොට නොගෙන සෙදගැමි මග ලැබූ ශුෂ්ක විදර්ශක ආර්‍ය්‍ය පුද්ගලයා, පසු කලෙකවත් ධ්‍යාන නො ලැබුයේ වී නම්, එක් වරකට වඩා කාම භවයෙහි නැවත නූපදනේ ය. එසේ හෙයින් සකෘදගාමි යන නාමය ලැබෙන්නේ ය .

## අනාගාමි මග්ග කුසල් සිත

තුන් වැනි මාර්ග කුසල් සිත අනාගාමි මාර්ග කුසල් සිත නමි. කාම ධාතුවෙහි පිළිසිඳ ගැනීමට කිසි කලෙකත් නො එන සුළු වූ ආර්‍ය්‍ය පුද්ගලයා ගේ ඒ බව සිදු කර දෙන්නා වූ මාර්ගය අනාගාමි මාර්ග නමි. සකෘදගාමි ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ නැව තත් ත්‍රි ලක්ෂණ භාවනා වඩනා කල්හි යටකී පරිද්දෙන් සම්පූර්ණ වූ විදර්ශනා ඥාන පහළවීමෙන්, මාර්ග චිත්ත වීථිය ඇති වී, එහි අනු ලොම චිත්තයන්ට අනතුරුව වොදන සිත ඉපිද නිරුද්ධ වූ කල්හි තුන්වෙනි වරට චතුස්සත්‍යය අවබොධ කරමින්, කෘත්‍ය සතර ම එකක්ෂණිකව සිද්ධ කරමින් අනාගාමි මාර්ග සිත නිර්වාණය අරමුණු කොට උපදනේ ය.

මේ අනාගාමි මාර්ග සිතින් සිදුවන ක්ලේශ ප්‍රහාණියෙන් අකුසල චිත්තයන් අතුරෙන්, පටිඝ සම්ප්‍රයුක්ත සිත් දෙක ද, සංයෝජනයන් අතුරෙන් සියුම් වූ කාමරාග පටිඝයෝ ද, ක්ලෙශයන් අතුරෙන් ද්වේෂය ද, මිච්ඡත්තයන් අතුරෙන් මිච්ඡා සංකප්ප මිථ්‍යා වචනය (පිසුණු වචන සහ පරුෂ වචන), ලොක ධර්මයන් අතුරෙන් ඒ ඒ

**ලොක ධර්ම විෂයෙහි** වූ **පටිඝය** ද, **විපයර්‍යාසයන්** අතුරෙන් අසුභ යෙහි සුභයයි ගන්නා සංඥා චිත්ත **විපර්‍යාසයෝ** ද, **ග්‍රන්ථයන්** අතු රෙන් **ව්‍යාපාද කාය ග්‍රන්ථය** ද, **ආශ්‍රවයන්** අතුරෙන් **කාමාශ්‍රවය** ද **කාමොඝ** සහ **කාමයෝගද**, **නීවරණයන්** අතුරෙන් **කාමච්ඡන්ද ව්‍යාපාද, කුක්කුච්ච** යන තුන් දෙනා ද, **අනුශයන්** අතුරෙන් **කාමරාග පටිඝානුශයෝ** ද, **මලයන්** අතුරෙන් **ද්වේෂ මලය** ද, **අකුසල කර්ම පථ** අතුරෙන් **පිසුණාවාචා, පරුෂාවාචා**, ව්‍යාපාදය යන තිදෙනා ද සමුච්ඡෙද වශයෙන් ප්‍රහාණ වන බව දත යුතු ය.

## අනාගාමි ඵල සිත

අනාගාමි මාර්ග කුසල් සිතට අනතුරුව අනාගාමි ඵල සිත් දෙකක් හෝ තුනක් **ආනන්තරිය සමාධිය** හා **අකාලික විපාක** වශයෙන් ද ඉපිද නිරුද්ධවීමෙන් පසු පළමු පරිදි චිත්ත සන්තතිය භවාඞ්ග වේ,

ධ්‍යානලාභි අනාගාමි ආර්‍ය්‍ය පුද්ගල තෙමේ මරණින් මතු පඤ්ච ශුද්ධාවාස යන්හි ඉපිද එහි දීම රහත්ව නිවන් දකී.

ශුෂ්ක විදර්ශක වූ අනාගාමි ආර්‍ය්‍ය පුද්ගල තෙමෙ දිවි හිමියෙන් ධ්‍යාන නො වඩා හිඳ කාලක්‍රියා කෙළේ වී නම් ඔහු ගේ කාමරාගය නැති බැවින්, කාම ලොකයෙහි ප්‍රතිසන්ධිය නො ගණී. හෙතෙමේ චුතියට පූර්ව භාගයෙහි චතුර්ත්ථ ධ්‍යානය ලබා එයින් චුතව ශුද්ධා වාසයන්හි උපදින්නේ ය. ස්ත්‍රිහු තුමූ, අනාගාමි වුව ද, එකවරට **ශුද්ධා වාසයට නො යන්නාහ.** ධ්‍යානලාභි ස්ත්‍රීන්ට නියම වූ බ්‍රහ්ම පාරිෂද්‍යයෙහි ඉපිද, එහි දී ම චතුර්ත්ථ ධ්‍යානය උපදවා, බ්‍රහ්ම පාරි ෂද්‍යයෙන් චුතව, ශුද්ධා වාස භූමියෙහි උපදින්නේ ය.

පඤ්ච ශුද්ධා වාසයන්හි ඉපිද එහි නියමිත ආයු නො වළඳා, අතර මග දී රහත් ව පිරිනිවන් පානා **අන්තරා පරිනිබ්බායි අනාගාමි පුද්ගලයා** ද, නියමිත ආයු වළඳා රහත්ව පිරිනිවන් පානා **උපහච්ච පරිනිබ්බායි අනාගාමි පුද්ගලයා** ද, එහි දී විදර්ශනා භාවනා කිරීම් වශයෙන් උත්සාහ නොකොට රහත්ව පිරිනිවන් පානා **අසංඛාර පරිනිබ්බායි අනාගාමී පුද්ගලයා** ද, විදර්ශනා භාවනා කිරීම් වශයෙන් උත්සාහ කොට

රහත්ව පිරිනිවන් පානා **සසංඛාර පරිනිබ්බායි අනාගාමි පුද්ගලයා ද** අවිහ බ්‍රහ්ම ලොකයෙහි ඉපිද ක්‍රමයෙන් කැමැති පරිදි අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ තලය දක්වා ගොස් රහත්ව නිවන් දක්නා **උද්ධංසොත අකිනිට්ඨගාමි අනාගාමි පුද්ගලයා ද** යනාදී වශයෙන් නොයෙක් ප්‍රභෙද වේ.

## අරහත්තමග්ග කුසල් සිත

සතරවැනි ව හෙවත් අවසාන වරට උපදින මාර්ග සිත අර්හත් මාර්ග සිත ය. අග්‍ර දක්ෂිණාර්හ හෙයින්, සියළු දෙව් මිනිසුන් ගේ පූජා ලබන්නට සුදුසු වන බැවින් හෝ කෙලෙස් නම් වූ අරින් (සතුරන්) හනනය (නිරවශෙෂයෙන් නැසීම) කළ බැවින් හෝ සංසාර චක්‍රයෙහි අරනම් වූ දැවි නැසූ බැවින් හෝ පව් කිරීමෙහි රහසක් නැති බැවින් හෝ හෙවත් රහසින්වත් පව් නො කරන බැවින් හෝ ''**අරහ**'' නම් වූ රහත් හු ගේ බවය යන අර්ථයෙන් **අරහත්ත** නම් වූ **අරහත් ඵලය** ලබන්නා වූ මාර්ගය **අරහත්ත මග්ග** නමි.

අනාගාමි ඵලස්ථ ආයතී පුද්ගල තෙමේ රහත් බව ලැබීම පිණිස නැවත විදර්ශනා භාවනා වඩනා කල්හි සියළු ම විදර්ශනා ඥානයන් නැවත පහළවීමෙන් සතර වැනි වරට මාර්ග චිත්ත වීථිය ඇති වී එහි අනුලොම චිත්තයන්ට අනතුරුව, **වොදන** සිත ඉපිද නිරුද්ධ වූ කල්හි සතර වැනි වරට චතුස්සත්‍යාවබොධය කරමින්, **සතර කෘත්‍යයන්** ඒකක්ෂණිකව සිද්ධ කරමින් **අරහත්ත මාර්ග සිත** නිර්වාණය අරමුණු කොට උපදින්නේ ය.

මේ අර්හත් මාර්ග කුසල් සිතින් ඉතිරි අකුසල් හෙවත් අනුශය වසයෙන් පැවති සියළු ම පාප ධර්මයන් සමුච්ඡෙද වශයෙන් **ප්‍රහාණය** කොට නැවත භවයක නූපදනා පරිද්දෙන් **සොපාදිශෙෂ නිර්වාණ ධාතුවට** හෙවත් උපාදනස්කන්ධ ශෙෂය සහිතව පවත් නා නිර්වාණ ධාතුවට පැමිණෙන්නේ ය.

අර්හත් මාර්ග ඥානයෙන් අකුසල චිත්තයන් අතුරෙන් **දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර** සහ **උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත** ද, **සංයෝජනයන්** අතුරෙන් **රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා** යන **පඤ්ච උද්ධංභාගිය සංයෝජනයන්** පස් දෙනා ද, **ක්ලෙශයන්** අතුරෙන් **ලොභ, මොහ,** මාන, ථීන, **උද්ධච්ච, අහිරික, අනොත්තප්ප** යන සත් දෙනා ද, **මිච්ඡත්තයන්** අතුරෙන් **මිච්ඡා වචන (සම්ඵප්පලාප) මිච්ඡා වායායාමය, මිච්ඡා සති, මිච්ඡා සමාධි, මිච්ඡා විමුත්ති මිච්ඡා ඥාණ** යන **මොහු ද, ලොක** ධර්මයන් අතුරෙන් **ඒ ඒ ලොක ධර්ම විෂයෙහි වූ ආලය ද, විපයාීසයන්** අතුරෙන් **දුකෙහි සුව යයි ගන්නා සංඥා චිත්ත** විපයාීසයන් ද, **ග්‍රන්ථයන්** අතුරෙන් **අභිධ්‍යා කාය ග්‍රන්ථය ද, ආශ්‍රවයන්** අතුරෙන් **භවාශ්‍රාව, අවිජ්ජාශ්‍රව** දෙකද **භවොඝ, අවිදොඝ, භවයොග, අවිද්‍යායොග** යන සතර ද, **නීවරණ යන්** අතුරෙන් **ථිනමිද්ධ, උද්ධච්ච** යන දෙදෙනා ද **උපාදනයන්** අතුරෙන් **කාමූපාදනය ද, අනුශයයන්** අතුරෙන් **මාන, භවරාග, අවිද්‍යානුශයන් ද, මලයන්** අතුරෙන් **ලොභ, මොහ මලයෝ ද, අකුසල කර්ම පථයන්** අතුරෙන් **සම්ඵප්පලාප අභිධ්‍යා** යන දෙදෙනා ද යන මේ සියළුම පාප ධර්මයන් නැවත නූපදනා පරිදි නිරවශෙෂ යෙන් නසනුලැබේ.

## අරහත්ත ඵල සිත

අර්හත් මාර්ග කුසල් සිතට අනතුරුව අර්හත් ඵල සිත් දෙකක් හෝ තුනක් **ආනන්තරිය සමාධිය** හා **අකාලික විපාක** වශයෙන් ද ඉපිද නැතිවීමෙන් පළමු පරිදි චිත්ත සන්තතිය භවාඞ්ග ශ්‍රොතයට බස්නේ ය. මේ රහතන් වහන්සේට **අශෛක්ෂ පුද්ගලයා** යයි ද කියනු ලැබේ. පෘථග්ජනයන් හැර ඉතිරි මාර්ගඵලස්ථ පුද්ගලයෝ **ශෛක්ෂ** නම් වෙති.

ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ, ධ්‍යාන පාදක කොට නො ගෙන විදර්ශනා වඩා අර්හත් මාර්ග චිත්තය ලැබීමේ දී ප්‍රථම ධ්‍යාන යෙහි අන්තර්ගත ධ්‍යානාඞ්ග පසම ලබන බව දත යුතු. පසුව **නිරොධ සමාපත්ති** නම් වූ ඉහාත්මයෙහි නිවන් සැප විඳිනු කැමැති නම්, ධ්‍යාන උපදවා අෂ්ට සමාපත්ති ලාභී වන්නේ ය. ජීවිතයා ගේ කෙළවරදී රහතන් වහන්සේ ස්කන්ධශෙෂය ද නැති කළ හෙයින් **අනුපාදිශෙෂ** නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාන්නේ ය.

මේ මාර්ග සිත් සතර සතරවරෙක කරන සතර කෘත්‍යයන් දැක්වීමට උපමාවක් ද ඇත.

පෙර නුදුටු විරූ ඉතා අගනා වස්තු සොයමින්, යන පුද්ගලයෙක් එම වස්තු සම්බන්ධව මනා දැනීමක් ඇති අයගෙන් විමසා යම්කිසි ප්‍රදේශයක, රජවරුන්ට අයත් භාණ්ඩාගාරයෙක්හි එකී වස්තු තිබෙන බව අසා, එයට පැමිණෙන මාර්ගය ද හොඳ හැටි අසා දැන ගෙන, ඒ මගින් යන්නේ, සොර සතුරු උපද්‍රවාදීන්ගෙන් බේරී, ක්‍රමයෙන් අවුත් භාණ්ඩාගාරය අසලට රාත්‍රි කාලයේ ම පැමිණියේය. එහි දී භාණ්ඩාගාරයට ඇතුල්වීමට නිසි අවසර ආදිය රැගෙන, පහන් දැල්වීම් ආදියට උවමනා උපකරණ ද සකස් කොට, භාණ්ඩාගාරයට පැමිණ දෙර හැර බලා, අන්ධකාරය පවත්නා බැවින් භාණ්ඩ නො දැක තමා විසින් ගෙනෙන ලද උපකරණවලින් පහන දල්වා භාණ්ඩාගාරය ආලෝක කොට, එහි තැන්පත් කළ අගනා වස්තු දැක සතුටු වී, තමන් කැමැති භාණ්ඩ ද රැගෙන පහන නිවා දෙර වසා නැවත පළමු සිටි තැනට පැමිණ, එහි විස්තර සිතමින් සිටියේ ය. මඳක් වේලා මෙසේ සිට නැවත වරක් භාණ්ඩ දකිනු කැමැති ව පළමු පරිදි භාණ්ඩාගාරයට ගොස් පහන දල්වා, වස්තු බලා, කැමැති දේ රැගෙන ආපසු පැමිණියේය. තුන්වන වරට ද මෙසේ ම ගොස් පහන දල්වා වස්තු බලා සතුටින් ආපසු ආයේ ය. සතරවන වරට ද වස්තු දකිනු කැමැතිව ගොස් පහන දල්වා වස්තු බලා සිටිය දී ම සූර්‍ය්‍යා ලොකය පහළවී ය. මෙ තැන් සිට හෙතෙමේ කැමැති කැමැති විටෙක සූර්‍ය්‍යා ලොකයෙන් වස්තු බලා ප්‍රීතිවෙමින් සවස හිර බසිනතෙක් සිට සැනසීමට පත් වීය. මේ උපමාවෙහි භාණ්ඩාගාරයේ තැන්පත් අගනා වස්තු මෙන් චතුස් සත්‍යයෝ ද, වස්තු සොයා ගිය පුද්ගලයා මෙන් යොගාවචර තෙමේ ද, නිසි මග යාම මෙන් පූර්වභාග ප්‍රතිපදව ද, සතර වරෙක පහන් දල්වා ආලොකය ලබා ගත්තාක් මෙන් සතර මාර්ග ඥානයෙන් සතර කෘත්‍යය සිදු කිරීම ද, සූර්‍ය්‍යා ලොකය මෙන් අර්හත් ඵලය ද, සූර්‍ය්‍යා බැස යන තෙක් වස්තු සිත් සේ බැලීම මෙන් කැමැති කැමැති විටෙක නිවණ අරමුණු කිරීම ද, සූර්‍ය්‍යා බැස යන්නාක් මෙන් රහතන් වහන්සේ ගේ පිරිනිවීම ද දත යුතුයි.

දෙළොස් අකුසල චිත්තයන් අතුරෙන් එක් මාර්ගයකින් නසනු ලබන්නා වූ අකුසල් සිත් සයකි. **සොවාන් මාර්ග සිතින් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර** සහ **විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත ද අර්හත්**

**මාර්ගයෙන් උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත** ද එකවර නසනු ලැබේ. මාර්ග තුනකින් නසනු ලබන සිත් දෙකෙකි. එනම්, **සොවාන්, සකෘදගාමි, අනාගාමි** යන මාර්ග සිත් තුනෙන් නසනු ලබන්නා වූ **පටිස සම්ප්‍රයුක්ත** සිත් දෙක ය. සතර මාර්ගයෙන් ම නැසිය යුතු අකුසල් සිත් සතරෙකි. එනම් **සොවාන්, සකෘදගාමි, අනාගාමි, අර්හත්** යන සතර මාර්ගයෙන් නසනු ලබන **දිට්ඨිගත විප්පයුක්ත** සිත් සතරය.

මේ ආර්‍ය්‍ය පුද්ගලයන් අට දෙනාට, තම තමන් ගේ ඵල සිත් මුත්, අනික් ලොකොත්තර සිත් සත නො ලැබෙන බව දත යුතු ය.

## ලොකොත්තර ධ්‍යාන සිත් සතළිහ

රූපාරූප ධ්‍යානයන් උපදවා එයින් යම් ධ්‍යානයක් හා යෙදුන සම්ප්‍රයුක්ත ධර්මයන් පාදක කොට නො ගෙන, හුදෙක් පඤ්චස්කන්ධ යන් ම අරමුණු කොට, විදර්ශනා වඩා, මාර්ග ඵලයන් උපදවන්නා වූ ශුෂ්ක විදර්ශකයාහට පහළවන ලොකොත්තර මාර්ග සිත් සතරත්, ඵල සිත් සතරත් විස්තර කරන ලදී. යම් යොගාවචරයෙක් ධ්‍යාන උපදවා, ඒ ධ්‍යානයෙහි අන්තර්ගත ධර්මයන් පාදක කොට ගෙන විදර්ශනා වඩා මාර්ග ඵල ලබන්නේ නම්, ඒ පුද්ගලයාහට ඒ ඒ ධ්‍යාන සිත්හි යෙදෙන ධ්‍යානාඞ්ගාදි සම්ප්‍රයුක්ත ධර්මයන් හා යෙදුන මාර්ග සිත් සහ ඵල සිත් උපදනේ ය. ධ්‍යාන සිත් පහෙන් ම මාර්ග සතරත්, ඵල සතරත් ලැබිය හැකි වේ. එවිට ප්‍රථමධ්‍යානය ඇති ව ලබන මාර්ග සතරත්, ඵල සතරත් යන ලොකොත්තර ධ්‍යාන සිත් අටක් ලැබෙන්නේ ය. මේ ක්‍රමයෙන් දෙවෙනි, තුන්වැනි, සතරවැනි පස් වැනි ධ්‍යානයන් ඇති ව ලබන මාර්ග ඵල සිත් අට බැගින් ලැබෙන්නේ ය. මෙසේ ලොකොත්තර ධ්‍යාන සිත් සතළිසක් වන්නේ ය.

## ප්‍රථමධ්‍යාන ලොකොත්තර සිත් අට

1. පඨමජ්ඣාන සොතාපත්ති මග්ග සිත
2. පඨමජ්ඣාන සොතාපත්ති ඵල සිත
3. පඨමජ්ඣාන සකදගාමි මග්ග සිත
4. පඨමජ්ඣාන සකදගාමි ඵල සිත
5. පඨමජ්ඣාන අනාගාමි මග්ග සිත

6. පඨමජ්ඣාන අනාගාමි ඵල සිත
7. පඨමජ්ඣාන අරහත්ත මග්ග සිත
8. පඨමජ්ඣාන අරහත්ත ඵල සිත

මේ ක්‍රමයෙන්, දුතියජ්ඣාන ලොකොත්තර සිත් අටෙකි. තතියජ්ඣාන ලොකොත්තර සිත් අටෙකි. චතුත්ථජ්ඣාන ලොකොත්තර සිත් අටෙකි. පඤ්චමජ්ඣාන ලොකොත්තර සිත් අටෙකි. සියල්ල සතලිසකි.

මේ සිත් සතලිසෙහි යෙදෙන ධ්‍යානාඞ්ගයෝ ද ඒ ඒ ධ්‍යාන සිත්හි යෙදෙන ධ්‍යානාඞ්ගයෝ ම ය. එහි විස්තර පළමු කී පරිදි දත යුතුය.

ලෞකික සිත් අසූ එකත් (81), සාමාන්‍ය ලොකොත්තර සිත් අටත් (8) එකතු කළ කල්හි සිත් සියල්ල අසූ නවයකි (89).

ලෞකික සිත් අසූ එකට ලොකොත්තර ධ්‍යාන සිත් සතලිස එකතු කළ කල්හි සියල්ල සිත් එක් සිය විසි එකකි (121).

මෙ එක්සිය විසි එකත් සිත් අතුරෙන් ධ්‍යාන සිත් හැට හතකි (67). එනම් ලොකොත්තර ධ්‍යාන සිත් 40 ත්, රූපාවචර ධ්‍යාන සිත් 15 ත්, අරූපාවචර ධ්‍යාන සිත් 12 ත් ය. එයින් ප්‍රථම ධ්‍යාන සිත් 11 කි. දුතියධ්‍යාන සිත් 11 කි. තතිය ධ්‍යාන සිත් 11 කි. චතුත්ථ ධ්‍යාන සිත් 11 කි. පඤ්චම ධ්‍යාන සිත් 23 කි. ඉන්ද්‍රිය භෙදයෙන් මේ පඤ්චමධ්‍යාන සිත් 23 ම උපෙක්ඛා සහගත ය. ඉතිරි සිත් 44 සොමනස්ස සහගත ය.

ප්‍රථම පරිච්ඡෙදය නිමි.

**සොභන සිත් 59**

- ලෞකික 51
  - කාම ශොභන 24
    - කුසල් 8
    - විපාක 8
    - ක්‍රියා 8
  - මහග්ගත 27
    - රූපාවචර 15
      - කුසල් 5
      - විපාක 5
      - ක්‍රියා 5
    - අරූපාවචර 12
      - කුසල් 4
      - විපාක 4
      - ක්‍රියා 4
- ලොකොත්තර 8
  - මග්ග 4
  - ඵල 4

| සොභන සිත් 91 | | | සෝමනස්ස | උපෙක්ඛා | සම්පයුත්ත | විප්පයුත්ත | අසංඛාරික | සසංඛාරික |
|---|---|---|---|---|---|---|---|---|
| මහා කුසල් | සිත් | 8 | 4 | 4 | 4 | 4 | 4 | 4 |
| මහා විපාක | සිත් | 8 | 4 | 4 | 4 | 4 | 4 | 4 |
| මහා ක්‍රියා | සිත් | 8 | 4 | 4 | 4 | 4 | 4 | 4 |
| රූපාවචර කුසල් | සිත් | 5 | 4 | 1 | 5 | - | - | 5 |
| රූපාවචර විපාක | සිත් | 5 | 4 | 1 | 5 | - | - | 5 |
| රූපාවචර ක්‍රියා | සිත් | 5 | 4 | 1 | 5 | - | - | 5 |
| අරූපාවචර කුසල් | සිත් | 4 | - | 4 | 4 | - | - | 4 |
| අරූපාවචර විපාක | සිත් | 4 | - | 4 | 4 | - | - | 4 |
| අරූපාවචර ක්‍රියා | සිත් | 4 | - | 4 | 4 | - | - | 4 |
| ලොකොත්තර | සිත් | 40 | 32 | 8 | 40 | - | - | 40 |
| එකතුව සිත් | | 91 | 56 | 35 | 79 | 12 | 12 | 79 |

# අභිධම්මත්ථ සඞ්ගහො

## දුතියො පරිච්ඡෙදො

1. එකුප්පාද නිරොධාච – එකාලම්බන වත්ථුකා
චෙතොයුත්තා ද්විපඤ්ඤාස – ධම්මා චෙතසිකාමතා

2. කථං? ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා එකග්ගතා ජීවිතින්ද්‍රියං මනසිකාරොචෙති සත්තිමෙ චෙතසිකා සබ්බචිත්තසාධාරණා නාම.

3. විතක්කො විචාරො අධිමොක්ඛො විරියං පීති ඡන්දොචාති ඡ ඉමෙචෙතසිකා පකිණ්ණකානාම. එවමෙතෙ තෙරසචෙතසිකා අඤ්ඤසමානාති වෙදිතබ්බා.

4. මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං ලොභො දිට්ඨි මානො දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං ථීනං මිද්ධං විචිකිච්ඡා චෙති චුද්දසිමෙ චෙතසිකා අකුසලානාම.

5. සද්ධා සති හිරි ඔත්තප්පං අලොභො අදොසො තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා චෙති එකූනවීසතිමෙ චෙතසිකා සොභන සාධාරණා නාම.

6. සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො චෙති තිස්සො විරතියොනාම.

7. කරුණා මුදිතා අප්පමඤ්ඤායො නාමාති සබ්බථාපි පඤ්ඤින්ද්‍රියෙන සද්ධිං පඤ්චවීසතිමෙ චෙතසිකා සොභනාති වෙදිතබ්බා,
එත්තාවතාච.

8. තෙරසඤ්ඤසමානාච – චුද්දසාකුසලා තථා,
සොභනා පඤ්චවීසාති – ද්විපඤ්ඤාස පවුච්චරෙ.

9. තෙසං චිත්තාවියුත්තානං – යථායොගමිතොපරං
චිත්තුප්පාදෙසු පච්චෙකං – සම්පයොගො පවුච්චති.

10. සත්ත සබ්බත්ථ යුජ්ජන්ති – යථායොගංපකිණ්ණකා
චුද්දසා කුසලෙස්වෙව – සොභනෙසේවව සොභනා

11. කථං? සබ්බචිත්තසාධාරණා තාව සත්තිමෙචෙතසිකා සබ්බෙසුපි එකූනනවුති චිත්තුප්පාදෙසු ලබ්භන්ති.

12. පකිණ්ණකෙසු පන විතක්කො තාව ද්විපඤ්චවිඤ්ඤාණ වජ්ජිත කාමාවචර චිත්තෙසුචෙව එකාදසසු පඨමජ්ඣාන චිත්තෙසු චාති පඤ්ච පඤ්ඤාස චිත්තෙසු ජායති.

13. විචාරොපන තෙසුචෙව එකාදසසු දුතියජ්ඣාන චිත්තෙසු චාති ඡසට්ඨි චිත්තෙසු.

14. අධිමොක්ඛො ද්විපඤ්ච විඤ්ඤාණ විචිකිච්ඡා සහගත වජ්ජිත චිත්තෙසු

15. වීරියං පඤ්චද්වාරාවජ්ජන විපඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වජ්ජිත චිත්තෙසු.

16. පීති දෙමනස්සුපෙක්ඛාසහගත කායවිඤ්ඤාණ චතුත්ථජ්ඣාන වජ්ජිත චිත්තෙසු.

17. ඡන්දෙ අහෙතුක මොමූහවජ්ජිත චිත්තෙසු.
තෙපන චිත්තුප්පාද යථාක්කමං:—

18. ඡසට්ඨි පඤ්චපඤ්ඤාස – එකාදසච සොළස.
සත්තති වීසති චෙව – පකිණ්ණක විවජ්ජිතා,
පඤ්චපඤ්ඤාස ඡසට්ඨි – ට්ඨසත්තති තිසත්තති.
එකපඤ්ඤාස චෙකූන – සත්තති සපකිණ්ණකා,

19. අකුසලෙසුපන මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං චාති චත්තාරො මෙචෙතසිකා සබ්බාකුසල සාධාරණ නාම, සබ්බෙසුපි ද්වාදසාකුසලෙසු ලබ්භන්ති.

20. ලොභො අට්ඨසු ලොභසහගත චිත්තෙස්වෙව ලබ්භති. දිට්ඨි චතුසු දිට්ඨිගත සම්පයුත්තෙසු, මානො චතුසු දිට්ඨිගත විප්පයුත්තෙසු

21. දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං චාති ද්විසුපටිඝ සම්පයුත්ත චිත්තෙසු.

22. ථීනං මිද්ධං පඤ්චසු සසඞ්ඛාරික චිත්තෙසු

23. විචිකිච්ඡා විචිකිච්ඡා සහගත චිත්තෙයෙවාති.

24. සබ්බාපුඤ්ඤේසු චත්තාරො – ලොභමූලෙතයොගතා,
දොසමූලෙසු චත්තාරො – සසඞ්ඛාරෙද්වයං තථා.
විචිකිච්ඡා විචිකිච්ඡා – චිත්තෙ චාති චතුද්දස.
ද්වාදසාකුසලෙස්වෙව – සම්පයුජ්ජන්ති පඤ්චධා.

25. සොභනෙසුපන සොභන සාධාරණාතාව එකූනවීසතිමෙ චෙතසිකා සබ්බෙසුපි එකූනසට්ඨිසොභන චිත්තෙසු සංවිජ්ජන්ති.

26. විරතියොපන තිස්සොපි ලොකුත්තර චිත්තෙසු සබ්බථාපි නියතා එකතොව ලබ්භන්ති, ලොකියෙසුපන කාමාවචරකුසලෙස්වෙ වකදචි සන්දිස්සන්ති විසුං විසුං.

27. අප්පමඤ්ඤායොපන ද්වාදසසු පඤ්චමජ්ඣාන වජ්ජිත මහග්ගත චිත්තෙසු චෙව කාමාවචර කුසලෙසුච සහෙතුක කාමාවචර කිරිය චිත්තෙසුචාති අට්ඨවීසති චිත්තෙස්වෙව කදචි නානාහුත්වා ජායන්ති, උපෙක්ඛා සහගතෙසු පනෙත්ථ කරුණාමුදිතා නසන්තිති කෙචි වදන්ති.

28. පඤ්ඤාපන ද්වාදසසු ඤාණසම්පයුත්ත කාමාවචර චිත්තෙසු චෙව සබ්බෙසුපි පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තෙ සුචාති සත්තචත්තාලීස චිත්තෙසු සම්පයොගං ගච්ඡතී ති.

29. එකූනවීසති ධම්මා – ජායන්තෙකූන සට්ඨිසු
තයො සොළස චිත්තෙසු – අට්ඨවීසතියං ද්වයං
පඤ්ඤාපකාසිතා සත්ත – චත්තාළිස විධෙසුපි
සම්පයුත්තා චතුද්ධෙවං – සොභනෙස්වෙව සොභනා.

30. ඉස්සා මච්ඡෙර කුක්කුච්ච – විරති කරුණාදයො
නා නා කදාචි මානොච – ථීන මිද්ධං තථා සහ
යථාවුත්තානුසාරෙන – සෙසා නියත යොගිනො
සඞ්ගහංච පවක්ඛාමි – තෙසංදානි යථාරහං

31. ඡත්තිංසානුත්තරෙ ධම්මා – පඤ්චතිංස මහග්ගතෙ
අට්ඨතිංසාපි ලබ්භන්ති – කාමාවචර සොභනෙ
සත්ත වීසත්‍යපුඤ්ඤම්හි – ද්වාදසාහෙතුකෙතිච
යථාසම්භවයොගෙන – පඤ්චධා තත්ථ සඞ්ගහො

32. කථං? ලොකුත්තරෙසුතාව අට්ඨසු පඨමජ්ඣානික චිත්තෙසු අඤ්ඤසමානා තෙරස චෙතසිකා අප්පමඤ්ඤා වජ්ජිතා තෙවීසති සොභන චෙතසිකාචෙති ඡත්තිංසධම්මා සඞ්ගහංගච්ඡන්ති, තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්කවජ්ජා, තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාරවජ්ජා, චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා, පඤ්චමජ්ඣානික චිත්තෙසුපි උපෙක්ඛා සහගතා තෙ එව සංගය්හන්ති ති සබ්බථාපි අට්ඨසු ලොකුත්තර චිත්තෙසු පඤ්චකජ්-ඣාන වසෙන පඤ්චධාව සඞ්ගහො හොතීති.

33. ඡත්තිංස පඤ්චතිංසාථ – චතුත්තිංස යථාක්කමං
තෙත්තිංසවය මිච්චෙවං – පඤ්චධානුත්තරෙ ඨිතා.

34. මහග්ගතෙසුපන තිසුපඨමජ්ඣානික චිත්තෙසුතාව අඤ්ඤ--සමානා තෙරස චෙතසිකා විරතිත්තය වජ්ජිතා ද්වා වීසති සොභන චෙතසිකා චෙති පඤ්චතිංස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති. කරුණා මුදිතා පනෙත්ථ පච්චෙකමෙව යොජෙතබ්බා. තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්කවජ්ජා තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර වජ්ජා චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා පඤ්චමජ් ඣානික චිත්තෙසුපි උපෙක්ඛා සහගතා තෙ එවං සඞ්ගය්හන්ති. පඤ්චමජ්ඣානික චිත්තෙසුපන පණ්ණරසසු අප්පමඤ්ඤායො නලබ්භ-න්තිති සබ්බථාපි සත්තවීසති මහග්ගත චිත්තෙසු පඤ්චකජ්ඣානව සෙන පඤ්චධාව සඞ්ගහො හොතීති.

35. පඤ්චතිංස චතුත්තිංස – තෙත්තිංසච යථාක්කමං
ඛත්තිංස චෙව තිංසෙති – පඤ්චධාව මහග්ගතෙ.

36. කාමාවචර සොභනෙසුපන කුසලෙසුතාව පඨමද්වයෙ අඤ්ඤ-සමානා තෙරස චෙතසිකා පඤ්චවීසති සොභන චෙතසිකාචෙති අට්ඨ-තිංස ධම්මා සංගහංගච්ඡන්ති. අප්පමඤ්ඤා විරතියො පනෙත්ථ පඤ්චපි පච්චෙක මෙව යොජෙතබ්බා. තථා දුතියද්වයෙ ඤාණවජ්ජිතා තතියද්වයෙ ඤාණ සම්පයුත්තා පීතිවජ්ජිතා. චතුත්ථද්වයෙ ඤාණ පීතිවජ්ජිතා තෙඑව සඞ්ගය්හන්ති.

37. කිරිය චිත්තෙසුපි විරතිවජ්ජිතා තථෙව චතුසුපිද්වකෙසු චතුධාච සඞ්ගය්හන්ති.

38. තථා විපාකෙසුච අප්පමඤ්ඤා විරතිවජ්ජිතා තෙ එව සඞ්ග ය්හන්ති.

39. අට්ඨතිංස සත්තතිංස–ද්වයං ඡත්තිංසකං සුභෙ
පඤ්චතිංස චතුත්තිංස – ද්වයං තෙත්තිං සකං ක්‍රියෙ
තෙත්තිංස පාකෙ ද්වත්තිංස – ද්වයෙකතිංසකං භවෙ
සහෙතු කාමාවචර – පුඤ්ඤ පාක ක්‍රියා මනෙ.

40. නවිජ්ජන්තෙත්ථ විරතී – ක්‍රියෙසුච මහග්ගතෙ
අනුත්තරෙ අප්පමඤ්ඤා – කාමපාකෙද්වයං තථා.

41. අනුත්තරෙ ඣාන ධම්මා – අප්පමඤ්ඤාච මජ්ඣිමෙ
විරතී ඤාණ පීතිච – පරිත්තෙසු විසෙසකා.

42. අකුසලෙසු පන ලොභමූලෙසු තාව පඨමෙ අසඞ්ඛාරිකෙ අඤ්ඤසමානා තෙරස චෙතසිකා අකුසලසාධාරණා චත්තාරොචාති සත්තරස ලොභදිට්ඨීහි සද්ධිං ඒකූන වී සති ධම්මා සඞ්ගහං ගච්ඡන්ති.

43. තථෙව දුතියෙ අසඞ්ඛාරිකෙ ලොභ මානේන.

44. තතියෙ තථෙව පීති වජ්ජිතා ලොභදිට්ඨීහි සහ අට්ඨාරස.

45. චත්තුත්ථෙ තථෙව ලොභමානෙන.

46. පඤ්චමෙ පන පටිසසම්පයුත්තෙ අසඞ්ඛාරිකෙ දෙසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චඤ්චාති චතුහි සද්ධිං පීති වජ්ජිතා තෙ එව වීසති ධම්මා සඞ්ගය්හන්ති. ඉස්සාමච්ඡරිය කුක්කුච්චානි පනෙත්ථ පච්චෙ කමෙව යොජෙ තබ්බානි.

47. සසඞ්ඛාරික පඤ්චකෙපි තථෙව ථින මිද්ධෙන විසෙසෙත්වා යොජෙතබ්බා.

48. ඡන්ද පීති වජ්ජිතා පන අඤ්ඤසමානා ඒකාදස අකුසල සාධා රණාචත්තාරොචාති පණ්ණරස ධම්මා උද්ධච්චසහගතෙ සම්පයුජ්-ජන්ති.

49. විචිකිච්ඡා සහගත චිත්තෙච අධිමොක්ඛ විරහිතා විචිකිච්ඡා සහගත තථෙව පණ්ණරස ධම්මා සමූපලබ්භන්තීති සබ්බථාපිද්වාදසා කුසල චිත්තුප්පාදෙසු පච්චෙකං යොජිතමානාපි ගණනවසෙන සත්ත ධාවසඞ්ගහිතා හවන්තීති.

50. එකූනවීසාට්ඨාරස – වීසෙකවීස වීසති
ද්වාවීසපණ්ණරසෙති – සත්තධාකුසලෙට්ඨිතා.

51. සාධාරණාච චත්තාරො – සමානාච දසාපරෙ
චුද්දසෙතෙපවුච්චන්ති – සබ්බාකුසලයොගිනො

52. අහේතුකෙසු පන හසන චිත්තෙතාව ඡන්දවජ්ජිතා අඤ්ඤ-සමානා ද්වාදස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති.

53. තථා වොට්ඨපනෙ ඡන්දපීතිවජ්ජිතා.

54. සුඛසන්තීරණෙ ඡන්ද විරිය වජ්ජිතා

55. මනො ධාතුත්තිකාහෙතුක පටිසන්ධි යුගලෙඡන්ද පීති විරිය වජ්ජිතා

56. ද්විපඤ්ච විඤ්ඤාණෙ පකිණ්ණක වජ්ජිතා තෙයෙව සඞ්ග-ය්හන්තීති සබ්බථාපි අට්ඨාරසසු අහෙතුකෙසු ගණන වසෙන චතුධාච සඞ්ගහොහොතීති.

57. ද්වාදසෙකාදස දස – සත්තචාති චතුබ්බිධො.
අට්ඨාරසා හෙතුකෙසු – චිත්තුප්පාදෙසු සඞ්ගහො.

58. අහෙතුකෙසු සබ්බත්ථ – සත්ත සෙසා යථාරහං
ඉතිවිත්ථාරතො වුත්තො – තෙත්තිංස විධසංගහො

59. ඉත්ථං චිත්තා වියුත්තානං – සම්පයොගංච සඞ්ගහං
ඤත්වා භෙදං යථා යොගං – චිත්තෙන සමමුද්දිසෙ.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ චෙතසික සඞ්ගහ විභාගොනාම.

දුතියො පරිච්ඡෙදෙ

# අභිධර්මාර්ථ සංග්‍රහය

## ද්‍ුතිය පරිච්ඡේදය

(භාවය)

1. සිත සමඟ එක්ව උපදින, එක්ව නිරුද්ධවන, එක් අරමුණක් ඇති, එක් වස්තුවක් ඇති, සිත හා යෙදෙන දෙපනස් ධර්මයෝ චෛතසිකයෝ යයි දන්නා ලදහ.

2. කෙසේ ද? ඵස්ස, වෙදනා, සඤ්ඤා, චෙතනා, එකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර යන මේ චෛතසික සත සබ්බචිත්ත සාධාරණ නම් වෙත්.

3. විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද යන මේ චෛතසික සය ප්‍රකීර්ණක නම් වෙත්. මෙසේ මේ චෛතසික තෙළෙස අඤ්ඤ සමාන යයි දත යුතු.

4. මොහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, ලොභ, දිට්ඨි, මාන, දෙස, ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච, ථීන, මිද්ධ, විචිකිච්ඡා යන මේ චෛතසික තුදුස අකුසල චෛතසික නම් වෙත්.

5. සද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලොභ, අදෙස, තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, කායලහුතා, චිත්තලහුතා, කායමුදුතා, චිත්තමුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා, කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා යන මේ එකුන් විසි චෛතසිකයෝ සොභන සාධාරණ නම් වෙත්.

6. සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන් දෙන විරතීහු නම් වෙත්.

7. කරුණා, මුදිතා දෙදෙන අප්‍රමාණ්‍යයෝ නම් වෙත්. සර්ව ප්‍රකාරයෙන් පඤ්ඤින්ද්‍රියයත් සමග ඉම් පස් විසි චෛතසිකයෝ සොභනයෝ යයි දත යුත්තා හ.

8. මෙතෙකින්, අන්‍යසමාන තෙළෙසය, අකුසල තුදුසය, සොභන පස් විස්සය යි දෙපනස් චෛතසිකයක් කියනු ලදී.

9. මින්මතු, චිත්තයන් හි වෙන වෙනම යෙදෙන ඔවුන්ගේ සම්ප්‍රයොගනය කියනු ලැබේ.

10. සතක් සියළු සිත්හි යෙදෙත්. ප්‍රකීර්ණකයෝ සුදුසු පරිද් දෙන් යෙදෙත්. තුදුසක් අකුසල් සිත්හිම යෙදෙත්. සොභනයෝ සෝභන සිත්හිම යෙදෙත්.

11. කෙසේද? සබ්බචිත්ත සාධාරණ නම් වූ මේ චෛතසික සත සියලු එකුන් අනූ සිත්හි ලැබෙති.

12. ප්‍රකීර්ණකයන් අතුරෙන් විතර්කය දෙපස්විඤ්ඤාණයන් හැර ඉතිරි කාමාවචර චිත්තයන්හි ද, එකොළොස් ප්‍රථමධ්‍යාන සිත්හිද යන පස්පනස් සිත්හි උපදී.

13. විචාරය ඒ සිත්හි ද, එකොළොස් ද්‍විතියධ්‍යාන සිත්හි ද යන සසැට සිත්හිද

14. අධිමොක්ඛය දෙපස් විඤ්ඤාණ සහ විචිකිච්ඡා සහගත සිත හැර ඉතිරි සිත් හිද

15. විරිය පඤ්චද්වාරාවජ්ජනය, දෙපස්විඤ්ඤාණය, සම්පටිච්ඡණ සන්තීරණ සිත් හැර ඉතිරි සිත් හිද

16. ප්‍රීතිය, දෙම්නස් සිත්, උපෙක්ඛාසහගත සිත්, කායවිඤ්ඤාණ චතුර්ථධ්‍යාන සිත් හැර ඉතිරි සිත්හි ද,

17. ඡන්දය අහේතුක සිත් මොමූහ සිත් හැර ඉතිරි සිත්හි උපදී. එය පිළිවෙලින්.

18. සිත් සැටසයෙක පස්පනසෙක, එකොළොසෙක, සොළොසෙක, සැත්තෑවෙක, විස්සෙක ප්‍රකීර්ණකයෝ නොයෙදේ. සිත්

පස්පනසෙක, සැටසයෙක, සැත්තෑ අටෙක, සැත්තෑතුනෙක, එක්පනසෙක, එකුන්සැත්තෑවෙක යන සිත්හි පිළිවෙලින් යෙදෙත්.

19. අකුසලයන් අතුරෙන් මොහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච යන මේ චෛතසික සතර සබ්බාකුසල සාධාරණ නම් වෙත්. මොව්හු සියලු දෙළොස් අකුසල් සිත්හි ලැබෙත්.

20. ලොභය, ලොභසහගත සිත් අටෙහිම ලැබේ. දිට්ඨිය, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ම ලැබේ. මානය දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ම ලැබේ.

21. දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන මොහු පටිඝසම්ප්‍රයුක්ත සිත් දෙක්හි ද,

22. ථිනය හා මිද්ධය සසඞ්ඛාරික සිත් පසෙහි ද,

23. විචිකිච්ඡාව විචිකිච්ඡා සහගත සිතෙහි ද ලැබේ.

24. සියළු අකුසල් සිත්හි සතරෙක් ද, ලොභ මූල සිත්හි තුනෙක් ද, දෙස මූල සිත්හි සතරෙක් ද, සසඞ්ඛාර සිත්හි දෙකෙක් ද, විචිකිච්ඡාව විචිකිච්ඡා සිතෙහි ද, මෙසේ මේ තුදුස දෙළොස් අකුසල් සිත්හි පස් ආකාරයකින් යෙදෙති.

25. සොභනයන් අතුරෙන් එකුන් විසි සොභනසාධාරණ චෛතසිකයෝ සියලු එකුන් සැට සොභන සිත්හිම ලැබෙති.

26. විරතිත්‍රය ලොකොත්තර සිත්හි සර්වප්‍රකාරයෙන් නියතව එකට ම ලැබෙත්. ලෞකික සිත් අතුරෙන් කාමාවචර කුසල් සිත්හිම ඇතැම් විටෙක වෙන වෙනම ලැබෙත්.

27. අප්‍රමාණයයෝ පඤ්චමධ්‍යාන සිත් හැර මහග්ගත සිත් දෙළොසෙහි ද කාමාවචර කුසල් සිත්හිද, සහේතුක කාමාවචර ක්‍රියා සිත්හිද යන අට විසි සිත් හි ඇතැම් විටෙක වෙන් වෙන්ව උපදිත්. උපෙක්ඛා සහගත සිත්හි කරුණා මුදිතා දෙක නො ලැබෙතියි සමහරෙක් කියත්.

28. ප්‍රඥාව වනාහි දෙළොස්ඥාණ සම්ප්‍රයුක්ත කාමාවචර සිත්හි ද, සියලු පන්තිස් මහග්ගත ලොකොත්තර සිත්හි ද යන සිත් සතළිස් සතෙහි සම්ප්‍රයොග බවට යෙයි.

29. එකුන් විසි ධර්මකෙනෙක් එකුන් සැටක් සිත්හි ද, තිදෙනෙක් සිත් සොළොසෙක ද දෙදෙනෙක් සිත් අටවිස්සෙක ද යෙදෙති. ප්‍රඥාව සිත් සතළිස් සතෙක යෙදේ යයි කියන ලදී. මෙසේ ශොභනයෝ සොභන සිත්හිම සතර ආකාරයකින් යෙදුනාහු ය.

30. ඉච්චා, මච්ඡරිය, කුක්කුච්ච, විරතිත්‍රය, කරුණා, මුදිතා යන මොව්හු සහ මානය ද වෙන් වෙන්ව කිසි විටෙක උපදී. එසේම ථීනය සහ මිද්ධය ද එකටම උපදී. කියන ලද අනුසාරයෙන් සෙස්ස නියතයෝගී වෙති. දැන් ඔවුන්ගේ සංග්‍රහනය ද කියමි.

31. ලොකොත්තර සිත්හි සතිසක්ද, මහග්ගත සිත්හි පන්තිසෙක්ද, කාමාවචර සොභන සිත්හි අටතිසෙක් ද, අකුසල් සිත් හි සත් විස් සක් ද, අහේතුක සිත්හි දෙළොසෙක් ද ලැබෙති. මෙසේ ලැබෙන පරිදි යෙදීමෙන් එහි සංග්‍රහය පස් වැදෑරුම් වේ.

32. කෙසේ ද? ලොකොත්තර සිත් අතුරෙන් ප්‍රථමධ්‍යානික සිත් අටෙහි තෙළෙස් අන්‍යසමාන චෛතසිකය, අප්‍රමාණායයන් හැර තෙවිසි සොභන චෛතසිකදැයි සතිස් චෛතසිකයන් සංග්‍රහ වෙත්. එසේම ද්‍රුතියධ්‍යානික සිත්හි විතර්කය හැර ද, තෘතියධ්‍යානික සිත්හි විතර්කවිචාරයන් හැර ද, චතුර්ථධ්‍යානික සිත්හි විතක්ක විචාර පීතිය හැරද, පඤ්චමධ්‍යානික සිත්හි එය ම උපෙක්ඛා සහිතවද සංග්‍රහ වෙත්. මෙසේ සර්වප්‍රකාරයෙන් ලොකොත්තර සිත් අටෙහි පඤ්චක ධ්‍යාන යන් ගේ වශයෙන් පඤ්චවිධ සංග්‍රහයක් වෙත්.

33. ලොකොත්තර සිත්හි පිළිවෙලින් සතියෙක, පන්තියෙක' සිව්තිසෙක, තුන්තිසෙක් බැගින් යුගලයක් දැයි පඤ්චවිධ සංග්‍රහයෙක් සිටියාහුය.

34. මහග්ගත සිත්හි වනාහි ප්‍රථමධ්‍යානික සිත්තුනෙහි අඤ්ඤසමාන තෙලෙස් චෛතසිකයෝ ය. විරති හැර සොභන දෙවිසි චෛතසිකයෝ ය යන පන්තිසක් ධර්ම සංග්‍රහ වෙත්. කරුණා

මුදිතා දෙදෙන වෙන වෙනම යෙදිය යුත්තාහුය. එසේ ම ද්‍විතියධ්‍යානික සිත්හි විතර්කය හැර ද, තෘතියධ්‍යානික සිත්හි විතර්ක විචාරයන් හැරද, චතුර්ත්ථධ්‍යානික සිත්හි විතර්ක, විචාර ප්‍රීතිය හැරුද පඤ්චමධ්‍යානික සිත්හි එයම උපෙක්ඛාව සහිතව ද සංග්‍රහවෙත්. පසළොස් පඤ්චම ධ්‍යානික සිත්හි අප්‍රමාණ්‍යයෝ නො ලැබෙත්. මෙසේ සර්වප්‍රකාර යෙන් සත් විසි මහග්ගත සිත්හි පඤ්චකධ්‍යානයන් ගේ වශයෙන් පඤ්චවිධ සංග්‍රහයක් වෙත්.

35. මහග්ගත සිත්හි පන්තිසෙක, සිව්තිසෙක, තුන්තිසෙක, දෙතිසෙක, තිසෙක යයි මෙසේ පිළිවෙලින් පඤ්චවිධ සංග්‍රහයෙක් වෙත්.

36. කාමාවචර සොභන සිත්හි වනාහි කුසල්සිත් අතුරෙන් ප්‍රථමද්වයෙහි අඤ්ඤසමාන චෛතසික තෙළෙසය, පස්විසි සොභන චෛතසික දැයි අටතිස් ධර්ම කෙනෙක් සංග්‍රහ වෙත්. මෙහි අප්‍රමාණ්‍ය, විරති යන ධර්ම පස වෙන වෙනම යෙදිය යුත්තාහ. එසේ ම දෙවෙනි ද්වයෙහි ඤාණය හැර ද, තුන්වන ද්වයයෙහි ඤාණ සම්ප්‍රයුක්තව ප්‍රීතිය හැර ද, චතුර්ථද්වයෙහි ඤාණ ප්‍රීති හැර එයම සංග්‍රහ වෙත්.

37. ක්‍රියා සිත්හි විරති හැර එසේම සතර ද්‍වකයෙහි සතර විධ සංග්‍රහයෙක් වෙත්.

38. එසේම විපාකසිත්හිද අප්‍රමාණ්‍ය, විරතිහැර එයම සංග්‍රහ වෙත්.

39. සහේතුක කාමාවචර කුසල ක්‍රියා විපාක සිත්හි පිළිවෙලින් කුසල් සිත්හි අටතිසෙක සත්තිස බැගින් දෙකෙක, සතිසෙක ක්‍රියා සිත්හි පන්තිසෙක, සිව්තිස බැගින් දෙකෙක තුන්තිසෙක, විපාක සිත්හි තුන්තිසෙක දෙතිස බැගින් දෙකෙක, එක්තිසෙක යන චෛතසිකයෝ සංග්‍රහ වෙත්.

40. මහග්ගත සිත්හි හා මහා ක්‍රියා සිත්හිද විරතීහු නැත්තාහ. ලොකොත්තර සිත්හි අප්‍රමාණ්‍යයෝ නැත්තාහ. එසේම මහා විපාක සිත්හි විරති අප්‍රමාණ්‍යයෝ නැත්තාහ.

41. ලොකොත්තර සිත්හි ධ්‍යාන ධර්මයෝ ද, මධ්‍යම වූ මහග්ගත සිත්හි අප්‍රමාණ්‍යයෝ ද, පරිත්තවූ කාම සොභන සිත්හි විරති, ඤාණ, ප්‍රීතිහු ද, විසෙසකර වෙත්.

42. අකුසල්සිත් අතුරෙන් ලොභ මූල සිත්හි ප්‍රථම අසංඛාරික සිතෙහි තෙළෙස් අඤ්ඤසමාන චෛතසිකයෝය. අකුසලසාධාරණ සතරය, යන සතලොස සහ ලොභ දිට්ඨි සහිතව එකුන් විසි ධර්ම කෙනෙක් සංග්‍රහ වෙත්.

43. එසේ ම දෙවෙනි අසඞ්ඛාරික සිතෙහි ලොභමානයන් සමගද

44. එසේම තුන්වෙනි අසඞ්ඛාරික සිතෙහි ප්‍රීතිය හැර ලොභ දිට්ඨි සමඟ අටළොසෙක් ද,

45. එසේම සිව්වැන්නෙහි ලොභ මානයන් සමඟ ද,

46. පස්වෙනි පටිඝසම්ප්‍රයුක්ත අසඞ්ඛාරික සිතෙහි 'දෙස, ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච යන සතර සමඟ ප්‍රීතිය හැර ඒ විසි ධර්මයෝ ම සංග්‍රහ වෙත්. එහි ඉස්සා මච්ඡරිය කුක්කුච්චයන් වෙන වෙන ම යෙදිය යුතුය.

47. සසඞ්ඛාරික සිත් පසෙහි ද එසේ ම ථීන මිද්ධයන් වෙසෙසා යෙදිය යුතු.

48. ඡන්ද පීති හැර අන්‍ය සමාන එකොළොස ද අකුසලසාධාරණ සතර ද යන පසළොස් ධර්මයෝ උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතෙහි යෙදෙත්.

49. විචිකිච්ඡා සහගත සිතෙහි ද අධිමොක්ඛය හැර විචිකිච්ඡාව සමඟ පසළොස් ධර්ම කෙනෙක් එසේම ලැබෙත්. මෙසේ සර්ව ප්‍රකාරයෙන් දෙළොස් අකුසල් සිත්හි වෙන වෙනම යෙදෙන්නාහු නමුදු ගණන වශයෙන් සත්පරිද්දෙකින් ම සංග්‍රහ කරන ලද්දහු වෙත්.

50. අකුසල් සිත්හි එකුන් විස්සෙක, අටළොසෙක, විස්සෙක, එක්විස්සෙක, නැවත විස්සෙක, දෙවිස්සෙක, පසළොසෙක යයි සප්තවිධ සංග්‍රහයෙන් සිටියාහු වෙත්.

51. අකුසල සාධාරණ සතරය, අන්‍යසමාන දසය යන තුදුස සියලු අකුසල් සිත් හි යෙදෙන්නාහුය.

52. අහේතුක සිත් අතුරෙන් පළමුකොට හසන චිත්තයෙහි ඡන්දය හැර අන්‍යසමාන දෙළොස් ධර්මයෝ සංග්‍රහ වෙත්.

53. එසේම වොට්ඨපන සිතෙහි ඡන්දප්‍රීති හැර ද,

54. සුඛසන්තීරණයෙහි ඡන්දවිරිය හැරද,

55. මනොධාතුත්‍රිකය සහ අහේතුක පටිසන්ධි යුගලයෙහි ඡන්ද, පීති විරිය හැරද.

56. දෙපස් විඤ්ඤාණයන්හි ප්‍රකීර්ණකයන් හැර අන්‍ය සමානයෝ සංග්‍රහවෙත්. මෙසේ සර්වප්‍රකාරයෙන් අටළොස් අහේතුක සිත්හි ගණන වශයෙන් සතරවිධ සංග්‍රහයෙක් වෙත්.

57. අටළොස් අහේතුක සිත්හි දෙළොසෙක, එකොළොසෙක දසයෙක, සතෙක යයි මෙසේ සතර ආකාරයකින් සංග්‍රහ වෙයි.

58. සියළු අහේතුක සිත්හි චෛතසික සතක් ද, සෙසු චෛතසික යෝ සුදුසු පරිද්දෙන් ද ලැබෙති. මෙසේ විස්තර වශයෙන් තෙතිස් වැදෑරුම් වූ සංග්‍රහ නය කියන ලදී.

59. මෙසේ සිත හා යෙදෙන චෛත්සිකයන්ගේ සම්ප්‍රයොගනය හා සංග්‍රහනය ද දැන යෙදෙන යෙදෙන පරිද්දෙන් සිත හා සම වූ චෛතසික ප්‍රභෙදය කියන්නේ ය.

මෙසේ අභිධර්මාර්ත්ථ සංග්‍රහයෙහි චෛතසික සංග්‍රහ විභාග නම් වූ

දුතිය පරිච්ඡෙදය නිමි.

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## ද්විතිය පරිච්ඡේදය

### චෛතසික සංග්‍රහ විභාගය

**චිත්ත, චෛතසික, රූප, නිර්වාණ** යන සතර පරමාර්ථ ධර්මයන් අතුරෙන් **චෛතසිකය** දෙවැනි පරමාර්ථය වේ. සිතක් හට ගැනීමේදී චෛතසිකයන් නැතිව නූපදී. චෛතසිකයන්ට ද සිතක් නැතිව ඉපදීමට නොහැකි වේ. සිතින් කරනු ලබන යම් කෘත්‍යයක් වේනම් මේ චෛතසිකයන්ගේ ශක්තියෙන් ම කළයුතු වේ. බලවත්ව යෙදුන චෛතසික ඇති සිත් බලවත් වේ. දුර්වල සිත්වල චෛතසිකයන් දුර්වල වේ. සිතත් සමගම, සිතටම ඇතුළත්ව පවතින මේ දෙපනස් චෛතසික ධර්මයෝ සිතම පූර්වාඞ්ගම කොට ඇත්තාහුය. චිත්ත චෛතසික දෙදෙනාගෙන් සිත ප්‍රධානය. චෛතසිකයෝ අප්‍රධානය.

### සම්ප්‍රයෝග ලක්ෂණ සතර

**ඒකුප්පාද, ඒකනිරොධ, ඒකාලම්බණ, ඒකවත්ථුක,** යයි චෛතසිකයන්ගේ සම්ප්‍රයොග ලක්ෂණ සතරෙකි.

**ඒකුප්පාද ලක්ෂණය**–චිත්තයාගේ **උප්පාද, ඨිති, භඞ්ග** යන **ක්ෂණත්‍රය** අතුරෙන් චිත්තය හටගන්නා උප්පාදක්ෂණයෙහිදීම ඉදිරි පසු නොවී තමා හා සම්ප්‍රයුක්ත වූ චෛතසික ධර්මයෝ ද හටගන්නාහු වෙති. මෙයට ඒකුප්පාද ලක්ෂණය යයි කියති.

**ඒකනිරොධලක්ෂණය**–චිත්තයාගේ භඞ්ගක්ෂණයේ අවසානයේදී සිත නිරුද්ධවන කල්හි ඒ හා සමඟ යෙදුනා වූ චෛතසික ධර්මයෝද ඉදිරිපසු නොවී නිරුද්ධ වී යෙති. මෙයට **ඒකනිරොධලක්ෂණය** යයි කියති.

**ඒකාලම්බණලක්ෂණය**–චිත්තය වනාහි රූපාලම්බණ, **සද්දලම්බණ**, ගන්ධාලම්බණ, රසාලම්බණ, ස්පාර්ශාලම්බණ, ධර්මාලම්බණ,

පච්චුප්පන්න, අතීතානාගත ධර්මයෝය, කාල විමුක්ත වූ ප්‍රඥප්තිය, චිත්ත චෛතසික සඞ්ඛ්‍යාත නාම ධර්මය, අධ්‍යාත්මක බාහිර ධර්මය, නිර්වාණය යන මේ ධර්මයන් අතුරෙන් **යම්කිසි ධර්මයක්** අරමුණු කොට උපදනේය. තමා හා සම්ප්‍රයුක්ත චෛතසිකයෝද මෙකී චිත්තයාගේ අරමුණ ම අරමුණු කරත්. මෙයට **එකාලම්බණ ලක්ෂණය** යයි කියති.

**එකවත්ථුකලක්ෂණය**– චක්ඛු විඤ්ඤාණාදී ද්විපඤ්ච විඤ්ඤාණයෝ චක්ඛුප්‍රසාද වස්තු ආදී පඤ්චප්‍රසාද වස්තු නිශ්‍රය කොට ගෙණ උපදිත්. අනිකුත් සියළුම සිත් හෘදයවස්තු රූපය නිසා පවත්නාහු වෙති. ඒ සිත් හා උපදනා චෛතසිකයෝ ද ඒ ඒ සිත් උපදින වස්තු නිසා පවත් නාහුම වෙති. මෙයට **එකවත්ථුක ලක්ෂණය** යයි කියති.

මෙකී සම්ප්‍රයොග ලක්ෂණ සතරින් යුක්තව, සිත හා සමගම, සිතෙහිම නියුක්තව, සිතටම ඇතුළත්ව පවත්නා හෙයින් මේ දෙප නස් ධර්මයන්ට චෛතසික යන නාමය ව්‍යවහාර වේ.

මේ චෛතසිකයෝ පනස් දෙදෙනා වෙන් වෙන් වූ ස්වභාව හා වෙන් වෙන් වූ කෘත්‍ය ඇත්තෝම වෙති. හැම සිතක් පාසාම මේ චෛතසික සියල්ලම යෙදෙන්නේ නොවේ. ඒ ඒ සිත්හි යෙදෙන චෛතසික සඞ්ඛ්‍යාව ද වෙනස් වේ. අඩුම ගණනින් චෛතසික යන් සත් දෙනෙක් ද, වැඩිම ගණනින් චෛතසිකයෝ තිස්හය දෙනෙක් ද යෙදෙත්. යම් සිතක යම් චෛතසික සමූහයක් යෙදෙන්නේ නම්, ඒ චෛතසිකයන් ද සිත හා සමඟම ඉපදීම් ආදී සතර සම්ප්‍රයෝග ලක්ෂණයන්ගෙන් යුක්ත වේ.

දෙපනස් චෛතසිකයන් අතුරෙන් ඇතැම් චෛතසිකයෝ හැම සිත්හි ම යෙදෙන්නාහු ය. තවත් සමහර චෛතසිකයෝ කුසල් අකුසල් දෙක්හිම අවස්ථා පරිදි යෙදෙන්නාහුය. තවත් ධර්ම සමූහ යක් අකුසල් සිත් හි පමණක් ද, සමහර ධර්මයෝ කුසල් සිත්හි පම ණක් ද යෙදෙන්නාහුය. මේ ආදී නොයෙක් කරුණු සලකා මේ චෛතසික ධර්ම සමූහය නොයෙක් කොටස් වලට බෙද දක්වනු ලැබේ.

පළමු කොට චෛතසිකයෝ රාශි තුනකට බෙදනු ලැබේ.

1. **අඤ්ඤසමාන රාශිය**– චෛතසික 13 කින් යුක්තය.
2. **අකුසල රාශිය**– චෛතසික 14 කින් යුක්තය.
3. **සොභන රාශිය**– චෛතසික 25 කින් යුක්තය.

**අඤ්ඤසමාන රාශිය**– අන්‍ය සමාන රාශියට අයත් චෛතසික යන් දහතුන් දෙනා අසොභන සිත් සමඟ යෙදෙන විට තමනුත් අසොභන වෙයි. එසේම සොභන සිත් සමග යෙදෙන විට තමනුත් සොභන වෙයි. මෙසේ අසොභන සිත් සමඟ යෙදෙන කල්හි, සොභන සිත්වලින් අන්‍ය වූ අසොභන සිත් හා සමාන බැවිනුත්, සොභන සිත් සමඟ යෙදුන කල්හි අසොභන සිත්වලින් අන්‍ය වූ සොභන සිත් හා සමාන වන හෙයිනුත් මේ චෛතසිකයන්ට අඤ්ඤ-සමාන යන නාමය ව්‍යවහාර වේ.

මේ අඤ්ඤසමානයෝ, මිත්‍රයන් ආශ්‍රය කිරීමෙහි දක්ෂ කෛරාටික මිත්‍රයෙකුට බඳු උපමා ඇත්තේයි. මොහු ප්‍රාණඝාත අදත්තාදනාදී දුශ්චරිතයන්හි හැසිරෙන්නා වූ, පාපකාරී පුද්ගලයන් ආශ්‍රය කිරීමේ දී ඔවුන් හා සමානවම ප්‍රාණඝාතාදී යෙහි හැසිරෙන්නේ ය. දනාදී පින්කම් කරන මිත්‍රයන් ආශ්‍රය කිරීමේ දී ඔවුන් හා සමානව ම පින්කම්හි යෙදෙන්නේ ය. එසේ ම මේ චෛතසිකයෝ තෙළෙස් දෙන, දෙළොස් අකුශල සිත් හා එක්ව යෙදුන කල්හි ඒ ධර්මයෝ ද ඒකාන්තයෙන් ම අකුසල් වෙති. කාම, රූප, අරූප, ලොකොත්තර යන හෙද ඇති සොභන සිත්හි ඒ හා එක්ව යෙදෙන කලහි, ඒ ධර්ම යෝ එකාන්ත කුසල්ම වෙත්. විපාක ක්‍රියාවන් හා යෙදුනු කල්හි අව්‍යාකෘත වෙත්.

තව ද මේ අඤ්ඤසමාන චෛතසිකයන් අතුරෙන් සත් දෙනෙක් සියළුම සිත්හි යෙදෙන සබ්බචිත්ත සාධාරණයෝයි. සදෙනෙක් සොභන අසොභන සිත්හි විසිර පවත්නා **ප්‍රකීර්ණකයෝ ය.**

**අකුසල රාශිය**— දෙළොස් අකුසල චිත්තයන්හි පමණක් යෙදෙන තුදුස් (14) චෛතසිකයෝ අකුසල රාශියට ඇතුළත් වෙති. පාප ගතිවූ ද, අනර්ථය සළසන්නාවූ ද අවැඩ සාද දෙන්නා වූ ද මේ චෛත සිකයෝ කුසලය වළක්වති.

**සොභන රාශිය**– මේ සොභන රාශියට අයත් පස්විසි (25) චෛතසික ධර්මයෝ සොභන සිත්හි මිස අන් සිතක නො යෙදෙන්නාහුය. යහපත් ගතිවූද, අර්ථයම සළසන්නා වූ ද, වැඩ සාද දෙන්නා වූ ද මේ චෛතසිකයෝ යහපත්කම ලබා දෙන හෙයින් සොභන නම් වෙති.

**අඤ්ඤසමාන රාශිය**

**සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ**

**සබ්බචිත්ත සාධාරණ චෛතසිකයෝ** නම්:— (1) **ඵස්සය**, (2) **වේදනාය**, (3) **සංඥය**, (4) **චේතනාය**, (5) **ඒකග්ගතාය**, (6) **ජීවිතෙන්ද්‍රියය**, (7) **මනසිකාරය** යන සතය.

අසූනවයක් වශයෙන් හෝ එක්සිය විසි එකක් වශයෙන් හෝ ගැණෙන සිත් සියල්ලෙහිම මේ චෛතසිකයෝ සත් දෙන යෙදෙන හෙයින් සියළුම සිත්වලට සාධාරණය යන අර්ථයෙන් **සබ්බචිත්ත සාධාරණයෝ** යයි ව්‍යවහාර වේ.

**ඵස්සය**

සිතක් හටගැනීමට අරමුණක් අවශ්‍යය. අරමුණු වශයෙන් ගැනීමට කොපමණ රූප, ශබ්දදිය ඇත්තේ වී නමුත්, ඒ හැම අරමුණක්ම, සිත විසින් එකවර ගනු නො ලබන්නේ ය. යම්කිසි එක් අරමුණක් සිත උපදින ස්ථානයේදී ම, එම සිතත් සමඟ යම් හැපීම් ආකාරයක් දක්වා ද, එවිට ඒ අරමුණ ගෙන සිත උපදී. අරමුණ සිතෙහි හැපීම්, වැදගැණිම්, ස්පර්ශවීම් ආකාරයෙන්, සිතෙහිම හටගන්නා ස්වභාවය, ඵස්ස යයි දත යුතු. බාහිරව පවත්නා වර්ණාදිය, අභ්‍යන්තරය ඇසුරු කරමින් පවත්නා සිත සමඟ ස්පර්ශවීම ඉතා සියුම් ආකාරයෙන් සිදුවන්නෙකි. ඵස්ස චෛතසිකය නම් වූ මේ නාමධර්මය අරමුණක් හමු වූ කල්හි සිතත්, සම්ප්‍රයුක්ත ධර්මත්, අරමුණෙහි ස්පර්ශ කරවීම පිණිස එම සිතෙහි ම හට ගන්නා ශක්තියකි. මේ ඵස්සය අනිකුත් සමප්‍රයුක්ත ධර්මයන්ට, මෙසේ ස්පර්ශ කරන ලද අරමුණු රසය විඳීම් ආදි නොයෙක් කෘත්‍යයන් කිරීමට අවකාශ සළසනු ලැබේ. සියළුම සම්ප්‍රයුක්ත ධර්මයන් එකට

උපදින නමුත් පළමු කෘත්‍යයක් හැටියට ස්පර්ශය ගත හැකි බැවින් මේ චෛතසිකය පළමු කොට දක්වූ බව සැළකිය යුතුය.

රූප ධර්මයන් එකිනෙකට ගැටීම හෙවත් ස්පර්ශවීම රළු වශයෙන් සිදුවන්නකි. නාම ධර්මයන් ගේ ස්පර්ශය, එසේ නොව අරමුණු රසය විඳගැනීමට හැකිවනසේ ගැටෙන ආකාරයෙන් පැවැත්මය. පඤ්චද්වාරයෙන් ගනු ලබන වර්තමාන අරමුණු පමණක් නොව, මනොද්වාරයෙන් ගනු ලබන අතීත වූ ද අනාගත වූ ද, කාලනියමයක් නැත්තාවූ ද, අරමුණු හා සමඟ ගැටීමෙන් ඒ පිළිබඳව සිත් ඇති වන්නේය. ඒ හැම අරමුණක්ම, සිතෙහි උපදනා ස්පර්ශ චෛතසිකයාගේ ශක්තියෙන් ම වැදගන්නේවේ. ඉතා වෙගයෙන් ඉපිද නිරුද්ධ වන්නා වූ සිතකින් ඉතා සියුම්වූ අතීතානාගතාදී අරමුණු ගන්නා කල්හි ද, ඒ සිතත්, සියුම් වූ අරමුණත් එකිනෙක හැපීම කරවන මේ ඵස්ස චෛතසිකය ද, ඒ සිත හා සමගම ඉපිද, ඒ සිත නිරුද්ධවන කල්හිම නිරුද්ධ වෙයි. එසේ ම ඉතා කුඩා වූ ද, මහත් වූ ද, අභිමුඛව පවත්නා වූ ද, දුර තිබෙන්නා වූ සැම අරමුණුම, ක්ෂණයෙකින් මේ ස්පර්ශ චෛතසිකය විසින් සිත හා සමඟ ස්පර්ශ කරවන්නේය. එපමණක් නොව පූර්ව භවයෙන් ගන්නා ලද කර්ම, කර්ම නිමිති, ගති නිමිති ආදී අරමුණුත් භවාඞ්ග සිත හා ගැටීම ඇති කර වන්නේත් මේ ස්පර්ශ චෛත්සිකය විසින්මය. මෙය ඉතා දුර්වලව හටගන්නා විපාක සිත් බැවින් එහි අරමුණ ප්‍රකටව නො වැටහේ. එබැවින් මේ **ඵස්ස චෛතසිකය** ද සිතත්, සිතෙහි සම්ප්‍රයුක්ත වූ අනිකුදු ධර්මයනුත් සමග එකටම ඉපිද එකටම නිරුද්ධවන එකම අරමුණ ගෙන එකම තැන උපදින නාම පරමාර්ථයකි. හැම සිතකම ඵස්සය උපදින හෙයින් එය සබ්බචිත්ත සාධාරණ චෛතසිකයකි.

තවද චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන සළායතනයන්ගේ ඇතිවීම හෙතුකොට ගෙනම මේ ඵස්සය වන්නේ ය. එමෙන් ම මේ ඵස්සයාගේ පහළ වීමෙන් වේදනාව ඇති වන්නේ ය. සත්ත්වයාගේ ජීවත් වීමට මේ ඵස්සය ආහාරයක් වන බැවින් එයටම **ඵස්සාහාර** යයි ද කියනු ලැබේ.

## වේදනාව

සෑම අරමුණකම පැතිර පවත්නා රසයක් ඇත්තේ ය. එම අරමුණ, සිත හා සමග ස්පර්ශවීමේ දී, අරමුණු රසය විඳගැනීමේ **ශක්තියක් ද, ඒ සිතෙහිම ඇති වේ.** එයට **වෙදනා යයි කියනු** ලැබේ. **මේ වෙදනාව** සෑම සිතකම උපදින බැවින් **සබ්බචිත්ත සාධාරණ** චෛතසිකයකි. යම් අරමුණක ඇති ඉෂ්ට බව, ප්‍රිය බව හෝ යහපත් බව දක්වන ආරම්මණ රසය අනුභව කිරීමේ හෙවත් විඳීමේ ස්වභාවය **සුඛ වෙදනා** යයි ද, **සොමනස්ස වෙදනාව** යයි ද ව්‍යවහාර වේ ආරම්මණයාගේ අනිෂ්ඨ බව, අප්‍රිය බව, අයහපත් බව දක්වන අරමුණු රසය අනුභව කිරීමේ හෙවත් විඳීමේ ස්වභාවය **දුක්ඛ වෙද නාව** යයිද, **දෞමනස්ස වෙදනාව** යයි ද ව්‍යවහාර වේ. එමෙන් ම ආරම්මණයාගේ සැප හෝ දුක් හෝ නුවූ මධ්‍යස්ථ බව අනුභව කරන් නාවූ, විඳින්නා වූ ස්වභාවය **උපෙක්ඛා වෙදනා** නම් වේ. මෙසේ අනුභවන භෙදයෙන් වෙදනාව **සුඛ**, **දුක්ඛ**, **උපෙක්ඛා** යයි තෙවැදෑ රුම් වේ. ඉන්ද්‍රිය භෙදයෙන් වනාහි **සුඛ**, **සොමනස්ස**, **දුක්ඛ**, **දෞම නස්ස**, **උපෙක්ඛා** යයි පස් වැදෑරුම් වේ.

සිතින් වැදගන්නා ලද අරමුණක යම් රසයක් වේද, ඒ සිතෙහි අන්තර්ගත සියළුම චෛතසික ධර්මයන් විසින් ද, තම තමන්ට අයත් විශෙෂ කෘත්‍යයන් සිද්ධ කරමින්, එක්තරා ප්‍රමාණයකින් අරමුණු රසය විඳින නමුත්, මේ වෙදනා චෛතසිකය සර්වප්‍රකාර යෙන්ම ඊශ්වර භාවයෙන් ම අන්‍ය කෘත්‍යයක් නො කොට අරමුණ රසයම අනුභව කරන බව සැළකිය යුතුයි.
සෑම සිතකම ඇතිවන මේ වේදනා සමූහයට **වෙදනා ස්කන්ධ** යයි කියනු ලැබේ.

විශෙෂයෙන් සුඛ වෙදනා උපදනා කල්හි, එයම නැවත නැවත විඳීමට කැමැත්ත හා ආශාව ඇති වීමෙන් තණහාව දියුණු වන්නේය. දුක් වෙදනා විඳින කල්හි **පටිඝය** ඇති වන්නේය.

## සංඥාව

**සංඥාව** වනාහි ආරම්මණ ස්වභාවය හැඳිනීම ලක්ෂණ කොට ඇත්තේය. සෑම වස්තුවක්ම, සෑම ධර්මයක් ම ඔවුනොවුන්ට

වෙනස් ආකාරයෙන් ඇතිවන බැවින්, ඒ ඒ වස්තු හෝ ධර්ම වෙන් වෙන් වශයෙන් හැඳිනීමට උපකාරවන ස්වභාවයක් හෙවත් **ලක්ෂණ** ඇත්තේය. සිතෙහිම හට ගන්නා වූ, එම අරමුණු ස්වභාවය හෙවත් **ලක්ෂණ** හැඳින ගන්නා ශක්තියට **සංඥ චෛතසික** යයි කියනු ලැබේ. සැම සිතකම මේ **සංඥව** ඇතිවන බැවින් එය ද **සබ්බචිත්තසාධාරණ** චෛතසිකයකි. මේ සංඥව උපදනා කල්හි එම අරමුණ නැවත හැඳිනීමට **ලකුණක්** කොට නිරුද්ධ වෙයි. පසුව ඇතිවන සිත, ඒ ලකුණෙන් අරමුණ හැඳින, නැවත හැඳිනීමට උපකාරවන ලකුණක්ද කරයි. මෙසේ නැවත නැවත ලකුණු කරමින් උපදනා මේ සංඥ සමූහය කල්ගත වීමෙන් අරමුණ ස්ථිරව හැඳිනීමට උපකාර වේ.

මේ සංඥ තොමෝ වනාහී සුදු, රතු නිල් යනාදී වශයෙන් ඒ ඒ ආලම්බණයන්ගේ සළකුණු මාත්‍රයකින්, අරමුණ හැඳින ගන්නේ වී නමුත්, එය කුමක් හෙයින් සුදු රතු නිල් වූයේ දැයි නො දනී.

සැම සිතක් පාසාම ඇතිවන මේ සංඥ සමූහයට **සංඥ ස්කන්ධ** යයි කියනු ලැබේ.

## චෛතනාව

කායික වූ ද, වාචසික වූද, මානසික වූද, හැම ක්‍රියාවක්ම කරන කල්හි, ඒ ඒ කෘත්‍යයන්හි උත්සාහවත් බව ඇති කරවන ආකාර යෙන්, සිතෙහිම විශෙෂ ශක්තියක් පහළ වන්නේය. ක්‍රියාවක් හෙවත් කෘත්‍යයක් නො කරන සිතක් නැත. සිත පමණක් නොව සිතෙහි සම්ප්‍රයුක්ත ධර්ම සමූහයා විසින් ද වෙන් වෙන් වශයෙන් තම තමන්ට අයත් කෘත්‍යයන් සිදු කරමින් පහළ වෙත්. සිතත්, සම්ප්‍රයුක්ත ධර්මයනුත්, තම තමන්ට අයත් කටයුතු කිරීමෙහි ශක්ති යක් ඇතිව ඉපදුන නමුත්, ඒ ඒ කටයුතු පිළිබඳව උත්සාහවත් බව ඇති කරවන ශක්තියක් ද ඒ හා සමහම ඉපදිය යුතු ය. එවැනි උත්සාහ කරවන ශක්තියක් නො ලැබුනොත් කටයුතු කළ නොහැකි වේ. එබැවින් සැම සිතකම ඇතිවන මේ ශක්තියට **චෛතනාව** යයි කියනු ලැබේ. මෙය ද **සබ්බ චිත්ත සාධාරණ චෛතසිකයකි.**

සවල්ප වූ සම්ප්‍රයුක්ත ධර්මයන් ඇති සිත්වල, එනම් අහේතුක **විපාක සිත්** ආදීන්හි යෙදෙන මේ **චෙතනා චෛතසිකය** ද දුර්වල වේ. එවැනි සිත්වලින් තමන්ට කළ හැකි වැඩ කටයුතු ද නැත. කුසලා කුසල කර්ම කරන කල්හි පහළවන සිත්වල වැඩි චෛතසික ගණනක් යෙදෙන බැවින් ද, එයින් කළයුතු කෘත්‍යයන් අධික බැවින් ද, ඒ **සිත්වල** යෙදෙන **චෙතනා චෛතසිකය** ද බලවත් වේ. මේ **චෙතනා චෛතසිකය**, තමනුත් උත්සාහවත් වී, සිතත්, අනිකුදු සම්ප්‍රයුක්ත ධර්මයනුත් උත්සාහවත් කරමින් උවමනා ක්‍රියාව සම්පූර්ණ කර දෙන්නේ ය. යුද්ධ සේනාපති තෙමේ යම්සේ ආයුධ සන්නද්ධව, ඉදිරියට පැමිණ, ඒ ඒ සේනාවන් ද ඒ ඒ යුද්ධ කාර්‍ය්‍යයන්හි යොදවා තමන් සතු කාර්‍ය්‍යය ද සිද්ධ කරන්නාක් මෙන්, මේ ''**චෙතසික භාවය**'' නම් වූ උත්සාහවත් වීම ලක්ෂණ කොට ඇති **චෙතනා චෛතසිකය,** සසම්ප්‍රයුක්ත වූ සිත තම තමන් සතු කාර්‍ය්‍යයන්හි යොදවා, තමනුත් උත්සාහවත්ව ක්‍රියා සම්පාදනය කරන්නේ ය. මෙසේ සියළුම ක්‍රියාවන්හි ප්‍රධානත්වය දරන **චෙතනාව**, කුසලා කුසල කර්මයන් කරවන කල්හි ඒ ඒ ක්‍රියාවන්ට යොග්‍ය පරිද්දෙන් අනිකුත් සම්ප්‍රයුක්ත ධර්මයන් ද උපදවා ගන්නේ ය. මේ **චෙතනාවට**, **කර්මය** යයි කියනුයේ මේ හේතුව නිසා බව දත යුතුයි.

**වේදනා**,, **සංඥා**, **සඞ්ඛාර**, **විඤ්ඤාණ** යන සතර නාම ස්කන්ධයන් අතුරෙන්, **වේදනා**, **සඤ්ඤ** යන දෙක පළමු කොට දක්වා, එයට අනතුරුව සඞ්ඛාර ස්කන්ධය දක්වන කල්හි මේ **චෙතනාව** මුල් කොට ඇති චෛතසික පනස (50) දැක්වීමෙන් ද, ඉතිරි චෛතසිකයන් අතුරෙන් චෙතනාවට මුල් තැන දී තිබෙන බව සැළකිය යුතුය. මේ චේතනාවට ම කර්මය, සංඛාරය, ආයුහනය යනාදී නම් ද ව්‍යවහාර වේ. අන්‍ය වූ චෛතසිකයන් මෙන් මේ චෙතනාවගේ ආයුෂය ද චිත්තක්ෂණයකට වැඩි නොවේ. එසේ නමුත් මේ **චෙතනාව** හෙවත් **කර්මය**, ඔහුගේ නිරුද්ධයට පසුව ලැබිය යුතු විපාක ශක්තිය උපදවා දෙමින්ම නිරුද්ධ වන්නේය. ණය ගත්තාවූ තැනැත්තා **ණය** ගෙවන තුරුම ණයගැති වන්නාක් මෙන්, මෙසේ උපදවා ගත් චෙතනාවගේ විපාක ශක්තිය ගෙවෙන තුරුම නො නැසී පවතින්නේය. **ණය** ගෙවීමට කාලපරිච්ඡේදයක් නියම කොට හෝ නියම නොකොට හෝ ණය ගත්තේ වී නම්, ඒ ඒ කාලසීමාව තුළ හෝ කාල නියමයක් නැතිව ලත්විටෙක හෝ, ණය ගෙවා නිදහස් විය හැකි

වන්නාක් මෙන්, මේ චෙතනාවගේ විපාක ශක්තිය ද, පළමුවන සත් වන ජවන් සිත්හි යෙදුන විට එම ආත්මභාවයෙහිදී ම හෝ, දෙවන අත්බැව්හි හෝ, විපාක දියයුතු වේ. මධ්‍යයෙහි වූ ජවන් සිත් පහෙන් සිදුවන කර්ම කාල නියමයක් නැතිව, අවස්ථා පරිදි විපාක දෙන්නේ වේ. ණය ගෙවුනු පසු ණයෙන් නිදහස් වන්නාක් මෙන් එක් චෙතනා චෛතසිකයකගේ විපාකය වරක් ලැබුණු කල්හි එයින් නිදහස් වන්නේය. නැවත විපාක දෙනු ලබන්නේ අන්‍ය චෙතනා වන්ගේ විපාකයෝය. යම් කර්මයක් කරන කල්හි ලක්ෂ සඞ්ඛ්‍යාත චිත්ත වීථි උපදනා බැවින් ද, ඉන් එක් චිත්ත වීථියක ජවන් හෙවත් කර්ම බවට පැමිණි සිත් සත බැගින් උපදනා බැවින් ද විපාක උපද වන චෙතනා අප්‍රමාණ බවත් එම ගණනට ම අප්‍රමාණ විපාක ලැබෙන බවත් වටහා ගත යුතු.

## එකග්ගතාවය

එක සිතකට, එක අරමුණක, එක් ආකාරයක් මුත් ආකාර කීපයක් එකවර ගත නො හැකිවේ. නොයෙක් ආකාරයන් එකවර ගන්නට ගියහොත් එකක්වත් හමු නොවන්නේය. එබැවින් සැම සිතක්ම, තමන් විසින් ගනු ලබන අරමුණෙහි නොයෙක් ආකාරයන් අතුරෙන් යම්කිසි එක් ආකාරයක පිහිටා, එම ආකාරයෙන් ම අරමුණ ගන්නාවූ ශක්තියක් ද එම සිතෙහිම පහළ වේ. මෙසේ අරමුණෙහි සිත පිහිටුවන සවභාවයට **එකග්ගතා** යයි කියනු ලැබේ. සිතත්, සිතෙහි වූ සම්ප්‍රයුක්ත ධර්මයනුත්, උප්පාදක්ෂණයේ සිට භංග අවස්ථාවේ අවසානය දක්වා, අරමුණ අත් නොහැර, එහි පිහිටා, එහිම නවත්වා ගන්නා වූ ද, කම්පා නොවීම ලක්ෂණ කොට ඇති, එකග්ගතා ශක්ති යද, සැම සිතකම, අනිකුත් සම්ප්‍රයුක්ත ධර්මයනුත් සමග පහළ වන්නේ ය. මේ එකග්ගතාවද සබ්බචිත්ත සාධාරණ චෛතසිකයකි. මෙයට සිතෙහි එකඟ බව යයි ද කියනු ලැබේ. සිතින් සහ සම්ප්‍ර යුක්ත ධර්මයන් විසින් ද, තම තමන්ට අයත් කෘත්‍යයන් කරන්නට හැකි වන්නේ ඒ ධර්මයන් අරමුණෙහි පිහිටුවා ගත් කල්හි පමණය. මේ උපකාරය ලබාදෙන්නේ එකග්ගතා චෛතසිකය විසිනි.

බලවත් එකග්ගතාවට **සමාධිය** යයි කියනු ලැබේ. කාමාවචර සිත්හි යෙදෙන සමාධියට වඩා මහග්ගත ලොකෝත්තර සිත්හි

යෙදෙන **සමාධිය** බලවත් වේ. මේ සමාධිය ප්‍රඥව ලැබීමට උපකාර වේ. අකුසල් සිත්හි මේ එකග්ගතාවය සමග මොහයත් උද්ධච්ච යත් යෙදෙති. මෝහය බලවත් වූ කල්හි උද්ධච්චය හෙවත් නොසන්සුන් බව අධික වේ. මෝහමූල උද්ධච්ච සම්ප්‍ර යුක්ත සිත ඇති වන්නේ එහෙයිනි. මේ සිතේ එකග්ගතාවයත් උද්ධච්චයත් එකට ඇතිවන්නේ කෙසේ දැයි සැක කළ හැකි වේ. එකග්ගතාවය, අරමුණ අත් නොහැර, අරමුණෙහි සිත රඳවා ගැනීම කරන්නේ ය. උද්ධච්චය, සිතත් සම්ප්‍රයුක්ත ධර්මත් කම්පාකොට නොසන්සුන් බව ඇති කරන්නේ ය. මේ කරුණු දෙකම අකුසල් සිතෙහි එකවර සිදු වේ. වල ගොඩ සහිත වූ මාර්ගයක රථය කට නැගී යන කෙනෙක් සෙලවි සෙලවි නමුත් රථයෙන් ගමන් කරන්නාක් මෙන්, මේ අකුසල් සිත ද උද්ධච්චයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ නොසන්සුන් බව ඇතිවන නමුත් එකගතා ශක්ති යෙන් අරමුණ අත් නොහරින්නේ ය. උද්ධච්චය නිසා, සම්ප්‍රයුක්ත ධර්මයන්ට, තම තමන්ට අයත් කෘත්‍යයන් නිශ්චලව සිට කරන්නට නො හැකි වේ. කුසල් සිත්හි මෙවැනි කලබල සහිත ස්වභාවයක් නැති බැවින් එකග්ගතාවය බලවත්ව, සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද, නිශ්චලව, තම තමන්ට අයත් යහපත් කෘත්‍යයන් කිරීම පිණිස අරමුණෙහි සසම්ප්‍රයුක්ත වූ සිත මනාව පිහිටුවා දෙන්නේ ය. කාමා වචර සිත්වලට වඩා මහග්ගත සිත්හි යෙදෙන එකග්ගතාවය බලවත් බැවින් ඒ සිතින් ගත් අරමුණෙහි මනාව පිහිටා ක්‍රියා කරන්නේ ය. ලොකොත්තර සිතෙහි මේ බලවත් එකග්ගතාවය වූ සමාධිය සමඟ විදර්ශනා ඥනය යෙදෙන බැවින් ඒ සිත අන් හැමට වඩා බලවත්ය. පෘථග්ජන ගොත්‍රය නැසීමට හැකි වන්නේත් මේ පිරිසිදුවීමත්, බල වත්කමත් නිසා ය.

## ජීවිතෙන්ද්‍රිය

**නාමජීවිතෙන්ද්‍රිය, රූපජීවිතෙන්ද්‍රිය** යන දෙවැදෑරුම් ජීවිතෙන් ද්‍රියයන් අතුරෙන්, **නාමජීවිතෙන්ද්‍රිය** සියළුම අසූ නවයක් වූ සිත්හි යෙදෙන්නා වූ ද, සිතත්, සම්ප්‍රයුක්ත ධර්මත් නැසෙන්නට ඉඩ නොදී ආරක්ෂා කරන්නා වූ, ජීවිතය දෙන්නා වූ චෛතසික ධර්මයකි. නාම ධර්මයක් වූ මේ නාම ජීවිතෙන්ද්‍රිය, ඒ හා සමඟ පහළවන අනි කුත් නාම ධර්මයන් ජීවත් කරවන, ඉන්ද්‍රියභාවයෙහි පිහිටි චෛත

සිකයක් බැවින් ජීවිතෙන්ද්‍රිය යයි කියනු ලැබේ. ජීවිතෙන්ද්‍රිය නැති කල්හි නාම ධර්මයන් ගේ පැවතීමක් නොවන්නේ ය. සෑම සිතක් ම විනාශ වන්නට ඉඩ නො දී සිත් පරම්පරාව ද රකිමින්, ජීවත් කරවමින්, සිතෙහි ම හට ගන්නා මේ ස්වභාවය හෙවත් ශක්තිය චිත්තසන්තතිය පාලනය කරන්නේ ය. මේ නිසා මෙය නො නැසෙන ශක්තියක් යයි ද, ආත්මයක් යයි ද වරදවා පිළිගැනීම ද සිදුවන්නේ ය. මේ ජීවිතෙන්ද්‍රිය චෛතසිකය ද අනිකුත් චෛතසිකයන් මෙන්, සිත හා සමගම ඉපිද සිත නිරුද්ධ වන කල්හි ම නිරුද්ධ වේ. එයට පසුව උපදින සිතෙහි ද ජීවිතෙන්ද්‍රියය ඒ සිත හා සමග ඉපිද නිරුධවේ. එබැවින් ජීවිතෙන්ද්‍රිය නො නැසෙන ශක්තියක් නොව හැම සිතක් පාසාම ඇතිව නැති වන චෛතසික ධර්මයකි.

රූපජීවිතෙන්ද්‍රිය යයි කියන ලද්දේ පටිසන්ධික්ෂණයේ දී හට ගත් කර්මජ රූපකලාපසන්තතිය නො නැසී චුතිය දක්වා පවත්වාගෙන යාමට කර්මයෙන් හටගත් රූප ධර්මයකි. මව් මළ පසු දරුවන් රැකීමට කිරිමව්වරු ඉදිරිපත් වන්නාක් මෙන් පටිසන්ධි සිත ඉපිද නිරුද්ධ වූවායින් පසු කර්මජ රූප කලාප ජීවත් කිරීමට මේ රූපජීවිතෙන්ද්‍රිය පහළ වන්නේය. චුති සිතෙහි අවසානය වනවිට කර්මජ රූප සියල්ලක් ම නිරුද්ධ වන බැවින් පටිසන්ධියේදී හටගත් මේ ජීවිතෙන්ද්‍රිය නම් වූ රූප ධර්ම පරම්පරාව ද චුති සිතත් සමග නිරුද්ධ වේ.

සබ්බචිත්ත සාධාරණ චෛතසිකයක් වශයෙන් ගනු ලබන්නේ මේ නාමජීවිතෙන්ද්‍රිය බව දත යුතුයි.

## මනසිකාරය

අරමුණු මෙනෙහි කිරීම ලක්ෂණ කොට ඇති මේ මනසිකාරය සියළුම සිත්හි යෙදෙන සබ්බචිත්තසාධාරණ චෛතසිකයකි. සිතට හමුවන නොයෙක් අරමුණුවලින් එකක් පමණක් එක වරකට සිතින් ගත හැකි බැවින්, කැමැති අරමුණු පමණක් ගැනීමටත් අන් අරමුණ වළක්වාලීමටත් මේ මනසිකාරය නම් චෛතසිකය උපකාර වේ. සිතත්, සම්ප්‍රයුක්ත ධර්මත් කැමැති එක් අරමුණට යොමු කරවන්නේ මේ මනසිකාරයයි. එබැවින් මේ මනසිකාරය, අරමුණු සිහි කිරීමත්,

සිත හා එකිනෙක ගැලපීමත් සිදු කරන්නේය. මනසිකාරය නොමැති නම් අරමුණ වෙන්කර ගැනීමක් සිදු නොවේ. නුවණත් සමඟ යෙදී අරමුණු මෙනෙහි කරන විට **යොනිසො මනසිකාරය** යයි ද නුනුවණින් මෙනෙහි කරන විට **අයොනිසො මනසිකාරය** යයි ද කියනු ලැබේ. මනසිකාරයට පමණක් යහපත් හෝ අයහපත් වශයෙන් අරමුණු තෝරාගන්නට ශක්තියක් නැත.

මෙහි විස්තර කරන ලද මේ සබ්බචිත්තසාධාරණ චෛතසික ධර්ම සත, කුසල් අකුසල් විපාක, ක්‍රියා යන සැම සිතකම යෙදෙති. කුසල් සිත් සමග යෙදෙන විට මේ සත් දෙනා එකාන්ත කුසලයෝ වෙති. අකුසල් සිත් සමග යෙදුන විට එකාන්ත අකුසල් වෙති. විපාක ක්‍රියා සිත්හි යෙදුන විට අව්‍යාකෘත චෛතසිකයෝ යයි කියනු ලැබේ. අඤ්ඤසමාන රාශියට ඇතුළත් වන්නේ ඒ හෙයිනි. ඉතාම දුර්වල වූ අහේතුක ද්විපඤ්ච විඤ්ඤාණ සිත්හි යෙදෙන්නේ මේ චෛතසික සත්දෙනා පමණය. මෙයින් එකක්වත් අඩුව සිතක් හට නොගන්නේය.

## ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙන

**විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද** යයි ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙනකි. සබ්බචිත්තසාධාරණ චෛතසිකයන් මෙන් නියම වශයෙන් හැම සිතකම නො යෙදුණේ වී නමුත් සොභන අසොභන සිත් දෙකොටසෙහිම සමහර විටෙක යෙදෙමින්, සමහර විටෙක නොයෙදෙමින්, විසිර පවත්නා බැවින් මේ චෛතසික සදෙනාට **ප්‍රකීර්ණකයෝ** යයි කියනු ලැබේ. මේ ප්‍රකීර්ණක චෛතසිකයෝ ද කුසල් සිත් සමග යෙදෙන විට එකාන්ත කුසල් වශයෙන් ද, අකුසල් සිත සමග යෙදෙන විට එකාන්ත අකුසල් වශයෙන් ද, විපාක ක්‍රියා සිත් සමග යෙදෙන විට අව්‍යාකෘත යයි ද සළකනු ලැබේ.

## විතක්කය

**සිතත්**, සම්ප්‍රයුක්ත ධර්මයනුත් අරමුණ කරා පමුණුවන, අරමුණට නංවන ස්වභාවය **විතක්ක** නමි. කල්පනා කිරීම යයි කියන්නේත් මේ විතර්කයටය. මේ විතර්කය, නැවත නැවතත්, අළුත් අළුත්

අරමුණුවලට සිත නංවමින් උත්සාහ වත් කරයි. විතර්කයෙන් අරමුණ කරා නංවන ලද සිත ඒ අරමුණ ගැනීම කරන්නේය. සිත අරමුණ ගන්නා කල්හි සම්ප්‍රයුක්ත ධර්මයන් ද එම අරමුණම ගනිති චක්ඛු විඤ්ඤාණාදි ද්විපඤ්ච විඤ්ඤාණයන්ට මේ විතර්කය උවමනා නැත. රූපාදී අරමුණු චක්ෂුරාදි වස්තූන්හි ගැටීම නිසා ඒ ඒ ස්ථානයන්හි ම විතර්කයාගේ මෙහෙයීමක් නැතිව සිත් උපදී. මහග්ගත චිත්තයන් අතුරෙන් ප්‍රථම ධ්‍යාන සිතෙහි විතර්කය යෙදෙන නමුත් ඉතිරි ධ්‍යානයන්හි, චිත්තසන්තතිය අරමුණෙහි බෙහෙවින් හුරු කරන ලද බැවින්, විතර්කය නැතිවම සමාධිය ඇති වේ. තමන්ට පමණක් ඉසිලිය නො හැකි බරක් කරපිට නැංවීමට උපකාර වන අන් පුරුෂයෙකු මෙන් විතර්කය ද අරමුණෙහි නැංවීමට උපකාර වන්නේ ය. ඖදරික සඝොධාර ශබ්දයක් වැනි වූ මේ **විතක්ක විප්ඵාර** ශබ්දය, අභිඥලාභීන්ගේ දිව්‍යශ්‍රොතඥනයට හමුවීමෙන්, මෝහට මෙබඳු සිතක් උපන්නේ යයි දනගනී. තවද උකුසකු අහසට නගින කල්හි පියාපත් වේගයෙන් පැහැර අහසට නගින්නාක් මෙන් ද මේ විතර්කයේ ඖදරිකත්වය දතයුතුයි. මේ **විතර්කයම. තර්කය** යයි ද, **සංකල්පය** යයි ද, **අප්පණා** යයි ද, **ව්‍යප්පණා** යයි ද, **ඌහා** යයි ද ඒ ඒ අවස්ථාවන්ට අනුව නොයෙක් නම්වලින් හඳුන්වනු ලැබේ. ධ්‍යානාඞග අතුරෙන් පළමුවැනි ධ්‍යානාඞගය **විතර්ක** යයි. ධ්‍යාන චිත්ත වීථියෙහි පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ යන කාමාවචර කුසල් සිත්හි යෙදෙන විට **විතර්කය** යයි ද, ධ්‍යාන සිතෙහි යෙදෙන විට **අප්පණා, ව්‍යප්පණා** යයි ද කියනු ලැබේ. මාර්ගඵල චිත්තයන්හි යෙදෙන විතර්කයට **සම්මා සඞකප්ප** යයි කියනු ලැබේ. තව ද විතර්කයෙන්, ථිනමිද්ධ නීවරණය යටපත් කරනු ලැබේ.

## විචාරය

විතර්ක චෛතසිකය විසින් අරමුණට නංවන ලද්ද වූ සිතත් සම්ප්‍රයුක්ත ධර්මයනුත් ඒ ඒ ක්‍රියාවන්හි හැසිරවීම ලක්ෂණ කොට ඇති මේ විචාරය අරමුණෙහි ස්වභාවය සිතට පැහැදිලි කර දෙන්නේ ය. යම් වස්තුවක් පැහැදිලි ලෙස දන ගැනීමට පෙර එය හොඳ හැටි පිරිමැද, අතගා බැලිය යුතු වාක් මෙන් විචාරය ද අරමුණෙහි හැසිර වීම් වශයෙන් උපකාර වෙයි. මේ **විතක්ක විචාර** දෙදෙනා නිතර

එකට ම උපදී. එයින් විචාරය සියුම් ස්වභාවය ඇත්තේ වෙයි. ඝණ්ඨාර ශබ්දයට පසුව ඇතිවන රාවය මෙන්ද, අහසට නැගී උකුසා පියාපත් නො පැහැර නිශ්චලව අහසෙහි යන්නාක් මෙන් ද, සන්හුන් පැවතුම් ඇත්තේ ය. යම් කිසි පුරුෂයෙක් ලොහොතලියක් එක් අතකින් තදින් අල්වාගෙන අනිත් අතින් සෙමින් සෙමින් මදින්නාක් මෙන්, විතර්කය විසින් තදින් නංවා අල්වා ගත් අරමුණ විචාරය විසින් පිරිමැද බලන්නේය. තව ද මේ විචාරය ධ්‍යානාඞ්ගයක් වශයෙන් පළමුවැනි දෙවැනි ධ්‍යාන සිත්හි යෙදෙමින් විචිකිච්ඡා නීවරණය මැඩලීමට උපකාරවන්නේ ය. ද්විපඤ්ච විඤ්ඤාණ සිත්හි ද විචාරය නො යෙදෙයි.

## අධිමොක්ඛය

අරමුණ නිශ්චය කරන ස්වභාවයට **අධිමොක්ඛ** යයි කියනු ලැබේ. අරමුණෙහි සැක හැර ස්ථිරව පිහිටීමට මේ අධිමොක්ඛ චෛතසිකය උපකාර වෙයි. සත්‍යය, අසත්‍යය, යහපත, අයහපත යනාදී වශයෙන් වෙන් නො කොට ,අරමුණ කුමක් හෝ වේවා, තදින් අල්වා ගෙන, සිතෙහි පිහිටුවා ගැනීමට උපකාරවන මේ අධිමොක්ඛය, බොහෝ සෙයින් වැරදි ලෙස ද, අසත්‍යය සත්‍ය වශයෙන් ද අදහන්නේ වේ. **මිථ්‍යාධි මොක්ඛ** යයි කියනුයේ එයටය. අරමුණක් යහපත් ය කියා හෝ අයහපත්ය කියා හෝ නිශ්චය කර ගැනීමට චිත්ත වීථි රාශියක් ඇති විය යුතුයි. සිතින් ගනු ලබන අරමුණ, අන් අරමුණුවලින් වෙන් කොට, නිශ්චය කිරීමක් වැනි ක්‍රියාවක් ඇත්තා වූ මේ අධිමොක්ඛ චෛතසිකය විචිකිච්ඡාව් නම් වූ සැකයට විරුද්ධ වූ නාම ධර්මයක් බැවින් මෝහමූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත අකුසල් සිතෙහි නො යෙදෙන්නේය. මේ අධිමොක්ඛය අකුසල් සිත්හි යෙදෙන කල්හි අකුසල් වශයෙන් ද, කුසල් සිත්හි යෙදෙන කල්හි කුසල් වශයෙන් ද, විපාක ක්‍රියා සිත්හි යෙදෙන කල්හි අව්‍යාකෘත වශයෙන් ද සළකනු ලැබේ.

## වීරිය

සසම්ප්‍රයුක්ත වූ චිත්තයට අරමුණෙහි ස්ථිරව පිහිටා සිටීමට රුකුල් දීම ලක්ෂණ කොට ඇති මේ වීර්‍ය්‍ය චෛතසිකයද

සොභන අසොභන සිත් දෙකොටසෙහි විසිර පවත්නා හෙයින් ප්‍රකීර්ණ චෛතසිකයකි. චිත්ත චෛතසික ධර්මයන්ගේ පසුබට නො වීම පිණිස මේ වීර්‍ය්‍යචෛතසිකය රුකුල් දෙන්නේ ය. ශරීරය ක්‍රියා කිරීමට, මැනවින් ආහාර පානාදියෙන් අනුබල ලැබිය යුතු වේ. ආහාර නොලැබූ කය දුර්වල වී ඇදවැටෙන්නේ ය. එමෙන් ම සිතත්, සම්ප්‍රයුක්ත ධර්මයනුත් දුර්වල වී, ඇදවැටෙන්නට නොදී අරමුණෙහි ස්ථිරව පිහිටා, තම තමන් අයත් කෘත්‍යයන් නිසිසේ කිරීමට උපකාර දීමත්, අනුබල දීමක් වශයෙන් මේ විරිය චෛතසිකය පහල වන බව දත යුතුයි. පාප ගතියට ම නැමී පවත්නා පෘථග්ජන චිත්ත සන්තානයක මේ වීර්‍ය්‍ය චෛතසිකය යෙදුන කල්හි පහතට ගලා බස්නා ජලයක පිහිටි ඔරුවක් මෙන්, පහසුවෙන් අකුසල පක්ෂයෙහිම ගමන් කරයි. කුසලය වනාහී අකුසලයන් මැඩ පවත්වා උත්සාහ යෙන් සිත සකස් කොට කළ යුත්තකි. වීර්‍ය්‍ය නො යෙදුන කල්හි කුසල් කිරීමට නො හැකි වේ. කෙලෙස් සහිත පුද්ගලයාට දන්දීම් සිල් රැකීම් ආදිය මහත් බරක් සේ වැටහේ. බරක් රැගෙන කඳු නගින තැනැත්තාට වීර්‍ය්‍ය නො ලැබුනොත් කඳු නැග ගන්නට නො හැකි වන්නා සේ කුසල් කිරීමට වීර්‍ය්‍යය ඇති විය යුතුයි. කුසල් සිතට වීර්‍ය්‍ය ලැබුණ කල්හි එහි සම්ප්‍රයුක්ත ධර්මයන් ද දුබල නොවී, උත්සාහවත් වී, නො පසු බටව ක්‍රියා කරන්නට රුකුලක් වන්නේ ය. වීර්‍ය්‍ය බලවත් වූ පමණට කුසල් සිත ද බලවත් වේ. බලවත් වූ වීර්‍ය්‍යය, පාරමිතාවක් වශයෙන් ද පුරුදු කොට, සම්බොධි යට ද පැමිණිය හැකි වේ. බොධි පාක්ෂික ධර්මයක් සැටියට මේ වීර්‍ය්‍යය, නව ආකාරයකින් පහළ වන්නේය. එනම් **සතර සම්‍යක් ප්‍රධානයෝය, වීරියිද්ධිපාදය, විරියින්ද්‍රිය, වීරියබලය, වීරිය සම්බොජ්ඣඞ්ගය, සම්මාවායාමය** යනුයි. මනොද්වාරාවජ්ජනය සහ හසිතුප්පාදය යන සිත් දෙක හැර අනිකුත් අහේතුක සිත් සොළොසෙහි මේ වීර්‍ය්‍ය චෛතසිකය නො යෙදෙන්නේය. ඒ සිත් දහසය, ප්‍රසාද වස්තුන්හි අරමුණු ගැටුනු කල්හි උත්සාහයක් නැතිවම හටගන්නා හෙයිනි. ඉතිරි සිත් සියල්ලෙහි ම මේ වීර්‍ය්‍ය චෛතසිකය යෙදෙන බව දත යුතුය.

### ප්‍රීතිය

පීති චෛතසිකය අරමුණෙහි සිතත්, සම්ප්‍රයුක්ත ධර්මයනුත් පිණවීම ලක්ෂණ කොට ඇත්තේය. දුකින් පෙළනු ලැබූ පුද්ගල

සාගේ හැකුළුනු ශරීරය, ඉෂ්ට අරමුණු ලත් කල්හි ඇතිවන සොම්නස නිසා වියලි ස්වභාවය දුරුවී පිරුණු, සැහැල්ලු ගතියක් ඇති කරන්නාක් මෙන්, මේ ප්‍රීති චෛතසිකය ද සිත පුබුදු කරවයි. ප්‍රීතිය නිසා උපදවා ගත් වයොධාතුහුගේ උපකාරයෙන්, ශරීරය ද නොයෙක් ආකාරයෙන් සැලෙන්නට, වැනෙන්නට ද සැරසෙයි. සිනහවක් නැටීමක් ඇති වන්නේ මේ හේතුවෙන්ය. සොමනස්සය යෙදෙන සැම සොභන අසොභන සිතකම ප්‍රීතිය ද පහළ වන්නේ ය. සොමනස්සය ඉෂ්ට අරමුණු රසය විඳිමකි. මේ විඳිම නිසා සිතෙහි ඇතිවන ප්‍රබෝධය ප්‍රීතිය නමි.

මේ ප්‍රීති තොමෝ, **ඛුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය, ඔක්කන්තික ප්‍රීතිය, උබ්බෙග ප්‍රීතිය, ඵරණ ප්‍රීතිය** කියා පස් ආකාර වේ. ශරීරයෙහි ලොමු ඩැහැගැනීම් මාත්‍රයක් උපදවන්නා වූ ප්‍රීතිය **ඛුද්දක ප්‍රීති** නමි. විදුලි ගසන්නාක් මෙන් ක්ෂණක්ෂණයෙන් ශරීරයෙහි ලොමු දැහැ ගැනීම් උපදවන්නා වූ ප්‍රීතිය **ඛණික ප්‍රීති** නමි. මුහුදේ රළ, වෙරළෙහි බිඳී බිඳී යන්නාක් මෙන් සකල ශරීරයෙහි පැතිර යන්නා වූ ප්‍රීතිය **ඔක්කන්තික ප්‍රීතිය** නමි. ශරීරය උඩට විසිකරන්නාක් මෙන් ඇතිවන බලවත් ප්‍රීතිය **උබ්බෙග ප්‍රීතිය** නමි. සකල ශරීරයම ස්පර්ශ කරමින්, පැතිර පවත්නා අති ප්‍රණීත ප්‍රීතිය **ඵරණ ප්‍රීති** නමි.

තවද මේ ප්‍රීති චෛතසිකය, ධ්‍යානාඞ්ගයක් වශයෙන් පළමුවැනි දෙවැනි තුන්වැනි ධ්‍යාන සිත්හි යෙදෙන්නේ ය.

## ඡන්දය

අරමුණ ගැනීමෙහි කැමැති බව **ඡන්ද** යයි. මේ ඡන්දය, අරමුණ ගනු කැමැත්ත මිස එහි ඇලීම කරවන ශක්තියක් නොවේ. අරමු-ණෙහි ඇලෙන ශක්තියට **ලොභ** යයි ද, **තෘෂ්ණාව** යයිද, **ආශාව** යයිද කියනු ලැබේ. යහපත, අයහපත වශයෙන් නො සළකා අරමුණ ගැනීම පමණක් මේ ඡන්දයෙන් සිදුවේ. මෝහය අධික කල්හි, සිතෙහි නොසන්සුන් භාවය හෝ, අරමුණෙහි සැක සහිත භාවය හෝ ඇතිවන නිසා, අරමුණ ගැනීමෙහි කැමැත්තක් ඇති නොවේ. එබැවින් මොහමූල සිත් දෙකෙහි ඡන්ද චෛතසිකය නොයෙදෙන් නේය. තව ද දුර්වල වූ අහේතුක සිත් අටළොසෙහි ද මේ ඡන්දය

නො යෙදේ. මේ හැර සොභන සිත් සියල්ලෙහි ම ඡන්දය යෙදෙන්නේය. ප්‍රකීර්ණක චෛතසිකයක් වූ මේ ඡන්දය, අකුසල් සිත් සමඟ යෙදුන විට අකුසල් වශයෙන් ද, කුසල් සිත් සමඟ යෙදුන විට කුසල් වශයෙන් ද, සළකනු ලැබේ.

ලොභමූල අකුසල් සිත්හි යෙදෙන ඡන්දය, ලොභයට අනුබල දෙන්නේ වේ. කුසල් සිත්හි යෙදෙන ඡන්දය, ලොභය මැඩලීමට උපකාර වේ. මේ ඡන්දය දියුණු කිරීමෙන් ඡන්දධිපති භාවයට හා ඡන්දිද්ධිපාද භාවයට පැමිණ තෘෂ්ණාව මැඩ පවත්වා උසස් කුසල් කිරීමට ද, ධ්‍යාන උපදවා ගැණීමට ද, නිවණට පැමිණීමට ද උපකාර වන්නේමය.

# අකුසල චෛතසික

අරමුණක් රැගෙන සිතක් හටගන්නා කල්හි, ඒ අරමුණ ගන්නා ආකාරයට අනුව සිතෙහි පහළවන්නා වූ ගති හෙවත් චෛතසිකයෝද වෙනස් වේ. ආලම්බණ ස්වභාවය ඇති සැටි ගැනීමේ දී පහළවන සොභන චෛතසිකයෝ, ආලම්බණ ස්වභාවය වරදවා ගැනීමේදී පහළ නොවන්නාහ. අරමුණ වරදවා ගන්නා කල්හි උපදනා සිත් වලින් අනර්ථයක්ම සිදුවන්නේ ය. යහපත සලසන්නා වූ සිත්හි යෙදෙන චෛතසිකයෝ සොභන චෛතසිකයෝයි. අනර්ථය සිදු කරන අකුසල් සිත්හි යෙදෙන චෛතසිකයන්ට, අකුසල චෛතසිකයෝ යයි කියනු ලැබේ. පෘථග්ජන සත්ත්වයා වනාහී සතර මහා භූතයන්ගේ විකාර ස්වභාවය, පෙනෙන, ඇසෙන, දැනෙන ආකාරයෙන් ම පිළිගැනීමට පුරුදුවී සිටින බැවින්, බොහෝ සෙයින්ම මුළා වීමෙන්, අයහපත යහපත වශයෙන් ද, යහපත අයහපත වශයෙන් ද ගෙන නොයෙක් දුක් හිරිහැර, කරදර ආදීන්ට භාජන වෙමින් සසර ඇවිදින්නේය. මෙසේ බොහෝ කලක් අඳුරෙහි ගමන් කරන්නාක් මෙන්, අරමුණු වරදවා ගන්නට පුරුදු වූ සත්වයා හට වැඩි වශයෙන් ඇති වන්නේ මුළාවූ සවභාවයකි. එබඳු මුළාවූ හැම අවස්ථාවන්හි සිත්වල යෙදෙන්නේ අනර්ථයම ගෙන දෙන්නාවූ පාප ගතිමය. ඒ පාප ගති හෙවත් අකුශල චෛතසිකයන් නිසා භයානක අපාදුකට ද පැමිණෙන්නේය. සසරින් මිදෙනු කැමැති නුවණැති

පුද්ගල තෙමේ මේ අනර්ථය සළසන්නාවූ පාප ගති හොඳින් දැන හැඳිනගෙන, එයින් වන විපාක හා මිදෙන මාර්ග ද අසා ඉගෙණ, නුවණත් වීය්‍ය්‍යත් දියුණු කර ගනිමින් පාපයන්ගෙන් වැළකීමට මහත් උත්සාහයක් දරන්නේය.

අකුසල් සිත් දෙළොසෙහි යෙදෙන්නා වූ මේ පාප ගති හෙවත් අකුසල චෛතසිකයෝ තුදුසෙකි. එනම්:– **මොහය**, **අහිරිකය අනොත්තප්පය**, **උද්ධච්චය**, **ලොභය**, **දිට්ඨිය**, **මානය**, **ද්‍වේෂය**, **ඉස්සාය**, **මච්ඡරිය**, **කුක්කුච්චය**, **ථිනය**, **මිද්ධය**, **විචිකිච්ඡාය** යන චෛතසික යෝ දහහතර දෙනාය. මෙයින් **මොහය**, **අහිරිකය අනොත්තප්පය**, **උද්ධච්චය** යන චෛතසික සතර සියළුම දෙළොස් අකුසල් සිත්හිම යෙදෙන හෙයින් අකුසල සාධාරණ චෛතසික නම් වෙති. ඉතිරි දසය, අවසථා පරිදි ඒ ඒ අකුසල් සිත්හි යෙදෙත්.

## මොහය (1)

**මොහය** වනාහී ආලම්බණ සවභාවය මුවහ කිරීම ලක්ෂණ කොට ඇත්තේය. ආරම්මණයාගේ ඇති සැටි දැනගත නො හැකි පරිද්දෙන්, සැබෑ ආකාරය ආවරණය කොට, ආරම්මණ සවභාවය වරදවා ගැණීම කරන්නා වූ ධර්මයට **මොහය** යයි කියනු ලැබේ. වැහිවලාකුලින් වැසීගත් අහස ඇති, අමාවක් පොහො දිනෙක, මධ්‍යම රාත්‍රියෙහි, වන ලැහැබෙක ඇතිවන අන්ධකාරය හේතුකොට ගෙන, ඒ වන ලැහැබෙහි ඇති ගස් කොළ ආදීන්ගේ නීලපීතාදී වර්ණයන් මුවහ කරවන්නාක් මෙන්, මේ මොහාන්ධකාරයෙන්, රූප ශබ්දදී සියළු ආරම්මණයන්ගේ සැබෑ තත්වය වසා, වැරැදි ආකාර යෙන්ම අරමුණු ගැනීම කරවන්නේය. යහපත අයහපත වශයෙන් ද, අයහපත යහපත වශයෙන්ද, අමිහිරි දෙය මිහිරි වශයෙන් ද, මිහිරි දෙය අමිහිරි වශයෙන් ද, දුක සැප වශයෙන් ද, සැප දුක වශයෙන් ද, අනිත්‍යය නිත්‍යය වශයෙන් ද, අනාත්මය ආත්මය වශයෙන් ද, අසුභය සුභ වශයෙන්ද, නොයෙක් දුකට පමුණුවන්නා වූ, අරමුණෙහි ඇලීම නම් වූ ආශාව, සැප ලබා ගැනීමේ හේතුවක් වශයෙන් ද, ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රියයන් පිණවීම භාග්‍යය ලභා කරවන ධර්ම යන් සැටියට ද ඉන්ද්‍රිය දමනය මහත් හිරිහැරයක් හැටියට ද, ප්‍රාණ වධාදියෙහි යෙදීම විනෝදයක් හැටියට ද, එයින් වැළකීම මෝඩ

කමක් හැටියට ද, සසර දුක සැප වශයෙන් ද එයින් මිදීමේ ප්‍රතිපදාව නපුරක් හැටියට ද, සත්‍යය අසත්‍යය වශයෙන් ද අසත්‍යය සත්‍යය වශයෙන් ද කෙටියෙන් කියතහොත් දුක්ඛයන්ගේ පැවැත්මට ස්ථාන වූ මේ පඤ්චස්කන්ධය නපුරක් හැටියට නොව, යහපත් වූද, මිහිරි වූද, ආලය කටයුතු වූද, අගනා වස්තුවක් සැටියට සිතනු ලබන්නේ මේ මොහන්ධකාරය නිසාමය. තවද මේ මොහය හේතුකොට ගෙන පූර්වභවය මුවහ කරවන්නේ ය. අනාගතය නො පෙනී යන්නේය, පූර්වාපරාන්තය නො දැනෙන්නේය. හේතුඵල ධර්මයන් නො වැටහෙන්නේය. ප්‍රඥාව මුවහ කරවන්නේය. කුසලය වළක්වන් නේය. අකුසලයෙහිම යොදවන්නේය. කුසල කර්මයාගේ ආනි ශංස නො වැටහෙන්නේය. අකුසල කර්මයාගේ ආදීනව නො දැනෙන්නේය. පාප ධර්මයන් හි හැකිලීමක්, පැකිලීමක් පසුබැස් මක් නො මැතිවම, පාපයෙහිම යොදවන්නේය. මෙලොවත් පර-ලොවත් මහත් වූ දුකට පමුණුවන්නේය. එබැවින් මේ මොහය, සියළු ම අකුසල්වලට මූලික හේතුවක් හෙවත් අකුසල මූලයක් යයි කියනු ලැබේ.

මොහය කරණකොටගෙණ නො ඇලියයුතු අරමුණෙහි ඇලීම නම් වූ ලොභය, ආශාව, තණ්හාව, ආලය යනාදිය ඇති වූ විට ලොභ, මූල සිත් අටෙන් එකක් උපදී. මොහයෙන් මුළාවූ පුද්ගලයාගේ, වැරිදි දෘෂ්ටි හෙවත්, මිථ්‍යාදෘෂ්ටිය ගැනීමේදී, ලොභ මූල දිට්ඨිගතසම්ප්‍ර යුක්ත සිත් සතරෙන් එකක් පහළවන්නේ ය. ලොකය සදාකාලික යයි ගන්නා ශාස්වතදෘෂ්ටිය ද, පරලොවක් නැතැයි ගන්නා උච්ඡෙද දෘෂ්ටියද, කුසලාකුසල කර්ම නැත, විපාක නැත, සියළුම සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තූන් මවන දෙවියෙක් හෝ බඹෙක් ඇත. මේ ලෝකය හැර අන්‍ය සත්ත්වලොක නැත. අපාය නැත, දෙව්ලොව නැත. බඹ ලොව නැත. අපට පෙනෙන, ඇසෙන, දැනෙන භවය මිස අන් භවයක් නැත, අපායත්, දෙව්ලොවත්, බඹලොවත් මේ මනුෂ්‍ය ලෝකයේ මය යනාදි වශයෙන් මිථ්‍යාදෘෂ්ටිය නොයෙක් ආකාර වේ. මේ සිත්වල මොහයත් සමග ලොභය සහ දිට්ඨිය ද ඇති වේ.

එමෙන්ම නො කිපිය යුතු අරමුණෙහි කිපීම නම්වූ පටිඝය, ක්‍රොධය, තරහව, වෛරය යනාදී වශයෙන් සිත් දූෂ්‍ය වීමද මේ

මොහය නිසාම ඇති වන්නේය. එහිදී මොහයත් සමග ද්වේෂමූලා යත් ඇතිවන හෙයින් දෙෂමූල දෙමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සිත් දෙකෙන් එකක් පහළ වන්නේය. කුසලයට මහත් බාධාවක් වූ මේ පටිඝය හේතුකොටගෙන අනන්ත අප්‍රමාණ අපාදුකට භාජන වන්නේය.

තවද මේ මොහය බලවත් වූ කල්හි අරමුණ නිශ්චය කර ගත නො හැකිවන ආකාරයක් ඇතිවීමෙන් මංමුළාවූ කෙනෙකු මෙන්ද, නොයෙක් සැක උපදවමින්, මහත් නොසන්සුන්කමක් දක්වමින් අනර්ථයම සිදුකර ගන්නේය. විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතත්, උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතත් ඇතිවන්නේ මේ බලවත් වූ මොහය හේතු කොට ගෙනමය.

සියළුම පාපධර්මයන්ට මූලික හේතුවක් වූ මේ මොහ චෛතසිකය, සැම් අකුසල් සිතකම යෙදෙමින්, ඒ සිත උපදනා කල්හී ඉපිද නිරුද්ධවන කල්හි නිරුද්ධ වෙමින්, එම අරමුණම ගෙන, ඒ සිත උපදින තැනම උපදිමින් සිතටම ඇතුළත්වන අකුසල සාධාරණ චෛතසිකයක් වූ නාම ධර්මයක් බව දත යුතුය. මොහයාගේ ඖදරික සවභාවයන් ඒ ඒ මාර්ගඥනයන් විසින් නසනු ලබන නමුත් සියුම් වූ අවිද්‍යාව අර්හත් මාර්ගඥනයෙන් නසන තෙක් චිත්තසන්තාන යෙහි අනුශය වශයෙන් පවතින බව දත යුතුය.

## අහිරිකය (2)

දෙවෙනි අකුසල සාධාරණ චෛතසිකය නම් අහිරිකයයි. කාය වාග් දුශ්චරිතාදියෙන් ලජ්ජා නොවීම ලක්ෂණ කොට ඇති මේ අහිරිකය අකුසල් සිත් දෙළොසෙහි ම යෙදෙන්නේ ය. මොහයෙන් මුළා වූ පුද්ගලයාහට, අරමුණ මුවහවීම හේතුකොට ගෙන, අරමුණෙහි සැබෑතත්වය තේරුම් ගත නොහැකිව, ලජ්ජාවක්, පිළිකුලක්, හැකිළීමක් නැතිවම, ඉෂ්ට අරමුණක් හමු වූ කල්හි එහි ඇලීම ද, අනිෂ්ට අරමුණක් හමුවූ විට කිපීම ද ඇති වන්නේ ය. මොහයෙන් මුළා නො වූයේ නම් ඉෂ්ටානිෂ්ට අරමුණු හමු වූ කල්හි එහි ඇලීමක් හෝ කිපීමක් හෝ නොවන්නේ ය. තමාට එයින් අවැඩක් සිදුවේ දෝ හෝයි සිතා වැරැදි සහිත කටයුත්තක් හෙවත් අකුසල් කිරීමට පිළිකුලක් ලැජ්ජාවක් ඇති වන්නේය.

ප්‍රකෘති චිත්තය හෙවත් භවාඞ්ග සිත ඉතා පිරිසිදුය. අහේතුක පටිසන්ධියක් ලැබූ පුද්ගලයෙකුට පවා භවාඞ්ග සිත වශයෙන් ලැබෙන්නේ උපෙක්ඛා සහගත සන්තීරණ සිතක් ය. එම සිතෙහි ලැබෙන්නේ අඤ්ඤසමාන චෛතසිකයන් දස දෙනෙක් පමණය. අකුසල චෛතසිකයන් කිසිවක් එහි නො ලැබෙන බැවින් ද, පාප ගති හා මිශ්‍ර නොවූ බැවින් ද ඒ සිත පවිත්‍රය. නුවණැති පුද්ගල තෙමේ මේ පවිත්‍ර වූ භවාඞ්ග චිත්තපරම්පරාව පාපගති වලින් කිලිටි කර ගැනීමට නො කැමැති වේ. එයට හාත්පසින්ම පිළිකුල් කරන්නේය. නුවණ නැති, මොහයෙන් මුළා වූ පුද්ගල තෙමේ, මේ බව නොදත් නිසා හෝ, සසර පුරුද්දක් වශයෙන් හෝ, මේ පිළිකුල් කරන ස්වභාව ය නැති හෙයින් අකුසල් කිරීමට ලජ්ජා නොවෙයි. සූකර, සුනඛ ආදී සත්වයෝ අසූචියෙහි ඇති දුර්ගන්ධය, සුවඳක් මෙන් වැටහී, පිළිකුලක් නැතිවම ගන්ධය ඉවසමින් ප්‍රීතියෙන් එය අනුභව කරන් නාහුය. එමෙන්ම පාපයට පිළිකුල් නො කරන තැනැත්තා ද හැකිලි මක්, පැකිලීමක් නැතිවම අකුසල් කරන්නේ ය. අහිරික යයි කියනු ලබන්නේ මොහයෙන් මුළා වූ සත්ත්වයාගේ, අකුසල් කිරීමේදී ඇති වන පිළිකුල් නො කිරීමේ ශක්තියටය. අහිරිකය නැතිව අකුසලයක් කළ නො හැකි වේ.

## අනොත්තප්පය (3)

කාය වාග් දුශ්චරිතාදීන්ට භය නොවීම හෙවත් තැති ගැන්මක් ඇති නොවීම ලක්ෂණ කොට ඇති මේ **අනොත්තප්ප** චෛතසිකය ද, අකුසල් සිත් දොළොසෙහිම යෙදෙන අකුසල සාධාරණ චෛතසික යෙකි. අරමුණු සභාවය වරදවා ගැනීමේදී පිළිකුල් නො කරණ **අහිරිකය** මෙන් මේ **අනොත්තප්පය** ද, අරමුණු සභාවය වරදවා ගැනීමේදී බියක් තැතිගැන්මක් ඇතිනොවන්නේ ය. වරද කිරීමේදී ඇතිවන අනිෂ්ට විපාකයන්, මොහයෙන් මුළාවූ තැනැත්තාට නො වැටහෙන්නේය. වරදෙහි ආදීනව නො දත් පුද්ගලයා භයක් චකිත යක් නැතිවම වරද කරන්නේය. පව් කළ තැනැත්තාට මෙලොවදී පමණක් නොව, පරලොවේදීත් සතර අපායන්හිදී ත්, විඳින්නට සිදුවන දුක් සමූහය ගැන සිතන විට බිය උපදවන්නේමය. මොහයෙන් වසා ගන්නා ලද චිත්ත සන්තානයට මේ බිය නො දැනෙන්නේ ය. සසර පුරුද්දක් වශයෙන්ම, නො දැනුවත්වම, පාපයට භය නොවනමේ

අනොත්තප්පය නම් සවභාවය, පෘථග්ජන සත්ත්වයාට ඇතිවේ. එයින් වැළකීමේ ශක්තියක් ඔහුට නැත්තේය. පළඟැටි තෙමේ පහන් සිළු ආලොකයට රැවටී, රූප තෘෂ්ණාවෙන් මුළා වී, ඒ පහන් වැටියේ හැප්පීමෙන් පිලිස්සී දිවිනසා ගන්නාක් මෙන්, අඥාන පුරුෂ තෙමේ ද, ප්‍රාණඝාත, අදත්තාදන, කාම මිථ්‍යාචාර, මුසාවාද ආදී කොට ඇති කායවාග් දුශ්චරිතයන් ඉතා සැපවත් යයි සළකා, එයට රැවටී, මේ අනොත්තප්පය හේතුකොටගෙන, දුශ්චරිත නමැති ගින්නෙන් දැවී නොයෙක් දුක් කරදර ආදීන්ට පැමිණෙන්නේ ය.

**අහිරිකය**, **අනොත්තප්පය** යන මේ චෛතසික දෙක, සත්ත්වයන් අකුසලයෙහි යොදවන මහාබල දෙකෙකි. මේ ශක්ති දෙක නැතිව අකුසල් කළ නොහැකි වේ.

## උද්ධච්චය (4)

සිතෙහි නොසන්සුන් බව හෙවත් සිත අරමුණෙහි චංචල කර වන සවභාවය **උද්ධච්චය** නමි. අරමුණු සවභාවය හැඳින ගැනීමට, සිතත් සම්ප්‍රයුක්ත ධර්මයනුත් නිශ්චලව පැවතිය යුතුය. චංචල වූ සිතකට හොඳ නරක තේරුම් ගැනීමට නො හැකි වේ. මොහයෙන් මුළා කරවන ලද විලි බිය නැති සිත, අරමුණු වරදවා ගන්නා කල්හි, නිශ්චලතාවය නැති කොට, චංචල සවභාවයක් ම ඇති කර වන මේ **උද්ධච්ච** චෛතසිකය, පුරුද්දක් වශයෙන් ම සිත නොමඟ යවන්නේය. අකුසල් කරනු ලබන්නේ මේ උද්ධච්චයාගේ උපකාරයෙනි. වාත වේගයෙන් ගස්, අතු කොළ ආදිය සොලවන්නාක් මෙන්, මේ උද්ධච්ච වේගයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් සෙළවමින් ඔවුන්ගේ කෘත්‍යයන් නිසිසේ කිරීමට බාධා පමුණු වන්නේය. ක්ලෙශයන් විසින් චිත්තසන්තානය දවන තවන කල්හි, සිතෙහි, සම්ප්‍රයුක්ත ධර්මයන්හිත් නොසන්සුන් භාවය වඩාත් ප්‍රකට වන්නේය. මොහය බලවත් වූ පමණට උද්ධච්චය ද බලවත් වන්නේ ය. මොහ මූල උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත පහළ වන්නේ මේ උද්ධච්චය බලවත්වූ කල්හිමය. උද්ධච්චය, දොළොස් අකුසල් සිත්හිම යෙදෙන බැවින් අකුසල සාධාරණ චෛතසිකයකි. උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතෙහි ලොභදෝෂාදි වඩා අනර්ථකරවන පාප ගති නැති හෙයින්, කර්ම පථ බවට නො පැමිණෙන්නේය. මේ අකුසල් සිත අර්හත් මාර්ග

ඥානයෙන්ම නැසිය යුතුවේ. අනාගාමී වූව ද උද්ධච්ච නම් වූ උද්ධම්භාගීය සංයෝජනය ප්‍රහීණ නො කළ බැවින් රූපාරූප භව යන්හි උත්පත්තිය ගෙණ දෙන්නේය. පසුතැවිල්ල ඇති කරවන **කුක්කුච්ච** චෛතසිකය හා සමඟ යෙදුන විට, කුසලයත්, සමාධියත්, වළක්වන **උද්ධච්ච කුක්කුච්ච නීවරණය** වශයෙන් පවතින බව ද සැළකියයුතු.

## ලොභය (5)

**ලොභ** චෛතසිකය, අරමුණෙහි ගිජුවශයෙන් ඇලීම ලක්ෂණ කොට ඇත්තේ ය. මේ ලොභය අකුසල මූලයක් වශයෙන් ලොභ මූල සිත් අටෙහි යෙදෙන්නේය. ඉෂ්ටාරම්මණයක් හමුවූ කල්හි, එහි ඇලීම, සසර පුරුද්දක් වශයෙන්ම පෘථග්ජන සත්ත්වයාට ඇති වන්නේය. අනිෂ්ට අරමුණක් වුවත්, චිත්ත විපල්ලාසාදීන්ගේ වශයෙන් ඉෂ්ට ලෙස ගැනීමේදී මේ ලොභයම ඇති වන්නේය. යම් භවයක පළමුව පටිසන්ධිය ලබන අවස්ථාවේදී පටිසන්ධි භවාඞ්ග සිත් ඉපිද නිරුද්ධ වූ කල්හි, එයට අනතුරුව අළුත් භවයකට ඇලුම් කරවන මේ ලොභමූල සිතක්ම ජවන් සිත් වශයෙන් පහළ වන්නේය. අර්හත් මාර්ගඥානයෙන් මොහය සමුච්ඡෙද වශයෙන් ප්‍රහීණ වනතුරු මේ ලොභය හෙවත් තණ්හාව අනුශය වශයෙන් පවතින්නේය.

අකුසල මූලයක් වූ මේ **ලොභය**, වඳුරු ලාටුවකට උපමා කොට තිබේ. මක්කටාලේප නම් වූ මේ වඳුරු ලාටුව, වඳුරන් ඇල්ලීම පිණිස, යම් තැනෙක ගා තැබූ කල්හි, එහි හැපෙන වඳුරා, එහිම ඇලී බේරී යන්නට නො හැකිව මහත් දුකට පැමිණෙන්නේය. එමෙන්ම ලොභය නම් වූ මේ තණ්හාව, අරමුණෙහි තදින් ඇලීම හේතුකොට ගෙණ, කාම මිථ්‍යාචාරාදී නොයෙක් අකුසල් සිදුකර දෙන්නේය. මේ ලොභය ඇති වන්නේ අරමුණක් ආශ්වාදනීය වශයෙන් ගන්නා කල්හිය. **තණ්හාව, ආශාව, ආලය, රාගය, ප්‍රෙමය, ආදරය, ගිජු බව ලොල්බව, ඕනෑකම** යනාදී වශයෙන් ලොභයාගේ නොයෙක් ආකාර ප්‍රකාශ වන්නේය. මමය, මාගේය, මාගේ මව්පියෝය, මාගේ අඹුදරුවෝය, මාගේ සහෝදර සහෝදරියෝය, මාගේ නෑදෑ මිතුරෝය, මාගේ ගේදෙර වතුපිටි කුඹුරුය, මාගේ වස්ත්‍රාභරණ යෝය, මාගේ සම්පත යනාදී වශයෙන් මමත්වයක් හෙවත් අරමු

ණෙහි ඇලෙන සවභාවය ද මේ ලොභ චෛතසිකයෙන් ම සිදුවන්නේය සැප සම්පත් සෙවීම, ලත් දෙය රැකීම, කාමයන්හි හැසිරීම, දෘෂ්ටිලෝභය ශාශ්වත උච්ඡෙද ආදි වශයෙන් මිථ්‍යාදෘෂ්ටි ගැනීම, නියත වශයෙන්ම ලොභමූල සිතකින් ඇති වන්නේ ය, අනියත වශයෙන් අදත්තාදනය මුසාවාදය, පිසුණාවාචය, සම්ඵප්පලාපය යන අකුසලයන් ද ලොභය නිසා සිදුවේ. ලොභය හෙවත් තණ්හාව, සියළුම දුක් ඉපදවීමෙහි හේතුවක් වන හෙයින් සමුදය සත්‍යය ද වන්නේ ය. සෝවාන් මාර්ග ඥනයෙන් දිට්ඨියත් සමඟ යෙදුන ලොභය සමුච්ඡෙද වශයෙන් නැසීමත්, දිට්ඨිය සමග නො යෙදුන ලොභය තුනී කිරීමත් ඇති වන්නේය. අර්හත් මාර්ගඥනයෙන් ඉතිරි අකුසලයන් සමඟ සියුම්ව පැවති ලොභය ද නසනු ලබන්නේ ය.

## දිට්ඨිය (6)

දිට්ඨිය යනු දැකීමට කියන නමෙකි. අකුසල චෛතසිකයක් වශයෙන් දිට්ඨිය යයි කියනු ලබන්නේ සම්‍යග්දෘෂ්ටිය, මිථ්‍යාදෘෂ්ටිය යන දෙවැදෑරුම් දෘෂ්ටීන් අතුරෙන් මිථ්‍යාදෘෂ්ටියටය. පෘථග්ජන සත්ත්වයා මොහයෙන් මුළා වූ බැවින්, දුටු පමණින්, ඇසූ පමණින්, විඳිනු පමණින් ඒ ඒ දෙය හමුවූ ආකාරයෙන් ම ගැනීමට සසර දී පුරුදු කළ බැවින්, වැඩි වශයෙන් වැරැදි ලෙසම දකින්නට ඔහු පුරුදුවී සිටී. යමක් පිළිබඳව නිවැරදි දැකීමක් ඇති වීමට, ප්‍රඥව ඇති විය යුතුයි. මොහයෙන් සත්‍යය හෙවත් සැබෑ තත්වය මුවහ කරනු ලබන බැවින් අසත්‍යය හෙවත් වැරැදි සවභාවයෙන් දැකීම වන්නේය. යුක්තිසහගතව හේතු ප්‍රත්‍යයන්ට අනුව ඇති සැටි නොගෙන, කරුණු වරදවා ගන්නා සවභාවය මිථ්‍යාදෘෂ්ටිය නම් වේ. කෙලෙස් සහිත පුද්ගලයාගේ ප්‍රධාන පැතීම සැප ලබා ගැනීමය. සැප විඳිනු පිණිස සැප ගෙන දෙන මාර්ගසොයා ඇවිදින පුද්ගලයාහට ප්‍රිය වස්තුවක් හෝ ප්‍රිය අරමුණක් හමු වූ කල්හි එහි ඇලීම සවභාවයකි. මොහය සමග යෙදුන ලොභය ඇති සිතට අරමුණෙහි පිණවීම මිස එහි ඇති සැටි කල්පනා කිරීමේ ශක්තියක් නැත. එබැවින් සැප විඳිමෙ අදහසින්, හමුවූ හැම ඉෂ්ට අරමුණක්ම, තදින් අල්වාගෙන, එහි විශ්වාසය තබා සැපය කැමැති වනු මිස, එහි වරද හෝ නිවැරද ඔහුට නොපෙනෙන්නේය. සතුන් මැරීම, අන් සතු වස්තු ගැනීම කාමයෙහි වරදවා හැසිරීම, බොරු කීම කේලාම් කීම යනාදිය තමාගේ

සැපතට හේතුවේ යයි ද, එවැනි දේ කිරීම නිවැරදි යයි සිතා වරදක්ම කොට මහත් දුකට පැමිණෙන්නෝ ය.

ප්‍රාණඝාතයෙහි දොස් නැත, අදත්තාදානයෙහි වරදක් නැත. කාම මිථ්‍යාචාරයෙහි අනිටු විපාක නැත, කුසලාකුසල කර්ම නැත, විපාක නැත, හේතුඵල නැත, පරලොව නැත, අතීතය නැත, අනාගතය නැත, සදාකාලික සවර්ගයක් ඇත, මැවුම්කාර දෙවියෙක් බඹෙක් ඇත.සෑම දෙයක්ම මනුෂ්‍යයාගේ ප්‍රයෝජනය පිණිස මවන ලද්දේය යනාදි වශයෙන් කරුණු වරදවා ගනු ලබන්නේ මේ මිථ්‍යාදෘෂ්ටිය හේතු කොට ගෙනමය. ශාශ්වත දෘෂ්ටිය, උච්ඡේද දෘෂ්ටිය යයි ප්‍රධාන මිථ්‍යාදෘෂ්ටි දෙකකි. කර්මපථ බවට පැමිණෙන මිථ්‍යාදෘෂ්ටි තුනෙක් වේ. දන්දීම. සිල් රැකීම, භාවනා කිරීම යනාදියෙහි ඵලයක් නැතැයි ගන්නා **නාස්තිකදෘෂ්ටිය** ද, මේ ලොකයෙහි සත්ත්ව යෝ අහේතුකව හටගන්නේයයි දැඩි වශයෙන් ගන්නා **අහේතුක දෘෂ්ටිය** ද, කුසලකර්මයෙහි ඉෂ්ට විපාක හෝ අකුසල කර්මයෙහි අනිෂ්ට විපාක හෝ නැතැයි දැඩි වශයෙන් ගන්නා **අකිරිය දෘෂ්ටිය** ද යන තුන නියත මිථ්‍යාදෘෂ්ටි වෙති. මේ දිට්ඨිය ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි මිස අන් සිතක නොයෙදෙන්නේය.

## මානය (7)

තමාගේ තත්වය වරදවා මැනීම ලක්ෂණ කොට ඇති මේ **මාන චෛතසිකය**, ලොභයාගේ යහළුවෙක් වශයෙන් පෙනී සිටින බැවින් ලොභමූල සිතකම යෙදෙන්නේය. මොහයෙන් මුළාවූ සත්ත්වයා හට තමාගේ තත්වය වූවද, නිවැරැදි ලෙස මැන ගැනීමට නොහැකි වන්නේ යම් යම් දේ ලබාගැනීමට තිබෙන ආශාව හෙවත් ලොභය නිසාමය.

**සෙය්‍යාමානය සදිසමානය හීනමානය** යයි මානය තෙවැදෑරුම් වේ. තමාගේ ශරීර ලක්ෂණය, ධන සම්පත්තිය, වයසින් හා ගුණ යෙන් වැඩි බවය, ජාති ගොත්‍රය, උතුම් බවය, කුසලකර්ම ඇති බවය යනාදිය සළකා, මම උතුමැයි ධවජයක් කොට, කොතක් කොට, උසස් කොට, ගන්නා සවභාවය **සෙය්‍යා මාන** නම් වේ. මෙයද

**ජාති මානය**, **ගුණ මානය**, **පුණ්‍ය මානය** කියා තුන්වැදෑරුම් වේ. මම උසස් ජාති ගොත්‍රයකින් පැවැත එන කෙනෙක්මියි සිතීම ජාති මානය වේ. මම ශීලසමාධි ගුණයන්ගෙන් යුක්ත යයි සිතා මානය කිරීම **ගුණ මානයයි.** මම කුසලකර්ම හේතුවෙන් ධන සම්පත්ති ලැබීමියි කියා මානය කිරීම **පුණ්‍ය මානය** වේ. උත්තම යයි සම්මත පුද්ගලයන් විසින් හීනයයි සම්මත පුද්ගලයන්ට මානය කිරීම **ප්‍රණීත මානය** හෙවත් **සෙයාා මානය** නම් වේ. උඩඟු බවය, ආඩම්බරය, අහංකාරය යනාදී වශයෙන් දක්වන්නේත් මේ සෙයාා මානයයි.

මම ද ඔහු ද කුල, සීලාදියෙන් සමාන යයි සිතා මානය කිරීම **සදිස මානය** වේ. අන්‍යයන්ටත් ඇත්තේ මට ඇති අවයවමය. අන්‍යයන් මෙන්ම මට ද සමානව සැප විඳීමට බලයක් ඇත. උසස්ය, පහත්ය, පොහොසත්ය, දුප්පත්ය යනාදි වශයෙන් වෙනස් කොට සැළකීම යුක්ති සහගත නොවේ. අප හැම දෙනාම සෑම කරුණකින්ම සමානය යනාදී වශයෙන් ගැනීම **සදිසමානයාගේ ලක්ෂණයෝයි.**

නිචයයි සම්මත අය විසින් උසස් අයට දක්වන මානය **හීන මානය** වේ. මෙය දක්වනු ලබන්නේ තම තත්වය පහත් කොට පෙන්වීමෙනි. අන්‍යයන්ට මෙන් මට ධනය නැත, උගත්කම් නැත, නැදෑමිතුරන් නැත. භාග්‍යය නැත. හීන වූ අපි උගත්කම් ලබාගන්නේ කෙසේද? දන් දෙන්නේ කෙසේද, සතුටු වන්නේ කෙසේද, උසස් වන්නේ කෙසේ ද යනා දී වශයෙන් තමාම ඉතා පහත් කොට සැළකීම මේ හීනමානයාගේ ලක්ෂණයෝයි. හීනමානය ඇති පුද්ගල තෙමේ දෙලොවින්ම පිරිහෙන්නේය.

මේ **මානය**, දිට්ඨිය හා සමානවම බලවත් හෙයින් එක සිතක මේ චෛතසික දෙක නො යෙදෙන්නේය. දිට්ඨිගත සම්ප්‍රයුක්ත **සිත් සතරෙහි දිට්ඨිය** නියත වශයෙන්ම යෙදෙන්නේය. **මානය, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි අනියත වශයෙන් යෙදෙන බව සැළකිය යුතුය.**

## (ද්වේෂය 8)

අප්‍රිය හෙවත් නො කැමැති අරමුණෙහි කිපීම ලක්ෂණ කොට ඇති මේ **ද්වේෂය** ද,සිත කිලිටි කරවන බලවත් අකුසල චෛතසික යකි. දණ්ඩෙන් පහර ලත් සර්පයෙකු මෙන් අප්‍රිය අමනාප අරමුණෙහි කිපෙන්නේ මේ ද්වේෂය ඇති හෙයිනි. තරහව, ක්‍රොධය වෛරය යනාදි වශයෙන් දක්වෙන්නේත් මේ ද්වේෂයාගේ නොයෙක් ආකාරයෝයි. සැඩ පරුෂ ගතියෙන් ද, රෞද්‍ර භාවයෙන් ද, සිත දූෂ්‍ය කිරීම මෙහි ප්‍රධාන ලක්ෂණය වේ. ගින්න දර දවන්නාක් මෙන් මේ ද්වේෂය ද, චිත්ත සන්තානය දවන ධර්මයකි. යකඩෙහි හට ගත් මලය යකඩය විනාශ කරන්නාක් මෙන්ද, අධ්‍යාත්මක චිත්ත සන්තානයෙහි හටගත්තා වූ **ද්වේෂය**, මේ ජාතියෙහිත් තමා විනාශ කොට, මරණින් මතු අපාය දුකට ද පමුණුවන්නේ ය.

අප්‍රිය අරමුණක් හමුවූ කල්හි එයට විරුද්ධව ඇතිවන සවභාවයට **කෝපය** යයි ද අප්‍රිය අරමුණ බලවත් වූ බව දැන එයින් ඈත්වීමට අදහස් කරවන ද්වේෂයට භය යයි ද අනිෂ්ට අරමුණු හමුවූ කල්හි ඇතිවන හැකිළෙන සවභාවයට **පිළිකුල** යයි ද කැමැති දෙය නො ලැබීම, අදහස ඉටු නොවීම ආදියෙහි දී ඇතිවන සිත් තැවිල්ලට **දොමනස්ස** යයි ද, **කණගාටුව** යයි ද, අදහස් පරිදි ඵල නොලැබෙන කල්හි ඇතිවන නොසතුටට **අනභිරතිය** යයි ද, බලාපොරොත්තුවූ පැහැදීම වෙනුවට නො සතුට ඇති වීමේ දී **අප්‍රසාදය** යයි ද, එසේම පලිගැනීමේ අදහසය, විනාශ කරනු කැමැත්තය, යනාදී නොයෙක් ආකාරයෙන් මේ ද්වේෂය පවතින බව දත යුතුය. දොළොස් අකුසල චිත්තයන් අතුරෙන් ද්වේෂ මූල පටිඝ සම්ප්‍රයුක්ත සිත් දෙකෙහි පමණක් මේ ද්වේෂ චෛතසිකය යෙදෙන්නේය. මේ ද්වේෂය මාර්ග සිත් තුනෙකින් නැසිය යුතු වේ. සෝවාන් සකෘදගාමී මාර්ග ඥානයන්ගෙන් එය තුනී කොට අනාගාමී මාර්ගඥානයෙන් සමුච්ඡෙද වශයෙන් නසනු ලැබේ.

## ඉස්සාව [9]

අනුන්ගේ සම්පත් යස ඉසුරු ආදිය නුරුස්නා බව හෙවත් නො ඉවසන සවභාවය ඊර්ෂ්‍යාව නම්. මොහයෙන් මුළා වූ පුද්ගල තෙමේ

පර සම්පතක් හෝ දියුණුවක් හෝ දැක, එය ඉවසා ගත නොහැකිව, නොසතුටට පත්ව, එහි විනාශය කැමැති වන්නේය. ද්වේෂයාගේ යහළුවෙක් වශයෙන් සැළකිය යුතු මේ **ඉස්සා** චෛතසිකය දෝෂ මූල සිත් දෙක්හිම ලැබෙන්නේය. ඊර්ෂ්‍යාව සිත් සතන් දවන ධර්ම යකි. බාහිර සන්තානයම අරමුණු කරමින් උපදනා මේ ඊර්ෂ්‍යාව අනුන්ගේ විපතෙහි හා දුකෙහි ද සතුටු ආකාරයක් හා අනුන්ගේ සැපතේහි හා දියුණුවෙහි ද නොසතුටු ආකාරයක් ද, දක්වන්නේය සැප විඳින්නන් දැක ඔවුන්ට නින්ද අපහාස කරති. පින් දහම් කරන, සිල් රකින, භාවනා කරන පින්වතුන් දැක ඔවුන්ගේ ඒ ගුණ මකා, එය කුහක කමක් වශයෙන් ද, ලාභ සත්කාර ලබා ගැනීමේ ප්‍රයෝගයක් වශයෙන් ද පෙන්වා, ඔවුන් ගේ නුගුණම පළකරන්නේය. පස් පවින් වැළකී ගුණ දම් වඩන පුද්ගලයන් වඩ්ක පුද්ගලයන් ලෙස දක්වන්නේය. සසර පුරුද්දක් වශයෙන්, පෘථග්ජන සත්වයා තුළ, මේ ස්වභාවය බොහෝ සෙයින් ඔවුන් නො දැනුවත්වම ඇති වේ

## මච්ඡරිය (10)

තමාගේ සම්පත් යස ඉසුරු සැඟවීම ලක්ෂණ කොට ඇති මේ **මච්ඡරිය** චෛතසිකය ද, ද්වේෂයාගේ බලවත් මිත්‍රයෙකු සේ දෙෂ මූල සිත් දෙක්හි පමණක් යෙදෙන අකුසල චෛතසිකයකි. තමා සතු යම් දෙයක් අන් කෙනෙකුට අයිතිවීම නො ඉවසන්නාවූ ද, තමා සතු දෙයකින් අන්කෙනෙකුට ප්‍රයෝජනයවීමනොඉවසන්නා වූද, තමාගේසම්පතට සමාන සම්පතක් අන් කෙනෙකුට ඇතිවීම නො ඉවසන්නා වූද, තමාගේ සම්පත් ආදිය අන්‍යයන් දැන ගැනීම පවා නො ඉවසන්නා වූද මසුරු කම යයි කියනු ලබන්නා වූද, චිත්ත සන්තානය කිලිටි කරන්නා වූද මේ නාම ධර්මය අධ්‍යාත්මයම අරමුණු කරන්නේය. ඊර්ෂ්‍යාව අධ්‍යාත්මය නොව බාහිර සන්තානයම අරමුණු කරන්නේය. මසුරු තැනැත්තා තමා සතු වස්තුව සැඟවීම පමණක් නොව, තමාට ප්‍රයෝජනය නොවන දෙයක් වුවත් අනුන්ට දීම වලක්වන්නේය. හැකිනම් අනුන්ගේ දීම පවා වළක්වන්නේය.

**ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය, ලාභ මච්ඡරිය, වර්ණ මච්ඡරිය ධම්ම මච්ඡරිය** යයි මසුරු කම් ඇති වීමට හේතු වන වස්තූන්ගේ වශයෙන් පස්වැදෑරුම් වේ.

## කුක්කුච්චය (11)

කළපව් හා නොකළ පින් පිළිබඳව පසුව සිත්හි ඇති වන්නා වූ තැවෙන සවභාවයට හෙවත් පසුතැවිල්ලට **කුක්කුච්චය** යයි කියනු ලැබේ. මේ **කුක්කුච්චය** අතීතයෙහි කළ නො කළ පව් පින්ම අර මුණු කරන්නේය. දහම් නො අසා, සත්පුරුෂයන් සේවනය නො කර, පව් පින් නො දන, යෞවන මදයෙන් මත්ව, නොයෙක් අකුසල් කළ තැනැත්තා, පසු කාලයක, වයස්ගතව, ධර්මය ගැන දැනීමක් ඇතිව, අකුසල විපාකාදිය පිළිබඳ විස්තර අසා, අහෝ තරුණ මදයෙන් මත් වූ මා විසින් මේ මේ අකුසලයන් කරන ලද්දේ ය. මට වූයේ මහත් වරදෙකි, ඒකාන්තයෙන්ම අපා දුක් විඳිමට සිදුවන්නේයයි සිතමින් චිත්ත සන්තානය නැවත නැවතත් කිලිටි කර ගන්නේය. එමෙන්ම, කුසල් කිරීමට හැම අවස්ථාවක්ම තරුණ වියෙහි දී ඇතිවූ නමුත්, පාප මිත්‍රයන් ඇසුරු කරමින් පින් නො කළ බැවින්, දැන් අත් පා දුර්වල වී, ජරාවෙන් පිඩිත වී, දුබලව සිටින මා කෙසේ පින්කම් කරන්නෙම් ද, අහෝ මට වූයේ මහත් අලාභයකි යනාදී වශයෙන් සිතමින් තැවෙන්නේය.

අතීතයෙහි කළ පව් ගැන සිතීම හෙවත් කළ පව් නැවත නැවත සිහි කිරීම **කුක්කුච්චය** නො වන බව සැළකිය යුතු යි. කළ පව් ගැන සිතමින්, තැවීම, කරණගාටුවීම, පශ්චාත්තාපය, පව් තුනී කරන යහපත් ගුණයක් හැටියට බොහෝ දෙනා සළකති. නමුත් කළ පව් ගැන සිතාපසුතැවිලි වීම, පව් තුනී කිරීම වෙනුවට නැවත නැවතත් සිත් දූෂ්‍ය කරවන බැවින්, කලින් ඇති වූ සුළු පාපය බර පතල කිරීමට උපකාර වන්නේය. අපායට යවන්නට තරම් ශක්ති යක් නැතිව තිබූ අකුසලය, මේ කුක්කුච්චය නිසා අපායට යැවිය හැකි අකුසලයක් වන්නේය. එසේම නො කළ පින් ගැන පසුව තැවීමෙන් පින් සිදුවන්නේ නැත. එයින් වන්නේ පින් කිරීමට උත්සාහවත් වූ සිත නැවත දුර්වල කොට සිත දූෂ්‍ය කිරීමකි.

ඇතැම්විට කලින් දන්දීම් සිල්රැකීම් ආදිය කොට පසු කලෙකදී මිථ්‍යා දෘෂ්ටි ගෙන, අහෝ මා විසින් කුසල්යයි සිතා මේ මේ දේ කෙළෙමි. ඒ සියල්ලම දන් නිස්ඵල ය. ඒ කාලයත් ධනයත් මාගේ මෙලෝ දියුණුවට යෙදුවානම් අද මම කොපමණ උසස්

කෙනෙක් ද, මා විසින් කර තිබෙන්නේ මහත් වරදෙකි යනාදී වශ යෙන්ද පසුතැවිල්ල ඇතිවන්නේය. මේ කුක්කුච්චය ද්වේෂමූල පටිස සිත් දෙක්හි පමණක් අනියත වශයෙන් යෙදෙන්නේය.

තවද මේ කුක්කුච්චය බලවත් වූ කල්හි, තමාගේ කල්පනාවෙන්ම කුසල් කිරීමට නො හැකි වන්නේය. නිතර සිත දූෂ්‍යව පවතින බැවින් තම උත්සාහයෙන් පමණක් එයින් මිදී සුචරිතයෙහි හැසිරීමට ශක්තිය නො ලැබෙන්නේය. බුදු පසේ බුදු මහරහතන් ආදී කල්‍යාණ මිත්‍රයන් හමු වූ කල්හි, උන්වහන්සේලාගේ අනුග්‍රහය ලැබීමෙන් පමණක් සුචරිතයෙහි හැසිරීමට හැකි වන්නේය.

මේ කුක්කුච්චය, උද්ධච්චය සමග යෙදී **උද්ධච්ච කුක්කුච්ච නීවරණය** වශයෙන් කුසල් සිත වළක්වන්නේය. මේ දෙදෙනා, කෘත්‍ය, ආකාර සහ ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ වශයෙන් සමානය. **උද්ධච්චය** නොසන්සුන් ආකාර ඇති හෙයින් නොයෙක් අරමුණුවල සිත හසුරුවන්නේය. **කුක්කුච්චය** ද පසුතැවිල්ල නිසා එක් අරමුණක සිත පවත්වාගත නොහැකිව මහත් නොසන්සුන් භාවයක්ම දක්වන්නේය. එබැවින් මේ දෙදෙනා කෘත්‍යවශයෙන් සමානය.

උද්ධච්චයා නොසන්සුන් සවභාවය ඇති හෙයින් ඉතා ලුහුඩු කල්පනා ඇත්තේ වේ. කුක්කුච්චය ද එසේම නොසන්සුන් ගති ඇති බැවින් ලුහුඩු කල්පනාව ඇත්තේ වේ. මෙසේ මේ දෙදෙනා ආකාර වශයෙන් ද සමානය.

උද්ධච්චය එකග්ගතාවට ප්‍රතිපක්ෂ වෙයි. කුක්කුච්ච චෛතසික ය ද එසේ ම එකග්ගතාවට ප්‍රතිපක්ෂය. මෙසේ මේ දෙදෙනා ප්‍රතිපක්ෂ ධර්ම වශයෙන් ද සමානය.

### ථීනය (12) සහ මිද්ධය (13)

සිතෙහි ගිලන් බව, දුබල බව, අප්‍රාණිකබව, මලානික බව හැකිලෙන ගතිය, හෙවත් උත්සාහවත් නොවන සවභාවයට ථීන යයි කියනු ලැබේ. චෛතසිකයන්ගේ ගිලන් බව, අලස බව, මැලි බව මිද්ධය නමි. මේ ථීනයත් මිද්ධයත් වෙන් කළ නොහැකි ධර්ම දෙකෙකි. සිතෙහි හැකිලීමක්ඇතිවන විට චෛතසිකයන්ගේද

හැකිලීම ඇති වන්නේය. මේ ථීන මිද්ධ දෙක එකතු වී නීවරණයක් වශයෙන් සමාධිය වළක්වා ලන්නේය. මේ ථීන මිද්ධ දෙදෙනාද කෘත්‍ය, ආකාර විපක්ෂ ධර්මයන්ගේ වශයෙන් සමාන බැවින් එක් කොට ගනු ලබන්නේය. කුරුළු පිහාටුවක් ගින්නට ලංකළ කල්හි හැකිළෙන්නාක් මෙන්, ථීනය, සිතෙහි හැකිලීම හෙවත් පසුබැසීම ඇතිකරන්නේය. මිද්ධය ද චෛතසිකයන්ගේ හැකිලීම ද ඇති කරන්නේය. මෙසේ මේ දෙදෙනා කෘත්‍ය වශයෙන් සමානය

ථීනය හේතුකොටගෙන සිත හැකිලෙන කල්හි ශරීරයෙහි හැකිලීම, අලස බව, බර බව ඇනුම් ඇරීම්, ඇතිවනේය. මිද්ධය කරණකොටගෙන සම්ප්‍රයුක්ත ධර්මයන් හැකිලෙන කල්හි ඒ සිතින් උපදවන චිත්තජරූපයන් පැතිර යාමෙන් ශරීරයාගේ හැකිලීම, අලස බව, බර බව, ඇතිවන්නේය. මෙසේ ආකාර වශයෙන් ද මේ දෙදෙනා සමානය.

ථීනය වීර්‍ය්‍යයාගේ සතුරු ධර්මයෙකි. මිද්ධය ද එසේම වීර්‍ය්‍ය යට විපක්ෂය. මෙසේ විපක්ෂ ධර්මයන්ගේ වශයෙන් ද දෙදෙන සමානය.

මේ ථීන මිද්ධ දෙදෙනා සසංඛාරික අකුසල් සිත් පසෙහිම අනියත වශයෙන් යෙදේ. මේ ථීන මිද්ධ චෛතසිකයෝ නැවත නැවත උපදනා කල්හි, ඒ සිතින් උපදවනු ලබන චිත්තජරූපයන්, ශරීරයේ සෑමතැනම පැතිරී යාමෙන්, නාමකාය සම්බන්ධ වූ වීර්‍ය්‍ය උපදවනු ලබන චෛතසිකය ද දුර්වල වී, රූප කය බරබවට, මත්බවට පත් වීමෙන් නිද්‍රාව හටගන්නේය. රූපමිද්ධයයි කියනු ලබන්නේ මේ නිද්‍රාවටය. චෛතසිකයන්ගේ මැළිබව වූ මිද්ධය නාමමිද්ධ යයි දත යුතුයි. නාම මිද්ධය අකුසලයකි. රූපමිද්ධය නම් වූ නිද්‍රාව හැමවිටෙකම නාම මිද්ධය නිසාම ඇති නොවන්නේය. ගමනාදි ඉරියව් පැවැත්වීමෙන් ද, ගිලන් වීමෙන්ද ඇතිවන ශරීර පීඩාව සංසිඳ වීමට ශරීරයට විවේකය උවමනා වේ. මේ විවේකය නොලැබුන හොත් ශරීරය නීරොගීව පවත්වා ගැනීම දුෂ්කර වේ.එබැවින් එවැනි අවස්ථාවන්හි ඇතිවන නිද්‍රාව සිතෙහි හෝ චෛතසිකයන්ගේ මැලි කම නිසාම ඇති නොවන්නේය. රහතන් වහන්සේලාට ද ශාරීරික විවේකය හෙවත් නිද්‍රාව උවමනාය. උන්වහන්සේලා සිහිනුවනින්

යුක්තවම නින්දට යති. වැඩෙක නොයෙදී හිස්ව සිටින අවස්ථාවන්හිදී එක් ඉරියව්වකින් කල්යවන පුද්ගලයාහට ඇතිවන නිදිමත හා පිබිදිකල්හි ඇතිවන අලස භාවයද, ථීනමිද්ධ යයි දත යුතුයි පමණ නොදන වැඩි ආහාර ගැනීම, අපථ්‍ය ආහාර ගැනීම, හා ස්වල්පවූ ආහාර ගන්නා කල්හිදී ථීනමිද්ධය ඇතිවියහැකිය. නොකැමැත් තෙන් යමක් අසමින් බලමින් සිටිනවිටද ඕනෑකමින් යමක් නො කරන විටද, නිදිමතවන්නේ මේ ථීනමිද්ධය නිසාමය. කුසල් සිත්හි කාය චිත්ත ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා, පාගුඤ්ඤතා ආදි ප්‍රතිපක්ෂ ධර්මයන් ඇතිවන හෙයින් ථීනමිද්ධය ඉපදීමට අවකාශ නැත. විතර්ක චෛතසිකය බලවත් වූ කල්හි, ථීන මිද්ධනීවරණය යටපත් කොට, සමාධිය ලැබීමට උපකාර වන්නේය.

## විචිකිච්ඡාව (14)

රූපාදි අරමුණු නිශ්චය කොට නොගත හැකිබව හෙවත් අරමුණු පිළිබඳව ඇතිවන සැකය අවිශ්වාසය **විචිකිච්ඡා** නම් වේ. කුසලයත් ඤාණයත් සමාධියත් ආවරණය කරන හෙයින් විචිකිච්ඡාව නීවරණ ධර්මයකි. මොහමූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි පමණක් යෙදෙන මේ චෛතසිකය මිථ්‍යාදෘෂ්ටිය හා සමාන වූ බලවත් අකුසලයකි. විචිකිච්ඡා බහුල පුද්ගල තෙමේ අකුසල් නොවන්නාවූ ක්‍රියාවෙහි අකුසල්යයි සිතා භයවෙයි. කුසල් නොවන්නා වූ ක්‍රියාවෙහි කුසල් යයි. වරදවා පිළිපදිති. එබැවින් මෙය මහා සාවද්‍ය අකුසල සංඛ්‍යා වට ගැණෙන්නේය. විචිකිච්ඡාව සමුච්ඡෙද වශයෙන් ප්‍රහීන නො කොට ආර්‍ය මාර්ගයට පැමිණිය නො හැකි වේ. දෙමං සන්ධියකට පළමුවර පැමිණි පුද්ගලයෙක් යා යුතු මාර්ගය කුමක් දැයි නිශ්චය කොට ගත නො හැකිව වෙහෙසට පැමිණෙන්නාක් මෙන් මේ විචිකිච්ඡාවද අරමුණු නිශ්චය කොට ගත නොහැකිව. චිත්ත සන්තාන නය වෙහෙසන්නේ ය. නීවරණ නොවූ විචිකිච්ඡාවක්ද ඇත්තේය නොදන්නා යම් කරුණක් ගැන නිශ්චය කොට ගත නො හැකිව ඇතිවන්නාවූ සැකයයි. එය සිත්රාශියකින් සිදු වන්නක් බැවින් අකුසලයක් නොවන්නටද පිළිවන. අකුසලය වන්නේ නීවරණ විචිකිච්ඡාව බව දතයුතුයි. බුද්ධාදි අට තැන සැකයට ද විචිකිච්ඡා යයි කියනු ලැබේ. මොහ මූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි විස්තර දක්වූ පරිදි මෙය දත යුතුයි. නුවණින් යුක්තව කල්පනා කිරීම

අරමුණ මනාකොට පරික්ෂාකිරීම නම් වූ විචාර චෛතසිකය දියුණු වූ කල්හි සැකය ද දුරුවන්නේය. මොහය බලවත් වූ සිතකම මේ විචිකිච්ඡාව යෙදෙන බව දතයුතුයි.

# සොභන චෛතසික

කුසල් සිත්හි යෙදෙන්නාවූ ද, යහපත්වූ ද, මනාගති හෙවත් සොභන චෛතසිකයෝ විසිපස් දෙනෙකි. ඔවුන් යෙදෙන සිත් දැක්වීමේ පහසුව සඳහා මේ සොභන චෛතසිකයෝ සතර කොටසකට බෙද දක්වනු ලැබේ. මෙයින් දහනවයක් (19) සියළුම සොභන සිත්හි නො අඩුවම යෙදෙන බැවින් **සොභන සාධාරණ චෛතසිකයෝ** යයි ද, තුන් දෙනෙක් **විරති චෛතසිකයෝ** යයි ද, දෙදෙනෙක් **අප්‍රමාණ්‍යයෝ** යයි ද, එක් චෛතසිකයක් **පඤ්ඤින්ද්‍රිය** යයි ද ව්‍යවහාර කරනු ලැබේ.

අසූනවයක් සිත් අතුරෙන් අකුසල් සිත් දෙළොස සහ අහේතුක සිත් අටළොස යන අහොභන සිත් තිහ හැර ඉතිරි සොභන සිත් පනස් නවයෙහි මේ සොභන චෛතසිකයෝ යෙදෙන්නාහුය. දන සීල භාවනා ආදී මහා කාමාවචර කුසල් කරන කල්හි ද, රූපාවචර අරූපාවචර ධ්‍යාන උපදවන කල්හි ද, මාර්ග ඵලයන්ට පැමිණිමේ දී ද මේ සොභන සාධාරණ චෛතසිකයෝ ද හනව දෙන නියත වශයෙන් ද, ඉතිරි චෛතසිකයෝ සදෙන ඒ ඒ සිත්හි ද පහළවන්නාහුය. එමෙන්ම, මහා කුසල් සිත්හි ද, කුසල විපාක සිත්හිද මහා ක්‍රියා සිත්හි ද මේ සොභන චෛතසිකයෝම යෙදෙන්නාහ. මේ සොභන චෛතසිකයෝ උපදනා කල්හි අකුසල චෛතසිකයන්ගේ පහළවීමක් නොවන්නේය. ක්ලේශයන් නැසීමට උපකාර වන්නේ ත් මේ සොභන චෛතසිකයෝමය.

### සොභන සාධාරණ චෛතසිකයෝ

**සද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලොභ, අදෙස, තත්‍රමජ්ඣත්තතා, කාය පස්සද්ධි, චිත්ත පස්සද්ධි, කායලහුතා, චිත්ත ලහුතා කාය මුදුතා, චිත්ත මුදුතා, කාය කම්මඤ්ඤතා, චිත්ත කම්මඤ්ඤතා**

**කාය පාගුඤ්ඤතා, චිත්ත පාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා** යන එකුන්විසි (19) චෛතසිකයෝ **සොහන සාධාරණ චෛතසික** නම්.

**කාමාවචර කුසල, විපාක ක්‍රියා සිත්** විසිහතර ද, **මහග්ගත සිත්** විසිහතද, **ලොකොත්තර සිත්** අට ද යන සොහන සිත් පනස් නව යෙහි ම **මෙ සොභන සාධාරණ චෛතසික** දහනවය නො අඩුවම එකවර ලැබෙන්නාහුය.

### සද්ධාව (1)

**ශ්‍රද්ධා චෛතසික** තෙමේ බුද්ධාදි ඉෂ්ටාලම්බණයෙහි තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් පැහැදවීම ලක්ෂණ කොට ඇත්තේය. බුද්ධ ධම්ම සඞ්ඝ යන රත්නත්‍රය, අතිඉෂ්ටවූ ද අති උත්තමවූද වස්තු බැවින් ඇදහිය යුතු වස්තුහු නම් වේ. මේ ශ්‍රද්ධාව, අප්‍රමාණ ගුණයන්ගෙන් යුක්ත වූ තුණුරුවන් කෙරෙහි විශ්වාසය ඇතිකොට, ඒ ගුණයන් සිහි කරවන්නාවූ චිත්තසන්තානයෙහි රාග, ද්වේෂ මොහාදී ක්ලෙෂයන්ගේ පහළවීමට අවකාශ නොදී, පිරිසිදුකොට, සිතෙහිත් සම්ප්‍රයුක්ත ධර්ම යන්ගේත් පැහැදීම හෙවත් ප්‍රසන්න භාවය ඇති කරවන්නේය. මඩ බොර හේතු කොටගෙන කැලැත්වූ ජලයෙහි, සක්විති රජුගේ මාණික්‍ය රත්නය දමාලූ කල්හි, මඩ බොර යටපත් වී ජලය ප්‍රසන්න භාවයට පත්වන්නාක් මෙන්, කෙලෙස් සහිත වූ චිත්ත සන්තාන යෙක්හි, ශ්‍රද්ධා නමැති ගුණය උපදවාගත් කල්හි කෙලෙස් යටපත් කොට සසම්ප්‍රයුක්ත වූ සිත ප්‍රසන්න භාවයට පත්වන්නේය. ප්‍රසන්න වූ ජලය කැඩපතක් මෙන් අවට පවත්නා වස්තූන්ගේ ඡායාව වැද ගන්නාක්මෙන්, ශ්‍රද්ධාවෙන් ප්‍රසන්න කරනලද හෙවත් ඔපදමන ලද සම්ප්‍රයුක්ත ධර්මයෝ බුද්ධාදී තුණුරුවන් ගුණ නම් වූ අති ඉෂ්ට අරමුණු වැදගැනීම හෙවත් පිළිගැනීම ඇති කරවති. තුණු රුවන් ගුණ විශ්වාස කිරීමත්, ඇදහීමත් ඇතිවන්නේ මේ පැහැදීම ඇති කල්හිමය. මෙසේ ප්‍රසන්න භාවයට පත්වූ චිත්ත සන්තාන යෙහි කෙලෙස්හට නොගන්නා බැවින් සොභන චෛතසිකයන්ගෙන්ම යුක්ත වූ කුසල් සිතක්ම වන්නේය. කුසලය වලක්වන නීවරණාදී පාප ධර්මයන් හට නොගන්නා බැවින් දන්දීම්, සිල් රැකීම්, භාවනා කිරීම් ආදී පින්කම් කළ හැකිවේ. ගංගාවකින් හෝ සැඩ පහර

කින් එතරවීම පිණිස රැස්ව සිටින පිරිසක් එතර කිරීම සඳහා ඔවුන් පෙරදැරි කොට ඉදිරියෙන් ගමන් කරන්නා වූ වීර පුරුෂයෙකුමෙන්, මේ ශ්‍රද්ධා චෛතසිකය ද කුසල් කිරීමේදී හැමටම පළමුව ඉදිරිපත් වී, අනිකුදු සම්ප්‍රයුක්ත ධර්මයන් තමාට අනුකූලකොට අධිපති භාවය දක්වන බැවින්, මෙයටම **ශ්‍රද්ධා ඉන්ද්‍රිය** යයි කියනු ලැබේ. මනා කොට පිහිටුවා ගන්නා ලද ශ්‍රද්ධාව, ප්‍රතිපක්ෂ ධර්මයන් විසින් නොසෙලවිය හැකි භාවයට පත් වූ කල්හි, එයට **ශ්‍රද්ධා බලය** යයි කියති. යහපත් වස්තූන් පිළිගැණීමට අත දිගු කරන්නාක් මෙන්, පින්කම්හි යෙදෙනවිට කුසලය පිළිගන්නා වූ හස්තයක් මෙන් මේ ශ්‍රද්ධාව ඉදිරිපත් වන්නේය. තවද ඉෂ්ට වූ කම්සැප ලබා ගැනීමට ධනය උපකාරවන්නාක් මෙන්, ලෞකික ලොකෝත්තර සියළු සම්පත් ලබාගැනීමට මේ ශ්‍රද්ධා නමැති ආර්‍ය ධනය උපකාර වන් නේය. එබැවින් එයට **ශ්‍රද්ධා ධනය** යයි ද කියති. එමෙන් ම, සරු කෙතක රොපනය කරන ලද සරු බීජය,සරු ඵල ලබාදෙන්නාක් මෙන්, තුණුරුවන් ගුණ විෂයෙහි මනාකොට පිහිටුවා ගන්නා ලද චිත්ත සන්තානය, නිවණ් සැප වැනි උතුම් ඵල ලබා දෙන බීජයක් වන හෙයින් එයට **ශ්‍රද්ධා බීජයයි** ද කියනු ලැබේ.

තුණුරුවන් ගුණ මිස කෙලෙස් සහිත පුද්ගලයන් කෙරෙහි ඇති වන යම් පැහැදීමක් වේ ද, එයට ශ්‍රද්ධාවයයි නොකිය යුතුයි එය ශ්‍රද්ධා මුහුණුවරින් පවතින **මිථ්‍යාධි මොක්ඛය** බව දතයුතුයි. පෘථග් ජන පුද්ගල තෙමේ බුදු ගුණ, දහම් ගුණ සහ සඟ ගුණ නොදත් බැවින් නොපැහැදිය යුතු තැන පහදින්නේය. කුසලයක්යයි සිතා ඉතා උත්සාහයෙන් ම අකුසලයක්ම කරන්නේය. ඵල ,ලැබෙන පිළි වෙතැයි සිතා නිශ්ඵල වැඩෙහි යෙදෙන්නේය. ගිලන් උපස්ථානය, රොගීන්ට සත්කාරය, යනාදිය පිණිස ඇතැම් විට සත්ත්ව ඝාතනයද කරන්නේය. අකැප වස්තු කැප වශයෙන් සළකා පිළිගන්වති. කරුණා, මෛත්‍රිය යයි සිතා නොයෙක් පුද්ගලයන් කෙරෙහි වරදවා හැසිරෙන්නේය. මේ ආදී වශයෙන්, මොහයෙන් මුළාවී, නොකට යුතු දෙය කටයුත්තකැයි වරදවාගෙන, ශ්‍රද්ධා ස්වරූපයෙන් අකුසල් කොට අනර්ථයම සිදුකර ගනිති. සමහර කෙනෙක් එයට මොඩ ශ්‍රද්ධාවයයි කියති. නමුත් එය නොකිය යුත්තකි. මොඩකම;

මොහය නම්වූ අකුසලයකි. ශ්‍රද්ධාව පිරිසිදු කුසලයකි. කුසල් සිතක අකුසල චෛතසික නොයෙදේ. මෙයට **මුග්ධ ප්‍රසාදය** යයි කීමෙහි වරදෙක් නැත. මෙයද **මිථ්‍යාධිමොක්ඛය** වේ.

### සතිය (2)

ස්වභාවයෙන්ම අකුසල පක්ෂය කරා ගමන් කරන චිත්ත සන්තතිය එයින් වළක්වා, කුසල පක්ෂය මතක්කරවන, සිහිකරවන ශක්තිය **සතිය** නමි. ගංගා ජලයෙහි දමනලද භාජනය ජල වේගයෙන් එහා මෙහා පෙරළවමින් පහලටම ගසාගෙන යන්නාක් මෙන්, පෘථග්ජන චිත්ත සන්තතිය ද, ප්‍රිය අරමුණු හමුවූ කල්හි එහි ඇලීමෙන්ද අප්‍රිය අරමුණු හා ගැටීමෙන්ද, අකුසලටම බරවී පවත්නේය. මෙසේ පවත්නා සිත් පරම්පරාව කුසල පක්ෂයට හරවාගෙන කුසල ක්‍රියාවන් කිරීමට විශෙෂ ශක්තියක් ඇතිවිය යුතුයි. සිහිය හෙවත් සතිය යයි කියනුයේ මේ ශක්තියටය. මේ සතිය නැති කල්හි කුසල් කළ නොහැකිවේ. එබැවින් සති චෛතසිකය සියළුමසොභන සිත්හි යෙදෙන බැවින් සොභන,සාධාරණ චෛතසිකයෙකි. පෙර ඇසූ, දුටු, කළ, කී දෙයක් හෝ ඉදිරියෙහි කිරීමට අදහස් කරන කටයුත්තක් හෝ මතක් කරණ විට ද සිහිය යයි කීමට බොහෝ දෙනා පුරුදුවී සිටී. නමුත් මේ මතක් කිරීම සති චෛතසිකය නොව, සිත් රාශියකින් සිදුවන එක්තරා ක්‍රියාවකි.

තමා සතු වස්තුව අනුන්ට නොදී රැක බලාගැනීම පෘථග්ජන ගතියකි. දන්දී, නුපුරුදු කෙනෙකුට තමා සතු වස්තුවෙන් ස්වල්පයක්වත් ලොභය හැර අනුන්ට දීම ඉතා දුෂ්කර වැඩෙකි. ලෝභය වළක්වා අලොභ චෙතනාව ඇති කොට දනමය කුසල කර්මය සිදු කිරීමට මේ සති චෛතසිකය ඇති විය යුතු. කම්සැපෙහි ඇලී ගැලී සිටින පුද්ගලයාහට සිල් රැකීම මහත් හිරිහැරයක් මෙන් වැටහෙන්නේය. සතිය ඇති කල්හි කාමයන්හි ආදීනව සිහි කොට එයින් වළක්වා කායවාග් සංවරයෙහි පිහිටුවන්නේ ය. අනේකාරම්මණයන්හි විසිර පවත්නා නොසන්සුන් සිත යහපත් වැඩෙහි යෙදීම අති දුෂ්කරය. කුසල් කිරීමට සිත්හි තැන්පත් බව ඇති විය යුතුයි. සති චෛතසිකයෙන් ඒ බව සිහි කරවා භාවනාදියෙහි යොදවා නුවණ වැඩීමට වුවමනා චිත්තෙකග්ගතාවය හෙවත් සමාධිය

උපදවා ගැනීමට උපකාරවන්නෝය. මෙලෙසින් සියළුම කුසල යන්ගේ ඇති වීමට සතිය අවශ්‍ය බව සැළකිය යුතුයි.

තවද මේ සති චෛතසිකය රත්නත්‍රයෙහි ගුණ පමණක් නොව නාමරූපධර්මයන්ගේ අනිත්‍යාදී සවභාවය සිහිකරවීම ලක්ෂණ කොට ඇත්තේය. ගලෙහි කෙටූ අකුරක්මෙන් නොනැසී බොහෝ කලක් පවත්නා බැවින් ශිලාලෙඛනස්ථම්භයකට ද උපමා වේ. කුඩා කල පටන් ස්ථිර වශයෙන් ඉගෙණගත් ශිල්පශාස්ත්‍රාදීහු මුළා නොවී සිත්හි පවත්වා ගැනීමට සති චෛතසිකය උපකාර වේ. පඤ්ච මධ්‍යාන වඩා අභිඥා උපදවාගත් පුද්ගලයා මේ චෛතසිකය වඩා අතීත ජාතියෙහි අරමුණු පවා සිහිකරන්නේය. දොරටුසයක් ඇති ගෙයක් රක්නා දොරටුපාලක තෙමේ දොරටු සයෙන් එන සොර සතුරන් වළක්වා ගෘහය ආරක්ෂා කරන්නාක්මෙන් සති චෛතසිකයද, චක්ඛුසොතාදීවූ සදොරින් පාපධර්මයන්ට ඇතුල් විය නොදී රක්නේය. එමෙන්ම ඉන්ද්‍රඛීලයක් මෙන් සතිචෛතසිකය අරමුණෙහි දැඩිව පිහිටා සිටින්නේය. කායානුපස්සනා, වෙදනානුපස්සනා, චිත්තානු පස්සනා, ධර්මානුපස්සනා යන සතර සතිපට්ඨාන භාවනා කරන පුද්ගලයාගේ චිත්තසන්තානය මනාකොට භාවනා අරමුණෙහි පිහිටුවා ත්‍රිලක්ෂණ මෙනෙහිකොට, විදර්ශනා වැඩීමට උපකාරවන් නේත් තියුණු වූ මේ සති චෛතසිකයමය. අනිකුත් සමප්‍රයුක්ත ධර්මයන්ට පෙරටුව ගමන්කොට නිවන් මග හෙළි කරන්නාවූ කල්හි අධිපති භාවයෙන් ප්‍රකටව පවත්නා මේ සතියට **සතින්ද්‍රිය** යයි කියති. ප්‍රතිපක්ෂ ධර්මයන් විසින් ,මැඩලිය නොහැකි ලෙස ස්ථිරව පිහිටුවාගත් සතියට **සතිබලය යයි** ද චතුස්සත්‍යාවබොධය පිණිස හෙවත් සතර මාර්ගඥානය උපදවන අඞ්ගයක් වශයෙන් යෙදුන කල්හි **සතිසම්බොජ්ඣඞ්ගය** යයි ද, ලොකොත්තර සිත්හි මාර්ගාඞ්ග යක් වශයෙන් යෙදෙන කල්හි **සම්මාසති මාර්ගාඞ්ගය** යයි ද කියනු ලැබේ.

## හිරිය (3)

පාපයට පිළිකුල් කරවන,හැකිලෙන, ලජ්ජාවන සවභාවය **හිරි** නම්වේ. පාපය පිළිකුල් කටයුතු වරදෙක් බව නො සිතා අකුසල් කරණ කල්හී අහිරිකය යෙදෙන බව දක්වන ලදී. මේ අහිරිකය මැඩපවත්වා

නැවත නැවත නැගී එන්නට නොදී වළක්වාලීම් වශයෙන් මේ හිරි චෛතසිකය සියලුම **සොභන සිත්හි** යෙදෙන්නේය. හිරිය නැති කල්හි කුසල් කළ නොහැකි වේ.

අධ්‍යාත්මය අරමුණු කොට **ලජ්ජාවීම් වශයෙන්** පාපයෙන් වළකින කල්හි, **හිරි චෛතසිකය** ආත්මගෞරවය රකින්නේය. අසූචියෙන් වැකුණු සිහිල්වූ යකඩයක් ඇල්ලීම පිළිකුල් කරන්නාක් මෙන්, හිරි චෛතසිකයද පාපයට පිළිකුල් කරන්නේය. එ මෙන්ම හිරිය ඇති පුද්ගලයා තමාගේ උසස් කුලගෝත්‍රාදිය සළකා සත්ත්වඝාතනය, අදත්තාදනය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, සුරාපානය, ආදී පව් කම් කිරීම, නිචයයි සම්මත පුද්ගලයන්ගේ නිහීන ක්‍රියාවකැයි සළකා පාපයෙන් වළකින්නේය. එමෙන්ම සමහර පුද්ගලයෝ තමන්ගේ සූරවීර භාවයද, බහුශ්‍රැත භාවය හෙවත් මාගේ දෙමව්පියන් විසින් මේ මේ ශිල්පශාස්ත්‍රයන් උගන්වා මා උගතෙකු කළ බැවින්, උගත් මා විසින් නූගත් අඥනයන් කරන පහත් ක්‍රියා නොකළ යුතු යයි ද සිතා පාපයට පිළිකුල් කරන්නේය. මෙසේ ගෝත්‍රය, වයසය, සූරභාවය, බහුශ්‍රැතභාවය, යනාදී කරුණු සළකමින් පාපයෙන් වැළකී කුසල් කිරීමට මේ හිරි චෛතසිකය සියළු සොභන සිත්හි යෙදෙන්නේය.

## ඔත්තප්පය. (4)

කායවාග් දුශ්චරිතාදියට භයවීම හෙවත් තැතිගැනීම **ඔත්තප්පය** නම් වේ. ප්‍රාණඝාතාදි වූ කායදුශ්චරිතයන්හිද, මුසාවාදදී වාග් දුශ්චරිතයන්හිද හැසිරෙන පුද්ගලයාහට, මෙලොවදීම අනුන්ගෙන් ඇතිවන හිරිහැර, කරදර, පීඩා වධ බන්ධන, දඬුවම් ආදියද, මරණින් මතු පැමිණෙන සතර අපා දුක්ඛයද සිහිකරන්නාවූ නුවණ ඇති තැනැත්තාහට මහත් භයක් හෙවත් තැතිගැන්මක් හටගන්නේය. මොහය හේතුකොටගෙන පාපයට භය නොවන්නාවූ ද මෙලොව පරලොව දෙක්හිම විඳින්නට සිදුවන දුක නොවැටහෙන්නාවූද අඥන පුද්ගලයා අකුසල් කොට මහත් දුකට පැමිණෙන්නේය. කායවාග් දුශ්චරිතාදින්ට භය උපදවා කුසලයෙහි යෙදීමට උපකාරවන ධර්මයක් වූ මේ **ඔත්තප්ප චෛතසිකය** බාහිරය අපෙක්ෂාකොට ලොක

ගෞරවය රැකගැනීම පිණිස පාපයෙන් වැළකීම සිදුවන්නේය. අත පිළිස්සේ යැයි භයින් ගිනිගෙන දිලිසෙන යකඩයක් අත නො ගාන්නාක් මෙන් මේ ඔත්තප්පයද වධයට භයින් පව් නොකරයි.

ඇතැම් පුද්ගලයෝ කායවාග් දුශ්චරිතාදීන්හි යෙදීමට අවස්ථා පැමිණිකල්හි ලොකයෙහි **ශිෂ්ටසම්පන්න** වූද, සිල්වත් වූද අය විසින් මට නින්ද කරනු ලබන්නේයයි සිතා පාපයන්ගෙන් වැළකෙති. සමහර කෙනෙක් මේ දෙශය රත්නත්‍රයට ගරුකරන්නා වූද, ප්‍රාණ ඝාතාදී අකුසල් නොකරන්නාවූද, සත්පුරුෂයන් වාසය කරන ප්‍රදේශ යක් බැවින් මෙහි දී වරදක් කිරීම මා වැනි කෙනෙකුට නොහොබනේ යැයි සළකා පාපයෙන් වළකියි. ශාස්ත්‍ර උගත් පණ්ඩිත ජනයා වසන තැන්හිදී වරද කිරීමෙන් ඔවුන්ගේ නින්දවට භාජන විය හැකි බැවින් **ප්‍රඥවන්තයන්ට** භයින් ද අකුසලයෙන් වළකින්නේය.එමෙන්ම උසස් ගුණදම් පුරණ පුද්ගලයන් විසින්ද තමාගේ ගුණයට කැලලක් වේය යන භයින් පවෙන් වළකියි. මේ ආදී නොයෙක් කාරණා, අකුශලයන්ගෙන් වෙන්වී කුශලයෙහි යෙදීමට උපකාර වේ.

මේ හිරි ඔතප් ධර්ම දෙක රකින පුද්ගලයෝ ශිෂ්ට සම්පන්න පුද්ගලයන් ලෙස ලෝකයා විසින් ද පිළිගනු ලැබේ. දණ්ඩනීති ආදිය පැණවීමට වඩා මේ හිරි ඔතප් දෙක රැකීමෙන් ලොකය මනා කොට පාලනය වන බැවින් මෙයට **ලොකපාලක ධර්මය** යයි ද කියති. උසස් සත්ත්වයන් ගේ ධර්ම දෙකක් බැවින් **දේවධර්මය** යයි ද මෙයටම නමෙකි. නිවන් සැප ලැබීමට උපකාර වන **ආයඁධනයක්** ද වන්නේය.

## අලොභය (5)

**අලොභය** අරමුණෙහි නො ඇලීම ලක්ෂණ කොට ඇත්තේය. අරමුණෙහි ඇලීම නම් වූ ලොභයට ප්‍රතිපක්ෂවූද, ලොභයට අවකාශ නොදී එය මැඩපවත්වන්නාවූද ශක්තිය අලොභය නම් වේ. පියුම් පතෙහි දිය නො ඇලෙන්නාක් මෙන්, අලොභයද නො ඇලී අරමුණ ගන්නේය. ලොභයාගේ අභාවය හෙවත් ලොභය නැතිබව අලොභය නොවේ. ලොභය නසන ශක්තියම අලොභය නමි. මේ අලොභය, වස්තූන් පිළිබඳ ආශාව දුරුකොට පරිත්‍යාග වශයෙන්යෙදීමට උපකාර වන්නේය. තමා සතු වස්තුවට ආශා කිරීමෙන්, තණ්හාව

දියුණුකොට, සසරම රඳාසිටීම් පෘථග්ජන ගතියකි. නුවණ ඇති සත්පුරුෂ තෙමේ මේ බැව් දැන, සසරින් එතරවනු පිණිස, සියළු දුකට හේතුවූ මේ තණ්හාව දුරු කිරීම් වශයෙන් වස්තූන්හි නො ඇලීම පුරුදු කරන්නේය. වස්තූන්ගෙන් ප්‍රයෝජන ඇති පුද්ගලයන් බලා, ලොභය හැර ඔවුන්ට මෛත්‍රී සහගත සිතින් වස්තු ප්‍රදානය කරන්නේය. අප්‍රිය වූ ප්‍රතිග්‍රාහකයාට පවා යමකින් සංග්‍රහ කරණ කල්හි, මේ අලොභය ඇති විය යුතුයි. ලොභය ඇතිතාක් කල් තමා සතු වස්තුව අත් නො හරින්නේය. අලොභය නිර්වාණාවබොධය පිණිස පූර්ව ප්‍රතිපදව වශයෙන් පිරිය යුතු පාරමී ධර්මයක්ද වන්නේය.

දන්දීමේදී පමණක් නොව, සිල් රැකීම, භාවනාකිරීම ආදී සියළුම් පින් කිරීමට මේ අලොභය ඇතිවිය යුතුයි. තමා පිළිබඳ අධ්‍යාත්මක වූද, බාහිරවූද, වස්තූන් පමණක් නොව සියළුම සැප සම්පත් ආදියද පරිත්‍යාග වශයෙන් නොපවත්වා තණ්හාව දුරුකළ නො හැකිවේ. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ආදී සියළුම තෘෂ්ණාවන් දුරු කිරීමට ප්‍රඥවත් සමඟ යෙදුන අලොභය අවශ්‍යමය. එබැවින් මේ අලොභ චෛතසිකය, අකුසල මූලයක් වූ, ලොභයට ප්‍රතිපක්ෂ වූ, සියළුම කුසල් කිරීමේ දී ඇතිවන කුසල මූලයක් වශයෙන් ද පනස් නවයක් සොභන සිත්හි යෙදෙන්නේය.

## අද්වේෂය. (6)

ද්වේශයට හෙවත් සිත්හි දූෂ්‍ය බවට විරුද්ධවූද, තම අදහසට එකඟවූ මිත්‍රයෙකුසේ, අරමුණෙහි සිත කිළිටි නොකරන්නාවූද, මොලොක්වීම ස්වභාවකොට ඇත්තාවූද, මෛත්‍රිය නම් වූ ශක්තිය ට අද්වේෂ ය යයි කියනු ලැබේ. අරමුණ පිළිබඳව නොසැඩ බව, රෞද්‍ර නැති බව, අවිරුද්ධ බව අද්වේෂයාගේ ලක්ෂණයෝයි. ද්වේෂයාගේ අභාවය හෙවත් ද්වේෂය නැතිබව අද්වේෂය නොවේ. ද්වේෂය මැඩපවත්වන්නාවූද, ද්වේෂයට නැඟ එන්නට නොදී එයට විරුද්ධවන්නාවූද ස්වභාවය අද්වේෂ නම්. මවක් දරුවකු අතගාන්නාක් මෙන් අර මුණ ඉතා මොලොක් ආකාරයෙන් ගන්නේය. පූර්ණ චන්ද්‍රයා මෙන් සෞම්‍යය. කෙලෙසුන් විසින් දවන ලද තවන ලද චිත්ත සන්තානය නිවා සිහිල් කොට සන්සිඳුවා ලන්නේය. සතුරෙකුට පවා තමා සතු වස්තුවෙන් කොටසක් වත් දෙන කල්හි ඔහු පිළිබඳව ඇති වූ

පටිඝය හෙවත් ද්වේෂය යටපත් කොට දිය යුතුවේ. ද්වෙෂය පවත්නා කල්හි පරිත්‍යාගයක් කළ නොහැකි වේ. එබැවින් අදෝෂ චෛත සිකය ද, අලොභය මෙන් පනස්නවයක් සොභන් සිත්හි සොභන සාධාරණ චෛතසිකයක් වශයෙන් යෙදෙන්නේය. එ මෙන් ම අදෝෂය කුසල මූලයකි.

අනන්තවූ සත්ත්වප්‍රඥප්තිය අරමුණු කොට ඔවුන් කෙරෙහි මෘදු මොලොක් ආකාරයෙන් අනුකම්පාව දක්වන කල්හි මේ අදෝෂය හෙවත් මෛත්‍රිය, සතර බ්‍රහ්ම විහරණය නම් වූ උතුම් වයඹාවන්ගෙන් එකක් වන්නේය. ප්‍රමාණ කළ නොහැකි සත්ත්ව සමූහයා කෙරෙහි පුද්ගල විශෙෂයක් නැතිව මෛත්‍රිය පැතිරවීම හේතුකොටගෙන **අප්‍රමාණ්‍ය ධර්මයක් ද** වන බව සැළකිය යුතුය. මේ අදෝෂ චෛත සිකය, තරහව, ක්‍රොධය, වෛරය, ව්‍යාපදය නැති කරන මහා බලයෙකි. නිර්වාණාවබොධය පිණිස පූර්වප්‍රතිපදාව වශයෙන් පිරියයුතු මෛත්‍රී නම් පාරමි ධර්මයක් ද වන්නේ ය.

## තත්‍රමජ්ඣත්තතාවය (7)

**තත්‍රමජ්ඣත්තතා** චෛතසිකය වනාහී මැදහත් ආකාරයෙන් අරමුණු ගැණීම ලක්ෂණ කොට ඇත්තේය. සිතත් චෛතසික ධර්මත්, වෙන්වෙන්වූ කෘත්‍ය ඇති ධර්මයෝවෙති. යම් ක්‍රියාවක් සිදුකරන කල්හි මේ සිතත්, එහි සම්ප්‍රයුක්ත වූ ධර්මත්, සාමූහිකව, වුවමනාකටයුත්තට සුදුසු පරිදි යෙදී ක්‍රියා කරමින් කටයුතු සම්පාදනය කරන්නේය. අකුසල් කරනවිට මොහ උද්ධච්ච ආදි පාපගති යෙදී නොසන්සුන් භාවය ඇති කරන බැවින් එම සිතෙහි යෙදෙන අනිකුත් අකුසල චෛතසිකයෝ තම තමන්ට පුරුදු පරිදි සව උත්සාහයෙන් ම ක්‍රියා කරන්නේය. ඒ පාපගති සවභාවයෙන්ම නොහික්මුණු ධර්ම බැවින් අමුතුවෙන් හික්මවා ගැනීමක් හෝ රැක ගැණීමක් හෝ අන වශ්‍යය. නුමුත් කුසල් කරන කල්හි සවභාවික වූ පාපගති වළක්වා, එයින් චිත්තසන්තතිය මුදවා ගෙන කුසල මාර්ගයට හරවා ගැනීම උත්සාහයෙන්ම කළ යුත්තකි. මෙසේ උත්සාහයෙන් උපදවා ගනු ලබන චිත්ත චෛතසික ධර්මයන්, ඒ ඒ කටයුත්තට වුවමනා පරිදි සමතත්වයෙන් පිහිටුවා ගෙන ක්‍රියා කරවන ශක්තියට **තත්‍රමජ්ඣත්තතා චෛතසික** යයි කියනු ලැබේ. මෙසේ සම්ප්‍රයුක්ත ධර්මයන් මැදහත්

ආකාරයෙන් හෙවත් කට යුත්තට ගැලපෙන පරිදි අඩු වැඩි නොවී සම තත්වයෙන් නොපිහිටි කල්හි නිසිලෙස කුසලය කිරීමට නො හැකිවේ.

අසුන් දෙදෙනෙකු බඳනා ලද රථය ඇදගෙන යන කල්හි රථාචාර්යයා විසින් ඒ අසුන් දෙදෙනා ඉදිරි පසු වන්නට ඉඩ නොදී සමව ගෙන නොගියහොත්, යා යුතු තැනට රථය නිසිසේ ගෙනයාම අපහසු වන්නාක් මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ක්‍රියාවේගය කටයුත්තට වුවමනා පරිදි සම තත්වයෙන් මැදහත්ව තබා නොගතහොත් කුසල කර්මයට බාධා පැමිණෙන්නේය. එබැවින් මේ මැදහත්භාවය ඇති කිරීම පිණිස සෑම සොභන සිතකම මේ **තත්‍රමජ්ඣත්තතා චෛතසිකය** යෙදෙන බව සැළකිය යුතුයි. මේ **තත්‍රමජ්ඣත්තතා** චෛතසිකයටම **උපෙක්ෂාව** යයි ද කියනු ලැබේ. මේ උපෙක්ෂාව, වෙදනා චෛතසිකයේ භෙදයක් වූ **උපෙක්ඛා වෙදනාව** නොවන බව දත යුතුයි. අනන්ත වූ සත්ත්වප්‍රඥප්තිය අරමුණු කොට මධ්‍යස්ථ භාවය ඇතිවන කල්හි උපදනා තත්‍රමජ්ඣත්තතාවයට **උපෙක්ඛා බ්‍රහ්මවිහරණය** යයි කියනු ලැබේ. බොධිය නම් වූ සතර මාර්ගඥන යන්ගේ අඞගයක් වශයෙන් යෙදෙන කල්හි **උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය** යයි ද,නිර්වාණාව බොධය පිණිස ප්‍රතිපද වශයෙන් උපෙක්ඛාව වඩන කල්හි **උපෙක්ඛා පාරමිතා** යයි ද කියනු ලැබේ.

## කායපස්සද්ධිය ( 8 ) සහ චිත්තපස්සද්ධිය ( 9 )

**කාය** යනු සොභන සිත්හි යෙදෙන චෛතසික සමූහයාට කියන නමෙකි. වෙදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධත්‍රයට ඇතුළත් වන ධර්මයන්ගේ සමුදය කාය බව දත යුතු. මෙහි **චිත්ත** යයි කියනු ලබන්නේ **සොභන සිත්** වලටය. **පස්සද්ධිය** යනු සන්සුන් බවය. එබැවින් **කායපස්සද්ධියෙන්** සොභන චෛතසිකයන්ගේ සන්සුන් බවද, **චිත්ත පස්සද්ධියෙන්** සොභන සිතෙහි සන්සුන් බවද ප්‍රකාශ වේ.

සිතෙහි නොසන්සුන් බව ඇතිවන්නේ උද්ධච්ච චෛතසිකය යෙදුනු කල්හිය. අකුසල් සිත්හි මිස කුසල් සිත්හි උද්ධච්චය නො යෙදෙන්නේ ය. පුණ්‍යකර්මයක් කිරීමේදී උද්ධච්චය නැග එන්නට

නොදී වළක්වා, චිත්තසන්තානය එකගැණීමෙන් සංසිඳුනු ස්වභාව යක් ඇති කිරීමේ ශක්තියක් ඒ සිතෙහිම පහළ විය යුතුයි. සිතත් චෛතසික ධර්මත් එකටම ඇතුළත් ව උපදනේ වී නමුත් වෙන්වෙන් වූ ධර්ම බැවින්, සංසිඳවන ශක්ති දෙකක් ම **කායපස්සද්ධි, චිත්ත පස්සද්ධි** වශයෙන් පහළ වන්නේ ය. මෙසේ උද්ධච්චය යටපත් කිරීමට පස්සද්ධි ධර්ම දෙක උපකාර වන්නේය.

**පස්සද්ධිය** බලවත් වූ කල්හි චිත්ත සුවය ද ඇති වන්නේය. එවිට පින් කිරීම ඉතා මිහිරි වන්නේය. දුබල වූ පස්සද්ධිය ඇති කල්හි පින් කරන්නේ වී නමුත් එතරම් මිහිරි නොවන්නේ ය. බොධි නම් වූ සතර මාර්ග ඥාන ලැබීමේ දී අඞ්ගයක් වශයෙන් යෙදෙන කල්හි මේ චෛතසික දෙකට **පස්සද්ධි සම්බොජ්ඣඞ්ග** යයි කියනු ලැබේ.

සූර්‍ය්‍යතාපයෙන් පෙළනු ලබන පුද්ගලයා රුක්සෙවනට පැමිණි කල්හි විඩා සංසිඳුවීම ඇතිවන්නාක් මෙන්, පෘථග්ජන චිත්ත සන්තානයෙහි බලපවත්වන්නා වූ, අකුසල් සිත්හි යෙදෙන උද්ධච්චය නමැති සූර්‍ය්‍ය තාපයෙන් පෙළනු ලබන කල්හි, කෙලෙස් දහය සංසිඳවීම පිණිස රුක්වෙසන නමැති පස්සද්ධිය උපදවා ගන්නේය. එබැවින් සොභන සිත්හි සිපිල භාවය හෙවත් ශාන්තභාවය ඇති වන්නේ මේ පස්සද්ධි ධර්ම හේතුකොට ගෙණ බව දත යුතුයි.

## කාය ලහුතා (10) සහ චිත්ත ලහුතා (11)

සොභන සිත්හි යෙදෙන්නා වූ සම්ප්‍රයුක්ත ධර්ම සමූහයාගේ සැහැල්ලු බව හෙවත් බර බව සන්සිඳවීමේ ශක්තියට **කාය ලහුතා** යයි ද, සොභන චිත්තයාගේ සැහැල්ලු බවට **චිත්ත ලහුතා** යයි ද ව්‍යවහාර කරනු ලැබේ. **කාය ලහුතාව,** අකුසල් සිත්හි යෙදෙන්නා වූ මිද්ධ නම් වූ චෛතසික ධර්මයාගේ බර බව සන්සිඳවීම ලක්ෂණ කොට ඇත්තේ ය. **චිත්ත ලහුතාව** වනාහි ථීන නම් වූ සිතෙහි බරබව සංසිඳවීම ලක්ෂණ කොට ඇත්තේ ය. **ථීන මිද්ධ** දෙදෙනා සසංඛාරික අකුසල් සිත්හි එක්ව යෙදෙන්නාක් මෙන්, එයට ප්‍රතිපක්ෂ ධර්ම දෙකක් වූ මේ කාය ලහුතා චිත්ත ලහුතා චෛතසික දෙක සොභන සිත්හි එක්ව යෙදෙන්නේ ය. ලහුතා ධර්ම පවත්නා

කල්හි ථීන මිද්ධයන්ට නැග එන්නට අවකාශ නොලැබේ. නාම ධර්මයන් වූ ථීන මිද්ධ දෙදෙනාගේ බර බව, ද්‍රව්‍යයන් ගේ බර බවක් මෙන් නොව, සිතෙහි දුර්වලභාවය හේතුකොට ගෙන ස්ව උත්සාහයෙන් ම නැඟී සිටීමට නො හැකිව, බරක් මෙන් පවතින සවභාවයෙකි. එමෙන්ම එයට ප්‍රතිපක්ෂ වූ **ලහුතා** ධර්ම දෙක ද, චිත්ත චෛතසික ධර්මයන්ගේ සැහැල්ලු බව යයි කියන කල්හි, එයින් අදහස් කරනු ලබන්නේ බරක් ලෙස දැනෙන චිත්ත චෛතසික ධර්මයන්ගේ දුර්වල භාවය හෙවත් අලස බව, මැලි බව නැති කොට කටයුත්තට සුදුසු බව ඇති කරවන ශක්ති දෙකෙකි. දුර සිට බරක් ඔසවාගෙන විත් පසෙක බහා තබා බර සැහැල්ලු කොට නිදහස ලබන්නාක් මෙන්, මේ ලහුතා ධර්ම දෙක ද, **ථීන මිද්ධ නීවරණ** නමැති බර බහා තබා සැහැල්ලු බව ඇති කරවන්නේ ය.

## කාය මුදුතා (12) සහ චිත්ත මුදිතා (13)

සොභන සිතෙහි යෙදෙන සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ මොලොක් බව **කාය මුදුතා** නම්. සොභන සිත්හි මොලොක් බව **චිත්ත මුදුතා** නම්. **මිථ්‍යා දෘෂ්ටිය මානය** ආදිකොට ඇති, චිත්ත චෛතසිකයන්ගේ තද බව, කර්කශ බව ඇති කරවන පාප ධර්මයන්ට අවකාශ නොදී, සොභන සසම්ප්‍රයුක්ත සිත්හි මෘදු මොලොක් භාවය ඇති කරවන්නේ මේ මුදුතා ධර්මයන්ගේ ශක්තියෙනි. එබැවින් මේ ධර්ම දෙක, දිට්ඨි මාන ආදී ක්ලෙශයන්ගේ සන්සිඳවීම ලක්ෂණ කොට ඇත්තේය. ගොරෝසු හමක් වැඩට සුදුසු ලෙස සකස් කර ගැණීමට කැමැති තැනැත්තා විසින් ඒ සම, තෙල් දිය, ආදියෙන් තෙමා තලා මොලොක් බවට පත්කර ගන්නාක් මෙන්, දිට්ඨි, මාන ආදී කෙලෙසුන්ගෙන් දැඩි බවට පත් වූ චිත්ත සන්තානය, මේ ධර්ම දෙක උපකාර කොට ගෙන මොලොක් බවට පත්කර ගැනීමෙන් කුසලයට හුරු කරනු ලබන්නේ ය. හැම කෙලෙසුන්ටම වඩා මිථ්‍යාදෘෂ්ටිය බලවත් පාපයකි. නැමිය නොහැකි වියලි දණ්ඩක් මෙන් ඉතා තදය, ලොභ මොහ ආදි පාප ධර්මයන්ගෙන් පිරිවරා ගත්, වැරදි ලෙස අරමුණු ගැණීමට පුරුදු වූ මේ දිට්ඨිය ඇති පුද්ගලයා, එම මිථ්‍යාදෘෂ්ටියෙන් මුදවා ගැනීම අති දුෂ්කරය. මිථ්‍යා දෘෂ්ටිය බල පවත්නා තෙක් කුසලයක් කළ නො හැකිය. එබැවින් මිථ්‍යාදෘෂ්ටියට විපක්ෂ වූ මේ **කාය මුදුතා චිත්ත මුදුතා** නම් වූ මුදුතා

ධර්ම දෙක සොභන සිතෙහි යෙදීමෙන් මිථ්‍යා දෘෂ්ටියගේ මතුවීම වළක්වා සිත මොලොක් බවට පත් කරවන්නේ ය.

## කාය කම්මඤ්ඤතා (14) සහ චිත්ත කම්මඤ්ඤතා (15)

සොභන චෛතසික ධර්මයන් කුසල කර්මයට යොග්‍ය කරවන ස්වභාවය හෙවත් කර්මණ්‍ය භාවය **කාය කම්මඤ්ඤතා** නමි. චිත්ත යාගේ කර්මණ්‍ය භාවය හෙවත් කුසලයට යොග්‍ය කරවන ශක්තිය **චිත්ත කම්මඤ්ඤතා** නමි. කාම වස්තුව කෙරෙහි ඇලීම නම් වූ කාමච්ඡන්දය ආදි කොට ඇති නීවරණධර්මයන් පෘථග්ජන චිත්ත සන්තානයෙහි නිතර පහළවන බැවින්, එයින් මිදී කුසල් කිරීම ඉතා දුෂ්කර කටයුත්තකි. එබැවින් කුසලයට බාධා කරන, කුසලය වළක්වන මේ නීවරණ ධරමයන් මර්දනය කරන, නීවරණ ධර්ම යන්ගේ නැගී සිටීම වළක්වන, එයට ප්‍රතිපක්ෂ වූ ශක්තියක් හැම සොභන සිතකම ඇතිවිය යුතුයි. එසේ නොයෙදුනහොත් ඒ සිත කුසලයට යොග්‍ය නොවන්නේය. මේ සිත කුසලයට යොග්‍ය කරවන්නේ හෙවත් කර්මණ්‍ය භාවය ඇති කරවන්නේ **මේ කම්ම ඤ්ඤතා ධර්මයන්ගේ** උපකාරයෙනි. රනින් ආභරණ තනාගනු කැමැති පුද්ගලයා, රත්රන් ගෙන, භාජනයක තබා උණු කොට, එහි අපිරිසිදු ලොහ ආදිය ඉවත් කොට, පිරිසිදු කර ගත් කල්හි කැමැති සේ ආභරණ තනාගැනීම පහසුවන්නාක් මෙන්, කුසල් කරණු කැමැති පුද්ගලයා විසින්, නීවරණාදී පාපධර්මයන්ගෙන් අපිරිසිදු වූ මේ චිත්ත සන්තානය පිරිසිදු කොට, කැමැති සේ කුසල් කිරීමට යෝග්‍ය පරිදි සිත සකස් කරගනු ලබන්නේ මේ කම්මඤ්ඤතා ධර්ම දෙක උපදවා ගැනීමෙනි. කම්මඤ්ඤතා ධර්ම බලවත් වූ කල්හි පහසුවෙන් කුසල කර්මයෙහි යෙදෙන්නේ ය. එය දුබල වූ කල්හි පින්කම් කරන්නට සැරසුනේ වී නමුත් වහා ආපසු අකුසල පක්ෂයට බසින්නේය.

## කාය පාගුඤ්ඤතාවය -16) සහ චිත්ත පාගුඤ්ඤතාවය (17)

සොභන සිත්හි යෙදෙන චෛතසික ධර්මයන් ගේ ප්‍රගුණය, පුහුණු බව නොහොත් නොගිලන් බව **කායපාගුඤ්ඤතා** නමි.

සොභන සිතෙහි ප්‍රගුණ බව, පුහුණු බව නොහොත් නොගිලන් බව **චිත්තපාගුඤ්ඤතා** නම් වේ. චිත්ත චෛතසික යන්ගේ ගිලන් බව හෙවත් රෝගී භාවය ඇති කරවන **අශ්‍රද්ධා** ආදී ක්ලෙශ යන් මර්දනය කිරීමේ ශක්තිය මේ පාගුඤ්ඤතා ධර්මයන්හි ඇත්තේය. යම් වැඩක් හොඳ හැටි කිරීමට ඒ වැඩය පිළිබඳව මනා **පුරුද්දක්** හෙවත් පුහුණුවක් ඇති විය යුතුයි. පුහුණු නොවූ තැනැත්තා වැඩට නුහුරු බැවින් කටයුත්ත කිරීමට අසමර්ථ වේ. එසේ ම දන්දීම්,සිල් රැකීම්, භාවනා කිරීම් ආදි පින්කම් කිරීමට ද පුරුද්ද හෙවත් පුහුණු කළ බවක් ඇති විය යුතුයි. පුහුණුවක් නැති කල්හි කුසලයෙහි යෙදිය නොහැකි වේ. සසර දී ඒ ඒ පින්කම් කොට මනාපලපුරුද්දක් ඇති පුද්ගලයාහට ඒ පුහුණු කළ පින්කම්හි යෙදීම ඉතා පහසු වන්නේය. දන් දීම පුරුදු කළ තැනැත්තාට දන්දීම ඉතා පහසුය. සිල්රැක භාවනා කොට පුරුදු තැනැත්තාට සිල් රැකීම භාවනා කිරීම ඉතා මිහිරි වන්නේය. දන්දීම සිල් රැකීම් භාවනා කිරීම් ආදියට මැලි වන්නේ භයවන්නේ ලජ්ජා වන්නේ ඒ පින්කම් කළ පුරුද්දක් නැති බැවිනි. **ශ්‍රද්ධාව සතිය, හිරිය, ඔත්තප්පය**, යනාදී යහපත් ගති පුහුණු නොකළ තැනැත්තාගේ චිත්ත සන්තානයෙහි **අශ්‍රද්ධාව, මුට්ඨස්සතිය, නිවරණ ධර්මාදිය** වැඩෙමින් චිත්තයාගේ රෝගී භාවය හෙවත් ගිලන් බව ඇති කරන්නේය. රෝගාදියෙන් පීඩිත වූ ශරීරය දුර්වල වී කටයුතු කිරීමට අසමර්ථ වන්නාක් මෙන්, අශ්‍රද්ධාදී පාපධර්මයන් නිසා රෝගී වූ චිත්ත සන්තානය කුසල් කිරීමට අසමර්ථ වන්නේය. චිත්ත චෛතසික ධර්ම යන්ගේ ගිලන් බව නැති කොට අන්තරායෙන් මුදවා කුසල් කිරීම පිණිස හුරු බවක් හෙවත් පුහුණුවක් ඇති කරවන මේ **කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා** නම් වූ චෛතසික දෙක සියළු සොභන සිත්හි යෙදෙමින් සිත් සතන් ශක්තිමත් කොට කුසලයෙක ම යොදවන්නේය. පාගුඤ්ඤතා ධර්මයන් බලවත් වූ කල්හි ඉතා පහසුවෙන් වෙහෙසක් නැතිව කැමැති පරිද්දෙන් ම කුසල කරන්නේ ය. දුබල වූ කල්හි වෙහෙසට පත් වන්නේ ය.

### කායුජ්ජුකතාවය (18) සහ චිත්තුජ්ජුකතාවය (19)

සොභන චෛතසිකයන්ගේ අවඞ්ක බව, ඇද නැති බව හෙවත් ඍජු භාවය ඇති කරවන ශක්තිය **කායුජ්ජුකතා**නම්. චිත්තයා

ගේ අවඞ්ක බව, ඇද නැති බව හෙවත් ඍජු බව ඇති කරවන ශක්තිය **චිත්තුජ්ජුකතා** නම් වේ. මායාසාඨෙය්‍යා ආදී ක්ලෙශයෝ සිතෙහි වඞ්කභාවය ඇති කරවන පාප ධර්මයෝ යි. කළවරද නැතහොත් ඇති වරද සඟවා අනුන් රැවටීම **මායා** නම් වේ. නැති ගුණ පෙන්වා රැවටීම **සාඨෙය්‍යා** නම්. මේ වඞ්ක ගති, සිත් සතන්හි පවත්නා තෙක් කුසල් කළ නො හැකි වේ. එබැවින් මේ වංක ගති වළක්වා, ඇද නැති කොට, සිතෙහි හා සම්ප්‍රයුක්ත ධර්මයන් ගේ ද ඍජු භාවය ඇති කරවන මේ **කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා** නම් වූ චෛතසික දෙක සියළුම සොභන සිත්හි ඇති වන්නේය. මේ චෛතසික දෙක බලවත් වූ කල්හි ඉතා මැනවින් සිහි නුවණින් යුක්තව, කලබල නොවී, නො හැකිළී උඩඟු නොවී පින් කරන්නේය. දුබල වූ කල්හි සිතෙහි කලබල ස්වභාවය ඇති විය හැකි බැවින් පින්කමෙහි ස්ථිරව නොපිහිටන්නේය. වහා අකුසල පක්ෂයට බසින්නේය.

මේ වඞ්ක භාවය තුන් ආකාරයකට දක්වනු ලැබේ. එනම් **ගොමුත්‍ර වඞ්කය, චන්ද්‍ර වඞ්කය, නඟුලකොටි වඞ්කය** යනුයි.

ගමන් කරන්නා වූ ගවයා මුත්‍ර පහ කරණ කල්හි පොළොවෙහි ඇතිවන රේඛාවේ ඇදයට ගෝමුත්‍ර වඞ්කයයි කියති. තමා තුන් දෙරින් ම පව් කරමින් පව් නොකරමි කියන පුද්ගලයාගේ ඇදය මේ ගෝමුත්‍ර වඞ්කය මෙනැයි දත යුතු. මෙතෙමේ වරක් පව් කිරීම නිසා එක පැත්තකට බර වී, පව් නො කරන බව පෙන්වීමේ දී අනිත් පැත්තට බරවන්නේ ය.

අමාවකට පසුව පායන චන්ද්‍රයාගේ ඉතාවක් බවට **චන්ද්‍ර වඞ්කයයි** කියති. ඇතැම් පුද්ගලයෝ පව් කරමින් ම අනුන්ට පව් නොකරන්නටත්, පව්වලට භය විය යුතු බවත් කියති. මොවුහු ඉතාම වඞ්ක බැවින් චන්ද්‍ර වඞ්කය හා සමානය. මෙතෙමේ ද්වාර දෙකෙකින් පව් සිදු කරගන්නා කෙනෙකි.

නඟුලෙහි දණ්ඩ ඍජු නමුත් වියගස බඳින කෙළවර ඇදය. මෙයට **නඞ්ගුලකොටි වඞ්කය** යයි කියනු ලැබේ. සමහරු පව් කරමින්, පව් නොකරණ බව ඉදිරියෙහි නොකියා වට පිටින් , පව්

නොකරන බව හැඟවීමට උත්සාහ කරති. පව් කිරීමෙහි වරද අනුන්ට කියා දෙයි. එය අසන අය මෙතෙමේ අවඩ්ක යයි පිළිගනී. මෙසේවූ වඩ්කය **නඞ්ගුලකොටි වඩ්කයයි** මෙනැයි කියනු ලැබේ. මෙතෙම එක් දෙරකින් පමණක් අකුසල් කරන කෙනෙකි.

**කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා** යන මේ ධර්ම දෙක සියළුම අකුසල යන්ට ප්‍රතිපක්ෂය.

මෙහි විස්තර කරණ ලද සොභන සාධාරණ චෛතසික දහනවය, සොභන සිත්හි එකවර යෙදෙමින් ඒ ඒ අකුසල ධර්මයන් මැඩ පවත්වා කෙලෙස් නැග එන්නට නොදී චිත්ත සන්තානය ආරක්ෂා කොට කුසල කර්මයන්හි යොදවන්නා වූ බලවත් නාම ධර්ම සමූහයකි.

## විරති චෛතසික

**සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යයි විරති ධර්ම තිදෙනෙකි **විරතිය** වනාහි පාපයෙන් වැළකීම, ප්‍රාණ ඝාතාදි දුෂ්චරිතයන්ගෙන් වැළකෙන සවභාවය, දුෂ්චරිතයන්ගෙන් වැළකීමට සත්ත්වයාහට උපකාරවන්නා වූ සවභාවය ද ලක්ෂණ කොට ඇත්තේය.

**විරවිතබ්බ වස්තු** හෙවත් වැළකිය යුතු වස්තු සතකි. එනම් **මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්ලපාප, ප්‍රාණඝාත අදත්තාදන, කාමමිථ්‍යාචාරය** යන සතය. මෙයින් **මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච සම්ඵප්ඵලාප** යන සතර, **වාග්දුෂ්චරිතයෝ** වෙති. **ප්‍රාණඝාත අදත්තාදන, කාමමිථ්‍යාචාර** යන තුන **කායදුෂ්චරිත** යෝයි. සප්ත දුෂ්චරිත සඞ්ඛ්‍යාත විරවිතබ්බ වස්තූන් ගෙන් වළක්නා හෙයින් **විරති** නම් වෙත්. විරවිතව්‍ය වස්තූන්ගෙන් වැළැක්මක් නැති කල්හි විරති නොවන බව සැළැකිය යුතුයි. යහපත් වචන කීම, යහපත් කර්මාන්ත කිරීම, යහපත් වෙළදාම් ආදිය කිරීම ඒකාන්ත විරති සංඛ්‍යාවට නොගැණෙන්නේය.

## සම්මාවාචා විරතිය (20)

ආජීව හේතු අපෙක්ෂා නොකොට, **මුසාවාද**, **පිසුනාවාචා**, **ඵරුසා වාචා**, **සම්ඵප්පලාප** යන සතර වාග්දුශ්චරිතයන්ගෙන් වැළකීම හෝ, වළක්නා සවභාවය හෝ, වැළකීමට උපකාරවන සවභාවය හෝ **සම්මාවාචා විරති** නම්. සතර වාග්දුශ්චරිතයන්හි යෙදෙන්නාවූ පුද්ගලයාහට මෙලොවදීම රාජ්‍යපාලකයන්ගෙන් හා ශිෂ්ඨ ජනසමාජ යෙන්ද ඇතිවන නින්ද, අපහාස, හිරිහැර, කරදර, දඬුවම් ආදිය ද, පරලොව දී ඇතිවන අපාය භය ආදිය සළකන්නාවූ පුරුෂතෙමේ, මෙසේ බහිද්ධ සන්තානය අපේක්ෂා කිරීම් වශයෙන් වාග්දුශ්චරිත යන්ගෙන් වළකින්නේ ය. මෙසේ සතර විරවිතව්‍ය වස්තූන්ගෙන් වැළකීමක් නැතිව යහපත් වචන කීම, දහම් පත් පොත් කියවීම, අනුන්ගේ ගුණ කථනය කිරීම යන ආදිය, **පුණ්‍යක්‍රියාවන්** වූ නමුත් එකාන්ත විරති නොවන්නේ ය. එයට **වොහාරසම්මාවාචා** යයි ද **කථා සම්මාවාචා** යයි ද කියනු ලැබේ. යහපත් වචන කීමේ දී ඇතිවන කුසල් සිත්හි යෙදෙන චේතනාවට **චේතනා සම්මාවාචා** යයි කියති. මේ දෙකම විරති නොවන්නේ ය. විරතියක් වූ මේ **සම්මාවාචා** චෛතසිකය ශීලයට ඇතුළත්වන ධර්මයකි. සිල් රැකීමේ දී වාග්දුශ්චරිතයන්ගෙන් වළකින බව මෙනෙහිකරන්නා වූ මහා කුසල් සිත්හි පමණක් මේ චෛතසිකය යෙදෙන්නේ ය. ලොකොත්තර චිත්තයන්හි මේ විරති සම්මාවාචා චෛතසිකය යෙදෙන්නේ මාර්ගාඞගයක් වශයෙනි.

## සම්මාකම්මන්ත විරතිය (21)

ආජීව හේතු අපෙක්ෂා නොකොට, **ප්‍රාණඝාතය**, **අදත්තාදනය කාමමිථ්‍යාචාරය** යන ත්‍රිවිධ කාය දුශ්චරිත නම් වූ විරවිතව්‍ය වස්තූන් ගෙන් වැළකෙනු පිණිස, ශික්ෂා පද සමාදන් වන්නා වූ හෝ අධිෂ් ඨාන කරගන්නා වූ හෝ පුද්ගලයාගේ කාය දුශ්චරිතයෙන් වළක්නා වූ හෝ වළක්නා සවභාවය හෝ, වැළකීම හෝ **සම්මාකම්මන්ත විරති** නම් වේ. යහපත් කායික ක්‍රියා කරණ කල්හි විරවිතව්‍ය වස්තූන් ගෙන් වැළකීමක් නොවන හෙයින් **සම්මාකම්මන්ත විරතිය** නො වන්නේ ය. නිවැරදියහපත් කර්මාන්ත කිරීමට **වොහාර සම්මා කම්මන්තය** හෙවත් **ක්‍රියාසම්මාකම්මන්තය** යයි කියති. එසේ

කිරීමේ දී ඇතිවන චේතනාව, **චේතනා සම්මාකම්මන්ත** නම්. විරතිය ඇතිවන්නේ කාය දුශ්චරිතයන්ගෙන් වළකින කල්හි පමණය. මෙය ද ශීලමය පුණ්‍යකර්මයට ඇතුළත් වේ. ලොකොත්තර සිත්හි මේ **සම්මාකම්මන්ත විරති** චෛතසිකය යෙදෙන්නේ **මාර්ගාඞ්ගයක්** වශයෙනි. මෙලොව පරලොව දුක්බයන්ට භය වී බහිද්ධ සන්තානය අපේක්ෂා කරමින් මේ සම්මාකම්මන්ත චෛතසිකයේ උපකාරයෙන් ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ගෙන් වළකින්නේ ය.

## සම්මා ආජීවය (22)

පව් කරන්නන් අතර ජීවිකාව පිණිස පව් කරන්නෝ ද වෙති. ජීවිකාව සඳහා හෙවත් ආජීව හේතු අපේක්ෂාකොට සප්තවිධ විරචිතව්‍ය වස්තුන්ගෙන් වැළකීම හෙවත් සතර වාග්දුශ්චරිතයෙන් හා ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් ද වළක්නා ස්වභාවය හෝ වැළකීමට උපකාර ධර්මය හෝ **සම්මා ආජීව** නම් වේ. මෙය අධ්‍යාත්ම සන්තානය අපෙක්ෂා කොට අකුසලින් හෙවත් සප්තවිධ දුශ්චරිතයන්ගෙන් වළකින්නේ ය. ස්වභාවයෙන් ම නිවැරදි වූ යහපත් වෙළඳාම් ආදී වූ කර්මාන්ත කිරීම් වශයෙන් ඇතිවන නිවැරදි ජීවිකාව මේ විරති සම්මා ආජීවය නොවේ. ආජීව පාරිශුද්ධ ශීලය ආදී වශයෙන් ශීලමය පුණ්‍යකර්මය වන්නේ, සප්තවිධ දුශ්චරිතයන්ගෙන් වැළකී නොහොත් මිථ්‍යා ආජීවයෙන් වෙන්ව යහපත් ජීවිකාවක් කරන කල්හි ය.

තම ජීවිකාව පිණිස ලාභ සත්කාර ලබා ගැනීමෙ අදහසින් තමා තුළ නැති ශීලා දී උතුම් ගුණ දහම් ඇතැයි හැඟවීම, බොරු කියා අනුන් රවටා, වංචා කොට ලාභ ලැබීම, අනුන් කෙරෙහි නැති ගුණ වර්ණනාකොට ප්‍රයෝගයෙන් ඔවුන් සතුටු කරවා ප්‍රයෝජනය ලබා ගැනීම, තමා තුළ ස්වභාවයෙන් නැති ශාන්ත ඉරියව් ආදිය අනුන් ඉදිරියෙහි පවත්වා සිල්වතෙක, ගුණවතෙක, සමාධි ඇත්තෙක, ධ්‍යාන මාර්ගඵලාදි උත්තරී මනුෂ්‍ය ධර්ම ඇත්තෙක, යනාදී වශයෙන් අනුන් රවටා ප්‍රයෝජනය ලැබීම යනාදිය මිථ්‍යා ආජීවය බව සැළකිය යුතුයි. අමාරුවට පත් කෙනෙකු දැක ඔහුගේ ඉඩ කඩම් පසුව අත් පත් කර ගැනීමේ අදහසින් ඔහුට මිල මුදල් දී

සත්කාර කොට අයුතු පොලී එකතු කොට, ඔහුට එය ගෙවාගත නො හැකි කල්හි එය තමා සතු කර ගැනීම ආදිය ද, තමාට ඇති වන සුළු ලාභයක් නිසා අනුන් අන්තරාවට පත් කිරීම් යනා දී නොයෙක් අධම ක්‍රියාවන් ද මිථ්‍යා ආජීව නම් වන්නේ ය. මෙවැනි ජීවිකා වන්ගේ දෙස් දැක මිථ්‍යා ආජීවයෙන් වෙන්ව යහපත් ජීවිකාව කරන කල්හි මේ **සම්මා ආජීව විරතිය** ලැබෙන්නේ ය.

තවද ආජීව හේතු අපේක්ෂා කොට ගෙන උපසම්පන්න භික්ෂූන්ට පණවා වදාල සැවැදෑරුම් ශික්ෂාපද නම්වූ, **පාරාජිකාවය, සංඝාදිසේසය, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනිය, දුක්කටය** යන ශික්ෂාපදයන් ව්‍යතික්‍රමණය කිරීම හෙවත් කඩ කිරීම් වශයෙන් **කුහන, ලපන, නෙමිත්තකතා නිප්පෙසිකතා, ලාභෙනලාභං නිජිගිංස නතා** දී පාප ධර්මයන්ගේ වශයෙන් ද පවත්නා වූ මිථ්‍යා ආජීවයෙන් වැළ කිමේදී ආජීව පාරිශුද්ධ ශීලය වශයෙන් මේ **සම්මා ආජීව විරති චෛතසිකය** කුසල් සිත්හි යෙදෙන්නේය. **ආජීවට්ඨමක සීල** සමාදනයෙහි ද මේ විරති ත්‍රමය ලැබෙන්නේය.

දශපුණ්‍ය ක්‍රියාවන් අතුරෙන් ශීලමය පුණ්‍ය කර්මය කරන කල්හි පමණක් කාමාවචර කුසල චිත්තයෙහි මේ විරතීහු යෙදෙති. කාමාවචර විපාක ක්‍රියා සිත්හි ද, මහග්ගත සිත්හි ද, සීලය නොයෙදෙන බැවින් විරතීහු නො ලැබෙති. කාමාවචර සිත්හි ලැබෙන විරතීහු, අවිද්‍යාප්‍රත්‍යයෙන් ලැබෙන්නා වූ කුසල සංස්කාර යන්ට උපකාර වෙති. ඒ පටිච්චසමුප්පාද චක්‍රයේ අඞ්ගයක් හෙවත් මතු සංසාරයෙහි ඉපදීමට හේතුහු වෙති. මාර්ග චිත්තයෙහි මාර්ගාඞ්ග වශයෙන් ලැබෙන්නා වූ විරතිත්‍රය, පටිච්චසමුප්පාද ක්‍රමයෙන් බැහැර යාමට හේතු වූ නීය්‍යාණිකාඞ්ගයන්ගෙන් යුක්ත වූ මාර්ගාඞ්ගයෝ වෙති. මෙසේ කාමාවචර විරතීහු, ලොකොත්තර විරතීන්ට අසමාන වන්නේ වී නමුත් ලොකොත්තර විරතීන් ගේ ලැබීමට ඒකාන්ත යෙන් ම උපනිශ්‍රය වන්නේ ය.

මේ විරතීහු තුන් ආකාරයෙකින් පහළවෙත් එනම්: **සම්පත්ත විරතිය, සමාදන විරතිය, සමුච්ඡෙද විරතිය** යන තුන් ආකාරයයි.

ශික්ෂාපද සමාදනයක් නැතිව, වරදක් කිරීමට අවස්ථා පැමිණි කල්හි, තමාගේ තත්වය, වයස, කුලය, උගත්කමය, පාපය යනාදිය සළකා වරදින් වැළකීම **සම්පත්ත විරතිය** නම්. **චක්කණ** නම් එක්තරා පුද්ගලයෙකුගේ මහළු මව් රොගාතුර වී වෙදෙකු කැඳවා පරීක්ෂා කරවා, රොගයට ප්‍රතිකාර පිණිස සාලෙයින් ඖෂධයක් තනාදිය යුතු බව සැළකෙළෙන්, චක්කණ තෙමේ වනයට ගොස් උගුල් අටවා පැටවුන් සහිත වූ සාදෙනක් එයට අසු වූ බව දැක, ළඟටවිත් සාදෙන පිරිවරා සිටි කුඩා සා පැටවුන් දැක, අනුකම්පාව උපදවා මගේ මව් මළහොත් අපට වන දුකට සමාන දුකක් මේ සාදෙන මැරීමෙන්, සා පැටවුන්ට ඒකාන්තයෙන්ම ඇති වේයයි සංවේගය උපදවා, සාදෙන මුදවා වනයට යවා තම ගෙට ආපසු ගොස් මෙපවත් තම සොහොයුරුට කී කල්හි ඔහු විසින් තර්ජනය කරන ලදින්, මව් සමීපයට ගොස් පැටවුන් සහිත වූ සාදෙනගේ ජීවිත දනය දුන් සැටි කියා එම සත්‍යය කරණකොට ගෙණ මැනියන්ගේ රොගය සංසිඳේවායි සත්‍යක්‍රියා කිරීමත් සමඟම මව්ගේ රොගය සුවවීය. කලින් සමාදනයක් නොවී අවස්ථාව පැමිණි කල්හි ප්‍රාණඝාත අකුසලින් මිදුනු ඒ පුරුෂයාගේ විරතිය **සම්පත්ත විරතිය** නම් වේ.

ශික්ෂාපද සමාදන්වූ කෙනෙකු වරදක් කිරීමට අවස්ථා පැමිණි කල්හි ඔහු විසින් සමාදන් වන ලද ශික්ෂාපද ගැන සිතා ජීවිතය නැති වුවත්, ශික්ෂාපද කඩ නොකරන්නෙමි යි තරයේ අධිෂ්ඨාන කොට පාපයෙන් වැළකීම **සමාදන විරති** නම්. එක්තරා පුරුෂයෙක් පන්සිල් සමාදන්ව, දරකැපීම සඳහා පොරවක් රැගෙන වනයට යන්නේ, මගදී මහා පිඹුරෙක් ඔහු වෙලාගත් කල පොරොවෙන් කපා පිඹුරා නසන්නට සිතා, නැවත සිතනුයේ මා විසින් සමාදන් වන ලද ශික්ෂාපද බිඳුනේ වී නම් නපුරෙක, ජීවිතය නැතිවුවත් ශික්ෂාපද බිඳිම නුසුදුසුය යනාදීන් තුන්වරෙකම සිතා, මේ පොරව අත තිබෙන තෙක් පිඹුරා මැරීමට අදහස් වන බැවින් පොරොව ඉවත දමාලූ කල්හි, පිඹුරාද වෙළුම හැර වනයටම ගියේය. සමාදන්වූ ශික්ෂාපද ඇති හෙයින් ශීල හෙදයට හයින්, මෙසේ ජීවිතය පුද ප්‍රාණඝාතයෙන් වැළකී සිටි අවස්ථාවේ මොහුට ඇති වූ විරතිය **සමාදන විරතියකි.**

ආර්‍ය්‍ය මාර්ග ඥනයෙන් නැවත හටනොගන්නා ආකාරයෙන් සමුච්ඡෙද වශයෙන් කෙලෙස් නසා, ප්‍රාණඝාතාදි පාප ධර්මයන් ගෙන් වැළකීම **සමුච්ඡෙද විරති** නම් වේ. සද්ධාතිස්ස නම් රජු විසින් සෝවාන්වූ තිස්ස නම් අරක්කැමියාහට කුකුළෙක් යවා ඉදින් තා කුකුළා නොමරන්නේ නම් වධකයන් ලවා තාගේ හිස සිඳවා ලන්නෙමියි නියෝග ලත් කල්හි, කුකුළා නොමරා තමා වධයට පැමිණීම ඉවසන්නේ යයි කියා වධකයන් සමඟ ගොස් ගෙල සිඳිනා තෙක් බලා සිටියේය තමාගේ ජීවිතය හානිවූයේ නමුදු ප්‍රාණඝාතාදී සප්තවිධ දුශ්චරිතයන් නොකරන්නාවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ විරතිය **සමුච්ඡෙද විරති** නම් වේ.

**සම්මාවාචා, සම්මාආජීව**, යන විරති දෙක දැක්වීමට ද උපමාවක් දක්වනු ලැබේ. අන්සතු කෙතක් අඳයට ලබා ගත් එක්තරා පුරුෂ යෙක්, පසු කලෙක දී එම කෙත තමන් සතු කර ගැනීමේ අදහසින් කෙත හිමියාහට දිය යුතු සසාය නොදී සිටි කල්හි කෙත හිමියා අධිකරණයට පැමිණිලි කෙළේය. එවිට වංචා කරුණු කැමැති පුද්ගලයා නීතිඥයෙකු වෙත පැමිණ පඩුරු දී කෙත හිමිකර දෙන ලෙස අයැද සිටියේය. නීතිඥ තුමා ද එය පිළිගෙන නැවත සිතනුයේ, බොරු කියා අන්සතු වස්තුවක් අහිමියෙකුට හිමිකර දීම මුසාවාද අකුසලයක් බැවින් ඒකාන්තයෙන්ම අපා දුක් විඳිමට සිදුවන්නේයයි සිතා පඩුරු ආපසු දී, මුසාවාද අකුසලයෙන් වැලකුනේය. මෙසේ වැළකීමේදී ඇතිවන කුසල් සිතෙහි **සම්මාවාචා විරතිය** ලැබෙන්නේ ය. නැවත මේ නීතිඥයා මෙසේ ද සිතන්නේ ය. බොරු කියා මෙසේ මුදල් උපයා ජීවත්වීම මහත් වරදෙකි. ඒ වැරැදි ජීවිකාව නිසා බොහෝ කලක් අපා දුක් විඳිමට ද සිදු වනවා ඇත. එබැවින් මා විසින් මිථ්‍යා ආජීවයෙන් වැළකිය යුතුයයි සිතා ප්‍රතික්ෂේප කරන් නේය. මෙසේ වළක්නා කල්හි ඒ කුසල් සිතෙහි යෙදෙන්නේ **සම්මා ආජීව විරති** යයි.

## අප්පමඤ්ඤා චෛතසික.

අප්‍රමාණවූ හෙවත් ප්‍රමාණය කළ නො හැකි සත්ත්ව ප්‍රඥප්තිය අරමුණු කරන ධර්ම **අප්‍රමාණ්‍ය ධර්ම** නමි. අප්‍රමාණ්‍ය ධර්මයෝ සතර දෙනෙකි. එනම්: **මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා**

යන සතරය. **බ්‍රහ්ම විහරණයෝ** යයි කියනු ලබන්නේත් මේ සතරට මය. මෙයින් මෛත්‍රී යනු **අද්වේෂයට** නමෙකි. උපෙක්ඛා යනු තත්‍රමජ්ඣත්තතා වට නමෙකි. මේ චෛතසික දෙකම සොභන සාධාරණ චෛතසිකයන් වශයෙන් ගන්නා ලද බැවින්, **කරුණා මුදිතා**, දෙක පමණක් අප්‍රමාණ්‍ය චෛතසිකයන් වශයෙන් මෙහි විස්තර කරණු ලැබෙ.

## කරුණාව (23)

කරුණාව වනාහී අප්‍රමාණවූ – දුක්ඛිත සත්ත්ව ප්‍රඥප්තිය අරමුණු කොට ගෙන පවත්නා අනුකම්පා කරන සවභාවය ලක්ෂණ කොට ඇත්තේය. ලොකයෙහි දුක්ඛිත සත්ත්වයෝ අප්‍රමාණය. ඔවුන් ගේ දුක්ඛිත භාවය අරමුණු කරන්නා වූ සත්පුරුෂයන්ගේ චිත්ත සන්තා නයෙහි ඇතිවන්නාවූ පර දුක්ඛය පිළිබඳව කම්පා වන්නාවූ ද, ඔවුන් ගේ දුක නො ඉවසන්නාවූද, ඒ දුකින් ඔවුන් මුදවනු කැමැති වන්නාවූද පරදුක්ඛයට විරුද්ධ ආකාරයෙන් පවත්නාවූ ද, සවභාවයට **කරුණාව** යයි කියනු ලැබේ. තම මව්පිය, අඹු දරු, නෑදෑ මිතුරු ආදීන් කෙරෙහි ඇතිවන්නා වූ අනුකම්පාව දයාව, ලොභයාගේම විශෙෂයක් බැවින් කරුණා චෛතසිකය නොවන්නේය. දසදිසාවන්හි වසන සත්ත්වයන් කෙරෙහි, සතුරු මිතුරු, ආදී විශෙෂයක් නො මැතිව, සමාන වශ යෙන් පවත්නා කල්හිම අප්‍රමාණ්‍ය ධර්ම වන්නේය. එසේ පුද්ගල විශෙෂයක් නො කොට, දුක්ඛිත භාවයම අරමුණු කොට, මේ සත්ව යෝ කවර කලෙක්හි දුකින් මිදෙත් ද, දූන් දූන් දුකින් මිදෙන්නේ නම් යහපතැයි යනා දී වශයෙන් හටගන්නා වූ දයාව, අනුකම්පාව, හෙවත් කාරුණිකභාවය කරුණා චෛතසිකය නම් වේ.

ඇතැම් විටෙක පරදුක්ඛය ඇසූ දුටු පමණින්ම, සිතේ නොසන් සුන් භාවයක් ඇතිවී ඔහුගේ සුවය පතමින්ම ශොකයක් ද, ඇති වන්නේය. එයද ඉවසා ගත නොහී හඩන්නට ද, වැලපෙන්නට ද සැරසෙන්නේය. මේ ශොක කිරීම, කරුණාවගේ විලාසයෙන් ඇතිවන ද්වේෂයාගේ එක් ආකාරයක් බැවින් අකුසලයක්ම වන් නේය. මෙය කරුණාව වඩන්නාවූ පුද්ගලයාගේ සතුරෙකි. ශොකය හැඬීමට කරුණක් වන නමුත් කරුණාව හැඬීමට කාරණයක් නො වන්නේය. මේ ශොකය වෙදනාස්කන්ධයට ඇතුළත් වේ. කරුණා

ව සංස්කාරස්කන්ධයට අයත් ය. කරුණාව වඩන්නාවූ පුද්ගලයා ශාන්ත ගති ඇති සත්පුරුෂයෙකි. බුද්ධාදී උතුමන් ගේ විහරණ යක් බැවින් **බ්‍රහ්ම විහරණයක්** ද වන්නේය.

## මුදිතාව (24)

මුදිතා චෛතසිකය වනාහී අප්‍රමාණ වූ ද, සුඛිත වූ ද සකල සත්ත්ව ප්‍රඥප්තිය අරමුණු කොටගෙන, සතුටු වීම් ආකාරයෙන් පවත්නාවූද, පරසම්පත දකින, අසන කල්හි සිත්හි හටගන්නාවූද එයට අනුකූල වූ ආකාරය හෙවත් ඊෂ්‍යාවට ප්‍රතිපක්ෂ වූද සවභාවයකි. තම දූ දරු, නෑදෑ හිත මිතුරු ආදීන් ගේ යස ඉසුරු සැප සම්පත් ආදිය දැකීමෙන් ඇසීමෙන් ඇතිවන සතුටු ආකාරය ලොභයාගේම විශෙෂයක් මුත් කුසල චෛතසිකයක් වූ මුදිතාව නොවන්නේ ය. සීමා රහිත වූද, දස දිග්හි වසන සුඛිත සත්ත්ව ප්‍රඥප්තිය අරමුණු කොට විශෙෂ විභාගාදිය නොසළකා ඔවුන්ගේ සුඛිත භාවය පිළිබඳව ඇති වන්නාවූ සතුටුවන ආකාරයම මුදිතා චෛතසිකය වන බව දත යුතුයි.

## පඤ්ඤින්ද්‍රිය (25)

අරමුණ තත්වාකාරයෙන් හෙවත් ඇති සැටියෙන් දැන ගන්නා සවභාවය **පඤ්ඤින්ද්‍රිය** නම් වේ. මොහයට ප්‍රතිපක්ෂ වූ ද, නිවැරදි ලෙස ආරම්මණයන් ගනු ලබන්නා වූද, හෙවත් සත්‍ය වශයෙන් ආරම්මණ තත්වය ගැනීමට උපකාරවන්නා වූද, මේ සවභාවයට **අමෝහය** යයි ද, **විද්‍යාව** යයි ද, **ප්‍රඥව** යයි ද කියනු ලැබේ. ඒ ඒ වස්තූන්ගේ විශෙෂ ලක්ෂණ හා අනිත්‍ය, දුක්ඛ, අනාත්මාදී සාමාන්‍ය ලක්ෂණ පිළිබඳ දැනීම අමොහයේ ලක්ෂණයෝයි. යමක ඇති සැටි අවබොධ කිරීමේ දී අධිපති වන බැවින් **පඤ්ඤින්ද්‍රිය** යයි ව්‍යවහාර වේ. මේ **පඤ්ඤින්ද්‍රිය** චෛතසිකය ඤාණසම්ප්‍රයුක්ත සොභන සිත්හි යෙදෙමින් පළපුරුදු මාර්ගදෙශකයෙකු මෙන් මුළා නොවී ආරම්මණයාගේ ඇති තත්වයම දක්වන්නේය. දක්ෂ දුනුවායෙකු සණ වෘක්ෂාදිය විනිවිද යන ලෙස ඊය විදින්නාක් මෙන් **පඤ්ඤින්ද්‍රිය** ද සියළු ධර්මයන් විනිවිද පවතින්නේ ය. අන්ධකාරය දුරු කොට වස්තු ආලෝක කරන පහනක් මෙන් මොහයෙන් වැසී තිබෙන, ආරම්මණයාගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්මාදී, සවභාවයන් මනාකොට

අවබෝධ කරන්නේය. චතුස්සත්‍යය අවබොධ කරන්නේත් ලොකෝත්තර සිත්හි යෙදෙන මේ **පඤ්ඤින්ද්‍රියමය**. චතුස්සත්‍යය නොදන්නාහට **දුෂ්ප්‍රාඥයා** යයි ද, චතුස්සත්‍යය දන්නා හට **ප්‍රාඥයා** යයි ද ව්‍යවහාර වේ.

**පඤ්ඤින්ද්‍රිය** හෙවත් **ප්‍රඥව** සත්ත්වයාහට ඇති රත්නයකි. හෙවත් මහාසාර ධනයෙකි. හැම කෙලෙසුන්ගෙන්ම පිරිසිදු වී රහත් වන්නේත් මේ ප්‍රඥව හේතුකොට ගෙනමය.

පටිසන්ධියත් සමග ලැබූ **ප්‍රඥ බීජය** හෙවත් **ජාති ප්‍රඥව**, පූර්ව ජන්මයන්හි දහම් ඇසීම, නිරවද්‍ය විද්‍යා ඉගෙණීම, යොනිසොමනසිකාරය, ධර්මය මෙනෙහි කිරීම, පණ්ඩිත සත් පුරුෂ ආශ්‍රය යනාදී කුසල හේතුන්ගේ විපාක වශයෙන් ලැබෙන ත්‍රිහේතුක ප්‍රතිසන්ධිකවූ සත්ත්වයාටම ලැබෙන්නේය. දිව්‍ය මනුෂ්‍යාදීන්ට මේ ප්‍රඥා බීජය ලැබෙන්නේ වී නමුත් තිරිසනුන්ට හා නිරිසතුන්ට ද නොලැබෙන් නේය. ඔවුන්ට ජන්මයෙන් ලැබී ඇත්තේ **සංඥ**, **විඤ්ඤාණ** හෙවත් හැඟීම හා දැනීම යන දෙක පමණකි. එබැවින් ඔවුන්ගේ සිත් සතන්හි නුවණ වැඩීය හැකි නොවේ. **ජාති ප්‍රඥව** හෙවත් **ප්‍රඥ බීජය** ඇති පුද්ගලයා හට නුවණ වැඩීම් වශයෙන් ප්‍රඥව දියුණු කළ හැකි වේ. මෙසේ දියුණු කළ කල්හි **ප්‍රඥ**, **විද්‍යා**, **දර්ශන** ද, **සම්මා**, **දිට්ඨි**, **විජ්ජා**, **ධම්මවිචය සම්බොජ්ඣඞ්ග**, **පඤ්ඤින්ද්‍රිය**, **පඤ්ඤාබල** **විමංසිද්ධිප්පාද** ආදිය ද ලැබෙන්නේය.

**විඥන**, **සංඥ**, **ප්‍රඥ** වන්හි වෙනස ද දත යුතුයි. ඒ ඒ දෙරටුවලට හමුවන අරමුණු ඇතුළට ගෙන යන්නාක් මෙන් දනෙන කෘත්‍යය කරන්නේ **විඥනය** හෙවත් **චිත්ත** යයි. සදෙරින් ගන්නා ලද අරමුණෙහි ලකුණු මාත්‍රයක් හෙවත් නැවත හැඳිනීමට සටහන් ගන්නාක් වැනි පැවැත්ම නම් වූ හැඟීම, **සංඥ** නමි. මෙහිදී ලකුණු තතු සේ ගැනීමට **යථාව සඤ්ඤා** යයිද, නොතතු සේ ගැනීමට **විපරිත සඤ්ඤා** යයි ද කියනු ලැබේ. සදෙරට හමුවූ අරමුණු ඇති සැටියටම හෙවත් තත්වාකාරයෙන්ම අවබෝධ කරන්නාවූ චෛතසිකය **ප්‍රඥ** නමි. ප්‍රඥව යෙදුන සිතෙහි හෙවත් ඤාණසම්ප්‍රයුක්ත කුසල් සිතෙහි, අරමුණු **සංඥවෙන්** හැඳින, **විඤ්ඤාණයෙන්** දැන, **ප්‍රඥයෙන්** ඇති තතු හෙළිවේ. එබැවින් **ප්‍රඥව** ආලෝකයක් මෙනැයි කියනු ලැබේ.

**ඥාන බීජය** ලත් පුද්ගලයා හට තම ඥානය ක්‍රමවත්ව වැඩීම නොකළහොත් එයින් ඵල ලබාගත නොහැකි වන්නේය. සියල් ලන්ගේම **ඥාන බීජයෝ** සමාන නොවෙති. උත්පත්තියෙන්ම පෙර ජාතීන්හි පුරුද්දෙන්ම ආ වාසනා හේතුවෙන් එකිනෙකාගේ හුරු බව එකී එකී විෂයෙහි බැවින් තම තමන්ට හුරුවූ විෂයෙක්හිම නුවණ වැඩීමෙන් ඒ ඒ විෂයෙහි විශෙෂඥ විය හැකි වේ. ඒ ඒ පසට සරිලන වැවිලි, ඒ ඒ බිමෙහි වැවීමෙන් සරු ඵල ලබන්නාක් මෙනි. මෙසේ ක්‍රමයෙන් නුවණ වැඩීමෙන් **සර්වඥතා ඥානය** දක්වා දියුණු කළ හැකිය.

**ශ්‍රද්ධාවත්, සමාධියත්, වීර්‍ය්‍යයත්,** ප්‍රඥා වැඩීමට උපකාර වේ. එය ද සමතත්වයෙන්ම තිබිය යුතුය. **ශ්‍රද්ධාව වැඩි වී නුවණ** මදවී නම් **මුග්ද ප්‍රසන්නයෙක්** වෙයි. නුවණ වැඩිවී **ශ්‍රද්ධාව** අඩු වී නම් **කෛරාටිකයෙක් වේ. සමාධිය** අඩුව **වීර්‍ය්‍ය** වැඩිවී නම් නොසන් සුන් බවට හ! උදහස් බවට ද යට වේ. **සමාධිය** වැඩිවී **වීර්‍ය්‍යය** අඩුවී නම් කුසිත භාවයට යට වේ. එබැවින් මේ ඉන්ද්‍රියයන්ගේ සම තත්වය, නිසි ලෙස නුවණ වැඩීමට හේතුවේ.

**ලෞකික ඥානය, ලොකොත්තර ඥානය** යයි ඥාන දෙකෙකි. ශිල්ප, ශාස්ත්‍ර, දර්ශන, විද්‍යා ලොක තත්වය ආදිය පිළිබඳව දැනීම **ලෞකික ඥානය** වේ. චතුරාර්‍ය්‍ය සත්‍යාව බොධය **ලොකොත්තර ඥානයෙන්** සිදුවේ. ශිල්ප ශාස්ත්‍රාදීන් පිළිබඳව විශෙෂ උසස්දැනීමක් ඇති වීමට ද ජාති ප්‍රඥාව තිබිය යුතුයි. ජාති ප්‍රඥාව හෙවත් ප්‍රඥා බීජය නැති කල්හි ලෞකික ධ්‍යානාදි උසස් ඵල ලබා ගැනීමට නොහැකි වුවත් බොහෝ උත්සාහ කළහොත් සවල්ප ඵලයක් ලබාගත නො හැකි වන්නේ නැත. මේ භවයෙහි අහේතුක ප්‍රති සන්ධි ලැබූයේ වී නමුත් පෙර ජාතීන්හි කළ කුසල් ඇති හෙයින් කල්‍යාණ මිත්‍ර සේවනය ආදී වශයෙන් උපකාර ලැබීමෙන් ප්‍රමාණ වත් ඥාණයක් ලබා ගැනීමට හැකි වේ. මෙසේ කිරීමෙන් මතු භවයන්හි ඵල ලැබීම පිණිසත් නුවණ දියුණුකරගත හැකි වන්නේය. සරු බීජය සරු කෙතක වපුරා මනාව රැක ගැනීමෙන් සරු ඵල ලැබෙනු මිස නිසි කල විධි ලෙස නො වැපුරුවහොත් ඵල නො ලැබෙන්නේ ය. ලෞකික ප්‍රඥාව චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ නො කරන්නේ වී නමුත්, නිර්වාණාවබොධයට බලවත් උපනිශ්‍රයක් වන්නේය.

මේ ලෞකික ඥානය වුවත් ඉතා දීර්ඝ කාලයක් ඒ ඒ භවයන්හිදී නිසි ලෙස වැඩීමෙන් දියුණු කරගත යුතු වේ. නුවණ වැඩීමට උපකාරවන කරුණු මහත් රාශියකි. කුඩා කල පටන් ම ඥානය වැඩීමේ අගය දැන එය වැඩීමට උත්සාහ කළ යුතුයි. කාලය මොහොතක්වත් අපතේ නොයවා පත් පොත් බැලීම් ආදියෙහි නිතර යෙදිය යුතු වේ. උගතුන්ගෙන් අසා දැන, ඇසූ දුටු දේ එකක් එකක් පාසා කරුණු සහිතව විමසා බලන්නට ද පුරුදු විය යුතුයි. යමක් ගැන සිතන කල්හි සිත විසිර යන්නට ඉඩ නොදී එහිම සිත පවත්වා ගැනීමට ද, සිත් සතන් නොයෙක් අරමුණුවල විසිරෙන්නට හේතුවූ පැවැත්මෙන් තොරව, චාම් පැවැතුම් ඇති කෙනෙකු වීමට ද උත්සාහ කළ යුතුයි. දූ කෙලි ආදියෙන් වැළකී දෙඩමලු නොවී, අනුන් දෙස් නො සොයා, අර්ථය පිණිසම ක්‍රියා කිරීම ද, නිදිබර නොවී, කලට වේලාවට කටයුතු කිරීම ද, උගතුන් සේවනය කිරීම ද, අනවශ්‍ය විතර්ක අඩු කිරීම ද, නින්ද, ප්‍රශංසා, සතුරුකම් ආදිය අමතක කිරීම ද, පළිගැනීම්, ඊර්ෂ්‍යා කිරීම් ආදියෙන් කුඩා කල්හි සිටම වෙන් වීමද, ලාභ අලාභ ආදියෙහිද උපෙක්ෂක භාවය වැඩීමද, ඉගෙන ගත් දෙය අමතක විය නොදී නැවත නැවත සිහි කිරීම ද යනාදී කරුණු ඥානයාගේ වැඩීමට උපකාර වන්නේය.

මේ පඤ්ඤින්ද්‍රිය චෛතසිකය හෙවත් ඥානය, කාම සොභන සිත් අතුරෙන් ඤාණසම්ප්‍රයුක්ත සිත් දොළොසෙහි ද, මහග්ගත සිත් විසිහතෙහි ද, ලොකොත්තර සිත් අටෙහි ද යෙදෙන්නේය. නුවණින් යෙදී දන ශීලාදී සියළුම පින්කම් කරණ කල්හි ඇතිවන කාමාවචර කුසල් සිත්හි මේ ඤාණය යෙදෙන්නේ ය. එමෙන් ම නිරවද්‍ය ශාස්ත්‍රාදිය ඉගෙණ ගන්නාකල්හි ද, මෙනෙහි කරණ කල්හි ද නුවණ යෙදෙන්නේ ය. මෙකී ලෞකික ශාස්ත්‍රඥානය ද තමාගේ හෝ අනුන්ගේ අයහපත සඳහා යොදවන කල්හි කුසල් සිත් ඇති නොවන්නේය. ඇතැම් පුද්ගලයෝ දස අකුසල් ආදිය කරන කල්හි ඉතා තීක්ෂණ බුද්ධියකින් මෙන් නොයෙක් උපක්‍රම යොද සත්ත්ව ඝාතනය, අදත්තාදනය, මුසාවාදය, සම්ඵප්පලාපය, ආදිය කරන්නේය. එය ඤාණය නොව අකුසල් කිරීමෙහි දක්ෂ බව, ශූර බව, දක්ෂිමය. කුසල් සිතකින් යහපතක් මිස අයහපතක් කිසි විටෙක සිදු නොවන්නේ ය. යහපත යහපත වශයෙන් ද, අයහපත අයහපත වශයෙන් ද, සත්‍යය සත්‍යය වශයෙන් ද අසත්‍යය අසත්‍යයා

වශයෙන්ද දැනීම ඥානය නම්. එමෙන්ම කුසලය, අකුසලය, කර්මය, කර්ම විපාකය, අතීතය, අනාගතය, එසේම ඉපැද්මට, පැවැත්මට නැවැත්මට හේතු, හේතූන් නිසා ඇතිවන ඵල යනාදිය දැනීම, නුව ණින්ම දත යුතු වේ. මෙසේ ඇති තතු දන්නා පුද්ගලයා අකුසලින් වැළකී කුසල් ම කරන්නේ ය. යම් අකුසලයක් කරන්නේ නම්, එකල් හි ඇති තතු නොදැනීමෙන්, නොවැටහීමෙන්, මුළාවී මෙන්ම කරන්නේ වේ. එබැවින් අකුසල පක්ෂයෙහි යෙදෙන දක්ෂභාවය, සූරභාවය, ඥානය යයි වරදවා නොගත යුතුයි. ශාස්ත්‍ර ඥානය අතින් ඉතා දියුණු පුද්ගලයන් අතර මිථ්‍යා දෘෂ්ටිකයෝ බොහෝ දෙනෙකි. මිථ්‍යාදෘෂ්ටිය හෙවත් වැරැදි දැකීමත් සමඟ කුසල් සිත් කිසි කලෙක හටනොගන්නේය. සම්‍යග් දෘෂ්ටිය නොවූයේ වී නමුත්, මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්ව දන් දීම, ගිලන් උපස්ථානාදි යහපත් කටයුතු කරණ කල්හි ඤාණවිප්‍රයුක්ත කුසල් සිත් ඇතිවිය හැකිය. ඤාණසම්ප්‍රයුක්ත කුසල් සිත්හි යෙදෙන ඥානය වනාහී සද්ධා සති, හිරි, ඔතප් ආදී කොට ඇති දහනවයක් සොභන සාධාරණ චෛතසිකයන් පිරිවර කොට ඇති, අනර්ථය වළක්වා අර්ථයම සළසන යහපත් වූ සොභන චෛතසිකයකි

### දෙපනස් චෛතසික ධර්ම

1. **අඤ්ඤසමාන රාශිය 13**

| | | | |
|---|---|---|---|
| (i) | සබ්බ චිත්ත සාධාරණ | 7 | 13 |
| (ii) | ප්‍රකීර්ණක | 6 | |

2. **අකුසල රාශිය 14**

| | | | |
|---|---|---|---|
| (i) | අකුසල සාධාරණ | 4 | 14 |
| (ii) | අන්‍ය අකුසල | 10 | |

3. **සොභන රාශිය 25.**

| | | | |
|---|---|---|---|
| (i) | සොභන සාධාරණ | 19 | 25 |
| (ii) | විරති | 3 | |
| (iii) | අප්පමඤ්ඤා | 2 | |
| (iv) | පඤ්ඤින්ද්‍රිය (අමෝහය) | 1 | |

## අඤ්ඤසමාන චෛතසික 13

| සබ්බ චිත්ත සාධාරණ 7 | | ප්‍රකිර්ණක 6 | |
|---|---|---|---|
| 1. | ඵස්ස | 1. | විතක්ක |
| 2. | වේදනා | 2. | විචාර |
| 3. | සඤ්ඤා | 3. | අධිමොක්ඛ |
| 4. | චේතනා | 4. | විරිය |
| 5. | ඒකග්ගතා | 5. | පීති |
| 6. | ජීවිතෙන්ද්‍රිය | 6. | ඡන්ද |
| 7. | මනසිකාරය | | |

## අකුසල චෛතසික 14

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මෝහ | අකුසල සාධාරණ (මෝහ චතුස්කය) | 8. | දෝස | දෝස චතුස්කය |
| 2. | අහිරික | | 9. | ඉස්සා | |
| 3. | අනොත්තප්ප | | 10. | මච්ඡරිය | |
| 4. | උද්ධච්ච | | 11. | කුක්කුච්ච | |
| 5. | ලෝභ | | 12. | ථීන | |
| 6. | දිට්ඨි | ලෝභ ත්‍රිකය | 13. | මිද්ධ | |
| 7. | මාන | | 14. | විචිකිච්ඡා | |

## සෝභන චෛතසික 25

### සෝභන සාධාරණ 19

| | | | |
|---|---|---|---|
| 1. | සද්ධා | 10. | කායලහුතා |
| 2. | සති | 11. | චිත්ත ලහුතා |
| 3. | හිරි | 12. | කාය මුදුතා |
| 4. | ඔත්තප්ප | 13. | චිත්ත මුදුතා |
| 5. | අලෝභ | 14. | කායකම්මඤ්ඤතා |
| 6. | අදෝස | 15. | චිත්ත කම්මඤ්ඤතා |
| 7. | තත්‍රමජ්ඣත්තතා | 16. | කායපාගුඤ්ඤතා |
| 8. | කායපස්සද්ධි | 17. | චිත්ත පාගුඤ්ඤතා |
| 9. | චිත්ත පස්සද්ධි | 18. | කායුජ්ජුකතා |
| | | 19. | චිත්තුජ්ජුකතා |

**විරති 3**

1. සම්මාවාචා 2. සම්මා කම්මන්තා 3 සම්මා අජීව

**අප්පමඤ්ඤා 2**

1. කරුණා 2. මුදිතා

**1. පඤ්ඤින්ද්‍රිය**

# චෛතසිකයන්ගේ සම්ප්‍රයොගනය

දෙපණස් චෛතසික ධර්මයන්ගේ සවභාවලක්ෂණයන් ඉගෙණ ගත් පසු, ඒ චෛතසිකයන් සිත්වල යෙදෙන්නාවූද, නො යෙදෙන්නා වූද ක්‍රමය දැන ගත යුතුය.

**සම්ප්‍රයොග නය, සංග්‍රහ නය**, යයි චෛතසිකයන් පිළිබඳව නය දෙකෙකි. එයින් සම්ප්‍රයොග නය යනු ඒ ඒ චෛතසිකයන් යෙදෙන සිත් කවරහුදයි දැක්වීමේ ක්‍රමයයි. ඒ ඒ සිත්හි යෙදෙන චෛතසික යන් දැක්වීමේ ක්‍රමයට සංග්‍රහ නය යයි කියනු ලැබේ.

**අඤ්ඤසමාන රාශිය, අකුසල රාශිය, සොභන රාශිය** යයි චෛත සිකයන්ගේ රාශි තුනෙකි. සබ්බචිත්ත සාධාරණයන් සත් දෙනා සහ ප්‍රකීර්ණකයන් සදෙනාත් යන තෙළෙස් (13) චෛතසිකයන් අඤ්ඤසමාන රාශියට ද, තුදුස් (14) අකුසල චෛතසිකයන් අකුසල රාශියට ද, පස් විසි (25) සොභන චෛතසිකයන් සොභන රාශියටද ඇතුළත් වේ.

අඤ්ඤසමාන රාශියට අයත් චෛතසිකයන් අතුරෙන් සබ්බ චිත්ත සාධාරණ සත, සියළුම එකුන් අනූවක් (89) ක් හෝ එක්සිය විසි එකක් (121) ප්‍රභෙද ඇති සිත්වල එකාන්තයෙන්ම නො අඩුවම යෙදෙත්.

**ප්‍රකීර්ණක චෛතසික සය** අසූනවයක් (89) හෙවත් එක්සිය විසි එකක් (121) ප්‍රභෙද ඇති සිත් අතුරෙන් සුදුසු පරිදි යෙදෙන්නා වූද, නො යෙදෙන්නා වූ ද සිත් ඇත්තාහ.

**තුදුස් (14) අකුසල චෛතසිකයෝ** දෙළොස් (12) අකුසල් සිත්හි සුදුසු පරිදි යෙදෙති. ඉතිරි සත්සැත්තෑ (77) සිත්හි නොයෙදෙති.

**පස්විසි (25) සොභන චෛතසිකයෝ** එකුන්සැටක් (59) සොභන සිත්හි සුදුසු පරිදි යෙදෙති. ඉතිරි සිත් තිහෙහි (30) නො ලැබේ.

**සම්ප්‍රයොග නය** ඉගෙනීමේදී සිත් සියල්ලම හොඳින් මතක තබා ගත යුතු යි. **අකුසල් සිත්** දෙළොසකි. (12) **අහේතුක සිත්** අටළොසකි. (18), **සොභන සිත්** එකුන් සැටකි. (59), සොභන සිත් අතුරෙන් **කාමසොභන සිත්** සූවිස්සකි. (24), **මහග්ගත**-සිත් සත්විස්සකි. (27), **ලොකොත්තර සිත්** අටෙකි. (8)

### අඤ්ඤසමාන චෛතසික රාශියේ සම්ප්‍රයෝග නය

### සබ්බචිත්ත සාධාරණ සත (1)

**ඵස්ස, වෙදනා, සඤ්ඤා, චෙතනා, එකග්ගතා, ජීවිතෙන්ද්‍රිය, මනසිකාරය** යන **සබ්බචිත්ත සාධාරණ චෛතසික සත**, සිත් සියල් ලෙහිම ඒකාන්තයෙන්ම ලැබෙති. මේ චෛතසිකයන් නො යෙදෙන සිතක් නැත.

### ප්‍රකීර්ණක සය

**විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද** යන **ප්‍රකීර්ණක චෛතසිකයන්** සදෙනා අසූනවයක් සිත් අතුරෙන් යෙදෙන්නා වූද නොයෙදෙන්නා වූද සිත් ඇත්තාහ. එබැවින් මේ චෛතසික සය වෙන් වෙන්ව ගෙණ යෙදෙන නො යෙදෙන සැටි විස්තර කරනු ලැබේ.

## විතක්කය (2)

**විතර්කය**, ධ්‍යානාඞ්ගයක් ද වන බැවින්,එය යෙදෙන සිත් සෙවීමේදී ලෞකික සිත් අසූඑකත්, සාමාන්‍ය ලොකොත්තර සිත් අට වෙනුවට ධ්‍යාන වශයෙන් ඇතිවන ලොකොත්තර සිත් සතලිස (40) ත් ගෙන එක්සියවිසි එකක් (121) සිත් අතුරෙන් සෙවිය යුතුයි. **විචාර, පීති** චෛතසිකයන්ට ද මෙසේ මය.

දෙපස් විඤ්ඤාණයෝ හෙවත් චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යන අහේතුක අකුසල විපාක පසත් කුසල විපාක පසත් ඉතා දුර්වල විපාක සිත් බැවින්, ඒ සිත්වල ලැබෙන්නේ සබ්බචිත්ත සාධාරණයන් සත්දෙනා පමණය. ඉතිරි පන්සාළිස් (45) චෛතසිකයන් නො ලැබෙත්. එබැවින් මේ විතර්කය සූපනස් (54) කාමාවචර සිත් අතුරෙන් දෙපස් විඤ්ඤාණ හැර ඉතිරි කාමාවචර සිත් සූසාළිසෙහි (44) ලැබෙන්නේ ය. තව ද ධ්‍යානාඞ්ගයක් වශයෙන් යෙදෙන මේ විතර්ක චෛතසිකය, ප්‍රථම ධ්‍යාන සිත්හි මිස අනිකුත් ධ්‍යාන සිත්හි නොයෙදෙන්නේය. ප්‍රථම ධ්‍යාන සිත් සියල්ල එකොළොසකි. එනම්: රූපාවචර ප්‍රථම ධ්‍යාන කුසල, විපාක, ක්‍රියා සිත් තුනය, ප්‍රථම ධ්‍යාන සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් යන ලොකොත්තර මාර්ගඵල සිත් අටය යන එකොළොසය. හැටහතක් (67) ධ්‍යාන සිත් අතුරෙන් මෙකී එකොළොස හැර ඉතිරි ධ්‍යාන සිත් සපනසෙහි (56) විතර්කය නො ලැබේ. එබැවින් විතර්කය සූසාළිස් (44) කාමාවචර සිත්හි සහ ප්‍රථම ධ්‍යාන සිත් එකොළසෙහි (11) යන පස් පනස් (55) සිත්වල යෙදෙන බවත් ඉතිරි සිත් සසැටෙහි (66) නො යෙදෙන බවත් දත යුතුයි.

## විචාරය (3)

විචාරය ද ධ්‍යානාඞ්ගයක් වන බැවින් එය යෙදෙන සිත් සෙවීමේදී එක්සිය විසි එකක් (121) වූ සිත් වලින්ම ම සෙවිය යුතුයි. කාමාවචර සිත් සූපනසෙන් (54) දෙපස් විඤ්ඤාණයන් හැර ඉතිරි සූසාළිසෙහි (44) ද, ධ්‍යාන සිත් හැටහතෙන් (67) පළමු, දෙවන ධ්‍යාන සිත් දෙවිස්සෙහි ද (22) යන සිත් හැට හයෙහි (66) මේ විචාර චෛසිකය යෙදෙන්නේ ය. ඉතිරි පස්පනස් (55) චිත්තයන්හි නො ලැබේ.

## අධිමොක්ඛය (4)

**අධිමොක්ඛයත්, විචිකිච්ඡාවත්** එකිනෙකට විරුද්ධ ධර්මයෝයි. එහෙයින් අධිමොක්ඛය යෙදෙන කල්හි විචිකිච්ඡාවත්, විචිකිච්ඡාව යෙදෙන කල්හි අධිමොක්ඛයත් නොයෙදෙන්නේ ය. විචිකිච්ඡාව යෙදෙන්නේ මොහමූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි පමණකි. එබැවින් විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි අධිමොක්ඛය නො ලැබේ.

කාමාවචර සිත් අතුරෙන් විචිකිච්ඡා සිතත් දෙපස් විඤ්ඤාණ සිත් දසයත් යන සිත් එකළොසෙහි අධිමොක්ඛය නො ලැබේ. ඉතිරි සිත් අට සැත්තෑවෙහි (78) අධිමොක්ඛය ලැබෙයි.

## විරිය (5)

අටලොස් අහේතුක සිත් අතුරෙන් දෙපස් විඤ්ඤාණයෝය, පඤ්චද්වාරාවර්ජනය, සම්පටිච්ඡන දෙක සහ සන්තීරණ තුන ප්‍රසාද වස්තූන්හි අරමුණු ගැටුණු කල්හි, චිත්ත නියාමය පරිදි වීර්‍ය්‍යයක් නොමැතිව හටගන්නා බැවින් මේ සිත් සොළොසෙහි වීර්‍ය්‍ය චෛතසිකය හට නොගන්නේ ය. ඉතිරි තෙසැත්තෑ (73) සිත්වල වීර්‍ය්‍යය යෙදෙයි.

## ප්‍රීතිය (6)

**ප්‍රීතිය** ද, ධ්‍යානාඞ්ගයක් වන බැවින් එක්සිය විසිඑකක් සිත් අතුරෙන් මේ චෛතසිකය යෙදෙන සිත් සෙවිය යුතුයි. සොම නස්සය ඇති කල්හිම ප්‍රීතිය හටගනී. දෙමනස්ස, උපෙක්ඛා, චිත්තයන්හි ප්‍රීතිය නො ලැබෙන්නේ ය. සොමනස්සය යෙදෙන සිත් සියල්ල එක්පනසෙකි. (51)එනම්:–දෙළොස් අකුසල් සිත් අතුරෙන් ලොභමූල සොමනස්ස සිත් සතරෙකි. (4). අටළොස් අහේතුක සිත් අතුරෙන් සොමනස්ස සිත් දෙකෙකි. (2). එනම් සොමනස්ස සන්තීරණය සහ සොමනස්ස හසිතුප්පාදය යන දෙකය. සූවිසි කාමසොභන සිත් අතුරෙන් සොමනස්ස සිත් දෙළොසෙකි. (12). හැට හතක් ධ්‍යාන සිත් අතුරෙන් ප්‍රථම ධ්‍යාන, දුතියධ්‍යාන තතියධ්‍යාන සිත් තෙතිසය. (33). මේ එක් පනස් චිත්තයන් හැර ඉතිරි සිත් සැත්තෑවෙහි (70) ප්‍රීතිය නො ලැබෙන්නේය.

### ඡන්දය (7)

**ඡන්ද චෛතසිකය** අටළොස් අහේතුක සිත්හි සහ මොහ මූල දෙසිතෙහි ද යන විසි (20) චිත්තයන්හි නො යෙදෙන්නේය. ඉතිරි සිත් එකුන්සැත්තෑවෙහි ම (69) යෙදෙයි.

**ඡන්දය** යයි කියනුයේ කරනු කැමැත්තටය. අහේතුක සිත් සියල්ලෙහිම කරුණු කැමැත්තක් නැති බැවින් ඡන්දය නො යෙදෙන බව දත යුතුයි. එමෙන්ම මොහමූල දෙසිතෙහි ද, මොහය අධික බැවින්, නොසන්සුන් බවත් අවිනිශ්චිත භාවයත් ඇති කල්හි, කැමැත්තක් ඇති නො වන්නේය. එබැවින් මොහමූල දෙසිතෙහි ද ඡන්දය නො යෙදෙන්නේ ය. මෙසේ අඤ්ඤසමාන චෛතසිකයන් නය හෙවත් ක්‍රම සතකින් ඒ ඒ සිත් හා යෙදීම හෝනො යෙදීම වන්නේය.

සැකෙවින් මේ අන්‍යසමාන චෛතසිකයන්ගේ සම්ප්‍රයොග නය සත මෙසේ දත යුතුයි. (213 පිටුව බලනු)

### අකුසල චෛතසික රාශියේ සම්ප්‍රයොග නය

අකුසල රාශියට අයත් චෛතසිකයන් තුදුසෙකි. (14) අසූනව යක් (89) සිත් අතුරෙන්, මේ තුදුස් (14) අකුසල චෛතසිකයෝ අකුසල් සිත් දෙළොසෙහි මිස, ඉතිරි සිත් සත්සැත්තෑවේ (77) නො ලැබේ. එබැවින් අකුසල චෛතසිකයන් යෙදෙන සිත් සෙවීමේදී මේ අකුසල් සිත් දෙළොසෙන් කවර නම් අකුසල් සිතක යෙදේද, කවර සිතක නො යෙදේදැයි සෙවිය යුතුය.

### මොහ චතුස්කය (1)

**මොහය, අහිරිකය, අනොත්තප්පය, උද්ධච්චය** යන චෛතසික සතරට මොහ චතුස්කය යයි කියති. මේ චෛතසික සතර දෙළොස් අකුසල් සිත්හි ඒකාන්තයෙන් ම යෙදෙන බැවින් අකුසල සාධාරණ යෝ යයි ද ව්‍යවහාර වේ. අටළොස් අහේතුක චිත්තයන්හි ද එකුන් සැට සොභන සිත්හි ද යන සත්සැත්තෑ (77) සිත්හි නොයෙදෙන්නාහ.

## ලොභ ත්‍රිකය (2)

**ලොභය, දිට්ඨිය, මානය** යන චෛතසික තුන **ලොභ ත්‍රිකය** නම්. දොළොස් අකුසල චිත්තයන් අතුරෙන් ලොභ මූල සිත් අටෙහි මිස, දෙෂමූල මොහමූල සිත් සතරෙහි නො යෙදේ. එයින් ලොභය, ලොභ මූල සිත් අටෙහි නියත වශයෙන්ම යෙදෙන්නේය. **දිට්ඨි චෛතසිකය** දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි නියතය. **මානය, දිට්ඨිය** මෙන්ම බලවත් අකුසලයක් බැවින්, මේ චෛතසික දෙක එක සිතක නො යෙදේ. **මානය,** දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි අනියත වශයෙන් යෙදෙන්නේය. සෑම දිට්ඨිගත විප්පයුත්ත සිතකම **මානය** නො යෙදෙන බවත්, මානය යෙදෙන්නේත් දිට්ඨිගත විප්පයුත්ත සිතක මිස අන් සිතක නොවන බවත් දත යුතුයි. අටළොස් අහේතුක සිත් හා එකුන් සැට සොභන සිත්හි ද ලොභ ත්‍රිකය නොයෙදේ.

## දෙස චතුස්කය (3)

**දෙසය, ඉස්සාවය, මච්ඡරිය, කුක්කුච්චය** යන චෛතසික සතරට දෙස චතුස්කය යයි කියති. දොළොස් අකුසල චිත්තයන් අතුරෙන් දෙසමූල සිත් දෙකෙහි පමණක් මේ දෙස චතුස්කය යෙදෙන්නේය. ඉතිරි සිත් අසූහතෙහි (87) නො යෙදේ. මේ චෛතසික සතර, සිත් දූෂ්‍ය කරවන ධර්මයෝයි. **ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච** යන තුන **දෙසයත්** සමඟ යෙදෙනු මිස දෙසය නැතිව නො යෙදෙන්නාහ. හැම දෙස සිතකම **ඉස්සා, මච්ඡරිය, කුක්කුච්චයන්** නොයෙදේ. මේ තුන එක්වරම එක සිතක නො යෙදේ. යෙදෙතොත් වෙන් වෙන්වම දෙසයත් සමඟ දෙස මූල සිතකම යෙදේ. එබැවින් **ඉස්සා, මච්ඡරිය, කුක්කුච්චය** යන චෛතසික තුන දෙස මූල සිත් දෙකෙහි අනියත යොගී වන්නේය. **දෙසය** නියත යොගී වේ.

## ථිනය සහ මිද්ධය (4)

**ථිනයත් මිද්ධයත්** එකටම උපදින, වෙන් කළ නොහැකි අකුසල ධර්මයෝයි. දොළොස් අකුසල් සිත් අතුරෙන් සසංඛාරික අකුසල් සිත් පසෙහි පමණක් අනියත වශයෙන් යෙදෙන්නේය. මේ චෛතසික දෙක අකර්මණ්‍යභාවය හෙවත් කටයුත්තෙහි යොග්‍ය නොවන ස්වභාවය ඇති හෙයින් අසංඛාරික අකුසල් සිත්හි නො යෙදේ.

අහේතුක අටළොස සහ සොභන පනස්නවයෙහි ද නො ලැබේ. සසංඛාරික අකුසල් සිත් පස නම්, ලොභමූල සතරත් දෙසමූල එකත් යන පසය. ඉතිරි අකුසල් සත අසංඛාරිකය. සියළුම සසංඛාරික අකුසල් සිත්වල ථීනයත් මිද්ධයත් නො යෙදෙන බවද, යෙදෙතොත් මේ සසංඛාරික සිත් පසෙහි මිස අන් සිතක නො යෙදෙන බවද දත යුතුයි.

## විචිකිච්ඡාව (5)

විචිකිච්ඡා චෛතසිකය දෙළොස් අකුසල චිත්තයන් අතුරෙන් එකම මොහමූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි පමණක් නියත වශයෙන් යෙදෙන්නේය. ඉතිරි සිත් අසූ අටෙහි නො ලැබේ.

අකුසල රාශියට අයත් තුදුස් චෛතසිකයන් මෙසේ නය හෙවත් ක්‍රම පසෙකින් ඒ ඒ දෙළොස් අකුසල් සිත්හිම යෙදෙන බව දත යුතුයි. සැකෙවින් මේ අකුසල චෛතසිකයන්ගේ සම්ප්‍රයෝග නය මෙසේයි.

| නය | චෛතසික | යෙදෙන සිත් | නොයෙදෙන සිත් |
|---|---|---|---|
| 1 | මෝහ චතුස්කය | අකුසල් සිත් 12 | අකුසල් 12 හැර ඉතිරි 77 |
| 2 | ලොභ ත්‍රිකය | ලොභමූල සිත් 8 | ලොභමූල 8 හැර ඉතිරි 81 |
| 3 | දෙස චතුස්කය | දෙසමූල සිත් 2 | දෙසමූල 2 හැර ඉතිරි 87 |
| 4 | ථීනය සහ මිද්ධය | සසංඛාරික අකුසල් 5 | සසංඛාරික 5 හැර ඉතිරි 84 |
| 5 | විචිකිච්ඡාව | මොහමූල විචිකිච්ඡා සිත 1 | විචිකිච්ඡා සිත හැර ඉතිරි 88 |

## සොභන චෛතසික රාශියේ සම්ප්‍රයොගනය

සොභන රාශියට අයත් චෛතසිකයෝ විසිපස්දෙනෙකි. එයින් එකුන්විසි (19) දෙනෙක් **සොභන සාධාරණයෝය**. තිදෙනෙක් **විරතියෝය**. දෙදෙනෙක් **අප්‍රමාණ්‍යයෝය**. ඉතිරි චෛතසිකය

**අමොහය** හෙවත් **පඤ්ඤින්ද්‍රිය** වේ. මේ සොභන චෛතසිකයන් ගේ සම්ප්‍රයොග නය සතරෙක් වේ.

සොභන චෛතසිකයෝ එකුන්සැටක් (59) සොභන සිත්හි මිස අන් සිතක නොලැබේ. එබැවින් සොභන චෛතසිකයන් යෙදෙන සිත් සෙවීමේ දී සොභන සිත් පනස් නවයෙන් පිටත නො සෙවිය යුතුයි.

## සොභන සාධාරණ චෛතසික (1)

**සද්ධා**, සති ආදී වූ එකුන්විසි (19) සොභන චෛතසිකයෝ එකුන් සැටක් (59) වූ සොභන සිත්හි ඒකාන්තයෙන්ම නො අඩුවම ලැබෙන්නාහ. සොභන සිත් පනස්නවය (59) නම්:–කාමසොභන සිත් සූවිස්සය (24), මහග්ගත සිත් සත්විස්සය (27). ලොකොත්තර සිත් අටය(8)

අසොභන සිත් තිහෙහි (30) සොභන චෛතසිකයෝ නො ලැබේ.

## විරතිත්‍රය (2)

**සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව** යන චෛතසික තුන **විරතිත්‍රය** නම්. මේ විරති චෛතසික තුනම ශීල විසුද්ධිය සම්පූර්ණ කරමින් ලොකොත්තර සිත් අටෙහි නියත වශයෙන්ම යෙදෙන්නාහ. කාමාවචර මහා කුසල සිත් අටෙහි වෙන් වෙන්ව අනියත වශයෙන් යෙදෙති. ශීලමය පුණ්‍යකර්මයක් සිදුවන කල්හි පමණක් මේ විරතීහු යෙදෙන බැවින් අනිකුත් පින්කම් කරන කල්හි ඇති වන කුසල් සිත්හි ද, විපාක, ක්‍රියා සිත්හි ද නො ලැබේ. එබැවින් මේ විරති චෛතසිකයෝ ලොකොත්තර සිත් අටෙහි නියත වශයෙන් ද, මහා කුසල් සිත් අටෙහි අනියත වශයෙන් ද යෙදෙන බවත් ඉතිරි සිත් තෙසැත්තෑවෙහි (73) නො යෙදෙන බවත් දත යුතුයි.

## අප්පමඤ්ඤා (3)

**අප්‍රමාණ්‍ය ධර්මයන් වූ කරුණා, මුදිතා** යන චෛතසික දෙක අනන්ත වූ සත්ත්ව ප්‍රඥප්තිය අරමුණු කරමින් ඇති වන්නා වූ කුසල ධර්මයෝයි. **කරුණා, මුදිතා** ධර්මයන් වඩන්නා වූ කල්හි ඇතිවන සොභන චිත්තයෝ නම්:– කාමාවචර මහා කුසල් සිත් අටය, මහා ක්‍රියා සිත් අටය, රූපාවචර ප්‍රථම ධ්‍යාන සිත් තුනය, ද්‍රුතියධ්‍යාන සිත් තුනය, තතිය ධ්‍යාන සිත් තුනය, චතුර්ථධ්‍යාන සිත් තුනය යන යන අටවිසි (28) සොභන චිත්තයෝය. මේ සිත් විසි අටෙහි කරුණා, මුදිතා ධර්ම වඩනා කල්හි පමණක් මේ චෛතසික දෙක අනියත වශයෙන් යෙදෙන්නාහ. ඉතිරි සිත් එක්සැටෙහි (61) අප්‍රමාණ්‍යයෝ නො ලැබේ.

කාමාවචර විපාක සිත් අට සුඛිත්දුක්ඛිත සත්ත්වප්‍රඥප්තිය අරමුණු නො කරන බැවින් කරුණා, මුදිතා දෙක ඒ විපාකසිත් අටෙහි නො ලැබේ. ධ්‍යාන සිත් අතුරෙන් රූපාවචරපඤ්චමධ්‍යාන සිත් තුනත්, අරූපාවචර සිත් දොළොසත් යන පසළොස් චිත්තයන්හි උපෙක්ඛාව යෙදෙන බැවින් කරුණා, මුදිතා දෙක ඇති නොවේ. ලොකොත්තර සිත් අට නිර්වාණය අරමුණු කිරීම හැර සත්ත්ව ප්‍රඥප්තියක් අරමුණු නො කළ හැකි බැවින්, අප්‍රමාණ්‍ය ධර්මයෝ ලොකොත්තර සිත් අටෙහි නොයෙදෙන්නාහ.

## පඤ්ඤින්ද්‍රිය (4)

සොභන සිත් පනස්නවය (59) අතුරෙන් පඤ්ඤින්ද්‍රිය චෛතසිකය යෙදෙන්නේ ඤාණ සම්ප්‍රයුක්ත සිත්හි පමණය. කාමසොභන ඤාණ විප්‍රයුක්ත සිත් දොළොස හැර ඉතිරි සොභන සිත් හතළිස් හත (47) ඤාණසම්ප්‍රයුක්තය. අසොභන සිත් තිහෙහි (30) කිසි සේත් නො ලැබේ. එබැවින් පඤ්ඤින්ද්‍රිය චෛතසිකය සොභන ඤාණසම්ප්‍රයුක්ත සිත් හතළිස්හතෙහි (47) යෙදෙන බවත්, ඉතිරි සිත් හතළිස් දෙකෙහි (42) නො යෙදෙන බවත් දත යුතුය.

සොභන රාශියට අයත් චෛතසිකයන් මෙසේ නය හෙවත් ක්‍රම සතරකින් ඒ ඒ සොභන සිත්හි යෙදෙති. සැකෙවින් සොභන රාශියට අයත් පස්විසි චෛතසිකයන්ගේ සතර සම්ප්‍රයෝග නය මෙසේ දත යුතුයි.

| නය | චෛතසිකය | යෙදෙන සිත් | නොයෙදෙන සිත් |
|---|---|---|---|
| 1 | සොභන සාධාරණ | සොභන සිත් 59 | අසොභන සිත් 30 |
| 2 | විරතිත්‍රය | ලොකොත්තර 8<br>මහා කුසල් 8<br>} 16 | අසොභන 30<br>මහා කුසල් 8 ත්<br>ලොකොත්තර 8 ත්<br>හැර ඉතිරි සොභන 43<br>} 73 |
| 3 | අප්පමඤ්ඤා | මහා කුසල් 8<br>මහා ක්‍රියා 8<br>ප්‍රථම ධ්‍යාන 3<br>දුතිය ධ්‍යාන 3<br>තතිය ධ්‍යාන 3<br>චතුත්ථ ධ්‍යාන 3<br>} 28 | අසොභන 30<br>මහා විපාක 8<br>පඤ්චමධ්‍යාන 15<br>ලොකොත්තර 8<br>} 61 |
| 4 | පඤ්ඤින්ද්‍රිය | කාම සොභන ඤාණසම්ප්‍රයුක්ත 12<br>මහග්ගත 27<br>ලොකොත්තර 8<br>} 47 | අසොභන 30<br>කාමසොභන ඤාණවිප්‍රයුක්ත 12<br>} 42 |

# නියතානියත යොගී චෛතසිකයෝ

චෛතසිකයන්ගේ සම්ප්‍රයොග නය දක්වන කල්හි ඇතැම් චෛතසිකයෝ සමහර සිත්හි නියත වශයෙන් ද, ඇතැම් චෛතසික යෝ අනියත වශයෙන්ද යෙදෙන බව පෙන්වා දෙන ලදී. යම් යම් සිත්හි යෙදෙන චෛතසිකයෝ ඒ ඒ සිත්හි ස්ථිර වශයෙන්ම යෙදෙන් නේ නම්, ඒ චෛතසිකයන්ට **නියතයොගී** චෛතසිකයෝ යයි කියනු ලැබේ. ඇතැම් සිතෙක් සමහර විටෙක යෙදී සමහර විටෙක චෛතසිකයන්ට **අනියතයොගී** චෛතසිකයෝ කියති. නො යෙදෙන

තෙළෙස් **අන්‍යසමාන චෛතසිකයෝ** යෙදෙන සිත්හි නියත වශයෙන් ම යෙදෙන බැවින් නියතයොගී වේ.

**තුදුස් අකුසල චෛතසිකයන්** අතුරෙන් **මොහ චතුස්කය**, **ලොභය**, **දිට්ඨිය**, **දෙසය**, **විචිකිච්ඡාව** යන අට තමන් යෙදෙන අකුසල් සිත්හි නියත වශයෙන් ම යෙදෙන හෙයින් **නියතයොගී** නම් වේ. ඉතිරි සය, එනම් **මානය**, **ඉස්සාව**, මච්චරිය, **කුක්කුච්චය**, **ථිනය** සහ **මිද්ධය** **අනියත යොගී** වේ. **මානය**, තමා යෙදෙන සිත්හි කිසි විටෙක යෙදෙයි. , කිසි විටෙක නො යෙදෙයි. **ඉස්සා, මච්ඡරිය,** කුක්කුච්චය යන චෛතසික තුන තමන් යෙදෙන සිත්හි කිසි විටෙක වෙන් වෙන්ව යෙදේ. ථිනය සහ මිද්ධය, හැම විටම එක්වම තමන් යෙදෙන සිත්හි කිසි විටෙක යෙදෙයි. , කිසි විටෙක නො යෙදෙයි.

පස්විසි **සොභන චෛතසිකයන්** අතුරෙන් එකුන්විසි (19) සොභන **සාධාරණ චෛතසිකයෝ** සියළුම සොභන සිත්හි යෙදෙන බැවින් **නියත** යොගී වේ. **විරතිත්‍රය** සහ **අප්පමඤ්ඤා** දෙක යන චෛතසිකයෝ පස්දෙනා **අනියත** යොගී වේ. තමන් යෙදෙන සොභන සිත්හි කිසි විටෙක වෙන් වෙන්ව යෙදෙන්නේය. **පඤ්ඤින්ද්‍රිය** චෛතසිකය ද, තමා යෙදෙන සිත්හි ස්ථිරව යෙදෙන හෙයින් **නියතයොගී** වේ. **ලොකොත්තර සිත්හි විරතිත්‍රය නියතයොගී** වේ.

සැකෙවින් මේ **නියතානියත** යොගය මෙසේ දත යුතුයි.

| චෛතසික | නියත යොගී | අනියත යොගී |
|---|---|---|
| අන්‍යසමාන 13 | තමන් යෙදෙන සිත්හි නියතය | නැත |
| අකුසල | මොහ චතුස්කය 4, ලොභය හා දිට්ඨිය 2, දොසය 1, විචිකිච්ඡාව 1 } 8 තමන් යෙදෙන සිත්හි නියතය | ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන තුන තමන් යෙදෙන සිත්හි කිසි විටෙක වෙන් වෙන්ව යෙදෙයි. මානය, තමා යෙදෙන සිත්හි කිසි විටෙක යෙදෙයි. ථීනය සහ මිද්ධය, හැම විටම එක්වම තමන් යෙදෙන සිත්හි කිසි විටෙක යෙ දෙයි. |
| සොභන | සොභන සාධාරණ 19, පඤ්ඤින්ද්‍රිය 1 } 20 තමන් යෙදෙන සිත්හි නියතය | විරතිත්‍රය සහ අප්පමඤ්ඤා දෙක තමන් යෙදෙන සිත්හි වෙන් වෙන්ව යෙදෙයි. ලොකොත්තර සිත්හි විරතිත්‍රය නියතය. |

## චෛතසිකයන්ගේ සංග්‍රහ නය

අසූනවයක් නොහොත් එක්සියවිසිඑකක් වූ සිත් අතුරෙන් ඒ ඒ සිත්හි යෙදෙන චෛතසිකයන් දැක්වීමේ ක්‍රමයට **සංග්‍රහ නය** යයි කියති.

## ලොකොත්තර සිත්හි චෛතසිකයන්ගේ සංග්‍රහ නය

ධ්‍යානයන්ගේ වශයෙන් ලොකොත්තර සිත් සතළිසෙකි. (40). එයින් පඨමජ්ඣාන ලොකොත්තර මාර්ග සිත් සතරය, ඵල සිත් සතර යයි අටෙකි. දුතියජ්ඣාන. ලෙකොත්තර සිත් අටෙකි

තතියජ්ඣාන ලොකොත්තර සිත් අටෙකි. චතුර්ථජ්ඣාන ලොකොත් තර සිත් අටෙකි. පඤ්චමජ්ඣාන ලොකොත්තර සිත් අටෙකි. ලොකොත්තර ධ්‍යාන සිත්හි යෙදෙන චෛතසිකයන් සෙවීමේදී අන්‍ය සමාන රාශියෙන් සහ සොභන රාශියෙන් ද සෙවිය යුතුයි. අකුසල රාශියට අයත් චෛතසිකයෝ, සොභන සිත්හි නො යෙදෙන බැවින්, ප්‍රතික්ෂෙප කළ යුතුයි.

ඒ ඒ ධ්‍යාන සිත්හි යෙදෙන ධ්‍යානාඞ්ගයන් ද මතක තබාගත යුතුයි. **ප්‍රථම ධ්‍යාන සිතෙහි**, **විතක්ක**, **විචාර**, **පීති**, **සුඛ**, **එකග්ගතා** යන අඞ්ග පස ද, **ද්‍රුතියධ්‍යාන සිතෙහි විචාර**, **පීති**, **සුඛ**, **එකග්ගතා** යන සතර ද, **තතියධ්‍යාන සිතෙහි පීති**, **සුඛ එකග්ගතා** යන තුන ද, **චතුර්ථධ්‍යාන සිතෙහි සුඛ**, **එකග්ගතා** යන දෙක ද, **පඤ්චමධ්‍යාන සිතෙහි උපෙක්ඛා**, **එකග්ගතා** දෙක ද යෙදෙන්නාහ.

තවද, මේ ලොකොත්තර සිත්හි **ශීල**, **සමාධි**, **ප්‍රඥ** යන ධර්ම තුනම බලවත්ව පවතින බව දත යුතුයි.

### පඨමජ්ඣාන ලොකොත්තර සිත් අට (1)

ප්‍රථම ධ්‍යාන ලොකොත්තර සිත් අටෙහි යෙදෙන්නා වූ චෛතසිකයෝ නම් තෙළෙස් අන්‍යසමානයෝ සහ විසිපස් සොභන චෛතසිකයන් අතුරෙන් අප්‍රමාණ්‍යයෝ දෙදෙනා හැර ඉතිරි තෙවිස් සය (23) යන චෛතසිකයෝ සතිස් (36) දෙනාය. තුදුස් අකුසල චෛතසිකයන් සහ අප්‍රමාණ්‍ය දෙදෙනාත් යන සොළොසක් (16) චෛතසිකයෝ නො ලැබෙන්නාහ.

### ද්‍රුතියජ්ඣාන ලොකොත්තර සිත් අට (2)

දෙවෙනි ධ්‍යාන සිතෙහි **විතර්කය** නො යෙදෙන බැවින් ප්‍රථම ධ්‍යානයෙහි යෙදෙන චෛතසිකයන් සතිසෙන් **විතර්කය** හැර ඉතිරි පන්තිස (35) යෙදෙන්නාහ. අකුසල් දහහතරත්, අප්‍රමාණ්‍ය යෝ දෙදෙනාත් විතර්කයත් යන සතළොස (17) නො ලැබේ.

### තතියජ්ඣාන ලොකොත්තර සිත් අට (3)

දෙවෙනි ධ්‍යානයෙහි යෙදෙන චෛතසිකයන්ගෙන් **විචාරය** හැර ඉතිරි සූතිස (34) මේ තතියජ්ඣාන සිත්හි යෙදේ. ඉතිරි අට ළොස (18) නොයෙදේ.

### චතුර්ථජ්ඣාන ලොකොත්තර සිත් අට (4)

සතරවැනි ධ්‍යාන සිතෙහි ප්‍රීති ධ්‍යානාඞ්ගය නො යෙදෙන බැවින් තුන්වන ධ්‍යාන සිතෙහි චෛතසික සූතිසෙන් **පීති** හැර ඉතිරි තෙතිස (33) යෙදේ. නො ලැබෙන්නේ ඉතිරි එකුන්විසි (19) චෛතසික යෝය.

### පඤ්චමජ්ඣාන ලොකොත්තර සිත් අට (5)

සතරවැනි ධ්‍යාන සිතෙහි සුඛය වෙනුවට **උපෙක්ඛාව** යෙදෙන බැවින් පඤ්චමධ්‍යාන සිතෙහි ලැබෙන්නේත් සතර වෙනි ධ්‍යාන සිතෙහි මෙන් චෛතසිකයෝ තිස්තුනෙකි (33). ඉතිරි චෛතසික දහනවය නො ලැබේ.

ලොකෝත්තර සිත්හි සංග්‍රහ නය පස මෙසේ දත යුතුයි.

| නය | සිත් | යෙදෙන චෛතසික | නොයෙදෙන චෛතසික |
|---|---|---|---|
| 1 | ප්‍රථමධ්‍යාන ලොකොත්තර 8 | අන්‍යසමාන 13<br>අප්පමඤ්ඤා 2 හැර<br>ඉතිරි සොභන 23 } 36 | අකුසල් 14<br>අප්පමඤ්ඤා 2 } 16 |
| 2 | දුතියධ්‍යාන ලොකොත්තර 8 | ඉහත 36 න් විතර්කය හැර ඉතිරි 35 | ඉහත 16<br>විතර්කය 1 } 17 |
| 3 | තතියධ්‍යාන ලොකොත්තර 8 | ඉහත 35 න් විචාරය හැර ඉතිරි 34 | ඉහත 17<br>විචාරය 1 } 18 |
| 4 | චතුත්ථධ්‍යාන ලොකොත්තර 8 | ඉහත 34 න් පීති හැර ඉතිරි 33 | ඉහත 18<br>පීතිය 1 } 19 |
| 5 | පඤ්චමධ්‍යාන ලොකොත්තර 8 | ඉහත 33 න් සුඛය හැර ඉතිරි 32<br>උපෙක්ඛාව 1 } 33 | ඉහත 19 |

## මහග්ගත සිත්හි චෛතසිකයන්ගේ සංග්‍රහ නය

**මහග්ගත සිත්** සත්විස්සකි. (27). එනම්, රූපාවචර ප්‍රථම ධ්‍යාන සිත් තුනය, ද්‍විතියධ්‍යාන සිත් තුනය, තතිය ධ්‍යාන සිත් තුනය චතුර්ථධ්‍යාන සිත් තුනය, පඤ්චමධ්‍යාන සිත් තුනය, අරූපාවචර සිත් පඤ්චමධ්‍යාන දෙළොසය. මහග්ගත ධ්‍යාන වඩන්නාවූ පුද්ග-ලයෝ සමාධිය ලැබීම පිණිසම වීයර්‍ය කරන්නෝය. මේ **සමාධිය, භාවනාමය** කුසල කර්මයාගේ ප්‍රතිඵලයෙකි. එබැවින් ශීලමය පුණ්‍ය කර්මයන් කිරීමේ දී ඇතිවන විරති චෛතසිකයෝ ධ්‍යාන සිත්හි නොලැබේ. අප්‍රමාණ වූ සුඛිත දුක්ඛිත සත්ත්ව ප්‍රඥප්තිය අරමුණු කරමින් ඇතැම් ධ්‍යාන උපදවාගත හැකි බැවින්, එසේ වඩනා කල්හි අප්‍රමාණ්‍ය ධර්ම වූ **කරුණා, මුදිතා** යන චෛතසික දෙක ද ලැබේ.

### පඨමජ්ඣාන මග්ගත සිත් තුන (1)

ප්‍රථම ධ්‍යාන මහග්ගත සිත් තුනෙහි තෙළෙස් අන්‍ය සමාන චෛතසිකයෝද, පස්විසි සොභන චෛතසිකයන් ගෙන් විරතිත්‍රය හැර ඉතිරි දෙවිසි (22) චෛතසිකයෝ ද යන පන්තිසක් (35) චෛතසිකයෝ ලැබෙන්නාහ. ඉතිරි වූ තුදුස් අකුසලයන් සහ විරතිත්‍රය ද යන සතළොස නො ලැබේ.

### දුතියජ්ඣාන මහග්ගත සිත් තුන (2)

ප්‍රථම ධ්‍යාන සිතෙහි වූ පන්තිස් චෛතසිකයන් අතුරෙන් විතර්කය හැර ඉතිරි සූතිස (34), ද්‍විතියධ්‍යාන සිතෙහි යෙදෙන්නාහ. නො ලැබෙන්නේ ඉතිරි අටළොස් චෛතසිකයෝය.

### තතියජ්ඣාන මහග්ගත සිත් තුන (3)

ද්‍විතියධ්‍යාන සිතෙහි යෙදෙන චෛතසිකයන්ගෙන් විචාරය හැර ඉතිරි තෙතිස (33) තතියධ්‍යාන සිත්හි ලැබේ. ඉතිරි වූ එකුන්විසි (19) චෛතසිකයෝ නොලැබේ.

## චතුර්ථජ්ඣාන මහග්ගත සිත් තුන (4)

තතියධ්‍යාන සිතෙහි ලැබෙන චෛතසිකයන්ගෙන් ප්‍රීතිය හැර ඉතිරි දෙතිස් (32) චෛතසිකයෝ සතරවැනි ධ්‍යාන සිතෙහි යෙදෙන් නාහ. නො යෙදෙන චෛතසිකයන්ගේ ගණන විස්සකි.

## පඤ්චමජ්ඣාන මහග්ගත සිත් පසළොස

සතරවැනි ධ්‍යාන සිතෙහි යෙදෙන සුඛවේදනාව හෙවත් සුඛ ධ්‍යානාඞ්ගය වෙනුවට පඤ්චමධ්‍යාන සිතෙහි යෙදෙන්නේ **උපෙක්ඛාවයි**. උපෙක්ඛාව යෙදෙන සිත්වලින් සුඛිත දුක්ඛිත සත්ත්වයන් අරමුණු කළ නොහැකි බැවින්, **කරුණා මුදිතා** නම් වූ අප්‍රමාණ්‍යයෝ දෙදෙනා ද පඤ්චමධ්‍යාන සිතෙහි නො යෙදේ. එවිට අඤ්ඤසමාන යන්ගෙන් විතර්ක, විචාර, ප්‍රීති, යන චෛතසික තුන ද විරතිත්‍රය සහ අප්‍රමාණ්‍ය ධර්ම දෙක ද අකුසලයන් තුදුස ද යන (22) දෙවිසි චෛතසිකයෝ මේ පඤ්චමජ්ඣානසිත්හි නො ලැබේ. ඉතිරි තිහ(30) ලැබේ.

මහග්ගත සිත්හි චෛතසිකයන්ගේ සංග්‍රහ නාය පස මෙසේ දත යුතුයි.

| නය | සිත් | යෙදෙන චෛතසික | නොයෙදෙන චෛතසික |
|---|---|---|---|
| 1 | ප්‍රථමධ්‍යාන මහග්ගත 3 | අඤ්ඤ සමාන 13 විරති 3 හැර ඉතිරි සෝභන 22 } 35 | අකුසල 14 විරති 3 } 17 |
| 2 | ද්‍විතියධ්‍යාන මහග්ගත 3 | ඉහත 35 න් විතර්කය හැර ඉතිරි 34 | ඉහත 17 විතර්කය 1 } 18 |
| 3 | තතියධ්‍යාන මහග්ගත 3 | ඉහත 34 න් විචාරය හැර ඉතිරි 33 | ඉහත 18 විචාරය 1 } 19 |
| 4 | චතුර්ථධ්‍යාන මහග්ගත 3 | ඉහත 33 න් පීතිය හැර ඉතිරි 32 | ඉහත 19 පීතිය 1 } 20 |
| 5 | පඤ්චමධ්‍යාන මහග්ගත 15 | ඉහත 32 න් කරුණා මුදිතා දෙක හැර ඉතිරි 30 (සුඛය වෙනුවට උපෙක්ඛාව) | ඉහත 20 අප්පමඤ්ඤා 2 } 22 |

## කාමසොභන සිත්හි චෛතසිකයන්ගේ සංග්‍රහ නය

**කාමසොභන සිත්** සූවිස්සකි (24). එයින් සිත් අටක් කුසල්ය, අටක් විපාකය, ඉතිරි අට ක්‍රියා සිත්ය. දන සීලාදී පුණ්‍යකර්ම යන් සිදුකරන කල්හි ඒ ඒ පින්කම් වලට සුදුසු පරිදි අන්‍යසමාන චෛතසික හා සොභන චෛතසික ද යෙදෙන්නාහ. සතුටු සිතින් පින්කම් කරන කල්හි ප්‍රීතිය ලැබේ. මධ්‍යස්ථව පින්කම් කිරීමේදී ප්‍රීතිය නො ලැබේ. සීලමය පින්කම් කරන කල්හි පමණක් විරතිත්‍රය වෙන් වෙන්ව ලැබෙන්නේය. ශීලමය පින්කම් නොවන දනාදී අනිකුත් කුසල් කරන විට විරතිත්‍රය නො ලැබෙන්නේය. දුක්ඛිත සත්ත්වයන් කෙරෙහි අනුකම්පාව දක්වන කල්හි **කරුණාව** ද, සුඛිත සත්ත්වයන් අරමුණු කරණ කල්හි **මුදිතාව** ද ලැබේ. එසේ නොවන කල්හි මේ අප්‍රමාණ්‍යයෝ නො ලැබෙන්නාහ. නුවණින් යුක්තව කුසල් කරන කල්හි පඤ්ඤින්ද්‍රිය ලැබේ. එසේ ඤුව ණින් යුක්තනොවූ කල්හි පඤ්ඤින්ද්‍රිය නොලැබේ. මල් පිදීම, වන්දනා කිරීම, බණ ඇසීම යනාදී පින් කම් කිරීමේ දී විරතිත්‍රයත්, අප්‍රමාණ්‍යයෝත් නො යෙදේ. සොභන චිත්තයන්හි අකුසල චෛතසිකයෝ කිසිසේත් නො ලැබේ.

කාමසොභන සිත්හි යෙදෙන චෛතසිකයන් දැක්වීමේ පහසුව සඳහා සිත් දෙක බැගින් ගෙන යුගල හෙවත් දුක වශයෙන් බෙද දක්වනු ලැබේ. සොමනස්ස ඤාණසම්ප්‍රයුක්ත සිත් දෙක ප්‍රථම යුගලය හෙවත් දුකය වශයෙන් ද, සොමනස්ස ඤාණවිප්පයුත්ත සිත් දෙක දෙවෙනි දුකය වශයෙන් ද, උපෙක්ඛා ඤාණසම්ප්‍රයුක්ත සිත් දෙක තෙවැනි දුකය වශයෙන් ද උපෙක්ඛා ඤාණවිප්‍රයුත්ත සිත් දෙක සිව්වැනි දුකය වශයෙන් ද සළකනු ලැබේ. මෙසේ කුසල් සිත් අටත්, විපාක සිත් අටත්, ක්‍රියා සිත් අටත් දුකයන්ගේ වශයෙන් සතර සතර කොටස්වලට බෙද එහි යෙදෙන චෛතසිකයන් වෙන් වෙන්ව දක්වනු ලැබේ.

කාමසොභන ක්‍රියා සිත් අට රහතන්වහන්සේලාට පමණක් ලැබෙන සිත් බැවින්, ඒකාන්ත කුසල් වශයෙන් යෙදෙන **විරති ධර්ම** තුන මේ ක්‍රියා සිත්හි නො ලැබේ.

කාම සොභන විපාක සිත් අට, කුසලකර්මයන්ගේ විපාක වශයෙන් ලැබෙන හෙයින් එහි විරතිත්‍රය නො ලැබේ. සුඛිත දුක්ඛිත සත්ත්වයන් ද අරමුණු නො කළ හැකි බැවින් අප්‍රමාණ්‍යයෝ ද නො ලැබේ.

## කාමසොභන කුසල් සිත් අටෙහි සංග්‍රහ නය

### පළමුවෙනි දුකය (1)

සොමනස්ස ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික සිත්දෙකෙහි තෙළෙස් අන්‍යසමානයන් හා පස්විසි සොභන චෛතසික ද යන අටතිසක් චෛතසිකයන් ලැබෙන්නාහ. අකුසල් තුදුස පමණක් නො ලැබේ. **විරතිත්‍රය** සහ **අප්‍රමාණ්‍යයෝ** දෙදෙනා ද මේ සිත්හි යෙදෙන්නේ අනියත වශයෙනි. එහෙත් එක සිතක එකවර යෙදෙන්නේ ඒ චෛතසික පසෙන් එක් චෛතසිකයක් පමණය. සීලමය පින්කමක් සිදුවන කල්හි විරතිත්‍රයන්ගෙන් එකක්ම ලැබේ. දුක්ඛිත සත්ත්ව යන් අරමුණු කරන කල්හි කරුණාව ද, සුඛිත සත්ත්වයන් අරමුණු වන කල්හි මුදිතාව ද යෙදේ. ඉහතකී පින් කම් නොව වෙනත් දන්දීම් බණ ඇසීම් ආදිය ඇතිවන කල්හි මේ කුසල් සිත්වල යෙදෙන්නේ තෙළෙස් අන්‍යසමානයෝ හා සොභන චෛතසිකයන් අතුරෙන් සොභන සාධාරණ දහ නවයත් පඤ්ඤින්ද්‍රියත් යන තෙතිස් (33) චෛතසිකයෝ පමණය.

### දෙවෙනි දුකය (2)

සොමනස්ස ඤාණ විප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික සිත් දෙකෙහි **ඤාණය** නො යෙදෙන හෙයින්, පළමු දුකයට දක්වන ලද අටතිස් චෛත සිකයන් අතුරෙන් **පඤ්ඤින්ද්‍රිය** හැර ඉතිරි සත්තිස් (37) චෛතසිකයෝ යෙදෙන්නාහ. නොයෙදෙන්නේ පඤ්ඤින්ද්‍රියත්, තුදුස් අකු සල චෛතසිකත් පමණය.

### තෙවැනි දුකය (3)

උපෙක්ඛා සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික සිත්දෙකෙහි **උපෙක්ඛාව** යෙදෙන හෙයින් ප්‍රීතිය නො ලැබේ. පළමු

දුකයෙහි සඳහන් කළ චෛතසිකයන් අතුරෙන් ප්‍රීතිය හැර ඉතිරි සත්තිස් චෛතසිකයෝ ලැබෙන්නාහ. එවිට මෙහි නො ලැබෙන්නේ ප්‍රීතියත්, තුදුස් අකුසලයනුත් පමණය.

### සිව්වැනි දුකය (4)

උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික සිත් දෙකෙහි **ප්‍රීතියත්**, **ඤාණයත්** නැති හෙයින් පළමු දුකයෙහි යෙදෙන අටතිස් චෛතසිකයන් අතුරෙන් **පීතිය** සහ **පඤ්ඤින්ද්‍රිය** හැර ඉතිරි සතිස් (36) චෛතසිකයෝ ලැබෙන්නාහ. තුදුස් අකුසලයන් හා පීති පඤ්ඤින්ද්‍රිය යන සොළොස් චෛතසිකයෝ නොලැබෙති.

කාම සොභන කුසල් සිත් අටෙහි චෛතසිකයන්ගේ සංග්‍රහ නය සතර මෙසේ දත යුතුයි.

| නය | කුසල් සිත් | යෙදෙන චෛතසික | නොයෙදෙන චෛතසික |
|---|---|---|---|
| 1 | **පළමුවෙනි දුකය** | අන්‍යසමාන 13, සොභන 25 } 38 (විරති සහ අප්‍රමාණ්‍යයෝ අනියතයෝගීවේ. | අකුසල් 14 |
| 2 | දෙවෙනි දුකය | අන්‍යසමාන 13, පඤ්ඤින්ද්‍රිය හැර ඉතිරි සොභන 24 } 37 | අකුසල 14, පඤ්ඤින්ද්‍රිය 1 } 15 |
| 3 | තෙවෙනි දුකය | අන්‍යසමාන (පීතිය හැර) 12, සොභන 25 } 37 | අකුසල 14, පීතිය 1 } 15 |
| 4 | සිව්වැනි දුකය | පීති හැර අන්‍යසමාන 12, පඤ්ඤින්ද්‍රිය හැර සොභන 24 } 36 | අකුසල 14, පීති සහ පඤ්ඤින්ද්‍රිය 2 } 6 |

### කාමසොභන ක්‍රියා සිත් අටෙහි සංග්‍රහ නය.

රහතන්වහන්සේලාට නැවත භවයක් නැති හෙයින් ද, අකුසල් සියල්ලම ප්‍රහීණ කළ බැවින් ද, කාමාවචර කුසල් සිත් නූපදි.. ඒ වෙනුවට ඇතිවන්නේ කාමසොභන ක්‍රියා සිත් අට පමණය

**විරති ධර්මයෝ** ඒකාන්ත කුසල් බැවින් මේ ක්‍රියා සිත්හි නො යෙදෙන්නාහ. සුඛිත, දුක්ඛිත පුද්ගලයන් අරමුණුකොට අනුකම්පාව දක්වන කල්හි ඇති වන ක්‍රියා සිත්වල අප්‍රමාණ්‍යා ධර්ම අනියත වශයෙන් යෙදේ. මේ ක්‍රියා සිත්හි සංග්‍රහ නය දක්වන කල්හි ද්‍රක වශයෙන් සිත් සතර කොටසකට බෙද දක්වනු ලැබේ.

### පළමුවෙනි ද්‍රකය (1)

සොමනස්ස ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික ක්‍රියා සිත් දෙකෙහි අන්‍යසමාන තෙළෙසත්, විරතිත්‍රය හැර ඉතිරි සොභන චෛතසික දෙවිස්සත් යන පන්තිස් (35) චෛතසික යෙදෙන්නාහ. අකුසලයන් තුදුසත් විරතිත්‍රයත් යන සතළොස නො ලැබේ.

### දෙවෙනි ද්‍රකය (2)

සොමනස්ස ඤාණ විප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික ක්‍රියා දෙසිතෙහි අන්‍ය සමාන තෙළෙසත්, විරතිත්‍රයසහ පඤ්ඤින්ද්‍රිය හැර ඉතිරි සොභනයෝ එක්විස්සය යන සූතිසක් (34) චෛතසික යෙදෙන්නාහ. ඉතිරි අටළොස (18) නො ලැබෙ.

### තෙවැනි ද්‍රකය (3)

උපෙක්ඛා සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික ක්‍රියා දෙසිතෙහි ප්‍රීතිය හැර ඉතිරි අන්‍යසමානයෝ දෙළොසත් විරති ත්‍රය හැර සොභන දෙවිස්සත් යන සූතිස් (34) චෛතසිකයෝ ලැබෙති. ඉතිරි අටළොස නො ලැබේ.

### සිව්වැනි ද්‍රකය (4)

උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික ක්‍රියා සිත් දෙකෙහි ප්‍රීතිය හැර දෙළොස් අන්‍ය සමානයෝ ද විරතිත්‍රය සහ පඤ්ඤින්ද්‍රිය හැර සොභනයෝ එක්විස්ස ද යන තෙතිස්(33) චෛතසිකයෝ ලැබෙති. ඉතිරි චෛතසික එකුන්විස්ස (19) නො ලැබේ.

කාමසොභන ක්‍රියා සිත් අටෙහි චෛතසිකයන්ගේ සංග්‍රහ නය සතර මෙසේ දත යුතුයි.

| නය | ක්‍රියා සිත් | යෙදෙන චෛතසික | නොයෙදෙන චෛතසික |
|---|---|---|---|
| 1 | පළමුවෙනි දුකය | අන්‍යසමාන 13<br>විරති හැර සොභන 22 } 35<br>(අප්‍රමාණ්‍යයෝ අනියතය) | අකුසල 14<br>විරති 3 } 17 |
| 2 | දෙවෙනි දුකය | අන්‍යසමාන 13<br>විරති සහ පඤ්ඤින්ද්‍රිය හැර<br>සොභන 21 } 34 | අකුසල 14<br>විරති 3<br>පඤ්ඤින්ද්‍රිය 1 } 18 |
| 3 | තෙවන දුකය | පීති හැර අන්‍යසමාන 12<br>විරති හැර සොභන 22 } 34 | අකුසල 14<br>පීතිය 1<br>විරති 3 } 18 |
| 4 | සිව්වැනි දුකය | පීති හැර අන්‍යසමාන 12<br>විරති පඤ්ඤින්ද්‍රිය හැර සොභන 21 } 33 | අකුසල 14<br>පීතිය 1<br>විරති පඤ්ඤින්ද්‍රිය 4 } 19 |

## කාමසොභන විපාක සිත් අටෙහි සංග්‍රහ නය

**කාමසොභන මහා විපාක සිත්** අටෙහි විරතිත්‍රයත් අප්‍රමාණ්‍යයෝත් නො ලැබෙන්නාහ. එබැවින් මේ විපාක සිත්හි යෙදෙන චෛතසිකයන් සෙවීමේ දී අන්‍යසමානයන් සහ විරති අප්පමඤ්ඤා හැර ඉතිරි සොභන විසි චෛතසිකයන්ගෙන්ද සෙවිය යුතුයි. මේ විපාක සිත් අටද දුක වශයෙන් සතරකට බෙද සංග්‍රහ නය දක්වනු ලැබේ.

### පළමුවෙනි දුකය (1)

සොමනස්ස ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික දෙ සිතෙහි අන්‍යසමාන තෙළෙසත්, විරති අප්පමඤ්ඤා හැර ඉතිරි සොභන විස්සත් යන තෙතිසක් (33) චෛතසිකයෝ ලැබෙන්නාහ. ඉතිරි එකුන් විසි (19) චෛතසිකයෝ නො ලැබේ.

### දෙවෙනි දුකය (2)

සොමනස්ස ඤාණ විප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික දෙ සිතෙහි අන්‍යසමානයෝ තෙළෙසත්, විරති අප්පමඤ්ඤා, පඤ්ඤින්ද්‍රිය හැර ඉතිරි සොභන එකුන්විස්ස (19) යන දෙතිස ලැබෙන්නා හ. ඉතිරි විසිදෙනා නොලැබේ.

### තෙවැනි දුකය (3)

උපෙක්ඛා සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික දෙ සිතෙහි ප්‍රීතිය හැර අන්‍යසමාන දෙළොසත්, විරති අප්පමඤ්ඤා හැර සොභන විස්සත් යන දෙතිස ලැබෙන්නාහ. ඉතිරි විස්ස නො ලැබේ.

### සිව්වැනි දුකය (4)

උපෙක්ඛා සහගත ඤාණ විප්පයුක්ත අසංඛාරික සසංඛාරික දෙ සිතෙහි ප්‍රීතිය හැර ඉතිරි අන්‍යසමාන දෙළොස ද, විරති අප්පමඤ්ඤා, පඤ්ඤින්ද්‍රිය හැර සොභන එකුන්විස්ස ද යන එක් තිසක් (31) ලැබේ. ඉතිරි එක්විසි දෙනා නො ලැබේ.

කාමසොභන මහා විපාක සිත් අටෙහි සතර සංග්‍රහ නය මෙසේ දත යුතුයි.

| නය | විපාක සිත් | යෙදෙන චෛතසික | නොයෙදෙන චෛතසික |
|---|---|---|---|
| 1 | පළමුවෙනි දුකය | අන්‍යසමානයෝ 13<br>විරති අප්පමඤ්ඤ හැර සොභන 20<br>} 33 | අකුසල් 14<br>විරති අප්පමඤ්ඤා 5<br>} 19 |
| 2 | දෙවෙනි දුකය | අන්‍යසමානයෝ 13<br>විරති අප්පමඤ්ඤා<br>පඤ්ඤින්ද්‍රිය හැර සොභන 19<br>} 32 | අකුසල් 14<br>විරති අප්පමඤ්ඤා<br>පඤ්ඤින්ද්‍රිය 6<br>} 20 |
| 3 | තෙවෙනි දුකය | පීති හැර අන්‍යසමාන 12<br>විරති අප්පමඤ්ඤා හැර සොභන 20<br>} 32 | අකුසල් 14<br>විරති අප්පමඤ්ඤා 5<br>පීතිය 1<br>} 20 |
| 4 | සිව්වැනි දුකය | පීති හැර අන්‍යසමාන 12<br>විරති, අප්පමඤ්ඤා<br>පඤ්ඤින්ද්‍රිය හැර සොභන 19<br>} 31 | අකුසල 14<br>පීතී, විරති, අප්පමඤ්ඤා,<br>පඤ්ඤින් ද්‍රිය 7<br>} 21 |

## අකුසල් සිත් දෙළොසෙහි සංග්‍රහ නය

ලොභමූල අටය, දෙසමූල දෙකය, මොහමූල දෙකය යයි අකුසල් සිත් දෙළොසෙකි. මේ සිත්හි යෙදෙන චෛතසිකයෝ කවරහු දැ යි සෙවීමේ දී අන්‍ය සමාන තෙළෙසත්, අකුසල චෛතසික තුදුසත් යන සත්විසිදෙනා අතුරෙන් ම සෙවිය යුතු වේ. පස්විසි සොභන චෛතසිකයන් අත්හැරිය යුතුයි.

සියළුම අකුසල් සිත්හි **සබ්බචිත්ත සාධාරණයෝ** සත් දෙනාත්, **විතක්ක, විචාර, වීරිය** යන ප්‍රකීර්ණකයෝ තිදෙනාත්, **මොහ චතුෂ්කය** එනම්: මොහය, අහිරිකය, අනොත්තප්පය, උද්ධච්චය යන සතර දෙනාත්, යන මෙකී චෛතසික දහහතර ඒකාන්තයෙන් ම ලැබෙන් නාහ.

ලොභමූල සිත් අටෙහි **ලොභය** ඒකාන්තයෙන් ලැබෙන නිසා නියතය. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි **දිට්ඨිය** නියත වශයෙන් ම යෙදෙන්නේ ය. දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරහි **මානය** අනියතයොගි වේ. සොමනස්ස සිත් හි ලැබෙන **ප්‍රීතිය**, උපෙක්ඛා සිත්හි නො ලැබේ. සසංඛාරික අකුසල් සිත්හි **ථිනයත්, මිද්ධයත්** අනියත වශයෙන් ලැබේ.

දෝමනස්ස පටිඝ සිත් දෙකෙහි ද ප්‍රීතිය නො ලැබේ. **දෙෂය** නියත වශයෙන් ලැබේ. **ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච** යන චෛතසික තුන අනියතයොගී වේ. **ථිනයත්, මිද්ධයත්,** සසංඛාරික සිතෙහි අනියත යොගී වේ.

මොහමූල සිත් දෙක අතුරෙන් විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි පමණක් **විචිකිච්ඡා චෛතසිකය** නියත වශයෙන් යෙදෙන්නේ ය. එම නිසා ඒ සිතෙහි **අධිමොක්ඛය** නො ලැබේ. උපෙක්ඛා වෙදනා ඇති හෙයින් **ප්‍රීතිය** ද නැත. මොහමූල දෙසිතෙහි ඡන්දය ද නො ලැබෙන්නේ ය.

අකුසල් සිත් දෙළොසෙහි චෛතසිකයන් දක්වීමේ පහසුව සඳහා ලොභමූල දෙසමූල සිත් දසයම අසංඛාරික සිත් පසය සසංඛා-

රික සිත් පසය යයි බෙද දක්වනු ලැබේ, මොහමූල සිත් දෙක වෙන් වෙන් වශයෙන් ගෙන සංග්‍රහ කරනු ලැබේ.

## පළමුවෙනි අසංඛාරික අකුසල් සිත (1)

සොමනස්ස දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික අකුසල් සිතෙහි අන්‍යසමාන තෙළෙසත්, මොහ චතුස්කයත්, ලොභයත්, දිට්ඨි යත් යන එකුන් විසි (19) චෛතසික ලැබෙන්නාහ. සොභන පස්විස්ස, මානය, දෙස චතුස්කය, ථීන, මිද්ධ විචිකිච්ඡා යන තෙතිසක් (33) චෛතසිකයෝ නො ලැබෙත්.

## දෙවෙනි අසංඛාරික අකුසල් සිත (2)

සොමනස්ස දිට්ඨිගත විප්පයුක්ත අසංඛාරික කුසල් සිතෙහි පළමු අසංඛාරික සිතෙහි යෙදෙන දිට්ඨිය වෙනුවට **මානය** අනියත වශයෙන් යෙදෙන්නේ ය. එවිට් මේ සි තෙහි යෙදෙන්නේත් චෛත සිකයෝ දහනව දෙනෙකි. ඉතිරි තෙතිස (33) නො ලැබේ.

## තෙවැනි අසංඛාරික අකුසල් සිත (3)

උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍යසමාන දෙළොස ද, මොහ චතුස්කය, ලොභය සහ දිට්ඨිය යන අටළොසක් චෛතසිකයන් යෙදෙන්නා හ. ඉතිරි සූතිස (34) නො ලැබේ.

## සිව්වැනි අසංඛාරික අකුසල් සිත (4)

උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංඛාරික සිතෙහි දිට්ඨිය නො ලැබෙන බැවින් ඒ වෙනුවට මානය අනියත වශයෙන් ලැබේ. එබැවින් මේ සිතෙහි ප්‍රීතිය හැර අන්‍යසමාන දෙළොස ද, මොහ චතුස්කය, ලොභය හා මානය යන අටළොස් (18) චෛත සිකයන් ලැබෙන්නාහ. ඉතිරි සූතිස (34) නො ලැබේ.

## පස්වැනි අසංඛාරික අකුසල් සිත (5)

දෙමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත අසංඛාරික සිතෙහි **ප්‍රීතිය** හැර අන්‍යසමාන දෙළොසද, මොහ චතුස්කය සහ දෙස චතුස්කයද යන විසි (20) චෛතසිකයෝ ලැබෙන්නාහ. ඉතිරි දෙතිස (32) නො ලැබේ.

## පළමුවෙනි සසංඛාරික අකුසල් සිත (6)

සොමනස්ස දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිතෙහි අන්‍ය සමාන තෙළෙසත්, **මොහ චතුස්කය, ලොභය, දිට්ඨිය, ථිනය, මිද්ධය** යන එක්විසි (21) චෛතසිකයෝ යෙදෙන්නාහ. ඉතිරි එක්තිස (31) නො ලැබේ.

## දෙවෙනි සසංඛාරික අකුසල් සිත (7)

සොමනස්ස දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිතෙහි පළමු සිතෙහි මෙන් චෛතසිකයෝ එක්විස්සකි. මෙහි **දිට්ඨිය** වෙනුවට **මානය** අනියත වශයෙන් යෙදේ. ඉතිරි එක්තිස (31) නො ලැබේ.

## තෙවැනි සසංඛාරික අකුසල් සිත (8)

උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිතෙහි **ප්‍රීතිය** හැර අන්‍යසමාන දෙළොස ද මොහ චතුස්කය, ලොභය, දිට්ඨිය, ථිනය මිද්ධය යන චෛතසික විසි දෙනා (20) ලැබෙන්නාහ. ඉතිරි දෙතිස (32) නො ලැබේ.

## සිව්වැනි සසංඛාරික අකුසල් සිත (9)

උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිතෙහි තෙ වැනි සිත මෙන් චෛතසික විස්සක් (20) ලැබේ. මෙහි **දිට්ඨිය** වෙනුවට **මානය** අනියත වශයෙන් ලැබේ. ඉතිරි දෙතිස (32) නො ලැබේ.

### පස්වැනි සසංඛාරික අකුසල් සිත (10)

දෙමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සසංඛාරික සිතෙහි ප්‍රීතිය හැර අන්‍ය සමාන දෙළොස ද, මෝහ චතුස්කය, දෙස චතුස්කය සහ ථිනයත් මිද්ධයත් යන දෙවිසි (22) චෛතසිකයෝ ලැබෙන්නාහ. ඉතිරි චෛතසික තිහ (30) නො ලැබේ.

### මොහමූල උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්ප්‍රයුක්ත අකුසල් සිත (11)

මේ සිතෙහි **ප්‍රීතියත්, අධිමොක්ඛයත්, ඡන්දයත්** හැර අන්‍ය සමානයෝ දස දෙනාත්, මෝහ චතුස්කය සහ විචිකිච්ඡා යන පසළොසක් චෛතසික ලැබෙන්නාහ. ඉතිරි සත් තිස (37) නො ලැබේ.

### මොහමූල උපෙක්ඛා සහගත උද්ධච්ච සම්ප්‍රයුක්ත අකුසල් සිත (12)

මේ සිතෙහි **ප්‍රීති, ඡන්ද** හැර අන්‍යසමානයෝ එකොළොසද, මෝහ චතුස්කය ද යන පසළොස් චෛතසිකයෝ ලැබෙන්නාහ. ඉතිරි සත්තිස (37) නො ලැබේ.

මෙසේ දෙළොස් අකුසල චිත්තයන්ගේ සංග්‍රහ නය දත යුතුයි. **(241 පිටුව බලනු)**

### අහේතුක සිත් අටළොසෙහි සංග්‍රහ නය

අහේතුක සිත් අටළොසෙන් සිත් සතක් අකුසල විපාක යෝයි. සිත් අටක් කුසල විපාකයෝයි. තුනක් ක්‍රියාසිත් ය. විපාක සිත් පසළොසින් චක්ඛු විඤ්ඤාණාදී විඤ්ඤාණ සිත් දහයට **දෙපස් විඤ්ඤාණයෝ** යයි කියති. මේ හැර සම්පටිච්ඡන සිත් දෙකක් ද සන්තීරණ සිත් තුනක් ද වේ. ක්‍රියා සිත් තුනෙන් දෙකක් පඤ්චාද්වාරාවජ්ජනය, මනොද්වාරාවජ්ජන යයි ආවජ්ජනා සිත් ය. ඉතිරි ක්‍රියා සිත රහතන් වහන්සේලාට ඇතිවන සොමනස්ස හසිතුප්පාද සිත ය.

මෙයින් සම්පටිච්ඡන දෙකත්, පඤ්චද්වාරාවජ්ජන සිතත් යන සිත් තුනට **මනොධාතුත්‍රික** යයි කියති. උපෙක්ඛා සහගත සන්තීරණ සිත් දෙකට **අහේතුක පටිසන්ධි යුගල** යයි ද කියති. මේ සිත් අටලොසෙහි ම, ලොභ දෙස, මොහ, අලොභ, අදෙස, අමොහ යන අකුසල හා කුසල හේතූන් යෙදී නැතිහෙයින් **අහේතුක සිත්** යයි ව්‍යවහාර වේ. මේ සිත්හි යෙදෙන්නේ **අන්‍යසමාන චෛතසිකයෝ** පමණය. අක්සල හෝ සොභන චෛතසිකයෝ නො ලැබෙන්නාහ. එබැවින් මේ සිත් අටලොසම ඉතා දුර්වල සිත් බව දත යුතුයි.

මේ අහේතුක චිත්තයන්ගේ සංග්‍රහ නය දැක්වීමේ පහසුව සඳහා කොටස් පසකට බෙද දක්වනු ලැබේ.

## දෙපස් විඤ්ඤාණයෝ (1)

චක්ඛුවිඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, ඝාණවිඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යයි අකුසල විපාක, කුසල විපාක වශයෙන් විඤ්ඤාණ සිත් පස බැගින් දසයක් වේ. මේ දෙපස් විඤ්ඤාණයෝ ඉතාමත් ම දුර්වල විපාක සිත් බැවින් **සබ්බචිත්ත සාධාරණ චෛතසික සත පමණක්** ඒ සිත්හි යෙදෙන්නා හ. ඉතිරි පන්සාලිස් (45) චෛතසිකයෝ නො යෙදෙන්නාහ.

## මනොධාතුත්‍රිකය හා අහේතුක පටිසන්ධි යුගලය (2)

සම්පටිච්ඡන දෙසිත හා පඤ්චද්වාරාවජ්ජනය යන මනොධාතුත්‍රිකයෙහි ද, උපෙක්ඛා සහගත සන්තීරණ දෙසිත නම් වූ අහේතුක පටිසන්ධි යුගලෙහි ද ලැබෙන්නේ **සබ්බචිත්ත සාධාරණ** සත් දෙනා සහ **විතක්ක, විචාර අධිමොක්ඛ** යන ප්‍රකීර්ණක තිදෙනාත් යන චෛතසික දසය පමණකි. ඉතිරි වූ ප්‍රකීර්ණක තිදෙනාත්, අකුසල සහ සොභන චෛතසික යෝත්, යන දෙසාළිස් (42) චෛතසික, මේ සිත් පසෙහි නො යෙදෙන්නාහ.

## **සොමනස්ස සන්තීරණ සිත (3)**

මෙය සොමනස්ස සිතක් බැවින්, උපෙක්ඛා සන්තීරණ සිතෙහි යෙදෙන චෛතසිකයන් දසදෙනාට **ප්‍රීති** චෛතසිකයත් එකතු වීමෙන් එකොළොස් චෛතසික කෙනෙක් ලැබේ. ඉතිරි එක් සාළිස නො ලැබේ.

## **මනොද්වාරාවජ්ජන සිත (4)**

මෙයට **වොට්ඨපන** සිත යයි ද කියනු ලැබේ. මේ සිත උපෙක්ඛා සහගත බැවින් ප්‍රීතිය නො යෙදේ. එවිට **ප්‍රීතියත් ඡන්දයත්** හැර අන්‍යසමාන එකොළොස්දෙනා ලැබෙන්නේය. නොලැබෙන්නේ ඉතිරි වූ සතළිස් එකක් චෛතසිකයෝ ය.

## **සොමනස්ස හසිතුප්පාද සිත (5)**

රහතන් වහන්සේලා ඇතැම් විට සිනහ පහළ කිරීමේ දී මේ අහේතුක ක්‍රියා සිත ඇති වේ. මේ සිතෙහි **ඡන්දය** හැර ඉතිරි දෙළොස් අන්‍යසමානයෝ ලැබෙන්නාහ. නොයෙදෙන චෛතසිකයෝ සතළිසකි. (40)

අහේතුක අටළොස් චිත්තයන්හි සංග්‍රහ නය පස මෙසේ දත යුතුයි. (211 පිටුව බලනු)

දෙපනස් චෛතසිකයෝ, අසූනවයක් හෝ එක්සිය විසි එකක් ප්‍රභෙද ඇති සිත්හි යෙදෙන ආකාරය දක්වන සම්ප්‍රයොගනය ද, ඒ ඒ සිත්හි යෙදෙන චෛතසිකයන් දක්වන්නා වූ සංග්‍රහනය ද මෙසේ සංක්ෂෙපයෙන් දැනගත් හෙයින්, සඞ්ඛ්‍යා වශයෙන් චෛත සිකයන්ගේ යෙදීම දැක්වීමට මෙහි පහත දක්වන චක්‍රය ප්‍රයෝජන වත් වේ. (215 පිටුව බලනු)

එක්සිය විසි එක් (121) චිත්තයන්හි, ඒ ඒ චෛතසිකයන් යෙදෙන සැටි බලා ගැනීමේ පහසුව සඳහා මෙහි පහත දැක්වෙන චක්‍රය සකස් කරණ ලදී. (216 පිටුව බලනු)

දුතිය පරිච්ඡේදය නිමි.

| නය | අහේතුක සිත් | යෙදෙන චෛතසික | නොයෙදෙන චෛතසික |
|---|---|---|---|
| 1 | දෙපස් විඤ්ඤාණයෝ | සබ්බචිත්ත සාධාරණ 7 | ප්‍රකීර්ණක 6<br>අකුසල, සොභන 39 } 45 |
| 2 | මනොධාතුත්‍රිකය සහ අහේතුක පටිසන්ධි යුගලය | ඡන්ද, පීති, විරිය හැර ඉතිරි අන්‍යසමාන 10 | ඡන්ද, පීති, විරිය 3<br>අකුසල, සොභන 39 } 42 |
| 3 | සොමනස්ස සන්තිරණය | ඡන්ද, විරිය හැර ඉතිරි අන්‍යසමාන 11 | ඡන්ද, විරිය 2<br>අකුසල, සොභන 39 } 41 |
| 4 | මනොද්වාරා වජ්ජන සිත | ඡන්ද, පීති හැර ඉතිරි අන්‍යසමාන 11 | ඡන්ද, පීති 2<br>අකුසල, සොභන 39 } 41 |
| 5 | හසිතුප්පාදය | ඡන්දය හැර අන්‍යසමානයෝ 12 | ඡන්දය 1<br>අකුසල, සොභන 39 } 40 |

# අඤ්ඤසමාන චෛතසිකයන්ගේ සම්ප්‍රයොග නය.

| නය | චෛතසික | යෙදෙන සිත් | නොයෙදෙන සිත් |
|---|---|---|---|
| 1 | සබ්බචිත්ත සාධාරණ 7 | සියළුම 89 සිත්හි යෙදේ | නැත |
| 2 | විතක්කය | අකුසල් 12<br>විඤ්ඤාණ 10 හැර ඉතිරි අහේතුක 8<br>කාමසොභන 24<br>පඨමජ්ඣාන 11<br>} 55 | විඤ්ඤාණයෝ 10<br>දුතියජ්ඣාන 11<br>තතියජ්ඣාන 11<br>චතුත්ථජ්ඣාන 11<br>පඤ්චමජ්ඣාන 23<br>} 66 |
| 3 | විචාරය | ඉහත සඳහන් 55<br>දුතියජ්ඣාන 11<br>} 66 | ඉහත සඳහන් 66 න් දුතියජ්ඣාන 11 හැර 55 |
| 4 | අධිමොක්ඛය | විචිකිච්ඡා හැර ඉතිරි අකුසල් 11<br>විඤ්ඤාණ 10 හැර ඉතිරි අහෙතුක 8<br>සොභන සිත් 59<br>} 78 | විචිකිච්ඡා සිත 1<br>විඤ්ඤාණ 10<br>} 11 |
| 5 | විරිය | අකුසල් 12<br>මනොද්වාරා වජ්ජනය 1<br>හසිතුප්පාදය 1<br>සොභන 59<br>} 73 | මනොද්වාරජ්ජනය සහ හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක 16 |
| 6 | පීතිය | සොමනස්ස අකුසල් 4<br>සොමනස්ස සන්තීරණ 1<br>සොමනස්ස හසිතුප්පාද 1<br>සොමනස්ස කාම සොභන 12<br>පඨමජ්ඣාන 11<br>දුතියජ්ඣාන 11<br>තතියජ්ඣාන 11<br>} 51 | සොමනස්ස අකුසල් 4 හැර ඉතිරි අකුසල් 8<br>සොමනස්ස සන්තීරණ සහ හසිතුප්පාද හැර ඉතිරි අහේතුක 16<br>උපෙක්ඛා කාම සොභන 12<br>චතුත්ථජ්ඣාන 11<br>පඤ්චමජ්ඣාන 23<br>} 70 |
| 7 | ඡන්දය | මොහමූල 2 හැර ඉතිරි අකුසල් 10<br>සොභන සිත් 59<br>} | මොහමූල අකුසල් 2<br>අහේතුක 18<br>} 20 |

# දොළොස් අකුසල චිත්තයන්ගේ සංග්‍රහ නය

| නය | අකුසල් සිත් | යෙදෙන චෛතසික | නොයෙදෙන චෛතසික |
|---|---|---|---|
| 1 | පළමුවෙනි<br>අසංඛාරික සිත | අන්‍ය සමාන 13<br>මෝහ චතුෂ්කය 4<br>ලෝභය හා දිට්ඨිය 2 } 19 | සෝභන 25<br>මානය, දෝස චතුෂ්ක<br>ථීන, මිද්ධ විචිකිච්ඡා } 8 } 33 |
| 2 | දෙවෙනි<br>අසංඛාරික සිත | ඉහත 19 න් දිට්ඨිය වෙනුවට<br>මානය 19 | ඉහත 33 න්<br>මානය වෙනුවට දිට්ඨිය- 33 |
| 3 | තෙවැනි<br>අසංඛාරික සිත | පීති හැර අන්‍ය සමාන 12<br>මෝහ චතුෂ්කය 4<br>ලෝභය හා දිට්ඨිය 2 } 18 | පළමු සිතෙහි 33<br>පීතිය 1 } 34 |
| 4 | සිව්වැනි<br>අසංඛාරික සිත | තෙවැනි සිතමෙහි<br>දිට්ඨිය වෙනුවට මානය 18 | තෙවැනි සිතමෙහි<br>මානය වෙනුවට දිට්ඨිය 34 |
| 5 | පස්වැනි<br>අසංඛාරික සිත | පීති හැර අන්‍ය සමාන 12<br>මෝහ චතුෂ්කය 4<br>දෝස චතුෂ්ක 4 } 20 | සෝභන 25<br>පීතිය ලෝභත්‍රිකය 4<br>ථීන මිද්ධ විචිකිච්ඡා 8 } 32 |
| 6 | පළමුවෙනි<br>සසංඛාරික සිත | අන්‍ය සමාන 13<br>මෝහ චතුෂ්කය 4<br>ලෝභ, දිට්ඨි, ථීන, මිද්ධ 4 } 21 | සෝභන 25<br>දෝස චතුෂ්කය 4<br>මාන විචිකිච්ඡා 2 } 31 |
| 7 | දෙවෙනි<br>සසංඛාරික සිත | ඉහත 21 න් දිට්ඨිය<br>වෙනුවට මානය 21 | ඉහත 31 න්<br>මානය වෙනුවට දිට්ඨිය 31 |
| 8 | තෙවැනි<br>සසංඛාරික සිත | පීති හැර අන්‍ය සමාන 12<br>මෝහ චතුෂ්කය 4<br>ලෝභ, දිට්ඨි, ථීන, මිද්ධ 4 } 20 | සෝභන 25<br>පීති මානය<br>දෝස චතුෂ්කය විචිකිච්ඡා 7 } 32 |
| 9 | සිව්වැනි<br>සසංඛාරික සිත | ඉහත 20 න් දිට්ඨිය<br>වෙනුවට මානය 20 | ඉහත 32 න් මානය<br>වෙනුවට දිට්ඨිය 32 |
| 10 | පස්වැනි<br>සසංඛාරික සිත | පීති හැර අන්‍ය සමාන 12<br>මෝහ සහ දෝස චතුෂ්ක 8<br>ථීන, මිද්ධ 2 } 22 | සෝභන 25<br>පීති ලෝභත්‍රිකය 4<br>විචිකිච්ඡා 1 } 30 |
| 11 | විචිකිච්ඡා<br>සම්ප්‍රයුක්ත සිත | අධිමොක්ඛ පීති, ඡන්ද<br>හැර අන්‍ය සමාන 10<br>මෝහ චතුෂ්කය සහ විචිකිච්ඡා 5 } 15 | සෝභන 25<br>අධිමොක්ඛ, පීති, ඡන්ද 3<br>දෝස චතුෂ්කය 4<br>ලෝභත්‍රිකය 3<br>ථීන, මිද්ධ 2 } 37 |
| 12 | උද්ධච්ච<br>සම්ප්‍රයුක්ත සිත | ඡන්ද පීති හැර අන්‍ය සමාන 11<br>මෝහ චතුෂ්ක 4 } 15 | සෝභන 25<br>ඡන්දය, පීතිය 2<br>දෝස චතුෂ්කය 4<br>ලෝභත්‍රිකය 3<br>ථීන මිද්ධ 2<br>විචිකිච්ඡා 1 } 37 |

# චෛතසිකයන්ගේ යෙදීම දැක්වෙන චක්‍රය.

| චෛතසික ගණන | යෙදෙන සිත් ගණන | ලොකොත්තර සිත් | මහග්ගත සිත් | කාම සොභන සිත් | අකුසල් සිත් | අහේතුක සිත් |
|---|---|---|---|---|---|---|
| 38 | 2 | — | — | 2 | — | — |
| 37 | 4 | — | — | 4 | — | — |
| 36 | 10 | 8 | — | 2 | — | — |
| 35 | 13 | 8 | 3 | 2 | — | — |
| 34 | 15 | 8 | 3 | 4 | — | — |
| 33 | 23 | 16 | 3 | 4 | — | — |
| 32 | 7 | — | 3 | 4 | — | — |
| 31 | 2 | — | — | 2 | — | — |
| 30 | 15 | — | 15 | — | — | — |
| 22 | 1 | — | — | — | 1 | — |
| 21 | 2 | — | — | — | 2 | — |
| 20 | 3 | — | — | — | 3 | — |
| 19 | 2 | — | — | — | 2 | — |
| 18 | 2 | — | — | — | 2 | — |
| 15 | 2 | — | — | — | 2 | — |
| 12 | 1 | — | — | — | — | 1 |
| 11 | 2 | — | — | — | — | 2 |
| 10 | 5 | — | — | — | — | 5 |
| 7 | 10 | — | — | — | — | 10 |
| එකතුව | 121 | 40 | 27 | 24 | 12 | 18 |

# සිත් හා චෛතසිකයන්ගේ යෙදීම

| සිත් ජාති | සිත් නාම | සිත් ගණන | චෛතසික ගණන | අඤ්ඤසමාන චෛතසික | | | | | | | අකුසල චෛතසික | | | | | | | සොභන | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 4 | 1 | 1 | 1 | 4 | 1 | 2 | 19 | 3 | 2 | 1 |
| | | | | සබ්බචිත්ත සාධාරණ | විතක්ක | විචාර | අධිමොක්ඛ | විරිය | පීති | ඡන්ද | මෝහ චතුෂ්කය | ලෝභ | දිට්ඨි | මාන | දෝස චතුෂ්කය | ථීන මිද්ධ | විචිකිච්ඡා | සොභන සාධාරණ | විරති | අප්පමඤ්ඤා | පඤ්ඤින්ද්‍රිය |
| ලොකොත්තර සිත් 40 | 1 වෙනි ධ්‍යාන | 8 | 36 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | – | 1 |
| | 2 ,, ,, | 8 | 35 | 7 | – | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | – | 1 |
| | 3 ,, ,, | 8 | 34 | 7 | – | – | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | – | 1 |
| | 4 ,, ,, | 8 | 33 | 7 | – | – | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | – | 1 |
| | 5 ,, ,, | 8 | 33 | 7 | – | – | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | – | 1 |
| මහග්ගත සිත් 27 | 1 වෙනි ධ්‍යාන | 3 | 35 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | 1 |
| | 2 ,, ,, | 3 | 34 | 7 | – | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | 1 |
| | 3 ,, ,, | 3 | 33 | 7 | – | – | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | 1 |
| | 4 ,, ,, | 3 | 32 | 7 | – | – | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | 1 |
| | 5 ,, ,, | 15 | 30 | 7 | – | – | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | – | – | 1 |
| කාම සොභන කුසල් සිත් 8 | 1 වෙනි දුකය | 2 | 38 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | 2 | 1 |
| | 2 ,, ,, | 2 | 37 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | 2 | – |
| | 3 ,, ,, | 2 | 37 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | 2 | 1 |
| | 4 ,, ,, | 2 | 36 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | 3 | 2 | – |
| කාම සොභන ක්‍රියා සිත් 8 | 1 වෙනි දුකය | 2 | 35 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | 1 |
| | 2 ,, ,, | 2 | 34 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | – |
| | 3 ,, ,, | 2 | 34 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | 1 |
| | 4 ,, ,, | 2 | 33 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | – | 2 | – |
| කාම සොභන විපාක සිත් 8 | 1 වෙනි දුකය | 2 | 33 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | – | – | 1 |
| | 2 ,, ,, | 2 | 32 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | 19 | – | – | – |
| | 3 ,, ,, | 2 | 32 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | – | – | 1 |
| | 4 ,, ,, | 2 | 31 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | 19 | – | – | – |
| අසංඛාරික අකුසල් සිත් 5 | 1 වෙනි අසං: | 1 | 19 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 4 | 1 | 1 | – | – | – | – | – | – | – | – |
| | 2 ,, ,, | 1 | 19 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 4 | 1 | – | 1 | – | – | – | – | – | – | – |
| | 3 ,, ,, | 1 | 18 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 4 | 1 | 1 | – | – | – | – | – | – | – | – |
| | 4 ,, ,, | 1 | 18 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 4 | 1 | – | 1 | – | – | – | – | – | – | – |
| | 5 ,, ,, | 1 | 20 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 4 | – | – | – | 4 | – | – | – | – | – | – |
| සසංඛාරික අකුසල් සිත් 5 | 1 වෙනි සසං: | 1 | 21 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 4 | 1 | 1 | – | – | 2 | – | – | – | – | – |
| | 2 ,, ,, | 1 | 21 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 4 | 1 | – | 1 | – | 2 | – | – | – | – | – |
| | 3 ,, ,, | 1 | 20 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 4 | 1 | 1 | – | – | 2 | – | – | – | – | – |
| | 4 ,, ,, | 1 | 20 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 4 | 1 | – | 1 | – | 2 | – | – | – | – | – |
| | 5 ,, ,, | 1 | 22 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 4 | – | – | – | 4 | 2 | – | – | – | – | – |
| මොහමූල අකුසල් 2 | විචිකිච්ඡා | 1 | 15 | 7 | 1 | 1 | – | 1 | – | – | 4 | – | – | – | – | – | 1 | – | – | – | – |
| | උද්ධච්ච | 1 | 15 | 7 | 1 | 1 | 1 | 1 | – | – | 4 | – | – | – | – | – | – | – | – | – | – |
| අහේතුක සිත් 18 | ද්විපඤ්ච විඤ්ඤාණ | 10 | 7 | 7 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| | මනොධාතු 3, අ: පටිසන් 2 | 5 | 10 | 7 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| | සො: සන්තීරණ | 1 | 11 | 7 | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| | මනොවාරාවජ්ජන | 1 | 11 | 7 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| | හසිතුප්පාද | 1 | 12 | 7 | 1 | 1 | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – |

# අභිධම්මත්ථ සඞ්ගහො

## තතියො පරිච්ඡෙදො

### පකිණ්ණකසඞ්ගහ විභාගො

1. සම්පයුත්තා යථායොගං – තෙපඤ්ඤාස සභාවතො
චිත්තචෙතසිකා ධම්මා – තෙසංදනි යථාරහං

2. වෙදනා හෙතුතො කිච්ච – ද්වාරාලම්බන වත්ථුතො
චිත්තුප්පාදවසෙනෙව – සඞ්ගහොනාමනීයතෙ

3. තත්ථ වෙදනා සඞ්ගහෙ තාව තිවිධා වෙදනා සුඛං දුක්ඛං අදුක්ඛමසුඛංචාති, සුඛං දුක්ඛං, සොමනස්සං දෙමනස්සං උපෙක්ඛාතිච හෙදෙන පන පඤ්චධා හොති.

4. තත්ථ සුඛ සහගතං කුසල විපාකං කායවිඤ්ඤාණ මෙක මෙව, තථා දුක්ඛ සහගතං අකුසල විපාකං කාය විඤ්ඤාණං.

5. සොමනස්ස සහගත චිත්තානි පන ලොභමූලානි චත්තාරි, ද්වාදස කාමාවචර සොභනානි, සුඛ සන්තීරණ හසනානිච ද්වෙති අට්ඨා රස කාමාවචර සොමනස්ස සහගත චිත්තානි චෙව පඨම දුතිය තතිය චතුත්ථජ්ඣාන සඞ්ඛාතානි චතුචත්තාළිස මහග්ගත ලොකුත්තර චිත්තානි චෙති ද්වාසට්ඨී විධානි භවන්ති.

6. දොමනස්ස සහගත චිත්තානි පන ද්වේ පටිඝසම්පයුත්ත චිත්තා නෙව

7. සෙසානි සබ්බානිපි පඤ්ච පඤ්ඤාස උපෙක්ඛා සහගත චිත්තානෙවාති

8. සුඛං දුක්ඛ මුපෙක්ඛාති – තිවිධා තත්ථ වෙදනා
සොමනස්සං දොමනස්ස – මිති හෙදෙන පඤ්චධා

9. සුඛමෙකත්ථ දුක්ඛංච – දෙමනස්සං වයෙයිතං
ද්වාසට්ඨීසු සොමනස්සං – පඤ්චපඤ්ඤාසකෙතරං

10. හෙතු සංගහෙ හෙතු නාම ලොභො, දෙසො, මොහො අලොභො අදෙසො අමොහො චාති ඡබ්බිධා භවන්ති.

11. තත්ථ පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන හසනවසෙන අට්ඨාරස අහේතුක චිත්තානිනාම

12. සෙසානි සබ්බානිපි එකසත්තති චිත්තානි සහෙතුකානෙව
13. තත්ථාපි ද්වේ මොමූහ චිත්තානි එකහේතුකානි

14. සෙසානි දස අකුසල චිත්තානි චෙව ඤාණ විප්පයුත්තානි ද්වා දස කාමාවචර සොභනානි චෙති ද්වා වීසති ද්විහේතුක චිත්තානීති.

15. ද්වාදස ඤාණ සම්පයුත්ත කාමාවචර සොභනානි චෙව පඤ්ච තිංස මහග්ගත ලොකුත්තර චිත්තානි චෙති සත්තචත්තාළිස තිහෙතුක චිත්තානීති.

16. ලොභො දෙසොච මොහොච – හෙතු අකුසලා තයො
අලොභා දෙසා මොහොච – කුසලාව්‍යාකතා තථා

17. අහෙතුකාට්ඨාරසෙක – හෙතුකා ද්වෙ දුවීසති
ද්වීහේතුකා මතා සත්ත – චත්තාලීස තිහෙතුකා.

18. කිච්ච සඞ්ගහෙ කිච්චානි නාම පටිසන්ධි, භවඞ්ගා වජ්ජන දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ජවන තදරම්මණ චුති වසෙන චුද්දසවිධානි භවන්ති.

19. පටිසන්ධි භවඞ්ගාවජ්ජන පඤ්ච විඤ්ඤාණට්ඨානාදි වසෙන තෙසං දසධා ඨාන භෙදෙ වෙදිතබ්බො

20. තත්ථ ද්වෙ උපෙක්ඛා සහගත සන්තීරණානි චෙව අට්ඨමහා විපාකානිච නවරූපාරූප විපාකානි චෙති එකූනවිසති පටිසන්ධි භවඞ්ග චුති කිච්චානි නාම

21. ආවජ්ජන කිච්චානි පන ද්වේ.

22. තථා දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන කිච්චානිච.

23. තීණි සන්තීරණ කිච්චානි

24. මනොද්වාරාවජ්ජන මෙව පඤ්චද්වාරෙ වොත්ථපන කිච්චං සාධෙති.

25. ආවජ්ජනද්වය වජ්ජිතානි කුසලා කුසල ඵල කිරිය චිත්තානි පඤ්ච පඤ්ඤාස ජවන කිච්චානි

26. අට්ඨ මහා විපාකානිචෙව සන්තීරණත්තයං චෙති එකාදස තදරම්මණ කිච්චානි

27. තෙසු පන ද්වෙ උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තානි පටිසන්ධි භවඞ්ග චුති තදරම්මණ සන්තීරණ වසෙන පඤ්ච කිච්චානි නාම.

28. මහා විපාකානි අට්ඨ පටිසන්ධි භවඞ්ග චුති තදරම්මණ වසෙන චතුකිච්චානි නාම.

29. මහග්ගත විපාකානි නව පටිසන්ධි භවඞ්ග චුති වසෙන තිකිච්චානි නාම.

30. සොමනස්ස සන්තීරණං සන්තීරණ තදරම්මණ වසෙන දුකිච්චං.

31. තථා වොත්ථපනං වොත්ථපනාවජ්ජන වසෙන.

32. සෙසානි පන සබ්බානිපි ජවන මනො ධාතුත්තික විපඤ්ච විඤ්ඤාණානි යථාසම්භව මෙකකිච්චානීති.

33. පටිසන්ධාදයොනාම – කිච්චභෙදෙන චුද්දස
දසධාඨාන භෙදෙන – චිත්තුප්පාද පකාසිතා

34. අට්ඨ සට්ඨි තථාද්වෙච – නවාට්ඨද්වේ යථාක්කමං
එක ද්වි ති චතු පඤ්ච – කිච්චට්ඨානානි නිද්දිසෙ.

35. ද්වාර සඞ්ගහෙ ද්වාරානි නාම චක්ඛුද්වාරං සොතද්වාරං ඝාණද්වාරං ජිව්හාද්වාරං කායද්වාරං මනොද්වාරං චෙති ඡබ්බිධානි භවන්ති.

36. තත්ථ චක්ඛුමෙව චක්ඛුද්වාරං, තථා සොතාදයො සොත ද්වාරාදිනි.

37. මනොද්වාරං පන භවඞ්ගන්ති පවුච්චති.

38. තත්ථ පඤ්චද්වාරාවජ්ජන චක්ඛු විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන කාමාවචර ජවන තදරම්මණ වසෙනඡ චත්තාළීස චිත්තානි චක්ඛුද්වාරෙ යථාරහං උප්පජ්ජන්ති.

39. තථා පඤ්චද්වාරාවජ්ජන සොතවිඤ්ඤාණාදිවසෙන සොතද්වාරාදිසුපි ඡචත්තාළිසෙව භවන්තීති සබ්බථාපි පඤ්චද්වාරෙ චතුපඤ්ඤාස චිත්තානි කාමාවචරා නෙව.

40. මනොද්වාරෙ පන මනොද්වාරාවජ්ජන පඤ්චපඤ්ඤාස ජවන තදරම්මණ වසෙන සත්ත සට්ඨි චිත්තානි භවන්ති.

41. එකූනවීසති පටිසන්ධි භවඞ්ග චූතිවසෙන ද්වාරවිමුත්තානි.

42. තෙසුපන ද්විපඤ්ච විඤ්ඤාණානි චෙව මහග්ගත ලොකුත්තර ජවනානි චෙති ඡත්තිංස යථාරහමෙක ද්වාරික චිත්තානිනාම.

43. මනොධාතුත්තිකං පන පඤ්චද්වාරිකං

44. සුඛසන්තීරණ වොත්ථපන කාමාවචර ජවනානි ඡද්වාරික චිත්තානි.

45. උපෙක්ඛා සහගත සන්තීරණ මහාවිපාකානි ඡද්වාරිකානි චෙව ද්වාර විමුත්තානිච.

46. මහග්ගත විපාකානි නව ද්වාරවිමුත්තානෙවාති.

47. එකද්වාරික චිත්තානි – පඤ්ච ඡද්වාරිකානිච
ඡද්වාරික විමුත්තානි – විමුත්තානිච සබ්බථා
ඡත්තිංසති,තථාතීණි – එකතිංස යථාක්කමං
දසධානවධා චෙති – පඤ්චධාපරිදීපයෙ.

48. ආලම්බන සඞ්ගහෙ ආලම්බනානිනාම රූපාරම්මණං සද්දරම් මණං, ගන්ධාරම්මණං රසාරම්මණං පොට්ඨබ්බාරම්මණං ධම්මා රම්මණං චෙති ඡබ්බිධානි භවන්ති.

49. තත්ථ රූපමෙව රූපාරම්මණං, තථා සද්දදයොසද්දරම්මණාදීනි

50. ධම්මාරම්මණං පන පසාද සුඛමරූප චිත්ත චෙතසික නිබ්බාන පඤ්ඤත්ති වසෙන ඡධා සඞ්ගය්හන්ති.

51. තත්ථ චක්ඛුද්වාරික චිත්තානං සබ්බෙසම්පි රූපමෙව ආරම්ම ණං, තංචපච්චුප්පන්නං, තථා සොතද්වාරික චිත්තාදීනම්පි සද්දදීනි, තානිච පච්චුප්පන්නානි යෙව

52. මනොද්වාරික චිත්තානං පන ඡබ්බිධම්පි පච්චුප්පන්නමතීතං අනාගතං කාලවිමුත්තංච යථාරහමාරම්මණං හොති.

53. ද්වාරවිමුත්තානංච පටිසන්ධි භවංග චුති සඞ්ඛාතානං ඡබ්බිධං යථාසම්භවං යෙභුයොන භවන්තරෙ ඡද්වාරගහිතං පච්චුප්පන්න මතීතං පඤ්ඤත්ති භූතං වා කම්ම කම්මනිමිත්ත ගතිනිමිත්ත සම්මතං ආරම්මණං හොති.

54. තෙසු චක්ඛු විඤ්ඤාණාදීනි යථාක්කමං රූපාදි එකෙකා රම්මණා නෙව.

55. මනොධාතුත්තිකං පන රූපාදිපඤ්චාරම්මණං

56. සෙසානි කාමාවචර විපාකානි හසන චිත්තං චෙති සබ්බථාපි කාමාවචරාරම්මණා නෙව.

57. අකුසලානි චෙව ඤාණවිප්පයුත්ත කාමාවචරජවනානි චෙති ලොකුත්තර වජ්ජිත සබ්බාරම්මණානි.

58. ඤාණ සම්පයුත්ත කාමාවචර කුසලානිචෙව පඤ්චමජ්ඣාන සඞ්ඛාතං අභිඤ්ඤා කුසලං චෙති අරහත්ත මග්ග ඵල වජ්ජිත සබ්බා රම්මණානි.

59. ඤාණසම්පයුත්ත කාමාවචර කිරියානි චෙව කිරියාභිඤ්ඤා වොත්ථපනං චෙති සබ්බථාපි සබ්බාරම්මණානි.

60. ආරුප්පෙසු දුතිය චතුත්ථානි මහග්ගතාරම්මණානි.

61. සෙසානි මහග්ගත චිත්තානි සබ්බානිපි පඤ්ඤත්තාරම්මණානි.

62. ලොකුත්තර චිත්තානි නිබ්බානාරම්මණානීති.

63. පඤ්චවීස පරිත්තම්හි – ඡචිත්තානි මහග්ගතෙ
එකවීසති වොහාරෙ – අට්ඨ නිබ්බාන ගොචරෙ

64. වීසානුත්තර මුත්තම්හි – අග්ග මග්ග ඵලුජ්ඣිතෙ
පඤ්ච සබ්බත්ථ ඡච්චෙති –සත්තධා තත්ථ සඞ්ගහො

65. වත්ථු සඞ්ගහෙ වත්ථූනිනාම චක්ඛු සොත, ඝාණ, ජිව්හා කාය, හදයවත්ථු චෙති ඡබ්බිධානි භවන්ති.

66. තානි කාම ලොකෙ සබ්බානි පි ලබ්භන්ති.

67. රූපලොකෙපන ඝාණා දිත්තයං නත්ථි

68. අරූපලොකෙ පන සබ්බානිපි නසං විජ්ජන්ති

69. තත්ථ පඤ්ච විඤ්ඤාණ ධාතුයො යථාක්කමං එකන්තෙන පඤ්චප්පසාද වත්ථූනි නිස්සා යෙව පවත්තන්ති.

70. පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන සඞ්ඛාතා පන මනොධාතුච හදයං නිස්සිතා යෙව පවත්තන්ති.

71. අවසෙසාපන මනොවිඤ්ඤාණ ධාතු සඞ්ඛාතාච සන්තීරණ මහා විපාක පටිසද්වය පඨමමග්ග හසන රූපාවචර වසෙන හදයං නිස්සායෙව පවත්තන්ති.

72. අවසෙසා කුසලාකුසල කිරියානුත්තර වසෙන පන නිස්සායවා අනිස්සායවා

73. ආරුප්පවිපාක වසෙන හදයං අනිස්සායෙවාති

74. ඡවත්ථු නිස්සිතා කා මෙ – සත්තරූපෙචතුබ්බිධා
තිවත්ථු නිස්සිතාරුප්පෙ – ධාත්වෙකානිස්සිතා මතා.

75. තෙචත්තාළීස නිස්සාය – ද්වෙචත්තාළීසජායරෙ
නිස්සායච අනිස්සාය – පාකාරුප්පා අනිස්සිතා.

ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ පකිණ්ණක සඞ්ගහ විභාගොනාම
තතියො පරිච්ඡෙදෙ

# අභිධර්මාර්ථ සංග්‍රහය

## තෘතිය පරිච්ඡේදය

### භාවය

### ප්‍රකීර්ණක සංග්‍රහය

1. යෙදෙන පරිද්දෙන් සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසික ධර්මයෝ ස්වභාව ලක්ෂණ වශයෙන් තෙපනසක් වෙති.

2. දැන් වෙදනා, හේතු, කෘත්‍ය, ද්වාර, ආරම්මණ, වස්තූන්ගේ භෙදයෙන් ඒ ධර්මයන්ගේ සංග්‍රහය චිත්තයන්ගේ වශයෙන් දක්වනු ලැබේ.

3. එහි වෙදනා සඞ්ග්‍රහයෙහි පළමුකොට සුඛ, දුක්ඛ, අදුක්ඛම-සුඛ වශයෙන් ත්‍රිවිධ වෙදනා ද සුඛ, දුක්ඛ, සොමනස්ස, දෞමනස්ස උපෙක්ඛා භෙදයෙන් පඤ්ච විධ වෙදනා ද වේ.

4. එහි සුඛ වේදනාව ඇති සිත එකම කුසල විපාක කාය විඤ්ඤාණ යයි. එසේ ම දුක්ඛ වේදනාව ඇති සිත එකම අකුසල විපාක කාය විඤ්ඤාණයයි.

5. සොමනස්ස වේදනා සහිත සිත් වනාහී ලොභ මූල සතරය, කාමාවචර සොභන දෙළොසය, සුඛ සන්තීරණ හසන දෙසිතය, යන කාමාවචර සොමනස්ස සහගත සිත් අටළොසද, ප්‍රථම ද්‍විතිය, තෘතීය, චතුර්ථ ධ්‍යාන සඞ්ඛ්‍යාත වූ සිව්සාළිස් මහග්ගත ලොකොත්තර සිත් දැයි දෙසැටවැදෑරුම් වෙත්.

6. දෞමනස්ස සහගත සිත් වනාහි පටිඝසම්ප්‍රයුක්ත දෙසිතමය.

7. සෙසු සියළු පස් පනස් චිත්තයෝ උපෙක්ඛා සහගත චිත්ත යෝ ය.

8. එහි වේදනාව සුඛ, දුක්ඛ, උපෙක්ඛා යයි ත්‍රිවිධ වේ. සොම නස් දෞමනස් දෙදෙනාත් සමඟ පඤ්ච විධ වෙත්.

9. සුඛය එක් සිතෙක්හි ද, දුක්ඛයත් එක් සිතෙක්හිද, දෞර්මනස දෙසිතක ද, සොම්නස දෙසැටසිතෙක්හි ද, උපෙක්ඛා ඉතිරි පස් පනසෙහි ද සිටියාය.

10. හේතු සංග්‍රහයෙහි හේතුහු නම් ලොභ, දෙස, මොහ, අලොභ, අදෙස, අමොහ යයි සවැදෑරුම් වෙත්.

11. එහි පඤ්චද්වාරාවජ්ජන, ද්විපඤ්ච විඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ වොත්ථපන, හසනයන් ගේ වශයෙන් අටළොසක් අහේතුක සිත් නම් වෙත්.

12. සෙසු සියළු එක් සත්තෑ දසිත් සහේතුක චිත්තයෝ ම වෙත්.

13. එහි ද මොහමූල දෙසිත ඒක හේතුක වෙත්.

14. සෙසු දස අකුසල් සිත් ද ඤාණ විප්‍රයුක්ත කාමාවචර සොභන සිත් දොළොස ද යන සිත් දෙවිස්ස ද්විහේතුක චිත්තයෝ වෙත්.

15. දොළොස් ඤාණ සම්ප්‍රයුක්ත කාමාවචර සොභන සිත් ද, පන්තිස් මහග්ගත ලොකොත්තර සිත් ද, යන සත්සාළිස ත්‍රිහේතුක චිත්තයෝ නම් වෙත්.

16. ලොභ, දෙස, මොහ යයි අකුසල හේතු තිදෙනෙක් වෙත්. එසේ ම අලොභ, අදෙස, අමොහ යයි කුසලාව්‍යාකෘත හේතුහු වෙත්.

17. අහේතුක අටළොසෙක, ඒක හේතුක දෙකෙක, ද්විහේතුක දෙවිස්සෙක. ත්‍රිහේතුක සත්සාළිසෙක.

18. කෘත්‍ය සඞ්ග්‍රහයෙහි කෘත්‍යයෝ නම් ප්‍රතිසන්ධි, භවාඞ්ග ආවර්ජන, දර්ශන, ශ්‍රවණ, ඝායන, සායන, ඵුසන, සම්පටිච්ඡන සන්තීරණ, වොත්ථපන, ජවන, තදරම්මණ, චූති යන මේ තුදුස්වැදෑරුම් කෘත්‍යයෝය.

19. ප්‍රතිසන්ධි, භවාඞ්ග, ආවජ්ජන, පඤ්චවිඤ්ඤාණස්ථානාදීන් ගේ වශයෙන් ඔවුන්ගේ දස ආකාර ස්ථාන භෙදය දත යුතු.

20. එහි උපෙක්ඛා සහගත සන්තීරණ සිත් දෙකය, මහා විපාක අටය. රූපාරූප විපාක නවය යන එකුන් විස්ස ප්‍රතිසන්ධි, භවඞ්ග, චූතිකෘත්‍යය ඇති සිත් නම්.

21. ආවජ්ජන කෘත්‍යය ඇති සිත් දෙකෙකි.

22. එසේ ම දර්ශන, ශ්‍රවණ, ඝ්‍රායන, සායන, ඵුසන, සම්පටිච්ඡණ කෘත්‍ය ඇති සිත් දෙක බැගින්ය.

23. සන්තීරණ කෘත්‍යය ඇති සිත් තුනෙකි.

24. මනොද්වාරාවජ්ජනයම පඤ්චද්වාරයෙහි වොත්ථපන කෘත්‍ය, සිදු කරයි.

25. ආවජ්ජන දෙසිත හැර කුසල්, අකුසල්, ඵල, කිරිය සිත් ඔස් පනස ජවන කෘත්‍ය ඇති සිත්ය.

26. අෂ්ඨ මහා විපාකයන් හා සන්තීරණත්‍රය යන එකොළොස තදරම්මණ කෘත්‍ය ඇති සිත්ය.

27. එයින් උපෙක්ඛාසහගත සන්තීරණ චිත්තද්වය ප්‍රතිසන්ධි භවාඞ්ග චුති සන්තීරණ, තදරම්මණ වශයෙන් කෘත්‍ය පසක් ඇති චිත්තයෝ ය.

28. මහාවිපාක අට ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති තදරම්මණ යන සතර විධ කෘත්‍ය ඇති සිත් ය.

29. මහග්ගත විපාක සිත් නවය ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති යන කෘත්‍ය තුනත් ඇති සිත් ය.

30. සොමනස් සන්තීරණය, සන්තීරණ තදරම්මණ යන කෘත්‍ය දෙකක් ඇති සිතය.

31. එසේ ම වොත්ථපනය, වොත්ථපන, ආවජ්ජන වශයෙන් කෘත්‍ය දෙකක් ඇත්තේය.

32. සෙසු සියළු ජවන, මනොධාතුත්‍රිකය, ද්විපඤ්ච විඤ්ඤාණ යෝ යෙදෙන පරිදි එක් කෘත්‍යයක් ඇති සිත් ය.

33. පටිසන්ධි ආදී නම් ඇති චිත්තයෝ කෘත්‍ය භෙදයෙන් තුදුසෙක් වෙති. ස්ථාන භෙදයෙන් දස විධ වෙතියි ප්‍රකාශ කරණ ලදී.

34. අට සැටෙක, දෙකෙක, නවයෙක, අටෙක, නැවත දෙකෙ කැයි පිළිවෙලින් මෙසේ කෘත්‍යස්ථාන දක්වන්නේය.

35. ද්වාර සංග්‍රහයෙහි ද්වාරයෝ නම් චක්ඛුද්වාරය, සොතද්වාරය, ඝාණද්වාරය, ජිව්හාද්වාරය කායද්වාරය, මනොද්වාර යයි සවැදෑරුම් වෙත්.

36. එහි චක්ඛු ප්‍රසාදයම චක්ඛුද්වාර නම් වේ. එසේම සොත ප්‍රසාදදීහුම සොතද්වාරාදීහු වෙත්.

37. මනොද්වාරය වනාහී භවඞ්ග චිත්තය යයි කියනු ලැබේ.

38. එහි පඤ්චද්වාරාවජ්ජනය, චක්ඛු විඤ්ඤාණ, සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන, කාමාවචර ජවන, තදාරම්මණ වශයෙන් සසාළිස් (46) සිත් චක්ඛුද්වාරයෙහි සුදුසු පරිද්දෙන් උපදිත්.

39. එසේම පඤ්චද්වාරාවජ්ජන, සොත විඤ්ඤාණාදින්ගේ වශයෙන් සොතද්වාරාදීන්හි සිත් සසාළිස බැගින් වෙත්. මෙසේ සර්වප්‍රකාරයෙන් පඤ්චද්වාරයෙහි උපදනා සිත් සිව්පනස කාමාවචරමය.

40. මනොද්වාරයෙහි වනාහී මනොද්වාරාවජ්ජනය, පස් පනස් ජවනය, තදාරම්මණ වශයෙන් සිත් සැට සතක් වෙත්.

41. පටිසන්ධි, භවාංග, චුති වශයෙන් සිත් එකුන් විස්ස ද්වාර විමුක්තය.

42. ඒ සිත් අතුරෙන් දෙපස් විඤ්ඤාණයෝද මහග්ගත ලොකොත්තර ජවනයෝ ද යන සතිස සුදුසු පරිද්දෙන් ඒකද්වාරික සිත් නම් වෙත්.

43. මනොධාතුත්‍රිකය වනාහී පඤ්චද්වාරිකය.

44. සුඛ සන්තීරණ, වොත්ථපන, සහ කාමාවචරජවනයෝ ඡද්වාරික සිත්ය.

45. උපෙක්ඛා සහගත සන්තීරණ, මහා විපාකයන් ඡද්වාරික වෙත්. ද්වාර විමුක්තද වෙත්.

46. නව මහග්ගත විපාකයෝ ද්වාරවිමුක්තම වෙත්.

47. ඒකද්වාරික, පඤ්චද්වාරික, ඡද්වාරික, ඡද්වාරිකද්වාරවිමුක්ත ද්වාරවිමුත්ත සිත් පිළිවෙලින් සතිසෙක, තුනෙක, එක්තිසෙක, දසයෙක, නවයෙකැයි මෙසේ පඤ්චප්‍රකාරයකින් දක්වන්නේ ය.

48. ආලම්බන සංග්‍රහයෙහි ආලම්බනයෝ නම් රූපාරම්මණ, සද්දරම්මණ, ගන්ධාරම්මණ, රසාරම්මණ, පොට්ඨබ්බාරම්මණ,ධම්මා රම්මණ යයි සවැදෑරුම් වෙත්.

49. එහි වර්ණයම රූපාරම්මණයයි. එසේ ම ශබ්දදීහු ශබ්දරම්ම ණාදීහු වෙත්.

50. ධම්මාරම්මණය වනාහී ප්‍රසාදරූප, සුඛුමරූප, චිත්ත චෛත සික, නිර්වාණ ප්‍රඥප්තීන්ගේ වශයෙන් ෂට් ප්‍රකාරයකින් සංග්‍රහ කරනු ලැබේ.

51. එහි සියළුම චක්ඛු ද්වාරික චිත්තයන්ට රූපයම අරමුණු වෙයි. එය ද වර්තමාන අරමුණකි. එසේම සොතද්වාරික චිත්තා දීන්ට ද ශබ්දදීහු අරමුණු වෙත්. ඔව්හු ද වර්තමාන අරමුණු මය.

52. මනොද්වාරික චිත්තයන්ට වනාහී , වර්තමාන වූද, අතීත වූද, අනාගතවූද කාලවිමුක්තවූද ආරම්මණයෝ සුදුසු පරිද්දෙන් අරමුණු වෙත්.

53. ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති සඞ්ඛ්‍යාත වූ ද්වාර විමුක්ත චිත්ත යන්ටද ෂඩ් විධ වූ අරමුණු ලැබෙත්. බොහෝ සෙයින් ඉකුත් භවයෙහි සදෙරින් ගන්නා ලද වර්තමානවූ හෝ අතීත වූ හෝ ප්‍රඥප් ති වූ හෝ කර්ම, කර්ම නිමිති, ගති නමිති යයි සම්මත අරමුණක් වෙයි.

54. ඔවුන් අතුරෙන් චක්ඛු විඤ්ඤාණාදීහු පිළිවෙලින් රූපාදී එක් අරමුණක් ඇත්තෝය.

55. මනොධාතුත්‍රිකය වනාහී රූපාදි පස් අරමුණු ඇති සිත්ය.

56. සෙසු කාමාවචර විපාකයෝ ද, හසන චිත්තය ද කාමාවචර අරමුණු ම ගන්නාහු වෙත්.

57. අකුසල් සහ ඥාණ විප්‍රයුක්ත කාමාවචර ජවනයෝ ද ලොකො තර ධර්ම හැර සියලු අරමුණු ගන්නාහු වෙත්.

58. ඥාණ සම්ප්‍රයුක්ත කාමාවචර කුසලයන් ද පඤ්චමධ්‍යාන අභිඥාකුසලය ද යන සිත් අර්හත් මාර්ගඵලයන් හැර සියලු අර මුණු ඇත්තාහු වෙත්.

59. ඤාණ සම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා ක්‍රියා අභිඤ්ඤා වොත්ථ-පන යන සිත් සියල්ලම අරමුණු කොට ඇති සිත්ය.

60. අරූපයන් අතුරෙන් දෙවෙනි සතරවෙනි අරූපාවචර සිත් මහග්ගත අරමුණු ඇත්තාහු වෙත්.

61. සෙසු මහග්ගත සිත් ප්‍රඥප්ති ධර්ම අරමුණු කොට ඇත්තා-හුය.

62. ලොකොත්තර සිත් නිර්වාණයම අරමුණු කොට ඇත්තාහුය.

63. කාම අරමුණෙහි පස්විස්සෙක, මහග්ගත අරමුණෙහි සයෙක, ප්‍රඥප්ති අරමුණෙහි එක් විස්සෙක, නිර්වාණාරම්මණයෙහි සිත් ටෙක් ද වෙත්.

64. ලොකොත්තර අරමුණ හැර සෙසු අරමුණෙහි සිත් විස්සෙක්ද අර්හත් මාර්ග ඵලයන් හැර සෙසු අරමුණෙහි පසෙක් ද සියලු අර මුණෙහි සයෙක්දයි මෙසේ ආරම්මණ සංග්‍රහයෙහි සත් පරිද්දෙකින් සංග්‍රහ වෙත්.

65. වස්තු සඞ්ග්‍රහයෙහි වස්තුහු චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය හදය වත්ථු යයි ෂට් ප්‍රකාර වෙත්.

66. ඒ වස්තුරූප සියල්ලම කාමභවයෙහි ලැබෙති.

67. රූපලොකයෙහි ඝාණාදිත්‍රය නැත.

68. අරූප භවයෙහි කිසිදු වස්තු රූපයෙක් නො ලැබේ.

69. එහි පඤ්ච විඤ්ඤාණ ධාතුහු පිළිවෙලින් ඒකාන්තයෙන් ම පඤ්චප්‍රසාද වස්තූන් නිසාම පවතිත්.

70. පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන සඞ්ඛ්‍යාත වූ මනොධාතු ද හෘදය වසතුව නිසාම පවතිත්.

71. අවශෙෂ වූ මනොවිඤ්ඤාණ ධාතු නම් වූ සන්තීරණ මහා විපාක, පටිසද්වය, ප්‍රථමමාර්ගය, හසිතොත්පාදය, රූපාවචර චිත්ත-යෝ යන මොව්හු හදයවස්තු නිසාම පවතිත්.

72. අවශෙශ වූ කුසලා කුසල ක්‍රියා ලොකොත්තර සිත් හදය වස්තුව නිසා හෝ නො නිසා හෝ පවතිත්.

73. අරූපවිපාකයන් ගේ වශයෙන් හදයවස්තුව නිශ්‍රය නො කොට පවතිත්.

74. කාමභූමියෙහි වස්තුසයක් ඇසුරු කොට විඤ්ඤාණ ධාතු සතක් ද රූප භූමියෙහි වස්තු තුනක් ඇසුරු කොට විඤ්ඤාණ ධාතු සතරක් ද අරූප භූමියෙහි වස්තු රූපයක් ඇසුරු නො කොට එකම විඤ්ඤාණ ධාතුවක් ද පවතී යයි දන්නා ලදී.

75. වස්තු රූපයන් නිසා ම සිත් තෙසාළිසෙක. වස්තු රූප නිසා ද නො නිසා ද සිත් දෙසාළිසෙක. වස්තු රූප නො නිසාම අරූප විපාක සිත් සතර උපදිත්.

මෙසේ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ප්‍රකීර්ණක සංග්‍රහ විභාග නම් වූ තෘතිය පරිච්ඡේදය නිමි

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## තෘතීය පරිච්ඡේදය

### ප්‍රකීර්ණක සංග්‍රහ විභාගය

තෙපනස් (53) ධර්මයන්ගේ **වේදනා භෙදය, හෙතු භෙදය, කෘත්‍ය භෙදය, ද්වාර භෙදය, ආරම්මණ භෙදය, වත්ථු භෙදය** යන මොවුන්ගේ වශයෙන් සයාකාර භෙදය දැක්වීම **ප්‍රකීර්ණක සංග්‍රහය** නම් වේ.

චිත්තයත්, චෛතසික පනස් දෙකත්, එක්කොට ගත් කල්හි **තෙපනස් ධර්මයෝයි.**

**චිත්තයාගේ** ප්‍රභෙද සංක්ෂෙපයෙන් එකුන් අනූවක් (89) හෝ, විස්තර වශයෙන් එක්සිය විසි එකක් (121) වන නමුත්, **ආරම්මණ විජානන** ලක්ෂණය හෙවත් **අරමුණු දැනීම** සියළු චිත්තයන්ගේම එකම සාධාරණ ලක්ෂණය බැවින් මේ සිත් සියල්ල එක් කොට ගෙන, එක් ධර්මයක් ලෙස සළකනු ලැබේ.

චෛතසික දෙපනස, **අරමුණු ස්පර්ශ** කිරීම, **අරමුණු රසවිඳීම, අරමුණු හැඳිනීම** යන ආදී වශයෙන් වෙන් වෙන්වූ ලක්ෂණ දෙපනසක්ම ඇති හෙයින්, ධර්ම වශයෙන් දෙපනසක් කොට සළකනු ලැබේ. මෙසේ ස්වභාව ලක්ෂණ යන්ගේ වශයෙන් වෙන් වෙන්වූ ධර්ම බැවින් සිතත්, චෛතසික දෙපනසත් එක්කොට ගෙන **තෙපනස් ධර්මයෝයයි** කියති. මෙයටම තෙපනස් **නාම ධර්ම** යයි ද කියනු ලැබේ. මෙසේ චිත්ත චෛතසික ධර්මය එකතු කොට මිශ්‍ර කොට වේදනාදී වශයෙන් බෙද දක්වන හෙයින් **ප්‍රකීර්ණක සංග්‍රහ** යයි කියනු ලැබේ.

# වේදනා සංග්‍රහය

**වේදනා** යනු ආරම්මණ රසය විඳීමට කියන නමෙකි. වේදනා භේදයෙන් චිත්ත චෛතසිකයන් බෙද දැක්වීම **වේදනා සංග්‍රහයවේ.**

හැම සිතක්ම අරමුණක් ගෙන උපදින බැවින්, ඒ අරමුණෙහි රසය විඳ ගැනීමේ ශක්තිය වූ වේදනාව හැම සිතකම ඇතිවේ. අරමුණු නොයෙක් ආකාර බැවින් වේදනාව ද ඒ ඒ අරමුණු සවභාවයට අනුව වෙනස් වේ.

සිත්හි යෙදෙන මේ වේදනා චෛතසිකය දෙයාකාරයෙකින බෙද දක්වනු ලැබේ. එනම්

**1. අනුභවන භේදය 2. ඉන්ද්‍රිය භේදය**

### අනුභවන භේදය

අරමුණු රස විඳ ගැනිම හෙවත් රස අනුභවනය කිරීමේ ආකාරයෙන් වේදනාව ත්‍රිවිධාකාර වේ. එනම් **සුඛ වේදනාව, දුක්ඛ වේදනාව, උපෙක්ඛා වේදනාව** යනුයි.

ඉෂ්ටවූ ද, ප්‍රියමනාපවූ ද, කැමැතිවන්නාවූ ද, අරමුණක් හමු වූ කල්හි සිතෙහි පහළ වන්නා වූ සතුටු කරවන සැප ගෙන දෙන සවභාවය **සුඛ වේදනා** නම් වේ. මේ සැප වේදනා ඇති සිත් සියල්ල සැටතුනෙකි (63). එනම්

| | |
|---|---|
| **සොමනස්ස ලොභ මූල සිත්** | **4** |
| **සුඛ සහගත කාය විඤ්ඤාණය** | **1** |
| **සොමනස්ස සන්තිරණය සහ හසිතුප්පාදය** | **2** |
| **සොමනස්ස කාම සොභන සිත්** | **12** |
| **ප්‍රථම ධ්‍යාන ද්විතියධ්‍යාන, තතියධ්‍යාන චතුර්ත්ථධ්‍යාන සිත්** | **44** |
| | **63** |

අනිෂ්ටවූ ද, අප්‍රියවූ ද, අමනාපවූ ද, කැමැති නොවන්නාවූ ද, **අරමුණක්** හමු වූ කල්හි සිතෙහි පහළවන්නා වූ නොසතුට ඇති කරවන දුක ගෙනදෙන ස්වභාවය **දුක්ඛ වේදනා** නම් වේ. මේ දුක්ඛ වේදනා ඇති සිත් තුනෙකි. එනම්

| | |
|---|---|
| **දෙමනස්ස දෙසමූල සිත්** | 2 |
| **දුක්ඛ සහගත කායවිඤ්ඤාණය** | 1 |
| | 3 |

අති ඉෂ්ට නොවූ, ඉෂ්ට මධ්‍යස්ථවූ මැදහත් තරමින් ප්‍රියවූ කැමැති වන්නාවූ අරමුණක් හමුවූ කල්හි සිතෙහි පහළවන්නාවූ සැපත් නොවූ දුකත් නොවූ මැදහත් විඳීම් ආකාරය **උපෙක්ඛා වේදනා** නම් වේ. මේ උපෙක්ඛා වේදනා ඇති සිත් පස් පනසෙකි. (55) එනම්.

| | |
|---|---|
| **උපෙක්ඛා සහගත අකුසල් සිත්** | 6 |
| **අහේතුක උපෙක්ඛා සහගත සිත්** | 14 |
| **උපෙක්ඛා සහගත කාම සොභන සිත්** | 12 |
| **උපෙක්ඛා සහගත පඤ්චමධ්‍යාන සිත්** | 23 |
| | 55 |

## ඉන්ද්‍රිය භේදය

මේ වේදනාවම ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වර භාවය කරන හෙයින් **ඉන්ද්‍රිය ධර්මයක්ද** වේ.

**ඉන්ද්‍රිය භේදයෙන්** වේදනා චෛතසිකය පඤ්චවිධ වේ. එනම්— **සුඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, දෙමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය** යනුයි.

අනුභවන භේදයේ දී දක්වන ලද **සුඛ වේදනාව** මෙහිදි **සුඛෙන්ද්‍රිය, සොමනස්සෙන්ද්‍රිය** යයි ද, **දුක්ඛවේදනාව, දුක්ඛෙන්ද්‍රිය, දෙමනස්සෙන්ද්‍රිය** යයිද, **උපෙක්ඛා වේදනාව උපෙක්ඛෙන්ද්‍රිය** යයි ද දක්වන ලදී.

**සුඛ වෙදනාව, සුඛ සොමනස්ස, ඉන්ද්‍රිය** යන් වශයෙන් දෙශනා කරන ලද්දේ කායික සැප වෙදනාවත්, මානසික සැප වේදනාවත් වෙන්කොට දක්වනු පිණිසය.

**දුක්ඛ වෙදනාවද** දුක්ඛ දෙමනස්ස ඉන්ද්‍රියයන් වශයෙන් කායික දුක්ඛය, මානසික දුක්ඛය දක්වීම පිණිසම දෙශනා කරන ලදී.

ඉන්ද්‍රිය භෙදයට අනුව **සුඛ වෙදනා** ඇති සිත් එකෙකි. එනම් **සුඛ සහගත කායවිඤ්ඤාණයයි.**

අනුභවන භෙදයෙන් දක්වන ලද සුඛ වෙදනා ඇති සිත් සැට තුනෙන් මේ සුඛ සහගත කාය විඤ්ඤාණය හැර ඉතිරි සිත් සැට දෙකම **සොමනස්ස වෙදනා** ඇති සිත් වේ.

එමෙන්ම **දුක්ඛ වෙදනා** ඇති සිත් එකෙකි. එනම් **දුක්ඛ සහගත කාය විඤ්ඤාණයයි.**

දෙමනස්ස වෙදනා ඇති සිත් දෙකෙකි. එනම් **දෙමනස්ස දෙස මූල සිත්දෙකය.**

උපෙක්ඛා වෙදනා ඇති සිත්, අනුභවන භෙදයේදී දක්වන ලද සිත් පස්පනසය.

එක්සිය විසි එකක් ප්‍රභෙද ඇති මේ සියළුම සිත්හි යෙදෙන **වෙදනාවෝ** එක් කොට ගත්කල්හි, **රූප වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ** යන පඤ්චස්කන්ධයන් අතුරෙන් වෙදනා ස්කන්ධයට ඇතුළත් වේ.

ත්‍රෛභූමිකවූ මේ සියළු වෙදනාවෝ ප්‍රත්‍යයෙන් හට ගන්නා බැවින් සියළු වෙදනා, **දුක්ඛ වෙදනා** යයි වදරණ ලදී. මේ දුක්ඛ වෙදනාවද, **දුක්ඛ දුක්ඛය, සංඛාර දුක්ඛය; විපරිනාම දුක්ඛය** යයි ත්‍රිවිධ වේ. ඔවුන් අතුරෙන් **ජාති, ජරා,** ව්‍යාධි, **මරණ, ශොක, පරිදේව, දුක්ඛ, දෙමනස්ස, උපායාසාදි** සසර දුක් හා **සතර අපා දුකද,** ස්වභාවශයෙන්ද නාම වශයෙන්ද, දුක්ම වන බැවින් **දුක්ඛ දුක්ඛ** නම් වේ.

අවශෙෂවූ, භවත්‍රයෙහි ඇතුළත්වූ, සුඛ වෙදනා, උපෙක්ඛා වෙදනා යයි සම්මතවූ සියළු වෙදනාවෝ ප්‍රත්‍යයෙන්ම හටගන්නා බැවින් ද ත්‍රෛභූමික සංස්කාරයන්ගේ ලක්ෂණවූ උදය–වැය දෙකින් පීඩිත වන බැවින් ද **සංඛාර දුක්ඛය** යයි කියනු ලැබේ.

අසූහාර දහසක් මහා කල්පයන්ට ආයු ඇත්තාවූ නෙව සඤ්ඤා නාසඤ්ඤායතනයෙන් චුත වී එන අවස්ථාවෙහි එපමණ දීර්ඝ කාල යක් වින්ද වූ විරාගී සැපයද, කායවස්තුක වූද අනායවූද සුඛ වෙදනා වෝද සවභාවයෙන් දුක් නො වෙතත් පෙරලීමෙන් දුක් ඉපදීමට හෙතු වන බැවින් **විපරි නාම දුක්ඛ** නම් වේ.

තවද, මේ දුක්ඛ වෙදනාවෝ **පටිච්ඡන්න දුක්ඛය අපටිච්ඡන්න දුක්ඛය, පරියාය දුක්ඛය, නිප්පරියාය දුක්ඛය** යනාදී වශයෙන් ද ප්‍රභෙද ඇත්තේය. අත්, පා, හිස, දත්, කන් ආදී අවයවයන් පිළිබඳ ව ඇතිවන්නාවූ වෙදනාද, රාග ද්වේෂාදියෙන් වන්නාවූ සිත් තැවිලිද, යනාදී කායික මානසික ආබාධයන් අසාම දැනගත යුතු බැවින්ද, එයට හෙතුව අප්‍රකට බැවින්ද, **පටිච්ඡන්න දුක්** නම් වේ.

බාහිරව පැමිණෙන්නාවූ නොයෙක් පීඩා, වධ, බන්ධන ආදිය නො අසාම දතහැකි බැවින්ද, උපක්‍රමය ප්‍රකට බැවින්ද, **අපටිච්ඡන්න දුක්ඛය** නම් වේ.

**දුක්ඛ දුක්ඛයට** අයත් නොවූ ජාති ආදී නාමයන් ගෙන් ප්‍රකාශ වන සියල්ලම ඒ ඒ දුකට වස්තු වන බැවින් හෙවත් කාරණා වන බැවින් **පරියාය දුක්ඛ** නම් වේ. **නිප්පරියාය දුක්ඛය** නම් මේ **දුක්ඛ දුක්ඛය** මය.

සංක්ෂෙපයෙන් වෙදනා භෙදය මෙසේ දත යුතුයි.

**1. සුඛ වෙදනා** (සිත් 63)

(1) සුඛෙන්ද්‍රිය. සුඛ සහගත කාය විඤ්ඤාණය 1

(2) සොමනස්සෙන්ද්‍රිය. (62)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | අසොභන | සොමනස්ස අකුසල් | 4 | 6 | 62 |
| | | සොමනස්ස සන්තීරණ | 1 | | |
| | | සොමනස්ස හසිතුප්පාද | 1 | | |
| 2 | සොභන. | කාම සොභන | 12 | 56 | |
| | | මහග්ගත (1–4 ධ්‍යාන) | 44 | | |

**2. දුක්ඛ වෙදනා** (සිත් 3)

| | | | |
|---|---|---|---|
| 3 | දුක්ඛෙන්ද්‍රිය. 1 දුක්ඛ සහගත කාය විඥ්ඥාණය | 1 | 3 |
| 4 | දෙමනස්සෙන්ද්‍රිය 2 දෙමනස්ස දෙස මුල | 2 | |

**3. උපෙක්ඛා වෙදනා** (5) **උපෙක්ඛෙන්ද්‍රිය** (සිත් 55)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | අසොභන. | උපෙක්ඛා අකුසල් සිත් | 6 | 20 | 55 |
| | | උපෙක්ඛා අහෙතුක සිත් | 14 | | |
| 2 | සොභන. | උපෙක්ඛා කාම සොභන | 12 | 35 | |
| | | උපෙක්ඛා මහග්ගත 5 ධ්‍යාන | 23 | | |

# හෙතු සංග්‍රහය

චිත්ත චෛතසික ධර්මයන් හේතූන්ගේ වශයෙන් බෙද දක්වීම **හෙතු සංග්‍රහය** නම් වේ.

නාම ධර්මයන් වූ චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි ස්ථිරව පිහිටීමට උපකාරවන ධර්ම **හෙතු ධර්ම** නමි. ගස්වැල් ආදිය පොළෙවෙහි ස්ථිරව පිහිටීමට මුල් උපකාර වන්නාක් මෙන් මේ හෙතු ධර්ම ද අරමුණෙහි ස්ථිරව පිහිටීමට උපකාරවන බැවින් මූල යයි ද කියනු ලැබේ.

හෙතු නාමය ලබන චෛතසිකයෝ සදෙනෙකි. එනම් **ලොභ, දෙස, මොහ, අලොභ, අදෙස, අමොහ** යනුයි. මෙයින් **ලොභ,**

**දෙස, මොහ** යන චෛතසික තුන අකුසල් සිත්හි යෙදෙන බැවින් **අකුසල හෙතු** යයි ද, **අලොභ, අදෙස, අමොහ** යන චෛතසික ධර්ම තුන කුසල් සිත්හි යෙදෙන කල්හි **කුසල හෙතු** යයි ද **විපාක** ක්‍රියා සිත්හි යෙදෙන කල්හි **අව්‍යාකෘත හෙතු** යයි ද ව්‍යවහාර කරනු ලැබේ.

මේ හෙතු ධර්ම සියළුම සිත්හි නොයෙදේ. එබැවින් හෙතු ධර්ම යෙදෙන සිත්වලට **සහෙතුක සිත්** යයි ද හෙතු ධර්ම නොයෙදෙන සිත් වලට **අහෙතුක සිත්** යයි ද කියති. **අහෙතුක සිත්** ඉතා දුර්වල ය, හීනය, අරමුණෙහි ස්ථිරව නොපිහිටන බැවින් අස්ථිරය, **සහෙතුක සිත්** බලවත් ය, ශක්තිමත්ය, අරමුණෙහි යහපත්ව පිහිටන බැවින් ස්ථිරය.

## අහෙතුක සිත්

**අහෙතුක සිත්** අටළොසකි. මේ සිත් අටළොසෙහි හෙතු ධර්ම සයෙන් එකක් වත් නොයෙදෙන්නේ ය. එබැවින් අසූනව යක් සිත් අතුරෙන් ඉතා දුර්වල සිත් වශයෙන් සලකනු ලබන්නේ මේ අහේතුක සිත් අටළොසය. මෙයින් සිත් සතක් **අකුසල විපාක යෝය**. සිත් අටක් **කුසල විපාකයෝය**, සිත් තුනක් **ක්‍රියාසිත් ය.**

## සහෙතුක සිත්

**සහෙතුක සිත්** එක් සැත්තෑවකි (71). මෙයින් සිත් දෙළොසක් අකුසල් සිත් ය. අකුසල් සිත් දෙළොසෙහි **ලොභ, දෙස මොහ** යන අකුසල හෙතුන්ගෙන් එකක් හෝ දෙකක් නියත වශයෙන් යෙදෙන්නේය. ඉතිරි සිත් එකුන් සැට (59) සොභන සිත්ය. මේ සොභන සිත් එකුන් සැටෙහි **අලොභ, අදෙස, අමොහ** යන චෛතසික වලින් දෙකක් හෝ තුනම හෝ යෙදෙන්නේය. එබැවින් මේ සහෙතුක සිත් එක් සැත්තෑව තමා හා යෙදෙන හෙතු ධර්මයන්ගේ ගණන අනුව කොටස් තුනකට බෙදනු ලැබේ. එනම් **එකහෙතුක සිත් ද්විහෙතුක සිත්** සහ **ත්‍රිහෙතුක සිත්** යනුයි.

**එකහෙතුක සිත්** දෙකකි. එනම් **මොහ හෙතුව** පමණක් යෙදෙන මොහ මූල අකුසල් සිත් දෙකවූ **විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත** සහ **උද්ධච්ච සම්ප්‍රයුක්ත** සිතය.

**ද්විහෙතුක සිත්** හෙවත් හෙතු ධර්ම දෙකක් යෙදෙන සිත් දෙවිස්සකි. (22) එනම්.

| | |
|---|---|
| **ලොභ, මොහ යෙදෙන ලෙහමූල සිත්** | **8** |
| **දෙස. මොහ යෙදෙන දෙසමූල සිත්** | **2** |
| **අලොභ. අදෙස යෙදෙන කාමසොභන සිත්** | **12** |
| **(ඤාණවිප්‍රයුක්ත සිත්)** | |
| | **22** |

**ත්‍රිහෙතුක සිත්** හෙවත් **අලොභ, අදෙස, අමොහ** යන කුසල හෙතු තුනම යෙදෙන සිත් සතළිස් සතකි. (47) එනම්

| | |
|---|---|
| කාමසොභන ඤාණසම්ප්‍රයුක්ත සිත් | 12 |
| මහග්ගත සිත් | 27 |
| ලොකොත්තර සිත් | 8 |
| | 47 |

මේ හෙතුධර්ම **ස්වභාව ලක්ෂණ වශයෙන්** සයකි. **ජාති වශයෙන්** නවයෙකි. **නිර්දෙශ වශයෙන්** දෙළොසකි, **භූමි වශයෙන්** පසළොසකි. සියල්ල දෙසාලිසකි. (42)

**ස්වභාව ලක්ෂණ වශයෙන්** සයාකාර හෙතුහු නම් අකුසල පක්ෂයෙහි **ලොභ, දෙස, මොහ** යන තුන ද කුසල පක්ෂයෙහි **අලොභ**, අදෙස, **අමොහ** යන තුන ද වේ.

**ජාතීන්ගේ වශයෙන්** නවාකාර හෙතුහු නම් **අකුසල ජාතියෙහි ලොභ, දෙස**, **මොහ** යන තුනය. **කුසල ජාතියෙහි අලොභ**, අදෙස, **අමොහ** යන තුන ද, **අව්‍යාකෘත ජාතියෙහි අලොභ අදෙස අමොහ** යන තුන ද වේ.

**නිර්දේශ** වසයෙන් දෙළොස් ආකාර හෙතුහු නම් අකුසල **හෙතු වූ ලොභ, දෙස, මොහ** යන තුන ද, **කුසල හෙතු වූ අලොශ, අදෙස**, **අමොහ** යන තුන ද, **විපාක හෙතු වූ අලොභ**, **අදෙස, අමොහ** යන තුන ද, **ක්‍රියා හෙතු වූ අලොභ අදෙස අමොහ** යන තුන ද වේ.

**භූමි වශයෙන්** පසළොස් ආකාර හෙතූහු නම් **කාමභූමියෙහි අකුසල හෙතු වූ ලොභ, දෙස, මොහ** යන තුන ද, **කුසලහෙතු වූ, අලොභ, අදෙස, අමොහ** යන තුන ද, **රූපභූමියෙහි අලොභ, අදෙස අමොහ** යන තුන ද, **ලොකොත්තර භූමියෙහි** අලොභ, අදෙස, අමොහ යන තුන ද වේ.

**විපාක ශක්තිය.** යම්සේ මුල් ඇත්තා වූ වෘක්ෂයක් ඒ මුල් හෙතු කොට ගෙන වැටිය නොදී පෘථිවියෙහි පිහිටා ද, ඒ මුල් නමැති අතින් පෘථිවි ඔජාව නංවා ගස ද වඩා අතු අග මල් ඵල උපදවන්නාක් මෙන් සහේතුක කුසලා කුසල චිත්තයන්ගේ ඵලදීම හෙවත් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාකදීම මේ **හෙතුධර්ම** යන්ගේම ශක්තියෙන් සිද්ධවන බව දත යුතුයි.

මෙහි විස්තර කරණ ලද මේ **හෙතුධර්මයෝ,** සිත් ඉපැද්මෙහි හෙතූන් යයි වරදවා නොගත යුතුයි. අවිද්‍යා **තණ්හා** ආදී ප්‍රත්‍යයන් හෙතු කොට ගෙන උපදවන ලද **චිත්ත සන්තතියක්** ඇතිවීමය. **ආරම්මණයන්ගේ** හමුවීමය, චිත්තොප්පාදයට සුදුසු ස්ථාන හෙවත් **වත්ථු** ඇති වීම යනාදී නොයෙක් හෙතූන් ඇතිවූ කල්හි සිත් හට ගන්නේ වේ. මෙසේ හටගන්නාලද සිත් තම අරමුණෙහි ස්ථිරව පිහිටීමට උපකාර වන ධර්ම වශයෙන් ද, සිත ශක්තිමත් කිරීමට අනුබලයක් වශයෙන් ද, මෙකී ලොභ, දෙස, මොහ, අලොභ, අදෝස, අමොහ යන චෛතසික සය ඒ ඒ සිත්වල යෙදෙන හේතු ධර්ම වශයෙන් සැලකිය යුතුය.

මේ කුසලාකුසල හෙතු ධර්මයෝ අන්‍ය චෛතසිකයන්ට වඩා බලවත්ය. එයින් කුසල හෙතු අකුසල හෙතූන්ට වඩා බලවත්ය. මේ කුසල හෙතූන්ට අකුසලයන් නැසීමේ ශක්තියද ඇත. **අලොභයෙන් ලොභයද, අදෙසයෙන් දෙසයද,** අමොහ හෙවත් **ප්‍රඥවෙන් මොහයද,** නසනු ලැබේ. බලවත් කුසල විපාක දෙන කල්හි අකුසල විපාක ශක්තිය යටපත් වන්නේය.

හෙතු ධර්මයන්ගේ යෙදීම සංක්ෂෙපයෙන් මෙසේ දතයුතුයි.

**1. අහෙතුක සිත් 18**

(1) අකුසල විපාක 7
(2) කුසල විපාක 8
(3) ක්‍රියා 3

**2. සහෙතුක සිත් 71**

(1) ඒකහෙතුක සිත් 2–(මොහමූලක අකුසල් සිත් 2)
(2) ද්විහෙතුක සිත් 22
1. අකුසල් 10—(ලොභමූල 8)
(දෙස් මූල 2)
2. කුසල් 12. (කාමාසොභන ඤාණවිප්‍රයුක්ත 12)

**3. ත්‍රිහෙතුක සිත් 47**

1. කාමසොභන 12 (ඤාණසම්ප්‍රයුක්ත සිත් 12)
2. මහග්ගත 27. (රූපාවචර 15. අරූපාවචර 12)
3. ලොකොත්තර 8. (මග්ග 4 ඵල 4)

හෙතු ධර්මයන්ගේ ප්‍රභෙද සංක්ෂෙපයෙන් මෙසේ දත යුතුයි.

**හෙතු ධර්ම 42**

**1. ස්වභාව ලක්ෂණ වශයෙන් 6**

1. අකුසල 3—ලොභ, දෙස, මොහ
2. කුසල 3—අලොභ, අදෙස, අමොහ

**2. ජාති වශයෙන් 9**

2. අකුසල ජාති 3 —ලොභ, දෙස, මොහ.
2. කුසල ජාති 3 —අලොභ, අදෙස, අමොහ
3. අව්‍යාකෘත ජාති 3 —අලොභ, අදෙස අමොහ

**3. නිර්දෙශ වශයෙන් 12**

1. අකුසල් 3 — ලොභ, දෙස, මොහ
2. කුසල 3 — අලොභ, අදෙස, අමොහ
3. විපාක 3 — අලොභ, අදෙස, අමොහ
4. ක්‍රියා 3 — අලොභ, අදෙස, අමොහ

**4. භූමි වශයෙන් 15**

1. **කාමභූමි**
   අකුසල් 3 — ලොභ, දෙස, මොහ
   කුසල් 3 — අලොභ, අදෙස, අමොහ
2. **රූපභූමි** 3 — අලොභ, අදෙස, අමොහ
3. **අරූපභූමි** 3 — අලොභ, අදෙස, අමොහ
4. **ලොකොත්තරභූමි** 3 අලොභ, අදෙස, අමොහ.

## කෘත්‍ය සංග්‍රහය

කෘත්‍යයන් ගේ වශයෙන් චිත්ත චෛතසික ධර්මයන් බෙද දැක්වීම **කෘත්‍ය සංග්‍රහය** නම් වේ. සැම සිතක් ම, සැම චෛතසික යක් ම වෙන්වෙන් වූ කෘත්‍ය හෙවත් කාර්‍ය්‍ය ඇති ධර්මයෝ වෙති. කෘත්‍යයක් නැති සිතක් හෝ චෛතසිකයක් හෝ නැත.

චිත්තචෛතසිකයන්ට අයත් කෘත්‍යයෝ තුදුසෙකි. (14) ඇතැම් සිත් එකම කෘත්‍යයක් කරන සිත් වෙති. ඇතැම් සිත් කෘත්‍ය දෙක, තුන, සතර හෝ පහ බැගින් කරන සිත් වෙති.

**තුදුස් කෘත්‍යයෝ නම්:- පටිසන්ධි, භවාඞ්ග, ආවජ්ජන, දස්සන සවණ, ඝායන, සායන, ඵුසන, සම්පටිච්ඡන, සන්තීරණ, වොට්ඨපන, ජවන, තදාරම්මණ, චුති** යන කෘත්‍යයෝ යි.

### පටිසන්ධි කෘත්‍ය (1)

අතීත භවය හා වර්තමාන භවය හෝ, වර්තමානභවය හා අනාගත භවය හෝ, ගළපන, සම්බන්ධකරවන හෙයින් **පටිසන්ධි** නම් වේ

එක් සත්ත්වයෙකු පිළිබඳ වූ චිත්ත පරම්පරාව වනාහී අනාදිමත් කාලයක සිට, අතරක් නැතිව, සිත් ඉපිද නිරුද්ධ වෙමින්, එකිනෙකට සම්බන්ධ වී සසර පවත්වාගෙන එන ශක්තියකි. අසුරු සැනක් ගසනා කල්හි ඉපිද නිරුද්ධවන චිත්තයන්ගේ සංඛ්‍යාව ලක්ෂ කොටි ගණන් ය. ඉතා ස්වල්ප වූ ආයුෂ ඇති මේ සිත්, වෙන් වෙන්වූ අරමුණු ගනිමින් වෙන් වෙන් වූ කෘත්‍ය කරමින්, එක් සිතක් අනිත් සිතෙහි කෘත්‍ය කිරීමට උපකාරවෙමින් තම තමන්ගේම ශක්තියෙන් උපදවා ගත් රූප කය ඇසුරු කරමින් භවය ඇති කොට ඒ ඒ චිත්ත යන්ගේ හෙවත් කර්මයන්ගේ ශක්තියෙන් නොයෙක් ක්‍රියා සිදු කොට කර්මයාගේ හෝ ශරීරයාගේ ආයු ශක්තිය පිරිහී යාමෙන් ස්කන්ධ යන්ගේ භෙදය වූ මරණය ඇති වී, මේ භවයෙන් ගිලිහී නැවත අළුත් භවයක් ඇති කරගනිමින් මෙසේ භවයෙන් භවයට පත් වෙමින් සසර පවත්වන්නේය. අවිද්‍යා තෘෂ්ණාදි හෙතූන් නො සිඳී පවත්නා තෙක් සසරින් මිදීමක් නොවන්නේය. මෙසේ මේ චිත්ත පරම්පරාවට අයත් එක් භවයෙක්හි අවසාන සිත වූ චුති සිතින් මෙභවය අවසන්කොට අතරක් නැතිව අළුත් භවය ඇති කරමින් පහළ වන, ඒ අළුත් භවයට අයත් පළමු සිත වූ ප්‍රතිසන්ධි චිත්තය, පරණ භවයත් අළුත් භවයත් ගළපමින් සන්ධි කරමින් උපදනේය. මෙයට **ඝටිසන්ධි කෘත්‍ය** යයි කියනු ලැබේ.

### පටිසන්ධි කෘත්‍යය කරන සිත් එකුන් විස්සකි (19)

දෙළොස් අකුසල් සිත් අතුරෙන් උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත හැර ඉතිරි සිත් එකොළොසින් යම් කර්ම පථයක් සිදුවී එහි ප්‍රති සන්ධි විපාක ගෙනදීම් වශයෙන් මරණාසන්න චිත්ත වීථියෙහි ජවනයන්ට අරමුණු වී නම් ඒ අකුසල කර්මයාගේ විපාක වශයෙන් සතර අපාය අතුරෙන් එමකර්මයට අනුරූප වූ යම්කිසි ස්ථානයක ඉපැද්වීම හෙවත් පටිසන්ධි කිරීම් වශයෙන් **අහෙතුක අකුසල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ සිත** ප්‍රතිසන්ධි කෘත්‍ය කරමින් එම අළුත් භවයෙහි පළමු සිත වශයෙන් පහළ වන්නේය. මෙයට දුගති අහෙතුක ප්‍රතිසන්ධියයයිද කියනු ලැබේ.

**ඤාණයෙන්** තොරව ආනිශංස නොදැන හෝ සිහි නොකර හෝ යම්කිසි දුර්වල කුසල කර්මපථයක් කරන කල්හි, දුර්වල වූ කාමාවචර

ඤාණ විප්‍රයුක්ත කුසල් සිත් සතරින් එකක් පහළ වී නම් එම කර්මයාගේ ප්‍රතිසන්ධි විපාක ලැබීමට අවස්ථා පැමිණි කල්හි, **අහේතුක කුසල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ සිත පටිසන්ධි කෘත්‍ය** සිද්ධ කරමින් මනුෂ්‍යාත්ම භාවයක නම් **ජාත්‍යන්ධ ජාතිබධිර** ආදී දුර්වල ආත්ම භාවයක් හෝ **විනිපාතික** වර්ගයට අයත් සුගති අහේතුක භවයක් හෝ ගෙන දෙන්නේය. මෙයට **සුගති අහේතුක ප්‍රතිසන්ධිය** යයි කියති.

දුර්වල නො වූ ද්විහේතුක ඤාණවිප්‍රයුක්ත සිතකින් කරණ ලද කුසල කර්මයාගේ ප්‍රතිසන්ධි විපාක වශයෙන් මධ්‍යම පමණින් සැප සම්පත් සළසන්නා වූ සුගති ආත්ම භාවයක් ලබන කල්හි ඤාණවිප්‍රයුක්ත මහා විපාක සිත් සතරින් එකක් පටිසන්ධි කෘත්‍ය කරමින් පහළ වන්නේය. මේ පුද්ගලයාහට තම උත්සාහයෙන් ප්‍රමාණවත් වූ සැප සම්පත් ලබාගත හැකිවෙ. ධ්‍යාන මාර්ග ඵලාදිය ලැබිය නො හැකිවේ.

දුර්වල වූ ඤාණයකින් යුක්තව, දුර්වල ත්‍රිහේතුක සිතකින් කරණ ලද කුසල කර්මයාගේ ප්‍රතිසන්ධි විපාක වශයෙන් ලැබෙන්නේත් ද්විහේතුක ඤාණවිප්‍රයුක්ත විපාක සිත් සතරින් ලැබෙන ද්විහේතුක ප්‍රතිසන්ධියකි.

ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසල කර්මයාගේ හෙවත් බලවත්වූ ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිතකින් යම් කුසල කර්මයක් සිදුවී නම් ඤාණ සම්ප්‍රයුක්ත වූ ත්‍රිහේතුක විපාක සිත් සතරින් එකක් ප්‍රතිසන්ධි කෘත්‍ය කරමින් දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි බොහෝ සැප සම්පත් ගෙන දෙන ආත්ම භාවයක් ඇති කර දෙන්නේය.

රූපාරූප ධ්‍යාන කුසල් සිත් නවයෙන් යම් බලවත් සමාධියෙන් යුක්ත වූ කුසලයක් සිදු වී නම් ඒ ධ්‍යානයට සුදුසු රූපාරූප භූමියක හෙවත් රූපාරූප බ්‍රහ්ම ලොකයක ප්‍රතිසන්ධි කෘත්‍ය කරමින් මහග්ගත විපාක සිත් නවයෙන් එකක් පහළ වන්නේය.

මෙසේ පටිසන්ධි කෘත්‍ය කරන්නා වූ සිත් දහනවය අහේතුක පටිසන්ධි යුගලය, මහා විපාක අට සහ මහග්ගත විපාක නවය බව දත යුතුයි.

**පටිසන්ධි සිතෙහි අරමුණ** එයට පූර්ව භවයෙන් ගන්නා ලද **කර්ම කර්මනිමිති ගතිනිමිති** යන අරමුණු වලින් එකෙකි. සෑම සත්ත්වයෙකුගේම මරණාසන්නයේදී මතු භවය ගෙනදීමට උපකාර වන කර්මයක් ඉදිරිපත් වන්නේය. එක් භවයකගේ අවසාන චිත්ත වීථියට මරණාසන්න චිත්ත වීථියයයි කියනු ලැබේ. එම චිත්ත වීථියෙහි උපදනා ජවන් සිත්වලට අරමුණු වන්නා වූ **කර්ම, කර්ම නිමිත්ත, ගතිනිමිත්ත** යන අරමුණු වලින් එකක් එම චිත්ත වීථියේ අවසාන සිත වූ චුති සිතට අනතුරුව දෙවන භවයෙහි පළමුව හට ගන්නා වූ මේ පටිසන්ධි විපාක සිත විසින් ගනු ලබන්නේය. එයට පසු එම අළුත් භවයෙහි නොසිඳි පැවැත්ම පිණිස එම අරමුණම ගෙන ඇතිවන භවාඞ්ග සිත් පරම්පරාවද ගනු ලබන්නේ මේ පටිසන්ධි සිතෙහි අරමුණමය.

## භවාඞ්ග කෘත්‍යය 2

භවියාගේ නො සිඳී පැවැත්මට උපකාර වූ කෘත්‍යය **භවාඞ්ග කෘත්‍ය** නම් වේ. ප්‍රතිසන්ධි සිත ඉපිද නිරුද්ධ වූ පසු, එම විපාක සිත, එම අරමුණම ගෙන, භවයාගේ අවසානය තෙක් චිත්ත සන්තතිය පවත්වා ගැනීමේ අඞ්ගයක් වශයෙන් **භවාඞ්ග චිත්තය** යන නමින් පහළ වන්නේය. වර්තමාන භවයෙන් අරමුණු ගෙන සිත් නූපදනා හැම කල්හිම පහළ වන්නේ මේ භවාඞ්ග සිත් පරම්පරාවමය. යම් අවස්ථාවෙක්හි අළුත් අරමුණක් ගෙන සිත් හටගැනීමක් ඇතිවන විට මේ භවාඞ්ග සිත බිඳී ඒ වෙනුවට අළුත් අරමුණ ගෙන චිත්ත වීථියක් ඇතිවී අවසන්වූ පසු නැවත මේ භවාඞ්ග සිත් පරම්පරාව හටගන්නේය. භවාඞ්ග සිත තිබියදී අන්සිතක් හට නොගන්නේය. මේ භවාඞ්ග සිත් පරම්පරාවේ අවසාන සිත සත්ත්වයා මේ භවයෙන් චුත කර වන බැවින් **චුති සිත** යයි ව්‍යවහාර වන්නේය.

**භවාඞ්ග කෘත්‍යය කරන සිත්** පටිසන්ධි කෘත්‍යය කරන සිත්ම බැවින් එකුන් විස්සකි (19). පටිසන්ධි සිතෙහි විස්තර කරන ලද පරිච්ඡෙදන් ඒ එකුන් විසි චිත්තයන් දත යුතුයි.

**භවාඞ්ග සිතෙහි අරමුණ** පටිසන්ධි සිත විසින් ගන්නා ලද, පූර්ව භවයට අයත් **කර්ම, කර්මනිමිති, ගතිනිමිති යන** අරමුණු වලින්

එකකි. මේ **භවාඞ්ග සිත, භූමි, ජාති, සම්ප්‍රයුක්ත ධර්ම, සංස්කාර, ආරම්මණයාගේ** වශයෙන් **ප්‍රතිසන්ධි සිතට** සැම අතින්ම සමානය. අහේතුක පටිසන්ධි සිතෙහි අන්‍යසමාන චෛතසිකයන් දසදෙනෙක් පමණක් යෙදෙන බැවින් දුර්වල විපාක සිතකි. එබැවින් එම භවාංග සිතෙහි ද අරමුණ අප්‍රකටය. නමුත් ක්ලෙශ ධර්මයන්ගෙන් මිශ්‍ර නො වූ හෙයින් පවිත්‍රය. **ප්‍රකෘති සිත** යයි කියන්නේත් මේ භවාඞ්ග සිතටමය. සිතින්ම ගනු ලබන යම් අරමුණක් ගෙන යම් චිත්තවීථි යක් ඇතිවේනම් එහි මනොද්වාරාවජ්ජන සිතට පෙර උපදනා භවංගු පච්ඡේද සිතට **මනොද්වාරයයි** කියනු ලැබේ.

## ආවර්ජන කෘත්‍යය (3)

**චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය** යන **පඤ්චද්වාරයෙන්** හා **මනොද්වාරයෙන්** ද ගනු ලබන්නාවූ අරමුණුවලට භවාඞ්ග සිත් පරම්පරාව යොමු කිරීම **ආවර්ජන කෘත්‍ය** නම් වේ.

ෂට්ද්වාරයන් අතුරෙන් යම්කිසි ද්වාරයකට අරමුණක් හමු වූ කල්හි භවාඞ්ග සිත බිඳී අළුත් අරමුණ ගෙන චිත්ත වීථිය ඇතිවන කල්හි ඒ අරමුණ කුමක්දැයි දැන ගැනීමට පෙර, භවාඞ්ග සිත් පරම් පරාව එම අළුත් අරමුණට යොමු කිරීම් වශයෙන් සිතක් පහළ වී නිරුද්ධ වන්නේය. මේ සිතින් ආවර්ජනය කිරීම හැර එයට වැඩි ක්‍රියාවක් කළ නොහැකිවේ. ගෙයට ඇතුල්වීම පිණිස දෙර හරින්නාක් මෙන්, ෂට් ද්වාරයෙන් ගන්නා අරමුණු ඇතුල් කිරීම පිණිස මේ ආවර්ජනා සිත් උපකාර වන්නේය.

**ආවර්ජන කෘත්‍ය කරන සිත් දෙකකි.** චක්ඛුද්වාරාදී පඤ්චද්වාර යෙන් ගන්නා වූ අරමුණුවලට සිත් පරම්පරාව යොමු කිරීම් වශ යෙන් පහළවන්නා වූ **අහේතුක උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන ක්‍රියා සිත** සහ මනොද්වාරයෙන් ගනු ලබන අරමුණුවලට සිත් පරම් පරාව යොමු කිරීම් වශයෙන් උපදනා **අහෙතුක උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන ක්‍රියා සිත** ද යන මේ සිත් දෙක ආවජ්ජන කෘත්‍යය කරන සිත් වෙති. පඤ්චද්වාරික චිත්ත විථියෙහි භවාඞ්ග සිතෙහි අරමුණ ඉවත් කරමින් උපදනා **භවඟුපච්ඡෙද** සිතටත්, චක්ඛු විඤ්ඤා ණාදි විඤ්ඤාණ සිතටත් අතර මේ පඤ්චද්වාරාවර්ජන සිත පහළ වේ.

මනොද්වාරික චිත්ත වීථියේදී ආවර්ජන කෘත්‍ය කරන්නාවූ මේ මනොද්වාරාවර්ජන සිත භවඟුපච්ඡෙදයටත් ජවනයටත් අතර පහළ වන්නේය.

**ආවජ්ජනා සිත්හි අරමුණ** එම චිත්ත වීථිය හටගැනීමට උපකාර වූ අළුත් අරමුණය. චිත්ත වීථියක පළමුව උපදනා වීථි සිත මේ ආවජ්ජනා සිතක්මය.

## දස්සන කෘත්‍යය (4)

චක්ඛුද්වාරයෙන් ගනු ලබන රූප අරමුණු දැනීම හෙවත් රූප දැකීම **දර්ශන කෘත්‍ය** නම් වේ. ආලොකයේ උපකාරයෙන් ප්‍රකට බවට පැමිණි රූපය පිළිබඳ වූ **වර්‍ණය** චක්ඛු ප්‍රසාද වස්තුව හා ගැටුනු කල්හි පඤ්චද්වාරාවජ්ජන ක්‍රියා සිතින් යොමු කරන ලද චිත්ත පරම්පරාවෙහි මේ **වර්‍ණය** අරමුණු කොට ගෙන චක්ඛු ප්‍රසාද වස්තුවෙහිදී ම ඒ **වර්‍ණය** දැන ගැනීම හෙවත් **දස්සන කෘත්‍යය** කරන්නා වූ **චක්ඛු විඤ්ඤාණ සිත** උපදින්නේය. චක්ඛු විඤ්ඤාණ සිත දස්සන කෘත්‍යය හැර අන් කෘත්‍යයක් කිරීමට අසමර්ථය. තවද මේ දස්සන කෘත්‍ය කරන කල්හි රූප අරමුණු දැන ගැනීම මිස එහි ඉෂ්ටානිෂ්ටාදී අන්‍ය ස්වභාවයන් දැන ගැනීමේ ශක්තියක් ද ඇති නොවන්නේ ය. එබැවින් මේ දස්සන කෘත්‍ය කරන චක්ඛු විඤ්ඤාණ සිත ඉතා දුර්වල වූ විපාක සිතක් ම වන්නේය.

**දස්සන කෘත්‍ය කරන සිත් දෙකකි.** එනම්, අකුසල විපාක වශයෙන් හමුවන අනිෂ්ටරූප අරමුණක් ගෙන පහළ වන්නා වූ **අහෙතුක අකුසල විපාක උපෙක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණ සිත** හා කුසලවිපාක වශයෙන් හමුවන ඉෂ්ට අරමුණක් ගෙන පහළවන්නාවූ **අහෙතුක කුසලවිපාක උපෙක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණ සිත ද වේ.**

ඇසින් දැකිය යුතු යම්කිසි වස්තුවක් දැක මෙය අසවල් ගසය, අසවල් සත්ත්වයාය, අසවල් ද්‍රව්‍යය යනාදී වශයෙන් නිශ්චය කර ගැනීම, සිත් රාශියකින් හෙවත් චිත්තවීථි කීපයකින් සිදුවන ක්‍රියාවකි. චක්ඛුවිඤ්ඤාණ සිතින් ඇති වන්නේ වර්ණය දැනීම පමණකි.

එබැවින් චක්ඛුවිඤ්ඤාණ දෙසිතෙහි අරමුණ, සතර මහා භූතයන් නිසා පවත්නාවූ, චක්ඛුවිඤ්ඤාණයට ගොචරවන හෙවත් ඇසින් දකිය යුතු රූපයන් පිළිබඳ වූ වර්ණය හෙවත් පැහැය බව සැලකිය යුතුයි.

## සවණ කෘත්‍යය (5)

සොතද්වාරයෙන් ගනු ලබන ශබ්ද අරමුණු දැනීම හෙවත් ශබ්ද ඇසීම **ශ්‍රවණ කෘත්‍ය** නමි. වයොධාතුහුගේ උපකාරයෙන් ශබ්ද අරමුණක් ශ්‍රොතප්‍රසාද වස්තුව හා ගැටුනු කල්හි පඤ්චද්වාරාවජ්ජන ක්‍රියා සිතින් යොමු කරන ලද චිත්ත පරම්පරාවෙහි මේ ශබ්දය අර මුණු කොට ගෙණ ශ්‍රොතප්‍රසාද වස්තුවෙහිදීම ඒ ශබ්දය දැන ගැනීම හෙවත් **සවණ කෘත්‍ය** කරන්නා වූ සොත විඤ්ඤාණ සිත උපදින්නේය. මේ **සවණ කෘත්‍ය** කරන කල්හි ඒ ශබ්දයාගේ මිහිරි බව හෝ අමිහිරි බව යනාදී ආකාරයන් නොවැටහෙන්නේ ය. ශබ්දයක් අරමුණු කළ බව පමණක් දැනගන්නේය.

**සවණ කෘත්‍ය කරණ සිත්** දෙකෙකි. අප්‍රියවූ අමනාපවූ අමිහිරි වූ ශබ්ද අරමුණක් හමුවූ කල්හි **අකුසලවිපාක අහෙතුක උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණ සිත** සවණ කෘත්‍ය කරමින් පහළ වන්නේය. එමෙන්ම ප්‍රියමනාප වූ, මිහිරිවූ ඉෂ්ට වූ ශබ්ද අරමුණක් හමුවූ කල්හි **අහෙතුක කුසලවිපාක උපෙක්ඛා සහගත සොතවිඤ්ඤාණ සිත සවණ කෘත්‍ය** කරමින් පහළ වන්නේය.

**සොතවිඤ්ඤාණ** දෙසිතෙහි අරමුණ, සතරමහාභූතයන් නිසා පවත්නා වූ ශ්‍රොත විඤ්ඤාණයන්ට ගොචරවන හෙවත් **කණින්** ඇසියයුතු ශබ්දය වේ.

## ඝායන කෘත්‍යය (6)

ඝාණද්වාරයෙන් ගනු ලබන ගන්ධ අරමුණු දැනගන්නා හෙවත් නැහැයට හමුවූ ගඳ සුවඳ දැනීම **ඝායන කෘත්‍ය** නම් වේ. ගන්ධ අරමුණක් ඝාණ ප්‍රසාද වස්තුව හා ගැටුනු කල්හි ඇතිවන පඤ්චද්වාර චිත්තවීථියෙහි පඤ්චද්වාරාවජ්ජන සිතට අනතුරුව ඝාණ විඤ්ඤාණ

නම් සිත ඝායන කෘත්‍ය කරමින් ගන්ධ අරමුණ ගෙන පහළ වන්නේය. ඝායන කෘත්‍ය කරන කල්හි ගන්ධයාගේ මිහිරි අමිහිරි බවක් හෝ නො දනෙන්නේය. ගන්ධ අරමුණක් හමුවූ බව පමණක් දැන ගන්නේය.

**ඝායන කෘත්‍ය කරන** සිත් දෙකෙකි. අප්‍රිය අමනාප ගන්ධයක් හෙවත් දුගඳක් හමුවූ විට **අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණ සිත** ඝායන කෘත්‍ය කරමින් පහළ වන්නේය. මිහිරි වූ මනාප වූ ඉෂ්ට වූ සුගන්ධයක් හමුවූ කල්හි **අහේතුක කුසලවිපාක ඝාණ විඤ්ඤාණ සිත** ඝායණ කෘත්‍යය කරමින් පහළ වන්නේය.

ඝාණ විඤ්ඤාණ දෙසිතෙහි අරමුණ සතරමහාභූතයන් නිසා පවත්නා, ඝාණ විඤ්ඤාණයට ගොචර වන හෙවත් නැහැයෙන් ආඝ්‍රාණය කළයුතු ගඳ සුවඳ යයි කියන්නා වූ ගන්ධ අරමුණයි.

## **සායන කෘත්‍යය (7)**

**ජිව්හා** ද්වාරයෙන් ගනු ලබන රස අරමුණු දැනගැනීම හෙවත් දිවට වැදගත් රස දැනගැනීම සායන කෘත්‍ය නම් වේ.

රස අරමුණක් ජිව්හා ප්‍රසාද වස්තුව හා ගැටුනු කල්හි පඤ්චද්වාරා වජ්ජන සිතින් රස අරමුණට යොමුකරන ලද සිත් පරම්පරාවෙන් රස දැනගන්නා ජිව්හා විඤ්ඤාණ නම් සිත සායන කෘත්‍ය කරමින් පහළ වන්නේය. රසයාගේ වැද ගැනීමමුත් එහි මිහිරි අමිහිරි කටුක, තිත්ත ආදී රසයන් වෙන් කොට දැන ගැනීමට අසමර්ථය.

**සායන කෘත්‍ය කරන සිත්** දෙකකි. අහිමිරි වූ, අප්‍රිය වූ, අනිෂ්ට රසයක් හමුවූ කල්හි **අහේතුක අකුසල විපාක ජිව්හා විඤ්ඤාණය,** සායන කෘත්‍යය කරමින් පහළවන්නේය. ඉෂ්ටවූ ද මිහිරි වූද රස යක් වැදගත් කල්හි අහෙතුක කුසල විපාක ජිව්හා විඤ්ඤාණය සායන කෘත්‍ය සිද්ධ කරමින් පහළ වන්නේය.

සායන කෘත්‍ය කරන ජිව්හා විඤ්ඤාණ දෙසිතෙහි අරමුණ සතර මහා භූතයන් නිසා පවත්නා වූ, ජිව්හා විඤ්ඤාණයට ගොචරවන හෙවත් දිවින් විඳගත යුතු අමිහිරිවූ ද, මිහිරිවූ ද රස අරමුණුය.

## ඵුසන කෘත්‍යය (8)

කායද්වාරයෙන් ගනු ලබන ස්පර්ශ අරමුණු දැනීම හෙවත් කයට වැදගත් පොට්ඨබ්බය දැනගැනීම **ඵුසන කෘත්‍යය** නමි. පොට්ඨබ්බ අරමුණක් කායප්‍රසාද වස්තුව හා ගැටුණු කල්හි පඤ්චද්වාරාවජ්ජන සිතට අනතුරුව ඵුසන කෘත්‍යය කරමින් කායවිඤ්ඤාණ නම් වූ සිත කායප්‍රසාද වස්තුවෙහි හටගන්නේය. මේ කායවිඤ්ඤාණ සිතින් කරනු ලබන්නේ ස්පර්ශය දැනගැනීම පමණකි. අන් කෘත්‍යයක් කිරීමට මේ සිත අසමර්ථ වේ.

**ඵුසන කෘත්‍ය** කරන සිත් දෙකෙකි. අමිහිරිවූද, නො කැමැති වූද, දුක් උපදවන්නා වූද ස්පර්ශයක් හමුවූ කල්හි **අහේතුක අකුසල විපාක දුක්ඛසහගත කාය විඤ්ඤාණ** නම් වූ සිත ඵුසන කෘත්‍යය කරමින් පහළ වන්නේය. ප්‍රිය මනාපවූද, මිහිරිවූද, සැප උපදවන ඉෂ්ට වූ ස්පර්ශයක් හමුවූ කල්හි **අහේතුක කුසලවිපාක සුඛ සහගත කායවිඤ්ඤාණ** නම් සිත ඵුසන කෘත්‍යය කරමින් පහළවන්නේය.

ඵුසන කෘත්‍ය කරන සිත්වල අරමුණ නම් **පඨවි, තේජෝ, වායො** යන භූතත්‍රය සංඛ්‍යාත පොට්ඨබ්බ අරමුණය. චක්ඛු, සොත, ඝාණ, ජිව්හා යන සතර විඤ්ඤාණයන් පිළිබඳ වූ අරමුණු මහාභූතයන් නිසා පවත්නා උපාදරූප බැවින් ඉතා සියුම්ය. එබැවින් ඒ සිත්හි වෙදනාව උපෙක්ඛා වෙදනාවයි. කාය විඤ්ඤාණ දෙසිතෙහි අරමුණ මහා භූතයන්ම බැවින් තදය. එබැවින් මෙහි වෙදනාව දුක් හෝ සැප වන බව දත යුතුයි.

## සම්පටිච්ඡන කෘත්‍යය (9)

පඤ්චද්වාරයෙන් වැදගන්නා ලද්දවූද, චක්ඛු විඤ්ඤාණාදී පඤ්චවිඤ්ඤාණයන් විසින් අරමුණු කරන ලද රූප, ශබ්දදී අරමුණු පිළිගැනීම **සම්පටිච්ඡන කෘත්‍ය** නමි.

චක්ඛුද්වාරාදි පඤ්චද්වාරයෙන් ඇතුල් කරගන්නා ලද අරමුණක් ගෙන, චිත්තවීථියක් උපදනා කල්හි භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡෙද යන දෙසිතෙන් භවාඞ්ග අරමුණ ඉවත් කොට, පඤ්චද්වාරාවජ්ජන සිතින් අළුත් අරමුණට සිත් පරම්පරාව යොමුකොට, චක්ඛුවිඤ්ඤාණාදි සිතින් අරමුණ ගත් කල්හි, මේ අළුත් අරමුණ පිළිගැනීම් වශයෙන් **සම්පටිච්ඡන කෘත්‍ය** කරමින් සිතක් පහළවන්නේය. එයට සම්පටිච්ඡන සිතයයි කියනු ලැබේ.

**සම්පටිච්ඡන කෘත්‍ය කරන සිත්** දෙකෙකි. අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදි සිතකින් ගන්නාලද අනිෂ්ට අරමුණ පිළිගනිමින් සම්පටිච්ඡන කෘත්‍ය කරන **අහෙතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත** හා කුසල විපාක විඤ්ඤාණ සිතකින් ගන්නා ලද ඉෂ්ට අරමුණ පිළිගනිමින් සම්පටිච්ඡන කෘත්‍ය කරන **අහෙතුක කුසල විපාක උපෙක්ඛාසහගත සම්පටිච්ඡන සිතත්** යන සිත් දෙකය.

මේ දෙසිතෙහි අරමුණ ඊට පෙර පහළ වූ විඤ්ඤාණ සිතින් ගන්නා ලද අරමුණමය.

## සන්තීරණ කෘත්‍යය (10)

සම්පටිච්ඡන සිතින් පිළිගන්නා ලද අරමුණ පරීක්ෂා කිරීම හෙවත් විමසා බැලීම **සන්තීරණ කෘත්‍යය** නම් වේ. පඤ්චද්වාරික අරමුණක් ගෙන චිත්තවීථියක් හටගන්නා කල්හි සම්පටිච්ඡන සිතට අනතුරුව සන්තීරණ කෘත්‍ය කරන හෙවත් පිළිගන්නා ලද අරමුණ ස්ථිරව හැඳින ගැනීමට පළමුවෙන් එය විමසා බැලීම් වශයෙන් සන්තීරණ සිත පහළ වන්නේය.

**සන්තීරණ කෘත්‍ය කරන සිත්** තුනෙකි. අනිෂ්ට අරමුණක් ගෙන විඤ්ඤාණ සිතක් ඇතිවී එය සම්පටිච්ඡන සිතින් පිළිගත් පසු **අහෙතුක අකුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිත** සන්තීරණ කෘත්‍ය කරමින් උපදින්නේය. ඉෂ්ට මධ්‍යස්ථ වූ අරමුණක් ලත් කල්හි **අහෙතුක කුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිතද**, අති ඉෂ්ට අරමුණක් හමුවූ කල්හි **අහෙතුක කුසලවිපාක සොම නස්සසහගත සන්තීරණ සිතද** පහළ වන්නේය.

**උපෙක්ඛා සහගත සන්තීරණ** **සිත සන්තීරණ කෘත්‍ය** පමණක් නොව **පටිසන්ධි, භවාඞ්ග, චුති, තදාරම්මණ** යන කෘත්‍යයන් ද කරන් නාහුය. **සොමනස්ස සන්තීරණ සිත සන්තීරණ කෘත්‍ය** සහ **තදාරම් මණ කෘත්‍ය** ද කරන්නේය.

**සන්තීරණ සිත්හි අරමුණ** එම චිත්තවීථිය හටගැනීමට උප කාර වූ අරමුණමය

### වොට්ඨපන කෘත්‍යය (11)

සන්තීරණ සිතින් විමසන ලද රූපාදී අරමුණු පිළිබඳව කෙසේ පිළිපැදිය යුතුදැයි නියමකිරීම හෙවත් අරමුණ නිශ්චය කිරීම **වොට්ඨ පන කෘත්‍ය** නම්.

චක්ඛු විඤ්ඤාණාදි විපාක සිත්වලින් ගන්නාලද අරමුණ පිළි ගෙන, විමසා බලා, අරමුණ පිළිබඳව ඒ ඒ කටයුතු කිරීමට පෙර, අරමුණ මෙ බඳු යයි නිශ්චයකර ගැනීම නම්වූ **වොට්ඨපන කෘත්‍ය** ය සිදුකරන්නේ **අහෙතුක උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන ක්‍රියා සිතිනි.** මේ සිත මනොද්වාර චිත්තවීථියේදී මනොද්වාරයෙන් අරමුණු ගන්නා කල්හි භවාඞ්ග සිත් පරම්පරාව මනොද්වාරික අරමුණට යොමු කිරීම් වශයෙන් **ආවර්ජන කෘත්‍යය** සිදුකරන් නේය. ජවන් සිත් පහළවන්නාවූ හැම චිත්ත වීථියකම ජවන් සිත්වලට පෙර මේ මනොද්වාරාවජ්ජන සිත පහළ වන් නේම ය.

### ජවන කෘත්‍යය (12)

වොට්ඨපන සිතින් නිශ්චය කර දෙන ලද ආකාරයෙන් අරමුණ ගෙන, ඒ අරමුණ පිළිබඳව ඒ ඒ කායික, වාචසික, මානසික ක්‍රියා සිදු කරමින් වෙගවත්ව දුවන්නාක් මෙන් පැවැත්වෙන කෘත්‍යය **ජවන කෘත්‍ය** නම් වේ.

සාමාන්‍යයෙන් මේ ජවන කෘත්‍ය කරන සිත පිළිවෙළින් සත් වරක් උපදින්නේය. චිත්තවීථියක කර්ම සිත් යයි කියනු ලබන් නේ මේ ජවන් සිත් සතටය. සහෙතුක වූ මේ කර්ම සිත් අන්‍ය වීථි

සිත් වලට වඩා බලවත් ය. හැම ජවන් සිතකම ප්‍රවෘත්ති විපාක ගෙනදීමේ ශක්තිය ඇත්තේය. කර්මපථ බවට පැමිණි ජවන් සිත්වල පටිසන්ධි විපාක ශක්තිය ද ඇත්තේය. මෙයින් පළමු ජවන් සිත **දිට්ඨ ධම්ම වෙදනීය කර්ම** වන බැවින් ඉහාත්මභාවයෙහිම විපාක දෙන්නේ වේ. සත්වන ජවන් සිත **උපපද්‍ය වෙදනීය කර්මය** වන බැවින් දෙවන ආත්මභාවයෙහි විපාක දෙන්නේ වේ. ඉතිරි වූ ජවන් සිත් පස **අපරාපරිය වෙදනීය කර්ම** වන බැවින් කාලනියමයක් නැතිව අවස්ථා පැමිණි කල්හි විපාක දෙන්නේය. එක් ජවන් සිතක විපාකය එක්වරක් දුන් කල්හි, එයින් එහි විපාක ශක්තිය කෙළවර වේ.

**ජවන කෘත්‍ය කරන සිත්** පස්පනසෙකි (55). එනම් අකුසල් සිත් දෙළොසය, හසිතුප්පාදය, කාම සොභන කුසල් අට සහ ක්‍රියා අටය, මහග්ගත කුසල් නවය සහ ක්‍රියා නවය; ලොකෝත්තර සිත් අටය යන චිත්තයෝය.

### තදරම්මණ කෘත්‍යය (13)

වෙගවත්ව උපන් ජවන් සිත්වලට අනතුරුව, ජවන් සිත් විසින් ගන්නා ලද අරමුණෙහිම එල්බ ගැනීම් වශයෙන් ඇතිවීම **තදරම්මණ කෘත්‍ය** නමි. වෙගයෙන් දුවගෙන ආ තැනැත්තාට එකවර නවතින්නට බැරි බැවින් ඉදිරියට පියවර දෙකක් පමණ තබා නව තින්නේය. එමෙන්ම පිළිවෙලින් වෙගවත්ව හටගත්තා වූ ජවන් සිත් සතට අනතුරුව එම අරමුණම ගෙන එහි විපාක වශයෙන් **තදරම්මණ සිත් දෙකක්** පහළ වන්නේය. බලවත් අරමුණක් ගෙන බලවත්ව හටගන්නා චිත්ත වීථියක මිස දුර්වල චිත්ත වීථියක තදරම්මණ සිත් නූපදී. එමෙන්ම චිත්ත වීථියක තදරම්මණ සිත් දෙකක් ඉපදීමට අවකාශ නොලදහොත් එකක් පමණක් නූපදනේය.

**තදරම්මණ කෘත්‍ය කරන සිත්** එකොළොසකි. එනම් අහෙතුක සන්තීරණ සිත් තුනය. කාම සොභන මහා විපාක අටය යන සිත් එකොළොසය.

## චුති කෘත්‍යය (14)

එක් භවයක් අවසාන කිරීම හෙවත් උප්පත්ති භවයාගේ සිඳීම **චුති කෘත්‍ය** නමි. **පටිසන්ධි සිතින්** ආරම්භ වූ භවයාගේ අවසානය ඇතිකරවන්නේ මේ **චුති සිතින්** ය. එබැවින් මේ චුති සිත එම භවයට අයත් භවාඞ්ග සිත් පරම්පරාවේ අන්තිම සිත වේ.

සත්ත්වයාගේ මරණ මොහොතේදී පහළවන මරණාසන්න චිත්ත වීථියේදී වස්තු දුර්වලතා ආදිය හෙතුකොට ගෙන ජවන් සිත් සතක්ම පහළ වීමට ශක්තිය නැති හෙයින්, ජවන් සිත් පහක් පමණක් පහළ වන්නේය. එයට පසුව තදරම්මණ; භවාඞ්ග සිත් ඇතිව හෝ නැතිව හෝ අවසාන සිත වශයෙන් භවාඞ්ග සිතෙහි අරමුණම ගෙන මේ චුති සිත ඇතිවී එම භවය අවසන් කරන්නේය. එයට අනතුරුව පහළවන්නේ අළුත් භවයෙහි ප්‍රතිසන්ධි ගැනීම් වශයෙන් ඇතිවන **ප්‍රතිසන්ධි විපාක** සිතය. එක් භවයකට අයත් **ප්‍රතිසන්ධි ,භවාඞ්ග, චුති** යන සිත් තුන එකම අරමුණ ගෙන ඇති වන්නාවූ, එකම ජාතියකට අයත් විපාක සිතක්ම වන්නේය.

**චුති කෘත්‍ය කරන සිත්** ද එකුන්විස්සකි (19). එනම් අහෙතුක පටිසන්ධි යුගලය, කාමාවචර මහා විපාක අටය, මහග්ගත මහා විපාක නවය යනුයි.

### කෘත්‍ය ස්ථාන

ඒ ඒ සිත් විසින් ඒ ඒ කෘත්‍යයන් සිදුකරන ස්ථාන **කෘත්‍ය ස්ථාන** නම් වේ. චිත්ත වීථීන්හි සිත් හටගන්නා පිළිවෙල අනුව මේ ස්ථාන දක්වනු ලබන බැවින් චිත්ත වීථි ඉගෙණ ගත් පසු මෙ කෘත්‍ය ස්ථාන මනාව අවබොධ වේ. කෘත්‍ය ස්ථාන මෙසේයි.

| සිත් හා කෘත්‍යයෝ<br>සිත් 89 | සිත් ගණන | පටිසන්ධි කෘත්‍යය | භවාංග කෘත්‍යය | ආවජ්ජන කෘත්‍යය | දස්සන කෘත්‍යය | සවන කෘත්‍යය | ඝායන කෘත්‍යය | සායන කෘත්‍යය | ඵුසන කෘත්‍යය | සම්පටිච්ඡන කෘත්‍යය | සන්තීරණ කෘත්‍යය | වොට්ඨපන කෘත්‍යය | ජවන කෘත්‍යය | තදාරම්මණ කෘත්‍යය | චුති කෘත්‍යය | කෘත්‍ය ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් | 12 | | | | | | | | | | | | 12 | | | 1 |
| චක්ඛු විඤ්ඤාණ | 2 | | | | 2 | | | | | | | | | | | 1 |
| සෝත විඤ්ඤාණ | 2 | | | | | 2 | | | | | | | | | | 1 |
| ඝාණ විඤ්ඤාණ | 2 | | | | | | 2 | | | | | | | | | 1 |
| ජිව්හා විඤ්ඤාණ | 2 | | | | | | | 2 | | | | | | | | 1 |
| කාය විඤ්ඤාණ | 2 | | | | | | | | 2 | | | | | | | 1 |
| සම්පටිච්ඡන | 2 | | | | | | | | | 2 | | | | | | 1 |
| උපෙක්ඛා සන්තීරණ | 2 | 2 | 2 | | | | | | | | 2 | | | 2 | 2 | 5 |
| සෝමනස්ස සන්තීරණ | 1 | | | | | | | | | | 1 | | | 1 | | 2 |
| පඤ්චද්වාරාවජ්ජන | 1 | | | 1 | | | | | | | | | | | | 1 |
| මනෝද්වාරාවජ්ජන | 1 | | | 1 | | | | | | | | 1 | | | | 2 |
| හසිතුප්පාදය | 1 | | | | | | | | | | | | 1 | | | 1 |
| කාම: කුසල් | 8 | | | | | | | | | | | | 8 | | | 1 |
| කාම: ක්‍රියා | 8 | | | | | | | | | | | | 8 | | | 1 |
| කාම: විපාක | 8 | 8 | 8 | | | | | | | | | | | 8 | 8 | 4 |
| මහග්ගත කුසල් | 9 | | | | | | | | | | | | 9 | | | 1 |
| මහග්ගත ක්‍රියා | 9 | | | | | | | | | | | | 9 | | | 1 |
| මහග්ගත විපාක | 9 | 9 | 9 | | | | | | | | | | | | 9 | 3 |
| ලෝකෝත්තර | 8 | | | | | | | | | | | | 8 | | | 1 |
| එකතුව | 89 | 19 | 19 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 3 | 1 | 55 | 11 | 19 | |

| | කෘත්‍යස්ථාන නාම | ගණන | කෘත්‍ය ස්ථාන විස්තරය |
|---|---|---|---|
| 1 | පටිසන්ධි ස්ථාන නාම | 1 | චුති–භවංග අතර |
| 2 | භවඞ්ග ස්ථාන | 6 | (1) පටිසන්ධි–ආවජ්ජන<br>(2) තදාරම්මණ–ආවජ්ජන<br>(3) ජවන–ආවජ්ජන<br>(4) වොට්ඨපන–ආවජ්ජන<br>(5) තදාරම්මණ–චුති<br>(6) ජවන–චුති |
| 3 | ආවජ්ජන ස්ථාන | 2 | (1) භවංග–පඤ්ච විඤ්ඤාණ<br>(2) භවංග–ජවන |
| 4 | පඤ්ච විඤ්ඤාණ ස්ථාන | 1 | ආවජ්ජන–සම්පටිච්ඡන |
| 5 | සම්පටිච්ඡන ස්ථාන | 1 | පංචවිඤ්ඤාණ–සන්තිරණ |
| 6 | සන්තීරණ ස්ථාන | 1 | සම්පටිච්ඡන–වොට්ඨප්පන |
| 7 | වොට්ඨපන ස්ථාන | 2 | (1) සන්තීරණ–ජවන<br>(2) සන්තීරණ–භවංග |
| 8 | ජවන ස්ථාන | 6 | (1) වොට්ඨපන-තදාරම්මණ<br>(2) වොට්ඨපන–භවංග<br>(3) වොට්ඨපන-චුති<br>(4) ආවජ්ජන–තදාරම්මණ<br>(5) ආවජ්ජන–භවාංග<br>(6) ආවජ්ජන–චුති |
| 9 | තදාරම්මණ ස්ථාන | 2 | (1) ජවන–භවංග<br>(2) ජවන–චුති |
| 10 | චුති ස්ථාන | 3 | (1) තදාරම්මණ–පටිසන්ධි<br>(2) ජවන–පටිසන්ධි<br>(3) භවංග–පටිසන්ධි |

# ද්වාර සංග්‍රහය

ද්වාරයන්ගේ වශයෙන් චිත්ත චෛතසිකයන් බෙද දක්වීම **ද්වාර සංග්‍රහ** නම් වේ.

**ද්වාර** යනු දොරටුවට නමෙකි. යම් ස්ථානයකට ඇතුල් වීමටත් එයින් පිට වීමටත් දොරටුව උපකාර වේ. මේ ශරීරය පිළිබඳව ද එවැනි දොරටු දෙ වර්ගයක් ඇත්තේය. **ඇස් සිදුරු, කණ් සිදුරු, නාස් සිදුරු, මුව සිදුරු, රෝමකූප** යනාදිය, ශරීරය බිඳී ප්‍රකටව පෙනෙන බැවින් **ඡිද්දද්වාර** හෙවත් **දොර සිදුරු** නම් වෙති. මෙය හැර, ඇසට නො පෙනෙන, සිත් ඇති වීමට උපකාර වන හෙවත් **මණ්ඩද්වාර** සයක් ඇත්තේය. මේ **මණ්ඩද්වාර** හෙවත් **දොරටු** සය, ශරීරය සිදුරු නොවී, ශරීරයෙහි ම පිහිටි විශෙෂ ඔපයක් හෙවත් පැහැයක් ඇති ස්ථාන සයකි. නාම ධර්මයන් පිළිබඳව ද්වාර යයි කියනු ලබන්නේ මේ ඔපය හෙවත් පැහැය පවත්නා ස්ථානයන්ට බව දත යුතුයි. ආරම්මණයන්ගේ ඇතුල්වීම හා පිටවීම වන්නේ මේ ද්වාර වලින්ය. ඒ ඒ වර්ගයේ අරමුණු ඇතුල් වීමට වෙන් වෙන් වූ ද්වාර ඇත්තේය. යම් ද්වාරයක් නැති කල්හි එයින් ගනු ලබන ආරම්මණ යන්ගේ ඇතුල් වීමක් ද නැත්තේ ය. එ බැවින් ඒ හේතුවෙන් හට ගන්නා සිත් ද පහළ නො වන්නේ ය. ද්වාරයෙන් අරමුණු ඇතුල් වීම යයි කී කල්හි ද්වාරයෙහි අරමුණ ස්පර්ශ වීම ප්‍රකාශ වන්නේය. අරමුණ ද්වාර හා සමග ස්පර්ශ වූ විට එම සත්වයා පිළිබඳ ව පවත්නා චිත්ත සන්තතිය එයින් කැමති අරමුණක් ගෙන ඒ පිළිබඳව දැනීමක් ඇති කරවන සිත් උපදවා ගෙන සිතින් කළ හැකි නොයෙක් කෘත්‍ය යන් සිදු කරන්නේය. යම් ද්වාරයක් හා ස්පර්ශ වූ අරමුණක් එල්බ ගෙන හට ගත් සිතෙහි උත්පාදය හෙවත් ඉපදීම, අරමුණ ඇතුල්වීම වශයෙන් දත යුතුයි. එ තැන්හි දීම ඇතිවන ඒ සිතෙහි නිරුද්ධය හෙවත් අභාවය ආරම්මණයාගේ පිටවීම වශයෙන් දත යුතුයි.

**රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම** යන අමුරණු සය ඇතුලත්වීමට **ද්වාර** සයක් ඇත්තේ ය. එනම්:—

1. **රූප අරමුණු ඇතුල් වන චක්ඛුද්වාරය**
2. **ශබ්ද අරමුණු ඇතුල් වන සොතද්වාරය**
3. **ගන්ධ අරමුණු ඇතුල් වන ඝාණ ද්වාරය**

4. **රස අරමුණු ඇතුල් වන ජිව්හා ද්වාරය**
5. **පොට්ඨබ්බ අරමුණු ඇතුල් වන කාය ද්වාරය**
6. **ධම්ම අරමුණු ඇතුල් වන මනො ද්වාරය.**

## චක්ඛු ද්වාරය

**රූප අරමුණු** හෙවත් **වර්ණය** වැදගන්නාවූ ද, **චක්ඛු විඤ්ඤාණය** හටගැනීමට උපකාර වන්නා වූ ද, **සසම්භාර චක්ෂුව** ඇසුරු කොට පවත්නාවූ ද, **මහාභූතරූපයන්ගේ ප්‍රසාදය** නම් වූ ඉතා සියුම් **රූප පරමාර්ථධාතුව** හෙවත් **චක්ෂුප්‍රසාද රූපය, චක්ඛුද්වාර** නම් වේ.

**ප්‍රඥචක්ෂු, මාංශචක්ෂු** යයි චක්ෂු දෙ වර්ගයකි. එයින් **ප්‍රඥා චක්ෂුව** නම් **නුවණැසට** කියන නාමෙකි. මේ නුවණැස වනාහී **බුද්ධචක්ඛු, සමන්තචක්ඛු, ඤාණ චක්ඛු, දිබ්බචක්ඛු, ධම්මචක්ඛු,** යනාදී වශයෙන් පඤ්ච ප්‍රකාර වේ. **මාංස චක්ඛුව** වනාහී **සසම්භාර චක්ෂුව, ප්‍රසාදචක්ෂුව** යයි ද්විප්‍රකාර වේ.

**සසම්භාර චක්ෂුව** වනාහී ඇස් සිදුර තුළ පිහිටා තිබෙන මස්පිඩු ආදීන්ගෙන් සෑදී තිබෙන **මසැසය.** එය සතර මහාභූතයන්ගෙන් හා උපාදරූපයන්ගෙන් ද යුක්ත වූ **අක්ෂි ගොලයයි.**

**ප්‍රසාද චක්ෂුව** වනාහී සසම්භාරචක්ෂුව ඇසුරු කොට පවත්නා දෘෂ්ටි මණ්ඩලය නම් ස්ථානයෙහි පිහිටි, කර්මයෙන් හටගන්නා ලද **පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඔජා, ජීවිතෙන්ද්‍රිය** යන රූප නවය හා එක්ව යෙදුනු, චක්ඛු විඤ්ඤාණයට නිශ්‍රය වන ඔපය හෙවත් පැහැය නම් වූ **චක්ඛුප්‍රසාද රූපය** වේ.

මෙ වැනි චක්ඛුදසක රූප කලාප මහත් රාශියකින් යුක්ත වූ අක්ෂි පටලය රූපාරම්මණයන්ගේ ඡායාව වැදගැනීමට යොග්‍ය වූ ද්වාර යකි. මෙසේ ඇතුල් වූ රූපාරම්මණය එල්බ ගෙන චක්ඛුවිඤ්ඤාණය ඉපදීමට ස්ථාන වන බැවින් **චක්ඛුවස්තු** නමුදු වේ. **චක්ෂුරෙන්ද්‍රිය** යයි ද එයටම නාමෙකි.

## සොතද්වාරය

**ශබ්ද අරමුණු** වැදගන්නා වූ ද, **සොතවිඤ්ඤාණය** හට ගැනීමට උපකාර වන්නාවූද, **සසම්භාර සොතය** ඇසුරු කොට පවත්නා වූ ද, **මහාභූත රූපයන්ගේ ප්‍රසාදය** නම් වූ ඉතා සියුම් රූප පරමාර්ථ ධාතුව හෙවත් **සොතප්‍රසාදය, සොතද්වාර** නම් වේ.

**සසම්භාර ශ්‍රොතය, ප්‍රසාද සොතය** යයි **ශ්‍රොතය** දෙ වැදෑරුම් වේ.

කන්බිල තුළ පිහිටි, මුදුවක් බඳු සියුම් තඹවන් ලෝම ඇති සතරමහාභූත රූපාදීන්ගෙන් සෑදුනු කණ නම් වූ අවයවය **සසම්භාර ශ්‍රොතය** නම් වේ.

**සසම්භාරසොතය** ඇසුරු කොට ගෙන පවත්නාවූ ද, කම්මසමුට්ඨාන වූ **සොතදසක රූපකලාපයන්හි** ඇතුළත්වූ ද, **සොතවිඤ්ඤාණයට** නිශ්‍රය වන ඔපය හෙවත් පැහැය නම් වූ රූපපරමාර්ථධාතුව **සොතප්‍රසාදය** නම් වේ. ශබ්දාරම්මණයන් ඇතුල්වීමට හෙවත් වැදගැනීමට උපකාර වන බැවින් මේ සොතප්‍රසාදයටම **සොතද්වාර** යයි කියනු ලැබේ. මෙසේ වැදගත් ශබ්දරම්මණය එල්බ ගෙන සොතවිඤ්ඤාණය ඉපදීමට ස්ථාන වන බැවින් එයට **සොතවස්තුව** යයි ද කියනු ලැබේ. **සොතෙන්ද්‍රිය** යයි ද එයට නමෙකි.

## ඝාණද්වාරය

**ගන්ධ අරමුණු** වැදගන්නා වූ ද, **ඝාණවිඤ්ඤාණය** හට ගැනීමට උපකාර වන්නාවූ ද, **සසම්භාර ඝාණය** හෙවත් නාසිකාව ඇසුරු කොට ගෙන පවත්නා වූද, **මහාභූත රූපයන්ගේ ප්‍රසාදය** හෙවත් ඔපය නම් වූ ඉතා සියුම් රූප පරමාර්ථධාතුව හෙවත් **ඝාණප්‍රසාදය, ඝාණද්වාර** නම් වේ.

**සසම්භාර ඝාණය, ප්‍රසාද ඝාණය** යයි **ඝාණය** දෙ වැදෑරුම් වේ.

නාසිකා සිදුර තුළ පිහිටි, ගඳ සුවඳ දැන ගැනීමට උපකාර වන්නා වූද, නාසය නම් වූ සතරමහා භූතාදීන් ගෙන් සෑදුනු ස්ථානය, **සසම්භාරඝාණය** නම් වේ.

**සසම්භාරඝාණය** ඇසුරු කොට ගෙන පවත්නා වූ ද, කම්ම සමුට්ඨාන **ඝාණදසක රූපකලාපයන්හි** ඇතුළත් වූ ද, **ඝාණ විඤ්ඤාණයට** නිශ්‍රය වන ඔපය හෙවත් පැහැය නම් වූ රූප පරමාර්ථධාතුව, **ඝාණප්‍රසාදය** නම් වේ. ගන්ධ අරමුණු ඇතුල් වීමට හෙවත් වැද ගැනීමට උපකාර වන බැවින් මේ **ඝාණප්‍රසාදයට ඝාණද්වාරය** යයි ව්‍යවහාර වේ. ගන්ධ අරමුණු එල්බ ගෙන ඝාණවිඤ්ඤාණය ඉපදවීමට ස්ථාන වන බැවින් **ඝාණවස්තුව** යයි ද කියනු ලැබේ. **ඝාණෙන්ද්‍රිය** යයි ද මෙයට නමෙකි.

## ජිව්හාද්වාරය

**රස අරමුණු** වැදගන්නා වූ ද, **ජිව්හාවිඤ්ඤාණය** හට ගැනීමට උපකාර වන්නා වූ ද, **සසම්භාර ජිව්හය** ඇසුරුකොට ගෙන පවත්නා වූ ද, **මහාභූත රූපයන්ගේ ඔපය** හෙවත් ප්‍රසාදය නම් වූ ඉතා සියුම් රූප පරමාර්ථධාතුව හෙවත් **ජිව්හා ප්‍රසාදය, ජිව්හාද්වාර** නම් වේ.

**සසම්භාර ජිව්හය, ප්‍රසාද ජිව්හය** යයි ජිව්හය දෙ වැදෑරුම් වේ.

මුව සිදුර තුළ පිහිටි, දිව නම් වූ ආහාර රසය දැන ගැනීමට උපකාර වන සතරමහා භූතාදීන්ගෙන් සැදුනු ස්ථානය **සසම්භාර ජිව්හය** නම් වේ.

**සසම්භාර දිව** ඇසුරු කොට ගෙන පවත්නා වූ ද, කම්ම සමුට්ඨාන **ජිව්හාදසක රූපකලාපයන්හි** ඇතුළත් වූ ද, **ජිව්හාවිඤ්ඤාණයට** නිශ්‍රය වන ඔපය හෙවත් පැහැය නම් වූ ඉතා සියුම් රූපපරමාර්ථ ධාතුව **ජිව්හාප්‍රසාදය** නම් වේ. රසාරම්මණය ඇතුල් වීමට හෙවත් වැදගැනීමට උපකාර වන බැවින් මේ **ජිව්හා ප්‍රසාදයට, ජිව්හාද්වාර යයි** කියනු ලැබේ. රස අරමුණු එල්බ ගෙන ජිව්හා විඤ්ඤාණය ඉපදීමට ස්ථාන වන බැවින් **ජිව්හාවස්තුව** යයිද ව්‍යවහාර වේ. **ජිවහෙන්ද්‍රිය** යයි ද මෙයට ම නමෙකි.

## කායද්වාරය

**පඨවි, තෙජො, වායො** නම් වූ භූතත්‍රය සංඛ්‍යාත වූ **පොට්ඨබ්බ** අරමුණ වැදගන්නා වූ ද, **කායවිඤ්ඤාණය** හට ගැනීමට උපකාර

වන්නා වූ ද, **සසම්භාරකය** ඇසුරු කොට ගෙන පවත්නා වූ ද, **මහාභූතරූපයන්ගේ ඔපය** හෙවත් ප්‍රසාදය නම් වූ, ඉතා සියුම්රූප පරමාර්ථ ධාතුව හෙවත් **කායප්‍රසාදය, කායද්වාර** නම් වේ.

**සසම්භාරකය, ප්‍රසාදකය** යයි කය දෙවැදෑරුම් වේ. ස්පර්ශය දැනගැනීමට උපකාර වන සතරමහා භූතාදීන්ගෙන් සෑදුනු ශරීරය **සසම්භාරකය** නම් වේ.

කෙස්, ලොම්, නිය, වියලිසම, ආදි ස්පර්ශය නොදැනෙන තැන් හැර, මේ **සසම්භාරකය** ඇසුරු කොට ගෙන පවත්නා වූද කම්ම සමුට්ඨාන **කායදසක රූපකලාපයන්හි** ඇතුළත් වූද කායවිඤ්ඤාණයට නිශ්‍රයවන ඔපය හෙවත් පැහැය නම් වූ රූප පරමාර්ථ ධාතුව **කාය ප්‍රසාදය** නම් වේ. **පොට්ඨබ්බාරම්මණය** ඇතුළ්වීමට උපකාර වන බැවින් මේ කායප්‍රසාදයටම **කායද්වාර** යයි කියනු ලැබේ. **පොට්ඨබ්බාරම්මණය** එල්බගෙන කාය විඤ්ඤාණය ඉපදීමට ස්ථාන වන බැවින් **කායවස්තුව** ද වන්නේය. **කායෙන්ද්‍රිය** යයි ද මෙයටම නමෙකි.

## මනොද්වාරය

පඤ්චද්වාරයෙන් හැර, සිතින්ම ගන්නා අරමුණු වැදගන්නා වූ මනොද්වාරික චිත්තයන්ගේ ඉපදීමට කාරණාවූ ද, මනොද්වාරික චිත්ත වීථියෙහි මනොද්වාරාවජ්ජන සිතට පෙරටුව, භවඞ්ග චලන සිතට අනතුරුව උපදනා **භවඞ්ගුපච්ඡෙද** චිත්තය **මනොද්වාරය** නම් වේ. පඤ්චද්වාරයන්ට අරමුණු නොවන්නාවූ ද, මනොද්වාර යට පමණක් අරමුණු වන්නාවූ ද **පසාදරූප, සුඛුම රූප, චිත්ත, චෛත සික, නිබ්බාන, පඤ්ඤත්ති** යන ධම්මාරම්මණයන් වැදගන්නා වූද කම්ම සමුට්ඨාන වත්ථුදසක රූපකලාපයන්හි ඇතුළත්වූ හදයවත්ථු රූප පරම්පරාව ඇසුරු කොට ගෙන පවත්නාවූද භවඞ්ග චිත්තයක් වූ **භවඞ්ගුපච්ඡෙද** නම් සිත **මනොද්වාරය** වේ. පඤ්චද්වාරික අරමුණු ගෙන උපදනා වීථි චිත්තයන්ට පෙර පහළවන භවඞ්ගුන්තරච්ඡෙද සිත **මනොද්වාරය** නොවන බැව් සැළකිය යුතුයි.

# ද්වාරික සිත් සහ ද්වාරවිමුක්ත සිත්

ද්වාරයන්ගේ වශයෙන් සිත් බෙද දක්වීමේදී සියළුම සිත් **ද්වාරික සිත්** සහ **ද්වාරවිමුක්ත සිත්යයි** දෙකොටසකට බෙදනු ලැබේ. මේ භවයේදීම ෂට් ද්වාරයන් ගෙන් ගත්අරමුණු එල්බ ගෙන උපදින සිත් **ද්වාරික සිත්** නම් වේ. මේ භවයේ දී ෂට්ද්වාර යන්ගෙන් නොගත් පූර්ව භවයෙන් ගත් අරමුණ එල්බගෙන උපදින සිත් **ද්වාරවිමුක්ත සිත්** නම් වේ.

## ද්වාරික සිත්

**ද්වාරික සිත්** කොටස් සයකි. එනම් **චක්ඛුද්වාරික සිත්, සොත ද්වාරික සිත්, ඝාණද්වාරික සිත්, ජිව්හාද්වාරික සිත් කායද්වාරික සිත්, මනොද්වාරික සිත්ය.**

## චක්ඛුද්වාරික සිත්

**චක්ඛුද්වාරයෙන්** ගන්නා ලද රූපාරම්මණයක් එල්බ ගෙන ඇති වන්නා වූ සිත් **චක්ඛුද්වාරික සිත්** නම් වේ. චක්ඛුද්වාරයට හමු වන රූප පරමාර්ථයාගේ ආයුෂය චිත්තක්ෂණ සතොළොසකි. එයින් චක්ෂු ප්‍රසාදයට හමුවන්නේ වර්තමාන හෙවත් පවත්නා රූපයකි. යම් රූපාරම්මණයක් ගෙන සිත් ඇතිවීමට අවස්ථා පැමිණිකල්හි භවඞ්ග සිත් පරම්පරාවේ එක්තරා සිතකට මේ රූපය හමුවන්නේය. උත්පාදක්ෂණයේදී රූපය ඉතා දුර්වල බැවින් පළමුවන භවඞ්ග සිතෙහි අරමුණ ඉවත් කරගැනීමට අසමර්ථ වේ. මෙසේ ගතවන **භවඞ්ග** සිතට **අතීත භවඞ්ග** යයි ව්‍යවහාර වේ. ස්ථිතික්ෂණයේදී රූපය බලවත් හෙයින් දෙවන භවඞ්ග සිතෙහි අරමුණ චලනය වන බැවින් ඒ සිතට **භවඞ්ග චලනය** යයි කියති. රූප අරමුණ බලවත් නම් එයට අනතුරුව හටගන්නා භවඞ්ග සිතෙහි අරමුණ ඒ සිත නිරුද්ධවන විටම ඉවත් වේ. මේ සිතට **භවඞ්ගුපච්ඡෙදය** යයි කියනු ලැබේ. එයට පසු අළුත් අරමුණ ගෙන, ඒ අරමුණට සිත් පරම්පරාව යොමු කිරීම් වශයෙන් ආවර්ජන කෘත්‍යය කරමින්, දපළමුවන චක්ඛුද්වාරික සිත වූ **පඤ්චද්වාරාවර්ජන චිත්තය** පහළ

වන්නේය. ඊට පසුව එම රූපාරම්මණයම ගෙන පිළිවෙළින් **චක්ඛුවිඤ්ඤාණය, සම්පටිච්ඡනය සන්තීරණය, වොට්ඨපනය, ජවන් සතය තදාරම්මණ දෙකය** යන වීථි සිත් ඉපිද නිරුද්ධවීමත් සමඟම රූපාරම්මණයාගේ ආයුෂය වූ සතොළොස් චිත්තක්ෂණය ගත වූ බැවින් එම අරමුණත් සමගම චිත්ත වීථියද අවසන් වී, නැවත භවාඞ්ග සිත් හටගන්නේය. මෙසේ චක්ඛුද්වාරයෙන් රූපාරම්මණයක් ගෙන ඇතිවන්නා වූ සතළොස් චිත්තක්ෂණයන්ගෙන් යුත් චක්ඛුද්වාරික චිත්තවීථියක ද්වාරික සිත් වශයෙන් වැඩිම ගණනින් ද්වාරික සිත් තුදුසක් (14) පහළ විය හැකි බව දත යුතුයි. ආරම්මණය දුර්වල වී නම් මෙයට අඩුවෙන් වීථි සිත් ඇති විය හැකිය.

මෙසේ චක්ඛුද්වාරික සිත් වශයෙන් ඇතිවිය හැකි සිත් සසාළිසකි. (46) එනම්.

| | | | | |
|---|---|---|---|---|
| 1. | **පඤ්චද්වාරාවජ්ජන සිත** | | | 1 |
| 2. | **චක්ඛුවිඤ්ඤාණ සිත්** | | | 2 |
| 3. | **සම්පටිච්ඡන සිත්** | | | 2 |
| 4. | **සන්තීරණ සිත්** | | | 3 |
| 5. | **වොට්ඨපන (මනොද්වාරාවජ්ජන සිත)** | | | 1 |
| 6. | **ජවන් සිත්** | අකුසල් | 12 | |
| | | හසිතුප්පාද | 1 | |
| | | මහාකුසල් | 8 | 29— 29 |
| | | මහා ක්‍රියා. | 8 | |
| 7. | **තදාරම්මණ සිත්** (11) න් සන්තීරණ සිත් 3 ගත් බැවින් ඉතිරි | | | 8 |
| | | | | 46 |

## සොතද්වාරික සිත්

**සොතද්වාරයෙන්** ශබ්ද අරමුණක් ගත් කල්හි **සොතද්වාරික** චිත්ත වීථියක් පහළ වන්නේය. එම චිත්ත වීථියද **චක්ඛුද්වාරික** චිත්තය වීථියමෙනි. **චක්ඛු විඤ්ඤාණය** වෙනුවට **සොතවිඤ්ඤාණය** යොද ගත් කල්හි **සොතද්වාරික චිත්ත** වීථියේ උපදින වීථි සිත් දත හැකි වේ.

**සොතද්වාරික සිත්** ද සසාළිසකි. (46) එනම් **පඤ්චද්වාරාවජ්ජනය සොතවිඤ්ඤාණ දෙසිතය, සම්පටිච්ඡන** දෙසිතය, **සන්තීරණ සිත්** තුනය, **වොට්ඨපන** සිතය, **ජවන් සිත්** විසිනවය, **තදාරම්මණ සිත්** එකොළොසින් සන්තීරණ සිත් තුන හැර ඉතිරි මහාවිපාක අටය යන සසාළිස් චිත්තයෝයි. මෙයින් එක් සොතද්වාරික චිත්ත වීථියක යෙදෙන වැඩිම ද්වාරික සිත් ගණන තුදුසකි. (14)

### ඝාණද්වාරික සිත්

**ඝාණද්වාරයෙන්** ගන්ධ අරමුණක් ගත් කල්හි **ඝාණද්වාරික චිත්ත වීථියක්** පහළ වන්නේය. එම චිත්තවීථියද චක්ඛුද්වාරික චිත්තවීථිය මෙනි. චක්ඛු විඤ්ඤාණය වෙනුවට **ඝාණ විඤ්ඤාණය** යොදගත් කල්හි **ඝාණද්වාරික** චිත්ත වීථියේ උපදින විථි සිත් දත හැකි වේ.

**ඝාණද්වාරික සිත්ද** සසාළිසකි. (46) එනම් **පඤ්චද්වාරාවජ්ජනය, ඝාණ විඤ්ඤාණ** දෙසිතය. **සම්පටිච්ඡන** දෙසිතය. **සන්තීරණ සිත්** තුනය, **වොට්ඨපන** සිතය, **ජවන් සිත්** විසි නවය, **තදාරම්මණ සිත්** එකොළොසින් සන්තීරණ සිත් තුන හැර ඉතිරි මහා විපාක සිත් අටය යන සසාළිස් චිත්තයෝයි. මෙයින් එක් ඝාණද්වාරික චිත්ත වීථියක යෙදෙන වැඩිම ද්වාරික සිත් ගණන තුදුසකි. (14)

### ජිව්හාද්වාරික සිත්

**ජිව්හාද්වාරයෙන්** රස අරමුණක් ගත් කල්හි **ජිව්හාද්වාරික චිත්ත වීථියක්** පහළ වන්නේය. එම චිත්ත වීථියද චක්ඛුද්වාරික චිත්තවීථියට සමානය. චක්ඛු විඤ්ඤාණය වෙනුවට ජිව්හා විඤ්ඤාණය යොදගත් කල්හි **ජිව්හාද්වාරික චිත්තවීථියේ** උපදින ද්වාරික සිත් දත හැකිවේ.

**ජිව්හාද්වාරික සිත්ද** සසාළිසකි. (46) එනම්, **පඤ්චද්වාරාවජ්ජනය, ජිව්හා විඤ්ඤාණ දෙසිතය, සම්පටිච්ඡන දෙසිතය, සන්තීරණ සිත් තුනය, වොට්ඨපන සිතය, ජවන් සිත් විසිනවය, තදාරම්මණ**

සිත් එකොළොසින් සන්තීරණ සිත් තුන හැර ඉතිරි මහා විපාක අටය යන සසාළිස් චිත්තයෝයි. මෙයින් එක් ජිව්හාද්වාරික චිත්ත වීථියක යෙදෙන වැඩිම ද්වාරික සිත් ගණන තුදුසකි. (14)

## කායද්වාරික සිත්

**කායද්වාරයෙන්** පොට්ඨබ්බ අරමුණක් ගත් කල්හි **කායද්වාරික චිත්තවීථියක්** පහළවන්නේය. එම චිත්ත වීථියද චක්ඛුද්වාරික චිත්තවීථියට සමානය. චක්ඛු විඤ්ඤාණය වෙනුවට කාය විඤ්ඤාණය යොදගත් කල්හි කායද්වාරික චිතතවීථියේ උපදින ද්වාරික සිත් දත හැකිවේ.

**කායද්වාරික සිත්**ද සසාළිසකි. (46) එනම්, **පඤ්චද්වාරාවජ්ජනය, කායවිඤ්ඤාණ දෙසිතය, සම්පටිච්ඡන දෙසිතය, සන්තීරණ සිත් තුනය, වොට්ඨපන සිතය, ජවන් සිත් විසිනවය, තදරම්මණ සිත්** එකොළොසින් සන්තීරණ සිත් තුන කලින් ගත් බැවින් එය හැර ඉතිරි මහා විපාක අටය යන සසාළිස් චිත්තයෝයි. මෙයින් එක් කායද්වාරික චිත්ත වීථියක යෙදෙන වැඩිම ද්වාරික සිත් ගණන තුදුසකි. (14)

## මනොද්වාරික සිත්

**මනොද්වාරයෙන්** හෙවත් සිතින්ම ගනු ලබන ධම්මාරම්මණයක් ගත්කල්හි **මනොද්වාරික චිත්ත වීථියක්** පහළ වන්නේය. භවඞ්ග සිත් පරම්පරාවට ධම්මාරම්මණයක් හමුවූ කල්හි **භවඞ්ග චලනය** ඇතිවී, **භවඞ්ගුපච්ඡෙද සිතින්** භවඞ්ග අරමුණ ඉවත් වූ කල්හි **මනොද්වාරාවජ්ජන සිත** ආවර්ජන කෘත්‍යය සිද්ධ කරමින් උපදින්නේය. මේ චිත්ත වීථියේ පළමුවන ද්වාරික සිත **මනොද්වාරාවජ්ජන සිතය.** එයට අනතුරුව **ජවන් සිත්** සතක් පහළවී **තදරම්මණ දෙසිතින්** චිත්ත වීථිය අවසන් වන්නේය.

**මනොද්වාරික සිත්** සැට සතකි. (67) එනම්:— **මනොද්වාරාවජ්ජනය, කාමජවන් විසිනවය, මහග්ගතජවන්** අටළොස, **ලොකොත්තර ජවන්** අටය යන **ජවන් සිත්** පස් පනසය (55), **තදරම්මණ සිත්**

එකොළොසය යන සැට සතක් චිත්තයෝයි. මෙයින් එක් මනොද්වාරික චිත්ත වීථියක යෙදෙන වැඩිම ද්වාරික සිත් ගණන දසයකි. එනම් **මනොද්වාරාවජ්ජනය, ජවන් සිත් සත** සහ **තදරම්මණ දෙසිතය**.

## ද්වාර විමුක්ත සිත්

මේ භවයේදී සදෙරින් ගන්නා ලද අරමුණු නොව, අතීත භවයේදී සදෙරින් ගන්නා ලද **කම්ම, කම්මනිමිත්ත, ගතිනිමිත්ත** යයි සම්මත ආරම්මණයක් ගෙන උපදනා චිත්තයෝ **ද්වාරවිමුක්ත සිත්** නම් වෙත්. මෙසේ උපදනා සිත් නම්, **පටිසන්ධි, භවඞ්ග, චුති** කෘත්‍යයන් සිද්ධ කරන්නාවූ එකුන් විසි (19) චිත්තයෝයි. එනම්:— **උපෙක්ඛා සහගත සන්තීරණ දෙසිතය, මහාවිපාක අටය, මහග්ගත විපාක** නවය යන මොහුය.

මේ ද්වාර විමුක්ත සිත් අතුරෙන් එක් භවයෙක ඇති වන්නේ **එක් පටිසන්ධි සිතක් හා එක් චුති සිතක් ද**, ද්වාරික සිත් හටනොගන්නා හැම කල්හිම **භවඞ්ග සිත්** සඞ්ඛ්‍යාවක් නොමැතිව ද හටගන්නා බව දත යුතුය.

## එකද්වාරික සිත්

එක් ද්වාරයකින් පමණක් අරමුණු ගෙන හටගන්නා සිත් **එකද්වාරික සිත් නම් වේ.** මේ එකද්වාරික සිත් සතිසකි. (36). එනම්:—

| | |
|---|---|
| **විඤ්ඤාණ සිත්** | **10** |
| **මහග්ගත, ලොකොත්තර ජවන් සිත්** | **26** |
| | **36** |

මෙයින් **විඤ්ඤාණ සිත්**, තම තමන්ට අයත් එක් ද්වාරයකින් අරමුණ ගෙන උපදින්නාහ. **මහග්ගත ලොකොත්තර ජවන් සිත්** විසිහය මනොද්වාරයෙන් පමණක් අරමුණු ගෙන උපදී.

## පඤ්චද්වාරික සිත්

**චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය** යන පස්දෙරින් අරමුණු ගෙන උපදනා සිත් **පඤ්චද්වාරික සිත් නම් වේ.**

**පඤ්චද්වාරික සිත්** තුන්දෙනෙකි. එනම් **පඤ්චද්වාරාවජ්ජනය, සම්පටිච්ඡන දෙසිතය,** යන **මනොධාතුත්‍රිකයයි.** මේ සිත් තුන **පඤ්චද්වාරයෙන්ම** අරමුණු ගෙන උපදී.

### ඡද්වාරික සිත්

පඤ්චද්වාරයන් සහ මනොද්වාරය යන සදෙරින්ම අරමුණු ගෙන උපදනා සිත් **ඡද්වාරික සිත් නම් වේ.** එබඳු සිත් එක්තිසකි. එනම්:-

| | | |
|---|---|---|
| සොමනස්ස සන්තීරණ | සිත | 1 |
| මනොද්වාරාවජ්ජන | සිත | 1 |
| කාමාවචර ජවන් | සිත් | 29 |
| | | 31 |

මෙයින් සොමනස්ස සන්තීරණ සිත පඤ්චද්වාරික චිත්ත වීථීන් හි සන්තීරණ සහ **තදරම්මණ** කෘත්‍යයන්ද, මනොද්වාරික **චිත්ත වීථියේදී** තදරම්මණ කෘත්‍ය පමණක්ද සිද්ධ කරමින් උපදනා බව දත යුතුයි.

### ඡද්වාරික – ද්වාරවිමුක්ත සිත්.

ඡද්වාරික වශයෙන් හා **ද්වාරවිමුක්ත වශයෙන්ද** අරමුණ ගෙන උපදනා සිත් **ඡද්වාරික ද්වාරවිමුක්ත** සිත් නම් වේ. එබඳු සිත් දසයකි. එනම් **උපෙක්ඛා සහගත සන්තීරණ සිත් දෙක හා කාමාව චර** මහාවිපාක අටය

### ද්වාරවිමුක්ත සිත්.

මේ භවයට අයත් නොවූ, පූර්ව භවයෙන් ගන්නා ලද අරමුණු' පමණක් ගෙන උපදනා සිත් **ද්වාරවිමුක්ත** සිත් නම් වේ. **පටිසන්ධි භවඞ්ග** චුති කෘත්‍යයන් පමණක් **සිදුකරන්නාවූ** ද්වාරවිමුක්ත සිත් නවය නම් **මහග්ගත විපාක** සිත් නවයයි. මේ සිත් නවය අන් **ආකාරයකින්** නූපදනේය. උපෙක්ඛා **සන්තීරණ** දෙසිතත්, මහා

**විපාක** අටත් **පටිසන්ධි, භවඞ්ග, චුති** කෘත්‍යයන් කරමින් උපදනා කල්හි පමණක් ද්වාරවිමුක්ත සිත් වශයෙන් පූර්ව භවයෙන් ගත් **කම්ම, කම්මනිමිත්ත, ගතිනිමිත්ත** නම් අරමුණු වලින් එකක් ගෙන උපදනේය. මෙ හැර මේ සිත් ෂට්ද්වාරික වශයෙන් අරමුණු ගෙන **සන්තීරණ** තදාරම්මණ කෘත්‍යයන් කරමින් උපදින බව දත යුතුයි.

# ආරම්මණ සංග්‍රහය

ආරම්මණයන්ගේ වශයෙන් චිත්ත චෛතසිකයන් බෙද දක්වීම **ආරම්මණ සංග්‍රහ නම් වේ.**

සිතක් හට ගැනීමට යම් කිසි සිතිය යුතු දෙයක් තිබිය යුතුය. **ඒ** සිතනු ලබන දෙය කරණකොට ගෙණ සතුටු වීමක් රමණය වීමක් ඇතිවන බැවින් එයට **ආරම්මණයයි** කියති. ඒ දෙය එල්බගෙන සිත උපදින බැවින් එයටම **ආලම්බණ** යයි ද කියති.

සිතින් සිතිය නො හැකි දෙයක් නැත. **ලෞකික වූද ලොකොත්තරවූද, පරමාර්ථවූද, ප්‍රඥප්තිවූද** හැම දෙයක්ම සිතින් සිතිය හැකිවේ. **එමෙන්ම, ප්‍රත්‍යුත්පන්නවූද, අතීතවූද, අනාගතවූද, කාලවිමුක්තවූද, සියළුම** අරමුණු සිත් වලින් ගනු ලබන්නේය.

මේ අරමුණු සයාකාරවේ. එනම් **රූපාරම්මණ, සද්දාරම්මණ, ගන්ධාරම්මණ, රසාරම්මණ, ඵොට්ඨබ්බාරම්මණ, ධම්මාරම්මණ** යන මොහුය.

### රූපාරම්මණය

ඇසට හෙවත් චක්ඛුවිඤ්ඤාණයට හමුවන වර්ණය හෙවත් **පැහැය රූපාරම්මණ** නම්වේ. **පඨවි, ආපො, තෙජො, වායො** යන සතර මහා භූතයන් එක්වූ කල්හි එහි ඇතිවන්නාවූ ලක්ෂණය හෙවත් පැහැය **වර්ණධාතුව** නම වේ. ඇසට ගොචරවන **මේ වර්ණ ධාතුවට රූපාරම්මණය** යයි කියති.

**සතර මහා භූතයෝ** වනාහී ඇසට නොපෙනෙන ඉතා සියුම් **රූප පරමාර්ථයෝ** යි. මේ රූපපරමාර්ථයන්ට තනිව වෙන්

වෙන්ව සිටිය නො හැකිවේ. හැම විටම ඔවුන් එක්වී සමූහ හෙවත් කලාප වශයෙන් පවතී. මෙසේ සතරමහා භූතයෝ එක්වූ කල්හි, ඔවුන්ගේ එක්තරා පැහැයක් හෙවත් **වර්ණයක් ද, රසයක්ද, ගන්ධයක් ද, ඕජාවක් ද,** ඇතිවන්නේය. එබැවින් හැම **රූප කලාපයකම පඨවි, ආපො, තෙජො, වායො** යන් සතරමහාභූතරූපද ඒ සතර මහාභූතරූප නිසා හටගන්නා **උපාදරූප** නම් වූ **වර්ණ, ගන්ධ, රස, ඕජා** යන රූප සතරදැයි මෙසේ අඩුම ගණනින් රූපපරමාර්ථයෝ අට දෙනෙක් විද්‍යාමාන වේ. මෙයට **සුද්ධාෂ්ටක රූප කලාපය** යයිද කියති. මෙවැනි රූපකලාප මහත් රාශියක් එකතුවීමෙන් **ද්‍රව්‍යයයි** සම්මත දෙය ඇතිවන්නේය. **ද්‍රව්‍යයකට** ඇතුළත් වූ හැම රූපකලාපයන්ගේම වෙන් වෙන්වූ වර්ණයන් එකතු වීමෙන්, මිශ්‍රවීමෙන්, ද්‍රව්‍යයකට ඇත්තේ වර්ණ මිශ්‍රණයකි. ඇසට හමු වන්නේ ද්‍රව්‍යයක ඇති මේ වර්ණ මිශ්‍රණය මිස රූප කලාපයන්හි ඇත්තාවූ, සත්‍යවූ පරමාර්ථවූ වර්ණ රූප නොවන බව දතයුතුයි. මෙසේ නොයෙක් ලෙසින් මිශ්‍ර වූ වර්ණය ඇසට හමු වූ කල්හි කලින් දැක පුරුදු සළකුණු වලින් හැඳිනගෙන අසවල් දෙය දක්කා යයි කියති. සුදු. නිල් රතු, කහ යනාදී වශයෙන් ද්‍රව්‍යයක වර්ණය ප්‍රකාශ කරන කල්හි නොයෙක් ලෙසින් ඇතිවූ, මේ වරණ මිශ්‍රණයම ප්‍රකාශ වන බව දතයුතුයි. ඇතැම් රූප කලාපයන්හි වර්ණය අප්‍රකටවූ කල්හි එයින් සැදුනු රූප ඇසට නො පෙනෙන්නේය. ප්‍රකට වර්ණයන් ඇති කල්හිම ද්‍රව්‍යයන් පෙනෙන්නේවේ. රූප කලාපයන්හි වායො ධාතු අධික වූ කල්හි සුලඟයයි කියති. එහි වර්ණය ඉතාමත් දුර්වල බැවින් සුලඟ ඇසට නොපෙනෙන්නේය. ශරීරයට සුලඟ දැනෙන්නේ එහි ඇති පඨවි ධාතු නිසාය. එබැවින් චක්ඛුද්වාරයට හමුවන්නාවූ ද, චක්ඛුවිඤ්ඤාණය ඉපදීමට උපකාර වන්නා වූද රූපාරම්මණය යයි කියනු ලබන්නේ මේ වර්ණ ධාතුවට බව දත යුතුයි.

චක්ඛුද්වාරයට හමුවන වර්ණ සඞ්ඛ්‍යාත රූපාරම්මණය **වර්තමාන** හෙවත් **ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණයයි.** අතීත හෝ අනාගත හෝ රූප අරමුණු චක්ඛුද්වාරයට හමුනොවන්නේය.

**පච්චුප්පන්නය** තුන් වැදෑරුම් වේ. එනම්:—

**1. ඛණ පච්චුප්පන්නය**
**2. සන්තති පච්චුප්පන්නය**
**3. අද්ධා පච්චුප්පන්නය**

**ඛණ පච්චුප්පන්නය** නම් චිත්තක්ෂණ හෙවත් සිත් සතළොසක් ඉපිද නිරුද්ධවීමට ගතවන කාලයයි. මෙය රූප පරමාර්ථයාගේ **ආයුෂය** වේ. පළමුවෙනි චිත්තක්ෂණයේ **උ**ත්පාදයත් සමගම රූප **පරමාර්ථයාගේ** උත්පාදය ඇතිවී සතොළොස්වන චිත්තක්ෂණයේ **භඞ්ගයත්** සමඟම රූපයද නිරුද්ධ වේ. අටළොස්වන චිත්තක්ෂණය ඇතිවන විට එය අතීත රූපයක් වන්නේය.

**සන්තති පච්චුප්පන්නය.** රූපයක් ඇසින් දුටු කල්හි හෙවත් රූප **අරමුණක්** ගෙන චක්ඛුද්වාරික චිත්තවීථියක් පහළවී එයට අනතුරුව **එම අරමුණම** ගෙණ පිළිවෙලින් මනොද්වාරික චිත්තවීථි තුනක් **ඇතිවීමෙන් පසු** ඒ රූපාරම්මණය හැඳිනගනු ලබන්නේය. මෙකී **චක්ඛුද්වාරික** චිත්තවීථියත් මනොද්වාරික චිත්තවීථි තුනත් යන **චිත්තවීථි** සතරට ගතවන කාලය **සන්තති පච්චුප්පන්නය** නම් වේ. **අ**රමුණක් හැඳිනීමට ගතවන කාලයයි.

**අද්ධා පච්චුප්පන්නය** නම් එක් සත්ත්වයෙක් පිළිබඳ වූ එක් භවයකට අයත් පටිසන්ධි චිත්තක්ෂණයේ පටන් එම භවයේ අවසානය හෙවත් චුතිසිත දක්වා පවත්නා කාලයයි.

මෙයින්, **චක්ඛු විඤ්ඤාණය** ඉපදීමට උපකාර වන **ප්‍රත්‍යුත්පන්න** අරමුණ යයි කී කල්හි **ඛණ පච්චුප්පන්නය යයි** කියන ලද, රූපාරම්මණ **යාගේ** ආයුෂයවූ චිත්තක්ෂණ සතළොස පවත්නා කාලයෙහි වූ අර මුණුබව දතයුතුයි.

මේ රූපාරම්මණය **අමිශ්‍ර අරමුණකි.** එසේම මේ වර්ණ රූපය, **කම්ම, චිත්ත, ඍතු, ආහාර** යන හේතු සතරින්ම උපදවනු ලැබේ.

### සද්දාරම්මණය

**සොතප්‍රසාදය** හා ගැටුනු කල්හි **සොතවිඤ්ඤාණයක්** ඉපදීමට **උ**පකාරවන යම් රූප පරමාර්ථයක් වේද, එයට **සද්දාරම්මණ යයි කියනු** ලැබේ. රූපකලාපයන් ඔවුන්නොවුන් හා ගැටීම වන **කල්හිද,** ගැටුණු රූප කලාපයන්ගේ වෙන්වීම වන කල්හිද, වායො **ධාතුහුගේ** චලනය වීම කරණකොට ගෙන උපදවන ලද රූප පරමාර්ථ

යෝ, සොතප්‍රසාදය හා ගැටීමෙන් සොතවිඤ්ඤාණය උපදවනු ලැබේ. සියුම් ආකාරයෙන් රූප කලාපයන්ගේ ගැටීම වන කල්හි, එයින් උපදවන **ශබ්දරූපයෝ** දුර්වල බැවින් කණට නො ඇසෙන්නේය. වේගවත්ව ගැටෙන කල්හිම ඇසෙන්නේ වේ. නොයෙක් ආකාරවූ රූප කලාපයෝ ඔවුනොවුන් හා ගැටීම නොයෙක් ලෙසින් සිදුවන බැවින්, ඒ ඒ ආකාරයට අනුව ශබ්දය ද වෙනස්වේ. වායො ධාතුව නැති කල්හි මේ ශබ්දයෝ නො පැතිරෙන්නාහ. ශබ්දය පැතිරෙන්නේයයි කී කල්හි, රූප කලාප සට්ටණයෙන් ඇතිවන ශබ්දරූපයෝ වායු වේගයෙන් ඈතට ගෙන යන්නේයයි වරදවා නොසිතිය යුතුයි. ශබ්ද රූපායාගේද ආයුෂය චිත්තක්ෂණ සත ළොසකට වැඩි නොවන බැවින් එසේ ගෙනයාමට ශබ්ද රූපයෝ නොපවති. රූප කලාප සට්ටණයෙන් ඇතිවන වායු චලනය කරණ කොට ගෙන එයට ඉදිරියෙහි පවත්නා රූප කලාපයන්ගේද සට්ටණ වන්නේය. එයින් හටගත් වායු චලනය නිසා එයට ඉදිරියෙන් ඇති රූප කලාපයන්ගේ ගැටීම ඇතිවේ. මේ ක්‍රමයෙන් ප්‍රථමයෙන් ඇති වූ රූප සට්ටණයේ වේගයට අනුව ඉදිරි ඉදිරි රූප කලාප සට්ටණය වී සොතප්‍රසාද වස්තුව සමීපයෙහි වූ රූප කලාපයන්ගේ ගැටීමෙන් හටගන්නා ශබ්ද රූපයෝම සොතප්‍රසාදය හා ස්පර්ශවීමෙන් සොතවිඤ්ඤාණය ඇතිවන බව දත යුතුය.

මෙසේ උපදවනු ලබන ශබ්දරූප කලාප සන්තතිය, යම් උපක්‍රමයකින් දියුණු කරගතහොත්, ඉතා ඈතට පවා පතුරුවන්නටද හැකි වේ. මේ ක්‍රමයට එක් ස්ථානයකින් පිළිවෙලින් උපදවනු ලබන ශබ්දරූප කලාප සන්තති, ඒ පිළිවෙලටම සොතප්‍රසාදය හා ගැටීම වන කල්හි කලින් අසා පුරුදු ශබ්දයෝ නම්, මේ ඇසුනේ අසවල් අසවල් ශබ්දයෝයි වෙන් වෙන් වශයෙන් ශබ්ද හැඳිනගන්නේය. බෙර ශබ්දය, වීණා ශබ්දය, මනුෂ්‍ය කට හඬය, පක්ෂිනාදය, අහස ගිගුම් ගැනීමය, යනාදි වශයෙන් ශබ්ද හැඳින ගන්නේ මේ ක්‍රමයෙන් බව දත යුතුයි. මේ ශබ්ද රූපයට තනිවම පැවතිය නොහැකි වේ. රූපකලාපයකට ඇතුළත්වම පවතී. **චිත්තසමුට්ඨාන** වශයෙන් උපදවන ශබ්ද රූපයෝ **වාග්විඤ්ඤප්ති දශක** රූප කලාපයට ඇතුළත් වේ. **ඍතුසමුට්ඨාන** හෙවත් ඍතුව නිසා හටගන්නා වූ ශබ්දයෝ **ශබ්දනවක** රූපකලාපයට හෝ **ශබ්ද ලහුතාදි ද්වාදසක රූපකලාපයට** හෝ ඇතුළත් වන්නේය.

## ගන්ධාරම්මණය

යම් රූප පරමාර්ථයක් **ඝාණප්‍රසාදය** හා ස්පර්ශවීමෙන් **ඝාණ විඤ්ඤාණය** ඉපදීමට ගොචර වේද, ඒ රූපයට **ගන්ධාරම්මණය** යයි කියනු ලැබේ. **පඨවි, ආපො, තෙජො, වායො** යන සතර මහා භූතරූප එක්වූ කල්හි, එහි ඇති යම්කිසි **ගන්ධයත්**, ඒ සමඟම පහළ වන්නේය. එය මහා භූතරූපයන් නිසා හටගත් උපාද රූපයකි. රූපකලාපයන් රාශියක් එක්වීමේ දී ඒ ඒ රූපකලාපයන්හි ඒ ඒ ගන්ධයෝ එකතුවීමෙන් ගන්ධ මිශ්‍රණයක් ඇතිවන්නේය. ඝාණප්‍රසාදයට හමුවන්නේ ඒ ගන්ධ මිශ්‍රණය මිස ඒ ඒ රූපකලාපයන්ගේම වෙන් වෙන්වූ ගන්ධයෝ නොවන බව දත යුතුයි. ඇතැම් රූප කලාපයන්හි ඇති ගන්ධරූපයෝ ඉතා දුර්වල බැවින් ඒ දුර්වල ගන්ධ ඇති රූප කලාපයන්ගෙන් සෑදුනු ද්‍රව්‍යයන්ගේ ගන්ධය නැහැයට ප්‍රකටව නොවැටහෙන්නේය, බලවත්වූ ගන්ධරූප ඇති කලාපවලට අයත් ගන්ධයෝ ම නැහැයට ප්‍රකටව වැටහෙන්නාහ. ඈතක තිබෙන යම් ද්‍රව්‍යයක ගන්ධයක් දැනෙන කල්හි, ඒ තැන හටගත් ගන්ධරූපයෝ පැමිණ ඝාණප්‍රසාදයෙහි නො ගැටෙන්නාහ. චිත්තක්ෂණ සතොළොසකට වැඩි ආයු නැති මේ ගන්ධරූපය නාසය සමීපයට පැමිණවීමට නම් කාලයක් ගතවිය යුතුයි. **කම්ම, චිත්ත, ඍතු, ආහාර** යන සතරාකාරයෙන්ම හට ගන්නා වූ මේ ගන්ධරූපයෝ ඒ හේතූන් පවත්නාතෙක් නැවත නැවතත් රූප පරම්පරාවන් උපදවන්නේය. වායෝ ධාතුහුගේ හෙවත් වායුවේ උපකාරයෙන් ඒ ඒ දිසාවන්හි මේ රූප පරම්පරාව පැතිර යන්නේය. එබඳු බලවත් ගන්ධ රූප ඇති රූප කලාපයන් ඝාණ ප්‍රසාදය සමීපයෙහි හටගත් කල්හි ඒ ගනධාරම්මණය ඝාණ ප්‍රසාදය හා ගැටීමෙන් ගන්ධය දැනගන්නා ඝාණ විඤ්ඤාණ සිත උපදින්නේය. එබැවින් ඝාණ විඤ්ඤාණය විසින් අරමුණු කරණු ලබන්නේ ඝාණ ප්‍රසාදය සමීපයෙහිම හටගත් වර්තමාන හෙවත් **ප්‍රත්‍යුත්පන්න ගන්ධාරම්මණය** බව දත යුතුයි.

## රසාරම්මණය

**ජිව්හා ප්‍රසාදය** හා ස්පර්ශ වීමෙන් **ජිව්හා විඤ්ඤාණය** ඉපදීමට **යම්** රූප පරමාර්ථයක් උපකාර වේද එය **රසාරම්මණය** වේ. **පඨවි, ආපො, තෙජො, වායො** යන සතර මහා භූතරූප එක්වූ කල්හි එහි ඇති

රසයද ඒ සමඟම පහළ වන්නේය. වෙන් වෙන්ව හටගන්නා රූප කලාපයන්ගේ වෙන්වෙන්වූ රස රූප ඇත්තේ වී නමුත් රූපකලාප යෝ එක්වූකල්හි ඇතිවන්නේ මිශ්‍ර රසයකි. ජිව්හා ප්‍රසාදයට හමු වන්නේ මේ මිශ්‍ර රසයයි. සෑම ද්‍රව්‍යයකම රස රූපයෝ ඇති නමුත් ඇතැම් විට දුර්වල රස රූපයන් දිවට ප්‍රකටව නොදැනෙන්නේය. බලවත් වූ රස රූපයෝ ජිව්හා ප්‍රසාදය හා ස්පර්ශ වීමෙදි රසය ප්‍රකටව දැනෙන්නේය. ඇඹුල්රස, තිත්තරස, පැනිරස යනාදී වශයෙන් දැනෙන්නේ මේ රස රූපයන්ගේ මිශ්‍රණය ඇතිවූ සැටියෙනි.

තවද මේ රසාරම්මණය වැදගැනීමට **ආපොධාතුහුගේ** උපකාරය ලැබිය යුතු වේ. තෙත්ගතිය ඇති විටෙක රසය ඉක්මනින් වැට හෙන්නේය. එබැවින් තෙත්ගතිය හෙවත් ආපො ධාතුව වැඩි ද්‍රව්‍යයන්හි රසය හොඳින් දිවට දැනෙන්නේ ය. තෙත් ගතිය ඇති ලුණු වර්ග දිවෙහි තැබූ කල්හි රසය වහා දැනෙන්නේය. රන්, රිදී, මැණික් ආදී ඝණ වස්තූන්හි රසය එතරම් ප්‍රකට නොවේ. මේ රස රූපය ද **කම්ම, චිත්ත, ඍතු, ආහාර** යන සතර හේතූන්ගෙන්ම හට ගන්නේය. රස රූපය තනියම හට නොගන්නේය. උපාද රූපයක් බැවින් මහාභූතරූප සමඟම පහළ වන්නේය.

## පොට්ඨබ්බාරම්මණය

කායප්‍රසාදය හා ස්පර්ශ වීමෙන් කාය විඤ්ඤාණය ඉපදීමට යම් රූප සමූහයක් උපකාරවේද, එයට **පොට්ඨබ්බාරම්මණ** යයි කියනු ලැබේ. සතර මහා භූතරූපයන් අතුරෙන් ආපො ධාතුව හැර **පඨවි, තෙජො,** වායො යන භූතත්‍රය **පොට්ඨබ්බය** නම් වේ. **ආපො ධාතුව,** සහජාතරූපයන් එකට බැඳීම, විසිරයානොදී වළක්වා ගැනීම කෘත්‍ය කොට ඇත්තේය. එබැවින් එය ස්පර්ශ කළ නොහැකි වේ. යම් කිසි දෙයක් ශරීරය හා ස්පර්ශ වූ කල්හි තදගතිය දැනේ නම් එය පඨවිධාතුහුගේ ස්පර්ශ වීමය. උණුසුම් බවක් හෝ සිහිල් බවක් හෝ දැනේනම් එය තෙජො ධාතුව ස්පර්ශ වීමය. සුළඟ හමන කල්හි ශරීරයට තදින් ස්පර්ශවීමක් දැනේනම් එය පඨවි ධාතුහුගේ ස්පර්ශයයි. සිහිල් හෝ උනුසුම් වාතය දැනේ නම් එය සුලඟෙහි ඇති තෙජො ධාතුවගේ ස්පර්ශයයි. එක්වර දැනෙන්නේ

මේ ධාතුන්ගෙන් එකෙක්මය. බලවත් ධාතුහුගේ ස්පර්ශය ප්‍රකටව දැනෙන කල්හි අනිකුත් ස්පර්ශයෝ නොදැනේ. මේ **පොට්ඨබ්බාරම්මණය** කාය ප්‍රසාද වස්තුව හා ගැටීමෙන් ඒ පිළිබඳව දැනීම නම් වූ **කාය විඤ්ඤාණය** හටගන්නේය. ඉෂ්ඨ වූ ස්පර්ශයක් හමු වූ කල්හි කුසල විපාක සුඛ සහගත කාය විඤ්ඤාණය ද, අනිෂ්ට හෙවත් නොකැමැති ස්පර්ශයක් හමුවූ කල්හි අකුසල විපාක දුක්ඛ සහගත කාය විඤ්ඤාණය ද, උපදින්නේය. මෙසේ සුඛ දුක්ඛ වශයෙන් කාය විඤ්ඤාණයන් හටගන්නේ පොට්ඨබ්බාරම්මණයේ ඇති තද බව හේතු කොටගෙනය. චක්ඛු, සොත, ඝාණ, ජිව්හා විඤ්ඤාණයන්ට හමුවන රූප, ශබ්ද, ගන්ධ, රස යන ආරම්මණයෝ ඉතා සියුම් ලෙසින් ස්පර්ශ වන බැවින් එහි වේදනාව උපෙක්ඛා වන බව සැළකිය යුතුයි.

## ධම්මාරම්මණය

**චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය** යන පඤ්චද්වාරයන්ට ගොචර නොවන, **මනෝද්වාරයට** පමණක් ගොචර වන, **පසාදරූප, සුඛුමරූප, චිත්ත, චෛතසික, නිබ්බාණ, පඤ්ඤත්ති** යන සය **ධම්මාරම්මණය** නම් වේ.

චක්ඛුප්‍රසාදය, **සොතප්‍රසාදය, ඝාණප්‍රසාදය, ජිව්හා ප්‍රසාදය, කාය ප්‍රසාදය** යන පස **පසාදරූප** නම් වේ.

මේ **පසාදරූප** පසත්, **රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ සඞ්ඛ්‍යාත පඨවි, තෙජො, වායො** යන මේ දෙළොස හැර ඉතිරි සොළොස් රූපයෝ **සුඛුමරූප** නම් වේ.

**චිත්ත** යනු එකුන් අනූවක් (89) සිත් ය.
**චෛතසික** නම් සිත් හා යෙදෙන දෙපනස් චෛතසිකයෝයි.
**නිබ්බාන** යනු දුක්ඛ නිරොධ නම් වූ නිර්වාණ පරමාර්ථ ධාතුවයි.

**පඤ්ඤත්ති** යනු ව්‍යවහාරය පිණිස පණවාගන්නා ලද පරමාර්ථ නොවූ සියළුම ධර්මයෝයි. මෙකී සියල්ලම පඤ්චද්වාරයන්ට ගොචර නොවන්නාහ. නමුත් මනොද්වාරයට මේ සියල්ලම අරමුණු වන හෙයින් **ධම්මාරම්මණයයි** කියති.

මේ ආරම්මණයෝ සදෙනාම, **මිශ්‍ර, අමිශ්‍ර** වශයෙන්ද දෙකොටස කට බෙදනු ලැබේ. **රූප, ශබ්ද, ගන්ධ, රස** යන ගොචර රූප සතර වෙන් වෙන්ව පවත්නා රූප බැවින් **අමිශ්‍ර අරමුණුය. පොට්ඨබ්බාරම්මණය, පඨවි, තෙජො, වායො** යන භූතත්‍රයෙන් යුක්ත බැවින් **මිශ්‍ර අරමුණු** ය. **ධම්මාරම්මණය, නාම, රූප, නිබ්බාන, පඤ්ඤත්ති** ධර්මයන්ගේ වශයෙන් **මිශ්‍ර අරමුණු ය.**

නවද **දිට්ඨ, සුත, මුත** වශයෙන් **ආරම්මණයෝ** තුන් ආකාර වෙත්.

ඇසින් දක්නාලද **රූපයෝ දිට්ඨාරම්මණයෝයි.** කණින් අසන ලද සද්දරම්මණ, **සුත අරමුණු** නම් වේ.

**ඝාණ, ජිව්හා, කාය** යන ද්වාරත්‍රයෙන් විඳගන්නා ලද **ගන්ධ, රස, පොට්ඨබ්බ** යන ආරම්මණයෝ **මුත** අරමුණු නම් වෙති.මෙ **කී** රූපයන්ගේ ආයුෂය වූ චිත්තක්ෂණ සතළොස ගතවූ පසු ඒ රූපයෝ **දිට්ඨ, සුත, මුත** වශයෙන් සළකනු ලබන බව දත යුතුයි. එබැවින් අතීත කාලිකවූ **දිට්ඨ, සුත,** මුත ආරම්මණයෝ **මනොද්වාරයටම** හමුවන්නේය. **මනොද්වාරයෙන්** කාලත්‍රයට අයත් අරමුණු ගන්නා කල්හි රූපාදී ආරම්මණයන්ගේ **ප්‍රත්‍යුත්පන්න චිත්තක්ෂණ සත ළොස** ඇතුළත කාලයේදී මනොද්වාරයට හමු නොවෙත්. වත්මන් හෙවත් පවත්නා අරමුණු චක්ඛු ආදී වූ පඤ්චද්වාරයන්ටම අරමුණු වේ. මෙසේ පඤ්චද්වාර චිත්තවීථියෙන් මුවහ කරන ලද බැවින් මේ කාලයේදී අරමුණු මනොද්වාරයට හමු නොවන බව දත යුතුයි. වත්මන් අරමුණ මනොද්වාරයට හමුවන්නේ පඤ්චද්වාර චිත්ත වීථියට පසුවය.

## චක්ඛුද්වාරික චිත්තයන්ගේ අරමුණු

**රූප අරමුණක්** ගෙන හටගන්නා වූ චක්ඛුද්වාරික සිත් හත ළිස් හයකි. මේ **රූපාරම්මණය, ප්‍රත්‍යුත්පන්න රූපය, අතීත රූපය, අනාගත රූපය** යයි ත්‍රිවිධ වේ.

රූපය පවත්නා චිත්තක්ෂණ සතළොස ඇතුළත කාලයේදී **ඒ රූපය ප්‍රත්‍යුත්පන්න රූපය** නම් වේ.

සතළොස් චිත්තක්ෂණය ගතවූ පසු මේ රූපාරම්මණයෝ **අතීත රූප** නම් වෙති.

ඉදිරි කාලයෙහි හටගන්නා රූප **අනාගත රූප** නම් වේ. චක්ඛුද්වාරික සිත්වලට අරමුණු වන්නේ **ප්‍රත්‍යුත්පන්න රූප** පමණය. **අතීත රූපත්, අනාගත රූපත්** චක්ඛුද්වාරික සිත්වලට අරමුණු නො වේ.

## සොතද්වාරික චිත්තයන්ගේ අරමුණු

ශබ්දරම්මණයක් ගෙන හටගන්නාවූ සොතද්වාරික සිත්ද සතළිස් සයකි. මේ සසාළිස් චිත්තයන්ටද අරමුණු වන්නේ **ප්‍රත්‍යුත්පන්න, අතීත,** අනාගත ශබ්දරම්මණයන් අතුරෙන් **ප්‍රත්‍යුත්පන්න ශබ්දරම්මණ** පමණය.

## ඝාණද්වාරික චිත්තයන්ගේ අරමුණු

ගන්ධාරම්මණයක් ගෙන හටගන්නාවූ ඝාණද්වාරික සිත්ද සතළිස් සයකි. මේ සසාළිස් ඝාණද්වාරික චිත්තයන්ට ද අරමුණු වන්නේ **ප්‍රත්‍යුත්පන්න, අතීත, අනාගත** ගන්ධාරම්මණයන් අතුරෙන් **ප්‍රත්‍යුත්පන්න ගන්ධාරම්මණයෝ** පමණය. අතීත සහ අනාගත ගන්ධයෝ අරමුණු නොවෙත්.

## ජිව්හාද්වාරික චිත්තයන්ගේ අරමුණු

රසාරම්මණයක් ගෙන හටගන්නාවූ ජිව්හාද්වාරික සිත්ද සතළිස් සයකි. මේ සසාළිස් ජිව්හාද්වාරික චිත්තයන්ටද අරමුණු වන්නේ **ප්‍රත්‍යුත්පන්න, අතීත, අනාගත** රසාරම්මණයන් අතුරෙන් **ප්‍රත්‍යුත්පන්න රසාරම්මණයෝ** පමණය. අතීත හා අනාගත රසයෝ අරමුණු නොවෙත්.

## කායද්වාරික චිත්තයන්ගේ අරමුණු

පොට්ඨබ්බාරම්මණයක් ගෙන හටගන්නාවූ කායද්වාරික සිත්ද සතළිස් සයකි. මේ සසාළිස් කායද්වාරික චිත්තයන්ටද අරමුණු

වන්නේ **ප්‍රත්‍යුත්පන්න, අතීත, අනාගත** පොට්ඨබ්බාරම්මණයන් අතුරෙන් **ප්‍රත්‍යුත්පන්න පොට්ඨබ්බාරම්මණයෝ** පමණය. අතීත අනාගත පොට්ඨබ්බයෝ අරමුණු නොවෙත්.

## මනෝද්වාරික චිත්තයන්ගේ අරමුණු

ධම්මාරම්මණයක් ගෙන හටගන්නා වූ මනොද්වාරික සිත් හැට හතකි. ප්‍රත්‍යුත්පන්නවූද, අතීතවූද, අනාගතවූද **රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධර්ම** සහ **නිබ්බාණ පඤ්ඤත්ති** යන **කාල විමුක්ත ධර්මයන්ද** මනොද්වාරික චිත්තයන්ට අරමුණු වෙත්.

## ද්වාර විමුක්ත චිත්තයන්ගේ අරමුණු

ද්වාරවිමුක්ත චිත්තයෝ නම් පටිසන්ධි, භවඞ්ග, චුති කෘත්‍ය යන් කරන්නාවූ එකුන්විසි (19) චිත්තයෝයි. අතීත භවයෙන් ගන්නා ලද, **කම්ම, කම්මනිමිත්ත, ගතිනිමිත්ත** යයි සම්මත සදෙරින් ගන්නා ලද ආරම්මණයෝ මේ ද්වාරවිමුක්ත චිත්තයන්ගේ අරමුණු වෙති.

මරණයට ඉතාම ආසන්නයෙහිදී පහළවන චිත්ත වීථියට **මරණාසන්න චිත්තවීථිය** යයි ද එම චිත්ත වීථියෙහි උපදනා ජවන් සිත් වලට **මරණාසන්න ජවන්** යයිද කියනු ලැබේ. මේ මරණාසන්න ජවනයන් විසින් අරමුණු කරනු ලබන්නේ **කම්ම, කම්මනිමිත්ත, ගතිනිමිත්ත** යන අරමුණුවලින් එකෙකි.

කලින් කරණ ලද යම් කුසලාකුසල කර්මයක් මතු භවයෙහි පටිසන්ධි විපාකය ගෙනදීම පිණිස මරණාසන්න ජවන් සිත් වලට අරමුණු වන්නේ නම් එයට **කම්ම අරමුණයයි** කියනු ලැබේ.

යම් කුසලා කුසල කර්මයක් කිරීමට උපකාර වූ යම් කිසි උපකරණාදියක් පටිසන්ධි විපාකය ගෙන දීම පිණිස මරණාසන්න ජවන් සිත්වලට අරමුණු වන්නේනම් එයට **කම්මනිමිත්ත අරමුණ** යයි කියති.

කරණ ලද යම් කුසලාකුසල කර්මයක්හුගේ විපාකය වශයෙන් යම් භවයක පටිසන්ධිය ගෙනදීමට හේතුවන්නේ නම්, එම අළුත් භවය පිළිබඳවූ යම් යම් නිමිති, දෙව් විමන්, වන, පර්වත, ගිනිදැල්, මස් වැදැලි ආදී වශයෙන් මරණාසන්න ජවන්, සිත්වලට අරමුණු වන්නේ නම් එයට **ගතිනිමිති අරමුණ** යයි කියනු ලැබේ.

මෙයින් **කම්ම අරමුණු** අතීත කාලික බැවින් **මනොද්වාර මරණාසන්න චිත්තවීථියෙහි** උපදනා ජවනයන්ට අරමුණු වන්නේය. අකුසල කර්මයක් නම් උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත හැර ඉතිරි එකො. ළොස් අකුසල චිත්තයන්ගෙන් එකකි. කුසල කර්මයක් නම් කාමාවචර කුසල් සිත් අටෙන් එකෙකි.

**කම්මනිමිති** ෂඩ්ද්වාරයටම අරමුණු වෙත්. වර්තමාන කම්ම නිමිත්තක් නම් පඤ්චද්වාරයටද, අතීත නිමිත්තක් නම් මනොද්වාර යටද අරමුණු වේ. කුසල පක්ෂයෙහිනම් කලින් පින්කම් කරණ කල්හි දුක පුරුදු බුද්ධ ප්‍රතිමාදියද, බණ ඇසීම, පිරිකර අතගෑසීම ආදියද මරණාසන්නයේදී ලද්දක් වශයෙන් ද පෙනෙන්නේය. අකුසල පක්ෂයෙහි නම් කලින් කරන ලද ප්‍රාණවධ ආදිය පිණිස උපකරණ පිළියෙල කිරීම අවි ආයුධ ගැනීම යනාදිය පෙනෙන්නේය.

බඹලොව උපදින ධ්‍යානලාභීන්ට භාවනා කර්මය පිණිස උප කාරවූ කසිණාදී පඤ්ඤත්ති අරමුණු කර්ම නිමිති වශයෙන් ඇතිවන් නේය. කම්ම හා ගතිනිමිති අරමුණු නොකරයි.

මරණාසන්න ජවනයන් විසින් **ගතිනිමිති** අරමුණු කරණ කල්හි ෂඩ්ද්වාරයෙන්ම අරමුණු කරන්නේය.

නිරය පටිසන්ධිය ගෙන දෙන්නේ නම් නිරය ගිනි, නිරය පාලයන්, නිරය සුනඛයන් ආදීන් දකී. තිරිසන් භවයෙහි නම් වන, පර්වතාදියද, මිනිස් ලොව නම් මව්කුස වර්ණ, රෙදි පිළි ආදියද, දෙව්ලොව නම් දෙවඟනන්, දෙව්රුක්, දෙව්විමන්, දිව්‍ය රථ දිව්‍ය මල් ආදිය අරමුණු වන්නේය. දිව්‍ය රථාදිය චක්ඛුද්වාරයෙන්ද ගීතාදිය සොතද්වාරයෙන්ද, සුවඳ ඝාණද්වාරයෙන්ද, රස ජිව්හා

ද්වාරයෙන්ද ගන්නේය. අකුසල පක්ෂයෙහිද එසේම, නිරාගිනි ශරීරයට දැනෙන්නේය. දුර්ගන්ධ, නපුරු දර්ශන ආදියද එපරිද්දෙන්ම ඒ ඒ ද්වාරවලට දැනෙන්නේය.

මෙසේ මේ භවයෙහිදී ෂඩ්ද්වාරයෙන් ගන්නාලද **කම්ම, කම්ම නිමිති, ගතිනිමිති** යන අරමුණුවලින් එකක් ගෙන මරණාසන්න ජවන් ඉපිද නිරුද්ධ වූ පසු චුති චිත්තයෙන් ඒ භවය අවසන් කොට එයට අනතුරුව අළුත් භවයෙහි පටිසන්ධි විපාක සිත එම මරණාසන්න ජවනයන්ගේම අරමුණ ගෙන උපදින්නේය. අළුත් භවයෙහි භවඞ්ග සිත්වල අරමුණත් චුති සිතෙහි අරමුණත් එයමය.

ද්වාරවිමුක්ත සිත්වශයෙන් උපදනා **කාමාවචර ප්‍රතිසන්ධිහු** දසදෙනෙක් වෙති. එනම් අහේතුක ප්‍රතිසන්ධි දෙක හා මහා විපාක අටය. මොව්හු ෂඩ්ද්වාරයෙන්ම ගනු ලබන **කම්ම, කම්මනිමිති, ගතිනිමිති** යයි සම්මත වූද **ප්‍රත්‍යුත්පන්න, අතීත** යන කාල දෙකටම අයත් රූපාදිය අරමුණු කරන්නාහුය.

**රූපාවචර ප්‍රතිසන්ධිහු පස්දෙන** සහ **ආකාශානඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන** සඞ්ඛ්‍යාත අරූපි දෙදෙනා යන **මහග්ගත ප්‍රතිසන්ධිහු සත්දෙන** මනොද්වාරයෙන් ගන්නා ලද්දවූද, කාලවිමුක්තවූද, ප්‍රඥප්ති ධම්මාලම්බණ සඞ්ඛ්‍යාත **කර්මනිමිති** අරමුණු කරන්නේය.

**විඤ්ඤාණඤ්චායතන** සහ **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** යන අරූප ප්‍රතිසන්ධි දෙදෙනා මනොද්වාරයෙන් ගන්නා ලද්ද වූද, අතීතකාලිකවූද, ආකාශානඤ්චායතන සහ ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්ත සඞ්ඛ්‍යාත ධම්මාලම්බණ කම්මනිමිත්ත අරමුණු කරන්නේය.

මරණාසන්න ජවනයන්ගේද, අනතුරු භවයෙහි පටිසන්ධි චිත්තයාගේද අරමුණු බොහෝ සෙයින් සමානය ඇතැම් තැනෙක අසමානද වේ, එනම්

1. මිනිස් ලොවදී වායො කසිණයෙන් චතුර්ථධ්‍යානය උපදවා අසංඥතලයෙහි උපදනා කර්මවාදී ක්‍රියාවාදී තීර්ථකයන්ගේ ප්‍රති

සන්ධියයි. මෙතෙමේ මනුෂ්‍යලොකයෙහි යම් ඉරියව්වකින් හිඳ, සතරනාමස්කන්ධයන්ගේ දෙස් දැක වායො කසිණය වඩා නොපිරිහුණු ධ්‍යානයෙන් කලුරිය කෙළේවිනම්, එම ඉරියව්වෙන්ම ප්‍රතිමා රූපයක් මෙන් රූපස්කන්ධයක්ම අසඥතලයෙහි පහළවන්නේය. ප්‍රතිසන්ධි චිත්තයක්වූ නාමස්කන්ධයක් නූපදනේය.

2. අසංඥතලයෙහි ඉපදීමට වඩාගත් ධ්‍යාන වේගය මහාකල්ප පන්සියයක් පමණ කල් නොසිඳී පවතින බැවින්, එතෙක්කල් මේ පුද්ගලතෙමේ අසඥතලයෙහි රූපස්කන්ධයෙන් පමණක් වැස එයින් චුතව සප්ත කාම භූමියට එන කල්හි අසංඥතලයට එන්නට පෙර භවයෙහිදී කරණ ලද යම් කුසල කර්මයක්හුගේ විපාක වශයෙන් කාමාවචර ප්‍රතිසන්ධි මහා විපාක සිතකින් කාම සුගතියෙහි ප්‍රතිසන්ධිය ලබන්නේය.

3. රහතන් වහන්සේගේ ස්කන්ධ පරිනිර්වාණයේදි චිත්ත සන්තතිය නිරුද්ධ වන බැවින්, අවසාන චිත්තයවූ චුතිසිතට අනතුරුව පටිසන්ධියක් ඇති නොවන්නේය.

### නියතානියත ආරම්මණ සංග්‍රහය

ආරම්මණයෝ කොටස් සතරකට බෙද දක්වනු ලැබේ.

එනම්:—

1. **කාමාවචර අරමුණු**
2. **මහග්ගත අරමුණු**
3. **ලොකොත්තර අරමුණු**
4. **පඤ්ඤත්ති අරමුණු**

**කාමාවචර අරමුණු – කාමාවචර සිත් පනස්හතරත්** එහි යෙදෙන **චෛතසික දෙපනසත්,** සහ **රූප විසිඅටත්** යන මේ ධර්මයන්ට ඇතුළත් සියළුම අරමුණු **කාමාමාවචර අරමුණු** නාම් වේ.

**මහග්ගත අරමුණු:— මහග්ගත සිත්වලට** ඇතුළත් අරමුණු **මහග්ගත අරමුණු** නම් වේ.

**ලොකොත්තර අරමුණු:—** ලොකොත්තර සිත් අටටත්, නිර්වාණ ධර්මයටත් ඇතුළත් අරමුණු **ලොකොත්තර අරමුණු** නම් වේ.

**පඤ්ඤත්ති අරමුණු,**– දසකසිණ, දසඅසුභ, ආදී භාවනා අරමුණු වලට ඇතුළත් අරමුණු සියල්ලම **පඤ්ඤත්ති අරමුණු** නම් වේ.

## නියත කාමාවචර අරමුණු ඇති සිත්

නියත වශයෙන්ම **කාමාවචර අරමුණුම** ඇති සිත් පස් විස්සකි.) (25)

එනම්.

| | |
|---|---|
| අහේතුක අකුසල විපාක සිත් | 7 |
| අහෙතුක කුසල විපාක සිත් | 8 |
| පඤ්චද්වාරාවජ්ජන සිත | 1 |
| හසිතුප්පාද සිත | 1 |
| මහාවිපාක සිත් | 8 |
| | 25 |

මේ සිත් පස්විස්සට **මහග්ගත, ලොකොත්තර** සහ **ප්‍රඥප්ති** අරමුණු ගැනීමට නොහැකි වේ. මෙයින් **දෙපස් විඤ්ඤාණයෝ** රූපාරම්මණාදී එක් එක් අරමුණක්ම අරමුණු කරයි. **පඤ්චද්වාරාවජ්ජනය** සහ **සම්පටිච්ඡන** දෙසිත යන **මනොධාතු ත්‍රිකය** රූපාදී පසම අරමුණු කරයි.

## නියත මහග්ගත අරමුණු ඇති සිත්

දෙළොස් අරූපාවචර චිත්තයන් අතුරෙන් **විඤ්ඤාණඤ්චායතන කුසල, විපාක, ක්‍රියා** සිත් තුනද, **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** කුසල **විපාක, ක්‍රියා** සිත් තුනද යන අරූප සිත් සය නියත වශයෙන්ම **මහග්ගත අරමුණුම** අරමුණු කරන්නේය.

**විඤ්ඤාණඤ්චායතන කුසල්** සිත උපදවනු කැමැති පුද්ගලයා විසින් **ආකාශානඤ්චායතන කුසල චිත්තය** අරමුණු කොට එම

ධ්‍යාන චිත්තයාගේ අනන්ත බව වටහා ගන්නා බැවින්, එහි අරමුණ මහග්ගත චිත්තය වූ **ආකාශානඤ්චායතන කුසල් සිත** නම් වේ.

**විඤ්ඤාණඤ්චායතන විපාක සිත, විඤ්ඤාණඤ්චායතන** අරූප භූමියෙහි ප්‍රතිසන්ධිය ගෙනදෙන විපාක සිතක් බැවින් එයට පූර්ව භවයෙහිදී මරණාසන්න ජවනයන්ට අරමුණු වූ **ආකාශානඤ්චායතන කුසල් සිත** නම් වූ **කර්මනිමිත්ත** අරමුණු කරණු ලැබේ.

**විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත** ඇතිවන්නේ රහතන් වහන්සේටය. අර්හත්වය ලබන්නට පෙර වඩනා ලද **ආකාශානඤ්චායතන කුසල චිත්තයාගේ** හේතුවෙන් ආකාශානඤ්චායතන අරූප තල යෙහි ඉපිද හෝ මාර්ගඵල වඩා අර්හත්වයට පැමිණ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය වඩනා කල්හි හෝ පූර්වයෙහි වඩනා ලද එම **ආකාශානඤ්චායතන කුසල් සිත අරමුණු කොට, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත** උපදවා ගන්නේය. තවද, අර්හත්වයට පැමිණ වඩනාලද ආකාශානඤ්චායතන ක්‍රියා සිත් ඇති රහතන් වහන්සේ එම **ආකාශාණඤ්චායතන ක්‍රියා සිතම අරමුණු කොට විඤ්ඤාණඤ්චායතන ක්‍රියා** සිත උපදවා ගන්නේය.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත, ආකිඤ්චඤ්ඤායතන කුසල් සිතම** අරමුණු කරන්නේය.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත,** පූර්ව භවයෙහි දී වඩන ලද **ආකිඤ්චඤ්ඤායතන කුසල්** සිත සඞ්ඛ්‍යාත **කම්මනිමිත්ත** අරමුණු කොට උපදනා මරණාසන්න ජවනයන්ට අනතුරුව නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ප්‍රතිසන්ධිය ගෙනදෙන බැවින් අතීත භවයෙහි **ආකිඤ්චඤ්ඤායතන** කුසල සඞ්ඛ්‍යාත **කම්මනිමිත්තම අරමුණු** කරන්නේය.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා** සිත ඇතිවන්නේ රහතන් වහන්සේටය. අර්හත්වය ලැබීමට පෙර, මේ භවයෙහිදී හෝ අතීත භවයෙහිදී හෝ වඩනා ලද ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තයාගේ හේතුවෙන් ආකිඤ්චඤ්ඤායතන අරූප තලයෙහි ඉපිද හෝ මාර්ගඵල වඩා, අර්හත්වයට පැමිණ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය

වඩනා කල්හි ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත අරමුණුකොට, නෙව සඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිත උපදවාගන්නේය. තවද අර්හත්ව යට පැමිණ වඩනාලද ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිත් ඇති රහතන් වහන්සේ එම ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිතම අරමුණුකොට, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිත උපදවා ගන්නේය.

මේ අරූපාවචර සිත් සය මෙසේ මහග්ගතවූ අරූපාවචර සිත්ම අරමුණු කරත්. කාමාවචර, ලොකොත්තර, පඤ්ඤත්ති අරමුණු නොගනී.

නියත පඤ්ඤත්ති අරමුණුව ඇති සිත්

| | |
|---|---|
| රූපාවචර සිත් පසළොස | 15 |
| ආකාසානඤ්චායතන කුසල විපාක ක්‍රියා සිත් | 3 |
| ආකිඤ්චඤ්ඤායතන කුසල විපාක ක්‍රියා සිත් | 3 |
| | 21 |

මෙයින් රූපාවචර සිත් පසළොස, දසකසිණාදි කමටහන් නම්වූ පඤ්ඤත්ති අරමුණක්ම අරමුණු කරති.

ආකාසානඤ්චායතන කුසල, විපාක ක්‍රියා සිත් තුන ආකාශ ප්‍රඥප්තියම අරමුණු කරති.

ආකිඤ්චඤ්ඤායතන කුසල, විපාක ක්‍රියා සිත් තුන අභාව ප්‍රඥප්තියම අරමුණු කරති.

නියත ලොකොත්තර අරමුණු ඇති සිත්

ලෝකොත්තර මාර්ග සිත් සතරත්, ඵල සිත් සතරත් නිර්වාණයම අරමුණු කරත්.

## අනියත අරමුණු ඇති සිත්

**කාමාවචර, මහග්ගත, පඤ්ඤත්ති අරමුණු ඇති සිත් විස්සෙකි.**

එනම්

| | |
|---|---|
| **අකුසල් සිත් දෙළොස** | **12** |
| **ඤාණවිප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර** | **4** |
| **ඤාණවිප්‍රයුක්ත කාමාවචර ක්‍රියා සිත් සතර** | **4** |
| | **20** |

මේ විසි චිත්තයෝ අරමුණු නොකරන්නේ **ලොකොත්තර අරමුණු පමණය. ලෞකික ධර්ම**, එනම් **ලෞකික සිත් අසූඑකත්** එහි යෙදෙන **චෛතසික පනස්දෙකත්, රූප විසිඅටත්** යන ධර්ම සියල්ලම අරමුණු කරත්.

## අර්හත් මාර්ගඵල හැර සියළු අරමුණු ඇති සිත්

| | |
|---|---|
| ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර | 4 |
| අභිඥ වශයෙන් උපදවාගත් රූපාවචර පඤ්චම ධ්‍යාන කුසල් සිත | 1 |
| | 5 |

මේ සිත් පස, **අර්හත් මාර්ග සිතත්, අර්හත් ඵල සිතත්** හැර **ඉතිරි සිත් අසූ හතත්**, **චෛතසික පනස්දෙකත්, රූප විසිඅටත්, නිර්වාණයත්, ප්‍රඥප්තියත්**, යන මොවුන් අරමුණු කරති.

## සියළුම අරමුණු ඇති සිත්

| | |
|---|---|
| ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර | 4 |
| අභිඥ වශයෙන් උපදවාගත් පඤ්චමධ්‍යාන ක්‍රියා සිත | 1 |
| මනොද්වාරාවජ්ජන ක්‍රියා සිත | 1 |
| | **6** |

මේ සිත් සය, සියළුම ධර්මයන්, එනම්, **කාමාවචර, මහග්ගත, ලොකොත්තර, ප්‍රඥප්ති** ධර්මයන් අරමුණු කරත්. අරමුණු නොවන ධර්මයක් නැත.

### කාම ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරන සිත්

| | |
|---|---|
| අකුසල් සිත් දොළොස | 12 |
| මහා කුසල් සිත් අට | 8 |
| මහා ක්‍රියා සිත් අට | 8 |
| මනොද්වාරාවජ්ජන සිත | 1 |
| අභිඥ දෙසිත | 2 |
| | 31 |

මේ එක් තිස් චිත්තයෝ කාම ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරන්නාහුය.

### මහග්ගත ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරන සිත්

කාම ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරන සිත් එක්තිස් දෙනා මහග්ගත ධර්මයන්ද අනියත වශයෙන් අරමුණු කරන්නාහුය.

### ප්‍රඥප්ති ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරන සිත්

කාම ධර්මයන් හා මහග්ගත ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරන සිත් එක්තිස්දෙනාම ප්‍රඥප්ති ධර්මයන්ද අනියත වශයෙන් අරමුණු කරත්.

### ලොකොත්තර ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරන සිත්

| | |
|---|---|
| ඥාණ සම්ප්‍රයුක්ත මහ කුසල් සිත් සතර | 4 |
| ඥාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර | 4 |
| මනොද්වාරාවජ්ජන ක්‍රියා සිත | 1 |
| අභිඥ දෙසිත | 2 |
| | 11 |

මේ එකොළොස් චිත්තයෝ ලොකොත්තර ධර්මයන් අනියත වශයෙන් අරමුණු කරත්.

| | නියත | අනියත | එකතුව |
|---|---|---|---|
| කාමාවචර අරමුණු ඇති සිත් | 25 | 31 | 56 |
| මහග්ගත අරමුණු ඇති සිත් | 6 | 31 | 37 |
| ප්‍රඥප්ති අරමුණු ඇති සිත් | 21 | 31 | 52 |
| ලොකොත්තර අරමුණු ඇති සිත් | 8 | 11 | 19 |

**කාමාවචර කුසලයෝ,** තෘෂ්ණාව පෙරටුකොට ඇති බැවින් අර්හත් මාර්ග ඵලයන් අරමුණු කිරීමට අසමර්ථවෙති.

**ඥාණවිප්‍රයුක්ත කුසල ක්‍රියා සිත් අට,** ඥාණය නොයෙදන බැවින් ලොකොත්තර ධර්මයන් අරමුණු නොකරත්.

**ඥාණසම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සතරත් අභිඥා කුසලයත්** යන පස්දෙනා අර්හත්මාර්ගය, අර්හත්ඵලය හැර සියළුම ධර්මයන් අරමුණු කරත්. ඒ චිත්තයෝ පෘථග්ජන සහ ශෛක්ෂ සන්තාන යෙහි හටගනී. රහතන්ගේ සන්තානයෙහි හට නොගනී.

**මනොද්වාරාවජ්ජන සිත,** ඥාණයෙන් තොරව පවත්නේවී නමුත් **සර්වඥතාඥාන** ගති ඇත්තේ යයි කියති. **ඥාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා චිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥාව සර්වඥතාඥානය** නම් වේ. ඒ ක්‍රියා චිත්තයට පෙරටුව උපදනා **මනොද්වාරාවජ්ජන චිත්තයද** එම ක්‍රියා සිතට ඉතාම ආසන්න බැවින් **සර්වඥතාඥාන ගති** ඇත්තේ යයි කියති.

**කාමාවචර කුසල් සිත,** පෘථග්ජන සන්තානයෙහි උපදනේවී නමුත් **ඥාණසම්ප්‍රයුක්ත මහා කුසලයෝ සතර දෙනා** නිර්වාණය අරමුණු කිරීමට පොහොසත්වෙති. එයින්ද, **සොවාන්, සකෘදගාමී, අනාගාමී** යන **ආර්‍ය්‍ය පුද්ගලයන්** තුන්දෙනා කෙරෙහි පවත්නාවූ **මහා කුසලයෝ** නිර්වාණය අරමුණු කරන්නාහුවෙති. පෘථග්ජන සන්තානයෙහි පවත්නා ඥාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් අතුරෙන් **සොවාන් මාර්ග ඥානයට පළමුව හටගන්නාවූ ගොත්‍රභූ චිත්තයම නිවණ** අරමුණු කරයි. එම ගොත්‍රභූ සිත උපදනා කෙණෙහි හෙතෙම

පෘථග්ජනවූයේ නමුත්, එයට අනතුරුව උපදනා **සෝවාන් මාර්ග චිත්ත යෙන්** පසු හෙවත් **සෝවාන් ඵලක්ෂණයෙහිදී, සෝතාපන්න ආර්‍ය්‍ය පුද්ගලයා** නම්වේ.

# වස්තු සංග්‍රහය

වස්තූන්ගේ වශයෙන් චිත්ත චෛතසිකයන් බෙද දැක්වීම **වස්තු සංග්‍රහය** නම් වේ.

චිත්ත චෛතසිකයන්ගේ ඉපදීමට උපකාරවන ස්ථාන **වස්තු** නම් වේ. **නාමරූප දෙකින්** යුක්ත සත්ත්වයා පිළිබඳවූ **නාම ධර්මයෝ, රූප ධර්මයන්** ඇසුරු කොට ගෙනම පවතී. එයින් පිටත නාම ධර්මයන් නොපවත්නාහ. සතර අරූප තලයන්හි රූප කය නැතිව නාම ධර්මයන් පමණක් පහළ වන බැවින් ඒ නාම ධර්මයන් අවස්තුකව පහළවන්නාහ. කර්මය නිසා හටගන්නාවූ හෙවත් කර්මජවූද, **වස්තු නාමය** ලබන්නාවූද, ස්ථානයෝ සදෙනෙකි. එනම් **චක්ඛු වස්තුව, සෝත වස්තුව, ඝාණ වස්තුව, ජිව්හා වස්තුව, කාය වස්තුව සහ හදය වස්තුව** යන වස්තු සයයි.

**චක්ඛුප්‍රසාද** රූපයට, **චක්ඛුද්වාර** යයිද, චක්ඛු **වස්තුව** යයිද ව්‍යවහාරවේ. **චක්ඛුප්‍රසාද රූපය,** රූපාරම්මණයන්ගේ ඇතුල්වීමට උපකාරවන බැවින් **චක්ඛුද්වාරය** යයි කියනු ලැබේ. එයම චක්ඛු විඤ්ඤාණයාගේ ඉපදීමට ස්ථානවන බැවින් **චක්ඛු වස්තුව** යයි ද ව්‍යවහාරවේ.

මෙසේම **සෝතප්‍රසාද රූපය, සෝතවිඤ්ඤාණය** ඉපදීමට ස්ථාන වන බැවින් **සෝත වස්තුව යයිද,**

**ඝාණ ප්‍රසාදය, ඝාණ විඤ්ඤාණය** ඉපදීමට ස්ථාන වන බැවින් **ඝාණ වස්තුව** යයිද,

**ජිව්හා ප්‍රසාදය, ජිව්හා විඤ්ඤාණය** ඉපදීමට ස්ථානවන බැවින් **ජිව්හා වස්තුව** යයිද,

**කාය ප්‍රසාදය**, **කාය විඤ්ඤාණය** ඉපදීමට ස්ථානවන බැවින් **කාය වස්තුව** යයිද, කියනුලැබේ.

ද්විපඤ්ච විඤ්ඤාණයන් හැර, **මනොධාතු**, **මනො විඤ්ඤාණ ධාතු** නම්වූ ඉතිරි එකුන් අසූවක් (79) සිත් ඉපදීමට ස්ථානවූද, කර්ම යෙන් ජනිතවූද, පපුව මැද පිහිටි **හෘදයයයි** සම්මත අවයවය තුල පවත්නා ලේ ධාතුව හෙවත් ලෝහිතය ඇසුරුකොට ඇත්තාවූද. පටිසන්ධික්ෂණයේදී පහළ වූ වස්තු දසක රූප කලාපයට ඇතුළත් හදය වස්තු රූප පරම්පරාවට අයත් රූප ධර්මය **හදය වස්තුව** නම් වේ,

තවද සත්ත්වයෝ යම් රූපයක් කරණකොට ගෙණ අර්ථය හෝ අනර්ථය හො හදත් ද, පුරත් ද, එයට **හදය** යයි කියනු ලැබේ. එයම චිත්ත චෛතසික ධර්මයන් උපදින තැන් වන හෙයින් **හදය වස්තු යයි** කියති.

මේ ෂට් වස්තුහුට පරිපූර්ණායතන ඇත්තාවූ සත්ත්වයන් කෙරෙහි ම ඇත්තාහුය. සදෙව් ලොව, මිනිස් ලොව, සතර අපාය යන එකොළොස් කාම භූමියෙහි උපන්නාවූ, අඞ්ග විකලත්වයක් නැති සත්ත්ව යන්ට මේ වස්තු සයම නො අඩුව ම ලැබෙත්.

සොළොස් රූප ලෝක අතුරෙන් සතර නාමස්කන්ධය නැති රූපස්කන්ධය පමණක් පවත්නා **අසංඥතලයෙහි** එකම වස්තුවක් වත් නැත්තේය.

ඉතිරි **පසළොස් රූප ලොකයන්හි** වසන බ්‍රහ්මයන්ට **ඝ්‍රාණ**, **ජිව්හා**, **කාය** යන වස්තු තුන නො ලැබේ. **චක්ඛු**, **සොත**, **හදය** යන වස්තු තුන පමණක් ලැබේ. මෙයින් **චක්ඛු**, **සොත** යන වස්තු දෙකින් බුද්ධ දර්ශන, ධර්මශ්‍රවණාදි කුසල ධර්මයන් රැස් කළ හැකි වේ. **ඝ්‍රාණ, ජිව්හා, කාය** යන වස්තු ත්‍රයෙන් **ගන්ධ, රස, පොට්ඨබ්බ** යන ත්‍රිවිධ කාම ගුණ විඳීම පමණක් ඇතිවන හෙයින් ද, අන් කිසි කුසල යක් කළ නො හැකි බැවින්ද, රූපී බ්‍රහ්මයන්ට කාමයන්ගෙන් වෙන්ව පඤ්චකාමගුණ විඳීමට ඇති තෘෂ්ණාව නැති කොට කාම විරාග භාවනා කළබැවින් ද, **ඝ්‍රාණ, ජිව්හා, කාය** යන ප්‍රසාද වස්තු නො

ලැබෙන්නාහ. සම්පූර්ණ ඇස්, කන්, නාස, දිව, ශරීර ආදී අවයව යන් ඇත්තේ වී නමුත්, කාම සැපයට පමණක් උපකාරවන්නා වූද, බ්‍රහ්ම සම්පතට අනවශ්‍ය වූද, **ඝාණ ජිව්හා, කාය** යන ප්‍රසාද වස්තු තුන නො ලැබෙන බව දත යුතුයි.

**අරූපාවචර භූමි සතරෙහි** නාම කය මිස රූප කිසිවක් නැති බැවින් එකම වස්තුවක්වත් නො ලැබේ. එහි සිත් අවස්තුකව හටගන්නා බව දත යුතුයි.

## විඤ්ඤාණ ධාතු

**විඤ්ඤාණ** යනු සිතට නමෙකි. තමතමන්ට අයත් ස්වභාව ලක්ෂණය දරන්නේය යන අර්ථයෙන් **ධාතු** නම් වේ.

සිත් සියල්ලම විඤ්ඤාණ ධාතුන්ගේ වශයෙන් සතකට බෙදනු ලැබේ. එනම්:—

1. **චක්ඛු විඤ්ඤාණ ධාතු=චක්ඛු විඤ්ඤාණ සිත් දෙක**
2. **සොත විඤ්ඤාණ ධාතු=සොත විඤ්ඤාණ සිත් දෙක**
3. **ඝාණ විඤ්ඤාණ ධාතු=ඝාණ විඤ්ඤාණ සිත් දෙක**
4. **ජිව්හා විඤ්ඤාණ ධාතු=ජිව්හා විඤ්ඤාණ සිත් දෙක**
5. **කාය විඤ්ඤාණ ධාතු=කාය විඤ්ඤාණ සිත් දෙක**
6. **මනොධාතු =පඤ්චද්වාරවජ්ජනය සහ සම්පටිච්ඡන සිත් දෙක**
7. **මනො විඤ්ඤාණධාතු=ඉතිරි සිත් හැත්තෑ හය**

## නිශ්‍රය වස්තු.

යම් සිතක් යම් කිසි වස්තුවක් ඇසුරු කොට ගෙන පවතී ද එයට **නිශ්‍රය වස්තුව** යයි කියති. මේ අනුව සිත් සියල්ලම තුන් කොටසකට බෙදනු ලැබේ.

1. **වස්තුරූප ඇසුරුකොට ගෙනම පවතින සිත්**
2. **වස්තුරූප ඇසුරුකොට ගෙනද, නො ගෙනද පවතින සිත්**
3. **වස්තුරූප ඇසුරුකොට නො ගෙනම පවතින සිත්**

## වස්තුරූප ඇසුරුකොට ගෙනම පවතින සිත් 43

**චක්ඛු විඤ්ඤාණ ධාතු** 2=චක්ඛු වස්තුව නිශ්‍රය කොට ගෙනම පවතී.

**සොත විඤ්ඤාණ ධාතු** 2=සොත වස්තුව නිශ්‍රය කොට ගෙනම පවතී.

**ඝාණ විඤ්ඤාණ ධාතු** 2=ඝාණ වස්තුව නිශ්‍රය කොට ගෙනම පවතී.

**ජිව්හා විඤ්ඤාණ ධාතු** 2=ජිව්හා වස්තුව නිශ්‍රය කොට ගෙනම පවතී.

**කාය විඤ්ඤාණ ධාතු** 2=කාය වස්තුව නිශ්‍රය කොට ගෙනම පවතී.

**මනොධාතු** 3=හදය වස්තුව නිශ්‍රය කොට ගෙනම පවතී.

**මනොවිඤ්ඤාණ ධාතු** අතුරෙන්

| | | |
|---|---|---|
| **දෙස මූල සිත්** | 2 | හදය වස්තුව නිශ්‍රය කොට ගෙනම පවතී. |
| **සන්තීරණ සිත්** | 3 | |
| **හසිතුප්පාද සිත** | 1 | |
| **මහා විපාක සිත්** | 8 | |
| **රූපාවචර සිත්** | 15 | |
| **සොතාපත්ති මග්ග සිත** | 1 | |

## වස්තුරූප ඇසුරුකොට ගෙන හෝ නො ගෙන හෝ පවතින සිත් 42.

මේ සිත් දෙසාලිස කාම ලොක රූප ලෝක දෙකෙහි හදය **වස්තුව** ඇසුරු කොට ගෙනද, අරූප ලොකයෙහි හදය වස්තුව නැති **බැවින්** අවස්තුකව ද පවතී. එනම්:—

**මනොවිඤ්ඤාණ ධාතු** අතුරෙන්

| | |
|---|---|
| **ලොභමූල සිත් අට** | 8 |
| **මොහමූල සිත් දෙක** | 2 |
| **මනොද්වාරාවජ්ජන සිත** | 1 |

| | |
|---|---|
| මහා කුසල් සිත් අට | 8 |
| මහා ක්‍රියා සිත් අට | 8 |
| අරූපාවචර කුසල් සිත් සතර | 4 |
| අරූපාවචර ක්‍රියා සිත් සතර | 4 |
| සොතාපත්ති මග්ගසිත හැර | |
| ඉතිරි ලොකොත්තර සිත් සත | 7 |
| | 42 |

**වස්තු රූප ඇසුරුකොට නොගෙන පවතින සිත් 4 නම් අරූපාවචර විපාක සිත් සතරය.**

මේ සිත් සතර, සතර අරූපතලයෙහි ප්‍රතිසන්ධිය පමණක් ගෙන දෙන බැවින් අරූපතලවලම අවස්තුකව හටගනී.

**වස්තු රූප ඇසුරු කරන විඤ්ඤාණ ධාතු**

**කාම ලොකයෙහි** වස්තු සයම ඇසුරු කොට පවත්නා **විඤ්ඤාණ** ධාතු සතකි.

**රූප ලොකයෙහි** වස්තු තුනක් ඇසුරු කොට පවත්නා විඤ්ඤාණ ධාතු සතරකි. එනම් **චක්ඛු වස්තු, සොත වස්තු, හදය වස්තු** ඇසුරු කරන **චක්ඛුවිඤ්ඤාණ ධාතු, සොතවිඤ්ඤාණ ධාතු, මනො ධාතු, මනො විඤ්ඤාණ ධාතු,** යන මොහුය.

**අරූප ලොකයෙහි** වස්තු එකක්වත් නැති බැවින් අවස්තුකව **පවත්නා මනො විඤ්ඤාණ ධාතුව** පමණක් ලැබේ.

| වස්තු | කාම ලෝක | රූප ලොක | අරූප ලොක |
|---|---|---|---|
| චක්ඛු වස්තුව | 1 | 1 | — |
| සොත වස්තුව | 1 | 1 | — |
| ඝාණ වස්තුව | 1 | — | — |
| ජිව්හා වස්තුව | 1 | — | — |
| කාය වස්තුව | 1 | — | — |
| හදය වස්තුව | 1 | 1 | — |
| එකතුව වස්තු | 6 | 3 | 0 |
| **විඤ්ඤාණ ධාතු** | | | |
| චක්ඛු විඤ්ඤාණ ධාතු | 1 | 1 | — |
| සොත විඤ්ඤාණ ධාතු | 1 | 1 | — |
| ඝාණ විඤ්ඤාණ ධාතු | 1 | — | — |
| ජිව්හා විඤ්ඤාණ ධාතු | 1 | — | — |
| කාය විඤ්ඤාණ ධාතු | 1 | — | — |
| මනො ධාතු | 1 | 1 | — |
| මනො විඤ්ඤාණ ධාතු | 1 | 1 | 1 |
| එකතුව විඤ්ඤාණ ධාතු | 7 | 7 | 1 |

තෘතිය පරිච්ඡේදය නිමි.

# අභිධම්මත්ථ සඞ්ගහො

## චතුත්ථො පරිච්ඡෙදො

### වීථි සඞ්ගහ

1. චිත්තුප්පාදනමිච්චෙවං – කත්වා සඞ්ගහ මුත්තරං
හූමිපුග්ගල භෙදෙන – පුබ්බාපරනියාමිතං
පවත්ති සඞ්ගහංනාම – පටිසන්ධිප්පවත්තියං
පවක්ඛාමි සමාසෙන – යථා සම්භවතො කථං

2. ඡවත්ථූනි, ඡද්වාරානි, ඡආරම්මණානි, ඡවිඤ්ඤාණානි, ඡවීථියො, ඡධා විසයප්පවත්ති චෙති වීථිසඞ්ගහෙ ඡ ඡක්කානි වෙදිතබ්බානි.

3. වීථිමුත්තානං පන කම්ම, කම්මනිමිත්ත, ගතිනිමිත්ත වසෙන තිවිධා හොති විසයප්පවත්ති.

4. තත්ථ වත්ථුද්වාරාරම්මණානි පුබ්බෙ වුත්තනයානෙව.

5. චක්ඛු විඤ්ඤාණං, සොතවිඤ්ඤාණං, ඝාණ විඤ්ඤාණං, ජිව්හා විඤ්ඤාණං, කාය විඤ්ඤාණං, මනොවිඤ්ඤාණංචෙති ඡවිඤ්ඤාණානි.

6. ඡවීථියො පන චක්ඛුද්වාරවීථි, සොතද්වාරවීථි, ඝාණද්වාරවීථි, ජිව්හාද්වාර වීථි, කායද්වාරවීථි, මනොද්වාර වීථි චෙති ද්වාරව සෙනවා, චක්ඛුවිඤ්ඤාණ වීථි, සොත විඤ්ඤාණ වීථි, ඝාණවිඤ්ඤාණ වීථි, ජිව්හා විඤ්ඤාණ වීථි, කායවිඤ්ඤාණවීථි, මනො විඤ්ඤාණ වීථි චෙති විඤ්ඤාණ වසෙනවා ද්වාරප්පවත්තා චිත්තප්පවත්තියො යොජෙතබ්බා.

7. අතිමහන්තං, මහන්තං, පරිත්තං, අතිපරිත්තංචෙති පඤ්චද්වාරෙ. මනොද්වාරෙ පන, විභූතං, අවිභූතංචෙති ඡධාවිසයප්පවත්ති වෙදිතබ්බා.

8. කථං? උප්පාදට්ඨිතිභඞ්ග වසෙන ඛණත්තයං ඒකචිත්තක්ඛණං නාම.

9. තානිපන සත්තරස චිත්තක්ඛණානි රූප ධම්මානං ආයු.

10. එක චිත්තක්ඛණාතීතානිවා බහු චිත්තක්ඛණාතීතානිවා ඨිතිප්පත්තානෙව පඤ්චාරම්මණානි පඤ්චද්වාරෙ ආපාථමාගච්ඡන්ති යස්මා යදි එකචිත්තක්ඛණාතීතකං රූපාරම්මණං චක්ඛුස්ස ආපාථමාගච්ඡති. තතොද්වික්ඛත්තුං භවඞ්ගෙ චලිතෙ භවඞ්ගසොතං වොච්ඡින්දිත්වා, තමෙව රූපාරම්මණං ආවජ්ජෙන්ති, පඤ්චද්වාරාවජ්ජන චිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති. තතො තස්සාන්තරං තමෙව රූපං පස්සන්තං චක්ඛුවිඤ්ඤාණං, සම්පටිච්ඡන්තං සම්පටිච්ඡන චිත්තං සන්තීරයමානං සන්තීරණ චිත්තං වවත්ථපෙන්තං වොත්ථපන චිත්තං චෙති යථාක්කමං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති. තතොපරං එකූනතිංස කාමාවචරජවනෙසු යංකිඤ්චි ලද්ධප්පච්චයං යෙභුයොන සත්තක්ඛත්තුං ජවති. ජවනානු බන්ධා නිච ද්වෙ තදාරම්මණ පාකානි යථාරහං පවත්තන්ති. තතොපරං භවඞ්ගපාතො.

11. එත්තාවතා චුද්දස වීථිචිත්තුප්පාදා ද්වේ භවඞ්ගචලනානි පුබ්බෙවා තීතකමෙකචිත්තක්ඛණංති කත්වා සත්තරස චිත්තක්ඛණානි පරිපූරෙන්ති, තතො පරං නිරුජ්ඣන්ති. ආරම්මණ මෙතං අති මහන්තං නාමගොචරං

12. යාව තදලම්බනුප්පාදා පන අප්පහොන්තාතීතකමාපාථ මාගතං ආලම්බනං මහන්තං නාම. තත්ථ ජවනාවසානෙ භවඞ්ගපාතොවහොති. නත්ථි තදලම්බනුප්පාදෙ.

13. යාව ජවනුප්පාදාපි අප්පහොන්තාතීතකමාපාථමාගතං ආරම්මණං පරිත්තං නාම, තත්ථ ජවනම්පි අනුප්පජ්ජිත්වා ද්වත්තික්ඛත්තුං වොත්ථපන මෙව පවත්තති. තතොපරං භවඞ්ගපාතොව හොති.

14. යාව වොත්ථපනුප්පාදාව පන අප්පහොන්තාතීතකමාපාථ ගතං නිරොධාසන්නමාරම්මණං අතිපරිත්තංනාම. තත්ථ භවඞ්ගචලනමෙව හොති. නත්ථි වීථිචිත්තුප්පාදෙ.

15. ඉච්චෙවං චක්ඛුද්වාරෙ තථා සොතද්වාරාදීසු චෙති. සබ්බථාපි පඤ්චද්වාරෙ තදලම්බන ජවන වොත්ථපන මොඝවාර සඞ්ඛාතානං චතුණ්ණං වාරානං යථාක්කමං අලම්බනභූතා විසයප්පවත්ති චතුධා වේදිතබ්බා.

16. වීථිචිත්තානි සත්තෙව – චිත්තුප්පාදචතුද්දස.
චතුපඤ්ඤාස විත්ථාරා – පඤ්චද්වාරෙ යථාරහං.
අයමෙත්ථ පඤ්චද්වාරෙ වීථිචිත්තප්පවත්ති නයො

17. මනොද්වාරෙපන යදි විභූතමාලම්බනං ආපාථමාගච්ඡති-තතොපරං භවඞ්ගචලන මනොද්වාරාවජ්ජන ජවනාවසානෙ තදරම්මණපාකානිපවත්තන්ති. තතො පරං භවඞ්ග පාතො.

18. අවිභූතෙ පනාලම්බනෙ ජවනාවසානෙ භවඞ්ග පාතොව හොති. නත්ථි තදරම්මණුප්පාදෙති.

19. වීථිචිත්තානි තීණෙව – චිත්තුප්පාද දසෙරිතා,
විත්ථාරෙන පනෙත්ථෙක – චත්තාලීස විභාවයෙ
අයමෙත්ථ පරිත්තජවනවාරො-

20. අප්පණා ජවන වාරෙ පන විභූතාවිභූතභෙදෙ නත්ථි තථා-තදලම්බනුප්පාදෙව.

21. තත්ථහි ඤාණ සම්පයුත්ත කාමාවචර ජවනානමට්ඨන්නං අඤ්ඤතරස්මිං පරිකම්මොපචාරානුලොම ගොත්‍රභූ නාමෙන චතුක්කත්තුංතික්ඛත්තුමෙවවා යථාක්කමං උප්පජ්ජිත්වා නිරුද්ධෙ තදනනත්තර මෙව යථාරහං චතුත්ථං පඤ්චමංවා ඡබ්බීසති මහග්ගත ලොකුත්තර ජවනෙසු යථාභිනිහාරවසෙන යංකිඤ්චි ජවනං අප්පණා වීථිමොතරති. තතොපරං අප්පණාවසානෙ භවඞ්ගපාතොහොති.

22. තත්ථ සොමනස්ස සහගත ජවනානන්තරං අප්පණාපි සොමනස්සසහගතාව පාටිකඞ්ඛිතබ්බා. උපෙක්ඛා සහගත ජවනානන්තරං උපෙක්ඛා සහගතාව.

23. තත්ථාපි කුසලජවනානන්තරං කුසල ජවනංචෙව හෙට්ඨිමංච ඵලත්තයමප්පෙති, කිරියා ජවනානන්තරං කිරියා ජවනං අරහත්තඵලංචාති.

24. ද්වත්තිංස සුඛපුඤ්ඤම්හා – ද්වා දසොපෙක්ඛකා පරං
සුඛිතක්‍රියතො අට්ඨ – ඡ සම්භොන්ති උපෙකඛකා

25. පුථුජ්ජනාන සෙක්ඛානං – කාම පුඤ්ඤතිහෙතුතො
තියහෙතුකාමක්‍රියතො – වීතරාගාන මප්පණා
අයමෙත්ථ මනොද්වාරෙ වීථි චිත්තප්පවත්තිනයො-

26. සබ්බත්ථාපි පනෙත්ථ අනිට්ඨෙ ආරම්මණෙ අකුසලවිපාකානෙව පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදරම්මණානි.

27. ඉට්ඨෙ කුසල විපාකානි.

28. අතිඉට්ඨෙ පන සොමනස්ස සහගතා නෙව සන්තීරණ තදරම්මණානි.

29. තත්ථාපි සොමනස්ස සහගත කිරියජවනාවසානෙ සොමනස්ස සහගතානෙව තදරම්මණානි භවන්ති.

30. උපෙක්ඛා සහගත කිරිය ජවනාවසානෙ උපෙක්ඛාසහගතානෙවහොන්ති.

31. දොමනස්ස සහගත ජවනාවසානෙවපන තදරම්මණානි චෙව භවඞ්ගානිච උපෙක්ඛා සහගතා නෙව භවන්ති. තස්මා යදි සොමනස්ස පටිසන්ධිකස්ස දොමනස්ස ජවනාවසානෙ තදරම්මණ සම්භවො නත්ථි. තදා යං කිඤ්චි පරිචිතපුබ්බං පරිත්තාරම්මණමාරබ්භ උපෙක්ඛා සහගත සන්තීරණං උප්පජ්ජති. තමනන්තරිත්වා භවඞ්ගපාතොව හොතීති වදන්ති ආචරියා.

32. තථාකාමාවචර ජවනාවසානෙ කාමාවචර සත්තානං කාමාවචර ධම්මෙ ස්වෙව ආරම්මණභූතෙසු තදරම්මණං ඉච්ඡන්තීති.

33. කාමෙජවන සත්තා – ලම්බනානං නියමෙසති.
විභූතෙති මහන්තෙච – තදාලම්බන මීරිතං
අයමෙත්ථ තදාලම්බන නියමො

34. ජවනෙසුච පරිත්තජවන වීථියං කාමාවචර ජවනානි සත්තක්ඛත්තුං ඡක්ඛත්තුමෙව වා ජවන්ති.

35. මන්දප්පවත්තියං පන මරණ කාලාදිසු පඤ්චවද්වාරමෙව.

36. භගවතො පන යමක පාටිහාරිය කාලාදිසු ලහුකප්පවත්තියං චත්තාරි පඤ්චවා පච්චවෙක්ඛණ චිත්තානි භවන්ති තිපි වදන්ති.

37. ආදිකම්මිකස්ස පන පඨමකප්පණායං මහග්ගත ජවනානි අභිඤ්ඤා ජවනානි ච සබ්බදපි එකවාරමෙව ජවන්ති. තතො පරං භවඞ්ගපාතො.

38. චත්තාරොපන මග්ගුප්පාද එකචිත්තක්ඛණිකා තතොපරං ද්වෙතීණි ඵල චිත්තානි යථාරහං උප්පජ්ජන්ති. තතොපරං භවඞ්ග පාතො.

39. නිරොධ සමාපත්ති කාලෙ ද්වික්ඛත්තුංචතුත්ථාරුප්පජවනං ජවති, තතො පරං නිරොධං ඵුසති. වුට්ඨාන කාලෙච අනාගාමි ඵලංවා අරහත්තඵලංවා යථාරහමෙකවාරං උප්පජ්ජිත්වා නිරුද්ධෙ භවඞ්ග පාතොංච හොති.

40. සබ්බත්ථාපි සමාපත්තිවීථියං භවඞ්ග සොතො විය වීථිනිය මො නත්ථීති කත්වා බහුනිපි ලබ්භන්තීති.

41. සත්තක්ඛත්තුං පරිත්තානි – මග්ගාභිඤ්ඤාසකිංමතා
අවසෙසානිලබ්භන්ති – ජවනානි බහූනිපි
අයමෙත්ථ ජවන නියමො

42. දුහෙතුකානමහෙතුකානංච පනෙත්ථ කිරියජවනානි චෙව අප්පණාජවනානිච නලබ්භන්ති.

43. තථා ඤාණ සම්පයුත්ත විපාකානිච සුගතියං

44. දුග්ගතියං පන ඤාණ විප්ප යුත්තානිච මහවිපාකානි නලබ්භන්ති.

45. තිහෙතුකෙසුච ඛීණාසවානං කුසලාකුසල ජවනානි නලබ්භන්ති.

46. තථා සෙක්ඛ පුථුජ්ජනානං කිරියජවනානි.

47. දිට්ඨිගත සම්පයුත්ත විචිකිච්ඡා ජවනානිච සෙක්ඛානං

48. අනාගාමි පුග්ගලානං පන පටිඝජවනානිච නලබ්භන්ති.

49. ලොකුත්තර ජවනානිච යථාසකං අරියානමෙව සමුප්පජ්ජන්තීති.

50. අසෙක්ඛානං චතුචත්තා – ළීස සෙක්ඛාන මුද්දිසෙ
ඡප්පඤ්ඤාසාවසෙසානං – චතුපඤ්ඤාස සම්භවා.
අයමෙත්ථ පුග්ගලභෙදෙ

51. කාමාවචර භූමියං පනෙතානි සබ්බානිපි වීථි චිත්තානි යථා-රහමූපලබ්භන්ති.

52. රූපාවචර භූමියං පටිසජවන තදරම්මණ වජ්ජිතානි.

53. අරූපාවචර භූමියං පඨමමග්ගරූපාවචරහසන හෙට්ඨිමාරුප්ප-වජ්ජිතානිච ලබ්භන්ති.

54. සබ්බත්ථාපිච තංතං පසාදරහිතානං තං තං ද්වාරික වීථිචිත්තා-නිනලබ්භන්තෙව.

55. අසඤ්ඤසත්තානං පන සබ්බථාපි චිත්තප්පවත්ති නත්ථෙවාති.

56. අසීති වීථි චිත්තානි – කාමෙ රූපෙ යථාරහං
චතුසට්ඨීතථාරූපෙ –ද්වෙ චත්තාලීස ලබ්භරෙ
අයමෙත්ථ භූමිවිභාගො

57. ඉච්චෙවං ඡද්වාරික චිත්තප්පවත්ති යථා සම්භවං භවඞ්ගන්තරිතා යාවතායුකමබ්බොච්ඡින්නා පවත්තති.

ඉතිඅභිධම්මත්ථ සඞ්ගහෙ වීථි සඞ්ගහ විභාගොනාම
චතුත්ථො පරිච්ඡෙදෙ.

# අභිධම්මාර්ථ සංග්‍රහය

## චතුර්ථ පරිච්ඡේදය

(භාවය)

### වීථිසඞ්ග්‍රහය

1. මෙසේ චිත්තයන් ගේ ප්‍රකීර්ණක සංග්‍රහය කොට අනතුරුව භූමි පුද්ගල භෙදයෙන් පෙර පසු සිත් විසින් නියම කරණ ලද්දවූ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන්හි චිත්තයන්ගේ ප්‍රවෘත්ති සංග්‍රහ නම් වූ මෙය සම්භවන පරිද්දෙන් ප්‍රකාශ කරන්නෙමි.

2. වස්තුසයය, ද්වාර සයය, අරමුණු සයය, විඤ්ඤාණ සයය, වීථි සයය, විෂය ප්‍රවෘත්ති සයය යන වීථි සංග්‍රහයෙහි ෂට්ක සයක් දත යුත්තාහ.

3. වීථි මුක්ත චිත්තයන් ගේ විෂය ප්‍රවෘත්තිය කම්ම, කම්ම නිමිති, ගතිනිමිති යන මොවුන්ගේ වශයෙන් ත්‍රිවිධ වෙයි.

4. එහි වස්තු ද්වාර, ආරම්මණයෝ පෙර කියන ලද පරිදිමය

5. චක්ඛු විඤ්ඤාණය, සොතවිඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනොවිඤ්ඤාණය යයි විඤ්ඤාණයෝ සදෙනෙකි.

6. වීථි සය නම් චක්ඛුද්වාර වීථි, සොතද්වාර වීථි, ඝාණද්වාර වීථි, ජිව්හාද්වාරවීථි, කායද්වාරවීථි, මනොද්වාරවීථි, යයි ද්වාර වශයෙන් හෝ චක්ඛුවිඤ්ඤාණ වීථි, සොත විඤ්ඤාණ වීථි, ඝාණ විඤ්ඤාණ වීථි, ජිව්හා විඤ්ඤාණ වීථි, කාය විඤ්ඤාණ වීථි, මනො විඤ්ඤාණ වීථි යයි විඤ්ඤාණයන් ගේ වශයෙන් හෝ ද්වාරයන් හි පැවැති චිත්ත වීථි හු යෙදිය යුත්තාහ.

7. පඤ්චද්වාරයෙහි අතිමහන්ත, මහන්ත, පරිත්ත, අතිපරිත්ත යයිද, මනොද්වාරයෙහි විභූත, අවිභූත යයිද සය ආකාර විෂය ප්‍රවෘත්තිය දත යුත්තාහ.

8. කෙසේද, උත්පාද, ඨිති, භඞ්ග වශයෙන් ක්ෂණත්‍රයක් එක චිත්තක්ෂණයක්වේ.

9. එබඳු චිත්තක්ෂණ සතළොසක් රූපධර්මයන්ගේ අයු ප්‍රමාණය වේ.

10. එක් චිත්තක්ෂණයක් ඉක්මුනාවූ හෝ බොහෝ චිත්තක්ෂණ යන් ඉක්මුනාවූ හෝ ස්ථිතිප්‍රාප්තවූ ම පඤ්චාරම්මණයෝ පඤ්චද්වාරයට හමුවෙති. එහෙයින් එක් චිත්තක්ෂණයක් ඉක්මුනාවූ රූපාරම්මණයක් ඇසට හමුවන්නේ නම් ඉන් පසු දෙවරක් භවඞ්ගය සෙල වුණු කල්හි ඒ භවඞ්ග ප්‍රවාහනය සිඳගෙන ඒ රූපාරම්මණයම මෙනෙහි කරමින් පඤ්චද්වාරාවජ්ජන චිත්තය ඉපිද නිරුද්ධ වෙයි. ඉන් පසු එයට අනතුරුව එම රූපය දක්නා වූ චක්ඛු විඤ්ඤාණයද, එය පිළිගන්නාවූ සම්පටිච්ඡන චිත්තයද, තීරණය කරන්නාවූ සන්තීරණ චිත්තයද, නියම කරන්නාවූ වොත්ථපන චිත්ත යද, පිළිවෙලින් ඉපිද නිරුද්ධ වෙත්. ඉන්පසු එකුන් තිස් කාමාවචර ජවනයන් අතුරෙන් ලබන ලද ප්‍රත්‍යය ඇති, ජවනයක් බොහෝ සෙයින් සත්වරක් දුවයි. ජවනයට අනුව යන විපාක දෙසිතක් ද සුදුසු පරිදි උපදිත්. අනතුරුව භවඞ්ග පාතය වේ.

11. මෙතෙකින් වීථි සිත් තුදුසක්ද භවඞ්ගචලන දෙකක්ද, පූර්වයෙහි ඉක්මුනාවූ එක් චිත්තක්ෂණයක් දැයි මෙසේ චිත්තක්ෂණ සතළොසක් සම්පූර්ණ වෙත්. ඉන්පසු අරමුණ නිරුද්ධවන්නේය. මේය අතිමහන්තාරම්මණ නම් වේ.

12. තදාරම්මණයන් උපදවන්නට නොහැකිව ඉක්මගිය ආයු ඇතිව අභිමුඛවූ අරමුණ මහන්තාරම්මණ නම් වේ. එහි ජවනාවසාන යෙහි භවාඞ්ගපතනයවේ. තදාලම්බනයන්ගේ ඉපදීමක් නැත.

13. ජවන් උපදවන්නට නොහැකිව ඉක්ම ගිය ආයු ඇතිව අභිමුඛ වූ අරමුණ පරිත්තාරම්මණ නම් වේ. එහි ජවනයද නොයිපිද වොත්ථපනයම දෙතුන්වරක් උපදී. ඉන්පසු භවඞ්ගපතනය වේ.

14. වොත්ථපනය උපදිනතෙක් නො පැවැති, ඉක්මගිය ආයු ඇතිව අභිමුඛවූ නිරුද්ධවන්නට ආසන්න වූ අරමුණ අතිපරිත්තා-රම්මණ නම් වේ. එහි භවඞ්ග චලනයම වේ. වීථි චිත්තයන් ගේ ඉපදීමක් නැත.

15. මේ ක්‍රමයෙන් චක්ඛුද්වාරයෙහිද එසේම සොතද්වාරාදීන් හිදුයි සර්ව ප්‍රකාරයෙන් පඤ්චද්වාරයෙහි තදලම්බන, ජවන, වොත්ථ පන, මොඝවාර සඞ්ඛ්‍යාත සතරවාරයන්ට පිළිවෙලින් අරමුණුවූ විසයප්පවත්තිය සතර ආකාරයකින් දතයුත්තීය.

16. පඤ්චද්වාරයෙහි සුදුසු පරිදි උපදනා වීථි සිත් සතක්ම වෙත්. චිත්තුප්පාදයෝ තුදුසෙක් වෙත්. විස්තර වශයෙන් සිව් පනසෙක් වෙති.

**මෙය මේ පඤ්චද්වාරයෙහි වීථිචිත්ත ප්‍රවෘත්ති ක්‍රමයයි**

17. මනොද්වාරයෙහි වනාහී ඉදින් විභූතාලම්බනයක් හමුවෙයිද ඉන් පසු භවඞ්ගචලන, මනොද්වාරාවජ්ජන, ජවනයන්ගේ අවසාන යෙහි තදරම්මණ විපාකයෝ උපදිත්. ඉන්පසු භවාඞ්ග පාතය වේ.

18. අවිභූතාලම්බනයෙහි වනාහී ජවනයන්ගේ අවසානයෙහි භවඞ්ගපාතයම වේ. තදරම්මණයන්ගේ ඉපදීමෙක් නැත.

19. මෙහි වීථි සිත් තුනෙක. චිත්තුප්පාදයෝ දසයෙක. විස්තර වශයෙන් සිත් එක්සාළිසෙක් යයි කියනු ලැබේ.

**මෙය මෙහි කාමාවචර ජවනවාරයයි**

20. අර්පණාජවන වාරයෙහි වනාහි විභූත අවිභූත භෙදයක් නැත. එසේම තදලම්බනයන්ගේ ඉපදීමෙක් ද නැත.

21. එහි ඤාණ සම්ප්‍රයුක්ත කාමාවචර ජවන් අටදෙනා අතුරෙන් එක්තරා ජවනයක් පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූනාම යෙන් සතරවරක් හෝ තුන් වරක් හෝ පිළිවෙලින් ඉපිද නිරුද්ධ වූ කල්හි එයට අනතුරුව සුදුසු පරිද්දෙන් සතර වැනිව හෝ පස් වැනිව හෝ සවිසි මහග්ගත ලොකොත්තර ජවනයන් අතුරෙන් යම් කිසි ජවනයක් අභිනීහාරයාගේ වශයෙන් අර්පණා වීථියට බැසගනී. එයින් පසු අර්පණාවගේ අවශානයෙහි භවඞ්ග පාතය වේ.

22. එහි සොමනස්ස සහගත ජවනයන්ට අනතුරුව උපදනා අර්පණාජවනයෝද සොමනස්ස සහගතම වෙත්යයි සැළකිය යුත්තාහ. උපෙක්ෂා සහගත ජවනයන්ට අනතුරුව උපෙක්ෂා සහගත අර්පණා ජවනයෝ ම වෙත්.

23. එහි ද මහා කුසල ජවනයන්ට අනතුරුව කුසල ජවනයෝද් යට ඵල ජවනතුණද අර්පණා වශයෙන් උපදී. මහා ක්‍රියා ජවනයන්ට අනතුරුව කිරිය ජවනයද අර්හත් ඵල ජවනයද අර්පණා වශයෙන් උපදී.

24. සොමනස්සසහගත ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල ජවනයන්ට අනතුරුව අර්පණා ජවන් දෙතිසෙක් ද, උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල ජවනයන්ට අනතුරුව අර්පණාජවන් දෙළොසෙක් ද, සොමනස්ස සහගත මහා ක්‍රියා ජවනයන්ට අනතුරුව අර්පණා ජවන් අටෙක් ද, උපෙක්ඛා සහගත මහා ක්‍රියාජවනයන්ට අනතුරුව අර්පණා ජවන් සයෙක් ද ලැබෙති.

25. පෘථග්ජනයන්ගේ හා ශෛක්ෂයන්ගේ ද ත්‍රිහේතුක කාම කුසලයන්ට අනතුරුව ද, රහතන්වහන්සේගේ ත්‍රිහේතුක කාම ක්‍රියාවන්ට අනතුරුවද අර්පණා ජවන් ලැබෙති.

**මෙය මේ මනොද්වාරයෙහි වීථි සිත් උපදනා ක්‍රමයයි**

26. මේ සියලු වාරයන්හි අනිෂ්ඨාරම්මණයෙහි පඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන, සන්තීරණ තදරම්මණයෝ අකුසල විපාකයෝ ම වෙත්.

27. ඉෂ්ඨාරම්මණයෙහි කුසල විපාකයෝම වෙත්.

28. අති ඉෂ්ඨාරම්මණයෙහි සොමනස්ස සහගත සන්තීරණ තදරම්මණයෝ වෙත්.

29. එහි ද සොමනස්සසහගත ක්‍රියා ජවනාවසානයෙහි සොමනස්ස සහගත තදරම්මණයෝම ලැබෙත්.

30. උපෙක්ඛා සහගත ක්‍රියා ජවනාවශානයෙහි උපෙක්ෂා සහගත තදරම්මණ වෙත්.

31. දොම්නස් සහගත ජවනයන් ගේ අවශානයෙහි තදලම්බන යෝද, භවඞ්ගයෝ ද, උපෙක්ඛා සහගතම වෙත්. එහෙයින් සොම-නස්ස ප්‍රතිසන්ධිකයාහට දෞමනස්ස ජවනාවශානයෙහි තදරම්මන යන්ගේ ලැබීමෙක් නැත. එකල්හි පෙර පුරුදු කරන ලද කිසි කාමාවචර ආලම්බනයක් අරමුණු කොට උපෙක්ඛා සහගත සන්තී-

රණය උපදී. එයට අනතුරුව ස්වකීය භවඞ්ගයම පතනය වේ යයි ආචාය්‍යීයෝ පවසත්.

32. එසේම කාමාවචර ජවනාවශානයෙහි කාමාවචර සත්ත්වයන් හටම කාමාවචර ධර්මයන් අරමුණු වූ කල්හිම තදරම්මණය කැමති වෙත්.

33. කාමභවයෙහි ජවන, සත්ත්ව, ආලම්බන යන මොවුන්ගේ නියමයක් ඇති කල්හි විභූතාලම්බනයෙහිද අතිමහන්තාලම්බනයෙහිද තදලම්බනය කියන ලදී.

### මෙය මෙහි තදරම්මණ නියම යයි

34. ජවනයන් අතුරෙන් කාමජවන වීථියෙහි කාමාවචරජවන යෝ සත්වරක් හෝ සයවරක් හෝ දුවත්.

35. මරණාසන්න කාලයෙහිදී වේගය මදව පවත්නා විට පස් වරක්ම දුවත්.

36. භාග්‍යවතුන්වහන්සේට යමක ප්‍රාතිහාය්‍යී කාලාදියෙහි වේගය සිඝ්‍රව පවත්නා විට් සතරක් හෝ පසක් හෝ ප්‍රත්‍යවෙක්ෂාජවන් සිත් වෙත්යයි කියති.

37. ආදි කර්මිකයාහට වනාහී ප්‍රථම අර්පණායෙහිදී මහග්ගත ජවනයෝ එක්වරක්ම උපදිත්. අභිඥා ජවනයෝද හැම කල්හිම එක්වරක්ම උපදිත්. එයින් පසු භවඞ්ග පාතය වේ.

38. මාර්ග චිත්තුප්පාදයෝ සතර දෙන එකචිත්තක්ෂණිකයහ. එයින් පසු සුදුසු පරිදි ඵලසිත් දෙකක් හෝ තුනක් උපදිත්. ඉන්පසු භවඞ්ග පාතය වේ.

39. නිරොධ සමවතට පැමිණෙන කල්හි සතර වැනි අරූප ජවනය දෙවරක් දුවයි. එයින් පසු නිරොධය වේ. සමවතින් නැගෙන කල්හි ද අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ සුදුසු පරිද්දෙන් එක්වරක් ඉපිද නිරුද්ධවූ කල්හි භවාඞ්ග පාතය වේ.

40. සියලුම සමාපත්ති වීථියෙහි භවාඞ්ග පරම්පරාව මෙන් වීථි සිත් නියමයක් නොකොට බොහෝවූ ජවනයෝ ලැබෙත්.

41. කාමජවනයෝ සත්වරක් ද මාර්ග අභිඥජවනයෝ එක් වරක්ද සෙසු ජවනයෝ බොහෝ වාරයක්ද ලැබෙත්.

### මෙය මෙහි ජවන නියමයයි

42. දුහෙතුක අහේතුක පුද්ගලයන්ට ක්‍රියා හා අර්පණා ජවනයෝ නො ලැබෙත්.

43. සුගතියෙහි ඤාණ සම්ප්‍රයුක්ත විපාකයෝද එසේම නො ලැබෙත්.

44. දුගතියෙහි ඤාණවිප්‍රයුක්ත මහාවිපාකයෝද නොලැබෙත්,

45. ත්‍රිහේතුක පුද්ගලයන් අතුරෙන් රහතන්වහන්සේට කුසලාකුසල ජවන් නොලැබෙත්.

46. එසේම ශෛක්ෂයන්ට හා පෘථග්ජනයන්ටද ක්‍රියාජවන් නො ලැබෙත්.

47. ශෛක්ෂයන්හට දිට්ඨිගත සම්ප්‍රයුක්ත ජවන් හා විචිකිච්ඡා ජවන්ද නොලැබෙත්.

48. අනාගාමී පුද්ගලයන්හට පටිඝජවන් නොලැබෙත්.

49. ලොකොත්තර ජවනයෝ ආර්‍ය්‍යයන්ටම තම තමන්ට අයත් පරිදි උපදනාහ.

50. රහතන්වහන්සේට සිව්සාළිසෙක්ද ශෛක්ෂයන්ට සපණසෙක්ද සෙසු පෘථග්ජනයන්ට සිව්පණසෙක්ද ලැබෙන පරිදි දක්වන ලදී.

### මෙය මෙහි පුද්ගල භෙදයයි

51. කාමාවචර භූමියෙහි මේ සියලු විථි සිත් සුදුසු පරිද්දෙන් ලැබෙත්.

52. රූපාවචර භූමියෙහි පටිඝජවන් තදරම්මණයන් හැර ඉතිරි විථිසිත් ලැබෙත්.

53. අරූපාවචර භූමියෙහි ප්‍රථම මාර්ග සිතය, රූපාවචර සිත්ය, හසිතුප්පාදය, යට අරූපාවචර සිත්ය යන මොවුන් හැර සෙසු සියලු වීථි චිත්තයෝ ලැබෙත්.

54. සියළුම භූමින්හි ඒ ඒ ප්‍රසාද රූප රහිතවූවන්ට ඒ ඒ ද්වාරික වීථි සිත් නොලැබෙත්මය.

55 අසඤ්ඤසත්ත්ව පුද්ගලයන්ට සර්වප්‍රකාරයෙන්ම සිත් පැවැත්මෙක් නැත.

56. කාමභූමියෙහි විථි සිත් අසූවක්ද, රූපභූමියෙහි සිව් සැටක්ද, අරූපභූමියෙහි දෙසාළිසක්ද සුදුසු පරිද්දෙන් ලැබෙති.

**මෙය මෙහි භූමිවිභාගයයි**

57. මෙසේ සදෙරෙහිවූ වීථි සිත් පැවැත්ම සුදුසු පරිදි භවඞ්ග යෙන් පිරිසිඳිනු ලැබ ආයු ඇතිතෙක් නොසිඳ පවත්නේය.

මෙසේ අභිධර්මාර්ත්ථ සඞ්ග්‍රහයෙහි විථිසංග්‍රහ විභාග නම් වූ
චතුර්ත්ථ පරිච්ඡේදය නිමි.

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## චතුර්ථ පරිච්ඡේදය

### වීථි සංග්‍රහ විභාගය

ලොකව්‍යවහාර වශයෙන් මිනිසුන්ගේ ගමන මාර්ගයට **වීථි** යයි කියනු ලැබේ. චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය ද, මේ ගමන මාර්ගය වැනි හෙයින් **වීථි** යන නාමයෙන් ව්‍යවහාර වේ. තවද, ආවර්ජ නාදි අනෙක චිත්ත පරිපාටිය කරණකොටගෙණ සිත් එකිනෙක ගැටීම යන අර්ථයෙන්ද, නොයෙක් ආකාරවූ චිත්ත පරිපාටිය සදෙ රෙහි හටගනියි යන අර්ථයෙන්ද, චිත්ත සන්තානයාගේ පැවතීම යන අර්ථයෙන්ද, **වීථි** නම් වේ. එබැවින් සදෙරින් යම්කිසි එක් ද්වාරයකින් ගත් අරමුණක් එල්බගෙණ අතරක් නැතිව පිළිවෙලින් උපදින යම් සිත් පෙළක් වේද, එයට **චිත්ත වීථිය** යයි කියති.

### ෂට්ක සය

**චිත්ත වීථි** පිළිබඳව මනා දැනීමක් ඇති කර ගැණීමට **ෂට්ක සය** දැනගත යුතුයි. **ෂට්ක සය** නම්:—

**1. වස්තු සය, 2. ද්වාරසය, 3; අරමුණු සය, 4 විඤ්ඤාණ සය, 5, වීථි සය, 6. විෂය ප්‍රවෘත්ති සය යි.**

සදෙරින් ගන්නාලද යම් අරමුණක් එල්බ ගෙණ සිත් පෙළක් ඇතිවීමේදී අසුවල් සිත, **චක්ඛු**, **සොත**, **ඝාණ**, **ජිව්හා**, **කාය**, **හදය**, යන **වස්තු** සය අතුරෙන් අසුවල් **වස්තුව** ඇසුරුකොට ගෙණ උපද නේය, ඒ සිත **චක්ඛු**, **සොත**, **ඝාණ**, **ජිව්හා කාය**, **මන** යන **ෂට් ද්වාර** **යන්** අතුරෙන් අසුවල් **ද්වාරයට** අයත්ය, ඒ සිත **රූප**, **ශබ්ද**, **ගන්ධ** **රස**, **පොට්ඨබ්බ**, **ධම්ම** යන **සයාරම්මණයන්** අතුරෙන් අසුවල් **අරමු** **ණෙහි** එල්බගෙණ උපදනේය, ඒ සිත, **චක්ඛු විඤ්ඤාණ**, **සොත** **විඤ්ඤාණ**, **ඝාණ විඤ්ඤාණ**, **ජිව්හා විඤ්ඤාණ**. **කාය විඤ්ඤාණ**, **මනො විඤ්ඤාණ**, යන **විඤ්ඤාණ සයෙන්** අසුවල් **විඤ්ඤාණයක්ය**

ඒ සිත **චක්ඛුද්වාර වීථි, සොතද්වාර වීථි, ඝාණද්වාර වීථි, ජිව්හා ද්වාර වීථි. කායද්වාර වීථි, මනොද්වාර වීථි** යන වීථි සය අතුරෙන් අසුවල් **චිත්ත වීථියට** අයත්ය, ඒ සිතෙහි අරමුණ, **අතිමහන්තය, මහන්තය, පරිත්තය, අතිපරිත්තය, විභූතය, අවිභූතය** යන **විෂය ප්‍රවෘත්ති සයෙන්** අසුවල් ආකාරයෙන් සිතට වැටහෙන්නේයයි ද දැනගත යුතුව තිබේ.

මේ **ෂට්ක** සය අතුරෙන් **වස්තු සය, ද්වාර සය, අරමුණු සය** සහ **විඤ්ඤාණ සයද** මෙයට පෙර විස්තර කරනලදී. එබැවින් දැන් **වීථි සයත්, විෂය ප්‍රවෘත්ති සයත්** විස්තර කරණු ලැබේ.

## පඤ්චද්වාර චිත්ත වීථි

චිත්තයන්ගේ පහළවීමට උපකාරවන, ආරම්මණයන්ගේ ඇතුල් වීම සිදුකරන්නාවූ ද්වාරයන්ගේ වශයෙන් **චිත්ත වීථි** ද්විප්‍රකාර වේ. එනම්:—**පඤ්චද්වාර වීථි** හා **මනොද්වාර වීථි** යනුයි.

**චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය** යන **ද්වාර පසට** වැටුණු අරමුණු එල්බගෙණ පවත්නා චිත්ත සන්තතිය හෙවත්. සිත් පෙළ **පඤ්චද්වාර චිත්ත වීථි** නම් වේ.

**මනොද්වාරයට** වැටුණු **ධම්මාරම්මණයක්** එල්බගෙණ පවත්නා චිත්ත සන්තතිය හෙවත් සිත්පෙළ **මනොද්වාර චිත්ත වීථි** නම් වේ.

**චිත්තවීථියක්** දැක්වීමේදී **වීථි සිත්** හා **වීථිමුක්ත සිත්** යයි සිත් දෙකොටසක් හමුවේ. මේ භවයෙහිදී සදෙරින් ගන්නා ලද අරමුණු එල්බගෙණ හටගන්නා සිත් **වීථි සිත්** නම්. එසේ නොගත් පෙර, භවයෙහිදී සදෙරින් ගත් **කම්ම, කම්ම නිමිති, ගති නිමිති** යයි සම්මත අරමුණු අතුරෙන් එක් අරමුණක් එල්බ ගෙණ පවත්නාවූ, **පටිසන්ධි, භවඞ්ග, චුති**, කෘත්‍යයන් සිද්ධ කරන්නාවූ, **ද්වාර විමුක්ත සිත්** යයි ව්‍යවහාර කරණු ලබන චිත්තයෝ, වීථි චිත්තයන්ට ඇතුළත් නොවන හෙයින් **වීථි මුක්ත සිත්** නම් වේ.

සිත, **අවස්ථා** නොහොත් **ක්‍ෂුද්‍ර චිත්තක්ෂණ** තුනෙකින් යුක්තය. සිත උපදින අවස්ථාවට **උත්පාදක්ෂණය** යයිද, සිත පවත්නා අවස්ථා

වට **ඨිතික්ෂණය** යයිද, චිත්තයාගේ බිඳීම හෙවත් මරණය සිදු වන අවස්ථාවට **භඞ්ගක්ෂණය** යයි ද ව්‍යවහාර වේ. මෙසේ **උත්පාද, ඨිති, භඞ්ග** යන ක්ෂණත්‍රය එක්වූ කල්හි එක් **චිත්තක්ෂණයක්** වෙයි. එයම **චිත්තයාගේ ආයුෂය** වේ.

සිතට ගොචර වන **රූප ධර්මයන්ට** මෙබඳු **චිත්තක්ෂණ සතලොසක්** හෝ උත්පාදක්ෂණාදී **කුඩා ක්ෂණ එක්පනසක්** හෝ ආයුෂ ඇත්තේයි. මේ රූපයාගේ ද, **උත්පාද, ඨිති, භඞ්ග** යන අවස්ථා තුනෙක් ඇත. එයින් රූපයාගේ **උත්පාද අවස්ථාව,** චිත්තයාගේ උත්පාදක්ෂණයට සමාන ආයුෂ ඇත්තේය. එහි **භඞ්ග අවස්ථාවද,** චිත්තයාගේ භඞ්ගක්ෂණයට සමාන ආයුෂ ඇත්තේය. නාම ධර්මයන්ගේ **ඨිති** කාලය එක් කුඩා චිත්තක්ෂණයක් වන නමුත්, රූපයාගේ **ඨිති** කාලය කුඩා ක්ෂණ එකුන් පනසකට (49) ආයුෂ ඇත්තේය. මෙසේ නාම ධර්මයන්ගේ හා රූප ධර්මයන්ගේද උත්පාදක්ෂණයත්, භඞ්ගක්ෂණයත් එක සමාන ආයුෂ ඇති බවත්, නාමධර්මයන්ගේ ඨිති කාලය එක් කුඩා ක්ෂණයක් වන නමුත් රූප ධර්මයන්ගේ ඨිති කාලය කුඩා ක්ෂණ එකුන්පනසක් වන බවත් දත යුතුයි. විසිඅට රූප ධර්මයන් අතුරෙන් රූප දෙවිස්සකට (22) සතළොස් චිත්තක්ෂණ බැගින් ආයු ඇති නමුත්, ඉතිරි රූප සයට, එනම් **උපචය, රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප, කායවිඤ්ඤත්ති රූප වචීවිඤ්ඤත්ති රූප** යන රූපයන්ට ආයුෂ එයට අඩු බව දත යුතුයි. රූප නිර්දෙශ යෙහිදී එහි විස්තර දක්වනු ලැබේ.

**චක්ඛුද්වාර වීථි, සොතද්වාර වීථි, ඝාණද්වාර වීථි; ජිව්හාද්වාර වීථි, කායද්වාරවීථි** යන වීථි පස **පඤ්චද්වාර චිත්ත වීථි** නම් වේ. මෙයටම **චක්ඛුවිඤ්ඤාණ වීථි, සොතවිඤ්ඤාණ වීථි, ඝාණවිඤ්ඤාණ වීථි, ජිව්හාවිඤ්ඤාණ වීථි, කාය විඤ්ඤාණ වීථි** යයි ද ව්‍යවහාර කරනු ලැබේ.

### චක්ඛුද්වාර වීථි හෙවත් චක්ඛු විඤ්ඤාණ වීථි

චක්ඛුද්වාරයෙන් ගන්නාලද රූපාරම්මණයක් හෙවත් **වර්ණ අරමුණක්** එල්බගෙණ පහළවන්නාවූ සිත්පෙළ **චක්ඛුද්වාර වීථි** නම් වේ. මේ සිත් පෙළේ හටගන්නාවූ **වීථිචිත්තයෝ** සත් වැදෑරුම් වෙත්. එනම් **පඤ්චද්වාරාවජ්ජනය, චක්ඛු විඤ්ඤාණය, සම්පටිච්ඡනය**

**සන්තීරණය, වොට්ඨපනය, ජවනය, තදාරම්මණය යන වීථි චිත්තයෝයි** මේ විථි චිත්තයන් නොපවත්නා කල්හි සිත් පරම්පරාව **භවඞ්ග චිත්තයන්ගෙන්ම** යුක්තවන්නේය. **භවඞ්ග සිතෙහි** අරමුණ පූර්ව භවයෙන් ගන්නාලද **කම්ම, කම්මනිමිත්ත, ගති නිමිති** යන අරමුණු වලින් එකෙකි. ප්‍රතිසන්ධි සිතෙහි අරමුණත්, චුති සිතෙහි අරමුණත් එයමය. යම්විටෙක, යමෙකුගේ සිත භවඞ්ග නොවීනම්, එවිට ගෙනෙම් සම්මුති මරණයෙන් මියයන්නේ වේ. සත්ත්වයාගේ නොසිඳි පැවැත්මට මේ **භවඞ්ග සිතත්**, **රූප ජීවිතෙන්ද්‍රියයත්, කර්මජ තෙජොධාතුවත්** ප්‍රධාන බව සැළකිය යුතුයි.

චක්ඛුප්‍රසාදය හා **ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය** යන දෙදෙනාගේ ගැටීම ඇති කල්හි **චක්ඛුද්වාර චිත්තවීථිය** හටගන්නේය. **ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය** නම් රූපයාගේ උත්පාදක්ෂණයේ සිට භඞ්ගක්ෂණය දක්වා රූපය පවත්නා කාලයයි. ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය හමුවීමයයි කී කල්හි, මේ සතොළොස් චිත්තක්ෂණයට ආයුෂ ඇති රූපයාගේ උත්පාදක්ෂණ යේ දීම හමුවන රූපය බව දත යුතුයි. මේ ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය හා ස්පර්ශවන **චක්ෂුප්‍රසාද රූපයෝද ප්‍රත්‍යුත්පන්න ප්‍රසාද රූපයෝම** වෙත්. එනම් ඒ රූපාරම්මණයාගේ උත්පාදක්ෂණයේ දීම, ඒකක්ෂණිකව හට ගත් ප්‍රසාද රූප විය යුතුයි. මෙසේ ඒකක්ෂණිකව උපන් රූපාරම්මණයාගේද, චක්ෂුප්‍රසාද රූපයාගේ ද ගැටීම වන කල්හි භවඞ්ග චිත්ත පරම්පරාවේ යම් භවඞ්ග සිතක් උපන්නේ නම්, ඒ භවඞ්ග චිත්තයට මේ දෙදෙනාගේ ස්පර්ශය දැනී එතැන් සිට අළුත් චිත්තවීථියක් ඇතිවීමට පිළියෙලවන්නේය. මේ ස්පර්ශය පළමුවරට දැනෙන භවඞ්ග චිත්තයට පළමුවෙනි **අතීත භවඞ්ගය** යයි කියනු ලැබේ. එබැවින් ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණයක් එල්බගෙණ **චක්ඛුද්වාර චිත්තවීථිය** හටගැනීමේදී **රූපාරම්මණයාගේ උත්පාදක්ෂණයද**, ඒ රූපාරම්මණය හා ස්පර්ශවන **චක්ඛු ප්‍රසාද රූපයාගේ උත්පාදක්ෂණයද**, ඒ ස්පර්ශය පළමුකොට දැනෙන **අතීත භවඞ්ගයාගේ උත්පාදක්ෂණයද**, ඒකක්ෂණිකව හටගන්නා බව සැළකිය යුතුයි. එයට පෙර හෝ පසුව හෝ උපන්නාවූ වර්ණ අරමුණු හමු නොවන්නාහ. එමෙන්ම අතීතභවඞ්ගයාගේ උත්පාදක්ෂණයට පෙර උපන් ප්‍රසාදරූපයෝ මන්දයුෂ්ක බැවින් වත්මන් අරමුණු ගත නොහැකි වේ. එයට පසුව උපන් ප්‍රසාදරූප අමන්දයුෂ්ක බැවින්ද එයටත් හමුනොවන්නේය.

චක්ෂුප්‍රසාද රූප පිහිටා තිබෙන්නේ අක්ෂි ගෝලයෙහි දෘෂ්ටි මණ්ඩලයට ඇතුළත් රූප කලාපයන් අතරය. රූපාරම්මණය යයි සම්මත වර්ණ රූපය හමුවන්නේත් ඒ තැන්හිමය. මේ දෙදෙනාගේ ගැටීම චක්ෂු ප්‍රසාද වස්තුවෙහි හටගන්නේ වී නමුත් පළමු කොට එතැන්හිදීම චක්ඛු විඤ්ඤාණය නො ඉපද, හදය වස්තු රූපය ඇසුරු කොට ගෙණ පවත්නා භවඞ්ග චිත්තයට දැනෙන්නේ කෙසේදැයි ප්‍රශ්නයෙකි. එය මෙසේ තේරුම් ගත යුතුයි.

භවඞ්ග චිත්ත පරම්පරාව පවතින්නේ හදය වස්තු රූපය ඇසුරු කොට ගෙණය. ශරීරයෙහි අන් තැනක පිහිටි ප්‍රසාද වස්තුවකට හමුවූ ආරම්මණයක් ගැණීම එකවරටම කළ නො හැකිවේ. හදය වස්තුව ඇසුරු කොට ගෙණ පවත්නාවූ භවඞ්ග සිත් පරම්පරාව ඊට පිළියෙල විය යුතුයි.

සියලුම ශරීරාවයව, නහරවැල් ආදියෙන් එකිනෙකට සම්බන්ධව පවතී. අධ්‍යාත්මක ආයතනයන්ගේ සම්බන්ධය ඉතා ප්‍රකටය. අධ්‍යාත්මක ආයතනයෝ නම්, **චක්ඛායතනය**, **සොතායතනය**, **ඝාණා-යතනය**, **ජිව්හායතනය**, **කායායතනය** සහ **මනායතනය** යන සයයි. පයෙහි හුලක් ඇණුනු කල්හි ඒ මොහොතේදීම දුක්ඛවෙදනාවෝද අත්පා ආදිය ක්‍රියා කරවීමෙන් ඒ මේ අත දිවීමත්, හෘදය වේගයෙන් ගැසීමත්, වේගයෙන් ආශ්වාස ප්‍රශ්වාස කිරීමත් යනාදී නොයෙක් ක්‍රියා සිදුවන්නේය. විසංඥව සිටින අවස්ථාවක් නම් ආයුධයකින් ශරීරය කපන බිඳින කල්හි ද නිශ්චල වන්නේය. එසේ වන්නේ ඒ වේලාවේදී ආයතනයන් අතර සම්බන්ධය නතරවූ හෙයිනි. මේ ක්‍රමයෙන් හෘදය වස්තුව හා අනිකුත් ප්‍රසාද වස්තූන් ඒකාබද්ධව පවතින බව වටහා ගැනීම දුෂ්කර නොවේ.

දෙමුහුන ඇති බෙරයක්හි එක් මුහුනක පැණි බිඳක් තබා, එහි රසය බොන්නට මැස්සෙක් පැමිණි කල්හි අනික් බෙර ඇසට දණ්ඩ-කින් පහර ගැසූ කල්හි, පැණි බොමින් සිටි මැස්සා, තමාට වැදුනු පහරක් මෙන් දැනී, ඉගිලී යන්නේය. එමෙන්ම, චක්ඛු ප්‍රසාදයට රූපාරම්මණයක් ගැටුණු කල්හි, චක්ෂුප්‍රසාදය, හදයවස්තුව හා සම්-බන්ධය ඇති බැවින් හදය වස්තුව ඇසුරු කොට ගෙන පවත්නා භවඞ්ග චිත්ත සන්තතියේ එක් භවඞ්ග සිතකට මේ ගැටීම නොහොත් ස්පර්ශය පළමුකොට දැනෙන්නේය.

තවද, සූර්‍යාලොකය පවත්නා කල්හි යම් පක්ෂියෙක් පියාඹා විත් වෘක්ෂ ශාඛාවක් මත පැමිණීමත් සමගම, ඒ පක්ෂියාගේ ඡායාවද එකක්ෂණිකව පොළොවෙහි පිහිටන්නාක් මෙන්, **චක්ෂු** ප්‍රසාදයාගේ හා රූපාරම්මණයාගේද ස්පර්ශ වීමත් සමගම හදය වස්තු රූපය ඇසුරු කොට ගෙණ පවත්නා **භවඞ්ග චිත්තයට,** එම අරමුණ එක්තරා ආකාරයෙකින් ස්පර්ශ වන බව දත යුතුයි. **හවඞ්ග චලන හවඞ්ගුපච්ඡෙද, පඤ්චද්වාරාවජ්ජන** යන සිත් හදය වස්තු රූප ඇසුරු කොට ගෙන හටගන්නේ මේ ආකාරයෙන් බව **සැළකිය යුතුයි.**

මේ අවස්ථාව රූපාරම්මණයාගේ සහ ප්‍රසාද රූපයාගේද උත්පාද අවස්ථාව වන බැවින්, දෙදෙනාම ඉතා දුර්වලය. එබැවින් භවඞ්ග සිතෙහි අරමුණ සෙලවීමට පවා ශක්තියක් නැති හෙයින්, ඒ භවඞ්ග සිත නොවෙනස්ව නිරුද්ධ වන්නේය. මේ භවඞ්ග සිතට **අතීත භවඞ්ගය** යයි කියනු ලැබේ.

**චක්ඛු ප්‍රසාදයත්, ආලොකයත්, ආරම්මණයත්, මනසිකාරයත්** ඉතා බලවත් නම් එම අරමුණ **අතිමහන්තාරම්මණයක්** වශයෙන් ගෙණ, **අතිමහන්තාරම්මණ චිත්තවීථියක්** හටගන්නේය. එවිට ඇතිවන්නේ එක් **අතීත භවඞ්ගසිතකි.** මේ අතීත භවඞ්ගය ඉපිද නිරුද්ධවූ කල්හි රූපාරම්මණයාගේ හා ප්‍රසාදරූපයාගේද ඨිති අවස්ථාව ආරම්භවූ බැවින්ද, භවඞ්ග චිත්ත පරම්පරාව මේ අලුත් අරමුණ ගෙණ ඇතිවිය යුතු සිත්වලට අවකාශ දිය යුතු බැවින්ද, භවඞ්ග සිත සෙලවෙන්නාක් මෙන් දක්වෙන **භවඞ්ග චලන,** නම් වූ භවාඞ්ග සිත ඉපිද නිරුද්ධ වන්නේය. මෙසේ චලනය වීමෙන් දුර්වල වූ භවඞ්ග සිතට අනතුරුව වීථි සිත් ඉපදීමට අවකාශ තබා නිරුද්ධ වන්නාක් මෙන්, **භවඞ්ගුපච්ඡෙද** නම් වූ භවඞ්ග සිත ඉපිද නිරුද්ධ වේ. මේ ක්‍රම යෙන් දුර්වලවූ භවාඞ්ග අරමුණ ගෙන, **අතීත භවඞ්ග භවඞ්ග චලන, භවඞ්ගු පච්ඡෙද** යන සිත් තුන නිරුද්ධවූ කල්හි, බලවත්වූ අලුත් රූපාරම්මණය ගෙන වීථි සිත් ඇති වීමට අවකාශ ලැබෙන්නේය. පළමුවරට අලුත් අරමුණු පහළවන චිත්තය භවඞ්ග සිත මෙන්ම හදය වස්තුවම ඇසුරු කරමින්, අලුත් අරමුණට සිත් පරම්පරාව යොමු කිරීම් වශයෙන් ආවර්ජන කෘත්‍ය කරමින් ඉපිද නිරුද්ධ වන්නේය. එයට **පඤ්චද්වාරාවජ්ජන සිත** යයි කියනු

ලැබේ. මේ **පඤ්චද්වාරාවජ්ජන චිත්තය** භවඞ්ග වශයෙන් චිත්ත පරම්පරාව හට ගැනීමට අවකාශ නොදී එය වළක්වා වීථි චිත්ත භාවය පිණිස නියෝග කරන්නාක් මෙන් උපදින්නේය. චක්ඛු ප්‍රසාද වස්තුවට හමුවූ අලුත් රූපාරම්මණය එල්බගෙණ හටගත් පළමුවෙනි වීථි සිත මේ **පඤ්චද්වාරාවජ්ජන සිත වේ.** ආවර්ජන කෘත්‍ය පමණක් සිදු කරන්නාවූ මේ සිතට ආරම්මණය පිළිබඳව යිසි හැඳිනීමක් නැත. එය අහේතුක ක්‍රියා සිතකි.

මේ අවස්ථාව වන විට, ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණයට හා ප්‍රසාද රූපයටද, චිත්තක්ෂණ සතරක කාලයක් ගත වීමෙන් දෙදෙනාම බලවත්ය. භවඞ්ග සිත්ද වලක්වා අලුත් අරමුණට සිත් පරම්පරාව යොමුකොට පඤ්චද්වාරාවජ්ජන සිත නිරුද්ධ වූ බැවින්, ඊට අනතුරුව උපදින සිත, චක්ඛු ප්‍රසාද වස්තුවෙහිම එයට හමුවූ අලුත් රූපාරම්මණය එල්බ ගෙණ උපදින්නේය. මේ සිත **චක්ඛු විඤ්ඤාණය** නම් වේ. මේ සිතට හමුවූ අරමුණ ඉෂ්ට නම් එය **අහේතුක කුසල විපාක චක්ඛුවිඤ්ඤාණය** වේ. අරමුණ අනිෂ්ට නම් **අහේතුක අකුසල විපාක චක්ඛු විඤ්ඤාණය** වේ. මේ සිත් දෙකම පෙර කුසලාකුසල කර්මයන්ගේ ප්‍රවෘත්ති විපාක වශයෙන් ලැබෙන සිත් දෙකෙකි. චක්ඛු ප්‍රසාද වස්තුවෙහි මිස අන් තැනෙක මේ **චක්ඛුවිඤ්ඤාණ දෙසිත** නුපදී. එමෙන්ම චක්ඛුප්‍රසාද වස්තුවෙහිද උපදින්නේ මේ සිත් දෙක පමණකි. එම වීථියට ඇතුළත් අනිකුත් චිත්තයෝ උපදින්නේ හදය වස්තුව ඇසුරු කොට ගෙනය.

චක්ඛුප්‍රසාදය, රූප ධර්මයක් බැවින් අන්ධයකු මෙන් රූපාරම්-මණය නො දකී. චක්ඛු විඤ්ඤාණයද පිළෙකු සමාන නාම ධර්මයක් බැවින්, තනිවම රූප නොදකී. නමුත් චක්ඛු ප්‍රසාද නමැති අන්ධයා ගේ කරපිට චක්ඛු විඤ්ඤාණ නමැති පිළා නැග ගොදුරු ගන්නා බව දත යුතුයි.

තවද, **නොපිරිහුණු** චක්ෂු **ප්‍රසාදය ඇති බවය, රූපාරම්මණයක් හමුවීමය, පඤ්චද්වාරාවජ්ජන චිත්තයෙන් අනන්තරප්‍රත්‍ය ලැබීමය,** යන මේ කරුණු සම්පූර්ණවීම හේතු කොට ගෙණ **චක්ඛු විඤ්ඤාණය** හටගන්නේය. මෙහි **රූපාරම්මණය** යයි කියන ලද්දේ ඇසින් දැක්ක හැකි සියල්ලටය. එය **සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තූන්**

පිළිබඳ වූ නිල පීතාදී යම් **වර්ණයක්** හෝ සතරැස්, දිග වටකුරු ආදි **සටහනක් හෝ** වන්නේය. මේ වර්ණායතනය චක්ෂු ප්‍රසාදය කරා නොපැමිණ, සිටි තැනම සිට අරමුණු වන්නේය. රූපාදි පඤ්චාරම්මණයන් අතුරෙන් රූපය මෙසේ චක්ඛු ප්‍රසාදය කරා නො පැමිණි නො ගැටී අරමුණු වෙත්. ශබ්ද අරමුණද එසේමය. සෙසු අරමුණු එනම් ගන්ධ රස, පොට්ඨබ්බ ආයතනයෝ ඒ ඒ ප්‍රසාදයන් කරා පැමිණ එහි හැපී අරමුණු වෙත්.

මෙසේ චක්ඛු ප්‍රසාද වස්තුවෙහි හටගන්නා චක්ඛු විඤ්ඤාණය ඉපිද, වර්ණායතනය දැක නිරුද්ධවූවායින් පසු, **දක්නා ලද** එම අරමුණ අනිෂ්ටාරම්මණයක් වීනම්, **අහේතුක අකුසල විපාක සම්පටිච්ඡන චිත්තයද**, අරමුණ ඉෂ්ටාරම්මණයක් නම් **අහේතුක කුසල විපාක සම්පටිච්ඡන චිත්තයද** එක්වරක් ඉපිද නිරුද්ධ වේ. මේ **සම්පටිච්ඡන** චිත්තයාගේ කෘත්‍යය නම් චක්ඛු විඤ්ඤාණයා විසින් දක්නා ලද අරමුණ පිළිගැනීමය. මේ සිත හටගන්නේ චක්ඛු ප්‍රසාද වස්තුවෙහි නොව හදය වස්තුව ඇසුරු කොට ගෙණය.

**සම්පටිච්ඡන චිත්තයට** අනතුරුව, එම සිතින් පිළිගන්නා ලද අරමුණ **අනිෂ්ටාරම්මණයක් වී නම්, අහේතුක උපෙක්ඛා සහගත අකුසල විපාක සන්තීරණ සිතද, ඉෂ්ටමධ්‍යාස්ථාරම්මණයක් නම් අහේතුක උපෙක්ඛා සහගත කුසල විපාක සන්තීරණ චිත්තයද, අතිඉෂ්ටාරම්මණයක් නම් අහේතුක සොමනස්ස සහගත කුසල විපාක සන්තීරණ චිත්තයද** එක් වරක් ඉපිද නිරුද්ධ වේ. මේ **සන්තීරණ** චිත්තයාගේ කෘත්‍යය නම් සම්පටිච්ඡන සිත විසින් පිළිගන්නා ලද අරමුණ විමසා බැලීමය.

**සන්තීරණ චිත්තයට** අනතුරුව අහේතුක ක්‍රියා සිතක්වූ **මනොද්වාරාවජ්ජන චිත්තය, වොට්ඨපන** යන නමින් ඉපිද එම රූපාරම්මණය නිශ්චය කොට දී නිරුද්ධ වන්නේය. මේ **වොට්ඨපන** සිතින් නිශ්චය කරණු ලබන්නේ එයට පෙර පහළ වූ සන්තීරණ සිතින් විමසන ලද ක්‍රමයට විරුද්ධ නොවන ආකාර යෙනි.

**වොට්ඨපන චිත්තය** ඉපිද නිරුද්ධ වූ කල්හි, **පඤ්චද්වාරාවජ්ජන සිතින්** ආවර්ජනය කළ ක්‍රමයටත්, **වොට්ඨපන සිතින්** නිශ්චය කළ

ක්‍රමයටත් අවිරුද්ධව, **එකුන් තිස් (29) කාමාවචර කුසලාකුසල ක්‍රියා ජවන චිත්තයන්** අතුරෙන් එක් සිතක් **ජවන කෘත්‍ය** සිද්ධ කරමින්, **පිළිවෙලින් සත් වරක්** ඉපිද, ඒ අරමුණු රසය ආශ්වාදනයකොට, නිරුද්ධ වන්නේය.

චක්ඛු විඤ්ඤාණයෙන් දක්නාලද රූපාරම්මණය ප්‍රිය මනාප වී නම්, **වොට්ඨපන සිතින්** එම අරමුණ ඇලුම් කටයුතු යයි **නුනුවණින්** හෙවත් **අයොනිසො මනසිකාරයෙන්** නිශ්චය කළ කල්හි, **ලොභ මූල අකුසල ජවන් අටෙන් එකක්** උපදනේය.

අනිෂ්ටාරම්මණයක් දක, **නුනුවණින් යුක්තව, වොට්ඨපන සිතින්** කිපියයුතු යයි නිශ්චය කෙළේ වී නම්, **දෙසමූල අකුසල ජවන් දෙකෙන් එකක්** උපදී.

ඉෂ්ට හෝ අනිෂ්ට හෝ අරමුණක් දක **වොට්ඨපන සිතින් මුළාවී නම්, මොහමූල අකුසල ජවන් දෙකෙන් එකක්** උපදනේය.

**වොට්ඨපන** සිතින්, **නුවණින් යුක්තව**, ඇතිසැටියෙන් ආරම්මණය නිශ්චය කෙළේවිනම් හෝ, බුද්ධ දර්ශනාදී අති ඉෂ්ටාරම්මණයක් හමුවී **වොට්ඨපන චිත්තය** කරණකොට ගෙණ පැහැදුණේවී නම් හෝ **කාමාවචර කුසල් ජවන් අටෙන් එකක්** හෝ **රහතන් වහන්සේ** නම් **කාමාවචර ක්‍රියා ජවන් නවයෙන්** (මහා ක්‍රියා 8 ත් හසිතුප්පාදයත් යන නවය) එක් සිතක් හෝ ජවන් වශයෙන් උපදින්නේය. **ජවනක්ෂණයෙහි** ඇතිවන **රඤ්ජන, දූස්සන, මුය්හන, පසාදන, විරමණ, උක්කණ්ඨනා** දි ය කරණකොට ගෙන කුසලාකුසල භාවය හා ක්‍රියා **භාවය** ද සිදුවන බව දතයුතුයි.

මෙකී ජවන් සිත්හි යෙදෙන චෙතනා චෛතසිකය කර්ම යන **නාමය** ලබන්නේය. පඤ්චද්වාරික චිත්ත වීථීන්හි ඇතිවන ජවන් **සිත්හි** යෙදෙන චෙතනා චෛතසිකය **කර්මපථ භාවයට** නොපැමිණේ. **එබැවින් එයින් ප්‍රවෘත්ති** විපාක මිස පටිසන්ධි විපාක නොලබන්නේය. මෙම චක්ඛුද්වාරික චිත්තවීථියේ අරමුණ අතීත වශයෙන් එල්බ **ගෙන** මනොද්වාර චිත්තවීථි සතරක් උපදිත්. ඔවුන් අතුරෙන් **පළමුවෙනි**, දෙවෙනි, තුන්වෙනි මනොද්වාරික චිත්ත වීථීන්හි

ලැබෙන ජවන් එක් විස්සෙහි (21) සම්ප්‍රයුක්ත චෙතනා එක්විස්සද (21) පෙර කී චෙතනා මෙන්ම ප්‍රවෘත්ති විපාක මිස, පටිසන්ධි විපාක ගෙන නොදෙන්නේය. අවසානයෙහි හටගන්නා අර්ථසාධක වූ, සතරවන මනොද්වාරික චිත්ත වීථියෙහි සම්ප්‍රයොග වන චෙතනා **කර්මපථ භාවය** සිද්ධ කිරීමට සමත් වේ. ඒ චෙතනා සතෙන්, පළමුවන ජවන් සිතෙහි චෙතනාව **දිට්ඨධම්ම වෙදනීය** වශයෙන් මෙලොවෙහි ද, සත්වන ජවනය හා යෙදුන චෙතනාව **උපපජ්ජ වෙදනීය** වශයෙන් දෙවන ආත්ම භාවයෙහිද, මැද ජවන් පස හා යෙදුන චෙතනා පස, ස්කන්ධ පරිනිර්වාණය දක්වා සසරදී අවකාශ ලත් විටෙක, **අපරාපරියවේදනීය** වශයෙන්ද ප්‍රතිසන්ධි පසක් හා ප්‍රවෘත්ති විපාක ද දෙන්නාහු වෙත්. එබැවින් එක් අරමුණක් නිසා, ප්‍රත්‍යුත්-පන්න අතීතාරම්මණ වශයෙන් පඤ්චද්වාර, මනොද්වාරයන්හි හටගන්නා චිත්ත වීථි පසෙහි ජවන් පන්තිසක් (35) ඇතිවන බවත්, එයින් එකුන් තිසක් (29) සමග යෙදෙන චෙතනා විසි නවය ප්‍රවෘත්ති විපාක පමණක් දෙන බවත්, අවසාන අර්ථසාධක චිත්තවීථියේ වූ අවසාන ජවන් සයෙහි යෙදෙන චෙතනා සය ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙකම ගෙනදෙන බවත් දතයුතුයි. **ජවන් සිත්** නිරුද්ධ වූ පසු මේ චිත්තවීථියෙහි දක්වන ලද **තදලම්බන කෘත්‍ය** කරන්නාවූ **සිත්** එකොළොසින් එක් සිතක්, ජවනයෙන් අනුභවකොට ශෙෂවූ අරමුණු රසය විඳින්නාක්මෙන් දෙවරක් ඉපිද නිරුද්ධ වේ. මෙයින් මේ සප්තරසායුෂ්ක හෙවත් සතළොස් චිත්තක්ෂණයෙකින් යුක්ත **චක්ඛුද්වාර චිත්ත වීථිය** අවසන් වේ. අති ඉෂ්ටාරම්මණයක් ලැබුනේ-වීනම් සොමනස් තදලම්බන පසෙන් එකක් ලැබෙන්නේය. ඉෂ්ට මධ්‍යස්ථ අරමුණක් නම් කුසල විපාක උපෙක්ඛා සහගත තදලම්බන පසෙන් එකක් ලැබෙන්නේය. අනිෂ්ට අරමුණක් නම් අකුසල විපාක තදලම්බණය ඇති වන්නේය.

පඤ්චද්වාරික චිත්තවීථීන් අතුරෙන් අති මහන්තාරම්මණ චිත්ත වීථියකම **තදලමබණයෝ** ඇතිවන බව දතයුතුයි. මේ තදලම්බණයට පසුව නැවතත් භවඞ්ග සිත් පරම්පරාව පහළ වේ. එබැවින් මේ තදලම්බණ සිත, ජවනයන්ට හා භවඞ්ගයට අවිරුද්ධ ආකාරයෙන් හටගන්නාවූ විපාක සිතක් බව දත යුතුයි.

මෙසේ දක්වනලද චිත්තවීථිය පිළිබඳ වූ අනෙකවිධ කෘත්‍යයන් සිද්ධකරමින් ඉපිද නිරුද්ධ වන චිත්තයන්ගේ පිළිවෙලින් පහළවීම, කෙසේ ඇතිවීදැයි අසන්නේ නම්, කාරකයෙක් හෙවත් කර්තෘ කෙනෙක් නොමැතිව, තමාගේ ස්වභාවයෙන්ම, අරමුණ විසින් ප්‍රසාදය පහරණු ලැබූ තැන් පටන්, චිත්ත නියමයෙන් ආවර්ජනාදී චිත්තයන්ගේ උත්පත්තිය වන බව කිව යුතුයි.

මේ ලොකයෙහි, **ලොකස්වභා, ධර්මස්වභා** වශයෙන් **කාරක යෙක් නොමැතිව** සිද්ධවන්නාවූ **නියාම ධර්මයෝ පස් දෙනෙකි.** එනම් **උතුනියාමය, බීජනියාමය, ධර්ම නියාමය, කර්ම නියාමය, චිත්ත නියාමය** යන නියාමයෝ පස්දෙනායි. කාරකයෙක් නොමැතිව **සීත, උෂ්ණ, වර්ෂා** ආදිය ඇතිවීම **උතු නියාමය යි.** වැල් ජාතීහු ආසන්න ගසක වෙළී වැඩීම, ඒ ඒ ගස්වල ඒ ඒ වර්ගයේ මල්ඵල හටගැණීම, සිදුරු සහිත ගස් කොළ ඇතිවීම යනාදිය **බීජ නියාමය** වේ.

බෝසත්වරුන් පහළවීමාදියේදී පෘථුවිකම්පාව, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් පහළ වීම ආදිය **ධර්මනියාමය** වේ. කුසල කර්මයට කුසල විපාකත්, අකුසල කර්මයට අකුසල විපාකත් ලැබීම **යනාදිය කර්ම නියාමය** නම් වේ. චිත්තවීථීන්හි ඒ ඒ චිත්තයන් හටගන්නා පිළිවෙල ආදිය **චිත්ත නියාම** නම් වේ. මෙකී නියාම ධර්ම පසින් චිත්තයන්ගේ පරිපාටිය හෙවත් කාරකයෙක් නැතිව සිත් හටගන්නා පිළිවෙල **චිත්ත නියාමය** බව දතයුතුයි.

අතිමහන්තාරම්මණ චක්ඛුද්වාර චිත්තවීථිය වටහා ගැණීමට **අම්බොපමාව** දක්වනු ලැබේ. එනම්:—එක්තරා පුරුෂයෙක්, පැසුණු අඹඵල ඇති ගසක් මුල හිස වසාගෙණ නිද සිටින කල්හි, විලිකුම් අඹ ඵලයක් නටුවෙන් ගැලවී ඔහු සමීපයෙහි වැටුණු ශබ්දය අසා පිබිදී ඇස හැර බලා අඹ ඵලය දැක, අතින් ගෙණ ඇඟිලිවලින් ඔබා විලිකුන් බව විමසා, නැහැයෙන් සිඹ විලිකුන් බවම නිශ්චය කොට ගෙණ, එය අනුභව කොට තලු ආදියෙහි රැඳී ගිය අඹ රසය, මුඛගත සෙම සහිතව ගිල නැවත පළමු පරිද්දෙන්ම නිදන්නේය.

මේ උපමාවෙහි ඵල සහිත වූ අඹ ගස **කාම සුගති භවය** මෙන්ද, **පුරුෂයා කාමාවචර සත්ත්වයා** මෙන්ද, නිද සිටීම මෙන් **භවඞ්ගයද,** අඹ ඵලය ගැලවී වැටීම මෙන් **අරමුණ හමුවීමද** පිබිද බලන්නාක් මෙන් **ආවර්ජනා සිතද** අඹ ඵලය දැකීම මෙන් **චක්ඛු විඤ්ඤාණයද,** එය අතින් ගැණීම මෙන් **සම්පටිච්ඡන සිතද,** අඹ ඵලය අතගා බැලීම මෙන් **සන්තීරණ සිතද,** නැහැයෙන් සිඹ විලිකුන් බව නිශ්චය කරගැණීම මෙන් **වොට්ඨපන සිතද,** ඵලය අනුභව කිරීම මෙන් **ජවන් සිත්ද,** තලු ආදියෙහි රැඳී රසය ගිලීම මෙන් **තදරම්මණයද,** නැවත නිදගැණීම මෙන් **භවඞ්ගපාතයද** දත යුතුයි.

චිත්ත විථි ලියා දක්වීමේ පහසුව සඳහා, සිත් හැඳිනීම පිණිස මෙසේ සළකුණු යොදනු ලැබේ:—

| | | | |
|---|---|---|---|
| භ | – භවඞ්ගය | ජ | – ජවනය |
| ති | – අතීත භවඞ්ගය | ත | – තදරම්මණය |
| න | – භවඞ්ග චලනය | ම | – මනොද්වාරාවජ්ජනය |
| ද | – භවඞ්ගුපච්ඡෙදය | ප | – පරිකර්මය |
| පං | – පඤ්චද්වාරාවජ්ජනය | උ | – උපචාරය |
| ච | – චක්ඛු විඤ්ඤාණය | නු | – අනුලෝමය |
| සො | – සොතවිඤ්ඤාණය | ගො | – ගොත්‍රභූ |
| ඝා | – ඝාණවිඤ්ඤාණය | වො | – වොදනය |
| ජි | – ජිව්හා විඤ්ඤාණය | ර්ග | – මාර්ග සිත |
| කා | – කායවිඤ්ඤාණය | ඵ | – ඵල සිත |
| සං | – සම්පටිච්ඡනය | ඣා | – ධ්‍යාන සිත |
| ණ | – සන්තීරණය | චු | – චුති සිත |
| වො | – වොට්ඨපනය | පටි | – පටිසන්ධි සිත |

## අතිමහන්තාරම්මණ චිත්ත වීථිය

**චක්ඛු ප්‍රසාද වස්තුව, රූපාරම්මණය, ආලොකය, මනසිකාරය** යන ධර්ම සතර ඉතා බලවත් නම්, එක් චිත්තක්ෂණයක් හෙවත් එක් අතීත භවඞ්ග සිතක් ගතවී, චිත්තක්ෂණ සොළොසක් (16) ඉදිරියට ඇති **අතිමහන්තාරම්මණ චක්ඛුද්වාර චිත්ත වීථිය** හටගන්නේය. එය මෙසේ දක්වනු ලැබේ.

...භ | ති න ද | පං ච සං ණ වො ජ ජ ජ ජ ජ ජ ජ ත ත | භ...
1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

මෙහි 1, 2, සහ 3 වෙනි සිත්, භවඞ්ග කෘත්‍යය සිද්ධ කරන්නාවූ **විපාක සංඛ්‍යාත භවඞ්ග සිත්ය.** එහි අරමුණ පූර්ව භවයෙන් සඳෙරින් ගත් කම්ම, කම්ම නිමිති, ගති නිමිති යන ද්වාරවිමුක්ත අරමුණු වලින් එකෙකි. ඒ සිත් උපදින්නේ හදය වස්තු රූප ඇසුරු කොට ගෙණය.

4. වෙනි **පඤ්චද්වාරාවජ්ජන සිත**, හදය වස්තු රූපය ඇසුරු කොට ගෙණ උපදින නමුත්, චක්ඛුද්වාරයෙන් ගත් ප්‍රත්‍යුත්පන්න වර්ණායතනය නම්වූ රූපාරම්මණය අරමුණු කරයි. එය අහේතුක ක්‍රියා සිතකි.

5. වෙනි **චක්ඛු විඤ්ඤාණ සිත,** දස්සන කෘත්‍ය කරන්නාවූ කුසල් හෝ අකුසල් විපාක සිතකි. චක්ඛුප්‍රසාද වස්තුවෙහිදීම, ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණයාගේ ස්පර්ශ වීමෙන් හටගන්නේ ය. 6 සිට 17 දක්වා ඇති ඉතිරි සිත් හදය වස්තු රූපය ඇසුරු කොටගෙණ ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය අරමුණු කොටගෙන උපදින්නාහුය.

6. වෙනි **සම්පටිච්ඡන** සිත, සම්පටිච්ඡන කෘත්‍ය කරන්නාවූ අහේතුක විපාක සිතකි.

7. වෙනි **සන්තීරණ සිත,** සන්තීරණ කෘත්‍යය කරමින් උපදින අහේතුක විපාක සිතකි.

8. වෙනි **වොට්ඨපන සිත** අහේතුක ක්‍රියා සිතක් වූ මනොද්වාරාවජ්ජන සිතමය. මෙතැන්හිදී වොට්ඨපන කෘත්‍ය සිද්ධ වන්නේය.

9. සිට 15 දක්වා ඇති **ජවන් සිත් සත,** ජවන කෘත්‍ය සිද්ධ කරන්නාවූ කාමාවචර කුසලාකුසල ක්‍රියා ජවන් සිත් විසිනවයෙන් එකකි.

16. සහ 17 වෙනි සිත් දෙක, තදාලම්බණ කෘත්‍ය සිදු කරන්නාවූ විපාක සිත් එකොළොසින් එකකි. එයට අනතුරුව භවඞ්ග සිත් ඇතිවේ.

මෙහි දක්වන ලද **චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ චිත්තවීථිය** මෙන්ම, **සොත**, **ඝාණ**, **ජිව්හා**, **කාය** යන සතර ද්වාරයෙන්ද **ශබ්ද ගන්ධ**, **රස**, **පොට්ඨබ්බ** යන ආරම්මණයන් එල්බගෙණ **අති මහන් තාරම්මණ පඤ්චද්වාර චිත්තවිථි සතරක්** ඇතිවන්නේය. **චක්ඛු විඤ්ඤාණය** වෙනුවට **සොත විඤ්ඤාණ**, **ඝාණ විඤ්ඤාණ**, **ජිව්හා විඤ්ඤාණ**, **කායවිඤ්ඤාණ** යන් යොදා ගත් කල්හි ඒ ඒ ද්වාරික චිත්ත වීථිවල ආකාරය දත හැකි වේ. මෙසේ අතිමහන්තාරම්මණ චිත්ත වීථි පසක්ම ලැබෙන බව දත යුතුයි.

මේ චිත්ත වීථි පසම, **තදාරම්මණ සිත් දෙකින්** අවසන් වන බැවින් **තදාරම්මණ චිත්ත වීථි** යන නමින්ද හැඳින් වනු ලැබේ.

අතිත භවංගයාගේ උත්පාදක්ෂණයේදීම උපන් චක්ඛු ප්‍රසාද රූපය හා රූපාරම්මණයද, දෙවෙනි තදාලම්බණ චිත්තයාගේ භඞ්ගක්ෂ ණයේදී නිරුද්ධ වන බැවින් , චිත්ත විථිය එතැනින් අවසාන වේ

## මහන්තාරම්මණ චිත්ත වීථි

**අතීත භවඞ්ග** දෙකක් හෝ තුනක් ගතවී ඉදිරියට චිත්තක්ෂණ පසළොසක් (15) හෝ තුදුසක් (14) ඇති චිත්ත වීථි **මහන්තාරම්මණ චිත්ත වීථි** නම්. එක් ද්වාරයකට මහන්තාරම්මණ චිත්ත **වීථි** දෙක බැගින් ද්වාර පසට මහන්තාරම්මණ චිත්ත **වීථි** දසයක්ම ලැබෙන්නේය.

වස්තු, **ආරම්මණ**, **ආලොක**, **මනසිකාරාදීන්**ගේ යම් දුර්වල බවක් ඇති කල්හි, **එක් චිත්තක්ෂණයකට** වැඩි ගණනක් ගත **වී** අරමුණ ගැණීම සිදුවන්නේය. මෙසේ චිත්තක්ෂණ දෙකක් ගත **වී** නම්, අතීත භවඞ්ග සිත් **දෙකක්** ද, චිත්තක්ෂණ තුනක් ගතවී **නම්**, අතීත භවඞ්ග සිත් තුනක්ද පහළවී, එයට අනතුරුව පිළිවෙලින් **භවඞ්ග** චලන භවඞ්ගුපච්ඡෙද, පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ, **සම්පටිච්ඡන** සන්තීරණ වොට්ඨපන සහ ජවන් සිත් සතද ඉපිද නිරුද්ධවන්නේය.

**අතීත භවඞ්ග දෙකක්** ගතවීනම්, එම චිත්ත විථියේ සත්වන ජවන් සිත නිරුද්ධවූ කල්හි, චිත්තක්ෂණ සතළොසින් ඉතිරි වන්නේ **එක් චිත්තක්ෂණයකි.** යම් චිත්ත වීථියක තදරම්මණ සිත් පහළ වන්නේ නම්, පිළිවෙළින් තදරම්මණයෝ දෙදෙනෙක්ම පහළ වීම ධර්මතාවකි. තදරම්මණයන් දෙදෙනෙකුගේ පහළවීමට අවකාශ නැති කල්හි, නොහොත් රූපාරම්මණයාගේ **භඞ්ගයට** ඇත්තේ එක් චිත්තක්ෂණයක් පමණක් නම්, තදරම්මණය වෙනුවට එක් භවඞ්ග සිතක් ඉපිද නිරුද්ධ වී මෙන් චිත්ත වීථිය අවසන් වේ.

අරමුණ ගැණීමට අතීත භවඞ්ග තුනක් ගතවී නම්, සත් වන ජවනය නිරුද්ධවීම සමගම, රූපාරම්මණයාගේ සතළොස් චිත්තක්ෂණය ගෙවීයාමෙන්, රූපාරම්මණය නිරුද්ධවන බැවින් සත්වන ජවනයෙන්ම චිත්ත වීථිය අවසන් වේ.

මෙසේ මේ චිත්ත වීථිය හටගැණීමට උපකාර වූ අරමුණ, අති මහන්තාරම්මණයට වඩා කුඩා බැවින්ද, පරිත්තාරම්මණයට වඩා මහත් බැවින්ද එයට **මහන්තාරම්මණ** යයි කියති. වීථි සිත්වන ජවනයන්ගෙන් කෙළවරවන බැවින්, මේ චිත්ත වීථි දෙකට **ජවන වාරය** යයි ද කියති. **මහන්තාරම්මණ** චිත්ත වීථි දෙක මෙසේ දත යුතුයි.

(1)

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

(2)

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ති | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

**සොතද්වාර, ඝාණද්වාර, ජිව්හාද්වාර, කායද්වාර** යන සතර ද්වාරයන් ගෙන් ගන්නා ලද **ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ** ආරම්මණයන් එල්බගෙණ උපදනා **මහන්තාරම්මණ චිත්තවීථි** ඉහත දක්වන ලද චක්ඛුද්වාරික මහන්තාරම්මණ චිත්තවීථි දෙකට **සමානය.**

**චක්ඛුවිඤ්ඤාණය** වෙනුවට **සොතවිඤ්ඤාණය, ඝාණවිඤ්ඤාණය ජිව්හාවිඤ්ඤාණය** සහ **කායවිඤ්ඤාණය** යොදගත් කල්හි **සොතද්-ද්වාරික, ඝාණද්වාරික, ජිව්හාද්වාරික, කායද්වාරික** මහන්තාරම්මණ චිත්තවීථීන්ගේ ආකාරය දත හැකිවේ.

මේ මහන්තාරම්මණ චිත්තවීථි, කාමාවචර, රූපාවචර පුද්ගල සන්තානයන්හි උපදී.

## පරිත්තාරම්මණ චිත්තවීථි

**වස්තු, ආරම්මණ, ආලොක, මනසිකාරාදීන්ගේ** දුර්වලතාවය අධිකනම්, භවඞ්ගචලනය වන්නට පෙර අතීත භවඞ්ග සතරක් හෝ වැඩිගණනක් ගතවන්නේය. එසේ භවඞ්ග චලනයට පෙර **අතීත භවඞ්ග** සතර සිට නවය දක්වා ගතවන චිත්තවීථි **පරිත්තාරම්මණ චිත්ත වීථි** නම් වේ.

**අතීත භවඞ්ග** සතරක් ගතවී **භවඞ්ගචලනය, භවඞ්ගුපච්ඡෙදය, පඤ්චද්වාරාවජ්ජනය, චක්ඛු විඤ්ඤාණය, සම්පටිච්ඡනය, සන්තීරණය වොට්ඨපනය** යන සිත් එකොළොස ගතවූ කල්හි, සතළොස් චිත්තක්-ෂණයට ආයුෂ ඇති රූපාරම්මණයාගේ ඉතිරි කාලය චිත්තක්ෂණ සයකි. වොට්ඨපන චිත්තයට අනතුරුව ඇතිවිය යුත්තේ ජවන්සිත් සතය. එසේ ජවන් සිත් ඇතිවූවහොත් සවැනි ජවන් සිතෙහි භඞ්ගක්-ෂණයේදී රූපාරම්මණයාගේ භඞ්ගයද සිදුවන බැවින් සත්වන ජවන් සිත පහළ වීමට අවකාශයක් නැත. **මරණාසන්න කාලය, මූර්ජා අවස්ථාව, දියෙහි ගිලෙන අවස්ථාව, විසංඥ අවස්ථාව ම්ච්කුසින් බිහිවන අවස්ථාව** යනාදී අවස්ථාවන්හි, හදය වස්තු ආදීන්ගේ දුර්වල තාවය ඉතාමත් අධික බැවින්, ජවන් සිත් පසක් හෝ සයක් ඇති වන්නේය. අනිකුත් අවස්ථාවන්හි, ජවන්සිත් සතක්ම ඉපදීම ධර්මතාවයකි. ජවන් සිත් සතක් ඇතිවීමට අවකාශ නොමැතිනම්, ජවන් සිත් වෙනුවට තවත් වොට්ඨපන සිත් දෙකක් හෝ එකක් ඇතිවී ඉතිරි චිත්තක්ෂණ භවඞ්ග සිත්වලින්ම පිරෙන්නේය.

චක්ඛුද්වාරයෙහි මෙසේ ඇතිවන **පරිත්තාරම්මණ චිත්ත වීථි** සයකි. එනම්:—

1. අතීතභවඞ්ග සතරක් ගතවී භවඞ්ගචලන ආදිය ඇතිවී, වොට්ඨපන සිත් තුනක් හා භවඞ්ග සිත් සතරකින් අවසන් වන **පළමුවෙනි පරිත්තාරම්මණ චිත්ත වීථිය**.

2. අතීත භවඞ්ග පසක් ගතවී වොට්ඨපන සිත් තුනක් හා භවඞ්ග තුනකින් අවසන්වන **දෙවෙනි පරිත්තාරම්මණ චිත්ත වීථිය.**

3. අතීත භවඞ්ග සයක් ගතවී වොට්ඨපන සිත් තුනක් හා භවඞ්ග දෙකකින් අවසන්වන **තුන්වෙනි පරිත්තාරම්මණ චිත්තවීථිය.**

4. අතීත භවඞ්ග සතක් ගතවී වොට්ඨපන සිත් තුනක් හා එක් භවඞ්ග සිතකින් අවසන්වන **සතරවන පරිත්තාරම්මණ චිත්ත වීථිය.**

5. අතීත භවඞ්ග අටක් ගතවී වොට්ඨපන සිත් තුනකින් අවසන් වන **පස්වන පරිත්තාරම්මණ චිත්ත වීථිය**.

6. අතීත භවඞ්ග නවයක් ගතවී වොට්ඨපන දෙකෙකින් අවසන් වන **සවැනි පරිත්තාරම්මණ චිත්තවීථිය**.

මෙසේ එක් ද්වාරයෙක්හි පරිත්තාරම්මණ චිත්ත වීථි සය බැගින් පඤ්චද්වාරයන්හි පරිත්තාරම්මණ චිත්ත වීථි තිහක් (30) ඇතිවන බව දතයුතුයි.

චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථි සය මෙසේයි.

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | භ | ති | ති | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | වො | වො | භ | භ | භ | භ |
| (2) | භ | ති | ති | ති | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | වො | වො | භ | භ | භ |
| (3) | භ | ති | ති | ති | ති | තී | ති | න | ද | පං | ච | සං | ණ | වො | වො | වො | භ | භ |
| (4) | භ | ති | ති | ති | ති | ති | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | වො | වො | භ |
| (5) | භ | ති | ති | ති | ති | ති | ති | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | වො | වො |
| (6) | භ | ති | ති | ති | ති | ති | ති | ති | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | වො |

සොතද්වාරිකාදී අනිකුත් පරිත්තාරම්මණ චිත්ත වීථි මේ ආකාර යෙන්ම දතයුතුයි. ද්වාරික සිත් අතුරෙන් වොට්ඨපන නම්වූ ද්වාරික සිතින් අවසන්වන මේ චිත්ත වීථි සයට **වොට්ඨපනවාර** යයි ද කියනු ලැබේ. මේ පරිත්තාරම්මණ චිත්තවීථි කාමාවචර රූපාවචර පුද්ගල සන්තානයන්හි උපදී. මේ චිත්ත වීථීන්හි ජවන් සිත් නුපදනා බැවින් එහි කර්මයන් නැත්තාහ.

### අතිපරිත්තාරම්මණ චිත්ත වීථි

**වස්තු, ආරම්මණ, ආලොක, මනසිකාරාදීන්ගේ** දුර්වලතාවය ඉතාමත් අධිකවීනම්, භවඞ්ග චලනය වන්නට පෙර අතීත භවඞ්ග සිත් දසය සිට පසළොස දක්වා ගතවීමට අවකාශ තිබේ. එසේ ඇති කල්හි, වොට්ඨපන සිත් දෙකක් වත් ඉපදීමට අවකාශ නො-ලැබෙන්නේය. වොට්ඨපන සිත් දෙකක්වත් හටගැනීමට අවස්ථා වක් නොලදහොත්, වීථි සිත් හටනොගැනීම ධර්මතාවයකි. එබැවින් **පඤ්චද්වාරාවජ්ජනය, චක්ඛුවිඤ්ඤාණය, සම්පටිච්ඡනය, සන්තීරණය** ආදී වීථි සිත් නොලැබේ. භවඞ්ගුපච්ඡෙදයක් නොලැබෙන්නේ නම් පඤ්චද්වාරාවජ්ජනයක් නොවන්නේය. මේ චිත්ත වීථියෙහි ආරම්මණයට භවඞ්ග චලනය කිරීමට හැකිවන්නේ, රූපය හටගෙන **චිත්තක්ෂණය** දසයක් හෝ වැඩි ගණනක් ගතවී ඉදිරියට **චිත්තක්ෂණ සතක්** හෝ අඩුගණනක් ඇති බැවින් රූපයාගේ නිරුද්ධයට ආසන්න **අවස්ථා**වෙහිදීය. මේ අරමුණට **අතිපරිත්තාරම්මණය** යයි ව්‍යවහාර වන්නේත් ඒ නිසාමය.

1. **පළමුවන අතිපරිත්තාරම්මණ චිත්ත වීථියෙහි** අතීත භවඞ්ග **දසයක්** ගතවී, භවඞ්ග චලනය දෙවරක් ඉපිද නිරුද්ධවූ පසු, ඉතිරි **චිත්තක්ෂණ** පස භවඞ්ග සිත් පසකින්ම පිරෙන්නේය.

2. දෙවන අතිපරිත්තාරම්මණ චිත්ත වීථියෙහි අතීත භවඞ්ග **එකොළොසක්** ගතවී, භවඞ්ග චලන දෙකක් ඉපිද නිරුද්ධවූ පසු **ඉතිරි** චිත්තක්ෂණ සතර භවඞ්ග සිත් සතර කින්ම පිරෙන්නේය.

3. **තුන්වන අතිපරිත්තාරම්මණ චිත්තවීථියෙහි** අතීත භාවාඞ්ග **දොළොසක් ගතවී, භවඞ්ග** චලන **දෙසිතක්** ඉපිද නිරුදධවූ පසු **ඉතිරි චිත්තක්ෂණ** තුන භවඞ්ග සිත් තුනෙකින්ම පිරෙන්නේය.

**4. සතරවන අතිපරිත්තාරම්මණ චිත්ත වීථියෙහි** අතීත භවාඞ්ග තෙළෙසක් ගතවී, භවාඞ්ග චලන සිත් දෙකක් ඉපිද නිරුද්ධවූ පසු ඉතිරි චිත්තක්ෂණ දෙක භවාඞ්ග සිත් දෙකෙකින් පිරෙන්නේය.

**5. පස්වන අතිපරිත්තාරම්මණ චිත්ත වීථියෙහි** අතීත භවාඞග තුදුසක් ගතවී, භවඞ්ග චලන දෙසිත ඉපිද නිරුද්ධවූ පසු ඉතිරි චිත්තක්-ෂණය භවඞ්ග සිතකින්ම පිරෙන්නේය.

6. **සවැනි අතිපරිත්තාරම්මණ චිත්ත වීථියෙහි** අතීත භවඞ්ග පසළොසක් ගතවී, භවඞ්ග චලන දෙසිත ඉපිද නිරුද්ධවීමත් සමග රූපාරම්මණයාගේ නිරුද්ධයද වන බැවින් චිත්තවීථිය දෙවෙනි භවඞ්ග චලනයෙන්ම අවසන් වේ.

මෙසේ අතිපරිත්තාරම්මණ **චක්ඛුද්වාරික චිත්ත වීථි සයක්ම** ඇති වන්නේය. වීථි සිත් කිසිවක් නැති භවඞ්ග සිත්වලින්ම **යුක්ත** වූ මේ අතිපරිත්තාරම්මණ චිත්තවීථිවලට **මොඝවාර** හෙවත් **හිස්වීථි යයි** ව්‍යවහාර කරණු ලැබේ.

**සොතද්වාර, ඝාණද්වාර, ජිව්හාද්වාර, කායද්වාරයන්හිද අති-පරිත්තාරම්මණ චිත්තවීථි සය** බැගින් මේ ආකාරයෙන්ම **උපදින්-නේය.** එවිට පඤ්චද්වාරයෙහිම අතිපරිත්තාරම්මණ **චිත්තවීථි තිසක් (30)** වේ.

චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථිය මෙසේයි:—

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17...

(1) භ ති ති ති ති ති ති ති ති ති ති න න භ භ භ භ භ ...

(2) භ ති ති ති ති ති ති ති ති ති ති ති න න භ භ භ භ ...

(3) භ ති ති ති ති ති ති ති ති ති ති ති ති න න භ භ භ ...

(4) භ ති ති ති ති ති ති ති ති ති ති ති ති ති න න භ භ ...

(5) භ ති ති ති ති ති ති ති ති ති ති ති ති ති ති න න භ ...

(6) භ ති ති ති ති ති ති ති ති ති ති ති ති ති ති ති න න ...

මේ ක්‍රමයට, අතිමහන්තාරම්මණ චිත්ත වීථි එකෙක, මහන්තාරම්මණ චිත්ත වීථි දෙකෙක, පරිත්තාරම්මණ චිත්ත වීථි සයෙක, අතිපරිත්තාරම්මණ චිත්ත වීථි සයෙකැයි චක්ඛුද්වාරයෙහි චිත්ත වීථි පසළොසක් වේ. එසේ සොතද්වාරයෙහිද, ඝාණද්වාරයෙහිද, ජිව්හාද්වාරයෙහිද, කායද්වාරයෙහිද පසළොස බැගින් පඤ්චද්වාරයන්හිම පනසැත්තෑ (75) චිත්ත වීථීන් ලැබෙන බව දත යුතුයි.

කාමාවචර පුද්ගල සන්තානයෙහි මේ චිත්ත වීථි පන්සැත්තෑවම ලැබෙන නමුත්, රූපාවචර සන්තානයෙහි ඝාණ, ජිව්හා, කාය යන ප්‍රසාදයන් නැති හෙයින්, ඝාණද්වාර, ජිව්හාද්වාර, කායද්වාර යන ත්‍රිවිධ ද්වාරයන්හි ලැබිය යුතු පන්සාලිස් චිත්ත වීථි නොලැබෙන්නාහ. අරූපාවචර සන්තානයෙහි රූපයන් නො ලැබෙන හෙයින් පඤ්චද්වාර චිත්ත වීථි නූපදනේය.

පඤ්චද්වාර චිත්ත වීථීන්හි ලැබෙන්නෝ කාමාවචර සිත් සූපනස (54) පමණය. මහග්ගත ලොකොත්තර සිත් නො ලැබේ- අරමුණු අතුරෙන් ප්‍රත්‍යුත්පන්න රූප, ශබ්ද,ගන්ධ, රස පොට්ඨබ්බාරම්මණයන් පමණක් එල්බගෙණ පඤ්චද්වාරික චිත්තවීථි හටගනී. අතීතානාගතාදී ආරම්මණයන් හමු නොවෙත්.

## මනොද්වාර චිත්ත වීථි

**මනොද්වාරයෙන්** ගන්නා ලද **ධම්මාරම්මණයක්** එල්බ ගෙණ පහළවන්නාවූ චිත්ත සන්තතිය හෙවත් සිත්පෙළ **මනොද්වාරචිත්ත වීථි නම්** වේ. ප්‍රත්‍යුත්පන්නවූද, අතීතවූද, අනාගතවූද, සියලු චිත්ත, චෛතසික, රූප හා කාලවිමුක්තවූ නිර්වාණ, ප්‍රඥප්ති ධර්මයන්ද මනොද්වාරයට හමුවේ. **මනොද්වාරය** වනාහි සිතින්ම අරමුණු ගන්නා කල්හි, ඒ අරමුණු හා ස්පර්ශ වන **භවඞ්ගුපච්ඡෙද සිතය.**

මනොද්වාරයෙහි හටගන්නාවූ චිත්තයන් ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණාදිය අරමුණු කරණ කල්හි ඒ රූපාදීන්ගේ ප්‍රත්‍යුත්පන්න වූ සතළොස් චිත්තක්ෂණය පවත්නා වූ කල්හි මනොද්වාරයට හමු නොවෙත්. මුවහ කරන ලද්ද වූ අරමුණම ප්‍රත්‍යුත්පන්න වශයෙන් මනොද්වාරයට හමුවෙත්. කලින් දක්නා ලද රූපාදිය නැවත

අරමුණු කරණු කැමැති නම්, දිට්ඨ, සුත මුත වශයෙන් ත්‍රිවිධාකාර වූ හෙවත් දක්නා ලද හෝ, අසන ලද හෝ අන් ආකාරයකින් වැදගන්නා ලද හෝ අරමුණම මනොද්වාරයට ප්‍රත්‍යුත්පන්න ආරම්මණයක් වශයෙන් හමුවන බව දත යුතුයි. වත්මන් අරමුණට ආයුෂ චිත්තක්ෂණ සතලොසක් වන බැවින්, ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණයක් ගෙණ හටගන්නා වූ මනොද්වාරික චිත්තවීථීන්ටද චිත්තක්ෂණ සතලො-සක් ගුතවන්නේය. එබැවින් ඒ චිත්ත වීථියෙහි අතීත භවඞ්ගයක් ද පහළවන්නේය.

අතීත රූප, අනාගත රූප, චිත්ත, චෛතසික, නිබ්බාණ පඤ්ඤත්ති යන මේ ආරම්මණයෝ චිත්තක්ෂණ ගණනක් දරා පවත්නා අරමුණු නොවෙති. එබැවින් එම අරමුණු මනොද්වාරයට හමුවීමේදී, පඤ්චද්වාරයෙහි මෙන් ගතවන සිත් ගණන නියම නැත. එහෙයින් එකී අරමුණක් ගෙණ උපදනා මනොද්වාරවීථින්හි අතීත භවඞ්ගයක් නැති බව දත යුතුය.

**මනොද්වාරයෙහි විෂය ප්‍රවෘත්ති දෙකෙකි**. එනම් **විභූතාරම්මණය** සහ **අවිභූතාරම්මණය** යන දෙකය. **විභූතාරම්මණය** නම් ප්‍රකට හෙවත් පැහැදිලි අරමුණය. අප්‍රකටවූ හෙවත් පැහැදිලි නොවූ අරමුණ **අවිභූතාරම්මණය** නමි. එබැවින් මනොද්වාරයට හමුවන සියලුම අරමුණු විභූත හෝ අවිභූත වන බව සැළකිය යුතුයි.

**මනොද්වාර චිත්ත වීථින්හි** උපදනා ජවනයන්ගේ වශයෙන් **මනොද්වාර වීථි දෙවැදෑරුම් වේ.** එනම් **කාමජවන වීථි** සහ **අර්පණා ජවන වීථි** යන දෙකය. එයින් **කාමාවචර ජවන් සිත් උපදනා චිත්ත වීථි කාම ජවන චිත්ත වීථි** නම් වේ. **ධ්‍යාන මාර්ගඵල ජවන් සිත් උපදනා චිත්ත වීථි අර්පණා ජවන** වීථි නම් වේ.

## මනොද්වාරික කාම ජවන චිත්ත වීථි

**මනොද්වාරික කාමජවන වීථි විභූතාරම්මණ කාමජවන වීථි අවිභූතාරම්මණ කාම ජවන වීථි** යයි දෙවැදෑරුම් වේ.

සප්ත රසායුෂ්ක හෙවත් සතලොස් චිත්තක්ෂණයකට ආයුෂ ඇති ප්‍රත්‍යුත්පන්න රූප ශබ්දාදී අරමුණක් ලැබුන කල්හි විභූතාරම්මණ

චිත්ත වීථි පසක් සහ අවිභූතාරම්මණ චිත්ත වීථි දෙකක්දැයි චිත්ත වීථි සතක්ම ලැබේ.

සප්ත රසායුෂ්ක හෙවත් සතළොස් චිත්තක්ෂණයකට ආයුෂ නැති අතීත රූප, අනාගත රූප, චිත්ත චෛතසික, නිබ්බාණ, ප්‍රඥප්ති ආදී අරමුණක් ලැබුන කල්හි විභූතාරම්මණ චිත්ත වීථියක් සහ අවිභූතාරම්මණ චිත්ත වීථියක්දැයි චිත්ත වීථි දෙකක් ලැබේ.

**සප්ත රසායුෂ්ක විභූතාරම්මණ වීථි පස**

1. සතළොස් චිත්තක්ෂණයකට ආයුෂ ඇති රූපාදී ආරම්මණ යෙක්, පඤ්චද්වාරයෙන් ගෙණ එම අරමුණ එල්බ ගෙණ පඤ්චද්වාරික චිත්ත වීථියක් හටගත් පසු, නැවත එම අරමුණ මෙනෙහි කරණ කල්හි, එම අරමුණම දිට්ඨ, සුත, මුත වශයෙන් අරමුණු කොට මනොද්වාරික චිත්ත වීථියක් හටගන්නේය. මෙසේ ගන්නා ලද අරමුණ ප්‍රකට අරමුණක් වීනම් එක් **අතීතභවඞ්ග චිත්තයක්**, භවඞ්ග කෘත්‍ය කරමින්ම ගතවන්නේය. මේ අතීත භවඞ්ග චිත්තයාගේ උත්පාදක්ෂණයේදීම එම අරමුණෙහි උත්පාදක්ෂණයද ඇති වන්නාක් මෙන් වැටහී එතැන් පටන් චිත්තක්ෂණ සතළොසක් වනතෙක් එම චිත්ත වීථිය පවත්නේය. අරමුණ ඉතා ප්‍රකට නම්, අතීත භවඞ්ගයට පසු එක් **භවඞ්ග චලනයක්** සහ එක් **භවඞ්ගුපච්ඡෙදයක් ද** ඉපිද නිරුද්ධ වේ.

මේ **භවඞ්ගුපච්ඡෙද** සිත, අභිනව අරමුණ ගැනීමට උපකාර වන්නාක් මෙන් ඉපිද නිරුද්ධ වන බැවින්, එයට මනොද්වාරය යයිද කියනු ලැබේ.

**භවඞ්ගුපච්ඡෙද චිත්තයට** අනතුරුව අලුත් අරමුණට සිත් පරම්පරාව යොමු කිරීම් වශයෙන් ආවර්ජන කෘත්‍ය සිද්ධ **කරමින්** එම අරමුණම ගෙණ මනොද්වාරාවජ්ජන සිත ඉපිද නිරුද්ධවන්නේය. මේ සිත, මනොද්වාර චිත්ත වීථියේ හට ගන්නා පළමුවෙනි වීථි සිත වේ

**මනොද්වාරාවජ්ජන සිතට** අනතුරුව, එම සිතින් නංවා දෙන ලද ආරම්මණයෙහි එල්බගෙණ **එකුන්තිස් (29) "කාමාවචර ජවන්**

**සිත්** අතුරෙන් එක් චිත්තයක් ජවන කෘත්‍යය සිද්ධකරමින් සත්වරක් ඉපිද නිරුද්ධ වේ.

**සත්වන ජවන් සිත** නිරුද්ධවූ කල්හි තදලම්බණ කෘත්‍ය සිද්ධ කරන්නාවූ එකොළොස් කාමාවචර විපාක සිත්වලින් එකක්, ජවන-යෙන් අනුභව කොට ශෙෂවූ අරමුණු රසය විඳින්නාක් මෙන් දෙවරක් ඉපිද නිරුද්ධ වේ. මේ තදලම්බණ සිත් දෙකය.

**දෙවෙනි තදලම්බණ චිත්තයාගේ** භඞ්ගයේදී රූපාරම්මණයට ගතවූ කාලය තෙළෙස් චිත්තක්ෂණයකි. තදරම්මණයන්ගෙන් විථි සිත් අවසන්වූ බැවින් මෙම චිත්ත වීථියේ ඉතිරි චිත්තක්ෂණ සතර භවඞ්ග සිත් වලින්ම පිරෙන්නේය. මේ **පළමුවෙනි විභූතාරම්මණ කාම ජවන වීථිය** වේ.

2. ආරම්මණයාගේ ප්‍රකට භාවය අඩුවී නම් **අතීත භවඞ්ග සිත්** දෙකක් ගතවන්නේය. එයට අනතුරුව පිළිවෙලින් **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරාවජ්ජනය, ජවන් සතය, තදරම්මණ දෙකය** යන තුදුස් චිත්තයෝ ඉපිද, ඉතිරි චිත්තක්ෂණ තුන **භවඞ්ග සිත්** තුනකින් පිරෙන්නේය. මෙය **දෙවෙනි විභූතාරම්මණ කාම ජවන වීථිය වේ.**

3. **තුන්වන විභූතාරම්මණ කාම ජවන වීථියෙහි, අතීත** භවඞ්ග සිත් තුනක් ගතවී **භවඞ්ගචලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරා වජ්ජනය, ජවන් සතය, තදරම්මණ දෙකය** යන පසළොස් චිත්තයන් ඉපිද නිරුද්ධවූ පසු ඉතිරි චිත්තක්ෂණ දෙක, **භවඞ්ග සිත්** දෙකෙකින් පිරී චිත්ත වීථිය අවසන් වේ.

4. **සතරවන විභූතාරම්මණ කාම ජවන** වීථියෙහි, අතීත **භවඞ්ග සිත් සතරක් ගතවී, භවඞ්ග චලනය,** භවඞ්ගුපච්ඡෙදය, මනොද් **වාරාවජ්ජනය ජවන් සතය, තදරම්මණ දෙකය** යන සොළොස් චිත්ත **යන්** ඉපිද නිරුද්ධවූ පසු ඉතිරි චිත්තක්ෂණය **භවඞ්ග** සිතකින් පිරී චිත්ත වීථිය අවසන් වේ.

5. **පස්වන විභූතාරම්මණ කාම ජවන වීථියෙහි, අතීත භවඞ්ග පසක්** ගතවී, **භවඞ්ගචලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරාවජ්ජනය ජවන් සතය, තදරම්මණ දෙකය** යන සතළොස් චිත්තයන්ම ඉපිද නිරුද්ධවූ පසු එයින්ම චිත්ත වීථිය අවසන් වේ.

මේ චිත්ත වීථි පසෙහිම **මනොද්වාරාවජ්ජනය, ජවන් සිත් සතය, තදරම්මණ සිත් දෙකය** යන වීථි චිත්තයෝ දසදෙනා බැගින් උපදින බවත්, **තදරම්මණයෝ** ඒකාන්තයෙන්ම ඇතිවන බවත් දතයුතුයි.

### සපත රසායුෂ්ක අවිභූතාරම්මණ වීථි දෙක

6. අවිභූතාරම්මණයෙක් හෙවත් අප්‍රකට අරමුණක් හමුවූ කල්හි භවඞ්ග සිත් සයක් හෝ සතක් ගත වන්නේය. **අතීත භවඞ්ග සිත් සයක් ගතවී භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරාවජ්ජනය, ජවන් සතය** යන සිත් සොළොස ඉපිද නිරුද්ධ වූ පසු ඉතිරි චිත්තක්ෂණයේදී තදරම්මණ සිත් දෙකක් ඉපදීමට අවකාශ නැති හෙයින් ඒ චිත්තක්ෂණය භවඞ්ග සිතකින්ම පිරෙන්නේය. මෙය **පළමුවෙනි අවිභූතාරම්මණ කාම ජවන වීථිය වේ.**

7. **දෙවෙනි අවිභූතාරම්මණ කාමජවන වීථියෙහි, අතීත භවඞ්ග සතක්** ගතවී, **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරාවජ්ජනය** සහ **ජවන් සත** යන සතළොස් චිත්තයන් ඉපිද නිරුද්ධවූ පසු එයින්ම චිත්තවීථිය අවසන් වේ.

### සප්තරසායුෂ්ක නොවන කාමජවන වීථි

අතීතානාගත රූප ශබ්දදිය හා චිත්ත, චෛතසික, නිබ්බාන, පඤ්ඤත්ති යනාදී අරමුණුවලට, ප්‍රත්‍යුත්පන්න දෙවිසි රූපයන්ට මෙන් ආයු කාලයක් නියම නැති හෙයින් එවැනි අරමුණක් එල්බ ගෙන පහළවන්නාවූ චිත්තවීථියක චිත්තක්ෂණ ගණනක් නියම නැත. ආරම්මණ ස්වභාවය අනුව පහළවන්නාවූ සිත් ඉපිද නිරුද්ධ වූ පසු චිත්ත වීථිය අවසන් වේ. මෙම චිත්තවීථීන්හි අතීත භවඞ්ගයන්ගේ ඉපදීමක් නැත.

මෙසේ හමුවන ආරම්මණයෝ **විභූත, අවිභූත** වශයෙන් විධවේ.

1. **විභූතාරම්මණයක්** හෙවත් ප්‍රකට අරමුණක් හමුවූ කල්හි පිළිවෙලින් **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරාවජ්ජනය ජවන් සතය** යන සිත් දසය ඉපිද නිරුද්ධ වූ පසු අරමුණු විභූත බැවින්, **තදරම්මණ සිත් දෙකක් ඉපිද** නිරුද්ධ වීමෙන් චිත්තවීථිය අවසන් වේ. මෙය **විභූතාරම්මණ චිත්ත වීථියයි.**

2. **අවිභූතාරම්මණයක්** හෙවත් අප්‍රකට අරමුණක් හමුවූ කල්හි **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරාවජ්ජනය** සහ **ජවන් සත ඉපිද** නිරුද්ධ වීමෙන්, අවිභූතාරම්මණ චිත්තවීථිය අවසන් වේ. අරමුණ අප්‍රකට බැවින් **තදරම්මණයන්ගේ** ඉපදීමෙක් නැත.

**සප්ත රසායුෂ්ක වත්මන් අරමුණක් එල්බගෙණ උපදනා කාම ජවන මනොද්වාර චිත්ත වීථි**

| | ....1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17.... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1..... | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | භ | භ... |
| 2..... | ති | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | භ... |
| 3..... | ති | ති | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ... |
| 4..... | ති | ති | ති | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ... |
| 5..... | ති | ති | ති | ති | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත... |
| 6..... | ති | ති | ති | ති | ති | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ... |
| 7..... | ති | ති | ති | ති | ති | ති | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ... |

1 සිට 5 දක්වා චිත්ත වීථි පස විභූතාරම්මණ චිත්ත වීථිය.
6 සහ 7 යන චිත්ත වීථි දෙක අවිභූතාරම්මණ චිත්ත වීථිය.

**සප්ත රසායුෂ්ක නොවන අතීතානාගතාදී අරමුණක් එල්බගෙණ උපදනා කාම ජවන මනොද්වාර චිත්තවීථි**

**විභූතාරම්මණ චිත්ත වීථිය**

.....න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත .....

**අවිභූතාරම්මණ චිත්තවීථිය**

....න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ....

මෙහි දක්වන ලද චිත්ත වීථි කාමාවචර, රූපාවචර සහ අරූපාවචර පුද්ගලයන්ට හමුවන බවත්, රූපාරූප පුද්ගල සන්තානයන්හි උපදනා කල්හි තදරම්මණ ඇති නොවන බවත් කාමපුද්ගල සන්තානයෙහි තදරම්මණ ඉපදීම හෝ නූපදීම වන බවත් දත යුතුයි.

තවද, රූපාදී අරමුණක් පඤ්චද්වාරයට හමුවන කල්හි, ඒ ආරම්මණය අනිත්‍යාදී වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ නම්, කුසල ජවන වීථියද, නිත්‍යාදී වශයෙන් නුනුවණින්මෙනෙහි කරන්නෝ නම්, අකුසල ජවන වීථියද උපදින්නේය. එයට අනතුරුව ඒ රූපාදී ආරම්මණයම අතීත වශයෙන් ගෙණ මනොද්වාරික චිත්ත වීථි තුනක් පහළ වෙති. එයින් තුන්වෙනි මනොද්වාරික චිත්ත වීථියේ උපදනා වීථි චිත්තයෝ අරමුණ, අසවල් අරමුණක් යයි හැඳින ගනී. එයට අනතුරුව ඇතිවන සතරවන මනොද්වාරික චිත්තවීථිය, අරමුණෙහි ඇලීම, පැහැදීම, කිපීම, මුලාවීම වශයෙන් කුසලාකුසල ජවනයන් ඇතිව පහළ වන්නේය. මෙසේ එක් වර්තමාන අරමුණක් හමුවූ කල්හි, පළමුකොට එක් පඤ්චද්වාරික චිත්ත වීථියක්ද, එයට අනතුරුව පිළිවෙලින් මනොද්වාරික චිත්තවීථි සතරක්දැයි චිත්තවීථි පසක්ම පහළවන බවත්, මේ චිත්ත වීථි පසෙන්, සතරවැනිව උපදින මනොද්වාරික චිත්ත වීථියෙන් අරමුණ හැඳිනගෙණ, පස්වැනිව හටගන්නාවූ සිව්වැනි මනොද්වාරික චිත්ත වීථියෙන්, අර්ථසාධක ජවන් පහළවී කුසල් හෝ අකුසල් කර්මපථ වුවත් සිද්ධකර ගත හැකි බවද දත යුතුයි.

**මේ චිත්තවීථි පස ඇතිවන පිළිවෙල මෙසේයි:—**

1. වර්තමාන අතිමහන්තාරම්මණ රූප අරමුණක් හමුවූ කල්හි පළමුකොට අතිමහන්තාරම්මණ චක්ඛුද්වාරික චිත්ත වීථියක් පහළ වන්නේය. ඒ මෙසේයි:—

V

... භ ත ද පං ච සං ණ වො ජ ජ ජ ජ ජ ජ ජ ත ත...

මෙහි පංචද්වාරාවජ්ජනය සිට දෙවෙනි තදරම්මණය දක්වා ලැබෙන ද්වාරික සිත්, ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය අරමුණු කරයි.

2. දෙවැනිව උපදින, පළමුවන මනොද්වාරික චිත්ත වීථියේ උපදනා වීථි සිත්, එම වර්තමාන අරමුණම අතීත කාලික වශයෙන් ගෙණ උපදින්නේය.

....න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත....

3. තුන්වැනිව උපදින, දෙවන මනොද්වාරික චිත්ත වීථියෙහි, නීලාදී වශයෙන් සළකන ලද අතීත රූපාරම්මණය ගෙන උපදින වීථි සිත් පහළ වන්නේය.

....න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත ....

4. සතරවැනිව හටගන්නා තුන්වන මනොද්වාරික චිත්ත වීථියෙහි ස්ත්‍රී පුරුෂ හෝ, වස්තු භාණ්ඩාදී වශයෙන් හෝ, ප්‍රඥප්තිය අරමුණු කොට උපදින වීථි සිත් පහළ වේ. අරමුණ කුමක් දැයි හැඳිනගන්නේ මේ චිත්ත වීථියෙනි.

...න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත...

5. පස්වැනිව හටගන්නා සතරවන මනොද්වාරික චිත්ත වීථිය, රූපාරම්මණ අර්ථ ප්‍රඥප්තීන්ගෙන් එකක් අරමුණු කොට ගෙණ පහළවේ. එහි උපදනා ජවන් සිත්, පැහැදීම්, ඇලීම, කිපීම, මුළාවීම් ආදී කෘත්‍යයන්ගෙන් එකක් සිද්ධ කරන්නේය. අර්ථ සාධක වන්නේ මේ පස්වැනි චිත්ත වීථියේ ජවන් පමණය. පළමු වීථි සිත් සතරෙහි උපදනා ජවන් විසි අටම අර්ථසාධක නො වන්නාවූ, ප්‍රවෘත්ති විපාක මාත්‍රයක්ම ගෙනදෙන්නාවූ කර්ම වන්නා හුය.

මේ රූපාරම්මණයට කියන ලද පරිද්දෙන්ම ඉතිරි වර්තමාන ශබ්දදී අරමුණු ගෙන උපදනා චිත්ත වීථිහු දත යුතුයි.

# නිද්‍රාව හා ස්වප්න

චිත්ත චෛතසිකයන්ගේ ගිලන් බව, අලස බව, මැලි බව හේතුකොට ගෙන හෝ ගමනාදී ඉරියව් පැවැත්වීමෙන්ද, ගිලන් වීමෙන්ද ඇතිවන ශරීර පීඩාව සංසිඳවීම පිණිස ශරීරයට විවේකය ගෙනදීමට හෝ **නිද්‍රාව** ඇතිවන්නේය. මෙසේ නිද්‍රාවට පැමිණෙන පුද්ගලයාහට මනොද්වාරික චිත්තවීථියක් ඉපිද, ඉන්පසු භවඞ්ග පාතය වී නින්දට පැමිණෙන්නේය. කිසිවිටෙකත් පඤ්චද්වාරික චිත්තවීථියකින් නිද්‍රාවට නොපැමිණේ. නිද සිට පිබිදෙන කල්හිද පඤ්චද්වාරික චිත්ත වීථියකින් නොව මනොද්වාරික චිත්ත වීථියකින්ම පිබිදෙන්නේය.

**ස්වප්න** දක්නා පුද්ගලයාද මනොද්වාරික චිත්ත වීථියකින්ම ස්වප්න දකී. වරින් වර නිදමින් පිබිදෙමින් ගතවන අවස්ථාවට **කපිමිද්ධ කපිනින්ද** හෙවත් **වඳුරු නින්ද** යයි කියති. මේ කපිනිද්‍රා සමයේදී, අශෛක්ෂයන් හැර, ශෛක්ෂ පෘථග්ජන පුද්ගලයෝම ස්වප්න දකින්නාහුය. මෙසේ සිහින දක්නා කල්හි මනොද්වාරික චිත්ත වීථි පහළවී කුසලාකුසල ජවනයන්ද ඇතිවිය හැකියි. එවිට කාමාවචර මනොද්වාරික චිත්තවීථි, තදරම්මණ ඇතිව හෝ නැතිව හෝ හටගනිත්. ඇතැම් විට ජවන, තදරම්මණ නූපදනා දුර්වල ස්වප්න දක්නා මනොද්වාරික චිත්තවීථි පහළවන කල්හි, මනොද්වාරාවජ්ජන සිත දෙතුන්වරක් ඉපිද නිරුද්ධ වී භවඞ්ගපාතය වන්නේය.

.....න ද ම ම භ භ.....

එසේ උපදනා මනොද්වාරික චිත්ත වීථීන්හි ඇතිවන කුසලාකුසල ජවනයෝ ඉතා දුර්වල බැවින් ප්‍රවෘත්ති විපාක පමණක්ම ගෙන දෙන බව සැළකිය යුතුයි.

# අර්පණා ජවන වීථි

**අර්පණා යනු මහග්ගත ලොකොත්තර ජවන් සිත්වලට නමෙකි.** එනම්:–රූපාවචර කුසල් සිත් පසත්, ක්‍රියා සිත් පසත්, අරූපාවචර කුසල් සිත් සතරත්, ක්‍රියා සිත් සතරත්, ලොකොත්තර මාර්ග

**සතරත්, ඵල සතරත්** යන සවිසි (26) **චිත්තයෝ යි. සසම්ප්‍රයුක්ත වූ චිත්තය** අරමුණට පමුණුවන අර්ථයෙන් **අර්පණා** නම් වේ. එය **විතර්කයාගේ** පර්‍යායය විශෙෂයකි.

මෙකී **අර්පණා** නම්වූ ජවන් සිත් පහළවන **මනොද්වාර චිත්ත වීථි, අර්පණාජවන වීථි** නමි.

ලෞකික ධ්‍යානයන් හෝ ලොකොත්තර මාර්ගයන් හෝ වඩනා කල්හි, චිත්තෙකග්ගතා නම් වූ බලවත් සමාධිය ඇතිවන බැවින්, ඒ සිත්වලට හමුවන අරමුණු ඉතා ප්‍රකට අරමුණු වෙත්. එබැවින් **අර්පණා ජවන වීථිවල විභූතාරම්මණ** මිස අවිභූතාරම්මණ වීථි නොලැබේ. කාමාවචර සත්ත්වයන්ට කාමාවචර අරමුණක් එල්බගෙණ හටගන්නා, කාමාවචර ජවන් සිත් පහළවන චිත්ත **වීථීන්හි** පමණක් යෙදෙන තදරම්මණ සිත්, අර්පණා ජවන වීථීන්හි නොලැබේ.

**අර්පණා ජවන** විථි තුන්වැදෑරුම් වේ. එනම්:

1. ධ්‍යාන වීථි
2. **මාර්ග වීථි**
3. **සමාපත්ති වීථි**

**අෂ්ට සමාපත්ති**, මාර්ගඵලාදි **උත්තරිමනුෂ්‍ය ධර්මයන්** ඉපද **වීමට** පූර්වභාගයෙහිදී, පළමුකොට ප්‍රථම ධ්‍යානය උපදවා ගතයුතුවේ. **ඒ ප්‍රථම** ධ්‍යානය, **ආවජ්ජන, සමාපජ්ජන, අධිෂ්ඨාන, උට්ඨාන, ප්‍රත්‍යවෙක්ඛණ** යන පඤ්ච වසිතාවන්ගේ වශයෙන් පුරුදු කොට ගෙණ, ඒ ප්‍රථම ධ්‍යානයාගේම උපකාරයෙන් **අෂ්ට සමාපත්ති** උපදවාගනු ලැබේ.

ඒ පරිද්දෙන්ම, ප්‍රථම ධ්‍යානය පටන් පඤ්චම ධ්‍යානය දක්වා **සියලු** රූපාවචර ධ්‍යානයන් උපදවා, පඤ්ච වසිතාවෙන් පුරුදුකොට ගෙණ , නැවත **පඤ්චම**ධ්‍යානයාගේම පඤ්චාභිඥවෝ උපදවාගන්නා **හුය.**

තවද, ඒ ප්‍රථමධ්‍යානාදී ධ්‍යානයකට සමවැද, එයින් නැගිට ධ්‍යානය පාදක කොට ගෙන හෝ, පාදකකොට නොගෙන හෝ, ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් සම්මර්ශනය කොට, **සෝවාන් ආදී මාර්ගඵලයන්ට** පැමිණිය යුතුය.

තවද, ඒ ප්‍රථම ධ්‍යානය උපදවාගෙන, එතැන් පටන් අනිකුත් රූපාවචර, අරූපාවචර ධ්‍යානයන් පිළිවෙලින් උපදවා, අෂ්ට සමාපත්තින්ට සමවැද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානලාභී ආර්‍ය්‍ය පුද්ගල තෙමේ චිත්තප්‍රවෘත්තිය නිරුද්ධ කිරීමෙන් **සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට** සමවදනේය.

මෙසේ ප්‍රථමධ්‍යානය පටන් නිරොධ සමාපත්තිය අවසන් කොට ඇති සියලු උත්තරිමනුෂ්‍ය ධර්මයන් උපදවා ගැනීමට විතර්ක සඞ්ඛ්‍යාත අර්පණාව ප්‍රධාන ධර්මය වේ. එසේ හෙයින් සියලු උත්තරීමනුෂ්‍ය ධර්මයන්ටද **අර්පණා** යන නාමය ව්‍යවහාරවේ.

## ධ්‍යාන චිත්ත වීථි

**රූපාවචර අර්පණා ධ්‍යානය** වනාහී, **ප්‍රථමධ්‍යානය**, **ද්‍විතියධ්‍යානය**, **තතියධ්‍යානය**, **චතුත්ථධ්‍යානය**, **පඤ්චමධ්‍යානය** යයි පස්වැදෑරුම් වේ. පෘථග්ජන හා **ශෛක්ෂ** (නොරහත්) **පුද්ගල** සන්තානයන්හි රූපාවචර ධ්‍යාන **කුසල් සිත්** පසත්, අශෛක්ෂ (රහත්) **පුද්ගල** සන්තානයෙහි **රූපාවචර ධ්‍යාන ක්‍රියා** සිත් **පසත්** යන ධ්‍යාන සිත් දසය, අර්පණා **ජවන් වශයෙන්** රූපාවචර ධ්‍යාන චිත්ත වීථින්හි පහළ වන්නේය.

**ධ්‍යාන** උපදවනු කැමැති පුද්ගලතෙමේ, **විපාකාවරණ**, **කර්මාවරණ ක්ලෙශාවරණ** සඞ්ඛ්‍යාත ආවරණත්‍රයෙන් මුවහ නොවූ, ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලැබූ කල්‍යාණ පෘථග්ජනයෙක්ව, ධ්‍යාන **ලාභී ආචාර්‍ය්‍ය** වරයෙකු කරා එළඹ, පළමුකොට සතර සංවර සීලයෙන් **පිරිසුදුවී**, ඒ ආචාර්‍ය්‍යයන් වහන්සේ ගෙන් උපනිශ්‍රය ලැබ, සුදුසු සෙනසුනක් දැන, භාවනා කර්මයට යොග්‍ය අරමුණක් හෙවත් **කර්මස්ථානයක්** ලබාගෙණ, ධ්‍යානය පිණිස වීර්‍ය්‍ය කටයුතු වේ.

## කර්මස්ථාන

ධ්‍යාන සිත් අතුරෙන් **ප්‍රථමධ්‍යාන කුසල විපාක ක්‍රියා** චිත්තයෝ වනාහි **දසකසිණය, දසඅසුභය, කායගතාසතියට** අරමුණු වන්නාවූ **කෙශාදි කාය කොට්ඨාශ ප්‍රඥප්තිය, ආනාපාන සතියට** අරමුණු වන්නාවූ **ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, මෙත්තා, කරුණා, මුදිතා** සඞ්ඛ්‍යාත බ්‍රහ්ම විහාරත්‍රයට අරමුණු වන්නාවූ **අනන්ත සත්ත්ව ප්‍රඥප්තිය** යන පස්විසි (25) **ප්‍රඥප්ති** ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාත ධම්මාරම්මණයන් අතුරෙන් එක් අරමුණක් එල්බ ගෙණ හටගනිත්.

**ද්‍විතිය, තතිය, චතුත්ථධ්‍යාන කුසල විපාක ක්‍රියා** චිත්තයෝ, **දසකසිණය, ආනාපාන සතියට** අරමුණු වන්නාවූ **ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, මෙත්තා, කරුණා මුදිතා**, සඞ්ඛ්‍යාත බ්‍රහ්ම විහාරත්‍රයට අරමුණු වන්නාවූ **අනන්ත සත්ත්ව ප්‍රඥප්තිය**, යන තුදුස් (14) **ප්‍රඥප්ති** ප්‍රතිභාග නිමිත්ත සංඛ්‍යාත ධම්මාරම්මණයන් අතුරෙන් එක් අරමුණක් එල්බගෙණ හටගනිත්.

අභිඥ වශයෙන් නොපවත්නාවූ **පඤ්චමධ්‍යාන කුසල විපාක ක්‍රියා චිත්තයෝ, දසකසිණය**, ආනාපාන සතියට අරමුණු වන්නාවූ **ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, උපෙක්ෂා බ්‍රහ්ම විහාරයට** අරමුණු වන්නාවූ **අනන්ත සත්ත්ව ප්‍රඥප්තිය** යන දෙළොස් **ප්‍රඥප්ති** ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාත ධම්මාරම්මණයන් අතුරෙන් එක් අරමුණක් එල්බගෙණ හටගනිත්.

**සතර අරූපධ්‍යාන** අතුරෙන් **ආකාශානඤ්චායතන කුසල විපාක, ක්‍රියා ධ්‍යානයෝ** වනාහි **ආකාශ කසිණය** තොර කොට ඇති **නව කසිණයන්** අතුරෙන් එක් කසිණයක් උගුලුවා ලබන ලද **ආකාශ ප්‍රඥප්තිය** අරමුණු කොටගෙණ හටගනිත්.

**විඤ්ඤාණඤ්චායතන කුසල** හා **විපාකධ්‍යානයෝ** මේ වර්ත්මාන **භවයෙහිද**, අනන්තර පූර්ව භවයෙහිද අධ්‍යාත්මසන්තානයෙහි උපන්විරූ **ආකාශානඤ්චායතනන කුසල චිත්ත සඞ්ඛ්‍යාත මහග්ගතා රම්මණය** එල්බගෙණ හටගනිත්.

**විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තය** වනාහි මේ භවයෙහිද, අනතුරු පෙර භවයෙහිද, තම සන්තානයෙහි උපන් **ආකාශානඤ්චායතන කුසල චිත්තයද**, මේ භවයෙහි තම සතන්හි උපන් **ආකාශානඤ්චායතන ක්‍රියා චිත්තයද** යන මහග්ගතාරම්මණය එල්බගෙණ හටගනිත්.

**ආකිඤ්චඤ්ඤායතන කුසල විපාක ධ්‍යානයෝ** වනාහි **ආකාශානඤ්චායතන කුසල චිත්තයාගේ නත්ථිභාව සඞ්ඛ්‍යාත අභාව ප්‍රඥප්තිය** අරමුණු කොටගෙණ හටගනිත්.

**ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තය,** ආකාශානඤ්චායතන **කුසල ක්‍රියා චිත්තයන්ගේ අභාව ප්‍රඥප්තිය අරමුණු කොටගෙණ** හටගණී.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල විපාකධ්‍යානයෝ මේ** වර්තමාන භවයෙහිද අනතුරු පෙර භවයෙහිද, අධ්‍යාත්ම සන්තානයෙහි උපන් **ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්ත සඞ්ඛ්‍යාත මහග්ගතාරම්මණය** එල්බගෙණ හටගණිත්.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තය** වනාහී මේ භවයෙහිද අනතුරු පෙර භවයෙහිද තම සතන්හි උපන් **ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තයද** මේ භවයෙන් තම සන්තානයෙහි උපන් **ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තයද** යන මහග්ගතාරම්මණය එල්බගෙණ හට ගණිත්.

භාවනානුයොගී පුද්ගලතෙමේ, මෙකී කමටහන් අතුරෙන් තම චරිතයට යොග්‍ය වූ අරමුණක් ලබාගෙණ භාවනා කරණ කල්හි, ඔහුට ධ්‍යාන ලැබීමට හේතු සම්පත් ඇත්තේවීනම්, ඔහුගේ **භවඞ්ග** චිත්තය ඤාණ සම්ප්‍රයුක්ත මහා විපාක සිත් සතරින් එකක්ම වන්නේය. භාවනාව සඵල වූ කල්හි,ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාත ධම්මාරම්මණය එල්බ ගෙණ චිත්ත වීථිය හටගැණීමේදී පළමුකොට **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡේදය,** යන භවඞ්ග සිත් දෙක ඉපිද නිරුද්ධවූ පසු, ප්‍රතිභාග නිමිත්ත එල්බගෙණ **මනොද්වාරාවජ්ජන සිත එක්වරක්** ඉපිද නිරුද්ධ වේ. ඊට අනතුරුව ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර මහා කුසල් සිත් සතරින් එක් චිත්තයක් **පරිකර්ම,**

**උපචාර**, **අනුලෝම**, **ගොත්‍රභූ** යන නමින් සතර වරක් ඉපිද නිරුද්ධ වන්නේය. එයට අනතුරුව **අර්පණා** හෙවත් **ධ්‍යාන** සිත **එක්** වරක් ඉපිද නිරුද්ධ වීමෙන් පසු චිත්ත සන්තතිය නැවත භවඞ්ග **වේ.**

**පරිකර්මාදි** මේ සිත් සතර, ඉතාමත්ම පිරිසුදුවූ කාමාවචර කුසල් සිත් සතරකි. භාවනාමය කුසල කර්මය සිද්ධ කරන්නාවූ මේ සිත් සතරින් පළමුවෙනි සිත අර්පණාවට සිත පිළියෙල කිරීම් වශයෙන් පහළවන බැවින් එයට **පරිකර්ම සිත** යයි කියනු ලැබේ. එයට අනතුරුව උපදනා මහා කුසල් සිත, අර්පණාවට ඉතා නුදුරුවූද, ඉතා නොලංවූද අර්පණාවට සමීපව පිහිටි හෙයින් **උපචාර** සිත යයි ව්‍යවහාර වේ. එයට අනතුරුව උපදින සිත අර්පණා නොවූවත් එයට අනුකූල බව ඇති හෙයින් **අනුලොම** යන නමින් හැඳින්වේ. මෙසේ මහා කුසල් සිත් තුනෙකින් පිළියෙලවී අර්පණාවට ලංකොට එයටම අනුකූලව වන සේ යෙදෙමින් නිරුද්ධ වූ කල්හි, කාමගොත්‍රයෙන් එතර කරවමින් අර්පණාවට පමුණුවන්නාවූ **ගොත්‍රභූ චිත්තය** ඉපිද නිරුද්ධ වේ.

**කාම ගොත්‍රය** හෙවත් කාමලොකයට අයත් බවය, **පෘථග්ජන ගොත්‍රය,** හෙවත් පෘථග්ජන බවය යයි **ගොත්‍ර දෙකෙකි, ධ්‍යානයෝ** රූපාරූප බ්‍රහ්ම ලොක වලට ඇතුළත් බැවින් කාම බවෙන් වෙන්වම ලබාගත යුතු වේ. එබැවින් රූපාරූප ධ්‍යාන සිත් ඉපැද්-වීමට පෙර, **කාම භවය** හෙවත් කාම ගොත්‍රය තාවකාලික වශයෙන් වත් නැසිය යුතු වේ. එබැවින් ධ්‍යාන චිත්තයට පළමුව උපදනා සිත **කාම ගොත්‍රය** නැසීම කරණ හෙයින් එයට **ගොත්‍රභූ** සිත යයි කියනු ලැබේ.

ආර්‍ය්‍ය භාවයට හෙවත් සෝවාන් මාර්ගයට පැමිණීමට පෙර **පෘථග්ජන ගොත්‍රය** නැසිය යුතු වේ. ඒ නැසීම, ධ්‍යානයට පළමුව කාම ගොත්‍රය නැසීම මෙන් නොව, පෘථග්ජන ගොත්‍රයට නැවත නොපැමිණෙන සේ නැසීමය. එබැවින් මාර්ග චිත්ත වීථියෙහි යෙදෙන ගොත්‍රභූ සිත **පෘථග්ජන ගොත්‍රය** නසමින් **ආර්‍ය්‍ය භාවයට** පමුණුවන කාමාවචර මහා කුසල් සිතක් බව දත යුතුයි.

**අර්පණා චිත්ත වීථියෙහි** යෙදෙන්නාවූ මේ කාමාවචර මහා කුසල් සිත් සතරට **උපචාර සමාධිය** යයි ද **උපචාර භාවනායයි** ද, කියනු ලැබේ. ඒ සිත් අර්පණාවට ඉතා සමීපව පහළවන බැවින් **උපචාර සමාධිය** නම් වේ. **උපචාර සමාධිය** ලැබීමත් සමගම අර්පණා සමාධියද ලැබෙන බව දතයුතුයි.

තවද, **පරිකර්ම, උපචාර, අනුලොම** යන නමින් උපදනා කාමාවචර කුසල් සිත් තුනට **ආසේවන සිත්** යයි ද, **පරිකර්ම සිත්** යයි ද **උපචාර සිත්** යයි ද, **අනුලොම සිත්** යයි ද කියනු ලැබේ.

**ගොත්‍රභූ චිත්තය** ඉපිද නිරුද්ධවූ පසු භාවනා අරමුණවූ ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාත ධම්මාරම්මණය ගෙණ **ප්‍රථමධ්‍යාන සිත** උපදී. මේ **ප්‍රථමධ්‍යාන චිත්තය** වනාහී, කාම භවයෙහි බැඳ තබන්නාවූද ධ්‍යානය වළක්වන්නාවූද, **කාමච්ඡන්දය, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා** යන පඤ්ච නීවරණ ධර්මයන් විෂ්කම්භණ වශයෙන් ප්‍රහාණය කිරීමට උපකාර වන්නාවූ, **විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සඞ්ඛ්‍යාත ධ්‍යානාඞ්ග පසකින්** යුක්තව පහළවන්නාවූ **ධ්‍යාන සිතකි.** මෙයට **අර්පණා සිත** යයි ද කියනු ලැබේ. මෙසේ අර්පණා චිත්තයක්වූ පළමුවෙනි ධ්‍යාන සිත එක්වරක් ඉපිද නිරුද්ධවූ පසු, නැවත භවඞ්ග චිත්ත පරම්පරාව පහළ වන්නේය.

**මන්දප්‍රාඥ, තික්ඛප්‍රාඥ** යන පුද්ගලයන් අතුරෙන් **තික්ඛ ප්‍රාඥ** නම්වූ තීක්ෂ්ණ නුවණක් ඇති, වහා සිත එකඟ කර ගැනීමට ශක්තිය ඇති පුද්ගලයා හට නැවත නැවත මේ ධ්‍යානය උපදවමින් පුරුදුවූ කල්හි ඔහුගේ සන්තානයෙහි පහළ වන්නාවූ අර්පණා චිත්ත වීථියේ, ධ්‍යාන සිතට පූර්වභාගයෙහි ඇතිවන මහා කුසල් සිත් සතර අතුරෙන් **පරිකර්ම සිත** හට නොගන්නේය. **භවඞ්ග චලන, භවඞ්ගුපච්ඡේද මනොද්වාරාවජ්ජන** චිත්තයන්ට අනතුරුව **උපචාර, අනුලොම ගොත්‍රභූ** යන සිත් තුන පමණක් පහළවී ධ්‍යාන සිත හට ගන්නේය. **මන්ද ප්‍රාඥයා හට** වනාහී **පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ** යන සිත් සතරම පහළ වන්නාහ.

**ප්‍රථමධ්‍යාන ලාභී පුද්ගල** තෙමේ ඒ ධ්‍යානය **ආවජ්ජන වසී සමාපජ්ජන වසී, අධිට්ඨාන වසී, උට්ඨාන වසී, පච්චවෙක්ඛණ වසී**

යන පස් ආකාරයෙන් පුරුදුකොට, ඒ ප්‍රථමධ්‍යාන සිත, කාමාවචර චිත්තයන්ට ආසන්න බැවින්ද, පඤ්චනීවරණ ධර්මයන් නැවත නැවත මතුවීමට අවකාශ ඇති බැවින්ද, ප්‍රථමධ්‍යානයෙහි දෙස් දැක, **දෙවෙනි ධ්‍යානය** උපදවාගනු කැමැතිව, නැවතත් පුරුදු කර්මස්ථානය ගෙණ භාවනාකොට **රූපාවචර ද්‍රුතියජ්ඣානය** උපදවා ගන්නේය.

**දෙවෙනි ධ්‍යාන සිත** උපදින චිත්ත වීථියේද, පළමුවෙන් **භවඞ්ග චලනය**, **භවඞ්ගුපච්ඡේදය**, **මනොද්වාරාවජ්ජනය**, **පරිකර්ම**, **උපචාර අනුලොම**, **ගොත්‍රභූ** යන සිත් ඉපිද නිරුද්ධවූ කල්හි, **විචාර**, **පීති**, **සුඛ**, **එකග්ගතා** යන ධ්‍යානාඞ්ග සතරින් යුත් **ද්‍රුතියජ්ඣාන අර්පණා චිත්තය** එක්වරක් ඉපිද නිරුද්ධ වීමෙන් චිත්ත වීථිය අවසන් වේ.

නැවත, ඒ **ද්‍රුතියධ්‍යානයද**, පඤ්චවසිතාවෙන් පුරුදු කොට ගෙණ නැවත නැවතත් භාවනා වඩනා කල්හි ඒද්‍රුතියධ්‍යානයාගේ දෙස් දැක **තුන්වෙනි ධ්‍යානය** උපදවාගනු කැමැතිව වීයඊ වඩන්නේය. එසේ වඩනා ලද භාවනාව සම්පූර්ණවූ කල්හි, පළමුකී පරිද්දෙන් නැවතත් අර්පණා චිත්ත වීථියක් පහළවන්නේය. එහි උපදනා අර්පණා සිත හෙවත් **තුන්වෙනි ධ්‍යාන සිත**, **විතක්ක විචාර** යන ධ්‍යානාඞ්ග දෙක හැර ඉතිරිවූ **පීති**, **සුඛ**, **එකග්ගතා** යන ධ්‍යානාඞ්ග තුනෙන් යුක්ත වන්නේය.

මෙයින් තෘප්තියකට නොපැමිණි යොගාවචර තෙමේ තමන් ලත් ධ්‍යානය පඤ්චවසිතාවෙන් පුරුදුකොටගෙණ **සතරවෙනි පස් වෙනි ධ්‍යානයන්** පළමුකී පරිදි පිළිවෙලින් උපදවා ගන්නේය. **සතරවෙනි ධ්‍යාන සිතෙහි සුඛ**, **එකග්ගතා** යන ධ්‍යානාඞ්ග දෙක ද **පස්වන ධ්‍යාන සිතෙහි උපෙක්ඛා**, **එකග්ගතා** යන ධ්‍යානාඞ්ග දෙකද පහළවන බව දත යුතුයි.

**අරූපාවචර ධ්‍යාන** උපදවන කල්හිද, මෙයට සමාන අර්පණා චිත්ත වීථි පහළ වන්නාහ. **අරූපාවචර ධ්‍යානයෝ** පඤ්චමධ්‍යාන සඞ්ඛ්‍යාවට ගැනෙන බැවින් එහි යෙදෙන ධ්‍යානාඞ්ගයෝ දෙදෙනා නම් **උපෙක්ඛා**, **එකග්ගතා** යන ධ්‍යානාඞ්ගයෝය.

මන්දප්‍රාඥයා හට උපදනා අර්පණා චිත්ත වීථිය මෙසේයි:—

...න ද ම ප උ නු ගො ඣා ...

තික්ඛප්‍රාඥයා හට උපදනා අර්පණා චිත්ත වීථිය නම්:—

...න ද ම උ නු ගො ඣා ...

ඒ ඒ ධ්‍යානයන්ට අනතුරුව, එක් ධ්‍යානාඞ්ගයකට එක් **ප්‍රත්‍යවෙක්ෂා ජවන වීථියක්** බැගින් ලැබෙන්නේය. එවිට **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්වාරාවජ්ජනය** යන සිත් තුන ඉපිද නිරුද්ධවූ කල්හි, ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරින් එකක් **ජවන්** වශයෙන් **එම ධ්‍යානාඞ්ගයක්** අරමුණු කරමින් පස් වරක් පිළිවෙලින් ඉපිද නිරුද්ධ වන්නේය. **පස්වන ජවනයට** අනතුරුව භවඞ්ගපාතය වීමෙන් **එක් ප්‍රත්‍යවෙක්ෂා ජවන වීථියක්** අවසන් වේ. මේ ක්‍රමයෙන් සියළුම ධ්‍යානාඞ්ගයන් අරමුණු කරන්නාවූ ප්‍රත්‍ය වෙක්ෂා ජවන වීථි ඒ ඒ ධ්‍යානයන්ට අනතුරුව **පහළ** වන බව දතයුතුයි.

## මාර්ග චිත්ත වීථි

**ලෝකොත්තර මාර්ග සිත් හා ඵල සිත් උපදින චිත්ත වීථි මාර්ග චිත්ත වීථි** නම්. එක් පුද්ගල සන්තානයෙක්හි මේ **මාර්ග චිත්ත වීථි** සතරක් මිස එයට වැඩි ගණනක් නූපදී. එනම් **සොවාන් මාර්ග වීථිය, සකෘදගාමි මාර්ග වීථිය, අනාගාමි මාර්ග වීථිය, අර්හත් මාර්ග වීථිය** යන **මාර්ග චිත්ත වීථි** සතරය.

**ලොකොත්කර මාර්ග** ඵල උපදවන පුද්ගලයෝ දෙදෙනෙකි. එනම් **ශුෂ්ක විදර්ශක පුද්ගලයා** සහ **සමථයානික පුද්ගලයා** යන දෙදෙනාය.

**ප්‍රථමධ්‍යානය, ද්‍විතියධ්‍යානය, තතියධ්‍යානය, චතුත්ථධ්‍යානය, පඤ්චමධ්‍යානය** යන ධ්‍යාන පසෙන් යම්කිසි එක් ධ්‍යානයක් හෝ වැඩි ගණනක් හෝ උපදවා එයින් එක් ධ්‍යානයක් උපකාර කොට

ගෙන නොහොත් ධ්‍යානයෙහි අන්තර්ගත අඞ්ගයන්ට ඇතුළත් ධර්මයන් විදර්ශනා වශයෙන් වඩා, මාර්ගඵල උපදවන පුද්ගල තෙමේ, **සමථයානික ආයසී පුද්ගල** නම් වේ. ඒ පුද්ගලයන් හට ලැබෙන මාර්ගඵල සිත් ලොකොත්තර ධ්‍යාන සිත් සතළිසට ඇතුළත් වේ.

**ශුෂ්ක විදර්ශක පුද්ගලයා** වනාහි ධ්‍යානය පාදකකොට නො ගෙන විදර්ශනා වඩා මාර්ග ඵලයන්ට පැමිණෙන ආයසී පුද්ගල යාය. මේ පුද්ගලයා හට ලැබෙන්නේ ලොකොත්තර මාර්ගඵල සිත් අටෙන් එක් මාර්ග සිතක් හා එක් ඵල සිතකි.

මේ ධ්‍යානය වනාහී **පාදකධ්‍යානය, සම්මසිතධ්‍යානය, පුද්ගල ධ්‍යාශය ධ්‍යානය** යයි තුන් වැදැරුම් වේ.

ධ්‍යාන ලාභී පුද්ගලතෙමේ, සොවාන් ආදී මාර්ගයක් ලබනු කැමැති කල්හි, ඒ ධ්‍යානය බොහෝ කලක් පඤ්චවසිතාවෙන් පුරුදු කොට, නිතර නිතර ධ්‍යානය උපදවා ගැණීමට ශක්තිය ඇති කල්හි, ධ්‍යාන සමාපත්තියට සමවැද, ඒ සමාපත්තියෙන් නැගිට, **ඒ** ධ්‍යානයෙහි අන්තර්ගත අරූප වූ, නාම ධර්මයන් **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** වශයෙන් විදර්ශනා වඩා මාර්ගඵල උපදවා ගන්නේය. එයට පාදක ධ්‍යානය යයි කියති.

**සම්මසිතධ්‍යානය** වනාහී හැකිතාක් ධ්‍යාන උපදවා එයින් යම් ධ්‍යානයකට සමවැද, අනික් ධ්‍යානයක් සම්මර්ශනය කොට විදර්ශනා වඩා පෙර මෙන්ම මාර්ග ඵලයන් ලැබීමය.

**පුද්ගලධ්‍යාශය ධ්‍යානය** වනාහි, ධ්‍යාන ලාභී පුද්ගල තෙමේ යම් ධ්‍යානයකට බඳුවූ මාර්ග ඵලයක් ලබම්හයි අදහස් කොට විදර්ශනා වැඩූයේවී නම්, ඒ ධ්‍යානයට බඳු මාර්ග ඵලයන් ලැබීමය.

මෙකී පුද්ගලයෝ **පාදකධ්‍යාන වශයෙන්** හෝ, **සම්මසිතධ්‍යාන වශයෙන්** හෝ, **පුද්ගලධ්‍යාශය ධ්‍යානය වශයෙන්** හෝ යම් ධ්‍යාන යක් උපකාර කොට ගෙන විදර්ශනා වඩා මාර්ග ඵල ලබන කල්හි, **ඒ** ඒ ධ්‍යානයන්ට සමාන වූ අඞ්ග හා යෙදුනු මාර්ග ඵල ලබන්නාහුය.

**මෙකී** ත්‍රිවිධාකාරයම ධ්‍යාන ලාභීන්ට මුත් ශුෂ්ක විදර්ශකයන්ට නොලැබේ. එසේද වුවත්, ශුෂ්ක විදර්ශකයා විසින් ලබන්නාවූ මාර්ගය, ඒකාන්තයෙන්ම, ප්‍රථමධ්‍යානයට සමාන වූ අඞ්ග පස කින් යුක්ත වන බැවින් **ශුෂ්ක විදර්ශකයාහට හෝ සමථයානිකයා හට හෝ ලැබෙන්නාවූ මාර්ගය ඒකාන්තයෙන්ම ධ්‍යානාඞ්ගයන් ගෙන් යුක්ත වන්නේමය.**

නිර්වාණාවබොධය පිණිස වීර්‍ය්‍ය වඩන හැම පුද්ගලයෙකු විසින්ම **ශීල, සමාධි, ප්‍රඥා** යන ධර්මයන් පිළිවෙලින් වඩා කෙළෙ සුන් කෙරෙන් දුරුවිය යුතුය. පිරිසුදු **සීලයෙහි** නොපිහිටා ලබා ගතහැකි **සමාධියක්** නැත්තේය. **සමාධිය** නැති සිතක **විදර්ශනා ඥානය** පහළ නොවන්නේය. **විදර්ශනා ඥානයෙන්** තොරව ලබා ගත හැකි **ලොකොත්තර මාර්ග ඵලයක්** නැත්තේය. එබැවින් මාර්ග ඵලයන්ට පැමිණෙනු කැමති හැම පුද්ගලයෙකු විසින්ම මේ ඒකායන මාර්ගය වැඩිය යුතු වේ.

සසරදී ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලෙහි දන ශීලාදී පින්කම් කොට තියුණු කරණ ලද **ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, සති, සමාධි, ප්‍රඥා,** සඞ්ඛ්‍යාත පඤ්චෙන්ද්‍රියයන්ගෙන් යුක්තව, පිරූ පෙරුම් ඇතිව, විපාකාවරණ, **කම්මාවරණ, ක්ලේශාවරණ** යන්ගෙන් මිදී **ත්‍රි හේතුක ප්‍රතිසන්ධියක්ම** ලැබ, **සම්‍යග්දෘෂ්ටියෙහි** පිහිටා **පතිරූපදෙශ වාසය, පණ්ඩිත සේවනය, සද්ධර්මශ්‍රවණය** සහ **නොපසුබට වීර්‍ය්‍යයෙන්ද** යුක්තව පූර්වභාග ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත **ලෞකික මාර්ගයද** වඩා **බොධිසම්භාරයන්** සම්පූර්ණ කළ තැනැත්තා විසින්ම මාර්ගඵලාවබොධය කළ හැකි බව දතයුතුයි. මෙතෙමේ පළමුකොට සතර සංවර ශීලයෙහි පිහිටා **ශීල විසුද්ධියෙන්** පිරිසුදුවී, **චිත්ත විසුද්ධිය** හෙවත් බලවත් **සමාධිය** ලබා ගැණීම පිණිස පඨවි කසිණාදී කසිණ අරමුණක් හෝ ආනාපානසතියට අරමුණු වන්නාවූ ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්ති අරමුණක් හෝ තමන්ට ප්‍රකටව වැටහෙන යම් අරමුණක් හෝ ගෙන භාවනා කොට අඩු වශයෙන් ප්‍රථම ධ්‍යානයවත් ලබාගන්නේය. මෙසේ **උපචාර සමාධි, අර්පණා සමාධි** වශයෙන් සමාධිය උපදවාගෙන **ප්‍රථමධ්‍යානයට** පැමිණි පුද්ගලතෙමේ, කැමැතිනම් ඉතිරි ධ්‍යාන ලබාගැණීම පිණිස, තමන් ලත් ධ්‍යානය පඤ්චවසිතා වශයෙන් පුරුදු කොට පිළිවෙලින් ඉතිරි ධ්‍යාන උපදවා ගන්නේය. එසේ ධ්‍යාන උපදවා ගැනීමේ

අපෙක්ෂාවක් නැති, මාර්ග ඵලයන්ම අවබොධ කරගැණීමට අදහස් කරණ පුද්ගල තෙමේ , එයටවැඩි ධ්‍යාන ගැන වීයඝී නොකොට, තමන් විසින් උපදවා ගන්නා ලද්දවූ ප්‍රථමධ්‍යාන සමාපත්තියට සම වැද, එයින් නැගිට, එහි අන්තර්ගත ධ්‍යානාඞ්ගයන් වෙන් වෙන් වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරමින් එහි ඇතුළත් ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කිරීමට උත්සාහ කරන්නේය. ඇතැම් පුද්ගල කෙනෙක් ධ්‍යාන සමාපත්තියට සමවැද හෝ සම නොවැද හෝ, ප්‍රථමධ්‍යානය වැඩීමෙන් ලබාගත් **චිත්ත විසුද්ධිය** හෙවත් බලවත් සමාධියෙන් යුක්තව, ත්‍රෛභූමික සංස්කාර ධර්ම යන්ම අරමුණු කරමින් ''**රූපං අනිච්චං**'' යනාදී වශයෙන් විදර්ශනා වැඩීමට ආරම්භ කරන්නේය.

මෙසේ ධ්‍යානය පාදක කොටගෙන හෝ නොගෙන හෝ විදර්ශනා වඩන්නාවූ පුද්ගල තෙමේ, තම ආත්ම භාව සඞ්ඛ්‍යාත පඤ්චොපාදනක් ඛන්ධය, නාමරූප වශයෙන් ඇති සැටි දක්නා සම්මර්ශන ඥනය පහළවීමෙන් **දුක්ඛ සත්‍යය** නිශ්චයකොට දැකීම නම් වූ **දිට්ඨිවිසුද්ධිය** උපදවා ගන්නේය. ඉක්බිති හෙතෙමේ නැවත නැවතත් විදර්ශනා වඩන්නේ තමන් විසින් පිරිසුදුව දක්නා ලද දුක්ඛසත්‍යයාගේ **අවිද්‍යා, තෘෂ්ණාදී** ප්‍රත්‍යයන් පිරිසිඳ දැනීමෙන් කාලත්‍රය විෂයෙහි ඉපදියහැකි වූ සැක දුරුකොට පවත්නා විදර්ශනා ඥනය නම්වූ **කඞ්කාවිතරණ විසුද්ධියෙන්** පිරිසුදුව **සමුදය සත්‍යය** නිශ්චයකොට දැනගන්නේය. නැවතත් ත්‍රිලක්ෂණයන් අනෙකප්‍රකාරයෙන් සම්මර්ශනය කරන්නාවූ ඔහුට, **ඕභාසාදී දසවිධ විදර්ශනොපක්ලේශ යන්** පහළවීමෙන් නොමග යා හැකි බැවින්, ඒ නොමගින් වළක්වා නිසි මග පාද දෙන්නාවූ **මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධියෙන්** පිරිසිදු වන්නේය. මෙසේ විදර්ශනොපක්ලේශයන් ගෙන් මිදී විදර්ශනා වඩන්නාවූ පුද්ගලයා හට, **උදයව්‍යඤාණාදී නව මහා විදර්ශනා ඥනයන්** පහළ වීමෙන් **ප්‍රතිපද ඤාණදස්සන** විසුද්ධියෙන්ද පිරිසුදු වන්නේය. මෙසේ මේ ෂට් විසුද්ධීන් උපදවාගෙන ඔවුන්ගේ වශයෙන් නොයෙක් වර ලබන ලද පූර්වභාග මාර්ග ඇතිව **චුල්ල-සොතාපන්න** යයි කිව යුතු බවට පැමිණෙන්නේය. මෙසේ නව මහා විදර්ශනා ඥනයන් පහළ වූ කල්හි මාර්ග ඵලාධිගමය පිණිස වැඩිය යුතු අන්‍ය විදර්ශනාවක් නැති හෙයින් මාර්ග චිත්ත වීථිය පහළ වන්නේය.

මස්තකප්‍රාප්ත වූ විදර්ශනා ඥාන ඇතිකල්හි හටගන්නාවූ මාර්ග චිත්ත වීථියෙහි පළමුකොට **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡේදය, මනොද්වාරාවජ්ජනය** යන සිත් තුන පිළිවෙලින් ඉපිද නිරුද්ධ වූ පසු, **මන්දප්‍රාඥයෙකු** වී නම් **පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ** යන නමින් මහා කාමාවචර කුසල් සිත් සතරක්ද, **තීක්ෂප්‍රාඥයෙකු** වී නම්, **උපචාර, අනුලොම, ගොත්‍රභූ** යන නමින් සිත් තුනක්ද ඉපිද නිරුද්ධ වන්නේය. මේ සිත් සතරෙන් **පරිකර්ම, උපචාර, අනුලොම** යන සිත් තුන නිවන් අරමුණු කරන්නාවූ චිත්තයන්ට පූර්ව භාග යෙන් එ මාර්ග චිත්තය ඉපැදවීමට මග සළසන්නාක් මෙන් එයට අනුකූලවම පවත්නා හෙයින් **අනුලොම** සිත් යයි ද ව්‍යවහාර වේ. මේ **අනුලොම සිත්** ඉතා පිරිසුදු කාමාවචර කුසල චිත්තයෝයි. තදඞ්ගප්‍රහාණ වශයෙන් අකුසල් නසන්නාවූ මේ චිත්තයන්හි සම්ප්‍රයුක්ත වූ **ප්‍රඥා චෛතසිකය, අනුලොම ඥානය, සච්චානු ලොම ඥානය, මස්තකප්‍රාප්ත විදර්ශනා ඥානය, වුට්ඨානගාමිනී විදර්ශනා ඥානය, සඞ්ඛාරොපෙක්ඛා ඥානය** යනාදී නොයෙක් නම් වලින් ව්‍යවහාර වන්නේය. **පාදක ධ්‍යානය** යයි කී කල්හී මේ **වුට්ඨානගාමිනී විදර්ශනාවට** පාදක වන බව දතයුතුයි. එබැවින් මාර්ග චිත්ත වීථියෙහි **ගොත්‍රභූ චිත්තය** දක්වා උපදින්නාවූ සියළු ජවනයෝ ත්‍රිවිධ ලොකයෙන් නැගී යාමට හේතුවන හෙයින් උප චාර වශයෙන් **වුට්ඨානගාමිනී විදර්ශනා ජවනයයි** සම්මත කරණ ලදී.

තවද, මාර්ග ඵල ලබන්නාවූ සියළුම පුද්ගලයෝ ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ත්‍රිලක්ෂණ යට ආරොපණය කොට භාවනා වඩන කල්හි එක් ආයතියෙක් හට එක් ලක්ෂණයක්ම වැටහී මාර්ග ඵලයන්ගේ ලැබීම ස්වභාව ධර්මයක් වෙයි.

යම් පුද්ගලයෙක් සියලු ධර්මයන් **අනාත්ම වශයෙන්** දැක ආත්මය යි ගැණුම අත්හරින්නේ නම්, ඔහට උපදනා මාර්ග වීථියෙහි අනු ලොම සිත හා යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය, **සුඤ්ඤතානුපස්සනා** නම් **විමොක්ෂ මුඛය** හෙවත් සසරින් මිදීමේ මාර්ගය වෙයි. අනතුරුව උපදනා **මාර්ගයද සුඤ්ඤත මාර්ග නම් වේ.** එයට අනතුරුව උපදනා **ඵලයද සුඤ්ඤත ඵලය** නම් වේ. ඒ මාර්ග ඵලයන්ට අරමුණු වන්නාවූ **නිර්වාණය ද සුඤ්ඤත නිර්වාණය** යයි කියනු ලැබේ.

යම් පුද්ගලයෙක් සියලු ධර්මයන් අනිත්‍ය වශයෙන් දැක විපල්ලාස නිමිත්ත අත්හරින්නේ නම්, ඕහට උපදනා මාර්ග වීථියෙහි අනුලොම සිත හා යෙදුනාවූ ප්‍රඥ චෛතසිකය, **අනිමිත්තානුපස්සනා විමොක්ෂ මුඛය** නම් වේ. එයට අනතුරුව උපදනා **මාර්ගඵල නිර්වාණ ධර්මයෝ, අනිමිත්ත මාර්ගය, අනිමිත්ත ඵලය, අනිමිත්ත නිර්වාණය** යයි ව්‍යවහාර වේ.

යම් පුද්ගලයෙක් විදර්ශනා වඩන කල්හි සියලු ධර්මයන් දුක් වශයෙන් දැක තෘෂ්ණා ප්‍රණිධිය අත්හරිද, ඔහුට උපදනා මාර්ග වීථියෙහි අනුලොම සිත හා යෙදුනාවූ ප්‍රඥ චෛතසිකය, **අප්පණිහිතානුපස්සනා විමොක්ෂ මුඛය** නම් වේ. ඊට අනතුරුව උපදනා **මාර්ග ඵල නිර්වාණ ධර්මයෝ, අප්පණිහිත මාර්ගය, අප්පණිහිත ඵලය** හා **අප්පණිහිත නිර්වාණය** යයි ද ව්‍යවහාර වේ. මෙසේ අනුලොම සිත හා යෙදුනාවූ ප්‍රඥ චෛතසිකය, **වුට්ඨානගාමිණී විදර්ශනාය, සංඛාරොපෙක්ෂා ඥනය, සච්චානුලොම ඥනය, අනුලොම ඥනය** යනාදී නම් ලබන්නාක් මෙන්ම **සුඤ්ඤතනුපස්සනා විමොක්ෂ මුඛය අනිමිත්තානුපස්සනා** විමොක්ෂ **මුඛය, අප්පණිහිතානුපස්සනා විමොක්ෂ** මුඛය යන නම්ද ලබා ඒ හේතුවෙන්ම **මාර්ග ඵල නිර්වාණ ධර්මයෝ** ද ඒ ඒ නම් ලබන බව දතයුතුයි. **නිර්වාණ** නම් වූ **ක්ෂෙම භූමියට** ඇතුළ් වන්නාවූ දෙරටු තුනක් බඳු හෙයින් මේ විදර්ශනා ඥනයෝ තුන්දෙනාට **විමොක්ෂ මුඛ** යයි කියති.

**අනුලොම සිත්**වලට අනතුරුව ලැබෙන්නාවූ **ගොත්‍රභූ සිත, නිර්වාණ ධර්මය** අරමුණු කරමින්, ප්‍රථග්ජන ගොත්‍රය, නසා, ආර්ය පුද්ගල භාවයට පමුණුවන්නාවූ කාමාවචර මහා කුසල් සිතකි. ඒ සිත **නිර්වාණය** අරමුණු කරන්නේවී නමුත් මාර්ග චිත්තයන් විසින්ම සිදුකරනු ලබන්නාවූ සතර මාර්ග කෘත්‍යයන් සිදු කිරීමට අපොහොසත් බැවින් පෘථග්ජන භාවයෙහිම සිට නිර්වාණය පමණක් අරමුණු කරන බව දත යුතුයි. එබැවින් **ගොත්‍රභූ ඥනය** මාර්ගය ආවර්ජනා කිරීම් වශයෙන් අනුලොම සිත්වලට අනතුරුව මාර්ග සිතට පළමුවද හට ගන්නා හෙයින් **ප්‍රතිපද ඥනදස්සන විශුද්ධියද** නොවන්නේය, එසේම මාර්ගය නොවන හෙයින් **ඥනදස්සන විසුද්ධියද** නොවේ. **අනුලොම ඥන** තුනෙන්, සත්‍යය වසා සිටි මොහාන්ධකාරය දුරුකළ කල්හි, සියලු සංස්කාරයන් **විෂයෙහි**

සිත නොයවන්නේය. සංස්කාර නිමිත්ත දුරුවූ කල්හි සංස්කාර විරොධ වූ නිවණ අරමුණු කරමින් පෘථග්ජන භූමියෙන් නික්ම ආය්‍ය්‍ය භූමියට පමුණුවන්නාවූ විදර්ශනාවගේ මස්තකය වැනිවූ පෙරලා නොඑන **ගොත්‍රභූ ඥානය** උපදී.

උත්පාදයත්, ප්‍රවෘත්තියත්, සංස්කාර නිමිත්තත් මඩිනුයි යන අර්ථයෙන්ද, අනුත්පාද වූද, සංස්කාරයන්ගේ නොපැවැත්ම හෙවත් සංස්කාර නිරොධයවූද, නිර්වාණයට වදිනුයි යන අර්ථයෙන්ද, **ගොත්‍රභූ** නම් වන බව දත යුතුයි.

දියෙන් පිරි ඇළකින් එතරවනු කැමැති පුරුෂයෙක් වහා දිව විත්, මෙතෙර සිට, වෘක්ෂ ශාඛාවෙක්හි එල්වනලද රැහැනක එල්ලී, එම වේගයෙන්ම එතෙරට පැන, රැහැණ අතහැර, වෙව්ලමින් සිට, පසුව පොළොවෙහි ස්ථිරව පිහිටන්නේය. මෙසේ යොගාවචර තෙමේද, සසරින් එතෙරව, නිවණෙහි පිහිටනු කැමැතිව, උදයව්‍යානු දර්ශනාදී නව මහා විදර්ශනා ඥානයන්ගේ වේගයෙන් දිව විත්, නාම රූප ධර්මයන්හි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයන් අතුරෙන් එක් ලක්ෂණයක් එල්බගෙන අනුලොම චිත්තයන්ගේ උපකාරයෙන් තමන් විසින් පැමිණිය යුතු **නිවණට** ආසන්නව තුන්වන අනුලොම චිත්තයාගේ නිරොධයෙන්, ඒ සංස්කාරාලම්බණය අත් හැර **ගොත්‍රභූ** සිතින් නිවණට පැමිණ, සොවාන් මාර්ගඥානයෙන් නිවණෙහි ස්ථිරව පිහිටන්නේය.

මෙහි **අනුලොම ඥානය**, සත්‍ය මුවහ කරණ කෙළෙස් නමැති අන්ධකාරය දුරු කරන්නට සමර්ථවන නමුත්, **නිර්වාණය** අරමුණු කරන්නට අසමර්ථ වේ. **ගොත්‍රභූ ඥානය** නිර්වාණය අරමුණු කිරීමට සමර්ථවන නමුත් සත්‍ය මුවහ කරණ ක්ලෙශාන්ධකාරය නැසීමට අසමර්ථ වේ.

ඇස් ඇති පුරුෂයෙක් අහසෙහි සඳ තරු දක යෝගයක් දැනගනු කැමැතිව රාත්‍රි කාලයෙහි අහස බලන්නේ වලාකුලින් වැසී තිබෙන හෙයින් සඳ තරු නොදකී. එවේලෙහි එක් වාතයක් නැඟ ඝණවූ වලා පටලයන් පහ කෙළේය. එයිනුත් සඳ නොපෙනී සිටි කල්හි දෙවනුව ද වාතයක් නැඟ මධ්‍යමවූ වලාපටලයන් පහ

කෙළේය. නැවත තුන්වන වාතයක්ද නැග සියුම් වලා පහකළ කල්හි, ඒ පුරුෂයා සඳ තරු ආදිය දක යොගය දැනගත්තේය. මෙසේ ඝණ, මධ්‍යම සියුම් වලාපටලයන් සත්‍ය මුවහ කරන ක්ලෙශාන්ධකාරය මෙන්ද, තුන් වාතයන් මෙන් අනුලොම චිත්ත යන්ද, සඳ දකින්නාවූ ඇස් ඇති පුරුෂයා මෙන් ගොත්‍රභූ චිත්තය ද, සඳ මෙන් නිර්වාණයද දතයුතුයි.

මෙසේ ෂට් විශුද්ධීන්ගෙන් පිරිසුදුවී, සම්පූර්ණ කරණලද ලෞකික මාර්ග ඇත්තේ සත්වන **ඥාන දස්සන විසුද්ධිය** ලබන්නාවූ මාර්ග චිත්ත වීථිය පහළවී, අනුලොම චිත්තයන්ට අනතුරුව උපදනා ගොත්‍රභූ සිතින් පෘථග්ජන භාවයෙන් එතරවූ කල්හි **ඥාන දස්සන** නම්වූ සොවාන් මාර්ග සිත **නිර්වාණය** අරමුණු කරමින් **සතර මාර්ග කෘත්‍යයන්** එකක්ෂණිකව සිද්ධකරමින්, එක් වරක් ඉපිද නිරුද්ධ වේ. ඒ **සතරමාර්ග කෘත්‍යයෝ** නම්, **දුක්ඛ සත්‍යය පිරිසිඳ දැනීමය, සමුදය සත්‍යය පහ කිරීමය, නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂව දැනීමය, මාර්ග සත්‍යය වැඩීමය** යන කෘත්‍යයෝයි. **සමථයානික ආර්‍ය්‍ය පුද්ගලයා** හට මේ සොතාපන්න මාර්ග සිත වශයෙන් ලැබෙන්නේ තමන් විසින් පාදකකොට ගත්, ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන පසෙන් යම්කිසි ධ්‍යානයකට බඳුවූ **ලොකොත්තර සොවාන් මාර්ග ධ්‍යාන සිත් පසෙන් එකකි. ශුෂ්ක විදර්ශක පුද්ගලයෙක් වීනම්** ඔහට ලැබෙන්නේ **ලොකොත්තර සිත්** අටට ඇතුළත් සොවාන් මාර්ග **සිතය.**

සොවාන් මාර්ග සිතින් නැසිය යුතු කෙළෙස් නසා, චතුරාර්‍ය්‍ය සත්‍යාවබොධය පළමු වරට සිද්ධ කරමින්, පෘථග්ජන භාවයෙන් එතර කරමින්, නිර්වාණ මාර්ගයට පමුණුවන්නාවූ මේ සොවාන් මාර්ග චිත්තය ඉපිද නිරුද්ධවූ කල්හි, එහි අකාලික වූ හෙවත් කල් නොයවා දෙන විපාකය නම් වූ, සොවාන් ඵල සිත දෙවරක් හෝ තුන්වරක් ඉපිද නිරුද්ධ වන්නේය. මේ චිත්ත වීථියෙහි පරිකර්ම සිත උපදනා මන්ද ප්‍රාඥයන්ට වනාහී ඵල සිත් දෙකක්ද, තීක්ෂ්ණ ප්‍රාඥයන්ට පරිකර්ම සිතක් නැති හෙයින් ඵල සිත් තුනක්ද උපදනේය. මෙසේ ඵල සිත් දෙකක් හෝ තුනක් මුත් එයට වැඩි ගණනක් නූපදීමට හේතුව චිත්ත වීථියක ඇති වන්නට අවකාශ ඇත්තේ ජවන් සිත් සතක් මුත් එයට වැඩි ගණනක් නොවන

බැවිනි. මන්ද ප්‍රාඥ පුද්ගලයා හට පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ, මාර්ග සිත, සහ ඵල සිත් දෙකත් එකතු වීමෙන් ජවන් සිත් සත සම්පූර්ණ වේ. තික්ඛ ප්‍රාඥ පුද්ගලයා හට උපචාර, අනුලොම ගොත්‍රභූ මාර්ග සිත සහ ඵල සිත් තුනක් එකතු වීමෙන් ජවන් සිත් සත සම්පූර්ණ වන්නේය.

මාර්ග සිතට අනතුරුව උපදින්නාවූ මේ ඵල සිත්, එකාන්තයෙන්ම නිවණ අරමුණු කරන්නේවීනමුත් කුසල සඞ්ඛ්‍යාවට නො ගැණේ. **ආනන්තරික සමාධිය, අකාලික විපාකය** යන නම් වලින් හැඳින්වනු ලබන මේ ඵල චිත්තයෝ, අව්‍යාකෘත ධර්මයෝ වෙත්. මාර්ග සිතින් නසනලද කෙලෙස් ඇති චිත්ත සන්තානයෙහි සංසිඳීම් ස්වභාවය ඇති කරවන හෙයින් මේ ඵල චිත්තයෝ පටිප්පස්සද්ධිප්‍රහා-ණයෙන් කෙලෙස් සන්සිඳවන බව දත යුතුයි. මනුෂ්‍ය ශරීරයෙන්ම නිවන් සැප විඳිනා හෙයින් ඒ ඵල චිත්තයට වඩා උතුම් සැප ගෙනදෙන චිත්තයක් මේ භවත්‍රයෙහිම නො ලැබෙන්නේය. මේ සොවාන් ඵල සිත් දෙක හෝ තුන ඉපිද නිරුද්ධ වූ කල්හි චිත්ත සන්තතිය නැවත භවඞ්ගයට බසින්නේය.

සොවාන් මාර්ග චිත්ත වීථිය මෙසේ දක්වනු ලැබේ.

මන්දප්‍රාඥයා හට: ... න ද ම ප උ නු ගො මග්ග ඵ ඵ ...
තික්ඛ ප්‍රාඥයාහට : ... න ද ම උ නු ගො මග්ග ඵ ඵ ඵ ...

මේ චිත්ත වීථියට පෙර පසු උපදනා භවඞ්ගයෝ පඤ්චවොකාර ත්‍රිහේතුක භවඞ්ග නවයෙන් එකක්ම වන්නේය. එනම්, ඥාණසම්ප්‍රයුක්ත කාමාවචර මහා විපාක සතරය, රූපාවචර විපාක පසය යන විපාක සිත් නවය වේ.

මෙසේ සොවාන් මාර්ග චිත්ත වීථිය අවසන් වී භවඞ්ග සිත් පරම්පරාව නැවතත් හටගෙණ, එයට අනතුරුව ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ගෙන් යුත් චිත්ත වීථි පහළ වන්නේය. ධර්මයන් පිළිබඳ මනා අවබොධයක් ඇති තික්ඛ ප්‍රාඥ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ කරුණු පසක්ම ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය. පළමුකොට තමන් උපදවා ගත් **මාර්ගය ප්‍රත්‍යවෙක්ෂා කරමින්** එක් චිත්ත වීථියක් හටගන්නේය.

**භවඞ්ග චලන, භවඞ්ගුපච්ඡෙද**, යන සිත් දෙක ඉපිද නිරුද්ධ වූ පසු, තමන් විසින්. උපදවාගත් සොවාන් මාර්ගය අරමුණු කොට ගෙන **මනොද්වාරාවජ්ජන සිත** පහළ වී, අනතුරුව **කාමාවචර ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරින්** එකක් **සොවාන් මාර්ගයම** අරමුණු කරමින් **ජවන් සිත්** වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වේ. එයට පසු සිත් පරම්පරාව නැවත භවඞ්ග වේ. මේ චිත්ත වීථියට පෙර පසු උපදනා භවඞ්ගයෝ **පඤ්චවොකාර** ත්‍රිහේතුක භවඞ්ග නවයෙන් එකක්ම වන්නේය.

ඉක්බිති, නැවතත් **සොවාන් ඵලය ප්‍රත්‍යවෙක්ෂා කරමින්** චිත්ත වීථියක් පහළ වන්නේය. එම චිත්ත වීථියේද **භවඞ්ග චලන**, **භවඞ්ගුපච්ඡෙද** යන සිත් දෙක ඉපිද නිරුද්ධ වූ පසු, **සොවාන් ඵලය** අරමුණු කරමින් **මනොද්වාරාවජ්ජනය** සහ **ජවන් සිත් සතක් ද** පළමු දක්වූ පරිදි, පිළිවෙලින් ඉපිද නිරුද්ධ වීමෙන් නැවත **භවඞ්ගපාතය වේ.**

තුන්වෙනුව හටගන්නා ප්‍රත්‍යවෙක්ෂා ජවනයෝ, **තමන් ලත් මාර්ගයෙන් ප්‍රහීණ කරනලද ක්ලේශයන්** අරමුණු කරමින්, මේ මේ ක්ලේශයන් මා විසින් නසන ලද්දේයයි ප්‍රත්‍යවෙක්ෂා කරන්නෝය. එම චිත්ත **වීථියෙහිද**, **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය**, යන සිත් **දෙකට** අනතුරුව, **ප්‍රහීණ** කෙලෙස් **අරමුණු** කරමින් **මනොද්වාරා වජ්ජන සිතක්ද, කාමාවචර ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරින් එකක් ජවන් වශයෙන්** සත්වරක්ද ඉපිද නිරුද්ධ වීමෙන් **පසු** නැවත භවඞ්ගපාතය වන්නේය.

සතරවෙනුව, **ඉතිරි** හෙවත් **අවශෙෂ ක්ලෙශයන්** අරමුණු කරන්නාවූ චිත්ත වීථියක් හටගන්නේය. එම චිත්ත වීථියෙහිද භවඞ්ග චලනය භවඞ්ගුපච්ඡෙදය ඇතිවී අනතුරුව තමන් විසින් **ඉදිරි මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙස් ප්‍රත්‍යවෙක්ෂා කිරීම නම් වූ අවශෙෂ ක්ලෙශාරම්මණය ගෙණ මනොද්වාරාවජ්ජන සහ කාමාවචර ඤාණ සම්ප්‍රයුක්ත** මහා කුසල් **සිත් සතරින්** එකක් ජවන් **වශයෙන්** සත්වරක් ඉපිද නිරුද්ධ වේ. එයට පසුව චිත්ත සන්තතිය නැවත භවඞ්ග වේ.

පස්වෙනුව හෙවත් අවසානයේදී, මා විසින් **නිර්වාණ සඬ්ඛ්‍යාත මේ ධර්මය අරමුණු කිරීම්** වශයෙන් අවබොධ කරණ ලද්දේය යි, මෙසේ ජාති ජරා මරණාදියෙන් පහවූ **අසඬ්ඛත ධර්මය** ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය. එම චිත්ත **වීථියේද, භවඞ්ග චලන, භවඞ්ගුපච්ඡේද** යන දෙසිත නිරුද්ධ වූ පසු **නිර්වාණාරම්මණය** ගෙණ **මනොද්වාරාවජ්ජන සිතක්** සහ **ඤාණසම්ප්‍රයුත්ත කාමාවචර මහා කුසල් සිත් සතරින් එක් සිතක් ජවන්** වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වන්නේය.

මේ ප්‍රත්‍යවෙක්ෂා චිත්ත වීථි මෙසේ යි:-

...න ද ම ජ ජ ජ ජ ජ ජ ජ භ භ...

**මන්ද ප්‍රාඥ පුද්ගලයන්** හට ඇතැම් විටෙක **ප්‍රහීණ ක්ලෙශයන්** සහ **අවශෙෂ ක්ලේශයන්ද ප්‍රත්‍යවෙක්ෂා** කරන චිත්ත වීථි නූපදිත්. එවිට ඒ පුද්ගලයා හට ඇති වන්නේ **මාර්ගය, ඵලය,** සහ **නිර්වාණය** අරමුණ කරන්නාවූ ප්‍රත්‍යවෙක්ෂා ජවන වීථි තුන පමණය

**සකෘදගාමි, අනාගාමි, අර්හත්** යන මාර්ග වීථි තුන ද **සොවාන් මාර්ග** වීථියට සමානය. ඒ චිත්ත වීථීන්හි මාර්ග චිත්තයට පෙර උපදින්නාවූ **ගොත්‍රභූ චිත්තය** වෙනුවට **වොදන** යන **නමින් ජවන් සිතක් නිර්වාණය අරමුණු කරමින් උපදින්නේය. වොදන** යන් නෙහි අදහස පිරිසුදු වූ **බවයි.** සොවාන් මාර්ගය ලබන්නට පෙර පෘථග්ජන ගොත්‍රයෙන් **එතර විය යුතු** බැවින් ඒ චිත්ත **වීථියේ** උපන් ගොත්‍රභූ **චිත්තය පෘථග්**ජන ගොත්‍රයෙන් එතර කරවන කෘත්‍ය කරමින් **උපදින්නේය.** එයට පසු ආර්‍ය්‍ය භාවයට **පත් පුද්ගලයා** හට පහ **කළයුතු** පෘථග්ජන ගොත්‍රයක් නොමැති බැවින් ඒ **වෙනුවට** සෑම අතින්ම පිරිසුදු වූ නිර්වාණය අරමුණු කරන්නාවූ **වොදන** සිත උපදින බව දතයුතුයි.

**ඒ** චිත්ත වීථීන්හි පෙර පසු උපදනා භවඞ්ගයෝ තෙළෙස් (13) භවඞ්ගයන්ගෙන් එකක්ම වේ. එනම් **ඤාණසම්ප්‍රයුක්ත මහා විපාක සතරය, රූපාවචර විපාක පසය අරූපාවචර විපාක සතරය** යන තෙළෙස් විපාක චිත්තයෝ යි. **සොවාන්** මාර්ග වීථිය අරූප ලොක-

යන්හි හට නො ගන්නා බැවින්, සොවාන් චිත්ත වීථියට පෙර පසු **භවඞ්ග වශයෙන්** අරූප විපාක සිත් සතර නො ලැබේ. සොවාන් **ආය්‍ය්‍යී පුද්ගල** තෙමේ අරූපධ්‍යාන වඩා අරූප තලයන්හි ප්‍රතිසන්ධිය ලැබූයේ වී නම් එහිදීම **ඉතිරි** මාර්ග ඵල ලබා පිරිනිවන් පාන්නේය.

අර්හත් මාර්ග **වීථියට** පසු ඇතිවිය හැකි **ප්‍රත්‍යවෙක්ෂණ චිත්ත වීථි** සතරෙකි. එනම් **මග්ග**, ඵල, **ප්‍රහීණ ක්ලේශ** සහ නිබ්බාණ යන සතරය. සියලු කෙලෙසුන් නසා අවසන් කළ හෙයින්, **ප්‍රත්‍යවෙක්ෂා** කිරීමට ඉතිරි ක්ලේශයන් නැත්තේය. එබැවින් අන්‍ය ආය්‍ය්‍යීයන්ට මෙන් **අවශෙෂ කිලෙස පච්චවෙක්ඛණ** චිත්ත **වීථියක්** ඇති නොවේ.

මෙසේ සොවාන්, සකෘදගාමි. අනාගාමි යන මාර්ගත්‍රයෙහි **ප්‍රත්‍යවෙක්ෂා** වීථි පසක් පසක් බැගින්ද, අර්හත් මාර්ග වීථියෙහි **ප්‍රත්‍යවෙක්ෂා** වීථි සතරක් දැයි එකුන් **විසි** (19) ප්‍රත්‍යවෙක්ෂණ **වීථි** කෙනෙක් වෙති. ඔව්හුම **විමුක්ති ඥාන** යයි ද ව්‍යවහාර කරණු ලැබෙත්.

තවද, මේ එක් මාර්ගයකට දහසක් නය ඇත්තේවීනමුත්, එයින් **එක්** ආය්‍ය්‍යී පුද්ගලයෙකු හට පහළ වන්නේ එක් මාර්ග චිත්තයක් පමණය. ඒ දහසක් නය මෙසේයි.:—

සොවාන් මාර්ගය, **සුඤ්ඤත සොතාපත්ති මාර්ගය**, **අප්පණිහිත සොතාපත්ති මාර්ගය** යයි දෙයාකාර වේ (2). ඒ මාර්ග දෙක, **දුක්ඛා පටිපද ඛිප්පාභිඤ්ඤා** දුක්ඛා, **පටිපද දන්ධාභිඤ්ඤා**, **සුඛා පටිපද ඛිප්පාභිඤ්ඤා**, **සුඛා පටිපද** දන්ධාභිඤ්ඤා, යන සතර ප්‍රතිපද **වශයෙන්** ගත් කල්හි අට දෙනෙකි. (8). මෙසේ **සුඤ්ඤත**, **අප්පණිහිත** වශයෙන් දෙකක්, ප්‍රතිපද වශයෙන් අටත් එකතු කළ කල්හි දසයකි 10). ඒ දසදෙනා. (1) සතිපට්ඨානය, (2) සම්‍යග් ප්‍රධානය, (3) ඍද්ධිපාදය, (4) ඉන්ද්‍රිය. (5) බලය (6)බොජ්ඣඞ්ගය. (7) සච්චය, (8) සමථය, (9) විදර්ශනාය, (10) ලොකුත්තර ධර්මය, (11) **ස්කන්ධය**, (12) ආයතනය, (13) ධාතුය, (14) ආහාරය, (15) ඵස්සය. (16) වෙදනාය, (17) සඤ්ඤා, (18)

චෛතන්‍යය, (19) චිත්තය යන එකුන් විසි අභිනිවේශයන් වශයෙන් ගත් කල්හි එක්සිය අනූවක් (190) සොතාපත්ති මාර්ග චිත්තයෝ වෙති. මේ එක්සිය අනූවට පළමු කී දසය එක් කළ විට දෙසියයක් (200) නය වෙති. මේ සිත් දෙසියය, **ඡන්ද, චිත්ත, විරිය, වීමංස** යන අධිපති ධර්ම සතර වශයෙන් ගත් කළ අටසියයක් (800) වෙති. මේ අටසියයට පළමු දෙසියය එකතු කළ විට නය දහසක් (1000) වෙති. මේ මාර්ග සිත් දහස, දහසක් ආර්‍ය්‍ය පුද්ගලයන්ට, මුත්, එක් ආර්‍ය්‍යයෙක් හට සිත් දෙකක් නො ලැබෙන්නේය. **දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සොවන් මාර්ගය** යයි කියන්නේ මේ දහසට බව දත යුතුයි.

මෙසේ **සකෘදගාමි, අනාගාමි, අර්හත්** යන මාර්ගයන්හිද මේ පිළිවෙලට දහස දහස බැගින් සිත් ලැබෙන්නේය. එවිට සතර මාර්ගයෙහි නය සාරදහසක් (4000) වේ.

තවද, **සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි** යන ආර්‍ය්‍ය අෂ්ඨාඞ්ගික මාර්ගයන්ගේ **(1) ක්ලෙශයන්ගෙන් නික්ම යාම්, (2) අකුසල චිත්තයන්ගෙන් නික්ම යාම, (3) අකුසල මූලයන්ගෙන් නික්ම යාම, (4) සම්ප්‍රයුක්ත ධර්‍මයන්ගෙන් නික්ම යාම, (5) කාමාදි චතුරාශ්‍රවයන්ගෙන් නික්ම යාම** යන පංච ප්‍රකාර නීයාණිකාර්ථයන්ගේ වශයෙන් සතර මාර්‍ගයෙහිම විසි දහසක් (4000 × 5–20,000) නය ලැබෙන්නේය.

තවද, **ශුෂ්ක විදර්ශක පුද්ගලයා** හට ලැබෙන්නාවූ ධ්‍යානාඞ්ග **පඤ්චකය** වශයෙන් ගත් කල්හිද, නය විසිදහසක් (4000 × 5=20,000) වන්නේය.

තවද, **සමථයානිකයාගේ වශයෙන්** ලැබෙන්නාවූ ධ්‍යානාඞ්ග **පඤ්චකය** වශයෙන් ගත් කල්හිද, නය විසිදහසක් (4000 × 5=20,000) ලැබෙන්නේය.

මෙසේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයන්ගේ පඤ්චප්‍රකාර නීර්‍ය්‍යාණිකාර්ථයන්ගේ වශයෙන් විසිදහසෙක (20,000) ශුෂ්ක විදර්ශකයන්ගේ

ප්‍රථමධ්‍යානයෙහි යෙදුනාවූ අඞ්ග පඤ්චකයන්ගේ වශයෙන් විසි දහසෙක (20,000) සමථයානිකයා හට ලැබිය යුතුවූ ධ්‍යානාඞ්ගයන් ගේ වශයෙන් විසි දහසෙකැයි (20,000) සතර මාර්ගයෙහි ලැබිය යුතු නය හැට දහසෙකි. (60,000)

තවද, සතර මාර්ගයෙහි ප්‍රතිබිම්බවූ සතර ඵල චිත්තයෙහිද මෙසේ සැටදහසක් (60,000) නය ලැබිය යුතු හෙයින්, මාර්ග ඵල චිත්තයන් අටදෙනාගේ එක් ලක්ෂ විසි දහසක් (1,20,000) නය, ක්‍රමයෝ සුදුසු පරිදි යොදගත යුතුයි.

## සමාපත්ති වීථි

**ධ්‍යාන සමාපත්ති**, **ඵල සමාපත්ති**, **නිරොධ සමාපත්ති**, යයි සමාපත්ති ත්‍රිවිධ වේ.

### ධ්‍යාන සමාපත්ති

**ප්‍රථමධ්‍යාන**, **ද්‍විතියධ්‍යාන**, **තතියධ්‍යාන**, **චතුර්ථධ්‍යාන**, **පඤ්චමධ්‍යාන** යන් රූපාවචර ධ්‍යාන පස සහ **ආකාශානඤ්චායතන**, **විඤ්ඤාණඤ්චායතන**, **ආකිඤ්චඤ්ඤායතන**, **නෙවසඤ්ඤානාසඤ්ඤායතන** යන අරූපාවචර ධ්‍යාන සතරත් යන ධ්‍යානයන් නවදෙනා අතුරෙන් යම් කිසි ධ්‍යානයක් උපදවා ගත් පුද්ගලයා විසින්, තමන් **ලත්** ධ්‍යානය පඤ්චවසිතාවෙන් පුරුදු කොට වහ වහා ධ්‍යාන සිත් උපදවා ගැණීමේ **ශක්තිය** ඇතිවූ කල්හි, ඕහට ධ්‍යාන **සමාපත්තිය** හෙවත් ධ්‍යාන සිත්ම පිළිවෙලින් උපදින්නේය. මෙසේ ධ්‍යානය උපදවා ගැනීමට උපකාර වූ අරමුණෙහිම සිත රඳවා ගත් කල්හි ධ්‍යාන සමාපත්ති චිත්ත වීථිය හටගන්නේය. එවිට **භවඞ්ග චලනය**, **භවඞ්ගුපච්ඡෙදය**, යන භවඞ්ග සිත් දෙක ඉපිද නිරුද්ධ වූ කල්හි කසිණාදි ප්‍රතිභාග ප්‍රඥප්ති ආලම්බණයක් අරමුණු කළේ වීනම්, එම ප්‍රඥප්ති අරමුණම ගෙණ **මනොද්වාරාවජ්ජන සිතක්** ඉපිද අනතුරුව කාමාවචර ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරෙන් එකක් එම ප්‍රඥප්ති අරමුණම ගෙණ, **පරිකර්ම**, **උපචාර**, **අනුලොම**, **ගොත්‍රභූ** යන නමින් සිත් සතරක් ඉපිද නිරුද්ධ වේ. තදනන්තරව තමන්ගේ ධ්‍යාන චිත්තය තමන් කැමැතිතාක් කල් උපදවා ගෙනධ්‍යාන සුවය විඳ, ඉක්බිති සිත් පරම්පරාව භවඞ්ගවේ. සෑම ධ්‍යානයකින්ම

මේ ආකාරයෙන් ධ්‍යාන සමාපත්තියට සමවැදිය හැකි බව දත යුතුයි. ධ්‍යාන සමාපත්තියට සමවදනා පුද්ගලයනට උපදින ධ්‍යාන සමාපත්ති වීථිය මෙසේයි:—

...න ද ම ප උ නු ගො ඣ ඣ ඣ ඣ... භ...

මේ ධ්‍යාන සිත් පවත්නාතාක් කල් විෂ්කම්භණ වශයෙන් අකුසල යන්ගේ යටපත්වීම ඇතිවන්නේය. ලෞකික සැප අතුරෙන් මේ ධ්‍යාන සුවය ඉතා ප්‍රණීතය.

## අභිඥා වීථි

රූපාවචර අරූපාවචර ධ්‍යානයන් උපදවා ගත් පුද්ගලයා විසින් ඒ ඒ ධ්‍යානයන් පඤ්චවසිතාවෙන් පුරුදු කොට, එක් ධ්‍යානයකින් අනික් ධ්‍යානයකටද, යනාදී පිළිවෙලින් අනුලොම පටිලොම වශයෙන් ධ්‍යාන උපදවාගෙන ඒ හේතුවෙන් ලබාගත් අෂ්ට සමාපත්ති ඇත්තේ, අභිඥා උපදවා ගැනීම පිණිස වීර්‍ය්‍ය වඩන්නේය.

අභිඥාවෝ සත්වැදෑරුම් වේ. එනම්:

1. දිබ්බ චක්ඛු අභිඥා
2. දිබ්බ සොත අභිඥා
3. ඉද්ධිවිධ අභිඥා
4. පරචිත්ත විජානන අභිඥා
5. පුබ්බේ නිවාසානුස්සති අභිඥා
6. යථාකම්මූපග අභිඥා
7, අනාගතංස අභිඥා

මේ අභිඥාවන් උපදවනු කැමැති පුද්ගලයා විසින් සතර භූත කසිණ හා සතර වර්ණ කසිණයන්ද අරමුණු කොට, වෙන් වෙන් වශයෙන් සියළුම ධ්‍යාන උපදවා ගැණීම පුරුදු කළ යුතු වේ.

## දිබ්බචක්ඛු අභිඥාව

දිබ්බචක්ඛු අභිඥාව උපදවාගනු කැමැති පුද්ගල තෙමේ, පළමු කොට, දුර පවත්නාවූ හෝ ප්‍රතිච්ඡන්න හෙවත් වැසී තිබෙන්නාවූ

හෝ සියුම්වූ හෝ රූප දකිනු කැමැත්ත ඇති කල්හි, **තේජෝ කසිණ ඕදත කසිණ, ආලෝක කසිණ** යන කසිණ තුණ අතුරෙන් එකක් අරමුණු කොට ගෙණ රූපාවචර පඤ්චමධ්‍යානයට සමවදින්නේය. මෙයට **පරිකර්ම පාදක ධ්‍යානය** යයි කියනු ලැබේ. **දෙවනුව**, නොදක්නා ලද රූපයන් අරමුණු කොට ගෙන අසුවල් අසුවල් රූපයන් දකින්නෙමියි අධිෂ්ඨාන කර කාමාවචර මනොද්වාර වීථි පහළවේ. එයට **පරිකර්ම වීථි** යයි කියති. **තුන්වෙනුව**, එක් කසිණයක් අරමුණු කොට ගෙණ නැවත රූපාවචර පඤ්චමධ්‍යානයට සමවදින්නේය. එයට **අභිඥ පාදක ධ්‍යාන වීථිය** යයි කියති. **සතරවැනිව**, වර්තමාන රූපයන් අරමුණු කොට ගෙන ඉතා පිරිසුදු විශෙෂ දැකුම් ඇති ජවන් සිත් පහළවන **රූපාවචර පඤ්චමධ්‍යාන අභිඥ වීථිය** හටගන්නේය. මෙසේ ඒ ඒ අභිඥවෝ උපදවා ගැනීම සඳහා සතර සතර බැගින් චිත්ත වීථි ඇතිකර ගත යුතු වේ. ඒ චිත්ත වීථිය මෙසේයි.

...න ද ම ප උ නු ගො අභිඥ භ භ...

මේ **අභිඥවට, දිබ්බචක්ඛු** අභිඥව යයි කියනු ලබන්නේ කුමක් නිසාදැයි දත යුතු වේ.

දෙවියන්ට වනාහි තමන්ගේ පෙර කුසලානුභාවයෙන් පහළවූ පළිබොධ රහිතවූ, උපක්ලෙශයන්ගෙන් මිදුනු හෙයින් ඉතා දුරවූ රූපාලම්බණය පිළිගැනීමට සමර්ථවූ, **දිව්‍යමය ප්‍රසාද චක්ෂුවක්** ඇත්තේය. භාවනා බලයෙන් ලබාගත් **මේ ප්‍රඥ චක්ෂුෂය දිව්‍ය චක්ෂුෂය** මෙන් බැහැරවූද රූපාලම්බණය දැකීමට සමර්ථ හෙයින් ද, දිව්‍ය විහාර වශයෙන් ලබන ලද හෙයින්ද කසිණාලොකයේ උපකාරයෙන් පැමිණිය යුතු බැවින්ද, පාදක ධ්‍යාන සඞ්ඛ්‍යාත දිව්‍ය විහාරය නිශ්‍රය කොට ලබා ගත් හෙයින්ද, ඥාණාලොකය පතුරුවා දෙවියන්ට මෙන් බිත්ති ආදීන් පිටතවූ රූප බැලීමෙන් මහත් දිව්‍ය ගති ඇති බැවින්ද **දිබ්බ චක්ඛු** නම් වේ.

තවද, මේ දිවැස් ඇති අභිඥ ලාභී පුද්ගල තෙමේ තමාගේ ධ්‍යානාලොකය නිරයයන් කරා පතුරුවා, නිරිසතුන් දිව නැණින් දැක ඔවුන් නිරයයන්හි උපදවාලූ කර්මයන් බැලීමට හෙවත් දැනගැනීමට

කැමතිවන්නේ, පාදකධ්‍යානයට සමවැද ඉන් නැඟී "මේ සත්ත්වයා කවර නම් කර්මයක් කොට නිරයෙහි ඉපිද මෙසා මහත් දුක් අනුභව කෙරේදැයි මෙනෙහි කරණ කල්හි, මෙනම් කර්මයකැයි වැටහී, එම කර්මය අරමුණු කරන්නාවූ ඥාණය පහළවන්නේය. එසේම ධ්‍යානාලොකය දිව්‍යලොකයන් කරා පතුරුවා දෙව්ලොව දිව සැප විඳින පුද්ගලයන් දක මේ සත්ත්වයන් කිනම් කුසල කර්මයන් කොට මෙසා මහත් සම්පතක් අනුභව කෙරෙත්දැයි මෙනෙහි කරණ කල්හි මේ නම් කුසල කර්මයකැයි වැටහී, එම කර්මය අරමුණු කරන්නාවූ ඥාණය පහළවන්නේය. මෙයට **යථා කම්මුපගඥාණය** හෙවත් **යථා කම්මුපග අභිඥා** යයි කියනු ලැබේ.

යම් සත්ත්වයෙකු දක ඔහු විසින් නිපදවන ලද කර්මයකින් මතු උපදනා ආත්ම භාවය බලනු කැමැති **දිව්‍යචක්ෂුරභිඥනලාභී පුද්ගල** තෙමේ, ඒ යථා කම්මුපග ඥාණයම පාදක කොට ගෙණ **අනාගතංස ඥාණය** උපදවාගන්නේය. මේ ඥාණ දෙකම **දිබ්බ චක්ඛුඥාණය** ඇති කල්හිම ලැබේ. නැති කල්හි නො ලැබේ.

නවද, ඒ දිව්‍යචක්ෂුරභිඥනය පෘථග්ජනයාහට අන්තරාය කර වේ. ඔහු යම් යම් තැන් ආලොක වේවායි අධිෂ්ඨාන කොට කසිණාලොකය ඒ ඒ තැන්හි පතුරුවාද, එකල්හි යක්ෂ, රාක්ෂසාදී රූප දර්ශනයෙන් භය ඉපිද සිත් විකල් බවට හෝ පැමිණ, ධ්‍යානයෙන් පිරිහී උමතු බවටද පැමිණිය හැකි වේ.

## දිබ්බසොත අභිඥාව

දෙව්ලොව උපන් දෙවියන්හට, ශ්‍රද්ධා බහුලභාවය, පිරිසුදු දෘෂ්ටිය ඇති බවය, ආනිසංස ඇදහීමය යනාදී මනාව කරණ ලද පුණ්‍යකර්මයන්ගේ විපාක වශයෙන් පලිබොධයන්ගෙන් මිදුණු හෙයින්, ඉතා දුරවූද, ඉතා සියුම්වූද, ශබ්ද ඇසීමට පවා සමර්ථ ප්‍රසාද සොත ධාතුවක් ඇත්තේය.

එසේම යොගාවචර තෙමේ, ධ්‍යාන සමාධීන් සමාධිමත්වූ කල්හි පිරිසුදුවූ, මිනිස් කන්හි ශබ්ද ඇසීමේ ශක්තිය ඉක්ම සිටි, දෙවියන්

ගේ සොතය වැනි හෙයින් **දිබ්බසොත** යයි කියන ලද නුවණින්, **දි**ව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, උභය ශබ්දයන් අසන්නට සමර්ථවන්නේය.

**දිබ්බසොතඤාණය** උපදවනු කැමැති යොගාවචර තෙමේ අභිඥපාදක ධ්‍යානයට සමවැද එයින් නැගී, පරිකර්ම වශයෙන් හටගත් සමාධි සිතින් පළමුකොට ප්‍රකෘති ශ්‍රොත්‍රප්‍රසාදයට විෂයවූ වනසතුන් ආදීන්ගේ ඖදරික ශබ්දය ආවර්ජනා කළ යුතුවේ. මෙසේ ක්‍රමයෙන් ලං ලංව අවුත් තමා වසන ස්ථානය අවට ඇති කථා ශබ්දය පක්ෂීන්ගේ නාදය, වාතයෙන් හටගත් ශබ්දය, අව්වෙහි වියලෙන පත්‍රාදීන්ගේ ශබ්දය කුරුකුහුඹු ආදීන්ගේ ශබ්දය යනාදී වශයෙන් සියලු ඖදරික ශබ්දයන් වෙන් වෙන් වශයෙන් ආවර්ජනා කොට හැඳින ගත යුතුවේ.

නවද, **දිසා වශයෙන්ද**, ශබ්දයන් මෙනෙහි කළ යුතුවේ. පූර්ව දිසාව, පශ්චිම දිසාව, උත්තර දිසාව, දක්ෂිණ දිසාව, හෙට්ඨිම දිසාව උපරිම දිසාව, නිරිත, ඊසාන, වයඹ, ගිනිකොන යන අනුදිසාවන්දැයි මෙසේ දශ දිසාවන්හි පවත්නා ශබ්ද වශයෙන් සිහි කළ යුතුවේ. මෙසේ මෙනෙහි කරණ කල්හි ඒ ඒ ශබ්ද ප්‍රකෘති සිතට ප්‍රකට වෙයි. පරිකර්ම සමාධි සිතට අතිශයින්ම ප්‍රකට වේමය. මෙසේ දිව්‍ය ශ්‍රොත්‍රය ඉපදීමට ලංවූ කල්හි ඒ මොහොතෙහි කරණ ලද යම් කිසි ශබ්දයක් අරමුණු කොට මනොද්වාරාවජ්ජන සිතක් ඉපිද නිරුද්ධවූ පසු, තික්ඛප්‍රාඥයෙකු වී නම්, උපචාර, අනුලොම ගොත්‍රභූ යන කාමාවචර සිත් තුනද, මන්දප්‍රාඥයෙකු වී නම් පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ යන කාමාවචර සිත් සතරද ඉපිද අනතුරුව පඤ්චම ධ්‍යාන අර්පණා චිත්තය උපදී. ඒ සිතෙහි උපදනා ඤාණය දිව්‍ය සොත ධාතු හෙවත් **දිව්‍යසොතඤාණය** නම් වේ.

මේ ඤාණය ස්ථිර වශයෙන් පිහිටි කල්හී, මෙතෙක් තැන පැතිරේවායි අධිෂ්ඨාන කොට, පාදකධ්‍යානයට සමවැද, එයින් නැගිට, එහි වූ ශබ්දය ආවර්ජනය කරන්නේය. තමාට ඉතාම ආසන්නයෙහි පටන් ක්‍රමයෙන් පිටත වූ ශබ්ද යන්ද නොදුරු ගම් දනවූ ආදීන්හි ශබ්දද, මේ පිළිවෙලින් සක්වළ තෙක්ද, එයින් පිටතද පවත්නා ශබ්දයන් අසන්නාහ. මේ ශබ්දයන් වෙන් වෙන් වශයෙන්

බෙද අසනු කැමැති කල්හි ඒ එක එක ශබ්දයක් පාසා නැවත නැවත පාදක ධ්‍යානයට සමවැදිය යුතුවේ.

## ඉද්ධි විධි අභිඥා

ඉද්ධිවිධඥාණය උපදවනු කැමැති යොගාවචරයා විසින් පඨවි කසිණයේ පටන් ඕදත කසිණය දක්වා ඇති අට කසිණයන්හි ලෞකික සමාපත්ති අට අට උපදවාගෙන අනතුරුව තුදුස් ආකාරයෙන් සිත දමනය කළ යුතුවේ. ඒ තුදුස් ආකාරය නම්:—

1. කසිණානුලොමය.
2. කසිණ පටිලොමය.
3. කසිණානුලොම පටිලොමය
4. ධ්‍යානානුලොමය.
5. ධ්‍යාන පටිලොමය.
6. ධ්‍යානානුලොම පටිලොමය.
7. ධ්‍යාන උල්ලඞ්ඝනය.
8. කසිණ උල්ලඞ්ඝණය.
9. ධ්‍යාන කසිණ උල්ලඞ්ඝණය
10. අඞ්ග සඞ්කන්තිකය.
11. ආලම්බණ සඞ්කන්තිකය.
12. අඞ්ග ආලම්බණ සඞ්කන්තිකය.
13. අඞ්ග ව්‍යවස්ථාපනය.
16. ආලම්බණ ව්‍යවස්ථාපනය.

මේ තුදුස් ආකාරයෙන් සිත දමනය නොකොට; පූර්ව ජන්ම යන්හි භාවනා නොවැඩූ, ධ්‍යාන නොවැඩූ පුද්ගලයා හට ඍද්ධි විධඥනය නො ලැබෙන්නේමය. ආදිකර්මිකයාහට මේ **කසිණ පරිකර්මයද** ඉතා දුෂ්කර ක්‍රියාවකි. **උග්ගහනිමිත්ත** නෙක් කසිණ පරිකර්මය වැඩූ පුද්ගලයාහට **ප්‍රතිභාග නිමිත්ත** ඉපදවීම ඉතා දුෂ්කරය. **ප්‍රතිභාග නිමිත්ත** උපන් කල්හි ද **උපචාර අර්පණා** ලැබීම දුෂ්කරය. **අර්පණාලාභියා හට තුදුස් ආකාරයකින් සිත දමනය කිරීම ඉතා දුෂ්කරය. තුදුස් ආකාරයෙන්** සිත දමනය **කළ තැනැත්තා** හටද **ඍද්ධි විකුර්වණය** හෙවත් **අන් වෙශයන් ගැනීම** ඉතා දුෂ්කරය.

**සෘද්ධි විකුර්ණය** ඇත්තා හටද **බිජ්පතිසන්තිභාවය** හෙවත් වහ **වහා** ධ්‍යානයට **සමවැදීම** අති දුෂ්කරය. එබැවින් ආදිකාර්මික යොගාවචරයා විසින් මෙ තුදුස් ආකාරයෙන් සිත දමනය කොට **ඡන්ද, චිත්ත, වීරිය,** විමංසා යන **සතර සෘද්ධිපාදයන්** පෙරටු කොට ගෙන, ධ්‍යානයට සමවැදීම් වශයෙන් පඤ්චවසිතාදියෙන් මොලොක් කොට, සෘද්ධිවිධඥනය ලබනු පිණිස භාවනා කළ යුතුය. මෙසේ භාවනා වඩන යොගාවචරයාහට **සද්ධා, වීය්‍ය, සති සමාධි, ප්‍රඥ,** ආදියෙන් රැකුල් ලැබ, ධ්‍යාන සමාධීන් සමාහිතවූ කල්හි, නිවරණ යන් විෂ්කම්භණ වශයෙන් දුරු කොට පිරිසුදුවී, ක්‍රමයෙන් විතර්කා දී ඖදරිකාඞගයන් පහවී මෙන් ප්‍රභාස්වරවී, පහවූ රාගාදී අඞගණ ඇති කල්හි, උපක්ලේශයන්ගෙන් මිදී, පඤ්චප්‍රකාර වසීභාවයට පැමිණී මෙන් මෘදු වී, සෘද්ධිපාද භාවයට ආසන්න බවට පැමිණීමෙන් කර්මණ්‍ය වී, භාවනාව සම්පූර්ණ කොට, පඤ්චමධ්‍යානයෙහි සිත නිශ්චල බවට පමුණුවා, කසිණාලම්බණයෙන් ධ්‍යාන සිත වෙන් කොට, සෘද්ධිවිධය පිණිස අභිමුඛ කොට, ඉපදවිය යුතු සෘද්ධියට නංවන්නේය.

සෘද්ධිය දක්වීමට කැමැති යොගාවචර තෙමේ පළමු කී පරිදි සෘද්ධිය පිළිබඳ මූල ධර්ම සම්පාදනය කොට**, අභිඥපාදක පඤ්චමධ්‍යානයට** සමවැද එයින් නැගී සියයක් වනු කැමැති නම් ''සියයක් වෙමියි'' කාමාවචර සිතින් මෙනෙහි කිරීමෙන් පරිකර්ම කොට නැවත ආවර්ජනා අභිඥ පාදක ධ්‍යානයට සමවැද එයින් නැගී ''සියයක් වෙමියි'' ඉටා ගන්නේය. එවිට ඒ අධිෂ්ඨාන චිත්තය සමග සියයක් වේ. දහසෙක් වෙමියි පරිකර්මාදිය කෙළේවිනම් එසේම වෙයි. හෙනෙම මෙසේ බොහෝව, එකෙකු වෙමියි අධිෂ්ඨාන කෙළේ වීනම් එසේම වන්නේය. තවද මේ ක්‍රමයෙන්ම අප්‍රකට දෙය ප්‍රකට කිරීමත්, ප්‍රකට දෙය අප්‍රකට කිරීමත්, දුර වූ දය ලං කිරීමත්, ලංවූ දය දුර කිරීමත්, අහසෙහි ගමන් කිරීමත්, පොළොව කිමිදීමත් ජලයෙහි ඇවිදීමත් යනාදිය අධිෂ්ඨාන කෙළේවි නම් ඒ ඒ අධිෂ්ඨානය පරිදිම සිද්ධ වන්නේය. මෙලෙසින්ම මහත් සෘද්ධි ඇති මහත් ආනුභාව සම්පන්න සඳ හිරු දෙදෙනා ද අත් පසට ගැණීම, හිඳ හෝ අතින් පිරිමැදීම, අතින් අල්වා ගැණීම, යනාදි සෘද්ධීන් මේ සමාධි බලයෙන්ම දක්වන්නාහ.

තවද සෘද්ධිමත් තෙමේ, කුමාර වේශයක් හෝ, නාග වශෙයක් හෝ ගුරුළු වෙශයක් හෝ, ශක්‍ර, දිව්‍ය, බ්‍රහ්ම, සමුද්‍ර, පර්වත, සිංහ, ව්‍යාඝ්‍ර, ඇත් අස් ආදී වශයෙන් අතුරෙන් යමක් මවනු කැමැත්තේ නම්, ඒ ඒ දැය අධිෂ්ඨාන කොට, පඨවි කසිණාදීන් අතුරෙන් යම්කිසි ආරම්මණයකින් අභිඥා පාදක ධ්‍යානයට සමවැද, එයින් නැගී තමා කැමැති වෙශයක් ආවර්ජනා කළ යුතුයි. එසේ ආවර්ජනා කොට, පරිකර්මාවසානයෙහි නැවත සමවතට සමවැද එයින් නැගී මෙබඳු වෙශයකින් පෙණේවා යි අධිෂ්ඨාන කිරීම හා සමගම, එසේ වන්නේය.

## පරචිත්ත විජානන අභිඥා

අන්‍ය සත්ත්වයන්ගේ සිතෙහි ස්වභාවය පිරිසිඳ දන්නා නුවණ **පරචිත්ත විජානන ඥාණය** නම් වේ. එයටම **චෙතොපරිය ඥාණය** යයි ද කියනු ලැබේ.

**දිව්‍යචක්ෂුරභිඥන ලාභී** යොගාවචර තෙමේ පළමුකොට කසිණා ලොකය වඩා දිව ඇසින් අන්‍ය වූ **සත්ත්වයෙකුගේ හෘදය මාංස පිණ්ඩය** බලන්නේය. එවිට හෘදය ඇසුර කොට පවත්නා ලේ ධාතුවෙහි වර්ණය බැලීමෙන් සරාගාදී වූ සිත බලන්නේය.

සොම්නස් සිතක් පවත්නා කල ඒ ලෙය විලිකුන් නුග ඵලයක් මෙන් රතු පැහැය ඇත්තේය. දොම්නස් සිතක් පවත්නා කල, විලිකුන් අඹ ඵලයක් මෙන් කලු වර්ණ වේ. උපෙක්ෂා සිතක් පවත්නා කල පහන් තලතෙල් බඳු පැහැය වේ. එහෙයින්, ඒ හේතුන් අනුව, මේ සිත සොමනස්සින්ද්‍රිය සහගතය, මෙය උපෙක්ඛින්ද්‍රිය සහගතය, යනාදී වශයෙන් දැනගන්නේය. මෙසේ අනුමාන වශයෙන් දිව්‍යචක්ෂුරභිඥනයෙන් දැනගත් පසු, නැවත නැවත නුවණ මෙහෙයවා සෙවීමෙන් **චෙතොපරියඥාණය** ශක්තිමත් බවට පැමිණෙන්නේය. මෙසේ සිය දහස් වර බැලීමෙන් චෙතොපරියඥාණයට ආසන්නව පිහිටි කල්හි ඒ ක්ෂණයෙන් ඒ සත්ත්වයාගේ සිත අරමුණුකොට මනොද්වාරාවජ්ජන සිතක් උපදී. එයට අනතුරුව ජවන් පසක් හෝ සතරක් ඉපිද නිරුද්ධ වන්නේය. එයින් අවසාන සිත රූපාවචර පඤ්චමධ්‍යාන සිතය. ඒ සිත හා යෙදුනු ප්‍රඥා චෛත

සිතය **චෙතොපරිය ඤාණ** නම් වේ. ඒ සිතින් සරාග, වීතරාග, සදෙස, වීතදෙස, සමොහ, වීතමොහ යනාදී වශයෙන් සොළොස් ආකාර වූ චිත්තයන් දැන ගන්නේය.

## පුබ්බෙනිවාසානුස්සති අභිඥ

පෙර විසූ කඳ පිළිවෙල දක්නා නුවණ **පුබ්බෙනිවාසානුස්සති ඤාණය** නම් වේ. පෙර ජාතීන්හි කාම, රූප, අරූප භවයන්හි පැවැති ස්කන්ධ පරම්පරාව සිහි කිරීමට සමත් වූ ස්මෘතිය හෙවත් සතිය **පුබ්බෙනිවාසානුස්සති** නම් වේ. ඒ සතියෙන් යුත් ඤාණය **පුබ්බෙ-නිවාසානුස්සති ඤාණ** නම් වේ.

මේ නුවණ ලබනු කැමැති යොගාවචරයා විසින් රහසිගතව හුදකලාව, එක් අරමුණක සිත පිහිටුවා, පිළිවෙලින් රූපාවචර පඤ්චම ධ්‍යානයට සමවැද, අනතුරුව අභිඥපාදක ධ්‍යානයෙන් නැගිට තමා හිඳිනා ආකාරය මෙනෙහි කරන්නේය. එතැන් සිට පිළිවෙලින් අසුන් පැනවීම, සෙනසුනට පිවිසීම, එයට පෙර ආහාර අනුභව කිරීම, පළමු සිටි තැනින් පැමිණීම යනාදී වශයෙන් එදින උදය කාලයේදී මුව සේදීම, අවදිවීම, රාත්‍රි ගතකිරීම, එසේම එයට පෙර දිනයෙහි කළ කී දෑ අනුක්‍රමයෙන්, පටිලොම වශයෙන් මෙනෙහි කරන්නේය. මෙසේ මෙනෙහි කරණා කල්හි යම් කිසිවක් ප්‍රකටව නොවැටහේ නම්, නැවත පාදක ධ්‍යානයට සමවැද එයින් නැගී ආවර්ජනා කළ යුතු වේ. මෙසේ ප්‍රතිලොම වශයෙන් දෙවෙනි දවසද, තුන්වෙනි දවසද, සතර, පස්වැනි දවස ආදී වශයෙන් මාස වර්ෂ ගණන් ආපසු බලන්නේ මේ අත්බැව්හි තමාගේ ප්‍රතිසන්ධිය තෙක් මෙනෙහි කළ යුතු වේ. එතැනින් නොනැවතී එයට අනතුරුව පූර්වභවයෙහි චුතික්ෂණයත් ඒ සමග පැවති නාමරූපත් ආවර්ජනා කළයුතු වේ. භාවනාවට පටන්ගත් තැන් සිට එම භවයෙහි ප්‍රතිසන්ධිය දක්වා පිරියම් පිණිස පැවැති සමාධිය **පරිකර්ම සමාධිය** නම් වේ. යම් කලෙක මේ ප්‍රතිසන්ධි අවස්ථාව ඉක්මවා අනතුර පෙර භවයෙහි චුතික්ෂණයෙහි පැවැති නාම රූප අරමුණු කරන්නේ නම්, එය **පුබ්බෙ-නිවාසානුස්සති ඤාණය** නම් වේ. මෙසේ ඇති කල්හි එම නාමරූප-යන් අරමුණු කොට ගෙන මනොද්වාරාවජ්ජන චිත්තය උපදී. එයට අනතුරුව ජවන් සතරක් උපදී. එයින් අවසානයෙහිවූ සතරවැනි

**සිත** රූපාවචර අර්පණා සිතය. ඒ සිත හා සමග උපදනා ඥණය **පුබ්බෙනිවාසානුස්සති ඥණය** නම් වේ.

මේ ක්‍රමයෙන් ජාති එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ ඒ ඒ ජාතීන් පිළිබඳ ස්කන්ධ සන්තතිය හෝ ජාති සියයක් දහසක් හෝ නොයෙක් සංවට්ටකල්ප හෝ නොයෙක් විවට්ටකල්ප හෝ අනෙක ප්‍රකාරයෙන් සිහි කරන්නේය.

මේ පූර්ව නිවාසය සිහි කරන්නාවූ පුද්ගලයෝ සදෙනෙකි. එනම්:—**තීර්ථකයාය, ප්‍රකෘති ශ්‍රාවකයාය, අසූ මහා ශ්‍රාවකයෝය. අග්‍ර ශ්‍රාවකයෝය, පසේ බුදුවරයෝය, සම්මා සම්බුදුවරයන් වහන්සේය.**

මෙයින් **කර්මවාදී, ක්‍රියාවාදී තාපසාදීන්ගේ** ඥාණයෙන් ඉකුත් සතලිස් කපක් කල් සිහි කරති. ඔවුන් හට විදර්ශනා ඥනය නැති හෙයින් ස්කන්ධ පටිපාටියෙන්ම සිහි කරති.

**ප්‍රකෘති ශ්‍රාවකයෝ** කල්ප සියක් දහසක් සිහි කරති. එයද ස්කන්ධ පිළිවෙලින් හෝ චුති පටිසන්ධි පිළිවෙලිනි.

**අසූ මහා ශ්‍රාවකයෝ** කල්ප ලක්ෂයක් චුති ප්‍රතිසන්ධි ක්‍රමය අනුව සිහි කෙරෙති.

**දෑගසව්වෝ** එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් චුති පටිසන්ධි පිළි-වෙලින් සිහි කෙරෙති.

**පසේබුදුවරයෝ** දෙයාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් චුතිපටිසන්ධි වශයෙන් සිහි කරති.

බුදුවරුන්ට වූ කලී ස්කන්ධ පටිපාටියක් හෝ, චුතිපටිසන්ධි පටිපාටියක් හෝ කාල නියමයක් හෝ නැත්තේය. නොයෙක් කෝටි ගණන් කල්ප අත්හැර යම් යම් කලක් බැලිමට කැමැති වන්නේ නම් ඒ ඒ කාලය ප්‍රකට වේමය.

X

## ඵලසමාපත්ති වීථි

ප්‍රඥා භාවනාවෙහි හෙවත් **විදර්ශනා** වැඩීමෙහි ආනිශංස වූ **කෙලෙස් නැසීමය, ආර්‍ය්‍ය ඵල රසය අනුභව කිරීමය, නිරොධ සමාපත්තියට සමවැදීමට සමත් බවය, ආහුනෙය්‍ය භාවාදී සිද්ධිය** යනාදී අනෙකවිධ අනුසස් අතුරෙන් **ආර්‍ය්‍ය ඵල රස** අනුභව කිරීම ද්විප්‍රකාර වේ. එයින් මාර්ග චිත්ත වීථියෙහි, මාර්ග සිතට අනතුරුව අකාලික විපාක වශයෙන් ලැබෙන්නාවූ ඵල සිත් දෙතුන්දෙනාගේ පහළවීම **පළමුවෙනි ආර්‍ය්‍ය ඵල රස** අනුභව කිරීම නම් වේ. **ප්‍රවෘත්ති** කාලයෙහිදී **ඵල සමාපත්තියට සමවැදීම දෙවෙනි ආර්‍ය්‍ය ඵල රසය** අනුභව කිරීම නම් වේ.

ආර්‍ය්‍යයන් වහන්සේගේ ඵල චිත්තය වනාහී අප්‍රමාණ වූ නිර්වාණය අරමුණුකොට පටිප්පස්සද්ධිප්‍රහාණියෙන් ක්ලෙශයන්ගේ සංසිඳුවීම කර වන චිත්තයකි. මෙසේ නිර්වාණාලම්බණය ගෙන උපදනා ඵල චිත්තයන්ගේ පැවැත්ම හෙවත් අර්පණාව **ඵල සමාපත්ති** නම් වේ.

සියලුම ආර්‍ය්‍යයෝ තම තමන් පිළිබඳ ඵලයට සමවදින්නාහුය. **සෝවාන් ආර්‍ය්‍ය පුද්ගල තෙමේ සෝවාන් ඵලයටද, සකෘදගාමි පුද්ගලතෙමේ සකෘදගාමි ඵලයටද, අනාගාමී පුද්ගලතෙමේ අනාගාමි ඵලයටද, රහතන් වහන්සේ රහත් ඵලයටද** සමවදින්නේය. සකෘද ගාමි පුද්ගලතෙමේ සොවාන් ඵලයට සම නොවදී. අනාගාමි පුද්ගල තෙමේ සොවාන් සකෘදගාමි ඵලයන්ට සම නොවදී. රහතන් වහන්සේ සොවාන්, සකෘදගාමි, අනාගාමි ඵලයන්ට සම නොවදී.

මෙසේ ආර්‍ය්‍යයන්ගේ ඵල සමාපත්තියට සමවැදීම, ඉහාත්ම යෙහිම කෙලෙස් විඩා දහයන් සංසිඳුවා, නිවණ අරමුණු කරමින් සුවසේ වසනු පිණිසමය. කැමැති, කැමැති කෙණෙහි ආර්‍ය්‍ය පුද්ගලයෝ ඵල සමවතට සමවදිත්.

ඵලසමවතට සමවදනා කැමැති ආර්‍ය්‍ය පුද්ගලතෙමේ රහසිගතව, නොයෙක් අරමුණෙන් වැළකී සිතින්, උදයව්‍යයාදී වශයෙන් සංස්කාර යන් විදර්ශනාවට නංවන්නේය. එසේ මනාකොට පරිපූර්ණ වූ විදර්ශනා ඥාන ඇති කල්හි **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, මනොද්-**

**චාරාවජ්ජනය, පරිකර්මය, උපචාරය, අනුලෝමය, වොදනය** යන සිත් පිළිවෙලින් ඉපිද අනතුරුව ඵල සමාපත්ති වශයෙන් **නිවන් අරමුණු කරමින් ඵල සිත්** පිළිවෙලින් කැමැති තාක් කල් උපදී. **ආර්‍ය්‍ය පුද්ගලතෙමේ**, සමථයානිකයෙක්ව, වැඩූ ධ්‍යානය පාදක කොට ගෙන මාර්ග ඵල ලැබූයේවීනම්, ඔහට එම ධ්‍යානික ඵලයම ලැබෙන් නේය. එවිට ඔහුගේ ඵල සමාපත්තිය වන්නේ එම ධ්‍යානික ඵල සිත්මය. සමවතට සමවැදීමට පෙර අසුවල් කාලයෙහි ඵල සමවතින් නැගී සිටිමියි අධිෂ්ඨාන කෙළේවීනම්, ඒ කාලය තුල සමවතෙහි සිටීම වන්නේය. මේ ඵල සමාපත්තියෙන් නැගිටීමේදී, අවසාන ඵල සිතට අනතුරුව තමන්ගේම ඤාණ සම්ප්‍රයුක්ත විපාකයක් වූ භවඞ්ග සිතින් සමවතින් නැගිටීම වන්නේය.

මන්දප්‍රාඥයා හට උපදනා ඵල සමාපත්ති වීථිය මෙසේයි.

...භ න ද ම ප උ නු වො ඵ ඵ ඵ .....භ භ ......

තීක්ඛප්‍රාඥයා හට පරිකර්ම සිත පමණක් නූපදී.

**මේ ඵල සමාපත්ති වීථිය**, ධ්‍යාන **සමාපත්ති වීථියට** බොහෝ සෙයින් සමානය. ගොත්‍රභූ චිත්තය වෙනුවට වොදන සිත ද, ධ්‍යාන සිත් වෙනුවට ඵල සිත් ද යොදගත් කල්හි ඵල සමාපත්ති වීථිය දතහැකි වේ.

**ශුෂ්කවිදර්ශක ආර්‍ය්‍ය පුද්ගල** තෙමේද ඵල සමාපත්තියට සම **වදනා හෙයින්**, හෙතෙමේ මාර්ගය උපදවා ගැනීමට පෙර ධ්‍යාන වඩා තිබෙන බව පැහැදිලි වේ. එසේ ධ්‍යාන නොවැඩූ පුද්ගලයෙකුට ලෞකික ධ්‍යානයන්ට වඩා සැම ආකාරයකින්ම උතුම් වූ ආනන්තරික් සමාධිය නම් වූ මේ ඵල සමාපත්තියට සමවැදීමට නොහැකි වේ.

## නිරොධ සමාපත්තිය

**නිරොධ සමාපත්තියට සමවැදීමෙහි සමර්ථ බවද ප්‍රඥ භාවනා** වෙහි **ආනිශංසයකි.**

විදර්ශනා ඥානය අනුව පැවැති අෂ්ටසමාපත්තීන්ට පිළිවෙලින් සමවැද, ඒ ඒ සමාපත්තියෙහි ප්‍රතිපක්ෂ ධර්මයන්නිරුද්ධ කිරීමෙන්ද, කායාදි ත්‍රිවිධ සංස්කාරයන් පිළිවෙලින් නිරුද්ධ කිරීමෙන්ද, අධිෂ්ඨාන කළ කාලය තුල චිත්ත චෛතසික ධර්මයන්ගේ නොපැවැත්ම, **නිරොධ සමාපත්ති** නම් වේ.

කාමරාගය, නිරවශෙෂ ප්‍රහාණයෙන් නැසූ **අෂ්ටසමාපත්තිලාභී අනාගාමී පුද්ගලයන් හා, අෂ්ටසමාපත්ති ලාභී අර්හත් පුද්ගලයෝම නිරොධ සමාපත්තියට සමවදිති.** පෘථග්ජනයෝද, සොවාන්,සකෘද-ගාමී පුද්ගලයෝද අෂ්ට සමාපත්ති නොලැබූ අනාගාමී සහ රහතන් වහන්සේලා ද **නිරෝධ සමාපත්තියට සම නොවදිත්.** නිරොධ සමාපත්තියට සමවදනා ආර්‍ය්‍ය පුද්ගලයෝ **සමථ විදර්ශනා බලද්වයෙන්ම** යුක්ත වන්නාහ. ධ්‍යාන බලයෙන් සංසිඳවන ලද ත්‍රිවිධ සංස්කාරයන් ඇත්තාහ. **ප්‍රථම ධ්‍යානය** ලැබීමෙන් **සමාධිය** බලවත් වන්නේය. **ද්‍විතියධ්‍යානයට** සම වන්නහුගේ විතර්ක විචාර අත්හැරීමෙන් **වචී සංස්කාරයෝ සංසිඳුනාහු වෙත්,** හෙවත් කථා කිරීම් නතර වූයේවේ. **චතුර්ථධ්‍යානයට** සමවන්නහුගේ **ආශ්වාස, ප්‍රශ්වාස නතර වීමෙන් කාය සංස්කාරයන් සංසිඳෙත්. සඤ්ඤාවේදයිත නිරොධයට** හෙවත් **නිරොධ සමාපත්තියට** සම වන්නහුගේ සංඥා, **වෙදනා හා සම්ප්‍රයුක්ත සංස්කාර ධර්මයන්** හෙවත් චිත්ත ප්‍රවෘත්තිය සංසිඳෙත්.

නිරොධ සමාපත්තියට සමවදනාවූ පුද්ගලයෝ සංස්කාර ධර්මයන්ගේ ඉපදීම් බිඳීම් දැක කළ කිරීම හේතුකොටගෙණ ඉහාත්මයෙහිම චිත්ත චෛතසික ධර්මයන්ගේ නිරොධය සඞ්ඛ්‍යාත නිර්වාණ ධාතුවට පැමිණ, ශාන්ත සුඛයෙන් සුවසේ වැසීම අපේක්ෂා කොටම සමවදින්නාහු වෙත්.

සමථ භාවනා වඩනලද පුද්ගලතෙමේ සතරවෙනි අරූපධ්‍යාන සමාපත්තියට පමණක් සම වැද නවති.

විදර්ශනා වශයෙන් භාවනා වඩන ලද පුද්ගලයෝ ඵල සමාපත්තියට පමණක් සම වැද නවති.

**සමථ විපස්සනාවන් දෙදෙනාගේ වශයෙන්ම භාවනා වඩන ලද අනාගාමී රහත් පුද්ගලයෝ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයාගේ නිරොධය කිරීමෙන් නිරොධ සමාපත්තියට සමවදිත්.**

එබැවින් නිරොධ සමාපත්තියට සමවදිනු කැමැති ආර්‍ය්‍ය පුද්ගල තෙමේ බත් කිස නිමවා, අත්පා මනාව සෝද, විවේකස්ථානයක; මනාව පැනවූ ආසනයක පලග බැඳ, කය ඍජු කොට පිහිටුවා; සිහිය කර්මස්ථානයට අභිමුඛ කොට එළවා වැඩහිඳ, ප්‍රථමධ්‍යානයට සමවැද, එයින් නැගී ඒ ධ්‍යානයෙහිවූ සංස්කාරයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් විදර්ශනා වඩන්නේය: ඉක්බිති ද්‍විතියධ්‍යානයට සමවැද එයින් නැගී එහි වූ සංස්කාරයන් එසේම විදර්ශනා කරන්නේය. ඉක්බිති හෙතෙමේ පිළිවෙලින් තෘතියධ්‍යානය, චතුර්ථධ්‍යානය, ආකාශානඤ්චායතන ධ්‍යානය, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය යන ධ්‍යානයන්ට සමවැද ඒ ඒ ධ්‍යානයෙන් නැගී ඒ ඒ ධ්‍යානයන්හි වූ සංස්කාරයන් එසේම විදර්ශනා කොට චතුර්විධ පූර්වකෘත්‍යය කරන්නේය. ඒ චතුර්විධ පූර්වකෘත්‍යයෝ නම්:—

1. **නානාබද්ධ අවිකොපනය.**
2. **සංඝ පතිමානනය**
3. **සත්ථු පක්කොසනය**
4. **අද්ධාන පරිච්ඡෙදය යන සතරයි.**

එයින් **නානාබද්ධ අවිකොපනය** නම්, ඒ භික්ෂුව සමග එකාබද්ධ වූ පිරිකර හැර, අන්‍ය වූ පාත්‍ර සිවුරු ආදිය හෝ, ආසනාදිය හෝ, වසන ගෙය හෝ, අන් කිසි පරිෂ්කාරයන් හෝ, ගිනි, දිය, වාත, සොර සතුරු, වන සතුන් ආදීන්ගෙන් විනාශ නොවන සේ අධිෂ්ඨාන කිරීමයි. මෙසේ අධිෂ්ඨාන කොට නිරොධ සමාපත්තියට සමවැද සිටින කාලය තුළ යම් උපද්‍රවයන් පැමිණියත් එයින් ඉටාගත් වස්තූන් විනාශ නොවේ. අධිෂ්ඨාන නොකෙළේවීනම් එකාබද්ධ පිරිකර හැර අන්‍ය වූ නානාබද්ධ පරිෂ්කාරයන් විනාශ වේ. ඒකාබද්ධ වූ හඳනා, පොරෝනා හෝ, වැඩහුන් අසුන් හෝ උපද්‍රවයන් ගෙන් රැකීමට අධිෂ්ඨානයක් උවමනා නැත. එය සමාපත්ති බලයෙන් ම රැකෙන්නේය.

**සංඝ පතිමානනය** නම් නිරොධ සමාපත්තියට සමවදිනු ලබන ආයඹී පුද්ගල වූ භික්ෂුන් වහන්සේ ගැන භික්ෂු සඞ්ඝයා වහන්සේගේ බලාපොරොත්තුවයි. සංඝ කර්මයක් කිරීමට රැස්වූ සඞ්ඝයා වහන්සේ මේ භික්ෂුන් වහන්සේ පැමිණෙන තෙක් සඞ්ඝ කර්මය නොකොට මේ භික්ෂුවගේ පැමිණීමම බලාපොරොත්තු වෙයි. එබැවින් භික්ෂුන් වහන්සේ සමවතට සමවදින්නට පෙර, පූර්වකෘත්‍යයක් වශයෙන්, සඞ්ඝයා බලාපොරොත්තු වුවහොත්, දූතයකු එවා කැඳවන්නට පෙර සමවතින් නැගිටින්නෙමියි අධිෂ්ඨාන කරන්නේය. එය එසේම සිදුවන්නේය. එසේ අධිෂ්ඨාන නොකොට සමවතට සම වන්නේවී නමුත්, සඞ්ඝ කර්මය පිණිස රැස්වූ සඞ්ඝයා වහන්සේ ඒ භික්ෂුවගෙන් වෙන්ව ඒ සඞ්ඝ කර්මය නොකොට, උන්වහන්සේ සිටින තැන් විමසා, නිරොධයට සමවන් බව දැන, සඞ්ඝයාගේ වචනයෙන් කැඳවනු පිණිස දූත භික්ෂුවක් යවා ආමන්ත්‍රණය කරවී නම් ඒ දූත වචනයට අනතුරුව සමවතින් නැගී සිටීම ඒකාන්තයෙන්ම සිදුවන්නේය. සඞ්ඝාඥව ඉතා ගරු හෙයිනි.

**සත්ථු පක්කොසනය** නම් ශාසතෘන් වහන්සේගේ ආමන්ත්‍රණයයි. නිරොධ සමාපත්තියට සමවැද සිටින කාලයේදී ශික්ෂාපද පැණවීමක් හෝ ඉතා වැදගත් ධර්මදෙශනාවක් හෝ කරණු කැමැතිව සර්වඥයන් වහන්සේ මාගේ පැමිණීම බලාපොරොත්තු වන්නේ නම්, දූත භික්ෂුවක් පැමිණ මා අමතන්නට පෙර, මා සමවතින් නැගිටින්නෙමියි අධිෂ්ඨාන කරන්නේය. එසේ නොකළහොත්, එවැනි කරුණක් ඇති කල්හි බුදුන් වහන්සේ අසුවල් භික්ෂුව කොහේදැයි විමසා, නිරොධයට සමවන් බව දැන, සර්වඥයන් වහන්සේගේ වචනයෙන් ඔහු කැඳවයි. දූත භික්ෂුවක් යවා කැඳවන කල්හි, සමවතින් නැගීටීම සිදුවන්නේය.

**අද්ධාන පරිච්ඡෙදය** – ජීවිතය පවත්නා කාලය පිරිසිඳ දැනගැනීමයි. නිරොධ සමාපත්තියට සමවදනා ආයඹීයන් වහන්සේ තමා ජීවත්වන කාල පරිච්ඡේදය දැනීමෙහි දක්ෂයෙක් විය යුතුයි. සමවතට සමවැද සිටිනා කාලය තුළ තමාගේ ආයුෂය පවතීද නැතිද යන බව ආවර්ජනා කොටම සමවතට සමවැදිය යුතුයි. නිරොධ සමාපත්තියෙන් තමාගේ මරණය වැළකිය නොහැකි වේ. නිරොධයට සමවැද සිටින අවස්ථාවේදී මරණය සිදු නොවන බැවින්, මරණයට පෙර නිරොධයෙන්

නැගිටීමට සිදු වන්නේය. එබැවින් ආයඝියන් වහන්සේ, තමාගේ ආයු සංස්කාරය පවත්නා කල් බලා එයට කලින් නැගිටින ලෙස කාල නියමය අධිෂ්ඨාන කොට නිරොධ සමාපත්තියට සමවදින්නේය. මේ අද්ධාන පරිච්ඡෙදයවූ කලී ආවර්ජනා කටයුතුමැයි.

මේ ක්‍රමයෙන් ඒ ආයඝියන් වහන්සේ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයෙන් නැගිට, මෙකී චතුර්විධ පූර්වකෘත්‍යයන් කොට, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයට සමවදින්නේය. ඉක්බිති එම ධ්‍යාන චිත්තවාර එකකින් හෝ දෙකකින් පසු උන්වහන්සේගේ චිත්ත සන්තතිය නිරුද්ධවේ. චිත්තයාගේ නිරොධය සමගම චෛතසිකයෝද, සිතින් හටගන්නා චිත්තජරූපයන්ගේ ඉපැද්මද නිරුද්ධ වෙත්.

**නිරොධ සමාපත්තියෙහි ස්ථිතිය** – මනුෂ්‍ය ලොක ආදී කබලිකාරාහාරයෙන් ජීවත්වන භවයන්හි වැඩිම ගණනින් සත්දිනක් නිරොධයට සමවැද සිටිය හැකිවේ. කිසිදු කබලිකාරාහාරයක් නොගෙන මනුෂ්‍ය ශරීරය ක්ලාන්ත නොවී පවත්වා ගත හැකි වැඩිම කාලය එපමණය. රූපාවචර භවයන්හි කැමැති පමණ කාලයක් නිරොධ සමවත් සුවයෙන් විසිය හැකිවේ. ඒ අතර, ආයු ගෙවීමය සංඝපටිමානනය, සත්ථුපක්කොසනයයන් අතුරෙන් යමක් ඇතිවීනම්, නිරොධයෙන් නැගීම වන්නේය.

**නිරොධ සමාපත්තියෙන් නැගීම** – අනාගාමී ආයඝියන් වහන්සේ නිරොධ සමාපත්තියෙන් නැගිටින කෙණෙහි **අනාගාමී ඵල** සිතද, රහතන් වහන්සේ නිරොධයෙන් නැගිටින කෙණෙහි **අර්හත් ඵල සිතද** එක්වරක් හටගෙන නිරුද්ධ වූ පසු භවඞ්ග සිත් පහළවී පළමු මෙන් චිත්ත ප්‍රවෘත්තිය ඇති වන්නේය.

**නිරොධ සමාපත්තියෙන් නැගිටි ආයඝියන් වහන්සේගේ චිත්තය නිර්වාණයටම නැමුණේ වේ.**

**මළ තැනැත්තාගේ හා නිරොධයට සමවන් ආයඝියාගේ වෙනස.**

මළ තැනැත්තාගේ **කාය සංස්කාර** නම්වූ ආශ්වාස ප්‍රශ්වාස නිරුද්ධ වූවාහුය. **වචී සංඛාර** නම් වූ **වචී විඤ්ඤත්තිය** ද,

**චිත්ත** සංඛාරයන්ද, නිරුද්ධවූවාහුය, එසේම **ආයුෂය** හෙවත් **ජීවි-තෙන්ද්‍රියද, කර්මජ තෙජො ධාතුවද, චක්ඛු ආදී ඉන්ද්‍රියයෝද** පිරිහුණා හුය.

නිරොධයට සමවන් ආයුෂ්මතුන් වහන්සේගේද **කායසංඛාර** හෙවත් ආශ්වාස, ප්‍රශ්වාස නිරුද්ධ **වෙත්.** එමෙන්ම **වචී සංඛාර චිත්ත සංඛාරයෝද,** නිරුද්ධ වන්නාහ. නමුත් **ආයුෂය, කර්මජ තෙජො ධාතුව,** චක්ඛු **ආදී ඉන්ද්‍රියයන්ද** නොපිරිහුණාහුය. එබැවින් ශරීර උෂ්ණයත්, **චක්ඛු** ආදී ඉන්ද්‍රියයෝත්, ආයුෂයත් විද්‍යා-මානය.

තවද නිරොධය අවිද්‍යමාන වුවත්, **සංඛත** නොවන්නේය. එසේම **අසංඛත,** යයි ද, **ලෞකික** යයිද, **ලොකොත්තරයයිද** කිය නොහැකි වේ. එහෙත් , නිරොධ සමාපත්තියට සම වන්නහුගේ වශයෙන් ඒ නිරොධ සමාපත්තියට සමවන්නී නම් වේ. එබැවින් **නිෂ්පන්නය** යයි කියයුතු වේ. අනිෂ්පන්න නොවේ.

නිරොධ සමාපත්තියට සම වැදීමෙදී ඇතිවන චිත්ත වීථිය මෙසේ දත යුතුයි.

...න ද ම ප උ නු වො ඣා ඣා **(නිරොධය)** එ භ භ ...

මෙහි **අනාගාමි පුද්ගලයෙකු** නම් ''ඣා'' යන්නෙන් **නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල් සිතද, 'එ'** යන්නෙන් **අනාගාමි ඵලසිතද** දක් වේ. **රහතන් වහන්සේට** නම් **'ඣා'** යන්නෙන් **නෙවසඤ්ඤානාසඤ්ඤා යතන ක්‍රියා** සිතද, 'එ' යන්නෙන් **අර්හත් ඵලසිතද** දක්වේ. **නෙව සඤ්ඤානාසඤ්ඤායතන** සිතටත් ඵල සිතටත් අතර නිරොධ සම වතට සමවැද සිටිනා කාලයයි.

මේ නිරොධ සමාපත්තියට සම වැදීමට **දිට්ඨධම්ම නිබ්බාණ සුඛ විහරණය** හෙවත් ඉහාත්මයෙහිම නිවන් සැප විදිමයයි කියනු ලැබේ.

අෂ්ට සමාපත්තින්හි අග තැන්පත් වූද, කාම රාගය නිරවශෙෂ යෙන් ප්‍රහීණ කළාවූද, අනාගාමී, අර්හත් පුද්ගලයෝම, නිරොධ

සමාපත්තියට සමවදින්නාහුයයි කියන ලද නමුත්, කාමාවචර භූමියෙහිම වසන්නා වූ අනාගාමීන්ට හා රහතුන්ට මුත්, රූප භූමියෙහිවත්, අරූප භූමියෙහිවත් වසන්නාවූ ආර්‍ය්‍යයන්ට නිරොධ සමාපත්තිය නොලැබෙන්නේයයි සමහරුන්ගේ මතය වේ. එයට මෙසේ කරුණු දක්වති. නිරොධයට සම වදින්නාවූ ආර්‍ය්‍යයන් වහන්සේ විසින් රූපාවචර ප්‍රථම ධ්‍යානය පටන් චතුෂ්කනයින් අෂ්ට සමාපත්තියට සමවැද ක්‍රමයෙන් ගොස් නාම ධර්මයන්ගේ නිරොධය කටයුතු වෙයි. රූප භූමියෙහි උපන්නාවූ ආර්‍ය්‍යයන් හට අරූප ධ්‍යාන හෝ, අරූප භූමියෙහි උපන්නාවූ ආර්‍ය්‍යයන් හට රූප ධ්‍යාන හෝ නො ලැබිය හැකි බැවින් රූපාරූප භූමි දෙක්හිම උපන්නාවූ අනාගාමීන්ට හා රහතුන්ට නිරොධ සමාපත්තිය නො ලැබෙන්නේය යනුයි. සමහර ආචාර්‍ය්‍යවරයෝ වනාහි, අරූප භවයෙහි රූප නැති හෙයින් එහි පමණක් නිරොධ සමාපත්තියට සම නොවදින්නේ යයි කියති. කෙසේ වෙතත් අෂ්ට සමාපත්තිලාභී අනාගාමී අර්හත් පුද්ගලයෝ පළමුකොට ප්‍රථම ධ්‍යානයට සමවැද, ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ගයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ලක්ෂණත්‍රයට ආරොපණය කොට ප්‍රත්‍යවේක්ෂා කරත්. මෙසේ ක්‍රමයෙන් අනිකුත් රූපාවචර, අරූපාවචර ධ්‍යානයන්ටද සමවැද, ඒ ඒ ධ්‍යානයන් පිළිබඳවූ ධ්‍යානාඞ්ගයන් ත්‍රිලක්ෂණ වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කොටම, අවසානයේදී නිරොධ සමාපත්තියට සමවදින්නාහ.

## අර්පණා නියමය

**අර්පණාචිත්ත වීථියක, අර්පණා චිත්තයට** පෙර **පරිකර්ම උපචාර, අනුලොම, ගොත්‍රභූ** යයි සිත්සතරක් උපදී. මේ සිත්සතර බොහෝ සෙයින් සමාන බැවිනුත්, අර්පණා චිත්තයට ඉතා ලංව, එයටම අනුකූලව උපදින හෙයින්, එයට **උපචාර සිත්** යයිද, **අනුලොම සිත්** යයිද ව්‍යවහාර කරණු ලැබේ. **උපචාර සමාධිජවන්** යයි කියනු ලබන්නේ මේ අනුලොම සිත්වලටය.

මෙසේ **අනුලොම වශයෙන්** උපදින සිත් අටෙකි. එනම් **කාමාවචර ඥාණ සම්ප්‍රයුක්ත** මහා **කුසල් සිත් සතරත්, ඥාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරත්ය.** මේ **කුසල් සිත් සතරෙන්, සිත්**

දෙකක් සොමනස්ස සහගතය, සිත් දෙකක් උපෙක්ඛා සහගතය, **ක්‍රියා සිත් සතරෙන්ද** සිත් දෙකක් **සොමනස්ස සහගතය,** දෙකක් **උපෙක්ඛා සහගතය.**

**අර්පණා වශයෙන්** උපදින සිත් පනස් අටෙකි. එනම්:-

| | |
|---|---|
| රූපාවචර කුසල් සහ ක්‍රියා සිත් | 10 |
| අරූපාවචර කුසල් සහ ක්‍රියා සිත් | 8 |
| ලෝකෝත්තර මාර්ග ඵල සිත් | 40 |
| | 58 |

අනුලොම සිත් සතරක් හෝ තුනක් හෝ ඉපිද නිරුද්ධ වූ පසු, අර්පණා චිත්ත වීථියේ උපදින අර්පණා සිත් මේ පණස් අටක් අර්පණා ජවනයන්ගෙන් එකක්ම විය යුතුයි.

ඒ ඒ අනුලොම සිත්වලට අනතුරුව කවර අර්පණා ජවන් සිත් ඇතිවේදැයි දැක්වීම **අර්පණා නියමය වේ.**

ඒ අර්පණා නියමය මෙසේ දත යුතුයි;-

කසිණාදී කර්මස්ථාන ගෙණ භාවනා වඩන කල්හි, ධ්‍යාන උපදවා ගත හැකි වන්නේ අරමුණ විභූත වශයෙන් හෙවත් ප්‍රකට වශයෙන් වැටහුණු කල්හි බැවින්, **ධ්‍යාන ජවන්, මාර්ග ජවන්, ඵල ජවන්,** උපදින අර්පණා චිත්ත වීථින්ගේ අරමුණු සියල්ලම **විභූතාරම්මණ** වෙත්.

**අර්පණා වීථින්හි තදරම්මණ සිත් නූපදි.** තදරම්මණ උපදින්නේ කාම ජවනයන්ට අනතුරුවමය.

අර්පණා සිත්වලට පළමුව උපදින අනුලොම ජවනයන්වූ මහා කුසල් හෝ මහා ක්‍රියා සිත් හෝ ඤාණ සම්ප්‍රයුක්ත විය යුතුය.

කමටහන් වඩන යොගාවචර තෙමේ **මන්දප්‍රාඥ** හෝ **තීක්ෂ්ණප්‍රාඥ** පුද්ගලයෙක් හෝ වන්නේය. මද පමණින් තියුණු කළ නුවණ

ඇති මන්දප්‍රාඥ පුද්ගලයාහට උපචාර සමාධි ජවන් හෙවත් අනුලොම වශයෙන් සිත් සතරක්ම උපදී. එයට අනතුරුව මාර්ග හෝ ඵල සිත් ලැබෙන්නාහ. මනාකොට තියුණු කළ නුවණ ඇති තීක්ෂප්‍රාඥ පුද්ගලයා හට උපචාර සමාධි ජවන් හෙවත් අනුලොම සිත් තුනක්ම ලැබේ.

ධ්‍යාන පමණක් ලබනු කැමැති පුද්ගලයාගේ සමථ භාවනා සිත ධ්‍යානයන්ටම අභිමුඛ කරයි. මාර්ග ඵල ලබනු කැමැති පුද්ගලයාගේ විදර්ශනා භාවනා සිත මාර්ග ඵලයන්ටම අභිමුඛ කරයි. ධ්‍යාන පමණක් ලැබීමට කරණ භාවනාව සමථ භාවනා නම් වේ. මාර්ගඵල ලැබීමට කරණ භාවනාව සමථ විදර්ශනා දෙකින්ම යුක්ත නමුත් එයට විදර්ශනා භාවනා යයි කියනු ලැබේ.

අර්පණා ජවන් වීථියෙහි උපදනා උපචාර සමාධි ජවනයෝ සොමනස්ස සහගත වුවහොත් , එයට අනතුරුව උපදින අර්පණා ජවනයද, සොමනස්ස සහගත ජවනයක්ම වන්නේය.

සොමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත කුසල් ජවන් දෙකකි. එයට පසුව උපදින සොමනස්ස සහගත අර්පණා ජවනයෝ දෙතිසකි. එනම්:—

| | |
|---|---|
| සොමනස්ස සහගත කුසල් ජවන් | 4 |
| (1–4 රූපාවචර ධ්‍යාන කුසල්) | |
| සොමනස්ස සහගත මාර්ග ජවන් | 16 |
| (1–4 වෙනි ධ්‍යාන මාර්ග සිත්) | |
| යට ඵලවශයෙන් උපදනා සොමනස්ස ඵල ජවන් | 12 |
| (1–4 ධ්‍යාන සොවාන්, සකෘදගාමී අනාගාමී ඵල) | |
| | 32 |

සොමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත ක්‍රියා ජවන් දෙකකි. එයට පසුව අර්පණා වශයෙන් උපදින සොමනස්ස සහගත ක්‍රියා ජවනයෝ අට දෙනෙකි. එනම්:—

| | |
|---|---|
| **සොමනස්ස මහග්ගත ක්‍රියා ජවන්** | 4 |
| (1–4 ධ්‍යාන ක්‍රියා සිත්) | |
| **සොමනස්ස අර්හත් ඵල ජවන්** | 4 |
| (1–4 ධ්‍යාන අර්හත් ඵල සිත්) | 8 |

ක්‍රියා ජවන් සිත් උපදින්නේ රහතන් වහන්සේ ට පමණය. උන්වහන්සේට ලොකොත්තර අර්පණා ජවන් වශයෙන් ලැබෙන්නේ අර්හත් ඵල සිත් පමණකි.

**අර්පණා ජවන වීථියේ උපදනා උපචාර සමාධි ජවන් උපෙක්ඛා සහගත වුවහොත්**, එයට අනතුරුව උපදින **අර්පණා** ජවනයද **උපෙක්ඛා සහගත ජවනයක්**ම වන්නේය.

**උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත කුසල්** ජවන් දෙකෙකි. එයට අනතුරුව උපදින **උපෙක්ඛා සහගත** අර්පණා ජවණයෝ දෙළො **සෙකි.**

එනම්:—

| | |
|---|---|
| **උපෙක්ඛා සහගත පඤ්චමධ්‍යාන රූපාවචර කුසල් සිත** | 1 |
| **උපෙක්ඛා සහගත අරූපාවචර කුසල් සිත්** | 4 |
| **උපෙක්ඛා සහගත පඤ්චමධ්‍යාන මාර්ග සිත්** | 4 |
| **යට ඵල තුනට අයත් පඤ්චමධ්‍යාන ඵල සිත්** | 3 |
| | 12 |

**උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත ක්‍රියා** ජවන් **දෙකෙකි.** එයට අනතුරුව උපදනා **උපෙක්ඛා සහගත අර්පණා** ජවනයෝ **සදෙනෙකි.**

එනම්:—

| | |
|---|---|
| **උපෙක්ඛා සහගත පඤ්චමධ්‍යාන රූපාවචර ක්‍රියා සිත** | 1 |
| **උපෙක්ඛා සහගත අරූපාවචර ක්‍රියා සිත්** | 4 |
| **උපෙක්ඛා සහගත අර්හත් ඵල සිත** | 1 |
| | 6 |

මේ අර්පණා ජවනයන් රහතන් වහන්සේලාට පමණක් ඇතිවන හෙයින් සියල්ල ක්‍රියා සිත්ම වන්නේය.

කුසල් සිත් උපචාර ජවන් වශයෙන් ඉපිද, අර්පණා උපදින්නේ පෘථග්ජනයන්ට හා රහත් නොවූ ශෛක්ෂයන්ටය.

ක්‍රියා සිත් උපචාර ජවන් වශයෙන් ඉපිද, අර්පණා උපදින්නේ අශෛක්ෂවූ රහතන් වහන්සේටය.

# විපාක නියමය

**ආරම්මණයෝ** තුන් වැදෑරුම් වෙත්. එනම්, **අනිෂ්ටාරම්මණ, ඉෂ්ටමධ්‍යාස්ථාරම්මණ සහ අති ඉෂ්ට ආරම්මණ** යෝයි.

පූර්වයෙහි කරන ලද අකුශල කර්මයන්ගේ විපාක වශයෙන් **අනිෂ්ටාරම්මණයන්ද**, කුසල කර්මයන්ගේ විපාක වශයෙන් **ඉෂ්ට මධ්‍යස්ථ** සහ **අති ඉෂ්ටාරමමණයන්ද** හමුවන්නාහ.

**අනිෂ්ටාරම්මණයක්** හමුවීමෙන් පහළවන චිත්ත වීථියක ලැබෙන විපාක වීථි සිත් සියල්ලම අකුසල් විපාක සිත්ම විය යුතුයි. එසේම ඉෂ්ටාරම්මණයක් හමුවීමෙන් ඇතිවන චිත්ත වීථියක ලැබෙන විපාක වීථි සිත් සියල්ල කුසල විපාක සිත්ම විය යුතුයි.

අකුසල විපාක වශයෙන් ලැබෙන වීථි සිත් සතකි.

එනම්:—

| | |
|---|---|
| අකුසල විපාක චක්ඛු විඤ්ඤාණාදි විඤ්ඤාණ සිත් | 5 |
| අකුසල විපාක සම්පටිච්ඡන සිත | 1 |
| අකුසල විපාක සන්තීරණ සිත | 1 |
| | 7 |

කුසල විපාක වශයෙන් ලැබෙන විථි සිත් සොළොසෙකි.

එනම්:—

| | |
|---|---|
| **කුසල විපාක චක්ඛු විඤ්ඤාණාදි විඤ්ඤාණ සිත්** | 5 |
| **කුසල විපාක සම්පටිච්ඡන සිත** | 1 |
| **කුසල විපාක සන්තීරණ සිත්** | 2 |
| **මහා කුසල විපාක සිත්** | 8 |
| | **16** |

පූර්වයෙහි රැස්කරණ ලද්දවූ අකුසල කර්මයන්ගේ විපාක වශයෙන් අප්‍රිය වූ ද, නොකැමැති වූ ද, අමනාප වූ ද, අනිෂ්ටාරම්මණයක් හමුවූ කල්හි, **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡේදය,** යන දෙසිතට අනතුරුව **පඤ්චද්වාරාවජ්ජන සිත** ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව **අකුසල විපාක, චක්ඛු විඤ්ඤාණාදි එක් විඤ්ඤාණ සිතක්** පහළවේ. **මේ සිත** ඉපිද නිරුද්ධ වූ පසු **අකුසල විපාක සම්පටිච්ඡන, සන්තීරණ** යන විපාක සිත් දෙක පහළ වන්නේය. එයට අනතුරුව **වොට්ඨපන චිත්තය** පහළවී **අකුසල් ජවන් සිතක්** පිළිවෙලින් සත්වරක් ඉපිද නිරුද්ධවේ. **අතිමහන්තාරම්මණයක්** අරමුණු කෙළේවී නම්, **අකුසල විපාක සන්තීරණ සිත** සත්වන ජවනයට අනතුරුව, **තදාරම්මණ කෘත්‍ය සිද්ධ කරමින්** පිළිවෙලින් දෙවරක් ඉපිද නිරුද්ධ වන්නේය.

පූර්වයෙහි රැස්කරන ලද්දවූ කුසල කර්මයන්ගේ විපාක වශයෙන්, ප්‍රිය වූ ද කැමැති වන්නාවූ ද මනාප වූ ද, ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයක් හමුවූ කල්හි **භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡේදය,** යන සිත් දෙකට අනතුරුව **පඤ්චද්වාරාවජ්ජන සිත** ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව **කුසල විපාක චක්ඛු විඤ්ඤාණාදි එක් විඤ්ඤාණ සිතක්ද, කුශල විපාක සම්පටිච්ඡන සිත ද, කුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිතද** ඉපිද නිරුද්ධ වේ. එයට පසු **වොට්ඨපන චිත්තය** ඉපිද නිරුද්ධවූ කල්හි, **කුසලා කුසල ජවන් සිත් වලින් එක් සිතක්** පිළිවෙලින් සත්වරක් ඉපිද නිරුද්ධ වන්නේය. **අතිමහන්තාරම්මණ චිත්තවීථියක් නම්,** සත්වන ජවනයට අනතුරුව, **අහේතුක උපෙක්ඛා සහගත සන්තීරණ සිතය, උපෙක්ඛා සහගත** මහා **විපාක සතරය**

යන අහේතුක, සහේතුක විපාක සිත් පසෙන් එක් සිතක් **තදරම්මණ කෘත්‍ය සිද්ධ කරමින්** දෙවරක් ඉපිද නිරුද්ධ වන්නේය.

බලවත්වූ කුසල කර්මයාගේ විපාක වශයෙන් අතිශයින් **ප්‍රිය** වූද, ඉතා මනාපවූද, බුද්ධ ප්‍රතිමාදී දර්ශනයක් හෝ, ඉතා මිහිරි ශබ්දයක් හෝ අතිඉෂ්ටාරම්මණයක් වශයෙන් හමුවූ කල්හි, **භවාඞ්ග චලනය, භවඞ්ගුපච්ඡෙදය, පඤ්චද්වාරාවජ්ජනය, කුසල විපාක චක්ඛු විඤ්ඤාණාදී එක් විඤ්ඤාණ සිතක්ය, කුසල විපාක සම්පටිච්ඡනය, කුසල විපාක සොමනස්ස සන්තීරණය, වොට්ඨපන සිතය** යන සිත්, පිළිවෙලින් ඉපිද නිරුද්ධ වන්නාහ. එයට අනතුරුව කාම ජවනයන් අතුරෙන් එක් සිතක් ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වේ. එය අති මහන්තාරම්මණ චිත්ත වීථියක් වී නම්, **සොමනස්ස සන්තීරණය, සොමනස්ස මහා විපාක සතරය** යන **සොමනස්ස කුසල විපාක** පසෙන් එකක් **තදරම්මණ** වශයෙන් දෙවරක් ඉපිද නිරුද්ධ වන්නේය.

රහතන් වහන්සේලාටද, ඉෂ්ටානිෂ්ටාරම්මණයන් හමුවූ කල්හි, **කුසලාකුසල විපාක විඤ්ඤාණයද, කුසලාකුසල විපාක සම්පටිච්ඡන සන්තිරණ සිත්ද** උපදින්නේ වී නමුත් සියලු කෙළෙසුන් නැසූ හෙයිනුත්, මතු භවයක් නැති හෙයිනුත්, **වොට්ඨපන සිතට** අනතුරුව **කුසලා කුසල ජවන් සිත්** පහළ නොවන්නාහ. උන්වහන්සේලාට ඒ වෙනුවට පහළ වන්නේ **ක්‍රියා ජවන්මය.**

## තදාරම්මණ නියමය

චිත්ත වීථියක, තදරම්මණ සිත් ඉපදීමට හේතු සතරෙකි.

එනම්:—

1. **කාමාවචර ජවන්** ඇතිවීමය.
2. **කාමාවචර භූමිය** වීමය.
3. **කාමාවචර සත්ත්වයෙකු** වීමය
4. **විභූත හෝ අතිමහන්තාරම්මණ** චිත්ත වීථියක්වීමය.

අනිෂ්ටාරම්මණයක් ගෙණ හටගත් චිත්ත වීථියක් වී නම් අකුසල විපාකවූ, උපෙක්ඛා සහගත සන්තීරණ සිත තදරම්මණ වශයෙන් උපදී.

ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයක් ගෙණ චිත්ත වීථියක් හටගත් තේ වීනම්, ඒ චිත්ත වීථිය අවසානයෙහි උපදනා තදරම්මණයෝ, කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තය, උපෙක්ඛා සහගත මහා විපාක සතරය යන මේ විපාක සිත් පසෙන් එක් සිතක් විය යුතුයි.

බුද්ධාදි අති ඉෂ්ටාරම්මණයක් හමුවීනම්, ඒ චිත්ත වීථිය අවසානයෙහි තදලම්බණ වශයෙන් උපදින්නෙ සොමනස්ස සහගත මහා විපාක සතරය, සොමනස්ස සන්තීරණය යන විපාක සිත් පසෙන් එකෙකි.

සාමාන්‍ය ස්වභාව වශයෙන් මෙසේ ඇතිවිය යුතු නමුත්, **ලොභ මූල ජවන් අටය, මොහ මූල ජවන් දෙදෙනාය, මහා කුසල් ජවන් අටය,** යන අටළොස් ජවනයන් අතුරෙන් යම්කිසි සිතක් ජවන් වශයෙන් ඇතිවූ කල්හි අසුවල් විපාක චිත්තයම තදලම්බණ වශයෙන් උපදින්නේයයි යන නියමයක් නැත්තේය. මේ ජවනයෝ පෘථග්ජනයන්ගේ හා ශෛක්ෂයයන්ගේ සන්තානයන්හි උපදින බැවින් මෙසේ නියම කළ නොහැකි බව දත යුතුයි.

පෘථග්ජනවූ තිර්ථකයන්හට බුද්ධාදී අති ඉෂ්ට ආලම්බණ යෙහි පවා දෙම්නස් සහගත ජවන් උපදී. සඤ්ඤාවිපල්ලාසය චිත්තවිපල්ලාසය, දිට්ඨි විපල්ලාසය යනාදී විපල්ලාසයන් ඇති හෙයින් මෙසේ සිදුවන බව දත යුතුයි. එබැවින් චිත්ත වීථියක උපදනා ජවන් සිත්වල ස්වභාවය අනුවද තදරම්මණයන්ද වෙනස් වේ.

**සොමනස්ස සහගත හසිතුප්පාද චිත්තය, සොමනස්ස සහගත මහා ක්‍රියා ජවන් දෙකය** යන සිත් තුනෙන් එකක් ජවන් වශයෙන් ඇතිවූ **කල්හි සොමනස්ස සහගත තදලම්බණයක්** ඒකාන්තයෙන්ම **ලැබෙන්නේය.**

එසේම උපෙක්ඛා සහගත ක්‍රියා ජවන් ඇතිවූ කල්හි උපෙක්ඛා සහගත තදලම්බණයන් අතුරෙන් එක්තරා තදලම්බණයක් උපදින්-නේය.

ඤාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන්ට අනතුරුව ඤාණ සම්ප්‍රයුක්ත මහා විපාක සිත් සතරෙන් එකක් තදලම්බණ වශයෙන් උපදී.

ඤාණ විප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන්ට අනතුරුව ඤාණ විප්‍ර යුක්ත තදලම්බණයක්ම උපදී.

සසංඛාරික, අසංඛාරික ක්‍රියා ජවනයන්ට අනතුරුව සසංඛාරික අසංඛාරික තදලම්බණයක්ම උපදී.

දෙස මුල ජවනයට අනතුරුව ලැබෙන තදලම්බණය එකාන්තයෙන්ම උපෙක්ඛා සහගත තදලම්බණ චිත්තයක්මය. කිසි කලෙක සොමනස්ස තදලම්බණයන් නොලැබේ. තදලම්බණ ලැබීමට අවකාශ මදවුවහොත් ජවන් කෙලවරදී භවඞ්ග සිතක්ම පහළ වන්නේය. මේ භවඞ්ග සිත ඒකාන්තයෙන්ම උපෙක්ඛා භවඞ්ගයක්ම විය යුතුයි. සොම්නස් වේදනාව සහ දෙම්නස් වේදනාව අතිශයින් විරුද්ධ නිසා එකකට එකක් පෙර පසුව ඇති නොවේ.

උපෙක්ඛා සහගත ප්‍රතිසන්ධි සිතින් පිළිසිඳ ගත්තාවූ පුද්ගලයා හට ඉෂ්ට මධ්‍යස්ථ අරමුණක් එල්බගෙණ, දෙස මූලික ජවනයන් ඇතිවී, ඒ චිත්ත වීථියේ තදලම්බණ සිත් ඇතිවීමට අවකාශ ඇති වුවහොත්, උපෙක්ඛා සහගත තදලම්බණයක්ම ඇති වෙයි. තදලම්බණයක් ඇතිවීමට අවකාශ නැති වුවහොත්, උපෙක්ඛා සහගත භවඞ්ගයක්ම වෙයි. මෙසේ ඇති කල්හි, අරමුණ හා භවඞ්ග චිත්තයද ජවනයද ඔවුනොවුන්ට ගැලපෙන්නේය.

උපෙක්ඛා සහගත පටිසන්ධියක් ඇති පුද්ගලයෙක්හට අති ඉෂ්ට අරමුණක් හමුවී, ද්වේෂ මූල ජවන් ඇති වුවහොත් තදලම්බණ ඉපදීමට අවකාශ ඇත්තේවී නමුත්, තදලම්බණ නොවී උපෙක්ඛා සහගත භවඞ්ගයක්ම වෙයි. තදලම්බණ වන්නේ නම් අරමුණට

අනුව සොම්නස් සහගත තදලම්බණයක්ම විය යුතුයි. එසේ වන කල්හි ද, ජවනයන් හා නොගැලපෙන හෙයින් තදලමබණ නොවී භවඞ්ගයම වන්නේය.

**සොමනස්ස මහා විපාක සිතින් ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයා සොමනස්ස ප්‍රතිසන්ධිකයායි.** මේ පුද්ගලයාහට ඉෂ්ට මධ්‍යස්ථාලම්-බණයක් අරමුණු කොට ගෙන, ද්වේෂ මූලික ජවන් ඇතිවූ කල්හි තදලම්බණ ඇති නොවෙත්. තදලම්බණයක් වන්නේ නම් උපෙක්ඛා සහගත තදලම්බණයක්ම විය යුතුයි. එසේ නොවන හෙයින් උපෙක්ඛා සහගත භවඞ්ගයක්ම වෙයි.

**සොමනස්ස ප්‍රතිසන්ධිකයාහට,** අති ඉෂ්ටාරම්මණයක් අරමුණු කොට ගෙණ ද්වේෂ මූලික ජවන් ඇතිවූ කල්හි, තදලම්බණ විය යුතු චිත්ත වීථියක්වී නම්, අරමුණට අනුරූප පරිද්දෙන් සොම්නස් සහගත තදලම්බණයක් විය යුතුයි. එසේ ඇති කල්හි ජවනය හා නොගැලපෙන හෙයින් උපෙක්ඛා සහගත සන්තීරණ සිතක්ම තදලම්බණය වෙනුවට උපදී.

**සොමනස්ස ප්‍රතිසන්ධිකයාහට, දෞමනස්ස ජවන යන්ට** අනතුරුව තමාගේ ප්‍රකෘති සොමනස්ස භවඞ්ගයට පෙර උපදනා මේ උපෙක්ඛා සහගත සන්තීරණ සිත, කුමණ කෘත්‍යයක් සිද්ධකරන්නේදැයි විමසිය යුතුයි.

**උපෙක්ඛා සහගත සන්තීරණ සිත** කෘත්‍ය පසක්ම සිද්ධ කරන්-නේය. එනම්, **පටිසන්ධි කෘත්‍යය, භවඞ්ග කෘත්‍යය, චුති කෘත්‍යය, සන්තීරණ කෘත්‍යය, තදරම්මණ කෘත්‍යය** යන කෘත්‍ය පසය. දෙම්නස් ජවනයටත්, ප්‍රකෘති සොම්නස් භවඞ්ගයටත් අතර උපදින මේ උපෙක්ඛා සහගත සන්තීරණ සිත, මේ කෘත්‍ය පසෙන් එකක්වත් සිද්ධ නොකරන්නේය. ඒ සිතේ අරමුණ, වීථි සිත්වලට අයත් අරමුණක් නොවන හෙයින් එය වීථි සිතක්ද නොවේ. එබැවින් මේ භවයෙහිම බොහෝ සෙයින් ගන්නාලද එක් කාමාවචර අරමුණක් එල්බගෙණ, මේ දෙෂ ජවනයන්ට සහ සොම්නස් භවංගයටද අතරින් උපදනා සන්තීරණ සිත **ආගන්තුක භවඞ්ග** කෘත්‍යය සිද්ධ කරමින් එයට අනතුරුව තමාගේ ප්‍රකෘති සොම්නස් භවඞ්ගය ඉපදීමට අවකාශ ඇති කරමින් ඉපිද නිරුද්ධ වන බව දත යුතුයි.

රූපී අරූපී බ්‍රහ්මයන්ට තදලම්බණ නොවන්නේ, කාමාවචර කර්ම නමැති බිජුවටින් ප්‍රතිසන්ධි නොගත් හෙයිනැයි දත යුතුයි. මහග්ගත ලොකොත්තර නිර්වාණ ප්‍රඥප්තීන් අරමුණු කරණ කල්හි තදලම්බණයන්ගේ හේතු භූතවූ කාම තෘෂ්ණාවට ප්‍රතිපක්ෂ හෙයින්, තදලම්බණ නූපදිත්.

# ජවන නියමය

ප්‍රවෘත්ති කාලයෙහි, **කාම ජවන චිත්ත වීථීන්හි කාම ජවනයන් සත් වරක් ඉපදීම සාමාන්‍ය ධර්මතාවයකි.** නමුත් එයට අඩුව සයවරක් හෝ පස්වරක් ජවන් උපදින අවස්ථාද ඇත. බලවත් රෝගාදිය කරණකොට ගෙණ හෘදය වස්තුව ඉතා දුර්වලවන කල්හි ද, මරණාසන්න අවස්ථාවන්හිද, උසින් වැටීම, දියේ ගිලීම, මහත් භයට පත්වීම, මූර්ඡාවීම සිහි නැතිව පවතින විසංඥ අවස්ථාව, මව් කුසින් බිහිවන අවස්ථාව, යනාදී අවස්ථාවන්හිදී හෘදය වස්තුව ඉතා දුර්වල වන බැවින් ජවන් සිත් සය වරක් හෝ පස් වරක් හෝ පහළවෙත්.

**තවද, බුදුරජාණන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්‍ය්‍ය කාලයේදී ප්‍රත්‍යවෙක්ෂා ජවනයන් සතර වරක්ම ලැබෙන්නේය.** **පසේ බුදුවරයන් වහන්සේලා හා මහමුගලන් ආදී මහ රහතන් වහන්සේලා** සෘද්ධි දක්වන කාලයන්හි ජවන් සිත් පස්වරක් පහළ වන්නේය.

**ආදිකර්මික** හෙවත් එක් එක් ධ්‍යානයක් පිණිස පළමු කොට කර්මස්ථාන වඩන්නාවූ පුද්ගලයාහට, ප්‍රථමයෙන්ම අර්පණා ලැබෙන කල්හි, මහග්ගත ජවනය එක් වරක්ම උපදී. පසුව ඒ ඒ ධ්‍යානයන්ට සමවදින කල්හි, සමාපත්ති වීථීන්හි ධ්‍යාන ජවනයන් බොහෝ ගණනක් ඇතිවිය හැකිය. මාර්ග ජවනයෝද එක් එක් වරක්ම උපදිත්. මාර්ග චිත්ත වීථීන්හි මාර්ග ජවනයට අනතුරුව උපදනා ඵල සිත් හෙවත් ඵල ජවනයන් දෙදෙනෙක් හෝ තිදෙනෙක් වෙති. මන්ද ප්‍රාඥ පුද්ගලයාහට දෙවරක්ද, තික්ඛ ප්‍රාඥ පුද්ගලයාහට ඵල ජවන් තුන්දෙනෙක්ද උපදී.

**අභිඥ ජවන් උපදනා කල්හි එක් චිත්ත වීථියක එක් අභිඥ චිත්තයක්ම උපදී.** සෙසු සමාපත්ති වීථියක මෙන් බොහෝවර

නූපදී. අභිඥා ජවනයෙහි සමාපත්තියක් නැත. එය පඤ්චමධ්‍යානයාගේම එක්තරා ශක්ති විශෙෂයකි.

අභිඥා ජවනය එක් වරක් ඉපිද නිරුද්ධ වූ කල්හි, ඍද්ධිය, දක්වීම් වශයෙන් සිය දහස් ගණන් රූපයන් මවා දක්වනු කැමතිනම් එසේ අධිෂ්ඨාන කළ කල්හි, ඒ අභිඥා ජවන චිත්තයාගේම ධර්ම ශක්තිය හේතුකොට ගෙණ, ඉටාගත් පරිදි ඍද්ධිය පහළ වන්නේය. දිව්‍ය ශ්‍රොත්‍රය, පරචිත්ත විජානනඥානය ආදී සෙසු අභිඥාවන් උපදවන කල්හිද, මේ පිළිවෙලට ඇතිවේ.

අභිඥා ජවනය එක් වරක් ඉපිද නිරුද්ධ වූ කල්හි ද පෘථග්ජනයන්ට හා ශෛක්ෂයන්ට කාමාවචර කුසල් චිත්තයෙන්ද බුදු පසේ බුදු මහරහතන් වහන්සේලාට කාමාවචර ක්‍රියා චිත්තයෙන්ද ඒ ඒ දිව්‍ය ශ්‍රොත්‍රාදිය හට ගන්නා බව දත යුතුයි. මෙසේ අභිඥා චිත්තය නිරුද්ධවී ගියේ නමුදු, ඒ අභිඥානුභාවය කරණ කොට ගෙණ කාමාවචර කුසල ක්‍රියා චිත්තයන්ගෙන් ඍද්ධිවිධය, දිව්‍ය ශ්‍රොත්‍රය, පර සිත් දැනීම්ය, පෙර විසූ කඳ පිළිවෙල දැනීමය, දිව්‍ය චක්ෂුරභිඥානය යන පඤ්චාභිඥාවන් සහ දිව්‍යචක්ෂුරභිඥානයාගේම විශෙෂයන්වූ ඉන්ද්‍රිය පරොපරියත්තඤාණය, අතීතංස ඥානය, අනාගතංසඥානය යන අභිඥාවෝද පවත්නාහු වෙති.

බුදුරජාණන් වහන්සේ යමක ප්‍රාතිහාර්‍ය්‍ය දක්වන කාලයේදී ප්‍රත්‍යවෙක්ෂා ජවන් සතරක්ම උපදින බව දක්වන ලදී. යමා මහ පෙළහර පානා කල්හි, ගිනි දළු නික්මවීමට අදහස් කරන්නේ නම් තෙජෝ කසිණය අරමුණු කොට චතුෂ්ක නයින් චතුර්ථධ්‍යානයට සමවදින සේක. මෙය පරිකර්මපාදක ධ්‍යානයනම් වේ. ඉක්බිති ඒ ධ්‍යානයෙන් නැගිට ප්‍රත්‍යවෙක්ෂා වීථි උපදවමින් එම ධ්‍යානයෙහි අන්තර්ගත උපෙක්ඛා, එකග්ගතා, යන ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂා කරණ සේක. මේ චිත්ත වීථිවල ප්‍රත්‍යවෙක්ෂා ජවන් සතර වරක් උපදී. එයට අනතුරුව ශරීරයේ මතු භාගයෙන් ගිනි දළු නික්මේවායි අධිෂ්ඨාන කොට, නැවත පරිකර්ම වීථියක් උපදී. මෙයට අභිඥාපාදකධ්‍යාන වීථිය යයි කියනු ලැබේ. එයින් නැගිට ඉහතකී පරිදි ප්‍රත්‍යවෙක්ෂා වීථි උපදවමින් එහි ඇතුළත් ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂා කරණ සේක. අභිඥා වීථිය ඇති වන්නේ එයට

පසුවය. එම අභිඥා වීථියේ පහළවූ අභිඥාවගේ ආනුභාවයෙන් උඩ කයින් ගිනි දළු නික්මීම සිදුවන්නේ එයට අනතුරුවය. ඊටපසු ශරීරයේ යට භාගයෙන් දිය දළු නික්මවීමට අදහස් කළ කල්හි, අපො කසිණය අරමුණු කොට ගෙණ ඉහතකී පරිද්දෙන් චිත්ත වීථීන් උපදවන සේක. මෙසේ ඇතිවන්නාවූ චිත්ත වීථි දෙකක් අතර භවඞ්ග සිත් දෙකකට වඩා නූපදී. මේ ක්‍රමයෙන් ගිනි දළු දිය දළු ආදිය සඳහාත්, වෙන් වෙන්වූ චිත්ත වීථි බොහෝ ගණනක් ඉතා ශීඝ්‍රව ඇතිවන බැවින්, යමක ප්‍රාතිහාර්‍ය්‍ය බලා සිටින්නවුන්ට වැටහෙන්නේ එම ගිනි දළු හා දිය දළු එක විටම එකු තැනින්ම නික්මෙන්නාක් මෙනි. ඍද්ධිය දක්වන ප්‍රත්‍යවෙක්ෂා ජවනයෝ කාමාවචර ජවනයන්ම බව දත යුතුයි.

# මරණාසන්න වීථි

මරණාසන්න කාලයෙහි සිතට නිශ්‍රයවූ හෘදය වස්තුව ඉතා දුර්වල බැවින් මරණාසන්න චිත්ත වීථියෙහි ජවන් සිත් පසක් උපදී.

**කාම භූමියෙහි හෝ රූපාවචර අරූපාවචර භූමියෙහි හෝ මැරෙන්නාවූ සත්ත්වයන්ට මරණාසන්න ජවන වශයෙන් කාමාවචර ජවන්ම ඇතිවීම ස්වභාව ධර්මයකි.** එබැවින් මරණාසන්න චිත්ත වීථි වශයෙන් ඇතිවන්නේ කාමාවචර ජවන් උපදනා චිත්ත වීථියක් මය.

මරණාසන්න චිත්ත වීථි දෙවැදෑරුම් වේ. එනම් **පඤ්චද්වාර මරණාසන්න වීථි, මනොද්වාර මරණාසන්න වීථි** යන දෙකය. **එයින් පඤ්චද්වාර චිත්තවීථි පසෙකි.** එනම්:— **චක්ඛුද්වාර වීථි, සොතද්වාර වීථි, ඝාණද්වාර වීථි, ජිව්හාද්වාර වීථි, කායද්වාර වීථි** යන පසයි. මේ **පඤ්චද්වාර මරණාසන්න චිත්ත** වීථි පසෙන් එක් එක් ද්වාරයක හටගන්නාවූ චිත්ත වීථි සිව් වැදෑරුම් වේ. මෙසේ මරණාසන්න චිත්ත වීථි වශයෙන් සූවිසි (24) චිත්ත වීථීන් ලැබෙන බව යුතුයි.

චක්ඛුද්වාරයෙහි ලැබෙන මරණාසන්න චිත්ත වීථි සතර නම්:—

1. **ජවනයට අනතුරුව චුතිය වන වීථිය**
2. **ජවන භවඞ්ගයට අනතුරුව චුතිය වන වීථිය**
3. **තදාලම්බණයට අනතුරුව චුතිය වන වීථිය**
4. **තදාලම්බණ භවංගයට අනතුරුව චුතිය වන වීථිය.**

නොරහත් පුද්ගලයන්ගේ මරණාසන්න කාලයේදී මේ භවයාගේ සිඳීමට අනතුරුව මතු භවයක උත්පත්තිය හට ගන්නා බැවින්, එයට හේතුවන්නාවූ **කුසලා කුසල කර්ම අරමුණක්** හෝ **කම්ම නිමිති අරමුණක්** හෝ, **ගතිනිමිති අරමුණක්** හෝ ගෙණ මරණාසන්න චිත්ත වීථියක් හට ගන්නේය.

මෙයින් **කම්ම** යනු **ප්‍රතිසන්ධිජනක කුසලා කුසල චෙතනා සංඛ්‍යාත ධම්මාරම්මණය වේ.** එය අතීත කාලික වූද, අධ්‍යාත්මිකවූද, ආරම්මණයකි. මෙහි **චෙතනා** යයි කී කල්හි චෙතනා චෛතසිකය පමණක් නොව, සසම්ප්‍රයුක්ත කුසලා කුසල චිත්තයම ගත යුතුයි.

**කම්ම නිමිති** යනු **ෂඩාරම්මණයයි.** එයද කර්මය කරණ කාලයෙහි ලබන ලද්දවූ, කර්මයට උපකාරවූ, කඩු, දුනු, ඊ, හෙල්ල, මුගුරු, වෙහෙර, විහාර, ආහාර, සිවුරු, ධජ, පතාක, ආදී ප්‍රත්‍යුත්පන්න, අතීත, අධ්‍යාත්ම, බාහිර උපකරණයෝයි. ඔවුන් අතුරෙන් කඩු ආදිය ප්‍රතිසන්ධි ජනක අකුසල කර්මයට අරමුණු වන කර්ම නිමිති වෙත්. විහාරාදිය කුසල කර්මයට අරමුණු වන කම්ම නිමිත්ත වේ.

**ගතිනිමිත්ත,** යනු රූපාදී ආරම්මණයෝයි. එයද අළුත් භවයෙහි ලැබිය යුතු මව් කුස, දෙව් විමන්, කප්රුක්, පර්වත, වන, ගිනිදළු, ආදියෙහි පිහිටි ප්‍රත්‍යුත්පන්නවූ බාහිරාරම්මණය වේ. ඇතැම් විට ආධ්‍යාත්මද වන්නේය.

1. මෙයින් ප්‍රත්‍යුත්පන්න අරමුණක් ගෙණ මරණාසන්න චිත්ත වීථිය හට ගන්නා කල්හි, එක් අතීත භවඞ්ගයක් ගතවී භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡේදය පඤ්චද්වාරාවජ්ජනය චක්ඛු විඤ්ඤාණය, සම්පටිච්ඡනය, සන්තීරණය, වොට්ඨපනය යන සිත් ඉපිද නිරුද්ධ වූ පසු මරණාසන්න ජවන් සිත් පහක් පිළිවෙලින් ඉපිද

නිරුද්ධවෙත්. එයට අනතුරුව චුති සිත පහළ වන්නේය. මෙයින් මරණාසන්න චිත්ත වීථියගේ කෙළවරත්, එම භවයේ කෙළවරත් වන්නේය. චුති චිත්තයට අනතුරුව පහළ වන්නේ පටිසන්ධි විපාක සිතය. ඒ සිත අළුත් භවයක් උපදවමින් එම අළුත් භවයේ පළමුවෙනි සිතද වන්නේය.

**මෙය පළමුවෙනි චක්ඛුද්වාරික මරණාසන්න චිත්ත වීථිය වේ.**

... ති න ද ප ච සං ණ වො ජ ජ ජ ජ ජ චු + පටිසන්ධි භ...

මෙහි ජවනයට අනතුරුව චුතිය ඇතිවේ.

2. දෙවෙනි චක්ඛුද්වාරික මරණාසන්න චිත්ත වීථිය ජවන භවඞ්ගයට අනතුරුව චුතිය වන වීථියයි. මේ චිත්ත වීථියේ මරණාසන්න ජවන් අතුරෙන් පස්වෙනි ජවනය ඉපිද නිරුද්ධ වීමෙන් පසු භවඞ්ග සිතක් ඇතිවී, එයට අනතුරුව චුති සිත පහල වේ.

...ති න ද ප ච සං ණ වො ජ ජ ජ ජ ජ භ චු + පටිසන්ධි භ...

3. තුන්වෙනි චක්ඛුද්වාරික මරණාසන්න චිත්ත වීථිය ජවන තදරම්මණයන්ට අනතුරුව චුතිය වන චිත්ත වීථියයි. එහි පස්වෙනි ජවනයට අනතුරුව එම ජවනයාගේ අරමුණෙහිම එල්බගෙණ තදරම්මණ දෙසිතක් ඇතිවී, එයට අනතුරුව චුති සිත පහළවේ.

...ති න ද ප ච සං ණ වො ජ ජ ජ ජ ජ ත ත චු + පටිසන්ධි භ...

4. සතර වෙනි චක්ඛුද්වාරික මරණා සන්න චිත්ත වීථිය, තදරම්මණ භවඞ්ගයට අනතුරුව චුතිය වන චිත්ත වීථියයි. එහි දී තුන්වන චිත්ත වීථියෙහි මෙන් ජවනයන්ට පසුව තදරම්මණ දෙසිත ඉපිද නිරුද්ධ වූ පසු නැවත එක් භවඞ්ග සිතක් පහළ වී, එයට අනතුරුව චුති චිත්තය පහළ වන්නේය.

...ති න ද ප ච සං ණ වො ජ ජ ජ ජ ජ ත ත භ චු + පටිසන්ධි භ...

මෙසේ චක්ඛුද්වාරික මරණාසන්න චිත්ත වීථියට අනුව චක්ඛු විඤ්ඤාණය වෙනුවට, සොතවිඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය යොදා ගැනීමෙන් සොතද්වාරික ඝාණ ද්වාරික, ජිව්හාද්වාරික කායද්වාරික මරණාසන්න චිත්ත වීථී සතර සතර බැගින් යොදගත යුතුයි.

එපරිද්දෙන්ම මනොද්වාරික මරණාසන්න චිත්තවීථි සතරක්ම ලැබෙන්නේය. එනම්:—

1. ජවනයට අනතුරුව චුතිය වන මනොද්වාරික වීථිය
2. ජවන භවංගයට අනතුරුව චුතිය වන මනොද්වාරික වීථිය
3. තදරම්මණයට අනතුරුව චුතිය වන මනොද්වාරික වීථිය
4. තදරම්මණ භවංගයට අනතුරුව චුතිය වන මනොද්වාරික වීථිය

මේ චිත්ත වීථීන්හි සිත් හටගන්නා පිළිවෙල මෙසේයි:—

1. න ද ම ජ ජ ජ ජ ජ චු – පටිසන්ධි භ...
2. න ද ම ජ ජ ජ ජ ජ භ චු – පටිසන්ධි භ...
3. න ද ම ජ ජ ජ ජ ජ ත ත චු – පටිසන්ධි භ...
4. න ද ම ජ ජ ජ ජ ජ ත ත භ චු – පටිසන්ධි භ...

මෙකී සතරාකාරයෙන් හට ගන්නා පඤ්චද්වාරික, මනොද්වාරික මරණාසන්න චිත්ත වීථි අතුරෙන් තදරම්මණයන් ඇතිවන්නාවූ තුන්වෙනි සතරවෙනි චිත්ත වීථී රූපී, අරූපී බ්‍රහ්මයන්ට නො-ලැබේ. ඔවුන්ට තදරම්මණ නොලැබෙන හෙයිනි.

අසංඥතලයෙහි වසන පුද්ගලයන්ට රූපයම චුතිය වේ.

මරණාසන්න ජවන් වශයෙන් ඇතිවන්නේ කාම ජවනයෝය. එනම්:– ලොභ ජවන්, දෙස ජවන්, මෝහ ජවන්, කාමාවචර මහා කුසල ජවන් යන මොහුය.

සප්ත කාම භූමියෙහි ලොභ මූලික අකුසල් රැස්කොට අනතුරු ආත්ම භාවයෙහි අපාය පටිසන්ධිය ගන්නේවි නම් ලොභ මූලික ජවනයන්ම මරණාසන්නයේදී පහළවෙත්.

දෙස මූල අකුසල් රැස්කොට අනතුරු ආත්ම භාවයෙහි අපායොත්පත්තිය ගන්නේවී නම්, මරණාසන්න ජවන් වශයෙන් **ද්වේෂ මූලික ජවන් පහළ වේ.**

**මෝහ මූලික අකුසල් රැස්කොට**, අනතුරු ආත්ම භාවයෙහි අපාය පටිසන්ධිය ගන්නේවී නම්, **මෝහ මූලික ජවනයන්ම** මරණාසන්න කාලයේදී පහළ වේ.

**කාම භූමියෙහි දනාදි පින්කම් කොට හෝ රූපාරූපධ්‍යාන උපදවා** හෝ අනතුරු ආත්ම භාවයෙහි සුගති යෙහි හෝ, රූපා රූප භවයෙහි හෝ, ප්‍රතිසන්ධිය ගන්නේවී නම්, **කාමාවචර මහා කුසල් ජවන් පහළ වේ.** රූපාරූප භවයන්හි උපන් සත්ත්වයන්ට ඒ භවයෙන් චුතවන්නාවූ කල්හි මහා කුසල් ජවනයෝම මරණාසන්න ජවන් වශයෙන් පහළ වෙත්. ඔව්හු ශ්‍රෙෂ්ඨ භවයෙකින් චුතව, අනතුරු ආත්ම භවයෙහි දුගති ප්‍රතිසන්ධියක් නොලබන හෙයින් අකුසල් ජවන් මරණා සන්නයේදී නූපදිත්.

**සතර අරූප තලයෙන් චුතව,** කාම සුගතියෙහි උපදින සත්ත්ව යෝ ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක්ම ලබන්නාහුය. කිසිසේත් ද්වි-හේතුක ප්‍රතිසන්ධියක් නොලබන්නාහ.

**සොළොස් රූප භවයෙන් චුතව,** කාම සුගතියෙහි උපදින්නාවූ පුද්ගලයන්ට ත්‍රිහේතුක හෝ ද්විහේතුක හෝ ප්‍රතිසන්ධියක් මුත් අහේතුක ප්‍රතිසන්ධියක් කිසි කලෙකත් නොලැබෙන්නේය.

පුද්ගලයන්ගේ වශයෙන් සප්තකාම භූමියෙන් චුත වන්නාවූ පෘථග්ජනයන්ට ලොභ ජවන් හෝ, දෙස ජවන් හෝ මොහ ජවන් හෝ මහා කුසල් ජවන් හෝ, කර්මානුරූප පරිද්දෙන් පහළ වෙත්.

රූපාරූප භූමියෙහි උපන්නාවූ ත්‍රිහේතුක පෘථග්ජනයන්ට හා සෝවාන් සකෘදගාමී, අනාගාමී යන ඵලස්ථ තුන්දෙනාටද, මරණා සන්න කාලයේදී මහා කුසල් ජවන්ම පහළවෙත්.

මරණාසන්න කාලයෙහි බොහෝසෙයින් **ලොභ ජවන්** ඇති වූවහොත් අනතුරු ආත්මභාවයෙහි **ප්‍රේත ලොකයෙහිම** උපදනාහු වෙත්. ඒ ප්‍රේතයන් අතුරෙනුදු, **නිජ්ඣාම තණ්හිකාදී වූ ප්‍රේතයන්ව** උපදනාවුන්ගේ පටිසන්ධිය, උපෙක්ඛා සහගත අකුසල විපාක **සන්තීරණ** සිතින්ම, අපායට ඇතුළත්ව හටගන්නේය. ඥාති ප්‍රේතව උපදනා ප්‍රේතයන්ගේ ප්‍රතිසන්ධිය, කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයෙන් චාතුම්මහාරාජිකයට ඇතුළත්ව හටගන්නේය.

මරණාසන්න කාලයේදී **ද්වෙෂ මූලික ජවන්** පහළවූ කල්හි, අනතුරු ආත්ම භාවයෙහි **අපාය ප්‍රතිසන්ධිය** ගන්නේය.

මරණාසන්න කාලයේදී **මෝහ මූලික ජවන්** ඇති සත්ත්ව තෙමේ, බොහෝ සෙයින්ම අනතුරු ආත්ම භාවයෙහි **තිරිසන් අපායෙහි** ප්‍රතිසන්ධිය ගන්නේය.

**ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණයෝ එකුන්විස්සකි. (19)** එනම්:— **කාමාවචර ප්‍රතිසන්ධි දසය,** සහ **මහග්ගත ප්‍රතිසන්ධි නවය ය. මේ එකුන්විසි ප්‍රතිසන්ධි විඤ්ඤාණයන්ගෙන් සූවිසි ප්‍රතිසන්ධියක් ලැබෙන්නේය.** මේ හෙදය භූමි සහ ආරම්මණයන්ගේ වශයෙන් සළකනු ලැබේ.

එනම්:—**භූමි සතරෙකි – අපාය භූමි, කාම සුගති භූමි, රූප භූමි,** සහ **අරූප භූමි** යන සතරය.

**ආලම්බණයෝද** සතර දෙනෙකි. එනම්:—**අතීතාරම්මණ, වර්තමානාරම්මණ, ප්‍රඥප්තාරම්මණ,** සහ **මහග්ගතාරම්මණ** යන සතරය.

**අපායෙන් චුතව අපායෙහිම, අතීත, වර්තමාන** වශයෙන් දෙයාකාර අරමුණු **ගෙණ ලබන ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

**අපායෙන් චුතව කාම සුගතියෙහි** අතීත, වර්තමාන වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

**කාම සුගතියෙන් චුතව, කාම සුගතියෙහිම, අතීත වර්තමාන** වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ **ලබන ප්‍රතිසන්ධි දෙකෙකි.(2)**

කාම සුගතියෙන් චුතව, අපායෙහි අතීත, වර්තමාන වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

කාම සුගතියෙන් චුතව, රූප භූමියෙහි, ප්‍රඥප්තාරම්මණ ගෙණ ලබන **එක් ප්‍රතිසන්ධියකි. (1)**

කාම සුගතියෙන් චුතව, අරූප භූමියෙහි ප්‍රඥප්ති, මහග්ගත වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

රූප භූමියෙන් චුතව, රූප භූමියෙහි, ප්‍රඥප්තාරම්මණය ගෙණ ලබන **එක් ප්‍රතිසන්ධියෙකි. (1)**

රූප භූමියෙන් චුතව, අරූප භූමියෙහි, ප්‍රඥප්ති, මහග්ගත වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

රූප භූමියෙන් චුතව, කාම සුගතියෙහි, අතීත, වර්තමාන වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

අරූප භූමියෙන් ප්‍රඥප්තාලම්බණ චුතියෙන් පරව කාම සුගතියෙහි අතීත, වර්තමාන වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

අරූප භූමියෙන්, මහග්ගතාරම්මණ චුතියෙන් පරව කාම සුගතියෙහි අතීත, වර්තමාන වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

අරූප භූමියෙන්, ප්‍රඥප්තාලම්බණ චුතියෙන් පරව අරූප භූමියෙහි ප්‍රඥප්ති, මහග්ගත වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

අරූප භූමියෙන්, මහග්ගතාලම්බණ චුතියෙන් පරව අරූප භූමියෙහිම ප්‍රඥප්ති, මහග්ගත වශයෙන් දෙයාකාර අරමුණු ගෙණ ලබන **ප්‍රතිසන්ධි දෙකෙකි. (2)**

සැකෙවින් සූවිසි ප්‍රතිසන්ධි මෙසේ යි:–

| | |
|---|---|
| **අපායෙන් සැව පටිසන්ධි සතරය** | **4** |
| **කාමසුගතියෙන් සැව පටිසන්ධි සතය** | **7** |
| **රූප භූමියෙන් සැව පටිසන්ධි පසය** | **5** |
| **අරූප භූමියෙන් සැව පටිසන්ධි අටය** | **8** |
| | **24** |

**කාම සුගතියෙන් සැව සියලු තන්හිම පටිසන්ධිය ලබත්. නමුත් අපායෙන් සැව රූපා–රූප භූමි පටිසන්ධියක් නැත.**

**රූප භූමියෙන් සැව අපාය පටිසන්ධියක් නැත.**

**අරූප භූමියෙන් සැව රූප භූමියෙහි පටිසන්ධියක් නැත.**

**අරූප භූමියෙන් සැව යට යට අරූප භූමියෙහි පටිසන්ධියක් නැත.**

**අරූප භූමියෙන් සැව අපායෙහි පටිසන්ධියක් නැත.**

මේ සූවිසි ප්‍රතිසන්ධීන් අතුරෙන් කාම ප්‍රතිසන්ධි දසයද අතීතාලම්බණික හා වර්තමානාලම්බණික ද වෙත්.

විඤ්ඤාණඤ්චායතන, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ප්‍රතිසන්ධි දෙක අතීතාලම්බණික වෙත්.

රූපාවචර ප්‍රතිසන්ධි පස සහ ආකාශානඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන යන ප්‍රතිසන්ධි සත, ප්‍රඥප්තාලම්බණික වෙත්.

තවද, ගතිනිමිත්ත එල්බගෙණ මනොද්වාරයෙහි උපදනා මරණාසන්න වීථියෙහි චුති සිතින් පසුව අභිනව ප්‍රතිසන්ධි චිත්තය ඇතුලු සිත් සතරකටද, තදාලම්බණ නැතිවුවහොත්, සිත් සයකටද, ප්‍රත්‍යුත්පන්න ආලම්බණය ලැබේ. වර්තමාන රූපාරම්මණයාගේ ආයුෂ වශයෙන් චිත්තක්ෂණ සතළොස ගතවන්නේ එනැන්හිදීය.

**ශෛක්ෂ**, **අශෛක්ෂ**, **පෘථග්ජන** යන ත්‍රිවිධ පුද්ගලයන්ගේම මරණාසන්න ජවනයෝ කාමාවචර මැයි. ශෛක්ෂ හා පෘථග්ජනයන්ගේ මරණාසන්න **වීථීන්හි** කුසලාකුසල කාම ජවනයන් **විසින්** කර්මාදී අරමුණු ගණු ලබන හෙයින් චුතියට අනතුරුව ප්‍රතිසන්ධිය ලැබේ.

රහතන් වහන්සේලා පිළිබඳවූ කාමාවචර ක්‍රියා ජවනයන් විසින් ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්මාදී වශයෙන් ගණු ලබන හෙයින් චුතියට අනතුරුව ප්‍රතිසන්ධියක් නැත්තේය. රහතන් වහන්සේගේ චුතිය ලැබෙන්නට පෙර, ඒ ආසන්න සමයෙහි කෙළ ලක්ෂ ගණන් සමාපත්තීන්ට සම වදිති.

# පුද්ගල භේදය

**පුද්ගලයන්ගේ** වශයෙන් සිත් බෙද දැක්වීම **පුද්ගල විභාගය** නම් වේ. එබැවින් **පුද්ගලයෝ** කවරහුද? ඒ ඒ පුද්ගලයන්ට ලැබෙන සිත් කවරහුද? යනු විස්තර කරණු ලැබේ.

ප්‍රතිසන්ධිය ලැබූ ආකාරයෙන් පුද්ගලයෝ ත්‍රිවිධ වෙත්.

එනම්:—

1. **අහේතුක ප්‍රතිසන්ධිය ලැබූ අහේතුක පුද්ගලයෝය.**
2. **ද්විහේතුක ප්‍රතිසන්ධිය ලැබූ දුහේතුක පුද්ගලයෝය.**
3. **ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලැබූ තිහේතුක පුද්ගලයෝය.**

**අහේතුක පුද්ගලයෝ** දෙකොටසකි. එනම්: (1) අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් සතර අපාය නම් වූ දුගතියෙහි ප්‍රතිසන්ධිය ලැබූ **දුගති අහේතුක පුද්ගලයා ය.**

(2) අහේතුක කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් සුගති නම් වූ දෙව් මිනිස් දෙගතියෙහි ලාමක ප්‍රතිසන්ධිය ලැබූ **සුගති අහේතුක පුද්ගලයා ය.**

(1) **දුගති අහේතුක පුද්ගලයෝ** - උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත හැර, ඉතිරි එකොළොස් අකුසල් සිත් අතුරෙන් එක් සිතකින් කරන ලද අකුසල කර්මපථයාගේ පටිසන්ධි විපාක වශයෙන් **නිරය, තිරිසන් අපාය, ප්‍රේතයොනිය, අසුර නිකාය** යන සතර අපායෙහි එකම අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයෝය.

(2) **සුගති අහේතුක පුද්ගලයෝ** - ඉතා දුර්වලවූ ඤාණ විප්‍රයුක්ත ද්විහේතුක කුසල් සිත් සතරින්, එක් සිතකින් කරණ ලද හීනවූ කුසල කර්මයාගේ ප්‍රතිසන්ධි විපාක වශයෙන්, අහේතුක කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින්, දෙව් මිනිස් දෙගතියෙහි ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයෝය. ජාති අන්ධ, ජාති බධිර ආදී අඞ්ග විකලත්වය ඇති, ඤාණයෙන් හීනවූ, සිහාකැම ආදියෙන් ඉතා දුකසේ දිවි පවත්වා ගන්නාවූ ලාමක මනුෂ්‍යාත්මයක් ලැබූ පුද්ගලයා සුගති අහෙතුක පුද්ගලයෙකි. එමෙන්ම, එම අහේතුක කුසල විපාක සන්තීරණ සිතින් ප්‍රතිසන්ධිය ලබන්නාවූ, භූමිනිශ්‍රිත විනිපාතික අසුරයෝද සුගති අහේතුක සඞ්ඛ්‍යාවට ඇතුළත් වෙති. මොවුහු ඤාති ප්‍රෙත සඞ්ඛ්‍යාවෙන් නෑයන් බලා පොරොත්තු වන නමුත් මනුෂ්‍ය භූමියට හෝ අපාය භූමියට ද ඇතුළත් නොවන හෙයින්, චාතුම්මහාරාජිකයට ඇතුළත් වන්නාහු යයි දත යුතුයි.

2. **ද්විහේතුක පුද්ගලයෝ නම්:-** අලොභ, අදෙස යන හේතු දෙක පමණක් යෙදුනාවූද, ඤාණ විප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතරින් එක් සිතකින් කරණලද ද්විහේතුක උත්කෘෂ්ට පුණ්‍යකර්මයාගේ ප්‍රතිසන්ධි විපාක වශයෙන් සුගතියෙහි ඤාණ විප්‍රයුක්ත මහා විපාක සිත් සතර අතුරෙන් එක් විපාක සිතකින් ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගල යෝය. පටිසන්ධියට හේතු භූතවූ ද්විහේතුක කුසල කර්මයාගේ හීන, මධ්‍යම, උත්කෘෂ්ට ආදී භෙද කරණකොටගෙන විපාකයෝද වෙනස් වේ. තම උත්සාහයෙන්ම සැප සම්පත් සාද ගැණීමට සිදුවේ. ඤාණයෙන් තොරව හෙවත් ජන්ම ප්‍රඥ නැතිව උත්පත්ති ලැබූ හෙයින් එම ආත්මභාවයේදීම උත්තරී මනුෂ්‍ය ධර්ම නම් වූ ධ්‍යාන, මාර්ග ඵලයන්ට පැමිණිය නො හැකි වේ.

3. **ත්‍රිහේතුක පුද්ගලයෝ නම්:-** අලොභ, අදෙස, අමොහ යන ත්‍රිහේතුක ප්‍රතිසන්ධි විපාක සිතකින් උත්පත්තිය ලැබූ පුද්ගල යෝයි. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ගෙණදෙන විපාක සිත් **තෙළෙසකි.** එනම් **කාමාවචර ඥාණ සම්ප්‍රයුක්ත මහා විපාක සතරය, රූපාවචර විපාක පසය, අරූපාවචර විපාක සතරය,** මෙයින් කාමාවචර **ඥාණ**සම්ප්‍රයුක්ත මහා විපාක සතරෙන්, මනුෂ්‍ය ලොකය සහ **සදිව්‍ය** ලොකයද යන කාම **සුගතියෙහිද,** රූපාවචර විපාක **පසෙන්** රූපාවචර බ්‍රහ්ම ලොකයෙහි ද, අරූපාවචර විපාක සතරෙන් අරූපා-වචර බ්‍රහ්ම ලොකයෙහි ද ප්‍රතිසන්ධිය ගෙන දෙන්නේය.

මෙසේ උපදින්නාවූ ත්‍රිහේතුක පුද්ගලයෝ දෙකොටසකි. එනම්: **ත්‍රිහේතුක පෘථග්ජනයා ය, ආර්‍ය්‍ය පුද්ගලයා ය** යන දෙදෙනා ය. නිර්වාණ මාර්ග ඵලාධිගමය නොකළ ත්‍රිහේතුක පුද්ගලයා **ත්‍රිහේතුක පෘථග්ජනයා** නම් වේ. මාර්ග ඵලාධිගමය කළ ත්‍රිහේතුක පුද්ගලයා **ආර්‍ය්‍ය පුද්ගලයා නම් වේ.**

**ආර්‍ය්‍ය පුද්ගලයෝ** අටදෙනෙකි. එනම්: සොවාන් **මාර්ගය,** සොවාන් ඵලය, සකෘදගාමි මාර්ගය, සකෘදගාමි ඵලය, අනාගාමි මාර්ගය, අනාගාමි ඵලය, අර්හත් මාර්ගය, අර්හත් ඵලය යන මාර්ග ඵල ලාභි **අෂ්ටාර්‍ය්‍ය පුද්ගලයෝය.**

මෙ **ආර්‍ය්‍ය පුද්ගලයෝ අටදෙනා ද, ශෛක්ෂ පුද්ගලයා ය, අශෛක්ෂ පුද්ගලයා යයි** දෙකොටසකි. අර්හත් ඵලස්ථ පුද්ගලයා **අශෛක්ෂ පුද්ගලයා නම් වේ.** සෙසු ආර්‍ය්‍ය පුද්ගලයෝ සත්දෙනා **ශෛක්ෂ පුද්ගලයෝ නම් වෙති.** මේ ආර්‍ය්‍ය පුද්ගලයෝ අටදෙනාද, **ශුෂ්ක විදර්ශක ආර්‍ය්‍ය පුද්ගලයා ය. සමථයානික ආර්‍ය්‍ය පුද්ගලයා යයි** දෙකොටසක් වෙත්. එහි විස්තර මෙයට පෙර දක්වන ලදී.

## ඒ ඒ පුද්ගලයන්ට ලැබෙන සිත්

**මහග්ගත විපාක සිත් නවය** ඒකාන්තයෙන්ම **ද්වාරවිමුක්ත** බැවින්, **වීථි සිත්** සඞ්ඛ්‍යාවට නොගැණේ. රූපාරූප භවයන්හි ප්‍රතිසන්ධිය ලබන්නා වූ පුද්ගලයන්ට ඔවුන්ගේ **ප්‍රතිසන්ධි, භවඞ්ග චුති** චිත්තයන් වශයෙන් පහළවීම මිස, අන්‍ය කෘත්‍යයක් කිරීමට

මේ මහග්ගත විපාක සිත් නවය අසමර්ථ වේ. එබැවින් වීථි සිත් වශයෙන් ගතයුතු සිත් සියල්ල අසූවකි. එනම් එකුන් අනූ චිත්තයන් ගෙන් මහග්ගත විපාක නවය හැර ඉතිරි සිත් අසූවය.

### දුගති අහේතුක පුද්ගලයා

මේ පුද්ගලයා හට හසිතුප්පාද සිතය, කාමාවචර මහා ක්‍රියා අටය, යන කාමාවචර ක්‍රියා ජවන් නවයද, මහා විපාක සිත් අටද, රූපාවචර කුසල ක්‍රියා දසය, අරූපාවචර කුසලක්‍රියා අටය, ලොකොත්තර සිත් අටය යන අර්පණා ජවන් විසිහයද යන තෙසාළිස් (43) චිත්තයන් නොලැබෙන්නාහ. ඉතිරි වීථි සිත් සත්තිස ලැබේ. ඒ සත්තිස නම්:– අකුසල් සිත් දෙළොසය (12) හසිතුප්පාදය හැර අහේතුක සිත් සතළොසය (17) මහා කුසල් සිත් අටය (8) යන සත්තිස් චිත්තයෝ යි.

### සුගති අහේතුක සහ ද්විහේතුක පුද්ගලයෝ

මේ පුද්ගලයන්ට කාමාවචර ක්‍රියා ජවන් නවය, අර්පණා ජවන් විසිහය, ඤාණසම්ප්‍රයුක්ත මහා විපාක සතරය, යන වීථි සිත් තිස්නවය (39) නොලැබෙන්නාහ. ඉතිරි එක්සාළිස් වීථි සිත් ලැබේ. ඒ එක්සාළිස් වීථි චිත්තයෝ නම්:— අකුසල් සිත් දෙළොසය, හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක සිත් සතළොසය, මහා කුසල් සිත් අටය, ඤාණවිප්‍රයුක්ත මහා විපාක සිත් සතරය යන එක්සාළිසය (41)

මෙකී දුගති අහේතුක, සුගති අහේතුක සහ ද්විහේතුක පුද්ගලයන්ට අර්පණා ජවන් සිත් නොලැබෙන බැවින්, මේ භවයෙහි ධ්‍යාන, මාර්ග ඵලයන්ට කිසිසේත් පැමිණිය නොහැකි වේ.

### ත්‍රිහේතුක පෘථග්ජනයා

පෘථග්ජන භාවයෙහි සිටින්නාවූ ත්‍රිහේතුක පුද්ගලයාහට හසිතුප්පාදය, කාමාවචර මහා ක්‍රියා අටය, මහග්ගත ක්‍රියා නවය යන අටළොස් ක්‍රියා ජවන් හා, ලොකොත්තර සිත් අටය යන සවිසි (26) චිත්තයන් නො ලැබේ. ඉතිරි සිත් සූපනස, එනම්:–

හසිතුප්පාදය හැර අශොභන සිත් විසිනවය කාමාවචර මහා කුසල් අට හා විපාක අටය, මහග්ගත කුසල් නවය යන සිත් පනස්හතර ලැබේ.

### සෝතාපන්න ආයර්‍ය පුද්ගලයා

සෝවාන් ඵලයට පැමිණි ආයර්‍ය පුද්ගලයා හට, අටලොස් ක්‍රියා ජවන්ය, දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුසල් සතරය, විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතය, සෝතාපන්න ඵල චිත්තය හැර ඉතිරි ලොකොත්තර සිත් සතය යන සිත් තිහ නොලැබේ. එක්වරක් ලැබුන සෝවාන් මාර්ග සිත නැවත නොලැබේ. සෙසු මාර්ග ඵලයන්ට නො පැමිණි බැවින් ඒ මාර්ග ඵල සිත් සය ද නො ලැබෙන්නාහ. සොවාන් මාර්ගක්ෂණයේදී සමුච්ඡෙද වශයෙන් නැසූ අකුසල් සිත් පහ නැවත ඒ චිත්ත සන්තානයෙහි නූපදී. ඉතිරි සිත් පනස, එනම්.– දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර, දෙස මූල දෙසිත, උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත, හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක සිත් සතළොස, මහා කුසල් සිත් අට, මහා විපාක සිත් අට මහග්ගත කුසල් නවය සොතාපත්ති ඵල සිත යන සිත් පනස ලැබේ.

### සකෘදගාමි ආයර්‍ය පුද්ගලයා

සකෘදගාමි ඵලයට පැමිණි ආයර්‍ය පුද්ගලයා හට සෝතාපන්න ආයර්‍ය පුද්ගලයාට මෙන් ක්‍රියා ජවන් අටළොස, දිට්ඨිගත සම්ප්‍ර යුක්ත සිත් සතර, විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත, සකෘදගාමි ඵල සිත හැර ඉතිරි ලොකොත්තර සිත් සත යන සිත් තිහ නොලැබේ. ඉතිරි විපී සිත් පනස, එනම්:— දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර, දෙෂමූල දෙසිත, උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත, හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක සිත් සතළොස, මහා කුසල් සහ විපාක සිත් සෙළොස, මහග්ගත කුසල් නවය සහ සකෘදගාමි ඵල සිත ද ලැබේ.

### අනාගාමි ආයර්‍ය පුද්ගලයා

අනාගාමි ඵලයට පැමිණි ආයර්‍ය පුද්ගලයා හට, අටළොස් ක්‍රියා ජවන්ය, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරය, දෙස මූල දෙසිතය, විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතය යන අකුසල් සිත් සතය, අනාගාමි

**ඵල සිත හැර ඉතිරි ලොකොත්තර සිත් සතය** යන සිත් දෙතිස (32) නො ලැබේ. ඉතිරි වීථි සිත් සතලිස් අට(48) එනම්:– **දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර, උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත යන අකුසල් සිත් පස, හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක සිත් සතළොස, මහා කුසල් අට සහ විපාක සිත් සොළොස, මහග්ගත කුසල් නවය සහ අනාගාමි ඵල සිත ද** ලැබේ. අනාගාමි මාර්ගක්ෂණයේදී ද්වේෂ මූල ද්වේසිත ප්‍රහීණ කළ බැවින්, අනාගාමී ආර්‍ය්‍ය පුද්ගලයාහට ඒ ද්වේසිත, නොලැබෙන බව දතයුතුයි.

## රහතන් වහන්සේ

**රහතන් වහන්සේට**, සියලු කෙලෙසුන් නැසූ හෙයින්ද, මතු භවය සිඳ දැමූ හෙයින්ද, **අකුසල් සිත් දෙළොසය, කාමාවචර මහා කුසල් අටය, මහග්ගත කුසල් නවය, අර්හත් ඵල සිතහැර ඉතිරි ලොකොත්තර සිත් සතය** යන සතිස් (36) චිත්තයන් නො ලැබේ. ඉතිරි **සූසාළිස් චිත්තයන් එනම්:— අහේතුක සිත් අටළොස, මහා විපාක ක්‍රියා සිත් සොළොස**, **මහග්ගත ක්‍රියා සිත් නවය සහ අර්හත් ඵල සිත** ද ලැබෙත්.

තවද, **අශෛක්ෂ, ශෛක්ෂ, පෘථග්ජනයන්** ගේ වශයෙන් පුද්ගල යන් තුන්දෙනෙක් දක්වන ලදී. එයින් **අශෛක්ෂ වූ රහතන් වහන්සේට** ලැබෙන සිත් ගණනසතලිස් සතරකි. (44) **ශෛක්ෂ පුද්ගලයෝ නම් ඉතිරි ආර්‍ය්‍ය පුද්ගලයෝ සත් දෙනාය. ශෛක්ෂ යන්ට** ලැබෙන සිත් පණසකි. එනම් සෝවාන් ඵලස්ථයා හට ලැබෙන සිත් පණසත්, මාර්ග සිත් සතරත්, සකෘදගාමි, අනාගාමි ඵල සිත් දෙකක් යන සපනස් (56) චිත්තයෝ යි. මේ සිත් ඒ ඒ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ වශයෙන් යොද ගතයුතු වේ. පෘථග්ජන පුද්ගලයා හට ලැබිය හැකි වීථි සිත් ගණන **සූපනසකි.** (45) මෙය ත්‍රිහේතුක පෘථග්ජනයාට ලැබෙන සිත්ය. මෙයින් දුගති අහේතුක පුද්ගලයන්ට සිත් තිස්හතක් ද, සුගති අහේතුක ද්විහේතුක පුද්ගල යන්ට සිත් සතලිස් එකක් ද ලැබෙන බව සැළකිය යුතුයි.

---

# පුද්ගල භේදය

| පුද්ගලයෝ | නොලැබෙන සිත් | | | ලැබෙන සිත් | | |
|---|---|---|---|---|---|---|
| දුගති අහේතුක පුද්ගලයා | කාමාවචර ක්‍රියා ජවන්<br>අර්පණා ජවන්<br>මහා විපාක | 9<br>26<br>8 | 43 | අකුසල් සිත්<br>හසිතුප්පාද හැර අහේතුක<br>මහා කුසල් සිත් | 12<br>17<br>8 | 37 |
| සුගති අහේතුක සහ විහේතුක පුද්ගලයා | කාමාවචර ක්‍රියා ජවන්<br>අර්පනා ජවන්<br>ඤාණසම්ප්‍රයුක්ත මහා විපාක | 9<br>26<br>4 | 39 | හසිතුප්පාද හැර අහේතුක<br>මහා කුසල්<br>ඤාණ විප්‍රයුක්ත මහා විපාක | 17<br>8<br>4 | 41 |
| ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා | ක්‍රියා ජවන්<br>ලොකොත්තර | 18<br>8 | 26 | හසිතුප්පාදය හැර අශොභන<br>මහා කුසල විපාක<br>මහග්ගත කුසල් | 29<br>16<br>9 | 54 |
| සෝවාන් ආයථි පුද්ගලයා | ක්‍රියා ජවන්<br>දිට්ඨිගත සම්ප්‍රයුක්ත<br>විචිකිච්ඡා සම්ප්‍රයුක්ත<br>සෝවාන් ඵලය හැර ඉතිරි ලොකොත්තර | 18<br>4<br>1<br>7 | 30 | දිට්ඨිගත විප්‍රයුක්ත<br>දෙස මූල<br>උද්ධච්ච සම්ප්‍රයුක්ත<br>හසිතුප්පාද හැර අහේතුක<br>මහා කුසල විපාක<br>මහග්ගත කුසල්<br>සෝවාන් ඵලය | 4<br>2<br>1<br>17<br>16<br>9<br>1 | 50 |

| පුද්ගලයෝ | නොලැබෙන සිත් | | | ලැබෙන සිත් | | |
|---|---|---|---|---|---|---|
| සකෘදගාමී ආය්‍ර්‍ය පුද්ගලයා | ක්‍රියා ජවන් | 18 | 30 | දිට්ඨිගත විප්‍රයුක්ත | 4 | 50 |
| | දිට්ඨිගත සම්ප්‍රයුක්ත | 4 | | දෙස මූල | 2 | |
| | විචිකිච්ඡා සම්ප්‍රයුක්ත | 1 | | උද්ධච්ච සම්ප්‍රයුක්ත | 1 | |
| | සකෘදගාමි ඵලය හැර ඉතිරි ලොකොත්තර | 7 | | හසිතුප්පාද හැර අහේතුක | 17 | |
| | | | | මහා කුසල විපාක | 16 | |
| | | | | මහග්ගත කුසල් | 9 | |
| | | | | සකෘදගාමි ඵලය | 1 | |
| අනාගාමී ආය්‍ර්‍ය පුද්ගලයා | ක්‍රියා ජවන් | 18 | 32 | දිට්ඨිගත විප්‍රයුක්ත | 4 | 48 |
| | දිට්ඨිගත සම්ප්‍රයුක්ත | 4 | | උද්ධච්ච සම්ප්‍රයුක්ත | 1 | |
| | දෙස මූල | 2 | | හසිතුප්පාද හැර අහේතුක | 17 | |
| | විචිකිච්ඡා සම්ප්‍රයුක්ත | 1 | | මහා කුසල විපාක | 16 | |
| | අනාගාමි ඵලය හැර ඉතිරි ලොකොත්තර | 7 | | මහග්ගත කුසල් | 9 | |
| | | | | අනාගාමි ඵලය | 1 | |
| රහතන් වහන්සේ | අකුසල් | 12 | 36 | අහේතුක | 18 | 44 |
| | මහා කුසල් | 8 | | මහා විපාක ක්‍රියා | 16 | |
| | මහග්ගත කුසල් | 9 | | මහග්ගත ක්‍රියා | 9 | |
| | අර්හත් ඵලය හැර ලොකොත්තර | 7 | | අර්හත් ඵලය | 1 | |

මෙහි මහග්ගත විපාක නවය හැර ඉතිරි වීථි සිත් අසූව ගන්නා ලදී

# භූමි භේදය

සත්ත්වයන් පහළවන්නාවූ භූමින්ගේ වශයෙන් සිත් බෙද දැක්වීම **භූමි භේදය** නම් වේ.

**කාම භූමි, රූප භූමි, අරූප භූමි** යයි භූමි තුනෙකි.

**සදිව්‍යලොක, මනුෂ්‍ය ලොකය,** සහ **සතර අපාය** යන භූමි එකොළොස **කාම භූමි** නම් වේ. මෙහි උපදනා සත්ත්වයන්ට වීථි සිත් අසූවම, ඒ ඒ පුද්ගලයන්ට සුදුසු පරිදි ලැබෙන්නාහුය.

**කාමාවචර භූමියෙහි** වනාහි **එකොළොස් භූමි කෙනෙක්ද, ප්‍රතිසන්ධිහු දසදෙනෙක්ද, අටවිසි රූප කෙනෙක්ද, ෂට්ද්වාර කෙනෙක් ද** පරිපූර්ණායතන ඇති සත්ත්වයන්ට ලැබෙත්. **ප්‍රතිසන්ධිහු දසදෙනා නම්** අපාය ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයද, මනුෂ්‍ය ලොකයෙහි ජාත්‍යාන්-ධාදී ලාමක සත්ත්වයන්ගේ හා භූමිනිශ්‍රිත විනිපාතික අසුරයන්ගේද ප්‍රතිසන්ධිය ගෙනදෙන්නාවූ කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තය ද, සප්තකාම සුගතියෙහි ප්‍රතිසන්ධිය දෙන්නාවූ මහා විපාකයෝ අටදෙනා ද යන දසදෙනාය. වීථි සිත් අසූවම ලැබෙන්නේ අඞ්ග විකලත්වයක් නැති පරිපූර්ණායතන ඇති සත්ත්වයන්ටය. ජාති, අන්ධ, ජාති බධිර ආදී අඞ්ග විකලත්වයන් ඇති කල්හි ද යම් යම් ද්වාර නැති කල්හිද, ඒ ඒ ද්වාරයන් නිසා ඇතිවන වීථි සිත්ඇති නොවන බව දතයුතුයි. භූමිනිශ්‍රිත විනිපාතික අසුරයන්ද, වෘක්ෂනිශ්‍රිත වෘක්ෂ දෙවතාවෝද, පර්වත, ගඞ්ගා, සමුද්‍රාදිය ඇසුරුකොට වසන දෙවියෝද, චාතුම්මහාරාජිකයටම ඇතුළත් වෙති. තවද කාම භූමියෙහිඋපදනා අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන, ධ්‍යාන, මාර්ග, ඵලස්ථ පුද්ගලයන්ගේ වශයෙන්, පුද්ගල භේදයෙහි දක්වනලද පරිද්දෙන් තම තමන්ට අයිති සිත් පමණක් ලැබෙන බව සැළකිය යුතුයි.

**රූපාවචර භූමියෙහි-පටිඝජවනයන් වූ ද්වේෂ මූල සිත් දෙකත්, තදාරම්මණයෝත් පහළ නොවෙත්.** තදාරම්මණ සිත් එකොළොසින්,

සන්තීරණ සිත් තුන පමණක් සන්තීරණ කෘත්‍ය සිද්ධ කරමින් උපදී. මහා විපාකඅට නොලැබෙන්නේමය.

එසේම, රූපාවචර භූමියෙහි ඝ්‍රාණ, ජිව්හා, කාය යන ද්වාරයන් නොලැබෙන හෙයින්, ඒ ද්වාරත්‍රයෙහි උපදනා ඝ්‍රාණ විඤ්ඤාණ සිත් දෙකය, ජිව්හා විඤ්ඤාණ සිත් දෙකය, කාය විඤ්ඤාණ සිත් දෙකය යන චිත්තයන් සදෙන නූපදිත්. කාම විරාග භාවනා බලයෙන් බ්‍රහ්ම ලොකයෙහි උත්පත්තිය වන හෙයින් කාම ගුණ විඳීමට පමණක් උපකාර වන ඝ්‍රාණාදී ප්‍රසාදත්‍රය නොලැබෙන බව දතයුතුයි.

එබැවින් රූපී බ්‍රහ්මයින්ට, දෙස මූල දෙසිතය, මහා විපාක සිත් අටය, ඝ්‍රාණ ජිව්හා, කාය විඤ්ඤාණයෝ සදෙනාය යන සොළොස් වීථි චිත්තයන් නොලැබෙත්. ඉතිරි වීථි සිත් සැටසතර (64) ලැබේ.

මේ රූපී බ්‍රහ්මයන් අතර පෘථග්ජන බ්‍රහ්මයෝද, ආර්‍ය්‍යයෝද සිටින හෙයින් පුද්ගල භෙදයෙහි සඳහන් වූ පරිදි ඒ ඒ පුද්ගල යන්ට ලැබෙන සිත් දතයුතුයි.

**අරූපාවචර භූමියෙහි** රූප කිසිවක් නැතිව සතර නාමස්කන්ධයෙන් පමණක් ප්‍රතිසන්ධිය ලබන හෙයින්, අරූපී බ්‍රහ්මයන්ට පඤ්චද්වාරයන් නැත්තාහ. එබැවින් පඤ්චද්වාරික චිත්ත වීථි කිසිවක් හට නොගන්නා හෙයින්, ද්විපඤ්ච විඤ්ඤාණයෝය, පඤ්චද්වාරාවජ්ජනය, සම්පටිච්ඡන දෙසිතය, සන්තීරණ සිත් තුනය, මහා විපාක සිත් අටය යන සූවිසි චිත්තයන් නොලැබෙත්. එසේම කාම විරාග භාවනා බලයෙන් ලත් ධ්‍යාන ඇති හෙයින් දෙස මූල සිත් දෙකද, පඤ්චද්වාර වීථීන්හි උපදනා හසිතුප්පාද සිතද, රූපාවචර කුසල ක්‍රියා සිත් දසයද, යන තෙළෙස් වීථි චිත්තයන් ද නො ලැබෙන්නාහ. තවද පරතොඝොස ප්‍රත්‍යයෙන් හෙවත් ධර්මය ඇසීමෙන්ම සොවාන් මාර්ගය ලබා ගත යුතු බැවින් ප්‍රසාද වස්තු කිසිවක් නැති අරූප තලයෙහි සොතාපත්ති මාර්ග චිත්තයද නො ලැබෙන්නේය. එබැවින් අරූපී බ්‍රහ්මයන්ට නොලැබෙන සිත් සඞ්ඛ්‍යාව තිස් අටෙකි (38) ඉතිරි සිත් දෙසාළිස ලැබේ.

අරූපතලයෙහිද පෘථග්ජනයන් සහ ආර්‍ය්‍යයන්ද වසන හෙයින් ඒ ඒ පුද්ගලයන්ට ලැබෙන වීථි සිත් පුද්ගල භේදයෙහි දක්වූ පරිදි දත යුතුයි.

තවද අරූප භූමි අතුරෙන් විඤ්ඤාණඤ්චායතන භූමියෙහි වසන බ්‍රහ්මයන්ට ආකාසානඤ්චායතන කුසල ක්‍රියා සිත් ද ආකිඤ්-චඤ්ඤායතන බ්‍රහ්මයන්ට ආකාශානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන කුසල ක්‍රියා චිත්තයන්ද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන බ්‍රහ්මයන්ට ආකාශානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන කුසල ක්‍රියා සිත් ද නොලැබෙන බව සැළකිය යුතුයි.

අසංඥ තලයෙහි පහළ වන්නාවූ සත්ත්වයන්ට, චිත්තයන්ගේ ඉපදීමට හේතුභූත වූ ෂට්ද්වාරයම නැති හෙයින් චිත්තප්‍රවෘත්තිය හාත්පසින්ම නැත්තේය.

මේ පුද්ගලයෝ අසංඥ භවයෙන් චුතව කාමාවචර භවයෙහි උපදනා කල්හි, අසංඥ තලයෙහි ඉපදීමට හේතුභූතවූ වායොකසිණ පඤ්චමධ්‍යානය ඉපදෙව් භවයෙහි රැස්කරණ ලද්දවූ යම්කිසි කාමා-වචර කුසල කර්මයක්, අපරාපර්‍ය්‍යවේද්‍ය වශයෙන් විපාක දීමට ඉදිරිපත්වී, එම කර්මානුභාවයෙන් ගෙණහැර දක්වන්නාවූ කර්ම, කර්ම නිමිති, ගති නිමිති යන නිමිතිවලින් එකක් එල්බගෙණ කාමා-වචර භූමියෙහි ප්‍රතිසන්ධි ගන්නේයයි දතයුතුයි.

# භූමි පුද්ගල භේදය

| පුද්ගලයෝ | වීථි සිත් |
|---|---|
| දුගති අහේතුක පුද්ගලයා | 37 |
| සුගති අහේතුක සහ ද්විහේතුක පුද්ගලයා | 41 |
| ධ්‍යාන නොලැබූ ත්‍රිහේතුක කාම පුද්ගලයා | 45 |
| ධ්‍යාන ලැබූ ත්‍රිහේතුක කාම පුද්ගලයා | 54 |
| පෘථග්ජන රූපී පුද්ගලයා | 43 |
| පෘථග්ජන අරූපී පුද්ගලයා | 27 |
| ශුෂ්ක විදර්ශක සෝවාන් සකෘදගාමි පුද්ගලයෝ | 41 |
| සමථයානික සෝවාන් සකෘදගාමි පුද්ගලයෝ | 50 |
| ශුෂ්ක විදර්ශක අනාගාමි පුද්ගලයා | 39 |
| සමථයානික අනාගාමි පුද්ගලයා | 48 |
| ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ | 35 |
| සමථයානික රහතන් වහන්සේ | 44 |
| ශෛක්ෂ රූපී පුද්ගලයා | 39 |
| අශෛක්ෂ රූපී පුද්ගලයා | 35 |
| ශෛක්ෂ අරූපී පුද්ගලයා | 23 |
| අශෛක්ෂ අරූපී පුද්ගලයා | 18 |

# අභිධම්මත්ථ සඞ්ගහො

## පඤ්චමො පරිච්ඡෙදො

### වීථිමුත්ත සඞ්ගහ විභාගො

1. වීථිචිත්ත වසෙනෙවං – පවත්තිය මුදීරිතො
පවත්ති සඞ්ගහොනාම – සන්ධියං දානිවුච්චති.

2. චතස්සො භූමියො චතුබ්බිධා පටිසන්ධි චත්තාරිකම්මානි චතුධා මරණුප්පත්ති චෙති වීථිමුත්ත සඞ්ගහෙ චත්තාරි චතුක්කානි වෙදිතබ්බානි.

3. තත්ථ අපායභූමි කාමසුගතිභූමි රූපාවචරභූමි අරූපාවචර භූමි චෙති චතස්සො භූමියො නාම.

4. තාසු නිරයො තිරච්ඡානයොනි පෙත්තිවිසයො අසුරකායො චෙති අපායභූමි චතුබ්බිධා හොති.

5. මනුස්සා චාතුම්මහාරාජිකා තාවතිංසා යාමා තුසිතා නිම්මාණ රති පරනිම්මිත වසවත්ති චෙති කාමසුගති භූමි සත්තවිධා හොති.

6. සා පනායමෙකාදසවිධාපි කාමාවචර භූමිච්චෙව සඞ්ඛංගච්ඡති.

7. බ්‍රහ්මපාරිසජ්ජා බ්‍රහ්මපුරොහිතා මහා බ්‍රහ්මාචෙති පඨමජ්ඣාන භූමි.

8. පරිත්තාභා අප්පමාණාභා ආභස්සරා චෙති දුතියජ්ඣාන භූමි

9. පරිත්තසුභා අප්පමාණසුභා සුභකිණ්හා චෙති තතියජ්ඣාන භූමි.

10. වෙහප්ඵලා අසඤ්ඤසත්තා සුද්ධාවාසාචෙති චතුත්ථජ්ඣාන භූමිති රූපාවචර භූමි සොළස විධා හොති.

11. අවිහා අතප්පා සුදස්සා සුදස්සී අකනිට්ඨා චෙති සුද්ධාවාස භූමි පඤ්ච විධා හොති.

12. ආකාසානඤ්චායතන භූමි විඤ්ඤාණඤ්චායතන භූමි ආකිඤ් චඤ්ඤායතන භූමි නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමි චෙති අරූපභූමි චතුබ්බිධාහොති.

13. පුථුජ්ජනානලබ්භන්ති – සුද්ධාවාසෙසු සබ්බථා
සොතාපන්නාච සකද – ගාමිනො චාපි පුග්ගලා

14. අරියානොපලබ්භන්ති – අසඤ්ඤාපාය භූමිසු
සෙසට්ඨානෙසු ලබ්භන්ති – අරියානරියා පිච.

### ඉදමෙත්ථ භූමි චතුක්කං

15. අපායපටිසන්ධි කාමසුගති පටිසන්ධි රූපාවචරපටිසන්ධි අරූපාවචර පටිසන්ධි චෙති චතුබ්බිධා පටිසන්ධි නාම.

16. තත්ථ අකුසල විපාකොපෙක්ඛාසහගත සන්තීරණං අපායභූමියං ඔක්කන්තික්ඛණෙ පටිසන්ධි හුත්වා තතොපරං භවඞ්ගං පරියොසානෙ චවනං හුත්වා වොච්ඡිජ්ජති. අය-මෙකාපාය පටිසන්ධි නාම.

17. කුසලවිපාකොපෙක්ඛාසහගත සන්තීරණං පන කාමසුගතියං මනුස්සානං චෙව ජච්චන්ධාදීනං, භුම්මස්සිතානංච විනිපා-තිකා සුරානං පටිසන්ධි භවඞ්ග චුති වසෙන පවත්තති.

18. මහාවිපාකානි පන අට්ඨ සබ්බත්ථාපි කාම සුගතියං පටි සන්ධි භවඞ්ග චුතිවසෙන පවත්තන්ති.

19. ඉමා නව කාම සුගති පටිසන්ධියො නාම

20. සාපනායං දසවිධාපි කාමාවචර පටිසන්ධිච්චෙව සඞ්ඛං ගච්ඡති.

21. තෙසු චතුන්නං අපායානං මනුස්සානං විනිපාතිකාසුරානංච ආයුප්පමාණං ගණනාය නියමො නත්ථි.

22. චාතුම්මහාරාජිකානං පන දෙවානං දිබ්බානිපඤ්චවස්ස සතානි ආයුප්පමාණං, මනුස්සගණනාය නවුති වස්ස සත සහස්සප්පමාණං හොති.

23. තතො චතුග්ගුණං තාවතිංසානං තතො චතුග්ගුණං යාමානං තතො චතුග්ගුණං තුසිතානං, තතොචතුග්ගුණං නිම්මාණරතීනං, තතො චතුග්ගුණං පරනිම්මිත වසවත්තීනං.

24. නවසතඤ්චෙකවීස – වස්සානං කොටියොතථා
වස්සසත සහස්සානි – සට්ඨිච වසවත්තිසු.

25. පඨමජ්ඣාන විපාකං පඨමජ්ඣාන භූමියං පටිසන්ධි භවඞ්ග චුතිවසෙන පවත්තති.

26. තථා දුතියජ්ඣාන විපාකං තතියජ්ජාන විපාකඤ්ච දුතියජ්ජාන භූමියං

27. චතුත්ථජ්ඣාන විපාකං තතියජ්ඣාන භූමියං.

28. පඤ්චමජ්ඣාන විපාකං චතුත්ථජ්ඣාන භූමියං

29. අසඤ්ඤසත්තානං පන රූපමෙව පටිසන්ධිහොති. තථා තතො පරං පවත්තියං චවන කාලෙච රූපමෙව පවත්තිත්වා නිරුජ්ඣති.

30. ඉමා ඡ රූපාවචර පටිසන්ධි යො නාම.

31. තෙසු බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං කප්පස්ස තතියො භාගො ආයුප්පමාණං, බ්‍රහ්ම පුරොහිතානං උපඩ්ඪකප්පො, මහාබ්‍රහ්මානං එකොකප්පො.

32. පරිත්තාභානං ද්වෙකප්පානි, අප්පමාණාභානං චත්තාරි-කප්පානි, ආභස්සරානං අට්ඨකප්පානි.

33. පරිත්තසුභානං සොළසකප්පානි, අප්පමාණසුභානං ද්වත්-තිංසකප්පානි, සුභකිණ්හා නං චතුසට්ඨි කප්පානි.

34. වෙහප්ඵලානං අසඤ්ඤසත්තානංච පඤ්චකප්පසතානි.

35. අවිහානං කප්පසහස්සානි, අතප්පානං ද්වෙකප්පසහස්සානි සුදස්සානං චත්තාරි කප්ප සහස්සානි, සුදස්සීනං අට්ඨකප්ප සහස්සානි ආකිණිට්ඨානං සොළොස කප්ප සහස්සානි.

36. පඨමාරුප්පාදි විපාකානි පඨමාරුප්පාදි භූමිසු යථාක්කමං පටිසන්ධි භවඞ්ග චුතිවසෙන පවත්තන්ති. ඉමාචතස්සො ආප්පටිසන්ධියො නාම.

37. තෙසුපන ආකාසානඤ්චායතනූපගානං දෙවානං වීසති කප්ප සහස්සානි ආයුප්පමාණං.

38. විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං චත්තාලිසකපප් සහස්සානි

39. ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං සට්ඨිකප්පසහස්සානි.

40. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනූපගානං දෙවානං චතුරාසිතිකප්ප සහස්සානි.

41. පටිසන්ධි භවඞ්ගඤ්ච – තථාචවන මානසං
එකමෙව තථෙවෙක – විසයංචෙකජාතියං

## ඉදමෙත්ථ පටිසන්ධි චතුක්කං

42 ජනකං උපත්ථම්භකං උපපීළකං උපඝාතකං චෙති කිච්චවසෙන

43 ගරුකං ආසන්නං ආචිණ්ණං කටත්තා කම්මං චෙතිපාකදාන පරියායෙන

44 දිට්ඨධම්මවෙදනීයං උපපජ්ජවෙදනීයං අපරාපරිය වෙදනීයං අහොසිකම්මං චෙති පාකකාලවසෙන චත්තාරිකම්මානිනාම

45. තථා අකුසලං කාමාවචර කුසලං රූපාවචර කුසලං අරූපාවචර කුසලං චෙති පාකට්ඨානවසෙන.

46. තත්ථ අකුසලං කායකම්මං වචීකම්මං මනොකම්මං චෙති කම්මද්වාර වසෙන තිවිධං හොති.

47. කථං ? පාණාතිපාතො අදින්නාදානං කාමෙසුමිච්ඡාචාරො චෙති කායවිඤ්ඤත්ති සඞ්ඛාතෙ කායද්වාරෙ බාහුල්ල වුත්තිතො කාය කම්මං නාම.

48. මුසාවාදෙ පිසුණාවාචා ඵරුසවාචා සම්පප්ඵලාපො චෙති වචීවිඤ්ඤත්ති සඞ්ඛාතෙ වචීද්වාරෙ බාහුල්ල වුත්තිතොවචීකම්මං නාම.

49. අභිජ්ඣා ව්‍යාපාදෙ මිච්ඡාදිට්ඨි චෙති අඤ්ඤත්‍රාපි විඤ්ඤත්තියා මනස්මිං යෙව බාහුල්ල වුත්තිතො මනොකම්මංනාම.

50. තෙසු පාණාතිපාතො ඵරුසාවාචා ව්‍යාපාදෙ ච දෙසමූලෙන ජායන්ති.

51. කාමෙසුමිච්ඡාචාරො අභිජ්ඣා මිච්ඡාදිට්ඨි ච ලොභමූලෙන

52. සෙසානි චත්තාරි ද්වීහි මූලෙහි සම්භවන්ති.

53. චිත්තුප්පාදවසෙන පනෙතං අකුසලං සබ්බථාපි ද්වාදස විධංහොති.

54. කාමාවචර කුසලම්පි කායද්වාරෙපවත්තං කායකම්මං, වචීද්වාරෙ පවත්තං වචී කම්මං මනොද්වාරෙ පවත්තං මනොකම්මංචෙති කම්මද්වාරවසෙන තිවිධං හොති.

55. තථා දන සීල භාවනා වසෙන.

56. චිත්තුප්පාදවසෙන පනෙතං අට්ඨවිධං හොති.

57. දන සීල භාවනා අපචායන වෙය්‍යාවච්ච පත්තිදන පත්තානු-මොදන ධම්මසවන ධම්මදෙසනා දිට්ඨුජ්ජුකම්ම වසෙන දසවිධං හොති.

58. තංපනෙතං වීසතිවිධම්පි කාමාවචර කම්මම්ච්චෙවසඞ්ඛං ගච්ඡති

59. රූපාවචර කුසලං පන මනොකම්මමෙව, තඤ්ච භාවනාමයං අප්පණාප්පත්තං ඣානාඞ්ග හෙදෙන පඤ්ච විධං හොති.

60. තථා අරූපාවචර කුසලඤ්ච මනොකම්මං, තම්පි භාවනාමයං අප්පණාප්පත්තං ආලම්බන හෙදෙන චතුබ්බිධං හොති.

61. එත්ථාකුසලකම්මමුද්ධච්ච රහිතං අපාය භූමියං පටිසන්ධිං ජනෙති. පවත්තියං පන සබ්බම්පි ද්වාදසවිධං සත්තා-කුසල විපාකානි සබ්බත්ථාපි කාම ලොකෙ රූපලොකෙච යථාරහං විපච්චති.

62. කාමාවචර කුසලම්පි කාමසුගතිය මෙව පටිසන්ධිං ජනෙති. තථා පවත්තියඤ්ච මහා විපාකානි, අහේතුක විපාකානිපන අට්ඨපි සබ්බත්ථාපි කාමලොකෙ රූපලොකෙච යථාරහං විපච්චති.

63. තත්ථාපි තිහෙතුකමුක්කට්ඨං කුසලං තිහෙතුකං පටිසන්ධිං දත්වා පවත්තෙ සොළස විපාකානි විපච්චති.

64. තිහෙතුක මොමකං ද්විහේතුකං මුක්කට්ඨංච කුසලං ද්වි හෙතුකං පටි සන්ධිං දත්වා පවත්තෙ තිහෙතුකරහිතානි ද්වාදස විපාකානි විපච්චති.

65. ද්විහෙතුක ඔමකං පන කුසලං අහෙතුකමෙව පටිසන්ධිං දෙති, පවත්තෙච අහෙතුක විපාකානෙව විපච්චති.

66. අසඞ්ඛාරං සසඞ්ඛාර – විපාකානි න පච්චති
සසඞ්ඛාරං අසඞ්ඛාර – විපාකානි ති කෙච න
තෙසං ද්වාදස පාකානි – දසාට්ඨච යථාක්කමං
යථා වුත්තානුසාරෙන – යථා සම්භව මුද්දිසෙ

67. රූපාවචර කුසලං පන පඨමජ්ඣානං පරිත්තං භාවෙත්වා බ්‍රහ්මපාරිසජ්ජෙසු උප්පජ්ජති.

68. තදෙව මජ්ඣිමං භාවෙත්වා බ්‍රහ්මපුරොහිතෙසු

69. පණීතං භාවෙත්වා මහා බ්‍රහ්මෙසු

70. තථාදුතියජ්ඣානං තතියජ්ඣානංච පරිත්තං භාවෙත්වා පරිත්තා භෙසු.

71. මජ්ඣිමං භාවෙත්වා අප්පමාණා භෙසු.

72. පණීතං භාවෙත්වා ආභස්සරෙසු.

73. චතුත්ථජ්ඣානං පරිත්තං භාවෙත්වා පරිත්තසුභෙසු.

74. මජ්ඣිමං භාවෙත්වා අප්පමාණ සුභෙසු,

75. පණීතං භාවෙත්වා සුභකිණ්හෙසු.

76. පඤ්චමජ්ඣානං භාවෙත්වා වෙහප්ඵලෙසු.

77. තදෙව සඤ්ඤා විරාගං භාවෙත්වා අසඤ්ඤසත්තෙසු.

78. අනාගාමිනො පන සුද්ධාවාසෙ උප්පජ්ජන්ති.

79. අරූපාවචර කුසලංච යථාක්කමං භාවෙත්වා ආරුප්පෙසු උප්පජ්ජන්ති ති.

80. ඉත්ථංමහග්ගතං පුඤ්ඤං – යථාභූමිවත්ථිතං
ජනෙති සදිසං පාකං – පටිසන්ධිප්පවත්තියං

## ඉදමෙත්ථ කම්මචතුක්කං

81. ආයුක්ඛයෙන කම්මක්ඛයෙන උභයක්ඛයෙන උපච්ඡෙදක කම්මුණාචෙති චතුධා මරණුප්පත්ති නාම

82. තථාච මරන්තානං පන මරණකාලෙ යථාරහං අභිමුඛීභූතං භවන්තරෙ පටිසන්ධි ජනකං කම්මංවා තං කම්මකරණ කාලෙ රූපාදිකමුපලද්ධ පුබ්බමුපකරණ භූතංච කම්ම නිමිත්තං වා, අනන්තරමුප්පජ්ජමාන භවෙ උපලභිතබ්බමුප- භොගභූතං ච ගතිනිමිත්තංවා කම්ම බලෙන ඡන්නංද්වාරානං අඤ්ඤතරස්මිං පච්චුපට්ඨාති

83. තතොපරං තමෙව තතොපට්ඨිතං ආරම්මණං ආරබ්භ විපච්ච- මානක කම්මානුරූපං පරිසුද්ධං උපක්කිලිට්ඨං වා උපලභි- තබ්බ භවානුරූපං තත්ථොනතංච චිත්තසන්තානං අභිණ්හං පවත්තති බාහුල්ලෙන

84. තමෙව වා පන ජනකභූතං කම්මං අභිනව කරණ වසෙන ද්වාරප්පත්තං හොති

85. පච්චාසන්න මරණස්ස තස්ස වීථි චිත්තාවසානෙ භවඞ්ගක්- ඛයෙවා චවන වසෙන පච්චුප්පන්න භවපරියොසාන භූතං චුති චිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති

86. තස්මිං නිරුද්ධාවසානෙ තස්සානන්තරමෙව තථාගහිතං ආරම් මණං ආරබ්භ සවත්ථුකං අවත්ථුකමෙව වා යථාරහං අවිජ්ජා නුසයං පරික්ඛිත්තෙන තණ්හානුසය මූලකෙන සඞ්ඛාරෙන ජනීයමානං සම්පයුත්තෙහි පරිග්ගය්හමානං සහජාතාන මධිට්ඨානභාවෙන පුබ්බඞ්ගමභූතං භවන්තර පටිසන්ධාන වසෙන පටිසන්ධි සඞ්ඛාතං මානසං උප්පජ්ජමාන මෙව පතිට්ඨාති භවන්තරෙ,

87. මරණාසන්න වීථියං පනෙත්ථ මන්දප්පවත්තානි පඤ්චෙවජවනානි පාටිකඞ්ඛි තබ්බානි, තස්මා යදි පච්චුප්පන්නාරම්මණෙසු ආපාතමාගතෙසු ධරන්තෙස්-

වෙ ව මරණං හොති තද පටිසන්ධි භවඞ්ගානම්පි පච්චුප්පන්නාරම්මණතා ලබ්භතීති කත්වා කාමාවචර පටි-සන්ධියා ඡද්වාරගහිතං කම්මනිමිත්තං ගතිනිමිත්තංච පච්චුප්-පන්නමතීතාරම්මණං උපලබ්භති, කම්මං පන අතීත මෙව, තංච මනොද්වාරගහිතං, තානි පන සබ්බානිපි පරිත්ත ධම්ම භූතානෙවාරම්මණානි

88. රූපාවචර පටිසන්ධියා පන පඤ්ඤත්තිභූතං කම්මනිමිත්ත මෙවාරම්මණංහොති

89. තථා ආරුප්ප පටිසන්ධියාච මහග්ගතභූතං පඤ්ඤත්ති භූතංච කම්ම නිමිත්තමෙව යථාරහමාරම්මණං හොති

90. අසඤ්ඤසත්තානං පන ජීවිත නවක මෙව පටිසන්ධි භාවෙන පතිට්ඨාති තස්මා තෙ රූප පටිසන්ධිකා නාම

91. ආරුප්පා ආරුප්ප පටිසන්ධිකා, සෙසා රූපාරූප පටිසන්ධිකා

92. ආරුප්ප චුතියාහොන්ති – හෙට්ඨිමාරුප්පවජ්ජිතා
පරමාරුප්ප සන්ධි ච – තථා කාමෙ තිහේතුකා
රූපාවචර චුතියා – අහෙතුරහිතා සියුං
සබ්බාකාමතිහේතුම්හා – කාමෙස්වෙවපනෙතරා
අයමෙත්ථ චුතිපටිසන්ධික්කමො

93. ඉච්චෙවං ගහිතපටිසන්ධිකානං පන පටිසන්ධි නිරොධානන්තරතොප්පභූති තමෙවමරම්මණං රබ්භ තදෙව චිත්තංයාව චුතිචිත්තුප්පාද අසති වීථිචිත්තුප්පාදෙ භවස්ස අංග භාවෙන භවඞ්ගසන්තති සඞ්ඛාතං මානසං අබ්බොච්ඡින්නං නදී සොතො විය පවත්තති පරියොසානෙච චවනවසෙන චුති චිත්තං හුත්වා නිරුජ්ඣති

94. තතොපරඤ්ච පටිසන්ධාදයො රථචක්කමිව යථාක්කමං එව පරිවත්තන්තා පවත්තන්ති
පටිසන්ධි භවඞ්ග වීථියො – චුතිචෙහතථා භවන්තරෙ
පුනසන්ධි භවඞ්ගමිච්චයං – පරිවත්තති චිත්ත සන්තති

95. පටිසංඛාය පනෙතමද්ධුවං – අධිගන්ත්වා පදමච්චුතං බුධා සුසමුච්ඡින්න සිනෙහ බන්ධනා – සමමෙස්සන්ති චිරාය සුබ්බතා ඉති අභිධම්මත්ථසංගහෙ වීථිමුත්ත සඞ්ගහ විභාගොනාම

**පඤ්චමො පරිච්ඡෙදො**

# අභිධර්මාර්ථ සංග්‍රහය

## පඤ්චම පරිච්ඡේදය

### වීථිමුක්ත සංග්‍රහ විභාගය

(භාවය)

1. මෙසේ ප්‍රවෘත්ති කාලයෙහි වීථිචිත්තයන්ගේ වශයෙන් ප්‍රවෘත්ති සංග්‍රහය කියන ලදී. දැන් ප්‍රතිසන්ධි චුති කාලයන්හි ප්‍රවෘත්ති සංග්‍රහය කියනු ලැබේ.

2. භූමිසතරය, ප්‍රතිසන්ධි සතරය, කර්ම සතරය, මරණොත්පත්ති සතරය යයි වීථිමුක්ත සංග්‍රහයෙහි චතුෂ්ක සතරක් දතයුත්තාහ.

3. එහි අපාය භූමියද, කාම සුගති භූමියද, රූපාවචර භූමියද, අරූපාවචර භූමියදයි යන මොවුහු සතර භූමි නම් වේ.

4. එහි නිරය, තිරිසන්යොනිය, ප්‍රෙතවිෂය, අසුරකාය යයි අපාය භූමි සතර වැදෑරුම් වේ.

5. මනුෂ්‍ය භූමිය, චාතුර්ම්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිර්මිතවසවර්තිය දැයි කාම සුගති භූමිය සත් වැදෑරුම් වේ.

6. එකොළොස් වැදෑරුම් වූ ඒ භූමිය කාමාවචර භූමි සඞ්ඛ්‍යාවටම යයි.

7. බ්‍රහ්මපාරිසජ්ජය, බ්‍රහ්මපුරොහිතය, මහාබ්‍රහ්මය යන තුන ප්‍රථමධ්‍යාන භූමි නමි.

8. පරිත්තාභය, අප්පමාණාභය, ආභස්සරය යන තුන ද්‍විතියධ්‍යාන භූමි නමි.

9. පරිත්තසුභය, අප්පමාණසුභය, සුභකිණ්හය යන තුන තෘතියධ්‍යාන භූමි නමි.

10. වෙහප්ඵලය, අසඤ්ඤසත්තය, සුද්ධාවාසය යන භූමි තුන චතුර්ථධ්‍යාන භූමි නමි. මෙසේ රූපාවචර භූමිය සොළොස් වැදෑරුම් වේ.

11. අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සිය, අකනිට්ඨය යයි සුද්ධාවාස භූමි පඤ්චවිධවේ.

12. ආකාසානඤ්චායතන භූමිය, විඤ්ඤාණඤ්චායතන භූමිය ආකිඤ්චඤ්ඤායතන භූමිය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන භූමිය යයි අරූපාවචර භූමිය සිව්වැදෑරුම් වේ.

13. සුද්ධාවාසයන්හි පෘථග්ජනයෝ ද සොවාන් සකෘදගාමී පුද්ගලයෝද සර්වප්‍රකාරයෙන් නොලැබෙති.

14. ආර්‍ය්‍යයෝ අසඤ්ඤ සත්තයෙහි සහ අපායයන්හි නො ලැබෙති. ආර්‍ය්‍යයෝ ද අනාර්‍ය්‍යයෝ ද සෙසුතන්හි ලැබෙත්.

**මෙය මෙහි භූමිචතුෂ්කය නමි**

15. අපාය ප්‍රතිසන්ධිය, කාමසුගති ප්‍රතිසන්ධිය, රූපාවචර ප්‍රති-සන්ධිය, අරූපාවචර ප්‍රතිසන්ධිය යන මොව්හු චතුර්විධ ප්‍රතිසන්ධිහු නම් වෙති.

16. එහි අකුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිත අපාය භූමියෙහි උපදින කල්හි ප්‍රතිසන්ධිය දී ඉක්බිතිව භවඞ්ගව අවශානයෙහි චුතිය වී සිදීයයි. මේ එකම අපාය ප්‍රතිසන්ධිය වේ.

17. කුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණ සිත, කාමසුගති-යෙහි මනුෂ්‍යයන් කෙරෙහි ජාත්‍යන්ධාදීන්ටද බූමාට විනිපාතික අසුරයන්ට ද ප්‍රතිසන්ධි භවඞ්ග චුතිවශයෙන් පවතිත්.

18. මහා විපාක අට වනාහී කාම සුගතියෙහි සෑම තැනම ප්‍රතිසන්ධි, භවඞ්ග චුති වශයෙන් පවතිත්.

19. මේ නවය කාමසුගති ප්‍රතිසන්ධිහු වෙත්.

20. ඒ මේ දස විධ ප්‍රතිසන්ධිහු කාමාවචර ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාවට පැමිණේ.

21. ඔවුන් අතුරෙන් සතර අපාගත සත්වයන්ගේද මනුෂ්‍යයන් ගේද විනිපාතික අසුරයන්ගේද ආයුප්‍රමාණ ගණනායෙහි නියමයෙක් නැත.

22. චාතුර්මහාරාජික දෙවියන්ට දිව්‍ය ප්‍රමාණයෙන් අවුරුදු පන්සියයක් ආයුප්‍රමාණය වෙයි. මිනිස් ගණනින් අනූ ලක්ෂයක් පමණ වෙයි.

23. එයට වඩා සතර ගුණයක් තව්තිසා දෙවියන්ටද, එයට වඩා සතර ගුණයක් යාම දෙවියන්ටද, එයට වඩා සතර ගුණයක් තුසිත දෙවියන්ටද එයට වඩා සතර ගුණයක් නිම්මාණරති දෙවියන්ටද, එයට වඩා සතර ගුණයක් පරනිම්මිත වසවර්ති දෙවියන්ට ද ආයු ප්‍රමාණය වෙයි.

24. මනුෂ්‍ය ගණනින් අවුරුදු නවසිය විසිඑක්කොටි හැට ලක්ෂයක් පරනිම්මිත වසවත්ති දෙව්ලොව ආයුෂය වෙයි.

25. ප්‍රථමධ්‍යාන විපාකසිත ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති වශයෙන් පවතී.

26. එ සේම ද්‍විතියධ්‍යාන විපාකසිතත්, තෘතියධ්‍යාන විපාකසිතත් ද්විතිය ධ්‍යාන භූමියෙහි ද,

27. චතුර්ථධ්‍යාන විපාක සිත තෘතියධ්‍යාන භූමියෙහි ද

28. පඤ්චමධ්‍යාන විපාක සිත චතුර්ථධ්‍යාන භූමියෙහිද ප්‍රති-සන්ධි, භවඞ්ග, චුති වශයෙන් පවතී.

29. අසඤ්ඤසත්වයන්ට වනාහී රූපයම ප්‍රතිසන්ධිය වෙයි. ඉන් පසු ප්‍රවෘත්තිකාලයෙහි ද චුති කාලයෙහි ද රූපයම පැවත නිරුද්ධ වෙයි.

30. මේ සය රූපාවචර ප්‍රතිසන්ධිහු නම් වෙත්.

31. ඔවුන් අතුරෙන් බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන්ට අසඞ්ඛ්‍ය කල්පයා ගේ තෘතීය භාගය ආයු ප්‍රමාණය වෙයි බ්‍රහ්මපුරොහිත

බ්‍රහ්මයන්ට අර්ධකල්පයක් ද මහා බ්‍රහ්මයන්ට එක් අසඞ්ඛ්‍ය කල්පයක් ද ආයු ප්‍රමාණය වෙත්

32. පරිත්තාභ බ්‍රහ්මයින්ට කල්ප දෙකක් ද, අප්පමාණභයින්ට, කල්ප සතරක් ද, ආභස්සරයින්ට කල්ප අටක් ද ආයු ප්‍රමාණය වෙත්

33. පරිත්තසුභ බ්‍රහ්මයින්ට සොළොස් කපක්ද අප්පමාණ සුභ බ්‍රහ්මයින්ට දෙතිස් කපක්ද, සුභකිණ්භ බ්‍රහ්මයින්ට සිව් සැට කපක් ද ආයුප්‍රමාණය වෙත්

34. වෙහප්ඵල බ්‍රහ්මයින්ට හා අසඤ්ඤසත්ත්ව බ්‍රහ්මයින්ට ද කල්ප පන්සියයක් ආයුප්‍රමාණය වෙත්

35. අවිහ බ්‍රහ්මයින්ට දහස් කපක්ද, අතප්ප බ්‍රහ්මයින්ට දෙදහස් කපක්ද, සුදස්ස බ්‍රහ්මයින්ට සාර දහස් කපක්ද, සුදස්සී බ්‍රහ්මයින්ට කල්ප අට දහසක් ද අකනිට්ඨ බ්‍රහ්මයින්ට කප් සොළොස් දහසක් ද ආයුප්‍රමාණය වෙත්

36. ප්‍රථම අරූපාවචර ආදී විපාකසිත් ප්‍රථම අරූපාදී භූමීන්හි ප්‍රතිසන්ධි භවඞ්ග චුති වශයෙන් පවතිත්. මේ සතර අරූපාවචර ප්‍රතිසන්ධීහු නම් වෙත්

37. ඔවුන් අතුරෙන් ආකාසානඤ්චායතනයෙහි උපන් බ්‍රහ්ම යින්ට කල්ප විසි දහසක් ආයු ප්‍රමාණය වෙයි

38. විඤ්ඤාණඤ්චායතනයෙහි උපන් බ්‍රහ්මයින්ට කල්පසතළිස් දහසක් ද,

39. ආකිඤ්චඤ්ඤායතනයෙහි උපන් බ්‍රහ්මයන්ට කල්ප සැට දහසක් ද

40. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපන් බ්‍රහ්මයින්ට කල්ප අසූහාර දහසක්ද ආයුප්‍රමාණය වෙත්

41. එක් භවයක දී ප්‍රතිසන්ධි, භවඞ්ග, චුති සිත් එකක්ම වෙයි. එසේ ම එකම අරමුණක එල්බ පවතිත්

**මේ මෙහි ප්‍රතිසන්ධි චතුෂ්කය වෙයි**

42. ජනකය, උපත්ථම්භකය, උපපීළකය, උපඝාතකය යයි කෘත්‍ය වශයෙන් කර්ම සතරක් වෙත්.

43. ගරුකය, ආසන්නය, ආචීර්ණය, කටත්තා කර්ම යයි විපාක දෙන පිළිවෙලින් ද කර්ම සතරක් වෙත්.

44. දිට්ඨ ධම්ම වෙදනිය, උපපජ්ජ වෙදනීය අපරාපරිය වෙදනීය අහොසිකම්ම යයි විපාක දෙන කාලවශයෙන් කර්මසතරක් වෙත්.

45. එසේම අකුසලය, කාමාවචර කුසලය, රූපාවචර කුසලය, අරූපාවචර කුසලයයි යයි විපාක දෙන ස්ථාන වශයෙන් කර්ම සතරක් වේ.

46. එහි අකුසලය, කායකර්ම, වචීකර්ම, මනොකර්ම යයි කර්ම ද්වාර වශයෙන් ත්‍රිවිධ වෙයි.

47. කෙසේ ද? පාණාතිපාතය, අදින්නාදනය, කාමමිථ්‍යාචාරය යන මෙය කාය විඥ්ඥත්ති සඞ්ඛ්‍යාත වූ කායද්වාරයෙහි බහුලවශයෙන් පවතින බැවින් කාය කර්ම නම් වේ.

48. මුසාවාද, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාප යන මේ සතර වචී විඥ්ඥත්ති සඞ්ඛ්‍යාත වූ වාග්ද්වාරයෙහි බහුල වශයෙන් පවත්නා බැවින් වචී කර්ම නම් වේ.

49. අභිධ්‍යාව්‍යාපාද ,මිථ්‍යාදෘෂ්ටි යන මෙය විඥ්ඥත්තියෙන් තොරව සිතෙහි ම බහුලව පවත්නා බැවින් මනොකර්ම නම් වේ.

50. එයින් පාණාතිපාතය, ඵරුසාවාචය, ව්‍යාපාදය යන මෙය ද්‍වෙෂමූලයෙන් උපදිත්.

51. කාමමිථ්‍යාචාරය, අභිධ්‍යාවය, මිථ්‍යාදෘෂ්ටිය ලොභමූල යෙන් උපදිත්.

52. ඉතිරි සතර මුල් දෙකකින් උපදිත්.

53. චිත්තොත්පාද වශයෙන් ඒ අකුසලය සර්වප්‍රකාරයෙන්ම දෙළොස් වැදෑරුම් වෙයි.

54. කාමාවචර කුසලයද කායද්වාරයෙහි පවත්නා කල්හි කාය කර්මය, වාග් ද්වාරයෙහි පවත්නා කල්හි වචී කර්මය, මනොද්වාරයෙහි පවත්නා කල්හි මනොකර්මය යයි මෙසේ කර්මද්වාර වශයෙන් ත්‍රිවිධ වෙයි.

55. එසේම දන, සීල, භාවනා වශයෙන් ත්‍රිවිධ වෙයි.

56. එය චිත්තොත්පාද වශයෙන් අටවැදෑරුම් වේ.

57. දන, සීල, භාවනා, අපචායන, වෙයාාවච්ච, පත්තිදන, පත්තානුමෝදන, ධම්මසවණ, ධම්මදෙශනා, දිට්ඨුජ්ජුකම්ම යන මොවුන්ගේ වශයෙන් දස වැදෑරුම් වේ.

58. ඒ මේ විසිවැදෑරුම් කර්මය කාමාවචර කර්ම සඞ්ඛ්‍යාවටම පැමිණේ.

59. රූපාවචර කුසලය මනොකර්මමය, එයද භාවනාමය වේ. අර්පණාවටද පැමිණියේ වෙයි. ධ්‍යානාඞ්ග භෙදයෙන් පස්වැදෑරුම් වේ.

60. එසේම අරූපාවචර කුසලයද මනොකර්මයකි. එයද භාවනාමය වේ. අර්පණාවටද පැමිණියේ වෙයි. ආරම්මණ භෙදයෙන් චතුර්විධ වෙයි.

61. එහි උද්ධච්ච සහගත අකුසල කර්මය හැර සෙසු අකුසල කර්ම අපාය භූමියෙහි ප්‍රතිසන්ධිය උපදවත්. ප්‍රවෘත්තිකාලයෙහි සියලු ද්වාදස විධ අකුසල කර්මයම කාමලොක රූප ලොකයන්හි අකුසල විපාක සත සුදුසු පරිදි උපදවයි.

62. කාමාවචර කුසලයද කාමසුගතියෙහි ම ප්‍රතිසන්ධිය උපදවයි. එසේම ප්‍රවෘත්ති කාලයෙහි මහා විපාකයන් උපදවයි. කාමලොක රූප ලොක යන සියලු තන්හි අහේතුක කුසල විපාක අටත් සුදුසු පරිද්දෙන් උපදවයි.

63. එහි ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසලය ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය දී ප්‍රවෘත්ති කාලයෙහි සොළොස් විපාකයන් උපදවයි.

64. ත්‍රිහේතුක ඕමක කුසලයන් සහ ද්විහේතුක උත්කෘෂ් කුසලයන් ද්විහේතුක ප්‍රතිසන්ධිය දී ප්‍රවෘත්ති කාලයෙහි ත්‍රිහේතුක හැර දෙලොස් විපාකයන් උපදවයි.

65. ද්විහේතුක ඕමක කුසලය අහේතුක ප්‍රතිසන්ධියමදෙයි. ප්‍රවෘත්තිකාලයෙහිද අහේතුක විපාකයන්ම උපදවයි.

66. අසඞ්ඛාරික කුසල කර්මය සසඞ්ඛාරික විපාකයද, සසඞ්ඛාරික කුසල කර්මය අසඞ්ඛාරික විපාකයද නොදේයයි ඇතැම්කෙනෙක් කියති. ඔවුන්ගේ අදහස් අනුව විපාක දෙළොසක්ද, දසයක්ද, අටක්ද, සම්භවන පරිදි පිළිවෙලින් දක්වන්නේය.

67. රූපාවචර කුසලය වූ ප්‍රථම ධ්‍යානය පරිත්ත වශයෙන් වඩා බ්‍රහ්මපාරිසජ්ජයෙහි උපදී.

68. එයම මධ්‍යම වශයෙන් වඩා බ්‍රහ්මපුරොහිතයන් කෙරෙහි උපදී.

69. ප්‍රණීත වශයෙන් වඩා මහා බ්‍රහ්මයන් කෙරෙහි උපදී.

70. එසේම ද්‍රුතිය තෘතියධ්‍යානයන් පරිත්ත වශයෙන් වඩා පරිත්තාභයන් කෙරෙහි උපදී.

71. මධ්‍යම වශයෙන් වඩා අප්පමාණාභයන් කෙරෙහි උපදී.

72. ප්‍රණීත වශයෙන් වඩා ආභස්සරයන් කෙරෙහි උපදී.

73. චතුර්ථධ්‍යානය පරිත්ත වශයෙන් වඩා පරිත්තසුභයන් කෙරෙහි උපදී.

74. මධ්‍යම වශයෙන් වඩා අප්පමාණසුභයන් කෙරෙහි උපදී.

75. ප්‍රණීත වශයෙන් වඩා සුභකිණ්හයන් කෙරෙහි උපදී.

76. පඤ්චමධ්‍යාන වඩා වේහප්ඵලයන් කෙරෙහි උපදී.

77. එයම සඤ්ඤා විරාග වශයෙන් වඩා අසඤ්ඤසත්තයන් කෙරෙහි උපදී.

78. අනාගාමීහු වනාහී සුද්ධාවාසයන් කෙරෙහි උපදිත්.

79. අරූපාවචර කුසලය ද පිළිවෙලින් වඩා අරූපභූමින්හි උපදිත්.

80. මෙසේ මහග්ගත කුසලය ඒ ඒ භූමියට නියමිත වූ පරිද්දෙන් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන්හි තමා හා සමාන විපාක උපදවයි.

**මෙය මෙහි කර්ම චතුෂ්කය යි**

81. ආයුක්ෂය, කර්මක්ෂය, උභයක්ෂය, උපච්ඡේදක යයි මරණොත්පත්ති සතර විධවේ.

82. එසේ මැරෙන්නවුන්ට මරණ කාලයෙහි සුදුසු පරිද්දෙන් අභිමුඛ වූ අනතුරු භවයෙහි ප්‍රතිසන්ධි ජනක කර්මය හෝ ඒ කර්මය කරණ කල්හි ලබන ලද රූපාදිය හා කර්මයට උපකරණ වූ කර්ම නිමිත්ත හෝ මතු භවයෙහි ලැබිය යුතු වූ ද අනුභව කටයුතු වූද, ගතිනිමිත්ත හෝ කර්ම බලයෙන් සදෙරින් ඒකතරා ද්වාරයෙක්හි වැට හෙයි.

83. ඉන් පසු එසේ වැටහුණු ඒ අරමුණේ එල්බගත් චිත්ත සන්තානය, විපාක උපදවන කර්මයට අනුරූපව පිරිසුදුව හෝ කිළිටුව හෝ උපදිනු ලබන භවයට අනුරූපව ඒ භවයට නැඹුරුව ම බොහෝ සෙයින් නිරතුරුව පවතී.

84. ඒ ප්‍රතිසන්ධි ජනක කර්මයම හෝ අභිනව කරණයක් වශයෙන් මනොද්වාරයට පැමිණියේ වෙයි.

85. මරණාසන්නයෙහිවූ ඔහුට වීථිචිත්තයන්ගේ අවශාන යෙහි හෝ භවඞ්ගයන්ට අනතුරුව හෝ චුතවීම් වශයෙන් ප්‍රත්‍යුත්පන්න භවයාගේ අවසානය වූ චුති චිත්තය ඉපිද නිරුද්ධ වෙයි.

86. එය නිරුද්ධ වූ පසු එයට අනතුරුව එසේ ගන්නා ලද අරමුණක් ගෙන හදයවස්තුව ඇසුරු කොට හෝ නොකොට හෝ සුදුසු පරිද්දෙන් අවිජ්ජානුසය විසින් පිරිවරන ලද තණ්හානුසය මුල්කොට ඇති කර්මයෙන් උපදවන ලද සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් පරිග්‍රහණය කරන ලද සහජාත ධර්මයන්ට ආධාර වීමෙන් පූර්වාඞ්ගමවූ භවයන්ගේ අතර ගැලපීම් වශයෙන් ප්‍රතිසන්ධිනම් වූ සිත භවාන්තරයෙහි උපදවමින් ම පිහිටයි.

87. මේ මරණාසන්න වීථියෙහි දුර්වලව පැවැති ජවන් පසක්ම කැමැති විය යුතුය. එහෙයින් ප්‍රත්‍යුත්පන්න අරමුණු හමුවූ කල්හි එ අරමුණු පවතිද්දීම මරණය වෙයි නම් එකල්හි ප්‍රතිසන්ධි භවාංගයන්ටද ප්‍රත්‍යුත්පන්න අරමුණු ලැබෙන බැවින් කාමාවචර ප්‍රතිසන්ධියට සදෙරින් ගන්නා ලද කම්මනිමිත්තත්, ගති නිමිත්තත් ප්‍රත්‍යුත්පන්න අරමුණක් හෝ අතීත අරමුණක්ව ලැබෙන්නේය. කර්මය අතීත අරමුණක් මය. එය ද මනෝද්වාරයෙන් ගන්නා ලදී. ඒ සියල්ලම කාමධර්ම අරමුණුම වෙත්.

88. රූපාවචර ප්‍රතිසන්ධියට ප්‍රඥප්තිවූ කර්මනිමිත්තම අරමුණු වෙයි.

89. එසේම අරූප ප්‍රතිසන්ධියටද මහද්ගත වූද ප්‍රඥප්ති වූද කර්ම නිමිත්තම සුදුසු පරිද්දෙන් අරමුණු වෙයි.

90. අසංඥසත්වයන්ට ජීවිත නවක රූපකලාපයම ප්‍රතිසන්ධි භාවයෙන් පිහිටයි. එහෙයින් ඔව්හු රූප ප්‍රතිසන්ධික යෝ නම් වෙත්.

91. අරූප භූමිකයෝ අරූපප්‍රතිසන්ධිකයෝය. සෙස්සෝ රූපා රූප ප්‍රතිසන්ධිකයෝය.

92. අරූපාවචර චුතියෙන් පසුව යට යට අරූපප්‍රතිසන්ධි හැර සෙසු අරූප ප්‍රතිසන්ධිහුද, කාම ත්‍රිහේතුක ප්‍රතිසන්ධිහුද වෙත්. රූපාවචර චුතියෙන් පසුව අහේතුක ප්‍රතිසන්ධින් හැර ඉතිරි ප්‍රතිසන්ධිහු වෙත්. කාමත්‍රිහේතුක චුතියෙන් පසුව සියලු ප්‍රතිසන්ධිහුම වෙත්. ඉතිරි චුතින්ගෙන් පසු කාමප්‍රතිසන්ධිහුම වෙත්.

**මෙය මෙහි චුතිප්‍රතිසන්ධි ක්‍රමය යි.**

93. මෙසේ ගන්නා ලද ප්‍රතිසන්ධි ඇත්තවුන්ගේ ප්‍රතිසන්ධි සිත නිරුද්ධ වූ තැන් සිට ඒ සිතම ඒ අරමුණම ගෙන චුති- චිත්තය උපදින තෙක් වීථිසිත් නූපදින කල්හි භවඞ්ග සන්තති සඞ්ඛ්‍යාත වූ සිත භවයාගේ පැවැත්මට හේතු භාවයෙන්

ගංගා ප්‍රවාහයක් මෙන් අතර නොසිඳී පවතී. භවයාගේ අවශානයෙහි ද චුතවීම් වශයෙන් චුතිසිත ඉපිද නිරුද්ධ වෙයි.

94. ඉන් පසුද ප්‍රතිසන්ධි ආදීහු රථ චක්‍රයක් මෙන් පිළිවෙලින්ම පෙරලෙමින් පවතිත්. මේ භවයෙහි ප්‍රතිසන්ධි භවඞ්ගයක්ම හා වීථි සිත් ද චුති සිත ද යන මේ චිත්ත සන්තතිය යම් සේ පෙරලේද, එසේම නැවත භවාන්තරයෙහි ප්‍රතිසන්ධි භවඞ්ගාදී මේ චිත්ත සන්තතිය පරිවර්තනය වෙයි.

95. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලත් නුවණැත්තෝ මෙහි අනිත්‍යතාවය සළකා මාර්ගඵලාධිගමය කොට තෘෂ්ණා බන්ධනය සිඳ නිවණට පැමිණෙන්නාහුය.

මෙතෙකින් අභිධර්මාර්ථ සංග්‍රහයෙහි වීථිමුක්ත සංග්‍රහ

විභාග නම් වූ පඤ්චම පරිච්ඡේදය නිමි.

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## පංචම පරිච්ඡේදය

### විථිමුක්ත සඞ්ග්‍රහ විභාගය

විථිමුක්ත සංග්‍රහයෙහි සතර භූමි කෙනෙක් ද, **සතරාකාර වූ ප්‍රතිසන්ධියෙක් ද, සතර කර්ම කෙනෙක් ද, සතරාකාර වූ මරණොත්පත්ති සඞ්ඛ්‍යාත වූ චුතියෙක් ද,** යන සතර චතුස්කයක්, **පිළිවෙලින්** විස්තර කරණු ලැබේ.

## භූමි චතුස්කය

සත්ත්වයන් වාසය කරණ ස්ථාන හෙවත් නාම රූප **සඞ්ඛ්‍යාත** පරමාර්ථ ධර්මයාගේ හටගැණීමට ස්ථාන වූ භූමි සතරෙකි.

එනම්:—

1. **අපාය භූමි**
2. **කාම සුගති භූමි**
3. **රූපාවචර භූමි**
4. **අරූපාවචර භූමි**

මෙයින් අපාය භූමි සහ කාම සුගති භූමි එක්කොට ගත් කල්හි **කාම භූමි** නම් වේ. කාම භූමි සියල්ලම එකොළොසකි. එනම් සතර අපායත්, සප්ත කාම සුගතියත් ය.

### අපාය භූමි

අය සඞ්ඛ්‍යාත වූ සැපයෙන් පහව ගියාවූ ස්ථානය **අපාය** නම් වේ. **අපාය** භූමි සතරෙකි. එනම්:—

1. **නිරය භූමිය**
2. **තිරිසන් භූමිය**
3. **ප්‍රෙත භූමිය**
4. **අසුර කාය භූමිය**

**අපාය භූමිය** යනු අය නම්වූ සැප කිසිවක් නැති තැනය යන අර්ථයි. එක් ඇසිපියක් හෙළන කාලයක් පමණකුදු සැපයක් නැතිව, අතිශය දුක්ඛයට පැමිණෙන හෙයින් **නිරය** යයි කියනු ලැබේ. කුසලාකුසල කර්මයන් හා එහි විපාකයන්ගේ ද දැනීමක් නැතිව ලොභයෙන් හා ද්වේෂයෙන් ද මුළා වී සත්ත්වඝාතනාදී අකුසල රැස්කළාවූ සත්ත්වයන් බොහෝ සෙයින් උපදින්නේ මේ නිරයයන්හී ය.

**මහා නිරය** අටෙකි. එනම් **සංජීවය, කාලසූත්‍රය, සංඝාතය, රෞරවය, මහාරෞරවය, තාපය, මහා තාපය** හෙවත් **ප්‍රතාපය, අවීචිය,** යන අටය.

1. **සංජීව නරකය:** සත්ත්වඝාතනාදිය කළාවූ සත්ත්වයන් උපදින නිරයකි. මේ මහා පොළොවට යොදුන් 15000 ක් යටින් පිහිටා ඇති මේ සංජීව නරකයෙහි උපන්නාවූ නිරිසතුන්ගේ වයස නිරය ගණනින් අවුරුදු 500 කි. එහි එක් දවසක් මනුෂ්‍යයන්ගේ ආයු පමණින් අවුරුදු නවලක්ෂයකැයි කියන ලදී. එසේ වූ දින 30 ක් එක් මසක් ද, දෙළොස් මසක් එක් අවුරුද්දක් ද, එවැනි අවුරුදු 500 ක් සංජීව නරකයෙහි ආයුෂය වේ.

2. **කාල සූත්‍රය:** මව්පිය, ගුරුවර, උපාද්ධ්‍යායාදීන් කෙරෙහි වරදවා පිළිපදින සත්ත්වයෝ ද, මිථ්‍යාදෘෂ්ටි ගත්තා වූ සත්ත්වයෝද වැඩි වශයෙන් **කාල සූත්‍ර** නරකයෙහි උපදින්නාහුය. මේ නරකය සංජීව නරකයට යොදුන් 15000 ක් පමණ යටින් පිහිටා ඇත. එහි ආයුෂ නිරය ප්‍රමාණයෙන් අවුරුදු දහසකි. එහි එක් දවසක් සංජීවයට දවස් සතරකි.

3. **සංඝාතය:** ගවයන්, එළුවන්, කුකුලන් ආදිවූ සත්ත්වයන් ඝාතනයකොට ජීවත් වන්නාවූ වැදි කෙවුල් ආදිවූ සත්ත්වයන් උපදින නිරයකි. කාලසූත්‍රයට යොදුන් 15000 ක් පමණ යටින් පිහිටි මේ නිරයෙහි ආයුෂ අවුරුදු දෙදහසකි. එහි එක් දවසක් කාලසූත්‍රයෙහි දින සතරකි.

4. **රෞරවය:** සංඝාත නරකයට යොදුන් 15000 ක් යටින් පිහිටා ඇති මේ නිරය, සත්ත්වයන්ට හිංසා පීඩා කරන්නාවූ

ද, ඉන්ද්‍රජාල, මායාකාර ආදී අනුන් රවටා ජීවත් වන්නාවූද සත්ත්ව යන් වැඩි වශයෙන් උපදින නිරයකි. එහි ආයුෂ නිරය ගණනින් අවුරුදු සාරදහසකි. සංඝාත නරකයෙහි සතර දිනක් රෞරවයට එක් දිනයකි.

5. **මහා රෞරවය:** තුනුරුවන් සතු වස්තු පැහැර ගන්නා වූ ද, අම්බලම්, මඩම් ආදිය විනාශ කරන්නාවූ ද පුද්ගලයන් උපදින නිරයකි. රෞරවයට යොදුන් 15000 ක් යටින් පිහිටි මේ නිරයෙහි වසන නිරිසතුන්ගේ ආයුෂ නිරය පමණින් අවුරුදු අට දහසකි. එහි එක් දිනක් රෞරවයට දින සතරකි.

6. **තාපය:** ප්‍රාණඝාතාදී දුශ්චරිතයන්හි හැසිරෙන්නා වූ පුද්ගල යන්ට අනිෂ්ට විපාකයෙක් නැත, සුගතියත් දුගතියත් මේ මනුෂ්‍ය භූමියෙහිම මිස අන් තැනෙක පිහිටා නැත යනාදී වශයෙන් මිථ්‍යා දෘෂ්ටි ගත්තාවූ පුද්ගලයන් උපදින නරකයෙකි. මහා රෞරව නරකයට යොදුන් 15000 කට පමණ යටින් පිහිටා ඇති මේ නරකයෙහි ආයුෂ නිරය ගණනින් අවුරුදු සොළොස් දහසකි. එහි එක් දිනක් මහා රෞරවයට සතර දිනකි.

7. **මහා තාපය;** හෙවත් ප්‍රතාපය, බුදුන් නැත, දහම් නැත, ආර්‍ය්‍ය සංඝයා නැත යනාදි බලවත් දෘෂ්ටි ගත්තා වූ පුද්ගලයන් උපදින භූමියකි. මේ නිරය තාප නිරයට යොදුන් 15000 ක් පමණ යටින් පිහිටා තිබේ. එහි ආයුෂ අර්ධ අන්තර කල්පයකි. අන්තර කල්පයක් නම් මනුෂ්‍ය භූමියෙහි පරමායුෂ අවුරුදු 10 සිට ක්‍රම යෙන් වැඩි වී අසඞ්ඛ්‍යය දක්වා නැග, නැවත පිරිහෙන්නට පටන් ගෙන අවුරුදු 10 දක්වා පැමිණීමට ගත වන කාලය වේ.

8. **අවීචිය:** මව්පියන්, රහතන් මැරුවාවූ ද, බුදුන් ඇඟින් ලේ සෙළවීම කළා වූද, සංඝ හෙදය කළා වූද, සඞ්ඝසන්තක දේපල ආරාම, දගැබ්, බෝමලු, ප්‍රතිමා රූපාදිය විනාශ කළාවූ ද පුද්ගල යන්ගේ උත්පත්ති භූමියකි. තාප නරකයට යොදුන් 15000 ක් පමණ යටින් පිහිටා ඇති මේ අවීචි මහා නිරයට ආයුෂ එක් කල්පයකි. දුකින් අතරක් නැති හෙයින් ද අවීචිය යයි කියනු ලැබේ.

මේ අටමහා නිරයයන් අතුරෙන් එක් එක් මහ නිරයකට පිරිවර වශයෙන් එක් පාර්ශ්වයෙක්හි සතර සතර බැගින් සොළොස් **උස්සද** හෙවත් **ඔසුපත් නිරය** වේ. එවිට අටමහා නිරය සහ **පිරිවර** ඔසුපත් නිරයයන් එකතුකොට ගත් කල්හි එක්සිය සතිසක් (136) නිරයයන් වෙත්.

තවද, චක්‍රවාටයන් තුන්දෙනෙක් හෙවත් සක්වළවල් තුනක් එකතු වූ තැන **ලෝකාන්තරික** නම් නරකයක් ද, එසේම **ලෝහකුම්භි** හෙවත් **ලොහොකුඹු** නම් කුඩා නිරයක්ද, **වේතරණී** නම් **ගඞ්ගා** නරකයක් ද, **කෝටිඉම්බලි** හෙවත් **කටු ඉඹුල්** නම් වෘක්ෂාකාර නරකයෙක් ද යන මේ සියලුම නරකයෝ **නිරය භූමි** නම් වෙත්.

## තිරිසන් හෙවත් තිරච්ඡාන භූමිය

මනුෂ්‍යයන් මෙන් කෙලින් නොගොස් සරස්ව නැමී යන්නෝ **තිරච්ඡානයෝ** යි. ඔවුන්ගේ ජාතිය **තිරිසන් යොනිය යි.** මේ තිරිසනුන් හට තැන් නියම නැත. මාර්ග ඵලයන්ගෙන් මිදුනා වූ ද, යට භාගයට යන්නා වූ ද යන අර්ථයෙන් ද **තිරච්ඡාන** නම් වන්නේ ය.

## ප්‍රෙත භූමිය

සර්වප්‍රකාරයෙන්ම සැපයෙන් දුරුවූ සත්ත්වයෝ ප්‍රෙතයෝ යි. මේ ප්‍රෙතයෝ සිව් කොටසකි. එනම්:—**පරදත්තුපජීවි, ඛුප්පිපාසික, නිජ්ඣාමතණ්හික** සහ **කාලකඤ්ජික** ප්‍රෙත කොටස් සතරය. මේ හැර තවත් කොටස් දෙළොසක් දක්වා ඇත. එනම් **වන්තාස, කුණපාස, ගුථඛාදක, අග්ගිජාලමුඛ, සූචිමුඛ, තණ්හට්ඨිත, සුනිජ්ඣාමක සත්වඞ්ග, පබ්බතඞ්ග, අජගර, වේමානික, මහිද්ධික** යන කොටස් දෙළොසකට අයත් ප්‍රෙතයෝ ය. මේ ප්‍රෙත ආත්මයම **ප්‍රෙතයෝනි** නම වේ. ඔවුන්ගේ වාසයට නියම තැනක් නැත.

## අසුර භූමිය

ඓශ්වර්‍ය්‍ය ක්‍රීඩා ආදියෙන් බැබැළීමක් නැති, සූර නොවූවෝ **අසුර** නම් වෙති. අසුරයෝ කොටස් පසෙකි. එනම්:—**දේව අසුර,**

**විනිපාතික අසුර, වේමානික අසුර, ලොකාන්තරික අසුර, සහ ප්‍රෙත අසුරයෝ යි.** මෙයින් **ප්‍රෙත අසුරයෝ** පමණක් සතර අපායට ඇතුළත් වෙති. සම්පත්තියෙන් දෙවියන් හා සමාන වූ **වේපචිත්ති, පහාරාදී** අසුරයෝ **දේව අසුර** සඞ්ඛ්‍යාවට ගැණෙත්. මොවුහු දෙවියන්ට සතුරුය. **මේ දේව අසුරයෝ** ද්‍විහේතුක කාමාවචර මහා **විපාක සිතකින්** පටිසන්ධිය ලැබුයේ වීනමුත්, ප්‍රවෘත්ති කාලයේ දී ත්‍රිහේතුක මහා විපාක ලබන්නාවූ දෙවියන්ට බඳු පස්කම් සැප අනුභව කරණ හෙයින් **තව්තිසා** වැසි දෙවියන් කෙරෙහි ඇතුළත් **වෙති.** නමුත් ඔවුන්ට, ත්‍රිහේතුක පටිසන්ධිය ලැබූ දෙවියන්ට මෙන් ධ්‍යාන මාර්ග ඵලාදිය නොලැබේ.

**පියඞ්කර මාතු, උත්තර මාතු** ආදිහු **විනිපාතික අසුරයෝයි. යමරජු** ආදීහු **වේමානික අසුරයෝ යි.** ලෝකාන්තරික නරකයෙහි වසන අසුරයෝ **ලොකාන්තරික අසුරයෝ යි. ප්‍රෙත අසුරයෝ** නම් **කාලකඤ්ජික** ප්‍රෙතයෝමය. මේ අසුරයෝද අපායට ඇතුළත් වෙති. මෙයින් **විනිපාතික** සහ **වේමානික අසුරයන්** චාතුම්මහාරාජි කයට ද ලොකන්තරික අසුරයන් නිරයටද ගැණෙත්.

මේ අපාය සතර අතුරෙන්, **තිරිසන්, ප්‍රෙත** සහ **අසුරයින්ට** නියම භූමි නැත. ඔවුන්ගේ ස්කන්ධයෝම, ඔවුන්ට **භූමි වෙත්.** එබැවින් මේ **තිරිසන්, ප්‍රෙත** සහ **අසුරයෝ** වාසය කරන්නාවූ ස්ථාන කෙසේ වෙතත් ඔවුන්ගේ පඤ්චස්කන්ධයෝම තිරිසන් භූමි ප්‍රෙත භූමි සහ අසුර භූමියයි සළකනු ලැබේ. අපාය පටිසන්ධිය ලැබූ මේ තිරිසන් ආදී සතුන් රජ මාළිගය ආදින්හි හෝ වෘක්ෂ, වන, පර්වත, ගඞ්ගා මහා සමුද්‍රාදීන්හි හෝ, කුණු කසල , අසූචියෙහි හෝ වෙසෙතත්, එකම අහේතුක අකුසල විපාක ප්‍රතිසන්ධියකින්ම පිළිසිඳ ගත් සත්ත්වයෝ මය.

සතර අපාය භූමියෙහි වාසය කරන්නාවූ සත්ත්ව ජාතින්ගේ සඞ්ඛ්‍යාව අනන්තය, අප්‍රමාණය, අචින්තිය. උද්ධච්ච සම්ප්‍රයුක්ත අකුසල චිත්තය හැර සෙසු එකොළොස් අකුසල කර්මයන්ගේ ශක්තියෙන්ම අපායෙහි පහළ වන්නාවූ අනෙකප්‍රකාර ශරීර සටහන් ඇත්තා වූ මේ සත්ත්වයන් අතර, සත්සියයක් යොදුන් දිග ඇත්තාවූ ආනන්ද නම් මත්ස්‍යාදී මහත් ආත්මභාව ඇත්තාවූ

සත්ත්වයෝද, මසැසට නොපෙනෙන්නාවූ කුඩා සත්ත්වයෝද, අපාද, ද්විපාද, චතුප්පාද, බහුප්පාද සත්ත්වයෝ ද, ඒ ඒ යොනියට සුදුසු පරිදි උපදනාහුය. එ සත්ත්වයන් ගේ නාම කාය, උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් ද, රූප කාය යෝනියෙන් ද හටගන්නා බැවින් ඒ ඒ යොනියෙහි ඇත්තාවූ ස්වභාවයෙන් ම එ ඒ සත්ත්වයන් ගේ ශරීර සටහන් ආදිය හටගන්නේය. මොවුන්ගේ භවඞ්ග චුති චිත්තයෝ ද එම උපෙක්ඛා සන්තීරණ සිත ම ය. මොවුන් ට ලැබෙන්නා වූ සිත් සත්තිසකි (37) එනම්:—

| | |
|---|---|
| අකුසල් සිත් | 12 |
| හසිතුප්පාදය හැර අහේතුක සිත් | 17 |
| මහා කුසල් සිත් | 8 |
| | 37 |

තවද යම් යම් අපායයන්හි ආයු ප්‍රමාණය සඳහන්වී ඇතත්, එහි උපන්නාවූ සත්ත්වයන්ගේ අකුසල කර්මය යම්තාක් නොගෙවේ නම් , ඒතාක් අපායයෙන් චුත නොවන බව දත යුතුයි. තිරිසන් ආත්මයෙහි උපන්නාවූ සත්ත්වයන් අතර කල්පායුෂ්ක වූ මහා නාගරාජයෝ ද, වැසිකිළි, කුණු කසළ ආදියෙහි උපන්නාවූ සත් දිනකට වඩා ආයුෂ නැත්තා වූ පණු ආදී සත්ත්ව වර්ගයෝ ද ඇත්තාහ.

තවද, සතර අපායෙහි උපදනා සත්ත්වයන් අතුරෙන් නරක යන්හි පහළ වන්නා වූ සත්ත්වයෝ ඕපාපාතිකවම පහළ වන්නාහුය. ඔවුන්ගේ ඕපපාතික ප්‍රතිසන්ධික්ෂණයේදී ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණය හා සමගම **චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, භාව වස්තු** සඞ්ඛ්‍යාත සප්ත දශක රූප කලාප පහළ වෙත්. එයින් ඇතැම් සත්ත්වයන්ට ඇතැම් විටෙක **චක්ඛු, සොත, භාව දශක** පහළ නොවෙත්. **ඝාණ ප්‍රසාදය** නැත්තා වූ නරක වාසි සත්ත්වයෙක් නම් නැත්තේය.

**තිරිසන් යෝනියෙහි** උපදනා සත්ත්වයන් කෙරෙහි **අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඕපපාතික** යන සතර යෝනියටම ඇතුළත් සත්ත්වයෝ ඇත්තාහ.

**ප්‍රෙතයන්** අතර **නිජ්ඣාමතණ්හික** නම් ප්‍රෙත යෝනියෙහි එකම **ඕපපාතික** ප්‍රතිසන්ධියක් ම ලැබෙන්නේය. සෙසු ප්‍රෙතයන් අතර සතර **යෝනියටම** අයත් සත්ත්වයෝ ඇත්තාහ.

නරකයෙහි උපදනා සත්ත්වයන්ගේ කර්මජ තේජෝ ධාතුව අධික හෙයින්, ඕපපාතිකවම මිස, අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ යන යොනිත්‍රය නොලැබෙන්නේය.

## කාම සුගති භූමි

**කාම සුගති භූමි** සත් වැදෑරුම් වේ. එනම්:—

**මනුෂ්‍ය භූමිය**
**චාතුම්මහාරාජිකය**
**තාවතිංසය**
**යාමය**
**තුසිතය**
**නිම්මාණරතිය**
**පරනිම්මිත වසවර්තිය**

**මනුෂ්‍ය භූමි:** පන්සියයක් පමණ කුඩා දිවයින් පිරිවර කොට ඇත්තාවූ **පූර්ව විදේහය, අපරගොයානය, උතුරුකුරු දිවයින, ජම්බුද්වීපය** යන සතර මහාද්වීපයෝ **මනුෂ්‍ය භූමි** නම් වේ. දිව්‍ය භූමියෙහි වසන්නාවූ දේව සමූහයාට පමණ ප්‍රණීත වූ, විශිෂ්ට වූ පඤ්චකාම සම්පතක් නැතත්, උපසම්පද ආදී ශ්‍රෙෂ්ට ශීලයන් රැකීමට අවකාශ ඇති හෙයින්ද, නොයෙක් ගුණයෙන් උතුම් වන හෙයින් ද, අතිශයින් උත්තම වූ **සති, ප්‍රඥ** ආදී අනන්ත ගුණයන්ට පැමිණියාවූ **සම්මා සම්බුද්ධ, පච්චෙකබුද්ධ, අග්‍රශ්‍රාවක, මහා ශ්‍රාවකයන් වහන්සේ ලා** ඇතිවන හෙයින් ද, උත්සන්න වූ සිතක් ඇත්තේය යන අර්ථයෙන් ද මනුෂ්‍ය නම් වන්නේය.

**චාතුම්මහාරාජික භූමිය:** මෙය මනුෂ්‍ය භූමියට දෙසාළිස් දහසක් යොදුන් උස්ව පිහිටා ඇත. එහි නොයෙක් ආකාරයෙන් නොයෙක් තන්හි පිහිටියාවූ නොයෙක් විමානයන්ද ඇත්තා හ.

නොයෙක් පර්වත, ගඞ්ගා, සමුද්‍ර, වෘක්ෂාදිය ආශ්‍රය කොටගෙණ වසන්නාවූ සියළු භූමස්ථ දෙවියෝ ද මේ චාතුම්මහාරාජිකයටම ඇතුළත් වෙති. දුර්වල දුහේතුක කාමාවචර කුසල කර්මයාගේ බලයෙන් අහේතුක කුසල විපාක සන්තීරණ සිතින් පටිසන්ධිය ගත්තාවූ භූමිනිශ්‍රිත **විනිපාතික අසුර** යයි කියන ලද්දවූ ඥාති ප්‍රේත සමූහයා ද, කුසල කර්මානුභාවයෙන්ම උපන් හෙයින් අපායෙහි ඇතුළත් නො කොට හැකි වේ. මනුෂ්‍ය යෝනියෙහි නූපන් හෙයින් මනුෂ්‍ය භූමියටද ඇතුළත් විය නොහැකියි. ඒ හෙයින් ඔවුන් චාතුම්ම හාරාජිකයටම ඇතුළත් කරනු ලැබේ.

තවද, සතරවරම් රජදරුවන්ට ගෞරව කටයුතු හෙයින්ද, සතරවරම් රජදරුවන්ගේ වාසස්ථාන වූ හෙයින් ද **චාතුම්මහාරාජික** නම් වේ.

**තාවතිංසය:** මඝමානවකයා ප්‍රධානකොට ඇත්තාවූ, එක්ව පින් කම් කළාවූ තෙතිස් දෙනාගේ උත්පත්තිස්ථාන වූ හෙයින් **තෙත්තිංස** යයි ද, **තාවතිංස** යයිද, **තව්තිසා** යයි ද ව්‍යවහාර කරණු ලබන මේ දිව්‍ය භූමිය **චාතුම්මහාරාජිකයට** යොදුන් දෙසාළිස් දහසක් උසින් පිහිටා ඇත.

**යාමය:** දුකින් පහවූ ස්ථානය යන අර්ථයෙන් **යාමය** නම් වූ මේ දෙව්ලොව තාවතිංසයට යොදුන් දෙසාළිස් දහසක් උසින් පිහිටා තිබේ.

**තුසිතය:** තමන්ගේ ශ්‍රී සම්පත්තිය කරණකොට ගෙණ ප්‍රීතියට පැමිණියා වූ දෙවියන්ගේ වාසස්ථානය යන අර්ථ ඇති මේ දෙව් ලොව **යාමයට** දෙසාළිස් දහසක් යොදුන් මතුයෙහි පිහිටා තිබේ.

**නිම්මාණරතිය:** තමන් විසින් නිර්මිත කරගන්නා ලද්දවූ ශ්‍රී සම්පත්තියෙහි ඇලෙන හෙයින් එහි වසන දෙවියෝ **නිම්මාණරති** නම් වෙත්. මේ **නිම්මාණරතිය** නම් දෙව්ලොව තුසිතයට යොදුන් **දෙසාළිස්** දහසක් මතුයෙහි පිහිටා ඇත.

**පරනිම්මිත වසවත්තිය**: අනුන් විසින් නිර්මිත කරණ ලද්ද වූ ශ්‍රී සම්පත්තිය තමාගේ වසඟයට පමුණුවාගෙණ වසන හෙයින් **පරනිම්මිත වසවත්ති** නම් වේ.

මේ මනුෂ්‍ය ලොකයත්, සදෙව්ලොවත් යන සප්ත භූමීහු, නොයෙක් සම්පත්තියට ආධාර ස්ථාන වූ හෙයින් ද, සොභන නම් වූ කාමාවචර මහා කුසල කර්මයන්ගේ හේතුවෙන් පැමිණිය යුතු හෙවත් පටිසන්ධිය ලැබිය යුතු හෙයින් ද, කාම සුගතිය යයි නම් ලැබේ.

මේ සප්ත කාම සුගති භූමි අතුරෙන් **මනුෂ්‍ය භූමිය** සහ **චාතුම්ම හාරාජික භූමිය** යන භූමි දෙකෙහි දුගති අහේතුක පුද්ගලයා හැර අන්‍යවූ එකොළොස් පුද්ගල කෙනෙක් පහළ වන්නාහ. එනම්:— සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන යන තිදෙනා ද, ආර්‍ය්‍ය පුද්ගල අටදෙනා ද වෙත්.

ජාත්‍යන්ධාදී අඞ්ග විකලත්වය ඇතිව උපදනා සත්ත්වයන්ට ද, විනිපාතික අසුරයන්ට ද, අහේතුක කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තය පටිසන්ධි, භවඞ්ග, චුති වශයෙන් එම භවයේදීම හටගන්නේ ය. කාමාවචර මහා කුසල් සිත් අටේ හේතුවෙන් ලබන්නාවූ මහා විපාකයෝ අටදෙනා, සප්ත කාම භූමියෙහිම පටිසන්ධි භවඞ්ග චුති වශයෙන් පහළ වී නොයෙක් සැප සම්පත් සාද දෙන්නාහ.

කාම සුගතියෙහි උපදින්නාවූ පළමු කියන ලද පුද්ගලයන් එකොළොස්දෙනා අතුරෙන් **සුගති අහේතුක පුද්ගලයාහට, දෙළොස් අකුසල චිත්තය, හසිතුප්පාද ය හැර ඉතිරි අහේතුක සතොළොසය, මහා කුසල් අටය, ඤාණවිප්‍රයුක්ත මහා විපාක සතරය** යන එක්සා ළිස් සිත් ලැබෙන්නාහ.

**ද්විහේතුක පුද්ගලයා** හට ද එම සිත් එක්සාළිසම ලැබේ.

**ත්‍රිහේතුක පුද්ගලයන් අතුරෙන්** ධ්‍යාන නොලැබූ **ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා හට, දෙළොස් අකුසල් සිත්ය, හසිතුප්පාදය හැර ඉතිරි අහේතුක සතොළොසය, මහා කුසල් අටය, මහා විපාක අටය** යන පන්සාළිස් සිත් ලැබෙන්නාහ.

ධ්‍යාන ලාභී ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා හට වනාහි **ඉහත සඳහන් පන්සාළිස් චිත්තයන් හා මහග්ගත කුසල් නවයද යන සිත් සූපනස (51) ලැබේ.**

මේ ක්‍රමයෙන් **ශුෂ්ක විදර්ශක සොතාපත්ති ඵලස්ථ පුද්ගලයා** හට සිත් එක්සාළිසක් ද, **සමථයානික සොතාපත්ති පුද්ගලයාහට සිත්** පනසක්ද, ශුෂ්ක විදර්ශක **සකෘදගාමි ඵලස්ථ පුද්ගලයා හට** එක්සාළිස් සිත් කෙනෙක් ද, **සමථයානික සකෘදගාමි පුද්ගලයා හට** පනස් සිත් කෙනෙක් ද, **ශුෂ්ක විදර්ශක අනාගාමි ඵලස්ථ පුදගලයා** හට එකුන්සාළිස් (39) සිත් කෙනෙක් ද **සමථයානික අනාගාමි ඵලස්ථ පුද්ගලයා හට** අටසාළිස් (48) සිත් කෙනෙක් ද, **ශුෂ්ක විදර්ෂක අර්හත් ඵලස්ථ පුද්ගලයාහට** පන්තිස් චිත්තයෙක් ද, **සමථයානික අර්හත් ඵලස්ථ පුද්ගලයාහට** සූසාළිස් (44) සිත් කෙනෙක්ද ලැබෙන්නාහ.

මේ දෙළොස් පුද්ගලයන් අතුරෙන් සතර මාර්ගස්ථ පුද්ගලයන් හට තම තමන්ගේ මාර්ග සිත පමණක් ලැබෙන බව දත යුතුයි. මාර්ගස්ථ පුද්ගලයා යයි කී කල්හි මාර්ගක්ෂණයෙහි සිටි පුද්ගලයා ගතයුතුයි. මාර්ගක්ෂණයට අනතුරුව අතරක් නැතිව ඵල සිත පහළවන බැවින්, මාර්ගස්ථ පුද්ගලයෙක් ඇසට හමු නොවේ. ඇසට හමුවන්නේ ඵලස්ථයා ම ය.

මාර්ගස්ථ පුද්ගලයා හට දන් දෙනු කැමැත්තේ නම් මාර්ගයටය පැමිණි අවස්ථාවේදී දන් දිය නොහැකි වේ. නමුත් යමෙක් මස්තකප්‍රාප්ත විදර්ශනා ඇති යොගාවචරයා හට නිරන්තරයෙන් දන් දෙන්නේවී නම් ඔහුගේ දනය වළඳා භාවනා වඩන්නාවූ කල්හි මාර්ගය ප්‍රත්‍යක්ෂ කෙළේවීනම් ඒ මාර්ගස්ථයා හට දන් දුන්නේ නම් වන්නේය.

තවද මේ මාර්ග ඵලස්ථ පුද්ගලයන් අතුරෙන් සමථයානික සොවාන් පුද්ගල තෙමේ, ඉදින් මේ භවයේදීම ඉතිරි මාර්ගඵල නොලබන්නේ නම් කාම භවයෙහි එක් වරක්වත් පටිසන්ධි නොගෙණ රූපාරූප භූමියෙහි හෝ රහත්ව හෝ නිවන් දක්නේය. එසේ හෙයින් සමථයානික සෝවන් පුද්ගලයාගේ ප්‍රභෙද නැත්තේය.

ශුෂ්ක විදර්ශක සොවාන් පුද්ගලයෝ වනාහි ත්‍රිවිධාකාර වෙත්. එනම්:—

1. **එකබීජ සොතාපන්න පුද්ගලයා ය.**
2. **කොලංකොල සොතාපන්න පුද්ගලයා ය.**
3. **සත්තක්ඛත්තු පරම සොතාපන්න පුද්ගලයා ය.**

සොවාන් වීමට අනතුරුව මේ මනුෂ්‍ය ලොකයෙහි හෝ දිව්‍ය ලොකයෙහි හෝ එක්වරක්ම පටිසන්ධි ගෙණ ඒ අනතුරු අත් බැව්හිම රහත්ව නිවන් දක්නා පුද්ගලතෙමේ එකම ප්‍රතිසන්ධි බීජයක් ඇති පුද්ගලයෙක් හෙයින් **ඒකබීජ සොතාපන්න පුදගලයා නම්** වන්නේය.

සොවාන් වීමට අනතුරුව මේ මනුෂ්‍ය භූමියෙහි හෝ දිව්‍ය ලොකයන්හි හෝ දෙව් මිනිස් දෙගතියෙහි හෝ සයවර දක්වා පටිසන්ධි ගෙණ, සවෙනි ආත්මභාවයේදී අර්හත් ඵලය ලබා නිවන් දක්නා පුද්ගලතෙමේ **කොලංකොල සොතාපන්න පුද්ගලයා** නම් වන්නේය.

සොවාන් ඵලයට පැමිණීමට අනතුරුව දෙව් මිනිස් දෙගති-යෙහි සත්වරක් පටිසන්ධි ගෙණ, සත්වෙනි අත්බැව්හි රහත්ව නිවන් දක්නා පුද්ගල තෙමේ **සත්තක්ඛත්තු පරම සොතාපන්න පුද්ගලයා** නම් වන්නේය. සොවාන් ඵලස්ථ පුද්ගලයා හට කාම භවයෙහි අට වැනි උත්පත්තියක් නම් නැත්තේය. නමුත් මනුෂ්‍ය ලොකයෙහි සොවාන් ඵලයට පැමිණ ප්‍රථමධ්‍යානය උපදවාගෙණ බ්‍රහ්මපාරිෂද්‍ය නම් බඹලොව ඉපිද, ක්‍රමයෙන් ඉතිරි බ්‍රහ්ම ලෝක වලද උත්පත්තිය ලබා අනාගාමීව, පඤ්චසුද්ධාවාස බ්‍රහ්ම ලෝක යන්හි ක්‍රමයෙන් ඉපිද, අකණිට්ඨ බඹලොව දී රහත්ව පිරිනිවන් පානට ද හැකි වේ.

**සකෘදගාමි** ඵලස්ථ **පුදගලයන්** අතුරෙන් **සමථයානික** පුද්ගල තෙමේ මනුෂ්‍ය ලොකයෙහි හෝ දිව්‍ය ලොකයෙහි හෝ එක්වරක්වත් පිළිසිඳ නොගෙණ, කැමැතිනම් ඒ භවයේදී රහත්ව නිවන් දැකීමට

හෝ රූපාරූප භූමියෙහි හෝ ඉපිද එහිදී රහත් වන්නට හෝ සමත් වේ. එබැවින් මේ පුද්ගලයාගේ ප්‍රභෙදයක් නම් නැත්තේය.

**ශුෂ්කවිදර්ශක සකෘදගාමි ඵලස්ථ පුද්ගලයන්** අතුරෙන්—

1. මේ මනුෂ්‍ය භූමියේදීම සකෘදගාමි ඵලයට පැමිණ මෙහිදීම අර්හත් ඵලය ලබන්නාවූ එක් පුද්ගලයෙක් ද,

2. දිව්‍යලෝකයේදී සකෘදගාමීව දිව්‍ය ලෝකයෙහිදීම රහත්ව නිවන් දක්නා එක් පුද්ගලයෙක් ද,

3. මනුෂ්‍ය ලෝකයේදී සකෘදගාමි ඵලයට පැමිණ එක් වරක් දිව්‍යලෝකයෙහි පටිසන්ධි ගෙණ එහිදී රහත්ව නිවන් දක්නා එක් පුද්ගලයෙක් ද,

4. දෙව්ලොවදී සකෘදගාමි ඵලයට පැමිණ නැවත එක් වරක් මිනිස් ලොව ඉපිද රහත්ව නිවන් දක්නා එක් පුද්ගලයෙක් ද,

5. මිනිස් ලොවදී සකෘදගාමි ඵලයට පැමණ, දෙව්ලොවෙහි එක්වරක් ඉපිද, එයින් චුතව නැවත මිනිස් ලොව ඉපිද රහත්ව නිවන් දක්නා එක් පුද්ගලයෙක්ද යි ශුෂ්කවිද්ර්ශක සකෘදගාමි පුද්ගලයෝ පස්දෙනෙක්ම වන්නාහ.

**අනාගාමි ඵලස්ථ පුද්ගලයන්** අතුරෙන් **සමථයානික** අනාගාමි පුද්ගලතෙමේ දෙව් මිනිස් ලොව එක් වරක් වත් ප්‍රතිසන්ධි නොගෙණ මේ භවයේදී රහත්ව නිවන් දැකීම හෝ රූපාරූප භූමියට පැමිණ රහත්වීම හෝ සිදුකර ගන්නේය. එහෙයින් මේ පුද්ගලයාගේ ප්‍රභෙදයක් නම් නැත්තේය.

**ශුෂ්ක විදර්ශක අනාගාමි පුද්ගලයන්** අතුරෙන්—

1. **අන්තර පරිනිබ්බායි නම් පුද්ගලතෙමේ,** පඤ්ච සුද්ධාවාස යන් අතුරෙන් යම් භූමියක පිළිසිඳගෙණ එහි නියමිත ආයු නොවළඳා පූර්වභාගයේදීම රහත්ව නිවන් දක්නේය.

2. **උපහච්චපරිනිබ්බායී නම් පුද්ගලතෙමේ,** සුද්ධාවාසයෙක්හි ඉපිද එහි ආයු කෙළවරදී රහත්ව නිවන් දක්නේය.

3. **අසංඛාර පරිනිබ්බායි නම් පුද්ගල තෙමේ,** සුද්ධාවාස යෙක්හි ඉපිද විදසුන් වැඩීමෙහි උත්සාහවත් නොවී රහත්ව නිවන් දක්නේය.

4. **සසංඛාර පරිනිබ්බායි නම් පුද්ගල තෙමේ,** සුද්ධාවාසයෙක්හි ඉපිද විදසුන් වැඩීමෙහි උත්සාහවත්වී රහත් බැව් ලබා නිවන් දක්නේය.

5. **උද්ධංසෝත අකණිට්ඨගාමී පුද්ගල තෙමේ,** කාම භවයෙන් එතරව **අවිහ** නම් සුද්ධාවාස භූමියෙහි ඉපිද එහි කැමැතිතාක් කල් වැස, **අතප්ප, සුදස්ස, සුදස්සී, අකණිට්ඨ** යන සතර සුද්ධාවාස තලයන් හිද ක්‍රමයෙන් ඉපිද, අකණිට්ඨ බඹලෙව්හිදී රහත්ව නිවන් දක්නේය.

මෙසේ ශුෂ්කවිදර්ශක අනාගාමි පුද්ගලයෝ පස්දෙනෙක් වෙති.

අර්හත් ඵලස්ථ පුද්ගලයෝ **සමථයානික, ශුෂ්කවිදර්ශක** යයි දෙවැදෑරුම් වුවත්, සියළු කෙලෙසුන් නැසූ හෙයින් එම භව යෙන් චුතව අන් භවයක ප්‍රතිසන්ධි ගැණීමක් නැති හෙයින් ඒ දෙදෙනා වහන්සේගේ විශෙෂයක් නම් නැත්තේය.

### සප්තකාම භූමියෙහි ආයු පරිච්ඡේදය

**මනුෂ්‍යයන්** හට ඇතැම් කලෙක්හි උත්කෘෂ්ට වශයෙන් ආයු අසඞ්ඛ්‍යයක් ද, යටත්පිරිසෙයින් දස වසක්ද වන හෙයින් මනුෂ්‍ය යන් හට නියම වූ ආයු පරිච්ඡෙදයක් නැත්තේමය.

**භූමාට දෙවියන්ද** කුසල කර්මය නොගෙවෙන තාක් කල් ඒ දිව්‍ය ආත්මයෙන් චුතවීමක් නැත්තේය. ඇතැම් **භූමාට දෙවියෝ** සත් දවසක් පමණද, ඇතැම් දෙවියෝ කල්පයක් පමණද ජීවත් වන හෙයින් භූමාට දෙවියන්ට ද නියම ආයු පරිච්ඡෙදයක් නැත්තේය.

**චාතුම්මහාරාජිකයට** දිව්‍ය ආයු ප්‍රමාණයෙන් අවුරුදු පන්සියයකි. මිනිස් ගණනින් අවුරුදු පනසක් එහි එක් දවසෙකි. තිස්දිනක් එක මසෙකි. දෙළොස් මසක් එක් හවුරුද්දෙකි. එවිට චාතුම්මහාරාජික දෙවියන්ට මිනිස් ගණනින් අවුරුදු අනූ ලක්ෂයක් ආයු වන්නේය.

**තව්තිසා දෙව්ලොව** වැසි දෙවියන් හට මිනිස් ගණනින් අවුරුදු සියයක් එහි එක් දිනයකි. මේ ගණනින් අවුරුදු දහසක් එහි ආයුෂ වේ. එවිට මිනිස් ගණනින් තුන්කෝටි සැට ලක්ෂයක් අවුරුදු තව්තිසා වැසි දෙවියන්ට ආයු වන්නේය.

**යාම දෙව්ලොව** වාසි දෙවියන් හට මිනිස් ගණනින් දෙසිය වසක් එහි එක් දිනයකි. ඒ ගණනින් අවුරුදු දෙදහසක් එහි ආයුෂ වේ. එවිට මිනිස් ගණනින් තුදුස්කොටි සතලිස් ලක්ෂයක් අවුරුදු එහි ආයුෂ වන්නේය.

**තුසිත දිව්‍ය ලොකයෙහි** වැසි දෙවියන්හට මිනිස් ගණනින් අවුරුදු සාරසියයක් එහි එක් දවසකි. ඒ ගණනින් සාරදහසක් අවුරුදු එහි ආයුෂ වේ. මිනිස් ගණනින් අවුරුදු සත්පණස් කොටි සැට ලක්ෂයකි.

**නිම්මාණරති** නම් දිව්‍යලොක වාසී දෙවියන්හට මනුෂ්‍ය ගණනින් අටසීයයක් අවුරුදු එහි එක් දිනයකි. එම ගණනින් අට දහසක් අවුරුදු නිම්මාණරතී දෙවියන්ගේ ආයුෂ වන්නේය. එය මනුෂ්‍ය ගණනින් අවුරුදු දෙසිය තිස්කෝටි සතළිස් ලක්ෂයක් වේ.

**පරනිම්මිත වසවත්ති** දෙව්ලොව වැසි දෙවියනට මිනිස් ගණනින් අවුරුදු එක්දහස් සසියයක් එහි එක් දවසකි. එම ගණනින් පරනිම්මිත වසවත්ති දෙවියන්ගේ ආයුෂ අවුරුදු සොළොස් දහසකි. මනුෂ්‍ය ගණනින් එය නවසිය එක්විසි කෙළ සැටලක්ෂයක් අවුරුදු වෙත්.

## රූපාවචර භූමි

**රූපාවචර ධ්‍යානයෝ** චතුෂ්කනයින් ගෙණ එහි පටිසන්ධි විපාක වශයෙන් සොළොස් රූපාවචර භූමි සතර කොටසකට බෙද දක්වනු ලැබේ.

**බ්‍රහ්ම පාරිෂද්‍යය, බ්‍රහ්ම පුරොහිතය, මහා බ්‍රහ්මය** යන භූමි ත්‍රය **ප්‍රථමධ්‍යාන භූමි** නම් වේ.

**පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර** යන භූමි ත්‍රය **ද්‍විතියධ්‍යාන භූමි** නම් වේ.

**පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්හක** යන භූමි ත්‍රය **තතියධ්‍යාන භූමි** නම් වේ.

**වෙහප්ඵලය, අසංඥසත්වය** යන භූමි දෙක හා **අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි, අකණිට්ඨ** යන පඤ්ච සුද්ධාවාස භූමි යන භූමි සත **චතුර්ථධ්‍යාන භූමි** නම් වේ.

මෙයින් **ප්‍රථමධ්‍යාන භූමි ත්‍රය** පරනිම්මිත වසවත්ති දිව්‍යලොක යෙන් මත්තෙහි පණස්පන්ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි ආකාශයෙහි සමතලයෙහි පිහිටා තිබේ.

**ද්‍විතියධ්‍යාන භූමි ත්‍රය** ප්‍රථමධ්‍යාන භූමිය මත්තෙහි පණස්පන් ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි ආකාශයෙහි සමතලයෙහි පිහිටියේය.

**තතියධ්‍යාන භූමි ත්‍රය** ද්‍විතියධ්‍යාන භූමිය මත්තෙහි පණස් පන්ලක්ෂ අට දහසක් යොදුන් ගිය තන්හි ආකාශයෙහි සමතලයෙහි පිහිටියේය.

තතියධ්‍යාන භූමි ත්‍රයෙන් මත්තෙහි පණස්පන්ලක්ෂ අටදහසක් යොදුන් ගියතන්හි **වෙහප්ඵලය, අසංඥසත්වය** යන භූමිද්වය සමතල ආකාශයෙහි පිහිටා සිටියේය.

**වෙහප්ඵලය** මත්තෙහි පණස්පන්ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි **අවිහ භූමියද,** අවිහ භූමියෙන් එපමණ මත්තෙහි **අතප්ප භූමියද,** අතප්ප භූමියෙන් එපමණ මත්තෙහි **සුදස්ස භූමියද, සුදස්ස භූමියෙන්** එපමණ මත්තෙහි **සුදස්සී භූමියද,** සුදස්සී භූමියෙන් එපමණ මත්තෙහි **අකනිට්ඨා භූමියද** පිහිටියේ වෙයි.

මේ සොළොස් රූපාවචර භූමියෙහි වාසය කරන්නාවූ සත්ත්වයන් අතුරෙන් **මහාබ්‍රහ්මයන්ගේ** උපස්ථායක පිරිසෙහි හටගත් බැවින් බ්‍රහමපාරිසජ්ජ නම් බ්‍රහ්මයන්ගේ වාස භූමිය **බ්‍රහ්මපාරිෂද්‍යය** නම් වේ.

ඒ මහා බ්‍රහ්මයන්ගේ අමාත්‍යස්ථානයෙහි සිටින පුරොහිත බ්‍රහ්මයන්ගේ වාසස්ථානය බ්‍රහ්ම පුරොහිත නම් වේ.

ධ්‍යානාදි ගුණ කරණකොටගෙණ අභිවෘද්ධියටත්, වර්ණවත් බවටත්, දීර්ඝායුෂ්ක බවටත් පත්ව, බ්‍රහ්මපාරිෂද්‍යාදීන්ට වඩා මහත්වූ බැවින් **මහාබ්‍රහ්ම** යයි නම් ලත් බ්‍රහ්මයන්ගේ වාසස්ථානය **මහාබ්‍රහ්ම** නම් වේ.

මොවුන් අතුරෙන් මනුෂ්‍ය ලෝකයේදී ප්‍රථමධ්‍යාන මාත්‍රයක් ලබා දැහැනින් නොපිරිහී ගොස් උපදින පුද්ගලයෝ **බ්‍රහ්මපාරිෂද්‍යයෙහි ද**, ප්‍රථමධ්‍යානය ආවර්ජනාදී කීප ආකාරයකින් වසීභූත කොට ගත් පුද්ගලයෝ **බ්‍රහ්ම පුරොහිතයෙහි ද**, ප්‍රථමධ්‍යානය පඤ්චවසිතාවෙන් පුරුදු කළාවූ පුද්ගලයෝ **මහාබ්‍රහ්ම තලයෙහි ද** උපදිත්.

මේ තුන් තලයෙහි උපදනා බ්‍රහ්මයෝ එකම රූපාවචර ප්‍රථම ධ්‍යාන විපාක සිතින් ප්‍රතිසන්ධිය ගෙණ එම සිතම ඔවුන්ට භවඞ්ග, චුති චිත්තයන් වශයෙන් එම භවයේදී පහළ වන්නේය.

මෙසේ ස්වල්ප වූ ආලෝකය ඇති බ්‍රහ්මයෝ **පරිත්තාභ** නම් බඹලොවද, ප්‍රමාණ රහිත ආලොක ඇති බ්‍රහ්මයෝ **අප්පමාණාභ** බඹලොවෙහි ද, වලාපටලයකින් නික්මෙන්නාවූ විදුලියක්මෙන් සප්‍රීතික ධ්‍යානයෙන් හටගත්තාවූ ස්කන්ධයන් ඇතිව, ශරීරප්‍රභාවය ඔබ්මොබ නික්මෙන්නාවූ බ්‍රහ්මයෝ **ආභස්සර** බඹලෙව්හි ද උපදනාහු වෙත්. මේ සමාන තලත්‍රය උතුම් ආලොකයෙන් බබලන්නේය. ද්‍රුතියධ්‍යාන චිත්තය සහ තතියධ්‍යාන චිත්තයද, පරිත්ත, මධ්‍යම උත්කෘෂ්ට වශයෙන් උපදවා ගත්තාවූ ධ්‍යාන ලාභී පුද්ගලයන් හට මේ **බ්‍රහ්ම ලොක** තුනෙහි සයාකාරයකින් ද්‍රුතිය, තතිය ධ්‍යාන විපාක චිත්තයන් පටිසන්ධි, භවඞ්ග, චුති වශයෙන් හටගනිත්.

තතිය ධ්‍යාන භූමි අතුරෙන් **පරිත්ත සුභ** නම් බඹලොව, **සුභ** සඞ්ඛ්‍යාත ශරීර ස්වභාවය පරිත්ත වශයෙන් ඇති බ්‍රහ්මයන්ගේ භූමිය වශයෙන් ද, එම ශරීර ස්වභාවය අප්‍රමාණ වශයෙන් ඇති බ්‍රහ්මයන්ගේ වාසස්ථානය **අප්පමාණ සුභ** යයි ද, ප්‍රභා සමූහය සඞ්ඛ්‍යාත ශොභාවෙන් ගැවසීගත් හෙයින් **සුභ කිණ්හ** නම් වූ බ්‍රහ්මයන්ගේ වාසස්ථානය **සුභ කිණ්හ** යයි ද ව්‍යවහාර වේ. මේ බ්‍රහ්මයන් ගේ ශරීරය උතුම් වූ ප්‍රභාවෙන් බබලන්නේය. චතුර්ථධ්‍යාන චිත්තය හීන, මධ්‍යම, උත්කෘෂ්ට වශයෙන් වැඩුවාවූ බ්‍රහ්මයෝ මේ සමාන තලයන්හි හෙවත් තතිය ධ්‍යාන භූමිත්‍රයෙහි චතුර්ථධ්‍යාන විපාක සිතින් පටිසන්ධි ගෙණ ඒ සිතම ඔවුන්ගේ භවඞ්ග, චුති චිත්තයන් වශයෙන් පහළ වන්නේය.

ධ්‍යානානුභාවයෙන් හටගත්තාවූ, අනෙකප්‍රකාර විපාක ඵල ඇති බ්‍රහ්මයන්ගේ භූමිය **වේහප්ඵල** නම් වේ.

සංඥා විරාග භාවනා වශයෙන් හටගත්තාවූ රූපකලාප මාත්‍ර යක් ඇති බැවින්ද, සතර අරූප හෙවත් සතර නාමස්කන්ධයක් නැති හෙයින්ද **අසංඥසත්ත** නම් වේ.

වේහප්ඵලය වනාහි ආයෳී වූ ද, අනායෳී වූ ද, පඤ්චම ධ්‍යාන ලාභී පුද්ගලයන් උපදින භූමියකි. එහි පටිසන්ධි, භවඞ්ග චුති වශයෙන් උපදින්නේ පඤ්චමධ්‍යාන විපාක සිතමය. මෙයින් අසංඥසත්වයෙහි උපදනා සත්ත්වයෝ සංඥාවෙහි නො ඇලී වායෝ කසිණය වඩා පඤ්චමධ්‍යානය ලබා එහි විපාක ශක්තියෙන් උපදවන ලද්දවූ ජීවිත නවක රූපකලාප සමූහයක් වශයෙන් මහාකල්ප පන්සියයක් මුළුල්ලෙහි සන්තතිය නො සිඳී පැවත නිරුද්ධ වන් නාහ.

පඤ්ච සුද්ධාවාය භූමි අතුරෙන් **අවිහ** යනු මඳ කලෙකින් අත්නොහරින භූමියක්ය යන අර්ථ ඇති ප්‍රථම සුද්ධාවාස භූමිය වේ.

දෙවෙනි සුද්ධාවාස භූමිය නම්, යම් කිසිවකින් නො තැවෙන යන අර්ථ ඇති **අතප්ප** නම් භූමිය යි.

තුන්වන තලය වැසි බ්‍රහ්මයෝ අතිශයින් සිත්කලු රූප ඇති **බැවින්** ද, සුවසේ දක්කයුතු බැවින් ද **සුදස්ස** නම් වෙත්.

සතරවන තලය වැසි බ්‍රහ්මයෝ වනාහී අතිශයින් පවිත්‍රවූ චක්ෂුර්විඥාන ඇති හෙයින්ද, රූපාලම්බණය සුවසේ දක්නාසුළු හෙයින්ද, **සුදස්සි** නම් වෙත්.

පස්වන තලයෙහි වැසි බ්‍රහ්මයෝ අතිශයින් උත්කෘෂ්ට සම්පත්ති ඇති හෙයින් ද, අන්‍ය බ්‍රහ්මයින්ට බාල බවෙක් නැති හෙයින්ද **අකණිට්ඨ** නම් වෙත්.

මේ භූමි පස, කෙලෙසුන් කෙරෙන් පවිත්‍ර වූ අනාගාමී රහතුන්ගේ වාසභූමි වන හෙයින් **සුද්ධාවාස** නම් වේ. අනාගාමී ආර්‍ය්‍යයෝම පඤ්චමධ්‍යාන විපාක සිතින් මේ පඤ්ච සුද්ධාවාසයන්හි උපදනා හෙයින්, ඒ බ්‍රහ්මයන්ගේ භවඞ්ගසිතත්, චුති සිතත් එයම වන්නේය. මේ ආර්‍ය්‍ය පුද්ගලයන් හට සුද්ධාවාස භූමියෙන් පිටත වාසයක් නැත්තේය. එහිදීම රහත්ව පිරිනිවන් පානාහු වෙති.

රූපාවචර බ්‍රහ්ම ලෝකයන්හි ත්‍රිහේතුක පෘථග්ජනයා සහ ආර්‍ය්‍ය පුද්ගලයෝ අටදෙනා ද යන පුද්ගලයන් නවදෙනෙක් දක්නා ලැබේ. එයින් ත්‍රිහේතුක පෘථග්ජනයා හට සිත් තෙසාළිසක් ද, සොවාන්, සකෘදගාමී, අනාගාමී පුද්ගලයන් හට එකුන්සාළිස් (39) සිත් කෙනෙක් ද, රහතන් වහන්සේට පන්තිස් (35) සිත් කෙනෙක් ද පහළ වෙත්.

අසංඥ තලයෙහි එකම සිතක්වත් නැත. එහි කම්ම සමුට්ඨාන ජීවිත නවක කලාපයෙන් පටිසන්ධි ගෙණ, සෘතු සමුට්ඨාන සුද්ධාෂ්ඨක කලාපයෙන් හා ලඝුතාදී ඒකාදසක කලාප යන රූප කලාප තුන්දෙන සන්තති වශයෙන් මහා කල්ප පන්සියයක් පවත්නාහ.

පඤ්ච සුද්ධාවාසයන්හි **අනාගාමි ඵලස්ථයා ය, අර්හත් මාර්ගස්ථයා ය අර්හත් ඵලස්ථයා ය** යන පුද්ගලයන් තුන් දෙනා දක්නා ලැබේ.

## සොළොස් රූපාවචර භූමියෙහි ආයු පරිච්ඡේදය

**1. ප්‍රථමධ්‍යාන භූමි**

| | | |
|---|---|---|
| බ්‍රහ්ම පාරිෂද්‍යය | — | අසඞ්ඛ්‍ය කල්ප ⅓ |
| බ්‍රහ්ම පුරෝහිතය | — | අසඞ්ඛ්‍ය කල්ප ½ |
| මහාබ්‍රහ්මය | — | අසඞ්ඛ්‍ය කල්ප 1 |

**2. ද්විතියධ්‍යාන භූමි**

| | | |
|---|---|---|
| පරිත්තාභ | — | මහා කල්ප 2 |
| අප්පමාණාභ | — | මහා කල්ප 4 |
| ආභස්සර | — | මහාකල්ප 7 + අසඞ්ඛ්‍ය කල්ප ½ |

**3. තතියධ්‍යාන භූමි**

| | | |
|---|---|---|
| පරිත්ත සුභ | — | මහාකල්ප 16 |
| අප්පමාණ සුභ | — | මහා කල්ප 32 |
| සුභ කිණ්හ | — | මහාකල්ප 63+ අසඞ්ඛ්‍යකල්ප ½ |

**4. චතුර්ථ ධ්‍යාන භූමි**

| | | |
|---|---|---|
| වෙහප්ඵලය | — | මහා කල්ප 500 |
| අසංඥසත්තය | — | මහා කල්ප 500 |

**5. පඤ්ච සුද්ධාවාස භූමි**

| | | |
|---|---|---|
| අවිහ | — | මහා කල්ප 1000 |
| අතප්ප | — | මහා කල්ප 2000 |
| සුදස්ස | — | මහා කල්ප 4000 |
| සුදස්සි | — | මහා කල්ප 8000 |
| අකණිට්ඨ | — | මහා කල්ප 16000 |

මෙහි දක්වන ලද අසඞ්ඛ්‍ය කල්ප මහා කල්පාදීන්ගේ විස්තර මෙසේ දත යුතුයි.

දිගින් යොදුනක් ද, පුලුලින් යොදුනක්ද, ඝනයෙන් යොදුනක්ද පමණ ඇති කොටුවෙක්හි අබ ඇට පුරවා අවුරුදු සියයකට වරක් එක් අබ ඇටය බැගින් ඉවත් කිරීමෙන්, යම් කලෙක ඒ කොටුව හිස් වන්නේවී නමුත්, අවුරුදු ගණන නොගෙවෙන්නාවූ කල්පය **එක් අසඞ්ඛ්‍ය කල්පයක්** නම් වෙයි. මෙවැනි අසඞ්ඛ්‍ය කල්ප සත රක් එක් මහා **කල්පයෙකි.**

තවද, **අන්තර කල්ප** සූ සැටක් (64) එක් **අසඞ්ඛ්‍ය කල්පයෙකි.** මේ මිනිස් ලොව කලින් කල විනාශයට පත් වන්නේය. එසේ ලෝක විනාශ වීමේදී අවි ආයුධ වලින් විනාශ වන අන්තර කල්පයට **සත්ථන්තර කල්පය** යයිද, දුර්භික්ෂයෙන් විනාශවන අන්තර කල්ප යට **දුබ්භික්ඛන්තර කල්පය** යයිද, රෝගයෙන් විනාශ වන අන්තර කල්පයට **රොගාන්තර කල්පය** යයි ද අන්තර කල්ප තුන් ආකාර යෙකි. මෙසේ ලොක විනාශය වන කල්හි මිනිස් ලොව පරමායුෂය අවුරුදු (10) දසයක් පමණ වන්නේය. ලෝක විනාශය ගැන කලින් අසා දැන, එයින් මිදෙනු කැමැති පිනැතියන් ගල් ගුහා ආදියෙහි සැඟවී සිට, ලෝක විනාශයෙන් පසු නැවත ලොව බල-නුයේ, විනාශයට පත්වූ නෑ මිතුරු ආදී සත්ත්වයන් දැක, අකුසල කර්ම විපාක සිහි කරමින් සංවේගයට පත්ව, පාපයට භයවී එයින් වැළකීම සඳහා ගුණදම් වැඩීමට පටන් ගන්නේය. මෙසේ ගුණදම් වැඩීමේ හේතුවෙන් ක්‍රමයෙන් ආයු වැඩෙමින් විසි අවුරුදු තිස් අවුරුදු සතළිස් අවුරුදු යනාදී වශයෙන් සියය, දහස, ලක්ෂය, කෝටිය, අසඞ්ඛ්‍යය දක්වා වැඩෙන්නේය. මෙසේ දීර්ඝායු වළඳමින්, සම්පත්තියෙන් මත්වූ සත්ත්වයන්ට ජරා මරණාදිය නොදැනීම හේතුකොට ගෙණ අධර්ම සමාදනයෙන් හැසිරීමට පටන් ගත් තැන් පටන් ආයුෂය ක්‍රමයෙන් පිරිහෙන්නට පටන් ගන්නේය. මෙසේ ආයු පිරිහෙමින් බොහෝ දීර්ඝ කාලයක් ගතවී පළමු කී පරිදි දස වර්ෂායුෂ්ක බවට පත්වූ කල්හි නැවතත් ලොක විනාශයක් ඇති වන්නේය. එම ලෝක විනාශයට පසු නැවතත් ඉහත දැක්වූ පරිද්-දෙන් ආයුෂය ක්‍රමයෙන් අසඞ්ඛ්‍යය දක්වා වැඩෙන්නේය. මෙසේ දස අවුරුද්ද සිට අසඞ්ඛ්‍යය දක්වාද, අසඞ්ඛ්‍යය සිට නැවතත් දස අවුරුද්ද දක්වාද ආයු වැඩීම සහ පිරිහීම ඇති වේ. මෙහි දක්වන ලද දස වර්ෂායුෂ්ක සත්ත්වයන්ගේ විනාශ දෙකකට අතර කාලය **එක් අන්තර කල්පයෙකි.** එවැනි **අන්තර කල්ප** සූ සැටක් (64) එක්

**අසඞ්ඛ්‍ය කල්පයකි**. මෙවැනි **අසඞ්ඛ්‍ය කල්ප** සතරක් එක් **මහා කල්පයකි. මේ අසඞ්ඛ්‍ය කල්ප** සතරට **සංවට්ට කල්පය, සංවට්ටට්ඨායි කල්පය, විවට්ට කල්පය, විවට්ටට්ඨායි කල්පය** යයි නම් කරුණු ලැබේ.

මොවුන් අතුරෙන් **කල්ප විනාශක මහා මේඝය** පටන් **කල්ප විනාශක මහා ගින්න** නිවීම දක්වා ලොව විනාශ වෙමින් **පවත්නා** කාලය **සංවට්ට අසඞ්ඛ්‍ය කල්ප** නමි. **කල්ප විනාශක මහා ගින්න** නිවීම පටන් කෙළ ලක්ෂයක් සක්වල ඇතිවන **සම්පත්තිකර මහා මේඝය** දක්වා විනාශ වී පවත්නා කාලය **සංවට්ටට්ඨායි අසඞ්ඛ්‍ය කල්ප** නමි. **සම්පත්ති කර මහා මේඝය** පටන් **චන්ද්‍ර සූර්‍ය්‍යාදීන්ගේ උදවීම** දක්වා ලොකය නැවතත් සැදෙමින් පවත්නා කාලය **විවට්ට අසඞ්ඛ්‍ය කල්ප** නමි. **සූර්‍ය්‍ය චන්ද්‍රාදීන්ගේ පහළවීම** පටන් නැවතත් **කල්ප විනාශක මහා මේඝය** දක්වා පවත්නා කාලය **විවට්ටට්ඨායි අසඞ්ඛ්‍ය කල්ප** නමි.

මෙයින් **සංවට්ටයෝ** තිදෙනෙකි. එනම් **ආපො සංවට්ටය, තෙජො සංවට්ටය** සහ **වායො සංවට්ටය** යන තුනයි. **සංවට්ට සීමාවෝ ද** තිදෙනෙකි. **ගින්නෙන්** කල්පය නස්නා කල්හි, **ආභස්සර බඹලොවින්** යටද, **ජලයෙන්** නස්නා කල්හි **සුභ කිණ්හ බඹලොවින්** යට ද, **වාතයෙන්** නස්නා කල්හි, **වෙහප්ඵලයෙන්** යටද නස්නේය.

තවද, කල්ප විනාශය වන කල්හි, **ජාතික්ෂේත්‍රය, ආඥක්ෂේත්‍රය, විෂය ක්ෂේත්‍රය** යන ත්‍රිවිධ ක්ෂෙත්‍රයන් අතුරෙන් **ආඥා ක්ෂේත්‍රයම** විනාශ වන්නේය. මෙයින් **ජාතික්ෂේත්‍රය** නම් තථාගතයන් වහන්සේගේ ලොව පහළවීම ආදී අවස්ථා වන්හිදී කම්පාවන ප්‍රදෙශය වූ දස දහසක් පමණ සක්වල වල්ය. රතන සූත්‍රාදීන්ගේ ආනුභාවය පැතිරෙන තරම් ප්‍රදේශය වූ කොටි ලක්ෂයක් සක්වල **ආඥක්ෂේත්‍රය** නම් වේ.

බුද්ධ ඥානයට විෂය වූ අනන්තාපරිමාණ සක්වල **විෂයක්ෂේත්‍ර** නාම වේ. **ආඥක්ෂේත්‍රය** නස්නා කල්හි **ජාතික්ෂේත්‍රයද** නස්නේය.

ගින්නෙන් කල්ප විනාශය වන කල්හි, පළමුකොටම **කල්ප විනාශක මහා වැසි** කෙළ ලක්ෂයක් සක්වල එකවිටම වසී. එවිට

මනුෂ්‍යයෝ සතුටුව බීජ වැපිරීම් ආදිය කරති. මෙසේ බීජ වපුරා වර්ධනය කොට ශස්‍යය ගවයන් කන පමණ වැඩුණු පසු, වැසි පොදයක් වත් නොමැතිව මේඝ ගර්ජනා පමණක් ඇති වන්නේය. මෙසේ නතර වූ වැසි, සදහටම නැවතුණේම වේ. එකල්හි වැස්සෙන් ජීවත්වන සත්ත්වයෝ දිවි පවත්වා ගත නොහැකිව, මියගොස් දෙව්ලොව ඉපිද ක්‍රමයෙන් ධ්‍යානාදිය වඩා බඹලොව උපදින්නාහුය. මල් ඵලයන්හි ඕජාවෙන් ජීවත් වන සත්ත්වයෝ ද, එසේ චුතවී ක්‍රමයෙන් ඔබලොව පහළ වන්නාහුය. මෙසේ දීර්ඝ කාලයක් වැසි නැතිවීමෙන් ජලය වියලී ගොස්, මත්ස්‍යාදී වූ දියෙහි උපදනා සත්ත්වයෝ ද මැරී, දෙව්ලොව ඉපිද, පෙර සසරදී කළ පින් බෙලෙන් භාවනා වඩා බඹලොව උපදී. එකල්හි ලෝකබ්‍යුහ නම් දෙවියෝ කෙස් මුදු විසුරුවා ගෙණ හඬමින්, අතින් කඳුළු පිසමින්, රතුවත් හැඳ, ඉතා විරූප වෙස් ගෙණ, මිනිස් ලොව හැසිරෙමින් හවුරුදු ලක්ෂයකින් කල්ප විනාශය වන්නේය, මේ මහා පොළොවද වැනසෙන්නේය. මහ මුහුදු පවා වියළෙන්නේය, මහාමේරු පර්වතයද ද විනාශ වන්නේය, බඹලොව තෙක් සියල්ල වැන සෙන්නේය. එබැවින් මෙත් වඩව්, කරුණා – මුදිතා – උපෙක්ෂා වඩව්, මව්පිය උවටැන් කරව්, කුල දෙටුවන් පුදව් යනාදිය පවසමින් කල්ප විනාශය වන බව හඟවන්නේය. මෙබස් අසා මනුෂ්‍යයෝද භූමාටු දෙවියෝද, පින්කම් කොට දෙව්ලොව ඉපිද, එහිදී වායො කසිණ භාවනාදිය කොට, ධ්‍යාන උපදවාගෙණ ක්‍රමයෙන් බඹලොව උපදිති. අන්‍යයෝ අපරාපර්‍ය්‍ය වෙදනීය කුසල කර්ම බලයෙන් දෙව්ලොව ඉපිද, ධ්‍යාන වඩා බඹලොව උපදිත්. අපරාපර්‍ය්‍ය වෙදනීය කර්ම විරහිත, සසර සැරිසරණ සත්ත්වයෙක් නම් නැත් තේය.

වැසි නැවති බොහෝ කලක් ඇවෑමෙන් දෙවෙනි සූර්‍ය්‍යයෙක් පහළ වන්නේය. එකල්හි රෑ දවල්හි වෙනසක් නො පෙනේ. එකක් උදවූ කල්හි අනික් සූර්‍ය්‍යයා බසී. මුලුලෝකය නිරතුරුවම සූර්‍ය්‍යාලෝකයෙන්ම ආලෝකමත් වේ. මේ සූර්‍ය්‍යයන් දෙදෙනාගේ තේජස කරණකොට ගෙණ හිමාල පර්වතයෙන් ගලා බස්නා පඤ්ච මහා ගඞ්ගාවන් හැර සෙසු ගංගා, ඇල, දෙල සියල්ලම වියළේ. මෙසේ බොහෝ දීර්ඝ කාලයක් ගතවූ කල්හි තුන්වෙනි සූර්‍ය්‍යයෙක්ද පහළ වී පස් මහා ගංගාවෝ පවා වියළී යති. එයටද බොහෝ

කලකට පසු සිව්වැනි සූර්‍යයෙක් ද පහළ වීමෙන් හිමවත මහා ගංගාවන් හට ගන්නාවූ **සිංහපතාකය, හංසපතාකය කර්ණමුණ්ඩකය, රථකාරය, අනවතප්තය, ඡද්දන්තය, කුණාලය** යන සප්ත මහා විල් සම්පූර්ණයෙන්ම වියළේ. ඉන් බොහෝ කලකට පසු, පස්වැනි සූර්‍යයෙක් උදාවීමෙන් මහා සාගර ජලයද වියළේ. එයටත් පසු ඉතා දීර්ඝ කාලයක් ගත වීමෙන් සවැනි සූර්‍යයෙක්ද පහළවී,කෙළ ලක්ෂයක් සක්වල වියලන දූමින් සෑම තැනම පිරී පවතින්නේය. ඉනිදු බොහෝ කලකට පසු සත්වැනි සූර්‍යයෙක් ද පහළ වේ. එවිට කෙළ ලක්ෂයක් සක්වල එකම ගිනි ජාලාවක් වී සියක් යොදුන් පමණ මහත් කඳු පර්වත පැලී අහසෙහි ද විනාශ වෙමින් චාතුම්මහාරාජිකය තෙක් පැතිරේ. මේ ක්‍රමයෙන් සදිව්‍ය ලෝකයන් දවා, ප්‍රථමධ්‍යාන භූමිය දක්වා ගින්න පැතිරෙන්නේය. මෙසේ පැතිර පවත්නා මහා ගින්න **ආභස්සර** බඹ ලොව හැර එයට යටින් පිහිටි සියලුම ප්‍රථම ධ්‍යාන භූමිද, කාම භූමිද ද විනාශ කරන්නේය. එයට ඇතුළත් සියලුම ද්‍රව්‍ය යන් අලු පමණවත් ඉතිරි නොකොට දැවී ගිය පසු ක්‍රමයෙන් ගින්න නිවී යයි. මේ විනාශයට ගතවන කාලයට **සංවට්ට කල්පය** යයිකියනු ලැබේ. එය **අන්තර කල්ප** සූ සැටක් පමණ දීර්ඝ කාලයකි.

මෙතැන් පටන්, ප්‍රථමධ්‍යාන භූමින්ගෙන් හා කාමභූමින්ගෙන්ද ශූන්‍යව, අන්තර කල්ප සූසැටක් පමණ දීර්ඝ කාලයක් ගතවන්නේය එයට **සංවට්ඨායි අසඞ්ඛ්‍ය කල්පය** යයි කියනු ලැබේ.

මෙසේ **සංවට්ඨායි අසඞ්ඛ්‍ය කල්පය** ගෙවී යාමෙන් පසු **මහා මේඝයක්** නැගී පළමුකොට සියුම් පොද වැසි වැස, පිළිවෙලින් මහත්ව, තල්කඳ පමණ වැසිධාරා වැස, කෙළ ලක්ෂයක් සක්වල සියලු දැගිය තැන දියෙන් පිරී යයි. ඒ ජලය හාත්පසින්ම , උඩ, යට සරස වාතය නැගී, ජලය ඝණ කොට, නොවිසිරි යන සේ පිඩු කොට තබන්නේය. මෙසා මහත් ජලස්කන්ධය අතර වාතය ගමන් කළ හැකි සේ විවර සැදෙමින් ඝණවී වට ආකාර වූ පසු ක්‍රමයෙන් තව තවත් ඝණවීමෙන් යටටම බසින්නේය. මෙසේ ක්‍රමයෙන් බසික්ම පෙර ප්‍රථමධ්‍යාන බඹලොව පිහිටි තන්හි එකී **ප්‍රථමධ්‍යාන බ්‍රහ්ම ලොකය ද,** එයට යටින් **පරනිම්මිත වසවර්තිය, නිම්මාණ රතිය, තුසිතය, යාමය** යන සතර දිව්‍යලෝකයන් පැවැති තන්හි

එම දිව්‍යලොකයන් ද පහළ වන්නේය. **තාවතිංසය චාතුම්මහාරාජිකය** යන දෙදෙව්ලොව, මේ මහා පොළොව හා සම්බන්ධ හෙයින්, ඝණ වූ ජල පොළොව පෙර මේ පොළොව පැවැති තැන් දක්වා බට කල්හි බලවත් වාතයක් හටගෙණ ජලය පොළොව වටකොට සිටී. මිහිරිවූ මේ ජලය ක්‍රමයෙන් ක්ෂය වෙමින්, යම්සේ උණු කරණ ලද කිරි නිවෙන කල්හි මතුයෙහි යොදයක් සෑදේද, එපරිද්දෙන්ම, ඉතා වර්ණවත් වූ ද, රසවත් වූ ද, රස පොළොව හටගන්නේය.

මෙසේ ඇති කල්හි, **ආභස්සර බඹලොව** වැසි බ්‍රහ්මයන් අතුරෙන් ඇතැම් බ්‍රහ්මයන්ගේ ආයු ගෙවීමෙන් එයින් චුතව මේ පොළොවෙහි ඕපපාතිකව පහළ වන්නාහුය. ඔව්හු ප්‍රීතියම ආහාර කොට ගෙණ ඇත්තේ ශරීරාලොකයෙන් බැබලෙමින්, අහස්හි හැසිරෙමින්, මනොඥ ස්වභාව ඇතිව ඉතා දීර්ඝ කාලයක් සිටිති. එකල සඳ හිරු ග්‍රහ තාරකාදිය නොපෙණේ. රෑ දවල් ද ඍතු භෙද ආදියක් ද විද්‍යාමාන නොවේ. එකල්හි ආශාව අධික එක්තරා සත්ත්වයෙක්, මේ කුමක්දැයි බලනු පිණිස රස පොළොවෙහි ඇඟිල්ල ඔබා එම ඇඟිල්ල දිව ගා රස බැලූ කල්හි ආශාව වැඩී ගියේය. අනික් සත්ත්වයෝ ද එසේම පොළෝ රස බලා ආශාව වැඩී ගිය කල්හි එම පස් ගුලි කොටගෙණ අනුභව කරන්නට පටන්ගත්තේය. මේ හේතුවෙන් ඔවුන්ගේ ශරීරාලෝකයද ක්‍රමයෙන් පහවී අන්ධකාරය පැතිරෙන්නට විය. එකල්හි සඳ හිරු දෙදෙනා ද, අනතුරුව තාරකා ආදියද පහළ විය. මෙසේ ඔව්හු එලිය ලදුම්හයි සතුටුව, අන්ධකාරය නිසා බියපත් වූ අය සනසා සූර බැව් උපදවමින් පහළවූයේ යයි යන අදහසින් **සූර්‍ය්‍යයා යයි** නම් කළෝය. දවල් කාලයේදි සූර්‍ය්‍යයා ලොව ආලෝක කොට අස්ත වූ කල්හි, නැවත අන්ධකාරය ඇතිවීමෙන් බියපත්වූ ඔව්හු රාත්‍රියෙහි ආලෝකයක් ලදහොත් යෙහෙකැයි සිතත්ම **සඳමඩල** පහළවිය. එය දැක සතුටුවූ ඔව්හු, එයට **චන්ද්‍ර** යයි නම් කළාහුය. මෙයට අනතුරුව නැකැත් තරු ආදිය පහළවීමද, රෑ දවල් , මාස අඩමස, ඍතු, සංවත්සර ආදියද ඇතිවිය. සඳ හිරු පහළවූද ම මහමෙර, සක්වලගල හිමවත් පර්වතය පහළවූහ. මේ සියල්ලම පහළවූ දින **මැදින් මස පුරපසළොස්වක් පොහෝ දින විය**

පොළොව සෑදීමේදී ඇතැම් පෙදෙස් ප්‍රූපයන් මෙන් උස්ව පිහිටියේය. එය කඳු පර්වත යයි ව්‍යවහාර විය. ඇතැම් පෙදෙස් ප්‍රපාතයන් මෙන් සෑදී සමුද්‍ර බවට පත්විය. ඇතැම් පෙදෙස් සමතැන්ව පිහිටි හෙයින් **ද්වීප** යයි නම් කරණ ලදී.

රස පොළොව අනුභව කරන්නාවූ සත්ත්වයන් අතුරෙන් ඇතැම් කෙනෙක් දුර්වර්ණ විය. එවිට වර්ණවත් වූවෝ දුර්වර්ණ යන් හෙළා දකින්නට පටන්ගත්හ. ඔවුන්ගේ ඒ මානය කරණ කොටගෙණ රස පොළොව ද ක්‍රමයෙන් පිරිහී ගොස් එහි රසය අතුරුදන් විය.

**රස පොළොව** නැතිව ගිය කල්හි ඔව්හු එකතුව **"අහෝ රසය අහෝ රසය"** යයි කියන්නට වන. ඉක්බිති **බිම්හතු** නම් වූ ඕජා සහිත මොළොක් පසක් පහළවිය. එය වර්ණවත් වූද සුවඳවූද, රසවූද, ගිතෙල් පැහැයෙන් යුක්තවූද, පසක් විය. එවිට ඔව්හු **භූමිපට්ටක** නම් වූ බිම්පතුරු හෙවත් **බිම්හතු** අනුභව කරන්නට පටන් ගත්හ. මෙසේ බොහෝ කලක් බිම්හතු අනුභව කරන්නාවූ සත්ත්වයන්ගේ ශරීරය රළු බවටද, වර්ණයෙන් හීන බවටද පත්විය. එවිට ඇතැම් වර්ණවත්වූ කෙනෙක් දුර්වර්ණයන් දැක ඔවුන්හෙළා දකින්නට වන් කල්හි බිම්හතුද ක්‍රමයෙන් අතුරුදහන් විය. එයට පසුව **බදලතා**නම් වැල් ජාතියක් පහළ විය. එයද මේ ක්‍රමයෙන්ම අතුරුදන් විය. අනතුරුව නොසානාලද භූමියෙහි හටගත්තාවූ පොතු නැති සුවඳ හැල් පහළ විය. බඳුනක සුවඳහැල් බහා ගලක් මත තුබූ කල්හි ගිනි නැග තුමූම බත පිසයයි. ව්‍යඤ්ජන නො මැතිව අනුභව කළ හැකි මේ බත ඉතා රසය. සුවඳහැල්ල අඩුවීමක් නැත. මෙසේ රළුවූ මේ ආහාර අනුභව කරන්නාවූ සත්ත්වයන්ට මල මූත්‍ර හටගෙණ ඒවා නික්මෙන මාර්ග හෙවත් ද්වාර පහළවිය. පෙර යමෙක් ස්ත්‍රී වූවාද, ඇයට ස්ත්‍රී ලකුණු ද, පෙර යමෙක් පුරුෂ වීද, ඔහට පුරුෂ ලකුණුද පහළ විය. ඉදින් ස්ත්‍රී තොමෝ ද බොහෝ වේලා පුරුෂයා දෙස ද, පුරුෂ තෙමේ ස්ත්‍රී දෙසද බලා සිටීමෙන් කාම රාගය වැඩී මෛථුන්දම් සේවනය කළහ. මෙය දුටු අන්‍ය සත්ත්වයෝ ඔවුන් පිළිකුල් කොට ගල්, පස්, කුණු ආදියෙන් ගසා එළවන්නට විය. මොව්හු ද, ඈත්ව ගොස් අනුන්ට නොපෙණී බොහෝ කල් මෛථුන්දම් සේවනය කරන්නේ, සැඟ

වෙනු පිණිස ආවරණ ස්ථාන හෙවත් ගෙවල් සාදගත්හ. ඕන පිණිස වරින්වර ගෙන්වා ගත් සුවඳ හාල් එකවරම කීප දිනකට සෑහෙන පමණ ගෙණ රැස්කොට තබා පිස අනුභව කරන්ට වන් බැවින් හැල් නරක් නොවෙනු පිණිස සහල් වසා පොතු ඇතිවිය. කපන ලද ධාන්‍යද නැවත නොවැඩුනේය. ඇල්වී පඳුරු පඳුරුව සිටියාහුය. එවිට ඔව්හු රැස්වී මෙසේ කථා කළහ.

"සත්ත්වයන් අතර පව්වු ගති පහළවිය. ආ විට තිබූ සම්පත් සෘද්ධි ආලොක ආදිය ක්‍රමයෙන් පිරිහී ගියහ. දැන් හැල් වී පඳුරු වෙන් වී පිහිටියාහුය. අප අතර මේ ඇල් වී බෙදු ගන්නෙමු නම් යහපතැයි" ගිවිස ඇල් වී බෙදු මායිම් කර ගත්හ. කල්යාමෙන් එක්තරා කෙනෙක් තමන්ට අයිති නොවූ බිමින් නොකියාම හැල් වී ගෙණ ගියහ. මෙසේ සොරකම උපන් කල්හි අන් අය ඕහට අවවාද කොට හික්මවන්ටනොහැකිව ගල් මුල්වලින් ගසා ඔහු නෙරපා දැමූහ. මෙසේ ක්‍රමයෙන් සොරකම, අනුන්ට අපහාස කිරීම බොරු කිම, හිංසා පිණිස දඬු ගැණීම යනාදිය පහළ විය.

මෙසේ ඇති කල්හි ඔවුනොවුන් ගිවිස ගෙණ වරද කරන්නවුන් හට නිසි සේ අවවාද දඬුවම් දෙනු පිණිස එක් පුද්ගලයෙක් සම්මත කරගැණීම සුදුසුයයි නිශ්වය කොට ගෙණ, ඒ පිරිස් අතුරෙන් යමෙක් ඉතා උතුම් රූප ඇත්තේ වේද, බොහෝ ලක්ෂණවීද, බොහෝ පැහැදීම ගෙණ දෙන්නේ වීද, ඉතා මහත් ආනුභාව ඇත්තේ වීද, ඔහු කරා පැමිණ "පින්වත එව, හොඳින් ප්‍රකාශ කටයුත්ත ප්‍රකාශ කරව, ගර්හා කටයුත්තහුට හොඳින් ගර්හා කරව, නෙරපිය යුත්තහු හොඳින් නෙරපව, අපි තොපට ඇල්වී වලින් කොටසක් දෙන් නෙමුයයි" බෝසත් හට කීහ. ඔහු ද එය පිළිගෙණ හොඳින් යුක්තිය ඉටු කෙළේය. මේ බොධිසත්ත්ව තෙම මහජන සම්මත යෙන් පත්වූ හෙයින් **මහා සම්මත**නම් විය. එසේම හෙතෙමේ ක්ෂෙත්‍ර-යන්ට හෙවත් ඉඩම්වලට අධිපති වන හෙයින් **ක්ෂත්‍රිය** යයි ද, ධර්මයෙන් අන්‍ය සත්ත්වයන් පිණවයි යන අර්ථයෙන් **රජ** යයි ද ප්‍රකට විය. මෙය **ක්ෂත්‍රිය වංශයාගේ** හට ගැණිම වේ.

තවද, මෙකල්හි විසූ ඇතැම් සත්ත්වයෝ මෙසේ ද සිතූහ. "ඒකාන්තයෙන්ම පාප ධර්ම සත්ත්වයන් කෙරෙහි පහළ

වූහ. එබැවින් සොරකම් කිරීම් ආදිවූ, ලාමකවූ අකුසල ධර්ම යන් නසන්නෙමු නම් ඉතා යෙහෙකැයි කියායි. මෙසේ සිතා ලාමකවූ අකුසල ධර්මයන් දුරු කෙරෙතියි යන අර්ථයෙන් ඔවුන් **බ්‍රාහ්මණ** යන නාමයෙන් ව්‍යවහාර විය. ඔව්හු වන ප්‍රදෙශයෙහි කොල සෙවිලි කළ **පන්සල්හි** වසමින් ධ්‍යාන උපදවති. බත සඳහා පිඩු සිඟීම් වශයෙන් ගම් නියම්ගම් රාජධානිවලට ඇතුල්ව, ආහාර ලබාගෙණ, නැවතද වන පන්සල්වලට වැද ධ්‍යාන කෙරෙති. මිනිස්සු මොවුන්ගේ මේ ක්‍රියා දැක ධ්‍යාන කෙරෙති යන අර්ථයෙන් ඣායක යන නමද ඔවුන්ට කීහ.

නවද ඇතැම් කෙනෙක් වන පෙදෙස්හි පන්සල්වල හිඳ ධ්‍යාන වඩා ගත නොහැකිව, ගම් නියම්ගම්වලට පැමිණ ත්‍රිවෙදය සකස් කරමින්ද, උගන්වමින්ද වෙසෙති. මිනිස්සු මොවුන් දැක මොව්හු ධ්‍යාන නොකෙරෙතියි යන අර්ථ ඇති **අජ්ඣායකය** යයි නම් කෙළේය.

නවද, ඇතැම් සත්ත්ව කෙනෙක් මෛථුන ධර්ම සේවනය නිසා ගවයන් රැකීම, වෙළඳාම් කිරීම, ආදී ප්‍රසිද්ධ කර්මාන්තයන්හි යෙදනාහ. මොවුන්ට **වෛශ්‍යයෝ** යයි නම් කළෝය.

නවද, ඉහතකී තුන් පිරිසට අයත් නොවූ නපුරු පැවතුම් ඇති පිරිසද විය. ඔවුන්ට නපුරු, නින්දිත ක්‍රියා ඇත්තේය යන අර්ථ යෙන් **ශූද්‍රය** යන නාමය ව්‍යවහාර කළහ.

මෙසේ කල්ප විනාශ මහා මේඝයේ පටන් ගින්නෙන් ද විනාශවී යන කාලය දක්වා **සංවටට අසඬ්ඛ්‍ය කල්පය** යයිද, එතැන් පටන් **සම්පත්තිකර මහා මේඝය** දක්වා **සංවට්ඨායි අසඬ්ඛ්‍ය කල්පය** යයි ද **සම්පත්තිකර මහා මේඝය** පටන් සඳ හිරු පහළවීම තෙක් **විවට්ට අසඬ්ඛ්‍ය කල්පය** ද, සඳ හිරු පහළවීමේ සිට නැවත **කල්ප විනාශක** **මහා මේඝය** දක්වා කාලය **විවට්ඨායි අසඬ්ඛ්‍ය කල්පය** යයි ද දතයුතුයි. මේ සතර අසඞ්ඛ්‍ය කල්පය එක්කොට ගත් කල්හි **එක් මහා කල්පයකි.** මෙය ගින්නෙන් කල්පය නස්නා පරිදිය.

ජලයෙන් කල්පය විනාශ වීමේදී පළමුකොට **කල්ප විනාශක මහා මේඝය** වසී. මුලදී සියුම් සියුම් වැසි වැස පසුව පිළිවෙලින් මහා වැසි ධාරාවෝ කෙළ ලක්ෂයක් සක්වළ පුරා වසිති. මෙසේ ක්‍රමයෙන් වැස මහා පොළොව , පර්වත ආදිය දියවී ගොස් හාත් පසින්ම ද්‍රුතියධ්‍යාන භූමි සමගම දියවී යන්නේය. මෙසේ ලොව දියවූ ජලය හාත්පසින්ම සුළඟ දරයි. සියල්ල දියවූ පසු ජලය වියලී යයි. මෙතෙක් කාලය **සංවට්ට අසංඛ්‍ය කල්ප** නම් වේ. සෙසු **සංවට්ඨායි, විවට්ට විවට්ඨායි** කල්පද පෙරසේම දතයුතුයි.

වාතයෙන් කල්පය විනාශ වීමේදී පළමුවෙන් කල්ප විනාශක මහා වැස්සක් වසී. පසුව දෙවෙනි සූර්‍ය්‍යා පහළ වූවාක් මෙන් කල්ප විනාශය පිණිස වාතය හටගනී. පළමු වෙන් මහා ධූලි නංවා, අනතුරුව සියුම් ධූලි සියුම් වැලි, මහාවැලි, කැටගල්, මහ ගල් යනාදිය නංවයි. එමෙන්ම පර්වත මහා රුක් ආදියද අහසට නංවා බිමට වැටිය නොදී අහසෙහිම සුණුවි සුණු වී යයි. අනතුරුව යටින් වාතය නැග ගස් මුල් සහිත වූ මහා පොළොව බිඳ අහසට නංවා විනාශ කොට යවති. මෙසේ සක්වළ පව්වද, මහමෙර පව්වද, භූමස්ඨ ආකාශස්ථ, විමානයන් ද ෂට් කාමාවචර දිව්‍ය ලෝකයන් ද, වේහප්-ඵලයට යටින් පිහිටි සියළු ම ප්‍රථමධ්‍යාන, ද්‍රුතියධ්‍යාන, තතියධ්‍යාන භූමි ද වාතයෙන් සුණු විසුණු වී යන්නේය. **මේ විනාශයේ දී ක්‍රමයෙන් සත්ත්වයෝ සුභකිණ්ණ බඹලොව ඉපිද එතැනින් චුතව වේහප්ඵල යෙහි පහළ වන්නාහ. කෙළ ලක්ෂයක් සක්වළ** මෙසේ වාතයෙන් **විනාශවී යති.** මෙහිදී ද කල්ප විනාශ මහා මේඝය පටන් කල්ප **විනාශක මහා වාතය නැවතීම තෙක් එක් සංවට්ට අසඞ්ඛ්‍ය කල්පයෙකි.** වාතය නැවතීම සිට සම්පත්තිකර මහා මේඝය තෙක් **එක් සංවට්ඨායි අසඞ්ඛ්‍ය කල්පයකි.**

මෙසේ සත්ත්ව ලොකය මෙන් අවකාශ ලොකයද වැනසෙන් නේ අකුසල මූල හේතුවෙන් බව දත යුතුයි. **රාගය** අධික වූ කල්හි **ගින්නෙන්ද, ද්වේෂය** අධික වූ කල්හි **ජලයෙන්ද මෝහය** අධික වූ කල්හි **වාතයෙන්** ද වැනසෙන බව දක්වන ලදී.

මෙසේ වැනසෙන්නාවූ සක්වලවල් පිළිවෙලින් සත්වරක් ගින් නෙන් ද, අටවැනි වර ජලයෙන්ද විනාශ වන්නේය. මේ ක්‍රමයෙන් ගින්

නෙන් සපණස් (56) වරක් සහ ජලයෙන් සත් වරක් ය යි තෙසැට (63) වරක් විනාශ වූ පසු සූසැට (64) වන වර වාතයෙන් විනාශ වන්නේය.

## අරූපාවචර භූමි

අරූපාවචර භූමි සතරෙකි. එනම්;– **ආකාශානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** යන භූමි සතරය.

**අකණිට්ඨ** නම් සුද්ධාවාස බඹතලයට යොදුන් පනස් පන්ලක්ෂ අසූදහසක් උසින් ආකාශානඤ්චායතනයද, එයින් මත්තෙහි එකිනෙකට එපමණම දුරින් සෙසු අරූප භූමිද පිහිටා තිබේ.

**ආකාශානඤ්චායතන** භූමියෙහි උපදනා පුද්ගලයෝ නොපිරිහුන් ආකාශානඤ්චායතන ධ්‍යාන කුසල කර්මයාගේ විපාකස්කන්ධයකින් පමණක් ප්‍රතිසන්ධි ගන්නාහුය. මේ භූමියෙහි වසන පුද්ගලයන් අතර, **ත්‍රිහේතුක පෘථග්ජනයාය, සොතාපත්ති ඵලස්ථයාය, සකෘදගාමි මාර්ගස්ථයාය, සකෘදගාමි ඵලස්ථයාය, අනාගාමි මාර්ගස්ථයාය, අනාගාමි ඵලස්ථයාය, අර්හත් මාර්ගස්ථයාය, අර්හත් ඵලස්ථයාය** යන පුද්ගලයන් අටදෙනා දක්නා ලැබේ. මේ පුද්ගලයන් අතුරෙන් **ත්‍රිහේතුක පෘථග්ජනයා** හට ද්වේෂ මූල සිත් දෙක හැර, ඉතිරි අකුසල් සිත් දසය, මනොද්වාරාවජ්ජන සිතය, මහා කුසල් අටය, අරූපාවචර කුසල් සතරය, ආකාසානඤ්චායතන විපාක සිතය යන සිත් සූවිස්ස (24) ලැබෙත්.

**විඤ්ඤාණඤ්චායතන** භූමියෙහි වසන ත්‍රිහේතුක පෘථග්ජනයා හට, යටකී සූවිසි චිත්තයන් අතුරෙන් ආකාශානඤ්චායතන කුසල හා විපාක චිත්තයන් වෙනුවට විඤ්ඤාණඤ්චායතන විපාක සිත පමණක් යොද ගත් කල්හි තෙවිසි (23) සිත් කෙනෙක් ලැබෙති.

**ආකිඤ්චඤ්ඤායතන** භූමියෙහි වසන ත්‍රිහේතුක පෘථග්ජනයා හට, යටකී තෙවිසි චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන කුසල් හා විපාක සිත් දෙක වෙනුවට ආකිඤ්චඤ්ඤායතන විපාක සිත පමණක් යොදගත් කල්හි දෙවිසි (22) සිත් කෙනෙක් ලැබෙත්.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන** භූමියෙහි වසන ත්‍රිහේතුක පෘථග්-ජනයාහට යටකී දෙවිසි චිත්තයන් අතුරෙන් ආකිඤ්චඤ්ඤායතන කුසල් හා විපාක සිත් දෙක වෙනුවට නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත පමණක් යොදගත් කල්හි එක්විසි සිත් (21) කෙනෙක් ලැබෙති.

**ආකාශානඤ්චායතන භූමියෙහි** වසන **සෝතාපත්ති ඵලස්ථයා** හට දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරය, උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතය, මනොද්වාරාවජ්ජන සිතය, මහා කුසල් සිත් අටය, අරූප කුසල් සතරය, ආකාශානඤ්චායතන විපාක සිතය, සොතාපත්ති ඵල සිතය යන විසි චිත්තයන් (20) ලැබෙත්.

**විඤ්ඤාණඤ්චායතන** භූමියෙහි වසන **සෝතාපත්ති ඵලස්ථයා** හට යටකී විසි චිත්තයන් අතුරෙන් ආකාශානඤ්චායතන කුසල විපාක සිත් දෙක හැර, විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය ඇතුළත් කොට ගත් කල්හි එකුන්විසි (19) සිත් කෙනෙක් ලැබෙත්.

**ආකිඤ්චඤ්ඤායතන** භූමියෙහි වසන **සෝතාපත්ති ඵලස්ථයා** හට යටකී එකුන්විසි චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන කුසල විපාක සිත් දෙක හැර ආකිඤ්චඤ්ඤා යතන විපාක සිත ඇතුළත් කළ කල්හි අටළොස් (18) සිත් කෙනෙක් ලැබෙත්.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි** වසන **සෝතාපත්ති ඵලස්ථයාහට** යටකී අටළොස් චිත්තයන් අතුරෙන් ආකිඤ්චඤ්ඤා යතන කුසල විපාක සිත් දෙක හැර නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකසිත ඇතුළත් කළ කල්හි සතළොස් (17) සිත් කෙනෙක් ලැබෙත්.

**ආකාශානඤ්ඤායතන භූමියෙහි** වසන **සකෘදගාමී ඵලස්ථයාහට** එහි සොතාපන්න පුද්ගලයාහට ලැබෙන විසි චිත්තයන් අතුරෙන් සොතාපත්ති ඵල සිත වෙනුවට සකෘදගාමි ඵල සිත ඇතුළත් කළ කල්හි විසි (20) චිත්තයන්ම ලැබෙති. මේ ක්‍රමයෙන් සොතාපත්ති පුද්ගලයන් කෙරෙහි ඇතිවන සොතාපත්ති ඵල සිත වෙනුවට සකෘදගාමි, අනාගාමි ඵල සිත් යොදගත් කල්හි ඒ ඒ පුද්ගලයන්ට සතර අරූප භූමියෙහි ලැබෙන සිත් දතහැකි වේ.

**ආකාශානඤ්චායතන භූමියෙහි** වසන **අර්හත් ඵලස්ථයාහට මනොද්වාරාවජ්ජන සිතය, මහා ක්‍රියා සිත් අටය, අරූප ක්‍රියා සිත් සතරය, ආකාශානඤ්චායතන විපාක සිතය, අර්හත් ඵල සිතය** යන සිත් පසළොස (15) ලැබෙත්.

**විඤ්ඤාණඤ්චායතන භූමියෙහි** වසන **අර්හත් ඵලස්ථයා** හට යට කියන ලද පසළොස් චිත්තයන් අතුරෙන් ආකාශානඤ්චායතන විපාක ක්‍රියා සිත් දෙක හැර විඤ්ඤාණඤ්චායතන විපාක සිත ඇතුළත් කළ කල්හි තුදුස් (14) සිත් කෙනෙක් ලැබෙති.

**ආකිඤ්චඤ්ඤායතන භූමියෙහි** වසන **අර්හත් ඵලස්ථයාහට** යටකී තුදුස් චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන විපාක ක්‍රියා සිත් දෙක හැර ආකිඤ්චඤ්ඤායතන විපාක සිත ඇතුළත් කළ කල්හි තෙළෙස් (13) සිත් කෙනෙක් ලැබෙත්.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි** වසන **අර්හත් ඵලස්ථයාහට** යටකී තෙළෙස් චිත්තයන් අතුරෙන් ආකාශානඤ්චායතන .විපාක ක්‍රියා සිත් දෙක හැර නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත ඇතුළත් කළ කල්හි දෙළොස් (12) සිත් කෙනෙක් ලැබෙත්.

### අරූප තලයන්හි ආයු පරිච්ඡේදය

| | | |
|---|---|---|
| **ආකාශානඤ්චායතනයෙහි** | **මහාකල්ප** | **20,000 කි** |
| **විඤ්ඤාණඤ්චායතනයෙහි** | **මහාකල්ප** | **40,000 කි** |
| **ආකිඤ්චඤ්ඤායතනයෙහි** | **මහාකල්ප** | **60,000 කි** |
| **නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි** | **මහාකල්ප** | **84,000 කි** |

**එකොළොස් කාම භූමිය, සොළොස් රූපාවචර භූමිය, සතර අරූප භූමිය.** යන එක්තිස් භූමියෙහි හටගන්නාවූ පුද්ගලයන් සංක්ෂෙප වශයෙන් දෙළොස් දෙනෙක් ද, විස්තර වශයෙන් දෙසිය තුදුස් දෙනෙක් ද වේ. ඒ දෙසිය තුදුස් (214) දෙනා නම් මෙසේයි:—

සතර අපායෙහි දුගති අහේතුකයෝ 4
මනුෂ්‍ය භූමියෙහි සහ චාතුර්මහාරාජිකයෙහි
දුගති අහේතුකයෝ දෙදෙන හැර 22

| | |
|---|---|
| අවශෙෂ පඤ්ච සුගතියෙහි දුගති, සුගති අහේතුකයෝ දසදෙනා හැර | 50 |
| ප්‍රථමධ්‍යාන භූමි තුනය, දුතියධ්‍යාන භූමි තුනය, තතියධ්‍යාන භූමි තුනය, වෙහප්ඵලය යන දසවිධ භූමියෙහි සුගති දුගති අහේතුක සහ ද්විහේතුක තිස්දෙනා හැර | 90 |
| අසඥසත්ත්වයෙහි එකම සුගති අහේතුකයා යි | 1 |
| පඤ්ච සුද්ධාවාසයෙහි අනාගාමි ඵලස්ථයාය, අර්හත් මාර්ගස්ථයාය, අර්හත් ඵලස්ථයාය යන තිදෙනාගේ වශයෙන් | 15 |
| සතර අරූප භූමියෙහි සුගති දුගති අහේතුක ද්විහේතුක, සොවාන් මාර්ගස්ථ යන සතරදෙනා හැර ඉතිරි අටදෙනාගේ වශයෙන් | 32 |
| | 214 |

# 2

# ප්‍රතිසන්ධි චතුෂ්කය

1. අපාය ප්‍රතිසන්ධිය
2. කාම සුගති ප්‍රතිසන්ධිය
3. රූපාවචර ප්‍රතිසන්ධිය
4. අරූපාවචර ප්‍රතිසන්ධිය

අතීත භවයෙහි චුති චිත්තය හා වර්තමාන භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයද, වර්තමාන භවයෙහි චුති චිත්තය හා අනාගත භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයද යන ආදී වශයෙන් භවයෙන් භවය අතරක් නැති වන සේ ගැලපීම ප්‍රතිසන්ධිය නම් වේ.

## අපාය ප්‍රතිසන්ධිය

දෙළොස් අකුසල ජවනයන්ගේ විපාකය වූ අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිත සතර අපාය භූමියෙහි උපදනා

සත්ත්වයන්ගේ **ප්‍රතිසන්ධි සිත** වශයෙන් ඉපිද, එහි වසනතාක් කල් **භවඞ්ග සිත්** වශයෙන්ද, ඒ භවයෙන් චුත වන කාලයෙහි දී **චුති සිත** වශයෙන් ද පහළ වන්නේය.

සතර අපායෙහි නොයෙක් ආකාර ඇති සත්ත්වයෝ මේ එකම අකුසල විපාක සන්තීරණ සිතින් ප්‍රතිසන්ධි ලබන්නාහුය.

කම්බලාස්සතර නාග භවනෙහි හා ගුරුළු භවනෙහි උපදනා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධියද මේ සිතින්ම වන්නේය. නමුත් ඔවුන්ගේ ප්‍රවෘත්ති කාලයෙහි දෙවියන්ට මෙන් දෙව් බොජුන් දෙව් විමන්, දෙව් රුක් ආදී අභිමත වස්තු ලැබ දෙවියන් මෙන් සැප විඳින්නාහු වෙත්. ඔවුන්ගේ ප්‍රවෘත්ති විපාක පරම්පරාව කාමාවචර කුසල බලයෙන්ම ලැබෙත්. අහේතුක ප්‍රතිසන්ධිය ඇති බැවින් එම ආත්මභාවයේදීම ධ්‍යාන මාර්ගඵලාදිය නො ලැබෙන්නේය.

## කාම සුගති ප්‍රතිසන්ධිය

දුර්වල ද්‍විහේතුක කාමාවචර කුසල කර්මයාගේ විපාකය වූ කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් කාම සුගතියෙහි ජාත්‍යන්ධ, ජාති බධිර, ජාති නපුංසකාදිවූ අඞ්ග විකල සත්ත්වයන් ගේ හා බොහෝ සෙයින් අනුන්ට බැලමෙහෙ කරන්නාවූ නුවණ මද සත්ත්වයන්ගේද ප්‍රතිසන්ධිය හා භූමිනිශ්‍රිතවූ විනිපාතික අසුර නම් වූ ඥාතිප්‍රේතාදීන්ගේ ද ප්‍රතිසන්ධිය ඇති වන්නේය.

මොවුන් අතුරෙන් ලාමක මනුෂ්‍යයෝ මනුෂ්‍ය භූමියෙහිද, විනිපාතික අසුරයෝ චාතුර්මහාරාජික භූමියෙහි ද ඇතුළත්වන බැවින් චාතුර්මහාරාජිකයෙහිද අහේතුක ප්‍රතිසන්ධියක් ඇත්තේ යයි කියන ලදී.

ත්‍රිහේතුක කුසලයාගේ හා ද්‍විහේතුක උත්කෘෂ්ට කුසලයාගේ විපාක වශයෙන් ත්‍රිහේතුක, ද්‍විහේතුක විපාක සිත් අටෙන් දෙව් මිනිස් දෙගතියෙහි උත්පත්තිය ගෙණ දෙන්නේය. ෂට් දිව්‍යලෝක-යන්හි මහේශාක්‍ය මහානුභාව සම්පන්න දෙවියන්ගේ ප්‍රතිසන්ධිය

ත්‍රිහේතුක විපාක සතරෙන්ද, ගාන්ධර්වලොක, අසුර භවන යන දෙතන්හිද, අල්පෙශාක්‍ය දෙවියන්ගේද ප්‍රතිසන්ධිය ද්විහේතුක විපාක සතරෙන්ද සිද්ධ වන්නේය. එබැවින් අසුර, ගාන්ධර්වාදීන්ට එම ආත්මභාවයේදීම ධ්‍යාන මාර්ග ඵලාදිය නොලැබිය හැක.

## රූපාවචර ප්‍රතිසන්ධිය

සාමාන්‍ය වශයෙන් ප්‍රථමධ්‍යානය පමණක් උපදවාගෙන, නොපිරිහුනු ධ්‍යානයෙන් කල්යවන පුද්ගල තෙමේ කාලක්‍රියාකෙළේ විනම් **බ්‍රහ්මපාරිසද්‍යයෙහි** උපදින්නේය. එසේම ස්ත්‍රී ආත්මභාවයෙහි උපන්නාවූ, අෂ්ටසමාපත්තිලාභිවූ අනාගාමී හුද, බ්‍රහ්මපාරිසද්‍යයෙහි ඉපිද අනතුරුව මතු මතු බඹ තලයන්හි අනුක්‍රමයෙන් ඉපිද සුද්ධාවාස භූමියෙහි පිරිනිවන් පානාහුයයි දත යුතු. මධ්‍යම පමණින් ප්‍රථමධ්‍යානය වඩා ගත් පුද්ගල තෙමේ **බ්‍රහ්ම පුරොහිත්යෙහි** උපදින්නේය. ප්‍රණීත ලෙස හෙවත් ප්‍රථමධ්‍යානය පඤ්චවසිතාවෙන් පුරුදු කළ පුද්ගල තෙමේ **මහා බ්‍රහ්මයෙහි** උපදින්නේය. මේ ත්‍රිවිධවූ ප්‍රථමධ්‍යාන තලයන්හි පහළවන බ්‍රහ්මයන්හට ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් ඇතිවන්නේ රූපාවචර ප්‍රථමධ්‍යාන විපාක සිතය.

සෙසු ධ්‍යානයන්ගේ විපාක වශයෙන් ලැබෙන ප්‍රති සන්ධිය මේ ක්‍රමයෙන් ම දත යුතුයි.

## අරූපාවචර ප්‍රතිසන්ධිය

ආකාශානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූපාවචර කුසල කර්මයන්ගේ විපාක වශයෙන් එම සතර අරූප භූමීන්හි අරූපාවචර විපාක සිත් සතරින් ප්‍රතිසන්ධි ගන්නේය. අරූප භූමියෙහි සතර නාමස්කන්ධයන් පමණක් ම පහළ වන්නේය.

### ප්‍රතිසන්ධි සතර සංක්ෂෙපයෙන් මෙසේයි:—

1. **අපාය ප්‍රතිසන්ධි:—**

අකුසල විපාක සන්තීරණ සිත 1

**2. කාම සුගති ප්‍රතිසන්ධි:—**

| | |
|---|---|
| අහේතුක කුසල විපාක සන්තීරණ සිත | 1 |
| කාමාවචර මහා විපාක | 8 |
| කාමාවචර ප්‍රතිසන්ධි සියල්ල | 10 |

**3. රූපාවචර ප්‍රතිසන්ධි:—**

| | |
|---|---|
| ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රථමධ්‍යාන විපාක සිතින් | 1 |
| ද්‍විතියධ්‍යාන භූමියෙහි ද්‍විතියධ්‍යාන විපාක සිතින් | 1 |
| ,, තතියධ්‍යාන විපාකසිතින් | 1 |
| තතියධ්‍යාන භූමියෙහි චතුර්ථධ්‍යාන විපාක සිතින් | 1 |
| චතුර්ථධ්‍යාන භූමියෙහි පඤ්චමධ්‍යාන විපාක සිතින් | 1 |
| අසංඥසත්ත්වයෙහි (රූපස්කන්ධය පමණයි) | 1 |
| රූපාවචර ප්‍රතිසන්ධි සියල්ල | 6 |

**4. අරූපාවචර ප්‍රතිසන්ධි:—**

| | |
|---|---|
| අරූපාවචර විපාක සිත් සතරින් සතර අරූප භූමියෙහි | 4 |

# 3
# කර්ම චතුෂ්කය

**1. කෘත්‍ය වශයෙන් කර්ම සතරෙකි.**

1. ජනක කර්මය
2. උපත්ථම්භක කර්මය
3. උපපීළක කර්මය
4. උපඝාතක කර්මය.

**2. විපාක දෙන පිළිවෙලින් හෙවත් විපාක දනක්‍රමයෙන් සතරෙකි**

1. **ගරුක කර්මය**
2. **ආසන්න කර්මය**
3. **ආචීර්ණ කර්මය**
4. **කටත්තා කර්මය**

**3. විපාක දෙන කාල වශයෙන් සතරෙකි.**

1. **දිට්ඨධම්ම වෙදනීය කර්මය**
2. **උපපජ්ජවෙදනීය කර්මය**
3. **අපරාපරිය වෙදනීය කර්මය**
4. **අහෝසි කර්මය**

**4. විපාක දෙන ස්ථාන වශයෙන් සතරෙකි.**

1. **අකුසල කර්මය**
2. **කාමාවචර කුසල කර්මය**
3. **රූපාවචර කුසල කර්මය**
4. **අරූපාවචර කුසල කර්මය**

## ජනක කර්මය

අසූනවයක් (89) ප්‍රභෙද ඇති චිත්ත පරමාර්ථයන් අතුරෙන් ජවන කෘත්‍ය සිද්ධ කරන්නාවූද, විපාක උපදවන්නාවූද, කුසලාකුසල චිත්තයන්හි සම්ප්‍රයුක්ත වූ **චෙතනා චෛතසිකය කර්ම** නම් වන්නේය.

අසූඑකක් (81) වූ ලෞකික සිත් අතුරෙන් අකුසල් සිත් දොළොසය **(12), කාමාවචර කුසල් සිත් අටය (8), රූපාවචර කුසල් සිත් පසය (5), අරූපාවචර කුසල සිත් සතරය (4) යන විසිනවයක් (29) සිත් කර්ම සිත්** වශයෙන් සළකනු ලැබේ. මේ කර්මයෝ ද, මහත් බවට සම්පූර්ණ බවට පැමිණි කල්හි **කර්මපථ** යයි කියනු ලැබේ.

කර්මයන් විසින් උපදවන්නාවූ විපාක ද්විධ වේ. එනම් **ප්‍රවෘත්ති විපාකය, ප්‍රතිසන්ධි විපාකය** යන දෙකය. කර්මපථ බවට පැමිණියාවූ

කර්මයන්ගේ විපාක වශයෙන් පටිසන්ධි ප්‍රවෘත්ති විපාකද්වයම ලැබේ. කර්මපථ බවට නොපැමිණියාවූ කර්මයෝ ප්‍රවෘත්ති විපාක පමණක් උපදවන්නාහුය. **ප්‍රවෘත්ති විපාකය** නම්, උපන්නාවූ සත්ත්වයන්ට, එම භවයේදීම; පූර්ව කර්මයාගේ ශක්තියෙන් උපදවනු ලබන්නාවූ කුසලා කුසල විපාක චිත්තයන්ගේ පහළ වීමෙන් සුඛ, දුක්ඛ, උපෙක්ඛාදී වශයෙන් ලැබෙන්නාවූ විඳීමය. කරණලද කුසලාකුසල කර්මයා ගේ ශක්තිය හේතුකොට ගෙණ එක් භවයෙකින් චුතවී අතරක් නොමැතිව දෙවෙනි භවයෙහි, **විපාක නාමස්කන්ධයෝ ය,** ප්‍රතිසන්ධිය හා එක්ව පහළවන්නාවූ **කර්මජ රූප** සඞ්ඛ්‍යාත **කටත්තාරූපයෝ** ය යන මේ **නාමරූපද්වය** ඉපදවීම **පටිසන්ධි විපාක** නම් වේ. මෙසේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙකම උපදවන්නාවූ කර්මය **ජනක කර්මය** නම් වේ.

**ජනක කර්මය, කුසල ජනක කර්මය, අකුසල ජනක කර්මය,** යයි ද්විප්‍රකාර වේ. ඔවුන් අතුරෙන් **කුසල ජනක කර්මය** කුසල විපාක නාමස්කන්ධයන් හා කටත්තාරූප උපදවයි. කුසල ජනක කර්ම හේතුවෙන් පටිසන්ධි විපාක දීමට අනතුරුව ප්‍රවෘත්ති විපාක දෙන්නාවූ කල්හි යහපත් පස්කම් සැප හා සියලු භවභොග සම්පත් ලබා දෙන්නේය. **අකුසල ජනක කර්මයාගේ** ස්වභාවය නම් දුක් සහිත වූ භූමියෙහි ප්‍රතිසන්ධිය ලබා දී, ප්‍රවෘත්ති කාලයෙහි සා පිපාසාදී නොයෙක් දුක් ගෙනදීමය.

කුසලාකුසල ජනක කර්ම හෙවත් කර්මපථ බවට පැමිණි එක් කුසලාකුසල කර්ම ජවන් සිතකින් එක් වරක් ප්‍රතිසන්ධි විපාකය ගෙනදුන් පසු නැවත එම සිතින්ම ප්‍රතිසන්ධි විපාක ගෙණදිය නොහැකි වේ. නමුත් ඒ චිත්තයන්ගේ ප්‍රවෘත්ති විපාක දීමට කාලසීමාවක් නම් නැත.

## උපත්ථම්භක කර්මය

කුසලාකුසල ජනක කර්මයට හෝ එම ජනක කර්මයෙන් නිපන් ස්කන්ධසන්තානයට හෝ අනුබල දෙන්නාවූ, අන්‍යවූ, කුසලාකුසල ජවන් චිත්තය හා සම්ප්‍රයුක්ත චෙතනා තොමෝ **උපත්ථම්භක** කර්මය නම් වන්නේය.

**ජනක කර්මය** ස්වල්ප වූ විපාක දෙන්නාවූ කල්හි එ ජනක කර්මයාගේ විපාක මහත් බව පිණිස රුකුල් දීමට මේ **උපත්ථම්භක කර්මය** සමත් වේ.

**කුසල උපත්ථම්භක කර්මය, අකුසල උපත්ථම්භක කර්මය** යයි **උපත්ථම්භක කර්මයෝ** දෙදෙනෙකි. මේ **උපත්ථම්භක කර්ම** ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුවූ පළමුවෙනි භවඞ්ග චිත්තය පටන් චුති චිත්තය දක්වා අතර කාලයෙහි මුත් ප්‍රතිසන්ධි කාලයෙහි විපාක නොදෙන්නේය.

කුසල ජනක කර්මයක් විසින් විපාක වශයෙන් නාමස්කන්ධයන් හා කටත්තාරූපයන් උපදවා, පසු කලෙක ඒ ජනක කර්මයාගේ ශක්තියෙන් නාමස්කන්ධය හා කටත්තාරූපයන් වර්ධනය කිරීමට අපොහොසත් වූ කල්හි, අන්‍යවූ උපස්ථම්භක කුසල කර්මයක් ඉදිරිපත් වී ඒ විපාක නාමස්කන්ධයන් වර්ධනය කිරීමටද මහත්වූ භවභොග සම්පත් දීම පිණිසද රුකුල් දෙන්නේය.

එමෙන්ම අකුසල ජනක කර්මයක් හේතුකොටගෙණ ගවයෙක්ව ඉපිද, ඒ සත්ත්වයා වැඩිවිය පැමිණි කල්හි බරගැල් ආදියෙහි යොදවා නොයෙක් වද දෙමින් විෂම මාර්ගයෙක්හි ගමන් කරවීම සඳහා සුදුසුවූ අකුසල උපස්ථම්භක කර්මයක් ඉදිරිපත්ව අකුසල විපාක වර්ධනය කරන්නාක් මෙන්, අකුසල විපාක වර්ධනයට රුකුල් දීම මේ අකුසල උපස්ථම්භක කර්මයාගේ ස්වභාවය වේ.

තවද දුර්වල වූ දුහේතුක කර්මයක විපාක වශයෙන් මිනිස් අත්බැව් ලැබ සිටි කල්හි, එම කුසලය කිරීමේදී පිරිවරාගත් නොයෙක් අකුසල කර්මයෝ නැවත උපස්ථම්භක වශයෙන් ඉදිරිපත් වී සාපිපාසා දෙකින් නොමිදීමටත් වෙනත් නොයෙක් දුක් හිරිහැර විඳීමටත් උපකාර වන්නේය.

තවද මේ උපස්ථම්භක කර්මය, දුර්වලවූ කර්මය බලසම්පන්න කරන්නේය. ඔසුපත් නිරයට යා යුතු කෙනෙක් මහානිරයට යවයි. අල්පෙශාක්‍ය කුලයක ඉපදවිය යුතු කෙනෙක් මහෙශාක්‍ය කෙරෙති.

## උපපීළක කර්මය

ජනක කර්මයාගේ පරම්පරාවක් නොසිඳ, ජන්ම කර්මයන් නොසිඳ, ජනක කර්මයට හිංසා කරන්නාවූ කර්මය උපපීළක කර්මය නම් වේ.

**උපපීළක කර්මයද, කුසල උපපීළක කර්මය, අකුසල උපපීළක කර්මය,** යයි දෙවැදෑරුම් වේ. ඒ කර්මද ප්‍රවෘත්ති කාලයෙහි මිස ප්‍රතිසන්ධි කාලයෙහි විපාක නොදෙති. නමුත් උපපීළක කුසල කර්මය, ජනක අකුසල කර්මයටද, උපපීළක අකුසල කර්මය, ජනක කුසල කර්මයට ද හිංසා කරයි.

කුසල ජනක කර්මය විපාක දෙන්නාවූ කල්හි, නොහොත් මහත් වූ සම්පත්තියෙන් පිරි කුලයෙක්හි ඉපිද, ඒ සම්පත් අනුභව නොකළහැකිවනු පිණිස රොගාතුරයෙක් හෝ උමතුවෙක් හෝ කිරීම, අකුසල උපපීළක කර්මයෙන් කුසල ජනක කර්මයට හිංසා කිරීම නම් වේ.

එමෙන්ම අකුසල ජනක කර්මයක් කරණකොට ගෙණ හස්ති යෝනියෙහි හෝ අශ්ව යොනියෙහි හෝ ගව යෝනියෙහි හෝ උපන් කල්හි, ඔවුන් රාජවාහන පිණිස යෙදූ කල්හි අවශෙෂ මනුෂ්‍යයන්ට වඩා මහත්වූ සැප ඔවුන්ට ලැබෙන්නේය.

දිනක් මහමුගලන් මහරහතන් වහන්සේ ලොකවිවරණ නම් ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වා අවීචිමහ නිරයෙහි ගිනි නිවා මොහොතක් කල් ධර්ම දෙශනා කළ සේක. එකල්හි ඒ නරකයෙහි උපන්නාවූ ඒ සත්ත්වයන්ගේ ජනක අකුසල කර්මයට හිංසා කොට උප පීළක කුසල කර්මය විපාක දීම් වශයෙන් යහපත් වූ ආර්‍ය්‍යයන් වහන්සේගේ රූපය දැකීමද, ධර්ම ශබ්දය ඇසීමද, කුසල විපාක වශයෙන් සිදු වූ බව දතයුතුයි.

## උප ඝාතක කර්මය

ජනක කර්මයාගේ විපාක ශක්තිය සිඳ, තමාගේ විපාකය දීමට අවකාශ ගන්නාවූ කර්මය **උප ඝාතක කර්මය** නම් වේ. **උප-**

**ඝාතක කර්මයද, කුසල උපඝාතක කර්මය, අකුසල උපඝාතක කර්මය** යයි දෙවැදෑරුම් වේ. ඒ දෙවැදෑරුම් උපඝාතක කර්ම, ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක ද දෙති.

**කුසල උපඝාතක කර්මය,** අකුසල ජනක කර්මයද, කුසල ජනක කර්මය ද නසා තමාගේ විපාකය ගෙන දෙන්නේය. ආහාර දානමය කුසල කර්මයකින් ප්‍රතිසන්ධි විපාක ගෙණ දීම පිණිස මරණාසන්නයේදී එය කර්ම අරමුණක් වශයෙන් ඉදිරිපත් වූ කල්හි වස්ත්‍රදානමයවූ කුසල කර්මය, උපඝාතක කුසල කර්මයක් වශයෙන් ඉදිරිපත්ව ආහාර දානමය ජනක කුසල කර්මයාගේ විපාක ශක්තිය නසා තමාගේ විපාකය ගෙන දීම, කුසල උපඝාතක කර්මයෙන් ජනක කුසල කර්මය, නැසීම නම් වේ.

ප්‍රාණඝාත අකුසල ජනක කර්මයක් ප්‍රතිසන්ධි විපාක ගෙණ දීමට ඉදිරිපත් වූ කල්හි විහාරදානමය කුසල උපඝාතක කර්මයක් පැමිණ, ප්‍රාණඝාත අකුසල විපාක ශක්තිය නසා තමාගේ ප්‍රතිසන්ධි විපාකය ගෙණදීම කුසල කර්මයෙන් අකුසල ජනක කර්මය නැසීම නම් වේ.

සුනඛයෙක් මැරූ ප්‍රාණඝාත අකුසල ජනක කර්මය ප්‍රති සන්ධි විපාක දීම පිණිස ඉදිරිපත් වූ කල්හි, ගවයෙකු මැරූ ගව ඝාතක අකුසල කර්මය පැමිණ සුනඛ ඝාතක අකුසල ජනක කර්මයාගේ ප්‍රතිසන්ධි විපාක ශක්තිය නසා තමාගේ ප්‍රතිසන්ධි විපාකය ගෙණ දීම අකුසල උපඝාතක කර්මයෙන් අකුසල ජනක කර්ම ශක්තිය නැසීම නම් වන්නේය.

ජලය දන්දීම නම්වූ උදකපූජා සඞ්ඛ්‍යාත කුසලජනක කර්මයක්, ප්‍රතිසන්ධි විපාක දීමට ඉදිරිපත් වූ කල්හි, පක්ෂියෙකු මැරූ උපඝාතක අකුසල කර්මය පැමිණ පළමු කුසල ජනකකර්මයෙහි විපාක ශක්තිය නසා තමාගේ අකුසල විපාක ශක්තියෙන් ප්‍රතිසන්ධිය ගෙණදීම අකුසල උපඝාතක කර්ම යෙන් කුසලජනක කර්මය නැසීම නම් වන්නේය.

ප්‍රවෘත්ති විපාක දෙන්නාවූ කාලයෙහිද, මෙසේම කුසලා කුසල උපඝාතක කර්ම, පළමුව ප්‍රවෘත්ති විපාක දෙන්නට ඉදිරිපත්වූ කුසලාකුසල විපාක ශක්තිය නසා තමාගේ විපාකය දෙන බව දත යුතුයි.

මේ හැම අවස්ථාවේදීම බලවත්වූ උපඝාතක කර්මය දුර්වල වූ ජනක කර්ම ශක්තිය නැසීම මිස දුර්වල උපඝාතක කර්මය විසින් බලවත් ජනක කර්ම ශක්තිය නැසීමට අසමර්ථ වේ.

ගොවියෙකු විසින් තමාට භාර ක්ෂේත්‍රය මැනවින් පිළියෙල කොට ධාන්‍ය බීජ වපුරා, එම ශෂ්‍යයට උපකාර පිණිස දිය බැඳීම්, පොහොර දැමීම්, රැකවල් ලීම්, නෙළීම් ආදිය කොට සිටිනා කල්හි, අධික සූර්ය සන්තාපය කරණකොට ගෙණ දිය සිඳීමෙන් ශස්‍ය, ම්ලානිකව ස්වල්ප කලකට පසු ලැව්ගින්නක් හටගෙන ඒ ශෂ්‍ය යන් දවා විනාශවී ගියාක් මෙන්, කෙතෙහි බීජ වැපිරීම නැමැති ජනක කර්මයාගේ ශක්තියෙන් ප්‍රතිසන්ධිය ලබාගෙණ ශෂ්‍ය රැකීම නම්වූ උපස්ථම්භක කර්මයාගේ උපකාරයෙන් වර්ධනය වන කල්හි දිය වියලි යාමෙන් ශෂ්‍ය ම්ලානික වීම වැනි වූ උපපීළක කර්මයෙන් හිංසා ලැබ අනතුරුව ලැව්ගින්නෙන් විනාශ වන්නාක් මෙන් උපඝාතක හෙවත් උපච්ඡේදක කර්මයෙන් ජන්ම කර්ම ශක්තිය සම්පූර්ණයෙන්ම මැඩලන්නේය.

තවද, දෙව්දත් තෙරනුවන්, ජනක කුසල කර්මයාගේ ශක්ති යෙන් ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලබා ගත්තේය. එමෙන්ම උපත්-ථම්භක කුසල කර්මයාගේ උපකාරයෙන් සස්නෙහි පැවිදිව අෂ්ට සමාපත්ති උපදවා ගත්තේය. පසුව බුදුන්වහන්සේට අනතුරු කරන්නට යාමෙන් අකුසල උපපීළක කර්ම රැස්කොට එයින් ජනක කර්මයට හිංසා පමුණුවා ගත්තේය. අවසානයේදී, සංඝ භේදය කොට ඒ උපඝාතක කර්මයේ බලයෙන් ජනක කර්ම ශක්තිය විනාශ කොට එම ආත්මයෙන්ම අවීචිමහා නිරයට යැවිය.

## ගරුක කර්මය

බරවූ කර්මය හෙවත් අන් කර්මයකින් තමන්ගේ විපාක ශක්තිය වැළැක්විය නොහැකි කර්මය **ගරුක කර්මය** හෙවත් **ගරු කර්මය** නම් වන්නේය.

**අකුසල ගරු කර්මය, කුසල ගරු කර්මය** යයි ගරු කර්ම දෙවැදෑරුම් වේ.

**නියත මිථ්‍යාදෘෂ්ටියත්, පඤ්චානන්තරිය කර්මත් අකුසල ගරු කර්ම** නම් වෙත්

**රූපාවචර, අරූපාවචර කුසල කර්මයෝ** කුසල ගරු කර්ම නම් වෙත්.

## නියත මිථ්‍යාදෘෂ්ටිය

ශාස්වත, උච්ඡෙද වශයෙන් හෝ පරලොවක් නැත, මැරී උපදින සත්ත්වයෙක් නැත, කුසලාකුසල කර්ම නැත, කර්ම විපාක නැත යනාදී වශයෙන් හෝ **නාස්තික දෘෂ්ටි, අහේතුක දෘෂ්ටි, අකිරිය දෘෂ්ටි** වශයෙන් හෝ ගැණීම **නියත** මිථ්‍යා **දෘෂ්ටි** නම් වේ. එසේ නියත මිථ්‍යාදෘෂ්ටි ගත්. පුද්ගල තෙමේ, මරණයට අනතුරු අත්බැව්හි ඒකාන්තයෙන්ම **අවීචිමහා නිරයෙහි** උපදින්නේය. මෙතෙමේ ඉතා දීර්ඝ කාලයක් නිරය දුක් විඳ කල්ප විනාශ කාලයෙහි එකවිට නස්නා කෙළ ලක්ෂයක් ලෝකධාතුන්ගෙන් පිටත්හි අවීචිමහ නිරයයන්හි ඉපිද දුක් විඳිමින් අනන්ත අප්‍රමාණ කාලයක් එහිම පැසෙන්නේය.

මිථ්‍යාදෘෂ්ටි අකුසලය ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරින් යම්කිසි සිතකින්ම සිදු වන්නේය. එම අකුසල සිත්හි මෝහයත් දිට්ඨියත්බලවත්වන බැවින් අනිෂ්ට විපාකද බලවත් වේ. මෙහි පටිසන්ධි විපාකය සත්වන ජවනයෙන්ම සිදුවේ.

## පඤ්චානන්තරිය කර්ම

**ආනන්තරිය කර්ම** පසෙකි. එනම්;-

1. **මාතෘඝාතක කර්මය**
2. **පිතෘඝාතක කර්මය**
3. **අරහන්ත ඝාතක කර්මය**
4. **ලොහිතුප්පාදක කර්මය**
5. **සංඝ භෙද කර්මය**

මේ කර්ම පසම මිනුෂ්‍යයෙකුට මුත්, අමනුෂ්‍යයෙකුට කළ නොහැකි වේ. **පඤ්චානන්තරිය කර්ම** අතුරෙන් යම්කිසි කර්මයක් කළ පුද්ගලයෙක් විනම් එම අත්බැව්හිම කොපමණ කුසල් කළත් මරණින් මතු ඒකාන්තයෙන්ම අනතුරු අත්බැව්හිම අපායොත්පත්තිය ලබන්නේමය. එහෙයින්ම එයට **ආනන්තරිය කර්මය** යයි කියනු ලැබේ. හෙතෙම ඔසුපත් නිරයයන් ඇතුළු අටමහ නිරයයන් අතුරෙන් යම්කිසි නිරයක ඉපිද, කල්පාන්තය තෙක් දුක්විඳ එයින් මිදෙන්නේය. එහි ප්‍රතිසන්ධි විපාකය තුන්වන අත්බැව්හි ගෙන නොදෙන්නේය. කල්ප විනාශයට දස දිනකට පෙර ආනන්තරිය කර්මයක් කෙළේවිනම් ඒ පුද්ගල තෙමේ දෙවන අත්බැව්හි ලැබිය යුතු අපාය දුකින් මිදෙන්නේය. අපායෙහි දෙතුන් දිනක් දුක් නොවිඳින හෙයිනි. මේ ගරු කර්මය සත්වන ජවන් සිතින්ම සිද්ධ කරණු ලබන්නක් බැවින් දෙවන ආත්මභාවයෙහි පටිසන්ධි විපාක නුදුනහොත් එම සත්වන ජවන කර්මය **අහෝසි කර්මයක්** වන්නේය. නමුත්, එම අර්ථසාධක ජවන වීථීන්හි දෙවන, තුන්වන, සතරවන, පස්වන, සවන ජවන චේතනාවන්, අපරාපර්‍ය්‍ය වේද්‍ය වශයෙන් අවස්ථා පැමිණිකල්හි, අපාය ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාකද දෙන බැව් සැළකිය යුතුයි. මහ මුගලන් මහ රහතන් වහන්සේ, පෙර සංසාරයෙහිදී කළාවූ මාතෘඝාතක, පිතෘඝාතක කර්මයන්ගේ දෙවන චේතනාදීවූ අපරාපර්‍ය්‍ය වේද්‍ය අකුසල කර්මයක් හේතුකොටගෙණ රහත්වූ අත්බැව්හි සොරු පන්සියයක් විසින් තලා මරා දැමීමෙන් පිරිනිවන් පෑයේයි.

ආනන්තරිය කර්මයක් කළාවූ පුද්ගල තෙමේ ඒ කර්මය වළක් වන පිණිස කොපමණ කුසල කර්මයන් රැස් කෙළේවී නමුත්, බුදුපාමොක් මහ සඟනට මහ දන් දුන්නේ වී නමුත්, අනතුරු අත්බැව්හි අපායොත්පත්තිය ඒකාන්තයෙන්ම වැළැක්විය නොහැකි වේමැයි. අජාසත් රජ තෙමේ පිතෘ ඝාතක ආනන්තරිය පාපකර්මය කොට, ලොහිතුප්පාදක සංඝ භෙද කර්මයන්ට සහායව සිට, මැත භාගයෙහි සාමඤ්ඤ ඵල සූත්‍රාන්ත ධර්ම දේශනාව අසා, තමා කළාවූ පව් ගැන පසුතැවිලි වී බුදුන් වහන්සේ කමා කරවාගෙණ මේ ශාසනයෙහි අචල ශ්‍රද්ධාවන්ත උපාසකයන් කෙරෙන් අග්‍රයයි, අග තනතුරු ලබා බුද්ධ පරිනිර්වාණයෙන් පසු ප්‍රථම මහා සඞ්ගායනාව පිණිස සප්තපර්ණි ගුහා සමීපයෙහි කෙළ ලක්ෂයක් ධන වියදම් කොට සඞ්ගාය-

නා ධර්ම මණ්ඩපය කරවා, තුන් මසක් මුලුල්ලෙහි මහා කාශ්‍යපාදී පන්සියයක් මහරහතන් වහන්සේට මහ දන් දී පන්දහසක් අවුරුදු මේ ශාසනය නිර්මලව පවත්නා පිණිස උපස්ථම්භක වූයේ නමුත් සැට දහසක් අවුරුද්දට ආයු ඇත්තාවූ ලොහොකුඹු නරකයෙහි ඉපිද, අද දක්වා එහි දුක් විඳින්නේය.

මේ පඤ්චානන්තරිය කර්ම අතුරෙන් සංඝභෙද කර්මය අන් හැමටම වඩා බලවත් පාප කර්මයකි. සංඝ භෙදය කරන තැනැත්තා සම්බුද්ධ ශාසනයටම අන්තරාදයක කාරණයක්ම කරන්නේය. එබැවින් ආනන්තරිය කර්ම පසම යම් පුද්ගලයෙකු විසින් කරණ ලද්දේ නම්, එයින් සංඝභෙද පාපකර්ම යෙහි ප්‍රතිසන්ධි විපාකම ගෙනදෙන්නේය. අවශෙෂ කර්ම චතුස්කයෙහි සත්වන ජවනයාගේ ප්‍රතිසන්ධි විපාක අහෝසි වේ.

සඞ්ඝභෙද කර්මය හැර අවශෙෂ කර්ම සතර කෙළෙව්විනම් ලොහිතුප්පාදක කර්මය විපාක දෙයි. ඉතිරි කර්මත්‍රයෙහි ලදවන ආත්ම භාවයෙහි ලැබිය යුතු පටිසන්ධි විපාක ශක්තිය අහෝසි වෙයි.

සංඝ භෙද ලොහිතුප්පාදක කර්ම දෙක හැර ඉතිරි කර්මත්‍රය කෙළෙව්විනම් අරහන්ත ඝාතක කර්මය විපාක දෙයි. ඉතිරි කර්මද්ව-යේ සත්වන ජවන යෙහි ප්‍රතිසන්ධි විපාක ශක්තිය අහෝසි වෙයි.

මාතෘඝාතක පිතෘඝාතක කර්මද්වය කෙළෙව්විනම්, පියා සුසිල-වන්තයෙක් වී මව දුශ්ශීල වීනම්, පිතෘඝාතක කර්මය විපාක දෙයි. මව් පිය දෙදෙනාම දුශ්ශීල නම් මාතෘඝාතක කර්මය විපාක දෙයි. මව්පිය දෙදෙනාම සිල්වත් නම්, මාතෘ ඝාතක කර්මයම විපාක දෙයි. මෙසේ වීමට හේතුව, මව්පිය දෙදෙනා අතුරෙන් මවගේ ගුණය මහත්වන හෙයිනි.

සියළු අකුසල් අතුරෙන් බලවත්වූ අකුසල ගරු කර්මය, නියත මිථ්‍යා දෘෂ්ටිය යි. දෙවන ගරු කර්මය පඤ්චානන්තරිය කර්මයයි. පඤ්චානන්තරිය කර්ම සිදුවන්නේ දෞමනස්ස සහගත පටිඝ සම්ප-යුත්ත අකුසල ජවන චිත්ත වීථියෙහි සත්වන ජවන චේතනා ශක්ති යෙනි.

නාස්තික දෘෂ්ටිය, අහේතුක දෘෂ්ටිය, අකිරිය දෘෂ්ටිය යන ත්‍රිවිධ මිථ්‍යාදෘෂ්ටියත් පඤ්චානන්තරිය කර්මත් එක්කොටගත් කල්හි **අට්ඨමිච්ඡත්ත** යයි කියනු ලැබේ.

## කුසල ගරු කර්ම

ඒකාන්තයෙන්ම දෙවන අත්බැව්හි ප්‍රතිසන්ධි විපාක ගෙන දෙන්නාවූ කුසල ගරු කර්මයෝ නම් රූපාවචර, අරූපාවචර ධ්‍යානයෝයි. ලොකොත්තර කුසල් ප්‍රතිසන්ධි විපාක නොදෙන හෙයින් මේ ගරු කර්ම වලට ඇතුළත් නොවෙති. ප්‍රථමධ්‍යාන ලාභී පුද්ගල තෙමේ ධ්‍යානයෙන් නොපිරිහී කළුරිය කෙළේවිනම් ඒකාන්තයෙන්ම දෙවන ආත්මයෙහි ප්‍රථමධ්‍යාන රූපාවචර බ්‍රහ්ම ලොකයෙහි උපදින්නේය. අනිකුත් ධ්‍යානයන්ගේ ප්‍රතිසන්ධි විපාක දීමත් මෙසේමය.

ප්‍රථමධ්‍යානය පටන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය දක්වා ධ්‍යාන සියල්ලම උපදවාගත් පුද්ගල තෙමේ මතු අසවල් තැන උපදිම්වායි භූමි නියමයක් නොකොට කළුරිය කෙළේවිනම් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන භූමියෙහිම උපදින්නේය. හෙතෙම මරණාසන්න කාලයේදී යම් භූමියක උපදිම්වායි ප්‍රාර්ථනා කොට කළුරිය කෙළේවිනම්, පැතූ භූමියෙහිම උපදින්නේය. යම් හෙයකින් බඹලොව නිකාන්තිය අත්හැර දෙව්ලොව හෝ මිනිස් ලොව හෝ උපදිම්වායි පැතුයේවිනම්, එම ධ්‍යාන චිත්ත වීථීන්හි පරිකර්මාදී කාමාවචර කුසල කර්ම බලයෙන් සප්ත කාම භූමියෙහි මහෙශාක්‍ය දිව්‍යරාජයෙක් හෝ ශ්‍රෙෂ්ඨ මිනිසෙක් හෝ වන්නේය.

## ආසන්න කර්ම

මරණාසන්න කාලයේදී කරණ ලද්දවූ හෝ. රැස්කරණ ලද්ද වූ හෝ සිහිපත් කරණ ලද්ද වූ හෝ කර්මය **ආසන්න කර්මය** නම් වේ

**ආසන්න කර්මයද, කුසලාසන්න කර්මය, අකුසලාසන්න කර්මය යයි** දෙවැදෑරුම් වේ.

මරණාසන්න කාලයෙහි කළාවූ කුසල කර්මද, එයට පූර්වයෙහි නොහොත් මරණයට ස්වල්ප කලකට පෙර කරණ ලද කුසල කර්ම ද, පූර්වයෙහි කරණ ලදුව මරණාසන්න කාලයේදී සිහිපත් කලාවූ කුසල කර්මද **කුසලාසන්න කර්ම** නම් වේ. දෙවන භවයෙහි පටිසන්ධි දීම පිණිස ගරු කර්මයක් නැත්තේ වී නම්, මේ ආසන්න කර්මය ම ඉදිරිත්වී පටිසන්ධි විපාක දෙන්නේය.

දුටුගැමුණු මහරජ, චුල්ලඞ්ගණිය යුද්ධයෙන් පැරද චුල්ලු-පට්ඨාකතිස්ස ඇමැතියා සමග වනයට වැද, අතිශය බඩසයින් පෙළෙන කල්හි, කැයුත්තක් ඇත්දැයි ඇමැතිගෙන් අසා, ඔහු විසින් ගෙණෙන ලද බත් තලිය දක්වූ කල්හි එය සතර කොටස කට බෙදන්නට නියම කෙළේය. රජුටත්, ඇමැතිටත්, අස් වෙළඹටත් යයි තුන් කොටසක් වියයුතු තැන සතරවැනි කොටස කුමටදැයි ඇමැති විසින් විචාළ කල්හි, තමා දැනගත් තැන් සිට කිසි කලෙක දනක් නො දී ආහාර අනුභව නොකළ බව කී කල්හි, මේ වනයෙහි දන් පිළිගන්නට කවුරු සිටිනේදැයි ඇමැති ඇසීය. එබස් අසා මහරජ සැදැහැ ඇතොත් ආයඝියන් දුර්ලභ නොවේ යයි පවසා හුනස්නෙන් නැගිට අහස දෙස බලා ''ආයඝියෝ ඇත්නම් දැන් මේ අන්තරායට පැමිණියාවූ අපගේ දනය පිළිගැණීමට වඩනා සේක්වා යි පැවැසීය. එකල්හි පුවඟු දිවයින දෙළොස් දහසක් භික්ෂූන් සමග දන් පිණිස වැඩහුන්නාවූ පිණ්ඩපාතිකතිස්ස මහරහතන් වහන්සේ රජුගේ මේ ආරාධනය දිවැකනින් අසා, අනාගතයෙහි බුදුසසුන් හොබවන රජුගේ ශ්‍රද්ධාව පිරිහී ගියේවීනම් නපුරැයි සිතා, ඒ භික්ෂූන් සිටියදී, පාසිවුරු ගෙන සැනෙකින් අහසින් වැඩ මහරජු ඉදිරියෙහි සිටි කල්හි, අධික ශ්‍රද්ධායෙන් ඉපිලී ගිය සිතැති රජ තෙමේ තම කොටසත් සමග පිණ්ඩපාතයට තැබූ කොටස රහතන් වහන්සේට පිදීය. ඇමැති තෙමේ ද මෙය දැක තම කොටසත් රහතන් වහන්සේට පුද සිටි කල්හි අස් වෙළඹගේ ද කොටසත් දෙනු කැමැත්ත හැඟවූ බව දැක එම කොටස ද පිදීය. මහරහතන් වහන්සේ ද. වහාම අහසින් වැඩ රජහුගේ කුසලය මහත් වේවායි සිතා දෙළොස් දහසක් භික්ෂූන් වහන්සේට එම දනය පිළිගන්වා අවසානයේදී තෙරුන්වහන්සේ මහරජ ක්ෂුධාවෙන් පිඩිතව සිටින බව දැන, පාත්‍රය සෝද, ප්‍රණීතාහාරයෙන් පුරවා අහසට දැමීය. එකෙණෙහිම ඊන් පාත්‍රය රජුගේ අතෙහි පිහිටියේය. රජතෙමේ ඉතා සතුටින්

ඇමැනි හා අස් වෙළඹින් සමග බත් අනුභව කොට පාත්‍රය සෝද හිස් පාත්‍රය ●ආපසු යැවීම නුසුදුසු යයි සිතා, තමා පැළඳි ලක්ෂයක් අගනා කසී සලුව පාත්‍රයෙහි බහා අහසට දමූ කල්හි තෙරුන් වහන්සේගේ අතෙහි පිහිටියේය.

පසු කාලයෙහි රජ තෙමේ නැවතත් යුද කොට ජය ගෙණ අනුරාධපුරයෙහි රුවන්වැලිසැය , ලොහප්‍රාසාදය, නැනවීම් ආදී මහ පින්කම් කොට ක්‍රමයෙන් ආයු ගෙවී මරණමඤ්චකයෙහි හුන්නේ, පින් පොත කියවන්නට නියමකොට චුල්ලඞගණිය යුද්ධයෙන් පැරද වනයෙහි සැහවී සිටින කල්හි දෙන ලද මේ දනය සිහිකරවන කල්හි අන් හැම පින්කමකටම වඩා ප්‍රීතිය ඉපිද, එයම කර්ම නිමිත්තක් වශයෙන් මරණාසන්න ජවනයන්ට අරමුණුවී කළුරිය කොට තුසිපුර-යෙන් ගෙණෙන ලද දිව්‍ය රථයෙහි පහළවී, දෙව් පිරිස් සහිතව මහ සෑය පැදකුණු කොට තුසි පුරය බලා පිටත්විය. මෙසේ පූර්වයෙහි කරණලද මේ කුසල කර්මය මරණයට ආසන්නවූ කල්හි අන් හැම පිංකමකටම පෙරටුව පැමිණ විපාක දීමට අවකාශ ගත්තේය.

තවද, රජගහනුවර වැසි තම්බදඨික නම් චොර ඝාතක තෙමේ දිවිහිමියෙන් මනුෂ්‍ය ඝාතනය කොට මරණාසන්න කාලයෙහි සැරියුත් මහතෙරුන් වහන්සේ මගදී හමුවී තම ගෙට වැඩමවා ගෙණගොස් තමා පිණිස පිසූ බත වළඳවා, දහම් අසා, නොබෝ කලකින් කළුරිය කොට ඒ මනුෂ්‍යඝාත අකුසල කර්මය වළක්වා දන් දී බණ ඇසූ කුසල කර්මය ආසන්නයට පැමිණ සුගති පටිසන්ධිය ලබාගත්තේය. මෙය කුසලාසන්න කර්මයාගේ ඵලවිපාකයෝ යි.

යදසන්න හෙවත් ආසන්න අකුසල කර්මයද, මෙසේම විපාක දෙන්නේය. ලක්දිව අන්තර ගඞගා නම් ගම **මහා වාචකාල** නම් උපාසකයෙක් බුදුසස්නෙහි පැහැද, දනාදී කුසල් කරමින් සිට, මාර්ගඵල උපදවනු පිණිස ධ්‍යානභාවනා කරමින්, තිස් අවුරුද්දක් මුළුල්ලෙහි උත්සාහ කොට සෝවාන් මාර්ග ඵල තබා ආලෝකයක් වත් නොලැබ, කලකිරුණු සිත් ඇත්තේ, බුද්ධ ශාසනය නෛර්‍යා-ණික නොවේය. ශුද්ධවූ ශාසනයක් නම් මෙතෙක් කළ භාවනායෙන් ඵල ලැබියයුතු යයි යනාදි වශයෙන් අනාදර උපදවා තමාගේ නුවණ නුමුහු කළ බව නොසිතා වැරැදි දෘෂ්ටි ගෙණ මරණාසන්න

යේදී එයම ආසන්න කර්මය වශයෙන් අරමුණු වී කළුරිය කොට මහවැලි ගඟ මහත් ශරීරයක් ඇති කිඹුලෙක් ව උපන්නේය. දිනක් මේ කිඹුලා ගොදුරු සොයා ඇවිදින්නේ කසාතොටට පැමිණියේය. ගල්ටැම් පිරූ ගැල් සැටක එපමණ බර අදින්නට සුදුසු පමණ ගව සමූහයක් යොදා, ගැල් මෙගොඩ ගෙනෙනු පිණිස කසාතොටට පැමිණ මෙගොඩ එළවූහ. එකල්හි ඒ ටැම් පිරූ ගැල් සැටත් එය අදනා ගව සමූහයත් යන සියල්ලම ඒ කිඹුලා ගිලිමින් ක්ෂුද්‍රව සංසිඳුවා ගත නොහැකි විය. මෙය බුද්ධ ශාසනය පිළිබඳ ව වරදවා සිතා අනාදර කොට ලද්දවූ අකුසලාසන්න කර්මයාගේ විපාකය වේ.

## ආචීර්ණ කර්මය

නිරන්තරයෙන් කරණ ලද්දවූ වැදි කෙවුල් ආදී කර්මාන්ත හෝ එක් වරක් කරණ ලද්දවූ යම් කුසල කර්මයක් හෝ අකුසල කර්මයක් හෝ, නිරන්තරයෙන් සිහිපත් කරන්නේ වීනම්, ඒ කර්මය **ආචීර්ණ** හෙවත් **යද්බහුල** කර්මය නම් වේ. යමෙක් බලවත් වූ කුසල කර්මයෙහිත් සොම්නස් උපදවාද, අකුසල කර්මයෙහි බලවත් වූ සන්තාපය හෙවත් තැවිල්ල උපදවා ද, එයද **ආචීර්ණ** කර්ම නම් වන්නේය. දුර්වලවූ කර්මය මර්දනයකොට ආසෙවන වශයෙන් බහුල වූ හෝ, කුසලා කුසල කර්මය ආචීර්ණ කර්මයක් වශයෙන් විපාක දෙන්නේය.

## කටත්තා කර්මය

**ගරු කර්ම, ආසන්න කර්ම, ආචීර්ණ කර්ම** යන කර්මයන් හැර අවශෙෂ වූ ද, එක්වරක් පමණක් කොට සිහියෙන් තුරන් කරන ලද කර්ම **කටත්තා කර්ම** නම් වන්නේය. මේ කර්ම ඉතා දුර්වලයහ. නමුත් ස්වල්ප වූ කර්මයක් කොට නැවත නැවත සිහිපත් කිරීමෙන් ආසේවන ප්‍රත්‍ය ලද්දේවීනම්, අන්‍ය වූ තුන්වැදෑරුම් කර්ම, මරණාසන්නයේදී, අරමුණු නොවූ කල්හි, ප්‍රතිසන්ධි විපාක දීමට අවකාශ ලබා ගන්නේය. ආසේවන ප්‍රත්‍ය නොලත් කුසලාකුසල කටත්තා කර්මයන්ට ප්‍රතිසන්ධි විපාක ගෙණ දීමේ ශක්තියක් නැත.

මේ සතර විධ කර්මයන් අතුරෙන් **ගරු කර්මය** පළමුකොට විපාක දෙන්නේය. ගරු කර්ම නැති කල්හි ආසන්න කර්මයක් ප්‍රතිසන්ධි විපාක දෙන්නේය. ගරු කර්ම, ආසන්න කර්ම දෙකම නැති කල්හි **ආචීර්ණ කර්මය** විපාක දෙන්නේය. මේ තුනම නැති කල්හි ආසේවන ප්‍රත්‍යය ලැබූ **කටත්තා කර්මය** ප්‍රතිසන්ධි විපාක දෙන්නේය.

ගව ගාලට ඇතුල් කරණු ලබන ගවයන් අතුරෙන් අන්තිමට ඇතුල් කරණ ලද දිරාපත් වූ මහළු ගවයෙක්, අනික් තැනක් නොලැබ ගාල් දොරටුව සමීපයෙහි ලැග සිට, නැවත දෙවන දවස්හි දොර හරනා කල, ඒ දොර සමීපයෙහි හුන් ගවයා දුර්වලයෙක් නමුත් අන් හැමටම පළමුව ගාලෙන් නික්මෙන්නාක් මෙන්, දුර්වල නමුත් ආසන්න ආචීර්ණ කර්මයන්ට පළමුව ප්‍රතිසන්ධි විපාක දීමට අවකාශ ලබා ගන්නේය.

## දිට්ඨධම්ම වෙදනීය කර්මය

මේ ආත්මභාවයේදීම, කර්මය කළාවූ ස්කන්ධයන්ටම විපාක දෙන කර්මය **දිට්ඨධම්ම වෙදනීය** කර්ම නම් වේ. කුසලාකුසල ජවන් උපදනා චිත්ත වීථින්හි ජවන් සිත් සත අතුරෙන් පළමුවෙනි ජවන් සිතෙහි යෙදුනාවූ චෙතනා චෛතසිකය දිට්ඨධර්ම වෙදනීය කර්මය වන්නේය. මේ කර්මය හෙවත් පළමු වෙනි ජවන් සිත, අන්‍ය ජවනයන්ගෙන් ආසේවන ප්‍රත්‍යය නො ලැබූ හෙයින්, ප්‍රතිසන්ධි විපාක ගෙණදීමට ශක්තියක් නැත. මේ කර්මයාගේ ශක්තියෙන් ප්‍රවෘත්ති විපාක ඉහාත්මයෙහිදීම ගෙණ නුදුනහොත් එය අහෝසි කර්මයක් හෙවත් අභාවයට පත්, විපාක නොදෙන කර්මයක් බවට පැමිණෙන්නේය.

**දිට්ඨධම්ම වෙදනීය කර්මය, කුසල දිට්ඨධම්ම වේදනීය කර්මය, අකුසල දිට්ඨධම්ම වෙදනීය කර්මය** යයි දෙවැදෑරුම් වේ. මේ දෙවැදෑරුම් කර්ම අතුරෙන් **දිට්ඨධම්ම වෙදනීය** දානමය කුසල කර්මය අතිශයින් මහත් වූ විපාක දීමේ ශක්තියක් ඇති කර්මයක් වීමට ප්‍රධානකොට කරුණු සතරක් සම්පූර්ණ විය යුතුය. එනම්:—

1. සම්පූර්ණ ධ්‍යානාභිඥලාභි බුදු පසේබුදු මහරහතන් වහන්සේ කෙනෙක් ලැබීමය.

2. ධාර්මික වූ දන වස්තුවක් ලැබීමය.

3. ප්‍රතිග්‍රාහක තෙමේ එදවස්හි නිරොධ සමවතින් නැගී සිටින බවය.

4. දයක තෙමේද පූර්ව චෙතනා, මුඤ්චන චෙතනා, අපර චෙතනාවන්ගෙන් පිරිසුදු වූ, සම්පූර්ණ වූ ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, ප්‍රඥවන් ගෙන් යුක්ත වන බවය.

මේ සතරාඞ්ගයන් ගෙන් සම්පූර්ණ වූ දිට්ඨධම්ම වෙදනීය කුසල කර්මය, එම භවයෙහි එම දවස්හි වුවත් අප්‍රමාණ සම්පත් ලබාදීමට පොහොසත් වන්නේය. ආසේවන ප්‍රත්‍ය නො ලැබීමෙන් දූර්වල වූ හෙයින් ප්‍රතිසන්ධි විපාක නොදියහැකි නමුත්, එම කර්මය කළාවූ පඤ්චස්කන්ධයටම සහේතුක කුසල විපාක මාත්‍රයක් දියහැකි වේ.

මුව දඩයම පිණිස වනයට වැදි පුරුෂයෙකු විසින් මුවන් එන මග බලා මුවකු මරණ අදහසින් වෙඩි පහරක් යැවූ කල්හි ඒ වෙඩි පහර ඒ මුවාට වැදුනේවීනම් මුවා බිම වැටෙන්නේය. පහර වැරදුනහොත් මුවා පැනගොස් නැවත ඒ පුරුෂයා හට සොයා ගත හැකි නොවන්නේය. දිට්ඨධම්මවෙදනීය කර්මයද එසේමය අවකාශ ලද හොත් එම ආත්මභාවයේදී ම විපාක දෙන්නේය. නැතහොත් වෙනත් ආත්මයක දී විපාක දීමට නොහැකිවේ.

පෙර රජගහනුවර බිම්සර රජු දවස **කාකවලිය** නම් දූගියෙක් බැළමෙහෙයට ගිය කල ඕහුගේ භාර්‍ය්‍යාතොමෝ ආහාර පිණිස කිසිවක් නොලදින් ඇඹුල් කැඳක් පමණක් පිස තම සැමියා එනතෙක් මග බලා සිටි කල්හි, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ නිරොධ සමවතින් නැගිට ලොව බලනුයේ කාකවලිය නම් මහ දූගියා හට වැඩ සිදුකරණු කැමැතිව ඔහුගේ ගෙදෙර පිඬු සිහා වැඩි සේක. එකල්හි දූගි භාර්‍ය්‍යාතොමෝ රහතන් වහන්සේ කෙරෙහි පැහැදී දනක් දෙනු කැමැතිව පාත්‍රය ගෙණ ඇඹුල් කැඳ එහි බහා පිළිගැන්

වූවාය, මහාකාශ්‍යප මහරහතන් වහන්සේද කැඳ පාත්‍රය පිළිගෙණ වෙහෙරට වැඩ ලොව්තුරා බුදුන් වහන්සේට පිළිගැන්වූ කල්හි, බුදුරජාණන් වහන්සේ අනිකුත් පන්සියයක් දෙනා වහන්සේට ද ස්වල්ප වශයෙන් බෙදු තමන් වහන්සේ ද වැළඳූ සේක. කාකවලිය තෙමේද, බැළමෙහෙ ගන්නවුන් සොයමින් ක්‍රමයෙන් දෙව්රම් වෙහෙර දෙසට ගියේ කැඳ ස්වල්පයක් ලැබ, එය අනුභව කොට සිටි කල්හි, මේ යාගු දනයෙහි අනුසස් මහකසුප් තෙරුන් විසින් විචාරණ ලදුව, මෙයින් සත්වන දවස කාකවලිය නම් දුගී තෙම මහත් ඓශ්වය්‍යී ලැබ කාකවලිය මහා සිටානෝ යයි ප්‍රසිද්ධ වන්නේ යයි බුදුරජාණන් වහන්සේ වදළ සේක. මෙබස් ඇසූ දුගී තෙමේ ඉතා සතුටුව වහා තම නිවසට ගොස් මෙපවත් භාය්‍යීා වට දැන්වීය. මෙදවස්හි බිම්සර රජතෙමේ ද නුවර ප්‍රදක්ෂිණා කරනුයේ නගරාසන්න අමු සොහොනෙහි දිවස් හුල නැගූ පුරුෂ යෙකු දැක, රාජභොජනයෙන් බත් අනුභව කරන්නට කැමැති බව ඔහු විසින් හඬනගා කියනු අසා, නැවත රජගෙට පැමිණ රජ බොජුන් ඔහු වෙත යවන ලෙස නියෝග කෙළේය. රාජපුරුෂයෝද එය ගෙනයාමට සමර්ථ කෙනෙකු නොලැබ, රාජ නියෝගයෙන්ම දහසක් බැඳි පියල්ලක්වත් ගෙණ මෙය දෙවන්නට කෙනෙකු සොයා යන්නේ, කාකවලිය නම් දුගියාගේ භාය්‍යීා තොමෝ මෙපවත් අසා, එම කාය්‍යී ඉටුකර දීමට කැමැති බව දැක්වූ හෙයින්, ඈ රජු ඉදිරියට පමුණුවා, ඇගේ ඉල්ලීම පරිදි පුරුෂ වෙෂයෙන් පංචායුධ සන්නද්ධව සරසවාගෙණ බත් තලිය ගෙණ අමු සොහොන දෙසට පිටත්විය. අතරමග තල් ගසක් සමීපයෙන් ඈ යන කල එහි වසන **දීඝතළල** නම් එක්තරා යක්ෂයෙක් ඈ ගොදුරු කොට ගන්නා අදහසින් ඈ විචාළ කල්හි, තමා රාජ දූතයෙක් බව දන්වා සිටි හෙයින්, නුඹා ගෙනුත් අස්නක් ගෙණයාහැකි දැයි අසා, හැකි දෙයක් නම් කරමි කී කල්හි ''දීඝතළල නම් යක්ෂයාගේ භාය්‍යීාව වූ සුමන දෙව්රජුගේ දූ කාලි තොම පුතෙකු වැදූවාහයි කියමින් යව, එයට පඬුරු පිණිස මේ තල් ගස මුල තිබෙන නිධාන සත ගනුවයි'' යක්ෂයා විසින් කියන ලදුව ඈ එසේම හඬනගා කියමින් ගියාය. මෙසේ මදක් දුර කියමින් යන්නාවූ ඇගේ මේ වචනය ඇසූ සුමන දෙව්රජ තෙමේ සතුටුව ඈ ගෙන්වා තමන් වසන වෘක්ෂ මූලයෙහි තිබෙන බොහෝ නිධානයන් දක්වා එය ගනුවයි කීය. දෙවියන්ගෙන්ද බොහෝ සත් කාර ලැබ මෙසේ යන්නා වූ ඈ සොහොනට ගොස් දිවස්හුල හුන්

පුරුෂයාහට බිත දී, එය අනුභව කරවා, මුඛය පිටත වැකුණු ඉඳුල් පිස දමන්නට කී කල , ඈ ලංවී අතින් මුඛය පිස දැමීය. ඈගේ මොළොක් අත ස්පර්ශ වූ කෙණෙහිම ස්ත්‍රියක් බව වැටහී අනුරාග චිත්තයෙන් ඈගේ හිසකෙස් වැටිය තම කටින් ඩැහැගත්තේය. ඈ ද එය ගලවා ගත නොහී කඩුවෙන් කෙස් වැටිය කපා, ඔහුගේ මුඛයෙහි එය තිබිය දී ආපසු රජු වෙත ගොස් මෙපවත් සියල්ලම දන්වා යක්ෂයන් විසින් පවරණලද වස්තුව ද ගෙන්වා රජු ඉදිරියෙහි තැබිය. රජතෙමේ ද ඉතාසතුටුවී, කාකවලිය නම් දුගියා ගෙන්වා ඔවුන්ගේ පිනින්ම ලත් ඒ සියළු ධනය ඔවුන්ටම පවරා සිටු තනතුරෙහි පිහිටවූහ. එතැන් සිට ඔහු කාකවලිය මහා සිටානෝ යයි ප්‍රසිද්ධ විය. මෙය දිට්ඨධම්මවෙදනීය කුසල කර්ම විපාකයාගේ ස්වභාවයයි.

නවද, පූර්ණික නම් දුගියා සහ ඔහුගේ භාර්‍ය්‍යාතොමෝ ද, සැරියුත් මහ තෙරුන්ට දැවටු දඩු සහ පැනින්ද බත් පාත්‍රයකින්ද පුදා, එහි ආනිශංස වශයෙන් එදිනම තමා සී සෑ තැන් සියල්ලක්ම කිහිරි මල් පිඩක් සේ රත්රන් පිඩවලු ගැසී තිබෙනු දැක රජුට දන්වා රජු විසින් දෙන ලද සිටු තනතුරු ලබා **බහුධන සිටානන්** යයි ප්‍රසිද්ධ වී, ඔහු සහ ඔහුගේ භාර්‍ය්‍යාවත් උත්තරා නම් දියණියත් බුදු පාමොක් මහ සඟනට දන් දී දහම් අසා සොවොන් මාර්ගඵලයෙහි පිහිටි සැටියෙනුත් දිට්ඨධම්මවෙදනීය කර්ම විපාකය මැනවින් අවබොධ කරගත හැකි වේ.

දිට්ඨධම්මවෙදනීය කුසල කර්මය මෙන්ම දිට්ඨධම්ම වෙදනීය අකුසල කර්මය ද, එම ආත්බැව්හිම විපාක නුදුනහොත් අහෝසි කර්ම බවට පත් වන්නේය.

අප බුදුන් වහන්සේ සද්ධර්මාමෘත වර්ෂා වස්වමින් බුදුසසුන් හොබවමින් වැඩවසන කල්හි, තීර්ථකයන් හට ලාභ සත්කාර නැතිවීමෙන් කෝපයට පත්ව, සැවැත්නුවර **චිංචාමානවිකා** නම් පරිබ්‍රාජිකාවට උගන්වා, බුදුන් වහන්සේට අවමන් කරුණු සඳහා යෙදවීය. ඕතොමෝ ගැබිණියක් ලෙස සැරසී දෙව්රම් වෙහෙර අසළ හැසිරෙමින් මහජනයා හට සැක උපදනා පරිද්දෙන් නව මසක් පමණ කල් වැස, බුදුරදුන් සිව්වණක් පිරිස් මැද බුද්ධාශනාරූඪව වැඩහිඳ

දහම් දෙසනා කල්හි, තමාගේ බඩ, දර දඬු මිටියක් බැඳගෙණ දෙවුරත් බඩත් වසා පලසක් පෙරෙවගෙණ අතුල් පතුල් උදුම්වා ගෙණ, පිරිස් මැදට විත් නොයෙක් මුසා බස් බැණ සිටියාය. එකල්හි සක්දෙව්රජු තම අසුන් හුණුවූ බව දැන, ලොව බලනුයේ චිංචාමාණවිකාවන් දැක මහ පිරිස් මැද සත්‍ය හෙළිකළ යුතු යයි සිතා මූෂික වෙස් ගත් දෙවියන් සතර දෙනෙකු ලවා එකවර දර මිටිය බැඳ තිබූ වැල් කපවා බිම හෙළා සිටි කල්හි රැස්ව හුන් පිරිස් විසින් ඇ තලා පෙලා පන්නා දැමීය. මදක් තැන් ගිය කල්හි පොළොව පළා ආ අවිචිමහ නිරය ගිනිදැල් වෙලාගෙණ ගොස් අවීචියෙහි හෙළිය. මේ කථාවෙන් ද දිට්ඨධම්මවෙදනීය අකුසල කර්මයාගේ අනිෂ්ට විපාක එම අත්බැව්හි ලැබෙන සැටි දතහැකිවේ.

නවද, යසෝධරා දෙවින්ගේ පියා වූ සුප්‍රබුද්ධ ශාක්‍ය රජතෙම බුදුන් කෙරෙහි නිකරුණේ කිපෙමින්, ආරාධනා ලත් තැනකට දන් වළඳනු පිණිස මහ සංඝයා වහන්සේ සමඟ බුදුන් වඩනා දැක යා නොදෙමියි කියා වඩනා මග අවුරාගෙණ හිඳගත් කල්හි බුදුහු කරුණායෙන්ම ගමන් වළකා ආපසු වැඩ, අතරමගදී සිනහ පහළ කොට අනඳ මහ තෙරුන් විසින් එයට කාරණා විචාළ කල්හි සුප්‍රබුද්ධ ශාක්‍යයෝ අප ඇමට සිඟා යන්නට අවසර නොකළ අකුසලයෙන් අදට සත්වන දවස තමන්ගේ මාලිගාවෙහි යටමාලේ හිණිපාමුළදී පොළොව පළා වැද නිරයෙහි හෙන්නාහු වේදැයි වදළසේක. සුප්‍ර-බුද්ධ ශාක්‍යයන්ගේ සහචරයෙකු මෙබස් අසා ඔහුට දන්වා සිටි සල බුද්ධ වචනය බොරු කරණු සඳහා තම මාලිගයෙහි උඩුමා-ලෙටවැද, රැකවල් ලා සත්වන දවස වනතෙක් මෙහිම වසමියි ඉටාගෙණ සිටියේය. සත්වන දිනයෙහි දී සුප්‍රබුද්ධ ශාක්‍යයන්ගේ මංගල අශ්වයා උන්මත්තව ගැසෙන්නේයයි අසා, ඔහු සංහිඳවනු පිණිස උන් තැනින් නැගිට අකුසලානුභාවයෙන් හරනා ලද දෙරටු වලින් බැස, යට මාලේ හිණි පාමුලට පැමිණ සිටිසඳ, මහ පොළොව විවරව සුප්‍රබුද්ධයන් ඇදගෙන ගොස් අවීචියෙහි හෙළිය. මෙයද දිට්ඨධම්මවෙදනීය අකුසල කර්මයාගේ විපාකයෙකි.

නවද, දෙව්දත් තෙරුන් විසින් බුද්ධානන්තිය උගුලුවා සංඝ භෙද කොට බුදුන්ට අපරාධ ලෙස බොහෝ ප්‍රයෝග කරමින් වධ කළ

අකුසලානුභාවයෙන් ඕ හට මේ ආත්ම භාවයෙහි විපාක දීමෙන් භූමිය විවරකොට ගෙණගොස අවිචිමහා නිරයෙහි හෙළිමත් දිට්ඨධම්මවෙදනිය අකුසල කර්ම විපාකයෙකි.

තවද, සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් බිණුවාවූ අකුසල විපාකයෙන් දෙව්දත්හුගේ ශ්‍රාවක වූ කොකාලික මහණතෙම එම ආත්මභාවයෙහිම පොළොව පළාගෙණ ගොස් පදුම නම් නිරයෙහි පතිත කෙළේත් මේ දිට්ඨධම්මවෙදනිය අකුසල කර්ම විපාක ශක්තියෙනි.

තවද, නන්ද නම් ගොඝාතක තෙමේ, පණස් අවුරුද්දක් ගවයන් මරා ජීවත්වනුයේ දිනක් බත් අනුභව කරන්නට ගොස් මස් නැතිව පට්ටියෙහි හුන් ගොනෙකුගේ දිව කපා පුලුස්සා ගෙණවුත් බත් අනුභව කරන්නට තැත්කළ විට තමන්ගේ දිව මුලින්ම කැඩී බත් ගොඩෙහි වැටී මහ හඬින් හඬ හඬා කාල ක්‍රියා කොට නිරාගත වූයේත් දිට්ඨධම්මවෙදනිය අකුසල විපාකයකිනි.

තවද, නන්ද නම් යක්ෂයෙක් සැරියුත් මහ තෙරුන් වහන්සේට නිකරුණේ හිසට පහරක් ගැසූ අකුසලයෙන් එවිටම පොළොව පළාගෙණ අවිචියෙන් මහත් ගිනිකඳක් දිවවුත් හඬව හඬවා ඕහු වෙළා ඇදගෙන ගොස් අවීචියෙහි හෙළිය. මෙයද දිට්ඨධම්මවෙදනිය කර්ම විපාකයකි.

තවද, උත්පලවර්ණා මහා ස්ථවිරින්ගේ මයිලනුවන්ගේ පුත්‍ර වූ නන්ද මානවක තෙමේ අන්ධ වනයෙහි වැඩ විසූ උත්පලවර්ණා මෙහෙණින් වහන්සේට අපරාධකොට එකෙණෙහිම මහා පොළොව විවරවී ගිනිදැල් අවුත් නන්ද මානවකයා වෙළා ගෙණ ගොස් අවිචියෙහි හෙළිමත් මේ දිට්ඨධම්මවෙදනිය අකුසල කර්ම විපාක යෙකි.

## උපපජ්ජ වේදනිය කර්මය

අනතුරු අත්බැව්හි හෙවත් දෙවන ජාතියෙහි ප්‍රතිසන්ධි විපාක දෙන කර්මතෙමේ **උපපජ්ජ වෙදනිය කර්ම නම් වේ.** අර්ථසාධක

ජවන් උපදනා චිත්ත වීථීන්හි සත්වන ජවන් සිත්හි යෙදෙන චෙතනා චෛතසිකයට උපපජ්ජවෙදනීය කර්මය යයි කියනු ලැබේ මෙය ජනක කර්මය හා සමානය. ප්‍රථම ජවනාදී ජවන් සය විසින් රුකුල් දෙන ලද සත්වන ජවනය විසින් දෙවෙනි අත් බැව්හි පටිසන්ධි විපාකය හා ප්‍රවෘත්ති විපාකද උපදවනු ලැබේ.

**උපපජ්ජවෙදනීය කර්මයද** කුසලාකුසල වශයෙන් දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් කුසල උපපජ්ජවෙදනීය කර්මයෝ තුමූ එක් සත්ත්වයෙකු කෙරෙහි අනන්ත අප්‍රමාණ වෙත්. ඒ අප්‍රමාණ උපපජ්ජවෙදනීය කර්මයන් අතුරෙන් අතිශයින් බලවත් වූ උපපජ්ජ වෙදනීය කර්මයකින් ප්‍රතිසන්ධිය ගෙණදුන් කල්හි, අවශෙෂ සත්වන චෙතනා කුසල කර්මයෝ අහෝසි කර්ම නම් වෙත්. නියම කාලය ඉක්මීම හේතුකොට ගෙන පැල නොවෙන්නාවූ ධාන්‍ය බීජ මෙන් අභාවයට පත්වන්නෝය. කුසල උපපජ්ජවෙදනීය කර්ම අතුරෙන් යම් රූපාවචර අරූපාවචර ධ්‍යාන කුසල කර්මයෝ වෙත් නම්, ඔව්හු අන් හැමටම පළමු පටිසන්ධි විපාක දෙවමින් බඹ ලෙව්හි පහළ කරවන්නාහුය.

අකුසල උපපජ්ජ වෙදනීය කර්ම අතුරෙන් **පඤ්චානන්තරිය කර්‍ම හා නියත මිථ්‍යාදෘෂ්ටිය** බලවත් හෙයින් අන් හැම අකුසල උපපජ්ජ-වෙදනීය කර්මයන් වළක්වා එහි පටිසන්ධි විපාක ලබා දෙන්නේය. එවිට අවශෙෂ අකුසල උපපජ්ජ වෙදනීය කර්මයෝ අභාව කර්ම හෙවත් අහෝසි කර්ම බවට පැමිණෙන්නාහ

### අපරාපරිය වෙදනීය කර්මය

තුන්වන ආත්ම භාවය පටන් අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑම දක්වා මේ අතරෙහි අවකාශ ලත් විටෙක විපාක දෙන කර්මයෝ අපරාපර්‍ය්‍ය වෙදනීය කර්ම නම් වෙත්. පළමුවෙනි සත්වෙනි ජවනයන්ට අතර සිටි පඤ්ච ජවන චිත්තයන්හි සම්ප්‍රයුක්ත චෙතනා චෛතසිකයෝ **අපරාපරිය වෙදනීය කර්ම** වන්නාහ.

මේ කර්මයෝ ද කුසලාකුසල වශයෙන් දෙවැදෑරුම් වේ. එක් සත්ත්වයෙක් හට ඇත්තාවූ අපරාපර්‍ය්‍ය වෙදනීය කර්මයන්ගේ

සඞ්ඛ්‍යාව අනන්තය අප්‍රමාණය. මිනිසුන් දහසක් නැඟී ගියාවූ නැවක් මහා සමුද්‍ර මධ්‍යයෙහි විනාශ වී නම්, ඒ දහසක් මිනිසුන් හට අපරාපරිය වෙදනීය කර්ම දහසක් ඉදිරිපත් වී ඔවුන්ගේ මරණය සිදු කරන්නේය. එක් කර්මයකින් එක් භවයෙක්හි ප්‍රතිසන්ධි විපාක දී අප්‍රමාණ ජාතිවල ප්‍රවෘත්ති විපාක දිය හැකි වේ. එක් සිතකින් එක් වරක් ප්‍රතිසන්ධි විපාක දුන් කල, එම චෙතනාවෙන් හෙවත් එම සිතින් නැවත ප්‍රතිසන්ධි විපාක නොදිය හැකි වේ. තවද, ප්‍රතිසන්ධි විපාක නොදී ප්‍රවෘත්ති විපාක දෙන්නාවූ අපරාපරිය වෙදනීය කර්මපථයක් නම් නැත්තේය.

අපරාපරිය වෙදනීය කර්මයාගේ ශක්තියෙන්ම විපාක දිය නොහැකි වේ. බොහෝ සෙයින් දිට්ඨ ධම්ම වෙදනීය කර්මයන් විසින් බලවත්වූ අපරාපරිය වෙදනීය කර්මයට රුකුල් දීමෙන්ම විපාක දෙන්නේ වේ. දිට්ඨ ධම්ම වෙදනීය කර්මයෙන් තොරව ඒ මහානුභාව සම්පන්න අපරාපරිය වෙදනීය කර්මයන්ට විපාක නො දිය හැකිය.

දැඩි ගිනි අඟුරු රැසක් මැදට අමු දර දැමූ කල්හි එම අමු දර දවෙන්නාක් මෙන්, බලවත්වූ අපරාපරිය වෙදනීය කර්මයට දුර්වලවූ දිට්ඨ ධම්ම වෙදනීය කර්මයකින් රුකුල් ලැබීමෙන් ඒ බලවත් අපරාපරිය වෙදනීය කර්මයාගේ මහත්වූ විපාක දෙන්නේය.

දුර්වල ගින්නකට යහපත් වියලි දර දැමූ කල්හි එම දර දැවීමෙන් දැඩි ගිනි හටගන්නාක් මෙන් දුර්වලවූ අපරාපරිය වෙදනීය කර්මයට බලවත් දිට්ඨ ධම්ම වේදනීය කර්මයකින් රුකුල් ලැබ මහත්වූ විපාක දෙන්නෙ වෙයි.

තවද, දුර්වලවූ ගින්නට වර්ෂා ජලය ලැබුනු කල්හි ගිනි නිවී යන්නාක් මෙන් දුර්වල අපරාපරිය කුසල කර්මයක් බලවත්වූ දිට්ඨ ධම්ම වේදනීය අකුසල කර්මයකින් පෙළෙනලද්දේ වී නම්, කුසල විපාක නොදෙන්නේය.

බියසුලු කෙනෙකුට තනිවම සොහොන් භූමියට යා නොහැකි මෙන් අපරාපරිය වෙදනීය කර්මයට තනිවම විපාක දිය නොහැකි වේ. යහළුවෙක් ලදහොත් බියසුළු තැනැත්තාට සොහොනට

යා හැකි වන්නාක් මෙන්, දිට්ඨ ධම්ම වෙදනීය කර්මය නම් වූ යාළුවාගේ උපකාරය ලැබූ කල්හි අපරාපරිය වෙදනීය කර්මයට විපාක දිය හැකි වන්නේය.

### අහෝසි කර්මය.

විපාක නොදෙන ලද්දවූද, මතු විපාක නොදෙන්නාවූද කර්ම තෙමේ **අහෝසි කර්ම** නම් වේ. **අහෝසි කර්ම ද, කුසලා කුසල** වශයෙන් දෙවැදෑරුම් වේ.

දෙව්දත් තෙරණුවෝ මේ ශාසනයෙහි පැවිදිව, සතර සංවර සීලය රක්ෂා කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා මෑත භාගයෙහි සංඝභෙද කර්මය කොට අවීචි මහා නරකයෙහි උපන්නේය. ඔහු විසින් රැස්කළාවූ කාමාවචර රූපා වචර, අරූපාවචර ආදී කුසලයන්ගේ දිට්ඨධම්මවෙදනීය, උපපජ්ජවෙදනීය කර්මයෝ අහෝසි කර්ම බවට පැමිණවූහ.

තවද, බොහෝ මනුෂ්‍ය ඝාතන කොට මෑත භාගයෙහි මහණව රහත්වූ අඞ්ගුලිමාල තෙරණුවෝ, ඒ අප්‍රමාණඅකුසල කර්මයන් අතුරෙන් උපපජ්ජවෙදනීය අපරාපරිය වෙදනීය අකුසල කර්මයන් අහෝසි බවට පැමිණවූහ. නමුත් ඒ අඞ්ගුලිමාල තෙරණුවන් වාසය කරන්නාවූ ග්‍රාම නගරාදීයෙහි බලූ කපුටු ආදීන්ට දමාගසන්නාවූ කැට මුගුරු ආදිය තෙරුන්වහන්සේගේ හිසේ පැහැර, හිසෙන් ගලන්නාවූ ලෙයින් සිවුර තෙමී වෙහෙරට පෙරළා වඩින්නේය. මේ වනාහි මනුෂ්‍ය ඝාතක අකුසලයන්ගේ දිට්ඨධම්ම වෙදනීය විපාක බව දතයුතුයි.

## අකුසල කර්ම

විපාක දෙන ස්ථාන වශයෙන් සතර වැදෑරුම්වූ කර්ම අතුරෙන් අකුසල කර්මයෝ, ද්වාරයන්ගේ වශයෙන් තුන් වාදෑරුම් වෙත්. එනම්:—

1. **කාය කර්ම (කාය විඥප්ති)**
2. **වචී කර්ම (වාග් විඥප්ති)**
4. **මනො කර්ම**

## අකුසල කාය කර්ම

ප්‍රධාන වශයෙන් අකුසල කාය කර්මයෝ ත්‍රිවිධාකාර වෙත්. එනම්:—

1. **පාණාතිපාත අකුසල කර්මය**
2. **අදින්නාදන අකුසල කර්මය**
3. **කාම මිත්ථ්‍යාචාර අකුසල කර්මය**

මේ කාය කර්මයන්ගේ නිකුත් වීමට දොරටුවක් වැනි හෙයින් කාය ද්වාරයයිද, කාය විඤප්තියයි ද කියනු ලැබේ. මේ කර්ම බොහෝ සෙයින් කායද්වාරයෙන් සිදු වන්නේ වී නමුත් ස්වල්ප වශයෙන් වාග්ද්වාරයෙහිද සිදුවිය හැකිය.

## පාණාතිපාත අකුසල කර්මය

**ප්‍රාණ** යනු සම්මුති වශයෙන් සත්ත්වයාටද, පරමාර්ථ වශයෙන් ජීවිතෙන්ද්‍රියටද කියන නමෙකි. සත්ත්වයෙකුගේ ස්වාභාවික පතනය හෙවත් ස්වාභාවික මරණය වළකා අතිපතනය හෙවත් ප්‍රයෝග බලයෙන් සත්ත්වයෙකුගේ මරණය සිද්ධ කිරීම **පාණාතිපාතය** නම් වේ. එ වැනි හෙළීමක් හෙවත් මරණයක් සිදු කරන්නාවූ කල්හි උපදනා අකුසල ජවන චිත්ත වීථීන්හි හට ගත් ජවන චිත්තයන්හි සම්ප්‍රයුක්ත වූ චෙතනා චෛතසිකයෝ **ප්‍රාණඝාත අකුසල කර්ම** නම් වෙත්. ඒ චිත්ත වීථීන් අතුරෙන් ද අර්ථ සාධක නොවන්නාවූ ජවනයන් කර්ම වශයෙන් ද අර්ථසාධක ජවන කර්ම පථ වශයෙන්ද සලකනු ලැබේ.

කර්මපථ බවට පැමිණි කර්මයෝ පටිසන්ධි විපාක දී අනතුරුව ප්‍රවෘත්ති විපාකද දෙති. කර්මපථ බවට නොපැමිණි කර්මයෝ ප්‍රවෘත්ති විපාක පමණක් දෙති.

ප්‍රාණඝාත අකුසල කර්මපථයක් සිදුවීමට අඞ්ග පසක් සම්පූර්ණ විය යුතුයි. එයින් එකක් හෝ අඩුවී නම් කර්මපථයක් නොවී සාමාන්‍ය ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් දෙන්නාවූ කර්මයක් වන්නේය. ඒ අඞ්ග පස නම්:—

1. සතෙකු වන බවය.
2. සතෙකු බව දැනීමය.
3. සත්ත්වයා මැරීමට සිතක් ඇතිවීමය.
4. සත්ත්වයා මැරීමට උපක්‍රම හෙවත් ප්‍රයෝග යොදන බවය.
5. සත්ත්වයාගේ මරණය සිදුවීමය.

මෙහි උපක්‍රම හෙවත් ප්‍රයෝග සයෙකි. එනම්:—

1. **සාහත්ථික ප්‍රයෝගය**—තමා විසින් හෙවත් තම අතින් මැරීම.
2. **ආණත්තික ප්‍රයෝගය**—අනුන් ලවා මැරවීම,
3. **නිස්සග්ගිය ප්‍රයෝගය**—ගල්, පොලු දඬු මුගුරු ආදියෙන් ගසා හෝ වෙඩි තැබීම් ආදියෙන් හෝ මැරීම.
4. **ථාවර ප්‍රයෝගය**—බොරු වලවල් කැණීම, උගුල් ඇටවීම ආදියෙන් මැරීම.
5. **ඍද්ධිමය ප්‍රයෝගය**—ඍද්ධි බලයෙන් මැරීම.
6. **විද්‍යාමය ප්‍රයෝගය**—මන්ත්‍ර ගුරුකම් ආදියෙන් මැරීම

මෙයින් යම්කිසි ප්‍රයෝගයකින් සතෙකු මරණ කල්හි අඞ්ග සම්පූර්ණ වී නම් ප්‍රාණඝාත අකුසල කර්මපථය සිද්ධ වන්නේය. මෙයින් ආණත්තික ප්‍රයෝගයෙන් සතෙකු මරණ කල්හි වාග්ද්වාර යෙන් අකුසලය සිද්ධ වන බව සැළකිය යුතුයි.

ප්‍රාණඝාත කර්මය සිදුකරණ කල්හි, ද්වේෂමූල දෙමනස්ස සහගත පටිඝසම්ප්‍රයුක්ත සිත් දෙකින් මිස අන් අකුසල සිතකින් සිදුකළ නොහැකි වේ. කොපමණ සතුටින් සිනහ සෙමින් සත්ත්ව ඝාතනය කිරීමට තැත් කරන්නේ වී නමුත් තමා ගේ අදහස ඉටු කර ගැනීමට සත්ත්වයාගේ ජීවිත්වීම බාධාවක් වන බැවින් එය නැතිකරණ අවස්ථාවෙහි පටිඝ සිතක්ම උපදින්නේය. මෙවැනි පාපකර්මයක් මරණාසන්නයේදී අරමුණු වුවහොත් ඒකාන්ත යෙන්ම දෙවන අත්බැව්හි අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තී රණ සිතින් සතර අපායෙහි පටිසන්ධිය ගෙණ දෙන්නේය. එයට පසුව එහි ප්‍රවෘත්ති විපාක වශයෙන් අහේතුක අකුසල විපාක සිත් සතම ලැබීමෙන් ඉතා දීර්ඝ කාලයක් දුක් විඳිමින් නැවත පටිඝ ජවන් උපදවමින් අපා දුකට ම පමුණුවන්නාහ.

සත්ත්ව ඝාතනය කිරීමේදී සත්ත්වයාගේ ගුණවත් කමේ හැටියටත් ශරීර ප්‍රමාණයේ හැටියටත් කර්මයෙහි බරපතල භාවය අඩු වැඩි වන්නේය. ආර්‍ය්‍ය පුද්ගලයන්, සිල්වත් පෘථග්ජනයන්, දෙමාපියන් ආදි ගුණයෙන් වැඩි පුද්ගලයන් මැරීමේ විපාක ඉතා මහත්ය. මහත්වූ ශරීර ඇති සතුන් මැරීමේදී ප්‍රයෝගයත්, එයට ගතවන කාලයත් මහත් බැවින්, මරණය සිදුකරණතෙක් මරණ චෙතනාවන්ම ඇති වන හෙයින්, එම කර්මය ද බලවත් වන්නේය.

## අදින්නාදන අකුසල කර්මය

නුදුන් දෙය ගැන්ම අදින්නාදන නම් වේ. අන්සතු වස්තුව හෙවත් තමන් වෙත නුදුන් දෙය ගැණීම යන අදහසයි. එසේ ගැණීමේදී ඇතිවන ජවන චිත්තයන් හා සම්ප්‍රයුක්ත චෙතනා චෛතසිකය **අදින්නාදන අකුසල කර්මය** නම් වේ. අර්ථ සාධකවූ හෙවත් අඞ්ග පසකින් සම්පූර්ණවූ එම සොරකම අදින්නාදන අකුසල කර්ම පථය නම් වේ. එයින් එකක්වත් අඩුවී නම් කර්මපථ බවට නොපැමිණේ.

එහි අඞ්ග පස නම්:—

1. අන් සතු වස්තුවක් වීමය.
2. අන් සතු වස්තුව බව දැනීමය.
3. අන් සතු වස්තුව සොරා ගැණීමට සිත්වීමය.
4. එම වස්තුව පැහැර ගැණීමට උපක්‍රම යෙදීමය.
5. අන් සතු වස්තුව සොරකම් කිරීමය.

සොරකම් කරණ තැනැත්තා ලොභ සිතින් අන් සතු වස්තුව පැහැර ගන්නා කල්හි ලොභ මූල අකුසල් සිතකින්ද, ක්‍රොධයෙන් හෝ පලිගන්නා අදහසින් හෝ පැහැර ගන්නා කල්හි ද්වේෂ මූල සිතකින්ද අදින්නාදන අකුසල කර්මය සිද්ධ වන්නේය. මේ අදින්නාදන අකුසල කර්මය බොහෝසෙයින් කායද්වාරයෙන් සිදුවන්නේ වී නමුත් ආණත්තික වශයෙන් හෙවත් අණකොට අන් කෙනෙකු ලවා සොරකම් කරවීමේදී වාග්ද්වාරයෙන්ද සිද්ධ වන්නේය.

අදත්තාදන අකුසල කර්මයෙහි විපාක වශයෙන් මෙලොවදී **නොයෙක් දුක්, හිරිහැර, නින්ද, අපහාස, වධ විඳීමටද සිදුවී එම අකුසලානුභාවයෙන් මරණින් මතු ඉතා දීර්ඝ කාලයක් සතර අපා දුක් විඳ, යම් විටෙක මිනිසත් බවක් ලද්දේවීනම් ඉතා අසරණ දුගී** බවට ද පත්වන්නේය.

### කාමමිථ්‍යාචාර අකුසල කර්මය

මෙහි **කාම** යනුවෙන් ස්ත්‍රී පුරුෂයන් හඟවයි. **මිථ්‍යාචාර** යනු වරදවා හැසිරීමයි. ස්ත්‍රී පුරුෂයන්ගේ වැරදි හැසිරීමට **කාම මිථ්‍යා චාරය යි** කියනු ලැබේ. පුරුෂ තෙමේ පර ස්ත්‍රීන් සේවනය කරණ කල්හිද, ස්ත්‍රී තොමෝ පරපුරුෂයන් සේවනය කරන කල්හිද, උප දින්නාවූ යම් ආශ්වාද චෙතනාවක් වේද, එය **කාමමිථ්‍යාචාර අකුසල කර්මය** නම්වන්නේය.

අඞ්ග සතරකින් සම්පූර්ණ වූ කාමමිථ්‍යාචාර අකුසල කර්මය, **කර්මපථ** බවට පැමිණෙන්නේය. එම අඞ්ග සතර නම්:—

1. පර ස්ත්‍රියක් හෝ පර පුරුෂයෙක් වීමය.
2. සේවන සිත ඇතිවීමය.
3. උපක්‍රමය හෙවත් සේවනය කිරීමය.
4. අධිවාසනය හෙවත් එය ඉවසීමය.

මෙහි දක්වන ලද පර ස්ත්‍රිහු විසිදෙනෙක් වෙති. එනම්:—

1. **මාතුරක්ඛිතා** නම් වූ මව විසින් රක්නාලද ස්ත්‍රිය.
2. **පිතුරක්ඛිතා** නම් වූ පියා විසින් රක්නාලද ස්ත්‍රිය.
3. **මාතුපිතුරක්ඛිතා** නම් වූ මව්පිය දෙදෙනා විසින් රක්නාලද ස්ත්‍රිය.
4. **භගිනිරක්ඛිතා** නම් වූ සහෝදරිය විසින් රක්නාලද ස්ත්‍රිය.
5. **භාතුරක්ඛිතා** නම් වූ සහෝදරයා විසින් රක්නාලද ස්ත්‍රිය.
6. **ඤාතිරක්ඛිතා** නම් වූ නෑයන් විසින් රක්නාලද ස්ත්‍රිය.
7. **ගොත්තරක්ඛිතා** නම් වූ ස්වකීය ගොත්‍රයන් විසින් රක්නා ලද ස්ත්‍රිය.

8. **ධම්මරක්ඛිතා** නම් වූ සහ ධාර්මිකයන් විසින් රක්නාලද ස්ත්‍රිය
9. **සාරක්ඛා** නම් වූ ගැබ්ව සිටියදී හෝ මෝ මාගේ යයි රක්නා ලද ස්ත්‍රිය.
10. **සපරිදණ්ඩා** නම් වූ අසුවල් ස්ත්‍රිය කරා ගියහොත් මෙතෙක් දඩ යයි නියමකරන ලද ස්ත්‍රිය.
11. **ධනක්කීතා** නම් වූ ධනය දී ගන්නා ලද ස්ත්‍රිය.
12. **ඡන්දවාසිනි** නම් වූ සිය කැමැත්තෙන් ප්‍රිය වූ පුරුෂයා ළඟ වසන්නාවූ ස්ත්‍රිය.
13. **භොගවාසිනි** නම් වූ භොග නිසා භාර්‍ය්‍යා බවට පත්වූ ස්ත්‍රිය
14. **පටවාසිනී** නම් වූ වස්ත්‍රය මාත්‍රයෙන් භාර්‍ය්‍යා බවට එළඹ සිටි ස්ත්‍රිය.
15. **ඕදපත්තකිනී** නම් වූ පැන් කලයෙහි අත බහා මේ ජලය මෙන් එක්ව වසමු යයි කැමැතිකොට වසන්නාවූ ස්ත්‍රිය.
16. **ඕභතචුම්බටා** නම් වූ දර දිය අදින තැනැත්තී විසින් හිසින් සුඹුලුවම බිමතබා බිරින්ද බවට ගත්තාවූ ස්ත්‍රිය.
17. **දසිභරියා** නම් වූ දසීව භාර්‍ය්‍යාව බවට ගත් ස්ත්‍රිය.
18. **කම්මකාරි භරියා** නම් වූ බැළමෙහෙ කරන්නීව භාර්‍ය්‍යා බවට ගත් ස්ත්‍රිය.
19. **ධජාහටා** නම් වූ යුදකොට ජය ගෙණ පරදෙසින් ගෙණෙන ලද ස්ත්‍රිය.
20. **මුහුත්තිකා** නම් වූ මොහොතකට බිරින්ද බවට ගන්නාලද ස්ත්‍රිය.

මෙකී ස්ත්‍රීන් අතුරෙන් කවර ස්ත්‍රියකු සමග හෝ මෙවුන් දම් සේවනය කරණ පුරුෂයා හට **කාමමිථ්‍යාචාර අකුසල කර්ම පථය** සිද්ධ වන්නේය.

**මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මතාපිතුරක්ඛිතා, භගිනි රක්ඛිතා, භාතුරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා,** යන ස්ත්‍රීහු අටදෙනා හට, ඔවුන් ගේ ස්පර්ශය පිළිබඳව ස්වාමීහු නැති බැවින්, පරපුරුෂ සේවනයෙහි කර්මපථය සිද්ධ නොවේ. මේ කාමමිථ්‍යාචාරයද කායද්වාරික අකුසල කර්මයකි.

කාය කර්මයක් වූ සුරාමේරය පානයද, ස්පර්ශකාම ගුණයෙහි වරදවා පිළිපදනා හෙයින් කාමමිථ්‍යාචාරයෙහිම ඇතුළත් වේ.

තවද, කාමමිථ්‍යාචාරයෙහි හැසිරෙන්නාවූ ස්ත්‍රී පුරුෂයන් හට මෙලොවදීම නොයෙක් වද, හිරිහැර, නින්ද, අපහාස ලැබීමටත්, මරණින් මතු සතර අපායෙහි ඉපිද, නොයෙක් දුක් විඳීමටත් සිදු වන්නේය. මනුෂ්‍යාත්මයක් ලැබුනේවිනම් නපුංසකව විරූපව උප දිති. බොහෝ ජාතීන්හි ස්ත්‍රීන්වම උපදිත්. ස්වාමි කුලයට ගියේවී නමුත් ඔවුනොවුන් අවිශ්වාසව, අප්‍රියව, අමනාපව කුකුස් සහිතව වෙසෙති. නොකල්හිම බිඳී වෙන් වෙති.

යම් ස්ත්‍රියක් පරපුරුෂ සේවනය කරන්නීද, ඒ ස්ත්‍රිය මතු සසරදී ස්ත්‍රීභාවයෙන් සඳහටම නො මිදේ. යම් පුරුෂයෙක් පරස්ත්‍රී සේවනය කෙරේ ද, හෙතෙමේ පරලෙව්හි ස්ත්‍රියක්වම උපදී.

කාම මිථ්‍යාචාර අකුසල කර්මය ලොභ මූල සිතකින්ම සිදු වන්නේය.

# අකුසල වචී කර්ම

**මුසාවාද, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාප** යන අකුසල කර්ම සතර බොහෝ සෙයින් වාග්ද්වාරයෙහි පවත්නා බැවින් **වචී කර්ම** නම් වේ. ඇතැම්විට වචීකර්මයෝ කායද්වාර යෙහිද ස්වල්ප වශයෙන් හටගනී. වචනයෙන් කිවයුතු වූ මුසාවාද ආදිය, පත්‍රාදියෙහි ලියා දෙන කල්හිද, හස්තමුද්‍රාවෙන් හෝ හඟ වන කල්හිද, එය කායද්වාරයෙහි පැවැති වචී කර්ම නම් වන්නේය.

### මුසාවාද අකුසල කර්මය

**මුසා** යනු අසත්‍යයට නමෙකි. **වාද** යනු කීමයි. අසත්‍ය වචන හෙවත් බොරු කීම **මුසාවාද** නමි. යමෙක් ඇසින් දුටු දෙය දුන දුනම නුදුටිමි කියාද, නුදුටු දෙය දුටිමි කියාද, කණින් ඇසූ දෙය නො ඇසුවෙමි කියාද, නො ඇසූ දෙය ඇසුවෙමියි කියාද, දත් දෙය නොදනිමියි කියාද, නොදත් දෙය දනිමියි කියාද, එවැනි කීම් මුසාවාද

නම් වේ. මෙසේ අසත්‍යයක් බව දැන දැනම අනුන් රවටන අදහසින් අසත්‍ය වචන ප්‍රකාශ කරණ කල්හි උපදනා අකුසල ජවන චිත්ත වීථීන්හි හටගන්නා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චේතනාවෝ මුසාවාද අකුසල කර්ම නම් වෙති.

මේ මුසාවාද අකුසල කර්ම, අඞ්ග සතරකින් සම්පූර්ණ වී නම්, අකුසල කර්මපථ බවට පැමිණෙන්නාහ. එම අඞ්ග සතර නම්:—

1. අභූත වස්තුවක් වීම හෙවත් බොරුවක් වීම.
2. විසංවාදන සිත ඇතිවීම.
3. ව්‍යායාමය.
4. අන්‍යයන් එය දැන ගැන්ම.

මෙයින් එකක් හෝ අඩුවීනම් කර්මපථ නොවන්නේය. අනුන් රවටන අදහසින් බොරු කියා අනුන්ට අනර්ථය හෙවත් අලාභහානි සිදුකරන්නේ නම් එම අනර්ථයේ හැටියටද අකුසල කර්මය මහාසාවද්‍ය හෝ අල්ප සාවද්‍ය හෝ වන්නේය. එසේම රවටන ලද පුද්ගලයාගේ ගුණ මහත්වයේ හැටියටද මහාසාවද්‍ය හෝ අල්ප සාවද්‍ය හෝ වන්නේය.

මුසාවාද අකුසල කර්මය වචීකර්මයක් වන්නේවී නමුත් පත් පොතෙහි ලිවීමෙන් හා හස්තමුද්‍රාදියෙන් හැඟවීමෙන්ද කායද්වාරයෙහි පැවති මුසාවාද අකුසල කර්මයක් වන්නේය.

මුසාවාද අකුසල කර්ම කරණ තැනැත්තා මෙලොවදීම නොයෙක් කටුක විපාක විඳ මරණින් මතු සතර අපායෙහි ද ඉපිද ඉතා දිගු කලක් දුක් විඳින්නේය. එයට පසුව යම් හෙයකින් මිනිසත් බවක් ලද්දේවීනම් නොයෙක් අභූත චෝදනා ලබන්නෙක් වන්නේය.

තවද, තමාට යම් ලාභ ප්‍රයෝජනාදියක් ලබා ගැණීමේ ආශාවෙන් මුසාවාද කර්මය කරණ කල්හි ලොභමූල අකුසල සිතකින්ද පළිගැණීමේ අදහසින් හෝ තරහවෙන් හෝ කරණ කල්හි ද්වේෂ මූල අකුසල සිතකින්ද කර්මය සිදුවේ.

## පිසුණාවාචා අකුසල කර්මය

ප්‍රිය භාවය සූන්‍ය කරණ කථා **පිසුණාවාචා** නම් වේ. **සමගි** යෙන්, ප්‍රිය මනාප භාවයෙන් සිටින්නවුන්ගේ සමගියත් ප්‍රිය මනාප භාවයත් බිඳුවන අදහසින් ඔවුනොවුන්ට කේලාම් කීමේදී හටගන්නා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **පිසුණාවාචා අකුසල කර්ම** නම් වෙත්. අඞ්ග සතරකින් එම කර්මය සම්පූර්ණ වූ කල්හි කර්මපථ බවට පැමිණෙන්නේ ය. එම අඞ්ග සතර නම්:—

1. බින්දයුතු අන්‍ය පුද්ගලයන් වීමය.
2. ඔවුන් බිඳවීමෙහි කැමැති සිත ඇතිවීම.
3. බිඳීමට උපක්‍රම යෙදීම
4. තම බස් අදහා ඔවුනොවුන් බිඳීමය.

මේ **පිසුණාවාචා අකුසල කර්මයද,** වචී කර්මයක් වන්නේ වී නමුත්, පත් පොතෙහි ලිවීමෙන් හෝ අන් සළකුණකින් හෝ කිරීමෙන්ද කායද්වාරයෙහි පැවැති පිසුණාවාචා අකුසල කර්මයක් වන් නේය.

පිසුණාවාචා අකුසල කර්මයාගේ විපාක වශයෙන් මෙලොවදීත් නොයෙක් දුක් විඳ, මරණින් මතු සතර අපා දුකටද පැමිණේ.

මේ කර්මය තමාට ලාභ ප්‍රයෝජන ලැබීමේ ආශාවෙන් කරණ කල්හි ලොභමූල සිතකින්ද, අනුන් පෙළීමේ හෝ පළිගැනීමේ අදහසින් හෝ කියන කරණ කල්හි ද්වේෂ සිතකින්ද සිදුවේ.

## ඵරුසා වාචා අකුසල කර්මය

සිත රිදවන තද වචන **ඵරුසා වාචා** නම් වේ. ඵරුස බස් අනුන් පෙළන අදහසින් කියන කල්හි ඇතිවන ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනා චෛතසිකය ඵරුසාවාචා අකුසල කර්මය නම් වේ. අඞ්ග තුනකින් සම්පූර්ණ වූ කල්හි එය කර්මපථයක් වන්නේය. එම අඞ්ග තුන නම්:–

1. ආක්‍රොස කරණු ලබන අන්‍ය පුද්ගලයෙකු වීම.
2. පටිස හෙවත් තරහ සිතක් ඇතිවීම.
3. ආක්‍රොස කිරීම.

**ඵරුසාවාචා** අකුසල කර්මය පටිස සම්ප්‍රයුක්ත අකුසල් සිතකින්ම සිද්ධවන්නේය. ඵරුස වචනයේ තද බැව්හි හැටියටත් ආක්‍රොස කරණු ලබන පුද්ගලයාගේ ගුණ මහත්වයේ හැටියටත් කර්මයාගේ මහාසාවද්‍ය අල්ප සාවද්‍ය බව සිදුවේ. මේ කර්මයද වචී කර්මයක් වන්නේවි නමුත් අනුන්ගේ හෘදය පෙළන වචන පත්‍රාදීන්හි ලියා යැවීමෙන් කායද්වාරයෙහි ද සිදුවේ. ඵරුසාවාචා අකුසල කර්මානු භාවයෙන් මතු සතර අපායයන්හි පටිසන්ධිය ලැබ නොයෙක් දුක් විඳින්නට සිදුවේ.

## සම්ඵප්පලාප අකුසල කර්මය

නිරර්ථක, හිස්, ප්‍රලාප බිණීම සම්ඵප්පලාප නම් වේ. එවැනි හිස් වචන කථා කරණ කල්හි උපදනා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **සම්ඵප්පලාප** අකුසල කර්ම නම් වෙත්. මේ අකුසල කර්මය සිදුවීමට අඞ්ග දෙකක් සම්පූර්ණ විය යුතුය. එනම්:-

1. නිරර්ථක කථා වන බවය.
2. එය ප්‍රකාශ කිරීමය.

නිරර්ථක කථා කියන්නාවූ කල්හි, අසන්නවුන් එය සත්‍යයක් වශයෙන් පිළිගත්විට **සම්ඵප්පලාප අකුසල කර්ම** පථය සිද්ධ වන්නේය. එහි ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාකද ගෙණදීමේ ශක්තියක් ඇත. එසේ නොවන කල්හි ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් ගෙණදෙන කර්මයක් වේ.

**සම්ඵප්පලාපය**, වචී කර්මයක් වන්නේවී නමුත්, පත් පොත්හි ලියා අන්‍යයන් එය කියවා සත්‍ය ලෙස ගැණීමට සැළැස්වීමේදී ද කායද්වාරයෙහි ද සිදුවන බව දතයුතුයි.

**ලාභ**, ප්‍රයෝජන, කීර්ති ප්‍රසංසා ආදිය ලබාගැණීමේ ආශාවෙන් **සම්ඵප්පලාප** කියන ලියන කල්හි ලොභ මූල අකුසල් සිතකින්ද,

අනුන්ට අවැඩක් අනර්ථයක් සිදුකිරීමේ අදහසින් දූෂ්‍යවූ චෙතනාවකින් කරණ කල්හි ද්වේෂ මූල සිතකින්ද මේ සම්ඵප්පලාප අකුසල කර්මය සිද්ධවන්නේය.

# අකුසල මනො කර්මය

**අභිද්ධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි** යන අකුසල කර්ම තුන මනොද්වාරයෙහිම පවත්නා බැවින් එයට **මනො කර්ම** යයි කියනු ලැබේ. මේ කර්ම තුන බොහෝ සෙයින් මනොද්වාරයෙහිම හටගන්නේවී නමුත් කාය වාග් ද්වාරයන්හි ද හට ගැණීමට අවකාශ තිබේ. එසේ කාය වාග් ද්වාරයන්හි හටගත් කල්හි ඒ කර්ම දුර්වල වේ. මනොද්වාරයෙහිම හටගත් ලොභ ද්වේෂයෝ බලවත් වෙති.

## අභිද්ධ්‍යා අකුසල කර්මය

**අභිද්ධ්‍යා** යනු දැඩි ලෝභයට නමෙකි. අන්සතු වස්තුව කෙරෙහි ලොභ උපදවා තමා සතු කරගැණීමට සිතීමේදී ඇතිවන ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාව **අභිද්ධ්‍යා අකුසල කර්මපථ** යකවන්නේය. එහි අඞග දෙකෙකි. එනම්:—

1. අන්සතු වස්තුවක් වීමය
2. එය තමාහට වේවායි සිතීමය.

අන්සතු වස්තුව කෙරෙහි ඇතිවන ආශ්වාදය **අභිද්ධ්‍යා අකුසල කර්මය** වේ. එය තමාහට ලබා ගැණීම සඳහා දක්වන බලවත් ආශාව **අභිද්ධ්‍යා අකුසල කර්මපථ** නම් වේ. මෙය ලොභමූල සිතකින්ම සිදුවන කර්මයකි.

අභිද්ධ්‍යා අකුසල කර්මය හේතුකොට ගෙණ මෙලොව දී නොයෙක් සිත් තැවිලි ආදී දුකට පත්වී මරණින් මතු ප්‍රෙතාත්මාදීන්හි ඉපිද නොයෙක් දුක් විඳීමටද සිදුවන්නේය.

## ව්‍යාපාද අකුසල කර්මය

අනුන් නැසෙත්වායි පැතීම නොහොත් අනුන්ගේ විනාශය කැමැති වන බව **ව්‍යාපාදය** නම් වේ. තමා නො කැමැතිවූ කුඩා

**වූ හෝ** මහත් වූ හෝ කවර නම් සත්ත්වයෙකු අනිෂ්ටාරම්මණයක් **මෙන්** වැටහී දෙම්නස් උපදවා ඒ සත්ත්වයා නැසේවායි සිතන්නාවූ **කල්හි** උපදනා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාව **ව්‍යාපාද අකුසල කර්මපථයක්** වන්නේය. එහිදී යම් කෝපවීම් මාත්‍රයක් ඇතිවීනම් එය ප්‍රවෘත්ති විපාක පමණක් දෙන්නාවූ ව්‍යාපාද අකුසල කර්මයක් වේ. මේ අකුසල කර්මයටද අඞ්ග දෙකක් සම්පූර්ණ විය යුතුයි. එනම්:–

1. සත්ත්වයෙකු වන බව.
2. ඔහුගේ විනාශය පැතීම.

මේ කර්මය දෝෂ මූල දෙමනස්ස සහගත පටිඝසම්ප්‍රයුක්ත අකුසල් සිතකින්ම සිදුවේ. එහි විපාක වශයෙන් මරණින් මතු සතර අපා දුකට පමුණුවන්නේය.

## මිථ්‍යාදෘෂ්ටි අකුසල කර්ම

වරදවා ගන්නා ලබ්ධියට මිථ්‍යාදෘෂ්ටිය යයි කියනු ලැබේ. මෙසේ වරදවා ගන්නා ලද දෘෂ්ටි ඇති කල්හි උපදනා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාව මිථ්‍යාදෘෂ්ටි අකුසල කර්ම නම් වෙව්. මේ කර්මයට ද අඞ්ග දෙකක් සම්පූර්ණ විය යුතු. එනම්.

1. වැරදි ලබ්ධිය ඇති බවය
2. එය එසේ ගැන්මය.

බුද්ධ දෙශනායෙහි මිථ්‍යාදෘෂ්ටිහු දෙසැටක් (62) දක්වා ඇත. සංක්ෂෙපයෙන් එය මෙසේයි:–

1. **චතුර්විධ ශාස්වත වාදය**–හෙවත් තමා ද ලෝකයද සදකාලික යයි ගැනීම.

(1) ඇතැම් කෙනෙක් ධ්‍යාන සමාපත්ති ලබා එයින් පූර්වෙ-නිවාසානුස්සති ඥාණය උපදවා නොයෙක් ලක්ෂ ගණන් ජාති සිහි කොට ආත්මය ද, ලෝකයද ශාස්වතය, වඳය, නිෂ්ඵලය, පර්වත

කූටයක් මෙන්ද, ඉන්ද්‍රඛීලයක් මෙන්ද නිශ්චලව සිටියේය. ඒ ආත්ම නිශ්‍රිතවූ සත්ත්වයෝ භවයෙන් භවයට ධාවනය කරන්නාහුය යනාදී වශයෙන් ගන්නා ශාස්වත දෘෂ්ටියෙක.

(2) ඇතැම් කෙනෙක් එසේ පෙරවිසූ කඳ පිළිවෙල සිහිකොට සංවට්ට විවට්ට කල්පාදීන්ගේ වශයෙන් සංවට්ට විවට්ට කල්ප දසය දක්වා බලා ආත්මයද ලොකයද, නිත්‍යය, නිශ්චලය, භවයෙන් භවයට යන්නාවූ සත්ත්වයෝ ශාස්වත වස්තුවක් මෙනැයි ආත්මය ගන්නා ශාස්වත දෘෂ්ටියෙක.

(3) ඇතැම් කෙනෙක් එසේ පෙර විසූ කඳ පිළිවෙල සිහිකොට සංවට්ට විවට්ට කල්ප සතළිසක් පමණ බලා ආත්මයද, ලෝකයද ශාස්වතය, නිශ්චලය, ආත්ම නිශ්‍රිතවූ සත්ත්වයෝ භවයෙන් භවයට යන්නාහු ශාස්වත වස්තූන් මෙන් නිරන්තරයෙන් ආත්මය ඇත්තේම යයි ගන්නා ශාස්වත දෘෂ්ටියෙක.

(4) ඇතැම් කෙනෙක් තමාගේ තර්ක ඥානයෙන් විමසා තමාගේ වැටහීම අනුව ආත්මයද, ලෝකයද, ශාස්වතය, වඳය, පර්වතකූටයක් ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චලව සිටියේය. භවයෙන් භවයට යන්නාවූ ආත්ම නිශ්‍රිත වූ ඒ සත්ත්වයෝ ශාස්වත වස්තුවක් හා සමවූ සේම වෙතියි ගන්නා ශාස්වත දෘෂ්ටියෙක.

2 **චතුර්විධ එකත්‍ය ශාස්වත වාදය**— හෙවත් කොටසක් ශාස්වත වශයෙන් ද, කොටසක් අශාස්වත වශයෙන්ද ආත්මය ද, ලෝකයද ගැනීම.

(5) කල්ප විනාශවන කල්හි බොහෝ සත්ත්වයෝ ආභස්සර නම් බඹලොව ඉපිද ඉතා දීර්ඝ කාලයක් එහි වැස, නැවත ලොව හටගන්නා කල්හි එයින් එක්තරා කෙනෙක් ආභස්සර ඔඹලොවින් චුතව, සිස්වූ බඹ විමනෙක් හි පහළ වෙයි. හෙතෙම හුදකලාව බොහෝ කලක් එම විමනෙහි වැස, අන්සත්ත්වයෝ ද මේ අත් බැවට එන්නාහු නම් ඉතා යෙහෙකැයි තෘෂ්ණා දිට්ඨි වශයෙන් අන් සත්ත්වයන් ගේ ඊම කැමැති වෙයි. එකල්හි ආයු හෝ කුසලය

ක්ෂය වීමෙන් අන් සත්ත්වයන්ද ආභස්සර බඹ ලොවින් චුතව එහි පහළ වෙත්. එයින් පළමු උපන් බ්‍රහ්ම තෙමේ මම බ්‍රහ්මයෙමි. මහා බ්‍රහ්මයෙමි, සියල්ල මැඩ පවත්වා සිටින්නාවූ ජ්‍යෙෂ්ඨ වෙමි. සියල්ල දක්නෙමි, ලොවට ඉසුරු වෙමි ලොව මවන්නෙක් වෙමි, ක්ෂත්‍රියාදීන්ගේ වශයෙන් ලොව බෙදන්නෙක් වෙමි යනාදිවශයෙන් ලබ්ධි ගන්නේය. හෙතෙම බොහෝ ආයුෂ ඇත්තෙක් වෙයි. අන්‍යයෝ මන්ද යුෂ්ක වෙති. පසු කලෙක එයින් කෙනෙක් බඹලොවින් චුතව මිනිසත් බව ලබා ධ්‍යාන උපදවා පෙර විසූ කඳ පිළිවෙල සිහිකොට ඒ මහා බ්‍රහ්මයා දැක හෙතෙම මහා බ්‍රහමයාය, අනුන් මැඩ පවත්නේය. සියල්ල මවන්නේය. හෙතෙම නිත්‍යය, ඒකාන්තය ශාස්වතය, එහිම සිටියේය. ඔහු විසින් නිර්මිත අපි වනාහී අනිත්‍ය වම්හ. ඒකාන්ත නොවම්හ. මන්ද්‍යුෂ්ක වම්හ. චුතවන්නාවූ ස්වභාවය ඇත්තෝ වම්හ යි ගන්නා එකච්ච සස්සත ඒකච්ච අසස්සත වාද ඇත්තෙක.

(6) ඛීඩ්ඩාපදූසිකා නම් වූ ක්‍රීඩායෙහි සිත් ඇලුනු දේව නිකායෙක් ඇත. බොහෝ කලක් හාස්‍ය ක්‍රීඩා රතිධර්මයට පැමිණි ඇතැම් දෙවි කෙනෙක් සිහි මුළාවීමෙන් ඒ දේවනිකායෙන් චුතව මිනිසත් බවට පැමිණ භාවනා කොට ධ්‍යාන උපදවා පූර්වනිවාසය සිහිකොට, ඒ දේව නිකාය දැක, එහි සිහිමුළා නොවූ දෙවියෝ චුතනොවෙත්, නිත්‍යය හ. ඒකාන්තයහ. ශාස්වතයහ. ක්‍රීඩායෙන් ක්ලාන්ත වූ අපි ඒ දේව නිකායෙන් චුතවූවෝ අනිත්‍යවම්හ ස්ථිර නොවම්හ. මන්ද්‍යුෂ්කවම්හ. චුතවන ස්වභාව ඇතියම්හ යනාදි වශයෙන් ගන්නා ඒකච්චශාස්වත ඒකච්ච අශාස්වත වාද ඇත්තෙක.

(7) මනොපදූසිකා නම්වූ ක්‍රොධ සිතින් ඔවුන්නොවුන් බලන්නාවූ දේවනිකායෙක් ඇත. ඔව්හු බොහෝ කලක් ඔවුන්නොවුන් කෙරෙහි ක්‍රොධ සිතින් බලමින් සිත් දූෂ්‍ය කරගනිත්. ඇතැම් දෙවියෝ එයින් ක්ලාන්ත වී ඒ දේව නිකායෙන් චුතව මිනිසත් බව ලැබ, භාවනා කොට ධ්‍යාන උපදවා පෙරවිසූ ආත්ම භාවය සිහි කොට, චිත්ත දූෂණය නොකරන්නාවූ දෙවියෝ, ඉතා දීර්ඝ කාලයක් ඔවු-නොවුන් ක්‍රොධ සිතින් නොබලන්නාහු ක්ලාන්ත නොවූවාහු, ඒ දිව්‍ය නිකායෙන් චුත නොවෙත්, නිත්‍යයහ, ස්ථිරයහ, ශාස්වතයහ, සිත් දූෂණය කොට ක්ලාන්ත වූ අපි ඒ දේව නිකායෙන් චුත වූයෙමු.

අනිත්‍යවම්හ. ස්ථිරනොවම්හ. මන්දයුෂ්කවූවෝ වම්හ. මෙසේ කොටසක් ශාස්වත වශයෙන්ද, කොටසක් අශාස්වත වශයෙන්ද ගන්නා වාද ඇත්තෙක.

(8) ඇතැම් කෙනෙක් තර්කකොට තමාගේ වැටහීම් මාත්‍ර යෙන් විමසා ලබ්ධි ගෙන චක්ඛු, සොත, ඝාණ, ජිව්හා කාය යන මේ ආත්මය අනිත්‍යය වෙයි. අස්ථිර වෙයි, අසාස්වත වෙයි, සිත, මනස, විඥ්ඥාණය යන නම්වලින් හැඳින්වෙන ආත්මය නිත්‍යය වෙයි. ස්ථිර වෙයි, ශාස්වත වෙයි. මෙසේ කොටසක් නිත්‍ය වශයෙන් ද කොටසක් අනිත්‍ය වශයෙන්ද ආත්මයත් ලෝකයත් පණවත්.

3. **චතුර්විධ අන්තානන්තික වාදය**--හෙවත් ලෝකය කෙළවරක් ඇතැයි කියා හෝ නැතැයි කියා හෝ පැවති දෘෂ්ටි සතර.

(9) ඇතැම් කෙනෙක් භාවනා කොට ප්‍රතිභාග නිමිත්ත උපදවා එය සක්වල කෙළවර දක්වා නොවඩා, ඒ කසිණාලෝකය, ලොකය යයි දෘෂ්ටි ගෙන අන්ත සංඥාව ඇතිව වසමින් මේ ලෝකය කෙළවරක් ඇත්තේය, හාත්පසින් වටය, යයි මෙසේ අන්තානන්තික වාදය පණවත්.

(10) ඇතැම් කෙනෙක් මෙසේ භාවනා කොට කසිණ ප්‍රතිභාග නිමිත්ත සක්වල කෙළවර තෙක් වඩා අනන්ත සංඥා ඇතිව මේ ලොකය අනන්තය කෙළවරක් නැත්තේ යයි අන්තානන්තික වාදය පණවත්.

(11) ඇතැම් කෙනෙක් භාවනානුයෝගීව ප්‍රතිභාග නිමිත්ත උඩින් සහ යටින් නොවඩා සරසින් පමණක් වඩා උඩින් හා යටින් අනන්ත සංඥා ඇතිව මේ ලෝකය කෙළවරක් ඇත්තේ ද වේ. කෙළවරක් නැත්තේ ද වේ යයි මෙසේ අන්තානන්තික වාදය පණවත්.

(12) ඇතැම් කෙනෙක් ස්වකීය තර්කයෙන් විමසා තීරණය කොට මේ ලෝකය කෙළවරක් ඇත්තේත් නොවේ. කෙළවරක් නැත්තේත් නොවේ යයි මෙසේ අන්තානන්තිකවාදය පණවත්.

4. **චතුර්විධ අමරා වික්ෂේපවාදය**—හෙවත් නොමැරෙන්නාවූ, කෙළවරක් නැත්තාවූ දෘෂ්ටි වචනයෙන් දමා ගසන්නා වූ, නොහොත් දිය පිට මතු වීමෙන් හා ගිලීමෙන් ඔබ මොබ දිවන්නාවූ අමරා නම් මත්ස්‍ය ජාතිය අල්වා ගත නොහැකිවාක් මෙන්, අල්වාගත නොහැකි වචනයෙන් දමා ගසන්නාවූ වාද සතරෙකි.

(13) ඇතැම් කෙනෙක් මේ කුසල කර්මය යයි ද මේ අකුසල කර්මය යයි ද තත් වූ පරිද්දෙන් නොදත් හෙයින් මෙය, 'කුසලය' මෙය අකුසලය යයි මම ප්‍රකාශ කෙළේ නම් මට ඡන්දය හෝ රාගය හෝ ද්වේෂය හෝ පටිඝය හෝ වන්නේය. එසේ වූයේ නම් එය මට බොරුවක් වන්නේය. එයින් දුක් වන්නේය. සගමොක් දෙකට ද අන්තරාය වන්නේය. මෙසේ ඔහු මුසාවාද භීතියෙන් එයට පිළිකුල් කිරීමෙන් මේ කුසලය මේ අකුසලය යයි ප්‍රකාශ නොකොට ඒ ඒ තන්හි ඔහු අමරාවික්ෂේපයට පැමිණේ. ආත්මය හා ලෝකය ශාස්වත දැයි ඇසූ කල්හි එසේ නොවේය කියා වචන යෙන් දමාගසයි. ශාස්වතයෙන් අන්‍ය වූ ඒකච්ච සස්සත වාදය දැයි ඇසූ කල්හි මට ඒ අන් පරිද්දෙකින් නොවේ යයි වචන දමා ගසයි. උච්ඡේදවාදයත් නොවේ යයි වික්ෂේප කෙරෙත්. සත්ත්ව තෙම මරණින් මතු නොවන්නේත් නොවේ දැයි කියූ තර්ක වාදයත් ප්‍රතික්ෂේප කොට දමාගසයි. මෙය පළමුවන අමරා වික්ෂේපය නමි.

(14) ඇතැම් කෙනෙක් මේ කුසලය මේ අකුසලය යයි තත් වූ පරිද්දෙන් නො දත් හෙයින් මෙය කුසලය මෙය අකුසලය යයි ප්‍රකාශ කෙළේ නම් එයින් මට ඡන්දය හෝ රාගය හෝ ද්වේෂය හෝ පටිඝයක් හෝ වෙයි. එයින් උපාදනය වෙයි. එහෙයින් ම දුක්වන්නේය. සගමොක් දෙකට ද අන්තරාය වන්නේය යි මෙසේ උපාදන භීතියෙන්, උපාදනයට පිළිකුල් කිරීමෙන් මෙය කුසල්ය මෙය අකුසල් යයි නොකියා එසේ දැයි ඇසූ කල මට එසේ නොවෙයි කියා ද එපරිද්දෙන් දැයි ඇසූ කල මට එසේත් නො වේ යයි කියාද අන් පරිද්දෙකින් දැයි ඇසූ කල එසේත් නොවේ යයි කියා ද නැතැයි දැයි ඇසූ කල්හි නැත කියාත් නොවෙයි කියාද නැත්තේත් නොවේ දැයි ඇසූ කල්හි මට නැත්තේ නොවන්නේත් නොවෙයි කියා ද මෙසේ කෙළවරක් නැති වික්ෂේපයට පැමිණෙයි. මෙය ද එක් අමරා වික්ෂේපයෙකි.

(15) ඇතැම් කෙනෙක් මෙය කුසලය මෙය අකුසලය යයි තත්වූ පරිද්දෙන් නොදත් හෙයින් මෙය කුසලය මෙය අකුසලය යයි ඉදින් ප්‍රකාශ කෙළේ වී නම් තියුණු නුවණ ඇති පණ්ඩිත ජනයා විසින් ඒ පිළිබඳව ප්‍රශ්න කෙළේ නම් මට පීඩා වන්නේය. එයින් සගමොක් දෙකට අන්තරාය වන්නේ යයි අනුයෝග භීතියෙන් ලජ්ජායෙන් කුසලා කුසලයන් ප්‍රකාශ නොකරන්නේය. ප්‍රශ්න ඇසූ කල්හි මෙසේත් මට නැත්තේය. එසේත් මට නැත්තේය. අන් පරිද්දෙනුත් මට නැත්තේය. මට නැත්තේත් නොවේ ය. නැත්තේ නොවන්නේත් නොවේය යනාදි වචනයෙන් දමා ගැසී මෙන් අමරා වික්ෂේපයට පැමිණෙත්.

(16) ඇතැම් කෙනෙක් මඳවූ නුවණ ඇති හෙයින් මූඪ වෙයි. හෙතෙම පරලොවක් ඇත්තේ දැයි විචාළෙහි නම්, පරලොව ඇතැයි මට අදහස් වී නම් පරලොවක් ඇතැයි මෙසේ තට ප්‍රකාශ කරන්නෙමි. මට එසේත් නොවෙයි එපරිද්දෙනුත් නොවෙයි, අන් පරිද්දෙනුත් නොවෙයි. මට නැත්තේත් නොවෙයි, නැත්තේ නොවන්නේත් නොවෙයි. කියා ද එසේම ඕපපාතික සත්ත්වයන් පිළිබඳව ද කුසලා කුසල කර්මයන්ගේ ඵලය හා අනුසස් පිළිබඳවද ඒ පිළිවෙළින්ම අමරා වික්ෂේප වාද ඇත්තෝ වෙත්.

5. **අධිච්ච සමුප්පන්න වාද දෙක**—හෙවත් නිෂ්කාරණයේ උපදවා ගත් වාද දෙක.

(17) ඇතැම් කෙනෙක් රූපස්කන්ධ මාත්‍රයෙන් අසංඥසත්ත්ව යෙහි මහා කල්ප පන්සියයක් වැස එයින් චුතව මිනිසත් බැව් ලබා පසු කලෙක ධ්‍යාන වඩා පෙර විසූ අසංඥසත්ත්වය දැක, මම පෙර නූවූයෙමි, ඒ මම පෙර නොවී දැන් සත්ත්ව ස්වභාවය පිණිස පැමිණියෙමි යි ආත්මයත් ලෝකයත් නිකරුණේ උපන්නක් යයි පණවත්.

(18) ඇතැම් කෙනෙක් ස්වකීය තර්ක වාදයෙන් විමසා තමාගේ වැටහීමට අනුව ආත්මය ද, ලෝකයද නිෂ්කාරණයේ උපන්නේ යයි ලබ්ධි ගනී.

## 6. සොළොස් ප්‍රකාර සංඥීවාදය

(19) ඇතැම් කෙනෙක් කසිණ රූපය ඇත්තේ ආත්මය වේ. මරණින් මතු නිත්‍ය කසිණ රූපයෙහි පැවැති සංඥාව යයි ගෙන හෝ රූපය ආත්මය වේ යයි කියා හෝ එහි පැවැති සංඥාව, සංඥාව යයි කියා ද පණවත්. මරණින් මතු නිත්‍යය යන සංඥාව ඇත්තාහු එය පණවත්.

(20) අරූප සමාපත්තියෙහි නිමිත්ත ආත්මය යයි ගෙන හෝ සමාපත්ති සංඥාව සංඥාව යයි ගෙන හෝ තර්ක මාත්‍රයකින්ම හෝ අරූපය ආත්මය වේ යයි එහි පැවැති සංඥාව, සංඥාව යයි පණවත්.

(21) රූප ඇත්තේ ද, රූප නැත්තේ ද ආත්මය වෙයි.
(22) රූප නැත්තේත් අරූපනැත්තේත් ආත්මය වෙයි.
(23) අන්ත ඇත්තක් වූයේ ආත්මය වෙයි.
(24) අන්ත නැත්තක් වූයේ ආත්මය වෙයි.
(25) අන්ත ඇත්තක් වූයේ ද අන්ත නැත්තක් වූයේ ද ආත්මය වෙයි.
(26) අන්ත ඇත්තක් නුවූයේද, අන්ත නැත්තක් නුවූයේද ආත්මය වෙයි.
(27) ධ්‍යාන සමාපන්නකයාගේ වශයෙන් ඒකත්ව සංඥ ඇත්තේ ආත්මය වෙයි.
(28) අසමාපන්නකයා ගේ වශයෙන් නානත්ව සංඥා ඇත්තේ ආත්මය වෙයි.
(29) පරිත්ත කසිණ වශයෙන් පරිත්තසංඥ ඇත්තේ ආත්මය වෙයි.
30) විපුල, කසිණ වශයෙන් අප්‍රමාණ සංඥා ඇත්තේ ආත්මය වෙයි.
(31) චතුර්ථධ්‍යාන භූමියෙහි ඉපදීම් වශයෙන් ඒකාන්ත සැප ඇත්තේ ආත්මය වෙයි.
(32) නරකයෙහි උත්පත්ති වශයෙන් ඒකාන්ත දුක් ඇත්තේ ආත්මය වෙයි.

(33) මිනිස්ලොව ඉපදීම් වශයෙන් සුවඳුක් ඇත්තේ ආත්මය වෙයි.

(34) වෙහප්ඵලයෙහි උපදනාහු දක සුවදුක් නැත්තේ ආත්මය වෙයි. මෙසේ මරණින් මතු නිත්‍ය සංඥා ඇත්තේ යයි ආත්මය පණවත්.

## 7. අටවැදෑරුම් අසඤ්ඤීවාදය

(35) රූප ඇත්තේ ආත්මය වේ. මරණින් මතු නිත්‍ය සංඥා නැත්තේ යයි පණවත්.

(36) රූප නැත්තේ ආත්මය වේ.

(37) රූප ඇත්තේ ද, අරූප ඇත්තේද ආත්මය වේ.

(38) රූප නැත්තේ ද, අරූප නැත්තේ ද ආත්මය වේ.

(39) අන්තවත් වූයේ ආත්මය වේ.

(40) අනන්තවත් වූයේ ආත්මය වේ.

(41) අන්තවත් වූයේද, අනන්තවත් වූයේද ආත්මය වේ.

(42) අන්තවත් නුවූයේද, අනන්තවත් නුවූයේද ආත්මයවේ. මරණින් මතු නිත්‍ය සංඥා නැත්තේ යයි පණවත්.

## 8. අට වැදෑරුම් නෙවසංඥනාසංඥවාදය ඇති ආත්මය.

(43) රූප ඇත්තේ ආත්මය වෙයි. මරණින් මතු නිත්‍යය නෙවසංඥා නාසංඥා ඇත්තේ යයි පණවත්.

(44) රූප නැත්තේ ද ආත්මය වෙයි.

(45) රූප ඇත්තේ ද රූප නැත්තේ ද ආත්මය වෙයි.

(46) රූප නැත්තේ ද අරූප නැත්තේ ද ආත්මය වෙයි.

(47) අන්ත ඇත්තේ ආත්මය වෙයි.

(48) අන්ත නැත්තේ ආත්මය වෙයි.

(49) අන්ත ඇත්තක් වූයේද, අන්ත නැත්තක් වූයේ ද ආත්මය වෙයි.

(50) අන්තවත් නුවූයේද, අනන්තවත් නුවූයේ ද ආත්මය වෙයි. මරණින් මතු නිත්‍යය. නෙවසංඥානාසංඥා ඇත්තේ යයි පණවත්.

## 9. සප්තවිධ උච්ඡේදවාදය

(51) මේ ආත්මය, රූප ඇත්තක් වූයේ, පෘථිවි ආදි සතර මහා භූතයයන් නිසා පවත්නේ, මව් පිය දෙදෙනාගෙන් උපන්නේ මරණින් මතු සිඳීමද, වැනසීමද භවවිගමනය හෙවත් මරණින් මතු නොවන්නේ යයි ද පණවත්.

(52) ඇතැම් කෙනෙක් මේ ආත්මය ඇත්තේය. මෙපමණකින් නොසිඳුනේය. අන්‍ය වූ දිව්‍ය ආත්මභාවයක් ඇත්තේය. එය රූප ඇත්තාවූ, කාමාවචරවූ, කබලිංකාරහාරය බුදින්නාවූ ආත්මයකි. ඒ ආත්මය මරණින් මතු සිඳීම ද, වැනසීම ද, මරණින් මතු නොවීමද වේ යයි පණවත්.

(53) ඇතැම් කෙනෙක් ඒ ආත්මය ද ඇත්තේමය. එපමණකින් ආත්මය නොසිඳුනේ වේ. ධ්‍යාන සිතින් පහළවූ අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ගෙන් හා ඉන්ද්‍රියයන් ගෙන්ද සම්පූර්ණ වූ දිව්‍ය ආත්ම යෙක් ඇත්තේ ය. ඒ ආත්මය මරණින් මතු සිඳීමද, වැනසීම ද, නොවීමද වේ යයි පණවත්.

(54) ඇතැම් කෙනෙක් ඒ ආත්මය ද ඇත්තේමය. එපමණකින් ආත්මය නොසිඳෙන්නේය. රූපසංඥාවන්ගේ ඉක්මවීම් ආදියෙන් ආකාසානඤ්චායතන තලයට පැමිණියාවූ අන්‍ය ආත්මයක් ද ඇත්තේ ය. ඒ ආත්මය මරණින් මතු සිඳීමද, වැනසීමද මරණින් මතු නොවීමද වේ යයි පණවත්.

(55) ඇතැම් කෙනෙක්, ඒ ආත්මය ද ඇත්තේමය. එපමණකින් ආත්මය නොසිඳෙන්නේය. ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණඤ්චායතනයට පැමිණියාවූ අන්‍ය ආත්මයක් ද ඇත්තේය. ඒ ආත්මය ද, මරණින් මතු සිඳීමද වැනසීමද මරණින් මතු නොවීමද වේ යයි පණවත්.

(56) ඇතැම් කෙනෙක් ඒ ආත්මය ද ඇත්තේමය. එපමණකින් ආත්මය නො සිඳෙන්නේය. විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා, ආකිඤ්චඤ්ඤායතන තලයට පැමිණියාවූ අන්‍ය වූ ආත්මයක් ද ඇත්තේය. ඒ ආත්මය ද, මරණින් මතු සිඳීමද වැනසීමද, මරණින් මතු නොවීමද වේ යයි පණවත්.

(57) ඇතැම් කෙනෙක් ඒ ආත්මයද ඇත්තේමය. එපමණ කින් ආත්මය නොසිඳෙන්නේය. ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන තලයට පැමිණියාවූ අන්‍ය වූ ආත්මයක් ද ඇත්තේය. ඒ ආත්මය ද මරණින් මතු සිඳීමද, වැනසීමද, මරණින් මතු නොවීමද වේ යයි පණවත්.

## 10. පඤ්චවිධ දිට්ඨධම්ම නිබ්බාණ වාදය

(58) ඇතැම් කෙනෙක්, මේ ආත්මය, පස්කම් කොටසින් මනාව පිහිටා සමගම හැසිරෙයි. මෙපමණකින් ම මේ ආත්මය උතුම් දිට්ඨධම්ම නිබ්බාණයට පැමිණියේ වේ යයි මෙසේ විද්‍යමාන සත්ත්වයා සම්බන්ධවම දිට්ඨධම්ම නිබ්බාණය පණවත්.

(59) ඇතැම් කෙනෙක් මේ ආත්මයද ඇත්තේමය. ඒ ආත්මය මෙපමණකින්ම දිට්ඨධම්ම නිබ්බාණයට පැමිණියේ නො වෙයි. පඤ්චකාමය අනිත්‍යය, දුකය, එහෙයින් සෝකයද වැලපීමද කායික දුක්ඛයද මානසික දුක්ඛයද, උපායාසයද උපදිත්. ඉදින් මේ ආත්මය කාමයන් ගෙන් වෙන්ව ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, ඒ ආත්මය දිට්ඨධම්ම නිබ්බාණයට පැමිණියේ වේ යයි පණවත්.

(60) ඇතැම් කෙනෙක් ඒ ආත්මය ද ඇත්තේමය. මෙපමණ කින් එය දිට්ඨ ධම්ම නිබ්බාණයට පැමිණියේ නොවෙයි. විතක්ක විචාර යන ඖදරික අඞ්ග දෙකින් යුක්ත හෙයින් ප්‍රථමධ්‍යානය ඖදරිකව වැටහේ. ඉදින් විතක්ක විචාරයන් රහිතවූ ද්විතීය ධ්‍යානයට පැමිණ වෙසේ ද, ඒ ආත්මය දිට්ඨ ධම්ම නිබ්බාණයට පැමිණියේ වේ යයි පණවත්.

(61) ඇතැම් කෙනෙක් ඒ ආත්මය ද ඇත්තේමය. මෙපණ කින් ඒ ආත්මය දිට්ඨධම්ම නිබ්බාණයට පැමිණියේ නොවෙයි. ඒ ද්විතීය ධ්‍යානය පීති නම් වූ ඖදරික අඞ්ගයෙන් යුක්ත හෙයින් ඖදරිකය. ඉදින් ප්‍රීති විරාගය හේතු කොට ගෙන තෘතීය ධ්‍යානයට පැමිණ වෙසේ ද, ඒ ආත්මය දිට්ඨධම්ම නිබ්බාණයට පැමිණියේ වේ යයි පණවත්.

(62) ඇතැම් කෙනෙක් ඒ ආත්මයද ඇත්තේමය. මෙප- මණකින් ඒ ආත්මය දිට්ඨධම්ම නිබ්බාණයට පැමිණියේ නොවෙයි ඒ තෘතියධ්‍යානය සැපය ඇති හෙයින් ඖදරිකය. මේ ආත්මය සුඛය ප්‍රහාණය කිරීමෙන් චතුර්ධ්‍යානයට පැමිණ වෙසේ ද එපමණ කින් ඒ ආත්මය දිට්ඨ ධම්ම නිබ්බාණයට පැමිණියේ වේ යයි පණ වත්.

තවද **නියත මිථ්‍යාදෘෂ්ටිය, අනියත මිථ්‍යාදෘෂ්ටිය,** වශයෙන් මිථ්‍යා- දෘෂ්ටිය දෙවැදැරුම් වේ. එයින් නියත මිථ්‍යාදෘෂ්ටිය කර්ම පථයක් වන්නේය.

**නියතමිථ්‍යාදෘෂ්ටිය** ත්‍රිවිධාකාර වේ. එනම්:—

1. මේ ලොකය හා සත්ත්වයෝත් අහේතුකව හටගනිත්ය යන **අහේතුක දෘෂ්ටිය** ද,

2. කුසල කර්මයෙහි කුසල විපාකයෙකුත්, අකුසල කර්ම යෙහි අකුසල විපාකයෙකුත් නැතැයි යනාදී වශයෙන් ගන්නාවූ **නාස්තික දෘෂ්ටිය** ද,

3. මරණින් මත්තෙහි ඉපදීමෙක් නැත. බුද්ධාදි උතුමන් කෙරෙහි පැවැත්විය යුතු සිරිත් විරිත් ආදිවූ ක්‍රියාවක් නැතැයි යනාදී වශයෙන් ගන්නාවූ **අකිරිය දෘෂ්ටියද** වේ.

මේ හැර සක්කායදෘෂ්ටි ආදීවූ අවශෙෂ දෘෂ්ටීහු **මිථ්‍යා දෘෂ්ටි කර්ම** නම් වෙත්.

නියත මිථ්‍යාදෘෂ්ටි ගත් පුද්ගල තෙමේ මරණින් මතු ඒකාන්ත යෙන්ම නිරය ගතවී කල්ප විනාශයේදී වැනසෙන්නාවූ කෙළ ලක්ෂයක් සක්වළවල් වලින් පිට සක්වළෙක්හි ඉපිද අති දීර්ඝ කාලයක් දුක් විඳින්නේය.

තවද පස්කම් සැප අනුභව කිරීමෙහි දෙසක් නැත යනාදී වශ යෙන් ද, යහපත් රූප දැකීම මඞ්ගල්‍යයෙක, අයහපත් රූප දැකීම

අවමඞ්ගලායෙක, ගමන් යාමේදී යහපත් අරමුණු ඉදිරියට සම්භවීම මඞ්ගලායෙක, අයහපත් අරමුණු සම්භවීම අවමඞ්ගලායෙක යනාදී **දිට්ඨ මඞ්ගලායයක්** හෝ, යහපත් ශබ්ද ඇසීම මඞ්ගලායෙක, අයහපත් ශබ්ද ඇසීම අවමඞ්ගලායෙක, යනාදී වශයෙන් ගන්නා **සුත මඞ්ගලායයක්** හෝ, යහපත් සුවඳ, මල්, වස්ත්‍රාදිය පැළඳීම, කිරි ගිතෙල් ආදිය අනුභව කිරීම මඞ්ගලායෙක යනාදී වශයෙන් ගන්නා **මුත මඞ්ගලායයක්** හෝ, යහපත් වාහනාදියෙන් ගමන් කිරීම සුභ යයි යනාදී වශයෙන් ගන්නා **විඤ්ඤාත මඞ්ගලායයෙක්** හෝ කර්ම විපාකයෙන් තොරව යහපත් නැකැත්, මුහුර්තාදිය නිසා හෝ යහපත් ග්‍රහ දශාදිය නිසා හෝ සුභ ඵල ලැබෙන්නේ යයි ගැණීමද, බලි, බිලි, ග්‍රහ හෝම ග්‍රහ ශාන්ති ආදියෙන් යහපත් විපාක ලැබෙන් නේ යයි ද, යනාදී වශයෙන් ඇදහීම මිථ්‍යා දෘෂ්ටියට ඇතුළත් වේ.

මිථ්‍යාදෘෂ්ටි අකුසල කර්මයද අභිද්ධ්‍යාව මෙන් ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහිම ලැබෙන්නේය.

මේ දස අකුසල කර්මපථයන් අතුරෙන් **ප්‍රාණාතිපාත, ඵරුසා වාචා සහ ව්‍යාපාද** යන අකුසලයෝ තුන්දෙනා, ද්වේෂ මූලික සිතින්ම උපදනාහුය. විකල්ප වශයෙන් මෝහ සමුට්ඨාන ද්වේෂ මූල සිතින්ද උපදිත්. නව ආඝාත වස්තූන් හේතු කොට ගෙණ **ප්‍රාණඝාතය, ඵරුෂ වචන කීම, ව්‍යාපාදය** යන අකුසල කර්මයන් කරන්නේ වීනම් ඒ අකුසලය ද්වේෂ මූල සිතින්ම හටගන්නේය. **මෝහය** හේතු කොටගෙණ ආදීනව නොදන ප්‍රාණඝාතාදී අකුසල කර්මයන් කරන් නේවීනම් ඒ අකුසලය **මොහ සමුට්ඨාන ද්වේෂමූලික සිතින්** වන්නේය

මෙසේ **කාම මිථ්‍යාචාරය, අභිද්ධ්‍යාව සහ මිථ්‍යාදෘෂ්ටිය** යන අකුසල කර්ම තුන **ලෝභමූලික සිතින්** හෝ **මෝහ පච්චය ලෝභ** මූල සිතින් හෝ හටගන්නා බව දතයුතුයි.

**අදින්නාදන, මුසාවාද, පිසුණාවාචා, සම්ඵප්පලාප** යන අකුසල් සතර ද ලෝභමූල සිතකින් හෝ ද්වේෂමූල සිතකින් හෝ සිදු වන්නාහ. විකල්පයෙන් පළමු කී පරිදි **මොහ පච්චය ලෝභමූල සිතින් ද, මෝහ පච්චය දෙෂ මූල සිතින්ද** සිදුවන්නාහ.

# කාමාවචර කුසල කර්ම

**කාමාවචර කුසල කර්මයෝ** ද්වාරයන්ගේ වශයෙන් **කාය කර්ම වාග් කර්ම, මනො කර්ම** යයි ත්‍රිවිධාකාර වෙත්. කායද්වාරයෙන් හෙවත් ස්වහස්තයෙන් දනාදි පින්කම් කරන කල්හි **කාය කර්ම** වශයෙන් ද වාග්ද්වාරයෙන් හෙවත් වචනයෙන් විධානය කිරීම්, අනුශාසනා කිරීම් ආදීවූ පුණ්‍යක්‍රියාවන් කරණ කල්හි **වාග් කර්ම** වශයෙන්ද, මනොද්වාරයෙන් හෙවත් සිතින්ම කුසල් කරණ කල්හි **මනො කර්ම** වශයෙන්ද සළකනු ලැබේ. තවද කාය දුශ්චරිතාදියෙන් වළකින කල්හි **කාය කර්ම** වශයෙන් ද, වාග් දුශ්චරිතාදියෙන් වළකින කල්හි **වාග් කර්ම** වශයෙන්ද, මනො දුශ්චරිතාදියෙන් වළකින කල්හි **මනො කර්ම** වශයෙන් ද ගණන්ගනු ලැබේ.

තවද කුසල කර්මයෝ **දන, ශීල, භාවනා** වශයෙන් ද ත්‍රිවිධ වෙත්.

චිත්තෝත්පාද වශයෙන් සොමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරිකාදී වශයෙන් අට වැදෑරුම් වේ.

**කුසල කර්මපථයන්** වශයෙන් **දන, ශීල, භාවනා, අපචායන, වෙය්‍යාවච්ච, පත්තිදන, පත්තානුමෝදනා, ධම්මසවණ, ධම්ම දේශනා, දිට්ඨුජ්ජු කම්ම** වශයෙන් දශ විධ වේ.

### දනය

**දනය** යනු වස්තු පරිත්‍යාගයයි. වස්තු පරිත්‍යාග කරණ කල්හි උපදනා කාමාවචර කුසල් ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාව **දනමය කුසල කර්මය** නම් වේ.

ස්වහස්තයෙන් දන්දෙන කල්හි දනමය කුසල කර්මය කායද්වාරයෙහි පැවැති **කාය කර්මයක්** වන්නේය. මෙසේ දන් දෙවයි විධාන කළ කල්හි දනමය කුසල කර්මය වාග්ද්වාරයෙහි පවත්නා **වාග් කර්මයක්** වන්නේය. මම දන් දෙමියි සිතිවිලි මාත්‍රයක් උපදවන කල්හි **මනො කර්මයක්** වන්නේය.

සිතු පරිදි දන් දෙන්නාවූ කල්හි උපදනා අර්ථසාධක ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **දනමය කුසල කර්ම පථ** නම් වන්නාහ. දනමය කුසල කර්මයාගේ ඉෂ්ටවිපාක වශයෙන් කාම සුගති ප්‍රතිසන්ධිය හා ප්‍රවෘත්ති විපාක ද ගෙණ දෙන්නේය. අර්ථ සාධක නොවන්නාවූ දනමය කුසල කර්මයෝ අහේතුක කුසල විපාක මාත්‍රයක් ම ගෙණ දෙන්නාහ.

මේ දනය ගුණවතුන්හට පූජා පිණිසද අනුන්ට අනුග්‍රහ පිණිසද දෙන කල්හි කුසල කර්මයක් වන්නේය.

තවද, **පූර්ව චෙතනා, මුඤ්චන චෙතනා, අපර චෙතනා** යයි දනමය කුසල චෙතනාවෝ ත්‍රිවිධාකාර වෙත්.

දන්දීම පිණිස වස්තු සම්පාදනය කරණ කල්හි ඇති වන චෙතනාව **පූර්ව චෙතනා** නම් වේ. තමා සතු වස්තුව දන් දෙන්නාවූ කල්හි ඇතිවන චෙතනාව **මුඤ්චන චෙතනා** නම් වේ. දන්දීමෙන් පසුව ඒ ගැන සිහි කරන්නාවූ කල්හි උපදනා චෙතනා **අපර චෙතනා** නම් වේ.

දනමය කුසල කර්ම පථය සිද්ධ කරන්නාවූ මුඤ්චන චෙතනා වන් පිරිවරාගත් පූර්වාපර කුසල චිත්තයන්ගේ පිරිසුදුවීමෙන් කුසල කර්මයද බලවත් වේ. පූර්වාපර චෙතනා දුර්වල වේ නම් කුසල කර්ම විපාකද දුර්වල වන්නේය.

තවද මේ කුසල කර්මය **හීන, මධ්‍යම, ප්‍රණීත,** වශයෙන් ත්‍රිවිධාකාර වේ.

හීන වූ **ඡන්ද, චිත්ත, විරිය, වීමංස** ආදීයෙන් දන් දෙන කල්හිද කීර්ති ප්‍රශංසා ලැබීම පිණිස හෝ අත්තුක්කංසන පරවම්භනාදියෙන් කිලිටි සිතින් හෝ කාමතෘෂ්ණාවෙන් භව භොග සම්පත් ප්‍රාර්ථනාකොට ගෙණ හෝ දන් දෙන්නාවූ කල්හි එම දනමය කුසල කර්මය **හීන කුසල කර්මයක්** වන්නේය.

මධ්‍යමවූ **ඡන්ද, චිත්ත, විරිය, වීමංස** ආදියෙන් දන් දෙන කල්හිද, පුණ්‍ය ඵල ලැබීම් පිණිස හෝ අත්තුක්කංසන පරවම්භනාදියෙන් නොකිලිටි සිතින් හෝ ලෞකික සැප සම්පත් ප්‍රාර්ථනා කරමින් හෝ තමන්ගේම විමොක්ෂය පිණිස හෝ දන් දෙන කල්හි එම දානමය කුසල කර්මය **මධ්‍යම කුසල කර්මයක්** වන්නේය.

ප්‍රණීතවූ ඡන්ද, චිත්ත, විරිය, වීමංස ආදියෙන් දන් දෙන කල්හිද ආයසී භාවය පිණිස හෝ මාර්ග ඵල සුඛය පිණිස හෝ සියළු සත්ත්වයන්ගේ විමොක්ෂය පිණිස පාරමී ධර්මයක් වශයෙන් හෝ දන් දෙන්නාවූ කල්හි එම කුසලය **ප්‍රණීත කුසල කර්මයක්** වේ.

නවද. මේ දානය, **දායක සුද්ධියෙන් ද, ප්‍රතිග්‍රාහක සුද්ධියෙන් ද, දාන ද්‍රව්‍ය සුද්ධියෙන් ද** යුක්තවූයේ නම් මහත්ඵල මහානිසංස ගෙණ දෙන්නේය.

දන් දෙන්නාවූ දායක තෙමේ **දාන දාසය, දාන සහායය, දානපති යයි** තුන්වැදෑරුම් වේ.

යමෙක් මධුර වූ වස්තුව තෙමේ අනුභවකොට අමධුර වස්තුව දන් දෙන්නේවීනම් හෙතෙමේ **දාන දාස** නම් වේ.

යමෙක් තමා අනුභව කරණ මධුර වූ හෝ අමධුර වූ හෝ වස්තුව අනුන්ට දන් දේ ද, හෙතෙමේ **දානසහාය** නම් වේ.

තෙමේ අමධුර වස්තුව අනුභව කොට අනුන්ට මධුර වස්තුවෙන් සංග්‍රහ කෙරේ ද හෙතෙම **දානපති** නම් වේ. මේ ආදී ලක්ෂණයන් ගෙන් දායකයා අඳුනා ගත හැකි වේ.

නවද, **කාලදානය, අසත්පුරුෂ දානය, සත්පුරුෂ දානය** යයි ද ත්‍රිවිධ වේ.

කර්මඵල අදහා ආගන්තුග, ගමික, ගිලන් ආදීන්හට දෙන්නේ ද, දුර්භික්ෂයේදී දන් දේද, සිල්වතුන් හට ප්‍රථම ශස්‍ය ඵල අග්‍රදාන වශයෙන් දන් දේද, මෙය **කාලදාන** නම් වේ,

දන් දෙන්නාවූ කල්හි සකස් නොකොට දේද, අනුන් ලවා දෙවාද, ආදර නොකොට දේද, එය **අසත්පුරුෂදන** නම් වේ.

යමෙක් සකස් කොට දේද, ප්‍රතිග්‍රාහකයන් පරීක්ෂාකොට ගෞරවයෙන් දේද, ස්වහස්තයෙන්ම දේද, නිරන්තරයෙන් දේද, කර්මඵල අදහා දේද, එය **සත්පුරුෂ දන** නම් වන්නේය.

තවද, දන වස්තු වශයෙන් මද්‍ය දනය, සමජ්ජ දනය, ස්ත්‍රී දනය, වෘෂභ දනය, චිත්‍රකර්මාන්ත දනය, සත්ත්වයන් දූෂ්‍ය කරවීමට උපකාර වන හෙයින් නොදිය යුතුයි.

තවද, **දන විසුද්ධිහු** සිව්වැදෑරුම් වෙත්.

දයක තෙමේ කල්‍යාණ පුරුෂයෙක්ව, පාපීවූ ප්‍රතිග්‍රාහකයෙකුට දන් දේ නම් ඒ දනය මහත්ඵල වන්නේ දයකයාගේ පිරිසුදු බැවිනි. ප්‍රතිග්‍රාහකයාගේ වශයෙන් නොවේ. වෙස්සන්තර මහරජු පාපීවූ ජූජක නම් බමුණාහට දන්දී මහ පොළොව පවා කම්පා කරවීය.

දයකතෙමෙ අධර්මිෂ්ඨව සිට සිල්වත්වූ ධර්මිෂ්ඨ කල්‍යාණ පුරුෂයෙකු හට දන් දුන්නේවීනම් ප්‍රතිග්‍රාහකයාගේ වශයෙන් දනය මහත්ඵල මහානිශංස වේ. දයකයාගේ වශයෙන් නොවේ.

දයක ප්‍රතිග්‍රාහක දෙදෙනාම අධර්මිෂ්ඨ වූ, පාප ධර්මයෙහි පිහිටියාහු වෙත්ද, ඒ දනය දෙන්නවුන්ගේ වශයෙන් ද ප්‍රතිග්‍රාහකයාගේ වශයෙන්ද මහත්ඵල නොවන්නේය.

දයක ප්‍රතිග්‍රාහක දෙදෙනාම ධාර්මික වූ සිල්වත් කල්‍යාණ පුරුෂයන් වේද, ඒ දනය දයකයාගේ වශයෙන්ද, ප්‍රතිග්‍රාහකයාගේ වශයෙන් ද සුද්ධ වේ.

තවද ප්‍රතිග්‍රාහකයාගේ ගුණය පමණට දනානිශංස ද මහත් වේ.

සරණ සීලයෙහි නොපිහිටි ගුණවත් නොවූ අපමණ සත්ත්වයන්ට දෙන ලද මහා දනය ත්‍රිසරණ පිහිටි එක් පුද්ගලයෙකු හට දුන්නාවූ දනයෙහි සොළොස්වන කලාවෙන් කලාවක් නො අගනේය

ත්‍රිසරණ පිහිටියන් සියක් දෙනාහට දුන් දනය සෝවාන් එක් පුද්ගලයෙක් හට දුන් දනය හාසම නොවන්නේ ය.

සෝවාන් වූ එක්සිය දෙනෙකු හට දුන් දනය, සකෘදගාමි එක් පුද්ගලයෙක් හට දුන් දනයට සම නොවන්නේය.

සෙදගැමි සියයක් දෙනා හට දුන් දනය එක් අනාගාමි පුද්ගලයෙක් හට දුන් දනට සම නොවන්නේය.

අනාගැමි සියයක් දෙනාහට දුන් දනය එක් රහත් පුද්ගලයෙකු හට දුන් දනයට සම නොවන්නේ ය.

රහත් සියක්නමකට දුන් දනය එක් පසේබුදු කෙනෙකුන් වහන් සේ නමකට දුන් දනට සම නොවන්නේය.

පසේ බුදුන් සියක්දෙනා වහන්සේට දුන් දනය සම්මා සම්බුදුන් වහන්සේ නමකට දුන් දනින් සොළොස් කලාවෙන් කලාවක් පමණවත් නො අගනේය.

ලොව්තුරා බුදුන් වහන්සේට දුන් දනට වඩා බුදු පාමොක් මහ සඟනට දුන් දනය මහත්ඵල මහානිසංස වන්නේය.

ඒ දනයට වඩා තුනුරුවන් පිහිටි තැන සංඝාරාමයක් කරවීම අගනේය.

එයටත් වඩා තුනුරුවන්ගේ සරණ ගත් කුසල ඵලය මහත් වේ.

එයට වඩා සරණ සීලයෙහි පිහිටා පඤ්චසීල සමාදනයෙහි කුසල ඵලය මහත් වේ.

එයටත් වඩා මොහොතක් මෛත්‍රී භාවනා කළහොත් එහි ඵලය මහත් වේ.

මේ හැමටම වඩා අසුරුසැනක් පමණ කල් විදර්ශනා භාවනා කිරීම මහත්ඵල වන්නේය.

එසේ හෙයින් විදර්ශනා වඩා මාර්ගඵල ප්‍රාප්ත වූ උත්තමයන් පිදීම මහානිසංස බැවින් බුද්ධ ධම්ම, සඞ්ඝ, යන තුනුරුවන් ප්‍රතිෂ්ඨාධාර කොට දන් දීම යහපති.

ප්‍රසන්න සිතින්, ශ්‍රද්ධකොට දන් දෙන්නාවූ පුද්ගල තෙමේ බොහෝදෙනා හට ප්‍රිය වන්නේය. සජ්ජන සමාගම ලබන්නේය. ඔහුගේ කීර්තිය දස දිසාවෙහි පැතිරෙන්නේය. ගෘහස්ථ ධර්මයෙන් පහ නොව මනා සැප විඳින්නේය. මේ ආත්මභාවයෙන් මත්තෙහි දිව්‍යලෝකයන්හි ඉපිද අපමණ දිව්‍ය සම්පත් විඳින්නේය. මේ දන් දීමෙහි පංචානිසංසය නම් වේ.

## සීලය

කාය වාග් දුශ්චරිතාදියෙන් වැළකෙන්නහුගේ හෝ වත් පිළිවෙත් පුරන්නහුගේ හෝ, ඒ පිළිබඳව උපදනා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාතොමෝ **සීලමය කුසල කර්මය** නම් වේ.

සීලන අර්ථයෙන් හෙවත් කුසල කර්මාදීන්ට විසිර යාමට ඉඩ නොදීම නම් වූ **සමාධානාර්ථය** හෝ කුසල ධර්මයන් ප්‍රතිෂ්ඨා වශයෙන් දැරීම නම් වූ **උපධාරණාර්ථය** හෝ ඇති මේ සීලය, **චෙතනා සීලය, චෛතසික සීලය, සංවර සීලය, අව්‍යතික්‍රම සීල** යයි චතුර්විධ වේ.

එයින්, සප්තවිධ කාය වාග් දුශ්චරිතාදියෙන් වැළකෙන්නහුගේ හෝ වත් පිළිවෙත් පුරන්නහුගේ හෝ, එ පිළිබඳව ඇතිවන චෙතනාව, **චෙතනා සීල** නම් වේ.

එබන්දෙකුගේ එවේලෙහි සිත්හි යෙදෙන **සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යන විරති චෛතසික තුන **චෛතසික සීල** නම් වේ.

**ප්‍රාතිමෝක්ෂ සංවරය, සති සංවරය, ඥාණ සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය** යන පංචවිධ සංවරයෝ **සංවර සීල** නම් වේ.

සමාදන් වූ සීලය කයින් හෝ වචනයෙන් හෝ නොබිඳ රැක ගැනීම **අව්‍යාතික්‍රම සීල** නම් වේ.

මේ සීලය **චාරිත්‍ර සීලය, වාරිත්‍ර සීලය** වශයෙන් ද ද්විවිධ වේ.

මේ දෙය කළයුතු යයි බුදුන් වහන්සේ විසින් පණවා වදළ ශික්ෂා පදයන් ශ්‍රද්ධාවෙන් හා වීර්‍ය්‍යයෙන්ද රැකීම **චාරිත්‍ර සීල** නම් වේ.

මේ දේ නොකළයුතු යයි බුදුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරණ ලදහෙවත් වළක්වනලද දෙය ශ්‍රද්ධාවෙන්ම වළක්වා ගැනීම **වාරිත්‍ර සීල** නම් වේ.

තවද, **හීන සීල, මධ්‍යම සීල, ප්‍රණීත සීල** යයි ද ත්‍රිවිධ වේ.

හීන වූ **ඡන්ද, චිත්ත, විරිය, වීමංසාදියෙන්** යුක්තව, කීර්ති ප්‍රශංසා ආදිය පිණිස හෝ, අත්තුක්කංසන පරවම්භනාදියෙන් කිලිටිව හෝ භවභොග සම්පත් සඳහා හෝ රක්නා සීලය **හීන සීල** නම් වේ.

මධ්‍යම වූ **ඡන්ද, චිත්ත, විරිය, වීමංසාදියෙන්** යුක්තව පුණ්‍යඵල ලැබීම පිණිස හෝ, අත්තුක්කංසන පරවම්භනාදීයෙන් නොකිළිටිව තමාගේම විමොක්ෂය පිණිස රක්නා සීලය **මධ්‍යම සීල** නම් වේ.

ප්‍රණීත වූ **ඡන්ද, චිත්ත, විරිය, වීමංසාදියෙන්** යුක්තව, ආර්‍ය්‍ය භාවය අපෙක්ෂාකොට හෝ මාර්ගඵල සුඛය පිණිස හෝ, සියළු සත්ත්වයන්ගේ විමොක්ෂය පිණිස පාරමිතා වශයෙන් හෝ රක්නා සීලය **ප්‍රණීත සිල** නම් වේ.

තවද, **භික්ෂු සීල, භික්ෂුණී සීල, අනුපසම්පන්න සීල, ගෘහස්ථ සීල** යයි ද චතුර්විධ වේ.

භික්ෂූන් උදෙසා පණවා වදළ යම්තාක් ශික්ෂාපද වේද එය **භික්ෂු සීල** නම් වේ.

**භික්ෂුණීන්** උදෙසා පණවා වදළ ශික්ෂා පද **භික්ෂුණී ශීල** නම් වේ.

සාමණේර, සාමණේරින්ගේ දස සීලය **අනුපසම්පන්න සීල** නම් වේ.

උපාසක උපාසිකාවන්ට නිත්‍ය සීල වශයෙන් පණවා වදල පංච ශික්ෂාපද ද, උපොසථාඞ්ග සීල වශයෙන් පණවා වදල අෂ්ට ශික්ෂාපද ද, උත්සාහ ඇතියවුන් විසින් රක්කයුතු දස ශික්ෂාපද ද **ගහට්ඨ සීල** නම් වේ.

තවද, **පාතිමොක්ඛ සංවර සීලය, ඉන්ද්‍රිය සංවර සීලය, ආජීව පාරිශුද්ධි සීලය, පච්චය සන්නිශ්‍රිත සීලය** යයි ද චතුර්විධ වේ.

ප්‍රාතිමෝක්ෂයෙහි වදළ ශික්ෂාපද ව්‍යතික්‍රම නොකොට රකගැණීමාදිය හෙවත්, ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්තව, ආචාර ගොචර සම්පන්නව, ස්වල්ප වරදෙහි පවා භය දක්නා සුලුව වාසය කරන්නේ යයි ශික්ෂා පදයන් සමාදන්ව නොකඩ කොට රැකීම **ප්‍රාතිමෝක්ෂ සංවර සීල** නම් වේ.

චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය මන යන ෂට්ඉන්ද්‍රියන් සංවර කරගැණීම හෙවත් සදෙරින් රූපාදී අරමුණු ඇතුල් වීමේදී සිහියෙන් යුක්තව ඉන්ද්‍රියයන් රකගැණීම **ඉන්ද්‍රිය සංවර සීල** නම් වේ.

ආජීවය හේතුකොටගෙණ පණවා වදළ පාරාජිකාය, සංඝාදි-සේසය, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කටාය යන සවැදෑරුම් ශික්ෂාපදයන් කඩ නොකොට කුහන, ලපන, නේමිත්ති කතා, නිප්පෙසිකතා, ලාභෙනලාභං නිජිගිංසනතාදී පාප ධර්මයන්ගේ වශයෙන් ද පවත්නාවූ මිච්ඡාජීවයෙන් වැළකීම **ආජීව පාරිශුද්ධි සීලය** නම් වේ.

ප්‍රත්‍යවෙක්ෂා කොට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන පච්චය යන සිව්පසය පරිභොග කිරීම **ප්‍රත්‍යසන්නිශ්‍රිත සීල** නම් වේ.

භික්ෂු සීල, භික්ෂුණී සීලයන්ගේ සමාදනය කර්මවාක්‍යයෙන් සිද්ධ වේ. පාරාජිකා වීමෙන් මෙහි සීල භෙදය වේ. සිල් බිඳුනු

කල භික්ෂු භාවය හෝ භික්ෂුණී භාවය හෝ නොහැර සිටින්නේ **දුශ්ශීලයා යි.** පාරාජිකා නොව සෙසු ශික්ෂාපද කඩ කිරීමෙන් සංවර හෙදය වූ කල එයට සුදුසු ප්‍රතිකර්මකොට නැවත ශීලයෙහි නොපිහිටා සිටින්නේ ද, දැන දැනම ශික්ෂාපද කඩ කරන්නේද, හෙතෙම **අලජ්ජි** නම් වේ.

අනුපසම්පන්නයාගේ හා ගහට්ඨයාගේද සීල හෙදයෙන් වන දුශ්ශීල භාවය හා අලජ්ජි භාවයත් මෙලෙසින්ම දතයුතුයි.

සීලයෙහි ආනිශංස වශයෙන්, මහත්වූ භෝගස්කන්ධ ලැබීමද කල්‍යාණ කීර්ති ශබ්දය නැගීමද, ක්ෂත්‍රියාදී පිරිස් කරා විසාරදව එළඹීමද, අසම්මූඪව කාලක්‍රියා කිරීමද, මරණින් මතු දෙව්ලොව ඉපදීම ද සිද්ධවන්නේ ය.

### භාවනා

කුසල ධර්මයන්ගේ වැඩීම හෙවත් දියුණුව පිණිස සිත යහපත් අරමුණෙක්හි වැඩීම, නැතහොත්, නන් අරමුණෙහි විසිර යා නොදී එක් අරමුණෙක්හි සිත නැවත නැවත ඉපදවීම් වශයෙන් බැඳ තැබීම **භාවනා** නම් වේ. සමසතලිස් කමහටන් වශයෙන් හෝ අනිත්‍ය දුක්ඛ අනාත්ම ආදී වශයෙන් හෝ යහපත් අරමුණක් නිමිතිකොටගෙන සමාධිය හෙවත් චිත්තේකග්ගතාවය පිණිස නැවත නැවත වැඩීමේදී උපදනා කාමාවචර ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාව **භවනාමය කුසල** කර්මය නම් වේ.

**ලෞකික භාවනා, ලොකොත්තර භාවනා** ය යි භාවනා දෙකෙකි.

ලෞකික සීල, සමාධි, ප්‍රඥාවන්ගේ ඉපදවීම ද ඒ සීල, සමාධි ප්‍රඥාවන්ගෙන් තම චිත්ත සන්තානය පුරුදුකිරීම් වශයෙන් වැඩීම ද **ලෞකික භාවනා** නම් වේ.

ලොකොත්තර සීල, සමාධි, ප්‍රඥාවන්ගේ ඉපදවීමද ඒ සීල, සමාධි, ප්‍රඥවන්ගෙන් තම චිත්ත සන්තානය පුරුදුකිරීම් වශයෙන් වැඩීම ද **ලෝකෝත්තර භාවනා** නම් වේ.

තවද මේ භාවනාව චිත්ත භාවනා, ප්‍රඥා භාවනා යයි ද ද්විධ වේ.

**දසකසිණ, දස අසුභ, දස අනුස්සති, සතර බ්‍රහ්ම විහරණ, ආහාරෙ පටික්කූල සඤ්ඤා, චතුධාතුවවත්ථානය, සතර ආරුප්පයෝය යන** සතලිස් කර්මස්ථාන අතුරෙන් යම් කිසි කමටහනක් අරමුණු කොටගෙණ, ලෞකික සමාධිය හෙවත් චිත්තෙකග්ගතාවය පිණිස සිත වැඩීම **චිත්ත භාවනා** නම් වේ. සමාධියට විරුද්ධ වූ කාමච්ඡන්දදී නීවරණ ධර්මයන් විතක්ක විචාරාදී ධ්‍යානාඞ්ගයන්ගේ වැඩීමෙන් තදඞ්ග විෂ්කම්භණ වශයෙන් ප්‍රහීණ කිරීම මේ භාවනාවේ අදහස වේ. නීවරණ ධර්මයන් සංහිඳවන අර්ථයෙන් **සමථ භාවනා** යයි ද කියනු ලැබේ.

මේ භාවනායෙන් ලබන සමාධිය, **උපචාර සමාධිය, අර්පණා සමාධිය** යයි දෙවැදෑරුම් වේ. **අර්පණා සමාධිය** නම් ප්‍රථමධ්‍යානාදී රූපාවචර අරූපාවචර සිත්හි ඇතිවන බලවත් ඒකග්ගතාවයයි. අර්පණා ජවන් උපදනා චිත්ත වීථීන්හි ගොත්‍රභූ චිත්තය දක්වා හටගන්නාවූ කාමාවචර කුසල ජවන් සිත්හි සම්ප්‍රයුක්ත ඒකග්ගතාවය **උපචාර සමාධිය** නම් වේ. භාවනා කිරීමට තැත් කළ තැන් පටන් එම අරමුණෙහිම සිත වඩනා කල්හි අර්පණාප්‍රාප්තියට පළමු පහළ වන්නාවූ ගොත්‍රභූ චිත්තය දක්වා ඇති කාමාවචර කුසල් ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **භාවනාමය කුසල කර්ම** නම් වෙත්.

චතුරාර්‍ය්‍යසත්‍යාවබෝධය පිණිස නැතහොත් විශිෂ්ට ඥාණය පිණිස පඤ්චස්කන්ධාදි ධර්මයන් විවිධාකාරයෙන්, අනිත්‍ය, දුක්ඛ අනාත්මාදි වශයෙන් විදර්ශනා කොට වැඩීම **ප්‍රඥ භාවනා** නම් වේ. මෙයට **විදර්ශනා භාවනා** යයි ද කියනු ලැබේ.

**සමථ භාවනා** හේතුකොටගෙණ රූපාවචර අරූපාවචර ධ්‍යානයෝ ද, පඤ්චාභිඥා ද ලැබෙත්.

**සමථ විපස්සනා භාවනා** හේතුකොටගෙණ සෝවාන් ආදී ලෝකෝත්තර මාර්ගඵල යන්ට පැමිණිය හැකිවෙත්.

සුපරිසුද්ධ ශීලයෙහි පිහිටා දසවිධ පලිබොධයන්ගෙන් දුරුව, චරිතානුකූල වූ කර්මස්ථානයක් ලබාගෙණ, සමාධි වැඩීමට අයෝග්‍ය ස්ථාන හැර යොග්‍ය ස්ථානයකට එළඹ, භාවනා විධි නොපිරිහෙලා, භාවනා කරන්නාවූ යොගාවචරයා හට සමාධිය ලැබෙන්නේය.

සීලයෙහි පිහිටා වඩා ගන්නා ලද සමාධිය ඇතිව විදර්ශනා ප්‍රඥා වඩන්නාහට ම ආර්‍ය්‍ය මාර්ගඵල ලැබෙන බව දතයුතුයි.

තවද, ධර්ම විනය ඉගෙණීමෙහිදී ද, නිරවද්‍ය ශිල්ප ශාස්ත්‍රාදිය ප්‍රගුණ කිරීමෙහිදී ද, භාවනාමය කුසල චෙතනාවෝ හටගනිත්.

### අපචායනය

බුද්ධ, ධම්ම, සඞ්ඝ යන රත්නත්‍රය කෙරෙහි ද, මව්පිය වැඩිහිටියන් කෙරෙහි ද, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් කෙරෙහි ද, ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි ද, අනිකුත් පිදිය යුත්තන් කෙරෙහිද ලාභ සත්කාරාදිය අපෙක්ෂා නොකොට, කිලිටි නොවූ සිතින්, කරුණාධ්‍යාශයෙන් යුක්තව, දැක හුනස්නෙන් නැගී සිටීමය, ආචාර කිරීම, වන්දනාමානාදිය කිරීම යනාදී යහපත් පැවතුම් ඇතියවුන් හට, ඒ පිළිබඳව උපදනා කුසල් ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **අපචායන** කුසල කර්ම නම් වෙත්. ශිෂ්ට සම්පන්න දෙමාපියන් වැඩිහිටියන් ඇසුරු කරමින් වන්දනාමානනාදී නොයෙක් යහපත් ගති පැවැතුම් පුරුදු කළ කුඩා දරුවන්හට ද, එහි අනුසස් නොදන්නේ වී නමුත් කුසල් සිත්ම පහළ වන්නේය. සිහි නුවණින් යුක්තව අනුසස් මෙනෙහි කරමින් අපචායන කුසල කර්ම සිද්ධ කරන්නාවූ කල්හි ඥාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් පහළ වෙත්.

මේ අපචායන කුසල කර්මය චාරිත්‍ර සීලයක් වන බැවින් දාන, සීල, භාවනා යන ත්‍රිවිධ කුසල කර්මයන් අතුරෙන් සීලමය කුසල කර්මයට ඇතුළත් වේ.

### වෙය්‍යාවච්චය

තුනුරුවන්, මව්පියන්, වැඩිහිටියන්, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් සමණ බමුණන් ආදී ගරු කටයුතු උතුමන්ට ද, ආගන්තුග, ගමික, අද්ධික ගිලන් මහල්ලන් ආදී සත්කාර කළයුතු අනිකුත් සත්ත්ව

යන්ට ද, කරුණාධ්‍යාශයෙන්, පිරිසුදු සිතින්, ලාභ ප්‍රයෝජනාදිය නොතකා ඉතා ආදරයෙන් වත් පිළිවෙත් කිරීම, උපකාර කිරීම, සත්කාර සම්මාන කිරීම යනාදී යහපත් කටයුතු කරන්න වුන් හට, ඒ පිළිබඳව උපදනා කුසල් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **වෙයාාවච්ච කුසල කර්ම** නම් වෙත්. මේ කුසල කර්මය ද අනුසස් දැන, කර්මඵල අදහා කරන්නාවූ කල්හි ඥාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් ද, පුරුද්දක් වශයෙන් හෝ, අනුන් කරණු දැක හෝ, අනුසස් නොදැන හෝ කරන කල්හි ඥාණ විප්‍රයුක්ත සිත් ද පහළ වෙත්. මේ කුසලය ද චාරිත්‍ර සීලයක් වන බැවින් සීලමය කුසල කර්මයන්ටම ඇතුළත් වේ. අනුන්ගේ පිංකම්හි දී අනුබල දීම් වශයෙන් සහාය වීම ද වෙයාාවච්චයටම ඇතුළත් කළ යුතුයි.

## පත්ති දානය

තම චිත්ත සන්තානයෙහි උපන්නාවූ කුසල චෙතනාවෝ අන්‍යයන් හා සාධාරණ කොට දීමේදී හෙවත් පින් පැමිණවීමේදී ඒ පිළිබඳව උපදනා කුසල් ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **පත්තිදාන කුසල කර්ම** නම් වෙත්. දාන, සීල, භාවනාදි යම් පුණ්‍ය කර්මයක් කොට එම පුණ්‍යක්‍රියාව නැවත සිහි කරමින් පින් අනුමෝදන් වන්නට කැමැත්තෙන් සිටින පුද්ගලයන් හට පිරිසුදු සිතින් කරුණාධ්‍යාසයෙන් එම පින් පැමිණවීමෙන් තමාගේ පුණ්‍ය කර්ම ශක්තියද මහත් වන්නේ ය, මිය පරලොව ගිය ඥාතීන් නොයෙක් තැන්හි ඉපිද පින් අනුමෝදන් වන්නට බලවත් ආසාවෙන් සිටින හෙයින් මේ පුණ්‍ය කර්මය බොහෝ සෙයින් චාරිත්‍ර ධර්මයක් වශයෙන්ද පුරුදු කරණු ලැබේ. අතීතයෙහි කරනලද්දවූ කුසල කර්ම යක් අනුමෝදන් කරවීමේදී ඒ කුසල කර්මය සිද්ධ කළ සැටි නුවණින් සිහි කරමින්ම අනුමෝදන් කළ යුතුයි. එවිට පින් ගන්නාවූ තැනැත්තාටද එබඳු කුසල් සිත්ම පහළවීමෙන් තමන් විසින් කරගන්නාලද කුසලකර්මයක් මෙන් වැටහී කුසල චෙතනා පහළ වන්නේය. පුණ්‍ය බලය දැන පත්ති දානය හෙවත් පින් දීම කරණ කල්හි ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් උපදී.

මේ කුසලය දානමය කුසල කර්මයට ඇතුළත් වන්නේය. යම් කිසි දෙවියෙක් හෝ පරදත්තූපජීවී පුද්ගලයෙක් හෝ උදෙසා

**පින්දීමක්** වේද, එය **උද්දිස්සක පත්ති දනය** නම් වේ. මෙය දිට්ඨ ධම්ම වේද්‍ය කර්මයක් වශයෙන් ඔවුන් අනුමෝදන් වීමෙන් සැප සම්පත් සාද ගන්නේය. සාමාන්‍ය යෙන් හැමටම සාධාරණ වශයෙන් පින්දීම **අනුද්දිස්සක පත්ති දනය** නම් වෙත්.

## පත්තානුමෝදනය

අනුන් විසින් පත්තිදන වශයෙන් පමුණුවන ලද කුසලය හෙවත් දෙනලද පින අනුමෝදන්වීම **පත්තානුමෝදනා** නම් වේ. මෙසේ අනුමෝදන් වීමේදී පමුණුවන ලද එම කුසල චෙතනා තම සිත් සතන්හි පහළ වීමේදී උපදනා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ පත්තානුමොදනා කුසල කර්ම නම් වෙත්. සිහි නුවණින් යුක්තව, පිරිසුදු සිතින් පින්ඵල අදහා පින් අනුමෝදන් වන්නා හට තමන් විසින් සිද්ධ කරගන්නා ලද කුසල කර්මයක් මෙන්ම කුසල් සිදු වන්නේ ය. පුණ්‍යකර්මය සිද්ධ කරගන්නාවූ අවස්ථාවේදී ඒ පුද්ගලයා හට පහළ වූ කුසල් සිත් තම සිත් සතන්හි පහළවන කල්හිම පත්තානුමෝදනා කර්මය සිද්ධ වන්නේය. යමෙක් පින සිද්ධකරගත් සැටි විස්තර නොකොට පින් අනුමෝදන් වන්නැයි කී පමණින් අනුමෝදන් වන තැනැත්තා ගේ සිතෙහි එම කුසල චෙතනා හට ගන්නට නුපුළුවන් බැවින් පත්තානුමෝදනා කුසල කර්මය සම්පූර්ණ නොවන්නේය. මේ පත්තානුමෝදනාවද දනමය කුසල කර්මයට ඇතුළත් වන්නේය.

## ධම්ම සවණය

අවික්ෂිප්තව හෙවත් නොයෙක් අරමුණුවල විසිර යා නොදී දහම් අරමුණෙහිම සිත පවත්වා මනාසේ අර්ථ පරීක්ෂා කරමින් බුද්ධ ගෞරවය, ධම්ම ගෞරවය, සංඝ ගෞරවය දේසකයන් කෙරෙහි ගෞරවය උපදවා, ශ්‍රද්ධාවෙන් යුක්තව, චතුස්සත්‍යාවබොධය කොට මාර්ග ඵල ලැබීම පිණිසද, ධර්මය සිත්හි දරා පිළිවෙත් පුරා සසරින් මිදීමේ අදහසින් ද දහම් අසන්නාවූ කල්හි, ඒ පිළිබඳව උපදනා කුසල් ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **ධම්මසවණ කුසල කර්ම** නම් වෙත්.

මේ ධර්මශ්‍රවණය සෝවාන් වන කෙනෙකුට අවශ්‍යයෙන්ම උපකාර වන ධර්මයකි. පරතෝඝොෂප්‍රත්‍යය යනුද එයට නමෙකි. නිවන් දක්නා කෙනෙකුට එම ජාතියේ හා ඊට පූර්ව ජාතිවලත් ඒ පිණිස මුල් උපකාරය ලෙස ධර්මශ්‍රවණය පිළිගත යුතුයි. දහම් අසා දැන නොගත් පුද්ගලයා සසර දෙස් සහ නිවන් ගුණ නො දනී. එහෙයින්ම පිළිවෙත් පිරිමක් වත්, සසරින් මිදීමක්වත් නොවන්නේය. ධර්මය ගැන සැක උපදවමින්, එහි නෛර්‍යාණිකත්වය පිළි නොගෙන, නොවුවමනා වාද ඇති කරණ අදහසින් බණ අසන්නවුන් හට පිරිසුදු කුසල් සිත් නූපදී. එවැනි කිලිටි අදහස්වලින් තොරව, අර්ථ නොවැටහෙන්නේ වී නමුත්, ශ්‍රද්ධා වෙන්, ධර්ම ගෞරවය පෙරදැරිව, දහම් අසන්නාවූ පුද්ගලයා හට සගමොක් සුව ලබාගැණීමට මේ ධර්මශ්‍රවණය උපකාර වන්නේය.

පිරිසුදු සිතින්, තමනුත් බහුශ්‍රැතව අනුන්ට ද අර්ථයක් සිදු කරණ අදහසින් නිරවද්‍ය විද්‍යාශ්‍රවණය කිරීමද, මේ ධම්ම සවණ කුසලයට ම ඇතුළත් වේ.

ධර්මශ්‍රවණයෙහි ආනිශංස වශයෙන්, නො අසන ලද ධර්ම විභාගය ඇසීමය, ඇසූ ධර්ම පිරිසුදු කරගැණීමය, බුද්ධාදී අට තැන්හි සැක දුරු කිරීමය, දෘෂ්ටිය ඍජු කිරීමය, ඔහුගේ සිත පැහැදීමය යන පඤ්ච ධර්ම ලාභය ලැබෙන්නේය.

## ධම්ම දෙසනා

ලාභ සත්කාර, කීර්ති, ප්‍රශංසා ආදියක් නොතකා, පිරිසුදු සිතින් හා කරුණාධ්‍යාසයෙන් යුක්තව, මනාකොට ධර්මය ඉගෙණ සසරින් එතරවන්නට උපකාර වන්නාවූ ධර්ම මාර්ගය නිවැරැදි ලෙස ශ්‍රද්ධායෙන් අන්‍යයන් හට දෙසනා කරන්නාවූ කල්හි උපදනා කුසල් ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ **ධම්මදෙසනා කුසල කර්ම** නම් වෙත්.

ධර්මදේශනය, ධර්ම දනයක් වන නමුත්, නන් අරමුණෙහි සිත යා නොදී දහම් අරමුණෙහිම සිත යොමුකොට පවත්නා බැවින්

භාවනාමය කුසල කර්මයට ඇතුළත් කරණු ලැබේ. ධර්මය පත් පොත්හි ලියා අන්‍යයන්ගේ දැනගැනීම පිණිස පළකරවන කල්හි මෙය කාය කර්මයක් ද වන්නේය. පර්‍ය්‍යාප්ති ශාසනය රැකගැනීමට අතිශයින් උපකාර වන මේ පුණ්‍ය කර්මය, ඥාණ සම්ප්‍රයුක්ත කාමාවචර මහා කුසල් සිතකින්ම සිද්ධවිය යුතුයි. එමෙන්ම දහම් දෙසීමේදී, නො දැනුවත් කමින් හෝ අසන්නන් නොමග යවන්නට හැකි වන අන්දමින් ධර්මාර්ථ වරදවා කියා දීමේදීද පිරිසුදු ධර්මයට නොගැලපෙන වෛතුල්‍ය මතාදීන් හා සම්මිශ්‍රණය කොට දෙශනා කිරීමෙන්ද ධර්මයට හානියක්, අන්තරා වක් විය හැකි බැවින් සාවද්‍ය දෙශනයක් වන්නට ද අවකාශ තිබේ. එබැවින් පැරණි ධර්ම දෙශකයෝ ථෙරවාද දහම මනා කොට ඉගෙණ, පත පොතට විරුද්ධ අර්ථයන් ප්‍රකාශ කරන්නෝ වී නමුත්, එය තම මතය හෝ අසුවල් ගුරු මතය යයි පැවසීමෙන් ධර්ම ගෞරවය නොකෙලෙසා දහම් දෙසූහ.

තවද දහම් දෙසන්නාවූ කල්හි, ශ්‍රවණය කරන්නාවූ පුද්ගල යන්ගේ ධර්ම ඥානයත්, ශ්‍රද්ධා භක්තියත් වැඩීමට උපකාරවන පරිද්දෙන් දහම් දෙසිය යුතුය.

## දිට්ඨුජ්ජුකම්මය

දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය හෙවත් දුන් දෙයෙහි විපාක නැත, යාග සඞ්ඛ්‍යාත දනයෙහි විපාක නැත, ආහුතියෙහි විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ විපාක නැත, මව් නැත, පියා නැත, මෙලෝ නැත, පරලෝ නැත, ඕපපාතික සත්ත්වයෝ නැත, මෙලෝ පරලෝ දත් මනා පිළිපන් මහණ බමුණු කෙනෙක් නැතැයි යන විපරිත දෘෂ්ටීන්ගෙන්ද, ඊශ්වර නිර්මානාදී දෘෂ්ටි වලින් ද දිට්ඨමංගලාදී දෘෂ්ටිවලින් ද මිදී සම්‍යග් දෘෂ්ටියෙහි සෘජුව පිහිටීමේදී ඒ පිළිබඳව උපදනා කාමාවචර කුසල ජවනයන්හි සම්ප්‍රයුක්ත චෙතනාවෝ දිට්ඨුජ්ජුකම්ම කුසල් නම් වෙත්.

බුද්ධාදි අට තැන්හි සැක නොකොට, කම්පල අදහමින්, දිට්ඨිය සෘජුකොට ගත් කල්හි, දන සීලාදී සියලු කුසල කර්මයන් නුවණින් යුක්තවම රැස් කළ හැකි වෙයි. එබැවින් දනාදී වූ

නවවිධ පුණ්‍යක්‍රියාවන්හිම දිට්ඨුජ්ජුකම්ම පුණ්‍යක්‍රියාව පූර්වාඞ්ගම කොට ඇත්තේයයි දතයුතුයි.

## රූපාවචර කුසල කර්‍ම

පඨවි කසිණාදී යම් භාවනා අරමුණක් ගෙණ භාවනා කරණ කල්හි **පරිකර්ම නිමිත්ත** උපන් තැන් පටන් **උග්ගහ නිමිත්ත** උපදින තැන් දක්වා කරන්නාවූ භාවනා **පරිකර්ම භාවනා** නම් වේ. **උග්ගහ නිමිත්ත** උපන් තැන් පටන් **ගොත්‍රභූ** චිත්තය දක්වා කරන්නාවූ භාවනාව **උපචාර භාවනා** නම් වේ. ඊට අනතුරුව උපදනා **ධ්‍යාන ජවනය, අර්පණා භාවනා** නම් වේ. මෙයින් **පරිකර්ම භාවනා, උපචාර භාවනා** යන භාවනාවෝ කාමාවචර මහා කුසල් නම් වන්නාහ. **අර්පණා ජවන් සිත්හි සම්ප්‍රයුක්ත** චෙතනාව **රූපාවචර කුසල කර්ම** නම් වේ.

මේ රූපාවචර කුසලය, කාය කර්ම වශයෙන් කිසි කලෙකත් හටනොගන්නේය. එය මනොද්වාරයෙහිම හටගන්නා බැවින් ඒකාන්ත මනො කර්මයක්ම වන්නේය.

**විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා** යන ධ්‍යානාඞ්ගයන්ගේ යෙදීම කරණකොටගෙණ මේ රූපාවචර කුසල කර්මයෝ **ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන තෘතියධ්‍යාන**, චතුර්ථධ්‍යාන, **පඤ්චමධ්‍යාන** වශයෙන් පඤ්චවිධ වෙත්.

රූපාවචර කුසල කර්මයන්ගේ විපාක වශයෙන්, උපදවන ලද ධ්‍යානයන්ගේ පිරිහීමක් නැති කල්හි, මරණින් මත්තෙහි ඒකාන්තයෙන්ම බ්‍රහ්මලොකොත්පත්තිය ලබන්නේය.

## අරූපාවචර කුසල කර්ම

රූපාවචර පඤ්චමධ්‍යානය උපදවා, ඉක්බිති **කසිණුග්ඝාටිමාකාසාදී** ආලම්බණයක් ගෙණ භාවනා කරන්නාවූ යොගාවචරයාහට උපදනා **ආකාශානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන** යන අරූපා

චචර පඤ්චමධ්‍යාන ජවන් සිත්හි යෙදුනාවූ චෙතනාවෝ අරූපාවචර කුසල කර්ම නම් වෙත්. මෙයද **මනො කර්මයක්ම** වන්නේය.එහි විපාක වශයෙන් සතර අරූප භූමියෙහි පටිසන්ධිය ලැබෙන්නේය. අරූපතලයන්හි පටිසන්ධිය ලබන්නාවූ පුද්ගල යන්ට සතර නාමස්කන්ධයන් පමණක් ලැබෙන හෙයින් එයට චතුවොකාර භවය යයි කියනු ලැබේ. එහි චිත්තසන්තතිය පවත්නේ අවත්ථුකවය.

තවද, කුසලාකුසල කර්මයන්ගේ විපාක දීම හෝ විපාක නොදීම සිදුවන ආකාරයෙන් ද, කර්මයෝ සොළොස් ආකාර වෙත්. ඒ සොළොස නම්:—

1. **ගති සම්පත්තියෙන් බාධිතව** විපාක නොදෙන අකුසල කර්ම
2. **උපධි සම්පත්තියෙන්** **බාධිතව** විපාක නොදෙන අකුසල කර්ම
3. **කාල සම්පත්තියෙන්** බාධිතව විපාක නොදෙන අකුසල කර්ම
4. **පයොග සම්පත්තියෙන්** **බාධිතව** විපාක නොදෙන අකුසල කර්ම
5. **ගති විපත්තිය නිසා** විපාක දෙන අකුසල කර්ම
6. **උපධි විපත්තිය නිසා** විපාක දෙන අකුසල කර්ම
7. **කාල විපත්තිය නිසා** විපාක දෙන අකුසල කර්ම
8. **පයොග විපත්තිය නිසා** විපාක දෙන අකුසල කර්ම
9. **ගති විපත්තියෙන් බාධිතව** විපාක නොදෙන කුසල කර්ම
10. **උපධි විපත්තියෙන් බාධිතව** විපාක නොදෙන කුසල කර්ම
11. **කාල විපත්තියෙන් බාධිතව** විපාක නොදෙන කුස කර්ම
12. **පයොග විපත්තියෙන්** බාධිතව විපාක නොදෙන කුසල කර්ම.

13. **ගති සම්පත්තිය නිසා** විපාක දෙන කුසල කර්ම

14. **උපධි සම්පත්තිය නිසා** විපාක දෙන කුසල කර්ම

15. **කාල සම්පත්තිය නිසා** විපාක දෙන කුසල කර්ම

16. **පයොග සම්පත්තිය නිසා** විපාක දෙන කුසල කර්ම

1. සුගති භවයෙහි උපන් පුද්ගලයාහට අනිෂ්ට විපාක දීමට අකුසල කර්මයන් ඇති නමුත් **ගති සම්පත්තියෙන් බාධිතවූ** වූ කල්හි ඒ අකුසල කර්මය විපාක නොදෙන්නේය.

2. අකුසල කර්ම විපාක වශයෙන් දසියකගේ කුස ඉපිද, රූපශ්‍රීන් යුක්තව වැඩිවිය පැමිණි කල්හි, ඔහුගේ ස්වාමිපුත්‍ර තෙම, ඔහුගේ රූපශ්‍රීය දැක සතුටුව, තමහට ජාත පුත්‍රයෙකු මෙන් සැපයෙන් වර්ධනය කොට, උසස් ස්ථානාන්තරාදියක තබන ලද කල්හි ඔහුගේ විද්‍යාමාන වූ අකුසල කර්මය **උපධි සම්පත්ති යෙන් බාධිතව** විපාක නොදෙන්නේ ය.

3. ආදිකල්පික මනුෂ්‍යයන කෙරෙහි හෝ සුලභවූ ආහාර පානයන් ඇති කාලයන්හි හෝ උපන් පුද්ගලයාහට, ඔහුගේ විද්‍යාමාන වූ පාපකර්මය, **කාල සම්පත්තියෙන් බාධිතව** විපාක නොදෙන්නේය.

4. යම් පුද්ගලයෙක් සම්‍යග් ප්‍රයෝග නිසා ජීවත් වේද, යමෙක් සමීපයට එළඹෙන්නට සුදුසු කාලයෙහි එළඹේද, යන්නට සුදුසු කල්හි පලායයි ද, සුදුසු කල් බලා දුර ගමන් යාම, සොරකම් කිරීම ආදිය කෙරේ ද, ඔහුගේ විද්‍යාමාන වූ පාප කර්මය, **ප්‍රයෝග සම්පත්තියෙන් බාධිතව** විපාක නො දෙන්නේය.

5. දුගතියෙහි උපන් සත්ත්වයාගේ පාපකර්මයෝ **ගති විපත්තිය නිසා** විපාක දෙන්නේය.

6. යම් පුද්ගලයෙක් දසියකගේ කුස පිළිසිඳගෙණ දුර්වර්ණව උපදීද, ඔහු ඇත් අස් ගව මහිසාදීන් බලන්නෙකු වශයෙන් හෝ නීච ක්‍රියාවන් කිරීමට හෝ සලස්වති. එවිට ඔහුගේ පාපකර්මය **උපධි විපත්තිය නිසා** විපාක දෙන්නේය.

7. යමෙක් දුර්භික්ෂ කාලයෙක්හි හෝ පිරිහෙන්නාවූ ද, සැප නැති කාලයෙක්හි හෝ අන්තඃ කල්පාන්තයෙහි හෝ මනුෂ්‍ය යන් කෙරෙහි උපදීද, ඔහුගේ පාපකර්මය **කාල විපත්තිය නිසා** විපාක දෙන්නේය.

8. යමෙක් ප්‍රයෝගයෙහි දක්ෂයෙක් නොවේද, නිසි කල්හි පැමිණීමට හෝ නික්ම යාමට නොදනීද, සොරකම් ආදියෙහි කල් නොදනීද, ඔහුගේ පාපකර්මය **ප්‍රයෝග විපත්තිය නිසා** විපාක දෙනු ලැබේ.

9. යමෙක් සැප විඳීමට නිසි කුසල කර්මයක් ඇති කල්හි දුර්ගති භවයෙහි උපදී ද, ඔහුගේ කුසල කර්මය **ගති විපතින් බාධිතව** විපාක නො දේ.

10. යමෙක් කුසලානුභාවයෙන් රාජරාජ මහාමාත්‍යාදී කුල යෙක්හි ඉපිද අන්ධ බධිර ආදි වශයෙන් අඞ්ග විකලත්වයකට පැමිණියේ වේද, එකල්හි ඕහට සුදුසු වයසයෙහිදී ලැබිය යුතු යුවරජ, සෙනෙවිරත් ආදී ස්ථානාන්තරයක් නොලැබෙන් නේය. මොහුගේ කුසලය **උපධි විපත්තින් බාධිතව** විපාක නො දෙන්නේය.

11. යමෙක් දුර්භික්ෂ කාලයෙක්හි හෝ සැප නැති කාල යෙක්හි හෝ, අන්තඃ කල්පාන්ත සත්ත්වයන් කෙරෙහි හෝ උපදීද, ඔහුගේ කුසල කර්මය, **කාල විපත්තීන් බාධිතව** විපාක නොදෙයි.

12. යමෙක් ප්‍රයෝගයෙහි දක්ෂයෙක් නොවේද, ඔහුගේ කුසල කර්මය **ප්‍රයෝග විපත්තීන් බා**ධිතව විපාක නොදෙයි.

13. යමෙක් කුසල කර්මානුභාවයෙන් සුගතියෙහි උපදීද, ඕහට ඒ කුසල කර්මය **ගති සම්පත්තිය නිසා** විපාක දෙයි.

14. යමෙක් රාජරාජ මහාමාත්‍යාදීන්ගේ කුලයෙක්හි ඉපිද, රූපශ්‍රීන් යුක්තව වැඩේද, ඔහුගේ රූප සම්පත්තිය දැක රජ,

යුවරජ, සෙනෙවිරත් ආදී උතුම් ස්ථානාන්තර ඔහුට **සුදුසු යයි** ඒ ස්ථානයන්ට පමුණුවනු ලැබේ. ඔහුගේ කුසල කර්මය **උපධි-සම්පත්තිය නිසා** විපාක දෙන්නේය.

15. යමෙක් ආදිකල්පික සත්ත්වයන් කෙරෙහි හෝ, සැප ඇති කලෙක්හි හෝ උපදීද, ඔහුගේ කුසල කර්මය **කාල සම්පත්තිය නිසා** විපාක දෙන්නේය.

16. යමෙක් සුදුසු කල්හි ස්ථානාන්තරප්‍රාප්ත ධනවත් ප්‍රභූන් කරා ගොස් ඔවුන් සිත් ගෙණ, යහපත් ලෙස කථා කොට, සේව නය කොට සිටීද, ඒ ප්‍රභූන් කිපුණු කල්හි නොපෙණී ඉවත් වේ ද, ඒ ප්‍රභූන්ට විපතක් පැමිණි කල්හි අසලවත් නොසිට පිට පළාතකට පළාගියේ ද, සොරකමට සුදුසු තැන්හි සොරකම් කොට වස්තු රැස්කෙරේ ද, ඒ වස්තුව පැහැර ගන්නට පැමිණි කල්හි මිහිරි වචනයෙන් හෝ අල්ලස් දීමෙන් හෝ වස්තු හානියක් වන්නට ඉඩ නොතබා ද, තෙමේත් සැපසේ ජීවත් වේද, ඔහුගේ කුසල කර්මය **ප්‍රයෝග සමපත්තිය නියා** විපාක දෙන්නේය.

# විපාක දෙන ස්ථාන

## අකුසල කර්ම

දොළොස් අකුසල් සිත් අතුරෙන් උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත හැර ඉතිරි එකොළොස් අකුසල් සිත්හි යෙදුනාවූ චෙතනා සඞ්ඛ්‍යාත වූ අකුසල කර්ම තෙමේ එකම අකුසල විපාක සන්තීරණ සිතින් සතර අපායෙහි පටිසන්ධිය උපදවයි.

මේ දෙළොස් අකුසල කර්මයන්ගේ ප්‍රවෘත්ති විපාක වශයෙන් කාම භූමියෙහි හා රූප භූමියෙහි ද සත්වැදෑරුම් වූ අහේතුක අකුසල විපාක ගෙනදෙන්නේය.

යම් හේතුවකින් චක්ඛු, සොත, ඝාණ ප්‍රසාදයෝ නො ලැබුයේ නම් කාම භූමියේදී ඒ ඒ විඤ්ඤාණයෝ නො ලැබෙන්නාහ.

රූප භූමියෙහි අඞ්ග විකලත්වයක් නැත. එසේ නමුත් චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ යන අකුසල විපාක සිත් සතර පමණක් ලැබේ. අවශෙෂ අකුසල විපාක සිත් තුන නාලැබේ.

චාතුම්මහාරාජිකයෙන් මත්තෙහි ඉෂ්ටවූ රූපාලම්බණ මිස අනිෂ්ට රූපාලම්බණාදියක් නොලැබෙන හෙයින් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ යන සිත් සතර කෙසේ ලැබෙන්නේ දැයි සැකයක් ඉපදිය හැකියි. බ්‍රහ්මයෝත් චාතුම්මහාරාජිකයෙන් මත්තෙහි වූ පඤ්ච දිව්‍යලොක යන්හි වසන දෙවියෝත් ඒ ඒ භූමි වලින් යට කාම ලෝකය බලන්නාවූ කල්හි හෝ, බුදුන් දැකීම් බණ ඇසීම් ආදිය සඳහා කාම ධාතුවට පැමිණි කල්හි හෝ, අනිෂ්ට වූ රූපාලම්බණයන් දැකීමෙන් හෝ අමිහිරි ශබ්ද ඇසීමෙන් හෝ ඒ ඒ දිව්‍ය බ්‍රහ්මයින්ට අකුසල විපාක චක්ඛු විඤ්ඤාණාදිය උපදී.

## කාමාවචර කුසල කර්ම

කාමාවචර කුසල කර්මයෝ අටදෙනා, සප්තකාම සුගතියෙහි නවවිධ ප්‍රතිසන්ධි උපදවත්, නවවිධ ප්‍රතිසන්ධීහු නම් කාමාවචර මහා විපාක අටය, අහේතුක කුසල විපාක සන්තීරණ සිතය යන විපාක සිත් නවයෙන් දෙනු ලබන ප්‍රතිසන්ධිහුයි. එහි ප්‍රවෘත්ති විපාක වශයෙන් කාම සුගති, රූප භූමි යන දෙතැන්හි අහේතුක කුසල විපාක අටය මහා විපාක අටය යන සොළොස් විපාක සිත් ලැබෙත්. කාම භූමියෙහි ඉන්ද්‍රිය විකලත්වයක් නොමැති නම් මේ සොළොස් විපාකයෝ ම ලැබෙන්නාහ. ඉන්ද්‍රිය විකලත්වයක් වී නම් ඒ ඒ ඉන්ද්‍රියයන් නිසා ලැබෙන්නාවූ විඤ්ඤාණයෝ නොලැබෙත්.

කාමාවචර මහා කුසල කර්මයන්ගේ ප්‍රවෘත්ති විපාක වශයෙන් රූප භූමියෙහි අහේතුක කුසල විපාක චක්ඛු විඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ යන සිත් සතර පමණක් ලැබේ. ඉතිරි කුසල විපාක දෙළොස එහි නො ලැබේ.

කාමාවචර මහා කුසල් සිත් අතුරෙන් **ඤාණසම්ප්‍රයුක්ත** කුසලය දෙවැදෑරුම් වේ. එනම්:—

1. **උත්කෘෂ්ඨවූ ඤාණ සම්ප්‍රයුක්ත කුසලය.**
2. **ලාමක වූ ඤාණසම්ප්‍රයුක්ත කුසලය.**

උත්කෘෂ්ඨ ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් සතර හා සමග යෙදුනාවූ චෙතනාවෝ සතර දෙනා **ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසල කර්ම** නම් වෙත්. ලාමකවූ ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් සතර හා යෙදුනාවූ චෙතනාවෝ සතර දෙනා **ත්‍රිහේතුක ඕමක කුසල කර්ම** නම් වෙත්.

ත්‍රිහේතුක උත්කෘෂ්ඨ කුසල චෙතනාව, සප්තකාම සුගති යෙහි මහෙශාක්‍ය මහානුභාව සම්පන්නවූ **ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය** ලබා දෙන්නේය. ප්‍රවෘත්ති විපාක වශයෙන් මහා විපාක අටත්, අහේතුක කුසල විපාක අටත් යන සොළොස් විපාක චිත්තයන් උපදවත්.

**ඤාණ විප්‍රයුක්ත කුසලයද** දෙවැදෑරුම් වේ. එනම්;—

1. **උත්කෘෂ්ඨ වූ ඤාණ විප්‍රයුක්ත කුසලය**
2. **ලාමකවූ ඤාණ විප්‍රයුක්ත කුසලය**

උත්කෘෂ්ඨ ඤාණ විප්‍රයුක්ත කුසල් සිත් සතරෙහි යෙදුනාවූ චෙතනාවෝ සතර දෙනා **ද්‍විහේතුක උත්කෘෂ්ඨ කුසල කර්ම** නම් වෙත්. ලාමකවූ ඤාණ විප්‍රයුක්ත කුසල් සිත් සතරෙහි යෙදුනාවූ චෙතනාවෝ සතර දෙනා **ද්‍විහේතුක ඕමක කුසල කර්ම** නම් වෙත්.

**ද්‍විහේතුක උත්කෘෂ්ඨ කුසල කර්මය** හා **ත්‍රිහේතුක ඕමක කුසල කර්මය** ද විපාකදීම් වශයෙන් සමානය. මේ දෙවැදෑරුම් වූ කුසල කර්මයෝ සප්තකාම භූමියෙහි ඤාණ විප්‍රයුක්ත මහා විපාක සිත් සතරින් **ද්‍විහේතුක ප්‍රතිසන්ධිය** උපදවත්. ප්‍රවෘත්ති **විපාක වශයෙන් ඤාණ විප්‍රයුක්ත විපාක සිත් සතරය, අහේතුක කුසල විපාක අටය යන දෙළොස් කුසල විපාක උපදවත්.**

**ද්විහේතුක ඕමක කුසල කර්මය** මනුෂ්‍ය භූමියෙහි ජාත්‍යාන්ධාදි හීන සත්ත්වයන්ගේද චාතුම්මහාරාජික භූමියෙහි ඥාතිප්‍රේත සඞ්ඛ්‍යාතවූ විනිපාතික අසුරයන්ගේද අහේතුක ප්‍රතිසන්ධිය හෙවත් අහේතුක කුසල විපාක සන්තීරණ සිතින් ප්‍රතිසන්ධිය උපදවයි.

කුසල කර්මයක් කිරීමේදී පූර්ව චෙතනාවෝ අකුසල කර්මයන් විසින් පිරිවරා නොගෙන, කුසල කර්මයන් විසින්ම පිරිවරා ගන්නා ලද්දේ වේද, එමෙන්ම අපර චෙතනාවෝද පසු තැවිලිවීම් ආදී වශයෙන් උපදනා අකුසල කර්මයන්ගෙන් පිරිවරා නොගෙණ පිරිසුදු කාමාවචර කුසල් සිත්වලින් ම පිරිවරාගනු ලබන්නේ වේද, ඒ කර්මය **ත්‍රිහේතුක උත්කෘෂ්ඨ කුසල කර්මයක්** වන්නේය.

දනාදි පින්කම් කිරීමේදි, දනානිශංස දනීද, අධර්ම වස්තුවෙන් සංග්‍රහ කෙරේද, දුශ්ශීලාදීන් හට දේද, පූර්වාපර චෙතනාවෝ අකුසල කර්මයන්ගෙන්ම පිරිවරණ ලද්දේ වේද, එම කුසලය **ත්‍රිහේතුක ඕමක කුසල කර්මයක්** වන්නේය.

දැහැමින් ලබන ලද වස්තුවෙන් සීලවන්තයන් විෂයෙහි දනානිශංස නොදන දෙන්නාවූද, පූර්වාපර චෙතනා කුසල කර්මයන්ගෙන් පිරිවරන ලද්දේ වේද, එම දනය **ද්විහේතුක උත්කෘෂ්ඨ දනමය කුසල කර්මයක්** වන්නේය.

දනානිශංස නොදන, අධර්මයෙන් ලබාගත් වස්තුවෙන් දෙන්නාවූද, පූර්වාපර චෙතනා අකුසල කර්මයන්ගෙන් පිරි වරන ලද්දේ වේද, එම දනය **ද්විහේතුක ඕමක දනමය කුසල කර්මයක්** වන්නේය.

**ත්‍රිහේතුක උත්කෘෂ්ඨ කුසල කර්මයත් ත්‍රිහේතුක ඕමක කුසල කර්මයත්**, මධ්‍යයෙහි හෙවත් කර්මය සිද්ධකරන්නාවූ අවස්ථාවෙහි ඥාණ සම්ප්‍රයුක්තවීම නිසා සමාන වෙත්. නමුත් පූර්ව චෙතනාවෝ ද අපර චෙතනාවෝ ද අසමාන වෙත්.

**ද්විහේතුක උත්කෘෂ්ට කුසල කර්මයත්, ද්විහේතුක ඕමක කුසල කර්මයත්** මධ්‍යයෙහි සමානව, පූර්වාපර චේතනාවෝ අසමාන වෙත්.

**ත්‍රිහේතුක උත්කෘෂ්ඨ කුසල කර්මයත්, ද්විහේතුක ඕමක කුසල කර්මයත්** පූර්වාපර චේතනා වශයෙන් සමාන වෙත්. මධ්‍යයෙහි අසමාන වෙත්.

**ත්‍රිහේතුක ඕමක කුසල කර්මත්, ද්විහේතුක ඕමක කුසල කර්මත්** පූර්වාපර චේතනාවන්ගේ වශයෙන් සමාන වෙත්. මධ්‍යයෙහි අසමාන වෙත්.

**කාමාවචර ත්‍රිහේතුක උත්කෘෂ්ඨ කුසල කර්මයෙන්** ගන්නාවූ ප්‍රතිසන්ධිය, අඩුම ගණනින්, හේතූන් අටෙකින් යුක්ත වන්නේය. ඒ හේතු අට නම්:—

**ආයූහණක්ෂණයේදී** හෙවත් කුසල කර්මය කරන්නාවූ කාලයේ දී උපදනා කාමාවචර කුසල ජවනයන්හි යෙදුනාවූ **අලෝභ, අද්වේෂ, අමෝහ** යන හේතු තුනය.

**නිකාන්තික්ෂණයේදී** හෙවත් මරණාසන්න කාලයේදී මරණාසන්න ජවන් වශයෙන් ඤාණවිප්‍රයුක්ත කුසල් සිත් උපන්නේ නම් එහි යෙදුනාවූ **අලෝභ, අද්වේෂ** යන හේතු දෙකය.

**ප්‍රතිසන්ධික්ෂණයේදී** හෙවත් ප්‍රතිසන්ධි සිතෙහි ලැබෙන්නාවූ අලෝභ, අද්වේෂ, අමෝහ යන හේතු තුනය.

මෙයින් ආයූහණක්ෂණයේදී හා නිකාන්තික්ෂණයේදී ලැබෙන්නාවූ හේතූන් පස් දෙනා කුසල් නම් වෙත්. පටිසන්ධික්ෂණයේදී ලැබෙන්නාවූ හේතූන් තිදෙන අව්‍යාකෘත නම් වෙත්.

## රූපාවචර කුසල කර්ම

රූපාවචර කුසල කර්මයෝ ප්‍රථමධ්‍යානාදි වශයෙන් පඤ්ච විධ වෙත්. ධ්‍යාන වඩන්නාවූ පුද්ගලයෝ **පරිත්ත, මධ්‍යම, ප්‍රණීත,** යන ත්‍රිවිධාකාරයෙන් ධ්‍යාන වඩති.

මතු මතු ධ්‍යාන සඳහා ප්‍රත්‍ය වන්නට අසමර්ථවූද, හීනවූ ඡන්ද, චිත්ත විරිය විමංසාදීයෙන් යුක්තවූද, ධ්‍යාන මාත්‍රයක් පමණක් වැඩීම **පරිත්ත** වශයෙන් ධ්‍යානය වැඩීම නම් වේ.

මධ්‍යමවූ ඡන්ද, චිත්ත, විරිය, වීමංසාදියෙන් යුක්තව වැඩීම **මධ්‍යම** වශයෙන් ධ්‍යානය වැඩීම නම් වේ.

ප්‍රණීතවූ ඡන්ද, චිත්ත, විරිය, වීමංසාදියෙන් යුක්තව පඤ්ච වසිතාවෙන් පුරුදු කොට වැඩීම **ප්‍රණීත** වශයෙන් ධ්‍යානය වැඩීම නම් වේ.

**පරිත්ත** වශයෙන් ප්‍රථමධ්‍යානය වඩනලද පුද්ගල තෙමේ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කෙළේ වී නම්, අසඞ්ඛ්‍ය කල්පයක් හුගේ තුනෙන් කොටසකට ආයු ඇති බ්‍රහ්ම පාරිෂද්‍ය නම් බඹ ලොව පටිසන්ධි ගන්නේය.

ප්‍රථමධ්‍යානය **මධ්‍යම** වශයෙන් වැඩූ පුද්ගල තෙමේ මරණින් මතු අර්ධ අසඞ්ඛ්‍ය කල්පයකට ආයු ඇති **බ්‍රහ්ම පුරෝහිත** භූමියෙහි පටිසන්ධි ගන්නේය.

**ප්‍රණීත** වශයෙන් ප්‍රථමධ්‍යානය වැඩූ පුද්ගල තෙමේ අසඞ්ඛ්‍ය කල්පයකට ආයුෂ **ඇති මහා බ්‍රහ්ම** භූමියෙහි පටිසන්ධි ගන්නේය.

ද්වීතිය තෘතිය ධ්‍යානයන් **පරිත්ත** වශයෙන් වැඩූ පුද්ගලයෝ මරණින් මතු මහා කල්ප දෙකකට ආයු ඇති **පරිත්තාභයෙහිද, මධ්‍යම** වශයෙන් වැඩූ පුද්ගලයෝ මහා කල්ප සතරකට ආයු ඇති **අප්පමාණාභයෙහිද, ප්‍රණීත** වශයෙන් වැඩූ පුද්ගලයෝ මහා කල්ප සතකුත් එක් අසංඛ්‍ය කල්පයකට ආයු ඇති **ආභස්සරයෙහිද** උපදින්නාහ.

චතුර්ථධ්‍යානය **පරිත්ත** වශයෙන් වැඩීමෙන් මහා කල්ප සොළොසකට ආයු ඇති **පරිත්ත සුභයෙහි ද, මධ්‍යම** වශයෙන් වැඩීමෙන් මහා කල්ප දෙතිසකට ආයු ඇති **අප්පමාණසුභයෙහි ද, ප්‍රණීත** වශයෙන් වැඩීමෙන් තෙසැට මහා කල්පයකුත් එක් අසඞ්ඛ්‍ය කල්පයකට ආයු ඇති **සුභකිණ්හයෙහි ද** උපදින්නේය.

පඤ්චමධ්‍යානය **පරිත්තව** හෝ **මධ්‍යමව** හෝ **ප්‍රණීතව** හෝ වැඩීමෙන් පඤ්චමධ්‍යාන තලයන්හි උපදිත්. පඤ්චමධ්‍යාන භූමි වනාහි රූප භූමි, අරූප භූමි වශයෙන් ද්විධ වේ. එයින් රූපාවචර පඤ්චමධ්‍යාන භූමි සතෙකි. **එනම් වේහප්ඵලය, අසඤ්ඤ සත්තය** සහ **අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකණිට්ඨ** නම් වූ සුද්ධාවාස පසය. **ආකාශානඤ්චායතනාදී** භූමි සතර පඤ්චමධ්‍යාන අරූප භූමි නම් වෙත්.

ත්‍රිහේතුක පෘථග්ජනයන් හා සොවාන් සකෘදගාමී යන ආර්‍ය්‍ය පුද්ගලයන් විසින් රූපාවචර පඤ්චමධ්‍යානය උපදවන ලද්දේ නම්, මහා කල්ප පන්සියයකට ආයු ඇති වෙහප්ඵලයෙහි උපදින්නාහ.

කර්මවාදී, ක්‍රියාවාදී තීර්ථකාදීන් විසින් සංඥා විරාග වශයෙන් පඤ්චමධ්‍යානය වඩන ලද්දේවී නම්, මහා කල්ප පන්සියයකට ආයු ඇති **අසඤ්ඤසත්තයෙහි** රූපස්කන්ධයකින් පමණක් පහළ වන්නේය. යම් ඉරියව්වකින් මිනිස් ලොවදී වායොකසිණය හෝ ආකාශ කසිණය හෝ වඩා පඤ්චමධ්‍යානය උපදවන ලද්දේ ද, එම ඉරියව් වෙන්ම ප්‍රතිමා රූපයක් මෙන් නාමස්කන්ධයෙන් තොරවූ රූප ප්‍රතිසන්ධිය ලබන්නේය.

අනාගාමී පුද්ගලයන් අතුරෙන් **ශ්‍රද්ධෙන්ද්‍රිය** අධිකවූ පුද්ගල තෙමේ මහා කල්ප දහසකට ආයු ඇති **අවිහ** නම් සුද්ධාවාස භූමියෙහි ද **වීර්‍ය්‍යෙන්ද්‍රිය** අධික වී නම් මහා කල්ප දෙදහසකට ආයුෂ ඇති **අතප්ප**. නම් සුද්ධාවාස භූමියෙහි ද, **සතින්ද්‍රිය** අධිකවී නම්, මහා කල්ප සාරදහසකට ආයු ඇති **සුදස්ස** නම් සුද්ධාවාසයෙහි ද **සමාධින්ද්‍රිය** අධික වී නම් මහා කල්ප අට දහසකට ආයු ඇති **සුදස්සී** නම් සුද්ධාවාස භූමියෙහි ද, **ප්‍රඥෙන්ද්‍රිය** අධික වී නම් මහා කල්ප සොළොස් දහසකට ආයු ඇති **අකණිට්ඨ** නම් සුද්ධාවාස භූමියෙහිද ප්‍රතිසන්ධිය ලබන්නේය.

ශුෂ්ක විදර්ශක අනාගාමී පුද්ගලයෝ ද මරණ කාලයෙහිදී ඒකාන්තයෙන්ම ධ්‍යාන උපදවන බැවින් බ්‍රහ්මලෝක ප්‍රතිසන්ධියම ලබන්නාහ. ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයන්ගේ සමානත්වය ඇති කල්හි අනාගාමී පුද්ගලයෝ වෙහප්ඵලයෙහි උපදනා බවද දක්වා ඇත.

ධ්‍යානලාභී ස්ත්‍රීහු ද, පළමුකොට බ්‍රහ්ම පාරිෂද්‍යාදියෙහි ඉපිද පසුව මතු මතු බ්‍රහ්මලෝකයන්හි උපදින්නාහුය.

## අරූපාවචර කුසල කර්ම

අරූපාවචර කුසල කර්මයෝ ආකාසානඤ්චායතනාදී වශයෙන් සතර වැදෑරුම් වෙත්. රූපාවචර පඤ්චමධ්‍යානය උපදවා ගත් පුද්ගල තෙමේ රූප ධර්මයෙහි ආදීනව දක හෙවත් රූපය ඇති කල්හිම නොයෙක් ශාරීරික දුක්ඛයන්ට භාජන වන බව සලකා එයින් මිදීම පිණිස **කසිණුග්ඝාටිමාකාස** ප්‍රඥප්ත්‍යාදීන් අරමුණු කොට ගෙණ අරූපධ්‍යානයන් උපදවත්. මෙසේ ධ්‍යාන වඩන්නාවූ කර්මවාදී ක්‍රියාවාදී තීර්ථකයෝ ද, සම්‍යග්දෘෂ්ටිකයෝද මරණින් මතු අරූපාවචර විපාක සිතකින් අරූප තලයෙහි සතර නාමස්කන්ධයෙන් පමණක් ප්‍රතිසන්ධිය ලබන්නාහ.

මෙකී පුද්ගලයෝ අරූපධ්‍යාන වඩා, **ආකාශානඤ්චායතන කුසලය** කරණකොටගෙණ මහා කල්ප විසිදහසකට ආයු ඇති **ආකාසානඤ්චායතන භූමියෙහි ද, විඤ්ඤාණඤ්චායතන** කුසලය හේතුකොටගෙණ මහා කල්ප සතළිස් දහසකට ආයු ඇති **විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ද, ආකිඤ්චඤ්ඤායතන** කුසල කර්මය හේතුකොටගෙණ මහා කල්ප සැට දහසකට ආයු ඇති **ආකිඤ්චඤ්ඤායතන භූමියෙහි ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන** කුසල කර්මය හේතුකොට ගෙණ මහාකල්ප සූවාසූ දහසකට ආයු ඇති **නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහිද** පටිසන්ධි ගන්නාහ.

රූපාරූප භූමිවල පටිසන්ධි ගත් ආර්‍ය්‍යයෝ යට යට බ්‍රහ්ම ලොකයන්හි නුපදිත්.

**වෙහප්ඵලය, අකණිට්ඨය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** යන බඹතල තුන ආර්‍ය්‍යයන්ගේ භවාග්‍ර වශයෙන් සළකණු ලැබේ. එකී තලයන්හි උපන් ආර්‍ය්‍යයෝ එහිදීම රහත්ව පිරිනිවන් පානා හෙයිනි.

පඤ්ච සුද්ධාවාසයන්හි අනාගාමි රහත් පුද්ගලයන් හැර අන්‍ය පුද්ගලයෙක් නොදක්නා ලැබේ.

# 4

# චුති ප්‍රතිසන්ධි ක්‍රමය

**ලෝක ව්‍යවහාර** වශයෙන් ඒ ඒ සත්ත්වයන්, ඔවුනොවුන් උපන් සත්ත්ව සමූහයෙන් යම් ගිලිහීමක් වේද, ගිලිහෙන බවෙක් වේද, වෙන්වීමෙක් වේද, අතුරුදන් වීමක් හෙවත් නොපෙනීයාමක් වේද, මෘත්‍යු නම් වූ මරණයෙක් වේද, **පරමාර්ථ** වශයෙන් පඤ්ච උපාදානස්කන්ධයන්ගේ බිඳියාමෙක් වේද, කලෙබරයාගේ හෙවත් ශරීරයාගේ දමාපීමෙක් වේද, රූපාරූප ජීවිතෙන්ද්‍රියයාගේ මුල් සිඳීමෙක් වේද, එහෙයින් වන්නාවූ එක් භවයක්හුගේ අවසානය **මරණය** හෙවත් **චුතිය** නම් වේ.

මෙසේ වන්නාවූ **මරණය** මනුෂ්‍යාත්මභාවය සඞ්ඛ්‍යාත සුගති භවයාගේ වශයෙන් සතර වැදෑරුම් වේ. එනම්:—

1. **ආයුක්ෂය මරණය**
2. **කර්මක්ෂය මරණය**
3. **උභයක්ෂය මරණය**
4. **උපච්ඡේදක මරණය**

### ආයුක්ෂය මරණය

ඒ ඒ සත්ත්ව නිකායට හෙවත් ඒ ඒ ලොකවල උපන් සත්ත්වයන් හට ජීවත් විය හැකි ඉතාම ඉහල කාල පරිච්ඡේදයට **ආයුෂ** යයි කියනු ලැබේ. මනුෂ්‍යයන්ගේ පරමායුෂය ද ඒ ඒ කාලයන්හි ඍතු ආහාරාදීන්ගේ වෙනස්වීම අනුවම අඩු වැඩි වන්නේය. පටිසන්ධිය ලත් තැන් පටන් හෙවත් ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයේ පටන් හැම චිත්තක්ෂණයක් පාසාම උපදිමින් සතලොස් චිත්තක්ෂණයකින් නිරුද්ධ වෙමින් පවත්නාවූ ද, **කම්ම, චිත්ත, ඍතු, ආහාර,** යන සතර ප්‍රත්‍යයන් විසින් උපදවන ලද රූප සන්තතිය, ආයුෂයාගේ පිරිහීමත්, සමගම පිරිහෙන්නේය. ආයුෂයාගේ කෙළවරදී **කම්ම, චිත්ත, ආහාර** යන ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා රූප සමූහය එම ප්‍රත්‍යයන්ගේ අභාවය කරණකොට ගෙණ හට

නොගනී. ඒ නිසාම දුබලවූ වස්තු ද්වාරයන් හේතු කොටගෙණ එම සන්තානයෙහි උපදනා චිත්ත පරම්පරාවද දුබලවී චුති චිත්තයාගේ **භඞ්ගක්ෂණය** හා සමඟ භවය කෙළවර වන්නේය. මෙසේ නාම රූප දෙදෙනාගේ බිඳීමෙන් මරණය සිදුවී රූපස්කන්ධය මෘත ශරීර බවට පැමිණ සෘතුජ රූපයන්ගේ උපකාරයෙන් ටික කලක් පව තින්නේය.

ප්‍රතිසන්ධි ජනක කර්මයාගේ ශක්තියෙන් අවුරුදු දහස් ගණන් වුවත් ජීවත් වන්නට හැකි නමුත්, ආයුෂයාගේ පිරිහීමෙන් ම සිදු වන්නාවූ මරණයට **ආයුක්ෂය මරණය** යයි කියනු ලැබේ. ඒ සත්ත්ව නිකායයට අයත් ආයුෂයාගේ ගෙවීමට කාලය පැමිණීමෙන් සිදු වන්නාවූ මේ මරණය **කාල මරණයට** ඇතුළත් වේ.

## කර්මක්ෂය මරණය

ඒ ඒ සත්ත්වයන් විසින් නොයෙක් භවයන්හි රැස්කරණලද අනන්ත වූ අප්‍රමාණවූ කුසලාකුසල කර්මයන් අතුරෙන් යද්ගරුකාදි වශයෙන් ප්‍රස්තාව ලද එක් කර්මයකින් ප්‍රතිසන්ධියලැබ එම කර්ම ශක්තියෙන්ම නාම ජීවිතෙන්ද්‍රිය ප්‍රබන්ධයා විසින් රක්ෂා කරනලද චිත්ත සන්තතිය ද, කර්මජ වූ රූප කලාපයක් පාසා උපාදය රූපයක් වශයෙන් පැවතෙමින්, ඒ ඒ කලාපයන්ට අයත් රූපයන්ට පණ පොවමින්, එයට සම්බන්ධ වූ චිත්තජ, සෘතුජ, ආහාරජවූ අන්‍ය කලාපයන්ට අයත් රූපයන්ද මැළවිය නොදී නගා සිටුවමින්,තෙමෙන් රැකෙමින්, රූප සන්තතියද පාලනය කරමින් පැවත ආ රූප ජීවි- තෙන්ද්‍රිය ප්‍රබන්ධයා විසින් රක්ෂා කරන ලද රූපසන්තතියද, ප්‍රතිසන්ධි ජනක කර්මයාගේ ශක්තිය යම්තාක් කල් පවතීද, එතෙක් කල් නාම රූප ධර්මයන් වශයෙන් සන්තතිය නොසිඳ පවත්වාගෙණවිත්, කර්ම වේගය ගෙවී යාමෙන් යම් චුතියක් හෙවත් මරණයෙක් වේද, එයට **කර්මක්ෂය මරණ යයි** යයි කියනු ලැබේ.

ඒ සත්ත්වයා පිළිසිඳ ගත් සත්ත්වනිකායට අයත් ආයුෂ ප්‍රමාණය ශෙෂව තිබියදී ප්‍රතිසන්ධි ජනක කර්මයාගේ ශක්තිය ගෙවී යාමෙන් මේ මරණය සිදුවන බැවින් එයද **කාල මරණ** සඞ්ඛ්‍යාවටම ඇතුළත් වේ.

## උභයක්ෂය මරණය

යම් පුද්ගලයෙක් යම්කිසි ජනක කර්ම ශක්තියකින් යම් සත්ව නිකායක ප්‍රතිසන්ධිය ලැබූයේ නම් ඒ සත්ත්ව නිකායට අයත්, **ආයුෂයත්,** ප්‍රතිසන්ධිය ලබා දුන් **ජනක කර්ම ශක්තියත්,** එකවර ගෙවී යාමෙන් මරණය සිදුවේ නම්, එය ආයු කර්ම දෙදෙනාගේ ක්ෂයවීම කරණකොටගෙන වන්නාවූ මරණය හෙවත් **උභයක්ෂය මරණය** නම් වන්නේය. මෙයද **කාල මරණයකි.**

## උපච්ඡේදක මරණය

යම් ප්‍රතිසන්ධි ජනක කර්මයක් කරණකොටගෙණ, යම් සත්ත්ව නිකායක ප්‍රතිසන්ධිය ලබා ගත් පුද්ගල තෙමේ, බොහෝ කල් ජීවත්වීමට ශක්තිය ඇතත්, ඒ සත්ත්ව නිකායට අයත් ආයුෂයත්, ජනක කර්ම ශක්තියත් ශෙෂව තිබියදී පෙරආත්ම භාවයකදී කරණ ලද අපරාපයර්‍යායවෙදනීය අකුසල කර්මයකට දෘෂ්ටධර්මවෙදනීය කර්මයකින් ඉඩ හා රුකුල් ලැබ උපඝාතක කර්මයක් වශයෙන් එළඹැ පිළිසිඳගත් ජනක කර්මයාගේ විපාක ශක්තිය කපා හෙළා අතරමඟදී නොකල්හි මරණය සිදු කෙරේ නම් ඒ මරණයට **උපච්-ඡෙදක මරණය** යයි කියනු ලැබේ. **අකල් මරණය** යයි කියනුයේත් මෙයටමය.

බොහෝ කල් ජීවත්විය හැකි බලවත් කුසල කර්මයකින් මිනිස් ලොව ප්‍රතිසන්ධිය ලැබ, තරුණ වියෙහිදී අසත්පුරුෂ සමාගමයෙන් මිනිමරුවෙක් වී නම්, ඔහු විසින් කළා වූ ඒ මනුෂ්‍ය ඝාතක අකුසල කර්මයාගේ දිට්ඨධම්මවෙදනීයාංශයෙන් රුකුල් ලැබ, පෙර භවයෙක්හි කළාවූ මනුෂ්‍ය ඝාතක අකුසල කර්මයක්හුගේ අපරාපයර්‍යායවෙද්‍යාංශය උපඝාතක කර්ම යක් වශයෙන් ඉදිරිපත්ව ජනක කර්මයාගේ විපාක ශක්තිය සිඳ මරණය සිදු කරන්නේය. එහෙත් ඔහුගේ ප්‍රතිසන්ධිය දුන් කර්මයත් ඉතා බලවත්වී නම්, ප්‍රවෘත්ති විපාක දෙන කර්මයෝත් බලවත් වී නම්, ඔහුත් ඔහුට සහාය පිණිස පැමිණි අයත් ප්‍රයෝගයෙහි දක්ෂවී නම් දිට්ඨධම්ම වෙද්‍ය කර්මයන්ට අපරාපයර්‍යායවෙද්‍ය අකුසලයන් කැඳවන්නට

නොසමත් වේ නම්, මනුෂ්‍යඝාතක අකුසල කර්මය නිසා මෙලොවදී ලැබෙන්නාවූ මරණයද වළක්වාගත හැකි වේ.

ප්‍රතිසන්ධි ජනක කර්ම ශක්තිය නිසා උපච්ඡේදක කර්මයන්ගේ විපාක ගෙණදීම සඳහා අවස්ථාව සළසා දීමට දිට්ඨධම්මවේදනීය කර්මය පමණක් නොව වෙනත් කරුණු ද උපකාර වන්නේය.

සතුරෙකු විසින් අවස්ථාව බලා ගසන ලද පිහි පහරකින් හෝ, වෙඩි පහරකින් හෝ, වෙනත් උපක්‍රමයකින් විෂ පෙවීම ආදියෙන් හෝ විපතට පත් කළ කල්හි එම මාරක පහරවැදීමෙන් හෝ, විෂය ශරීරගත වීමෙන් හෝ, ශරීරයෙහි හටගන්නාවූ මහා භූතයන් කිපීමෙන් ඔහුගේ කර්මජ රූප සන්තතියද වෙනස්වී හෘදය වස්තු දුබලතාවය සිදුකරන්නේය. මෙසේ දුබල වූ හෘදයවස්තුව නිශ්‍රයකොට ගෙණ පවත්නා නාම ජීවිතෙන්ද්‍රියද දුර්වල වේ. මේ ක්‍රමයෙන් දුබල වූ නාමරූප ධර්මයන් ඇති කල්හි උපච්ඡේදක කර්මයන්ට ප්‍රස්තාව ලැබී ප්‍රතිසන්ධිජනක කර්මයෙහි විපාකාදන ශක්තිය සිඳලීමෙන් නො කල්හිම මරණය සිදුවන්නේය.

තවද නොසැළකිලි ලෙස හැසිරීමෙන්ද, අපථ්‍යාහාර ගැණීමෙන්ද, බෝවන රෝග ආදියට මුණ පෑමෙන් ද, ලෙඩක් ඇති කල්හි සුදුසු ප්‍රතිකාර කර නොගැණීමෙන්ද, යනාදී නොයෙක් කරුණු හේතුකොට ගෙණ, උපච්ඡේදක කර්මයන්ට, ඔවුන්ගේ විපාක ගෙණදීමට ප්‍රස්තාව ලැබෙන බව දතයුතුයි.

මේ **උපච්ඡේදක මරණය,** ප්‍රෙත ලෝකය, අසුර නිකාය, තිරිසන් අපාය, මනුෂ්‍ය ලෝකය, විනිපාතික අසුරාදී භූමාට දෙවියෝය යන මොවුන් කෙරෙහි ලැබෙන්නේය. තාවතිංසය පටන් නෙවසඤ්ඤානා සඤ්ඤායතනය දක්වා ඇත්තාවූ සියළුම සුගති භූමිය, අවීචි නරකය, උතුරුකුරු දිවයින යන තන්හි උපච්ඡේදක මරණය නොලැබෙන්නේය. **උපච්ඡේදක මරණ,** නොලැබෙන්නාවූ සියලු තැන්හිම **ආයුක්ෂය, කර්මක්ෂය, උභයක්ෂය** යන ත්‍රිවිධ මරණයෝම ලැබෙන්නාහ.

පහන් වැටි, තෙල් දමා දල්වන ලද පහන, තෙල් ගෙවීමෙන්ද පහන් වැටිය ගෙවීමෙන්ද, තෙල් පහන් වැටි දෙදෙනා ගේ ගෙවී,

මෙන්ද, තෙල් පහන්වැටි ඉතිරිව තිබියදී බලවත් පවනින් පහන නිවීමද යන සතරාකාරයෙන් නිවෙන්නේය.

මෙහි තෙල් ගෙවීමෙන් පහන නිවීම, කර්මය ගෙවීමෙන් වන්නාවූ කර්මක්ෂය මරණයට උපමා වෙයි. තෙල් තිබිය දී පහන් වැටිය ගෙවීමෙන් පහන නිවීම, ආයුෂය ගෙවීමෙන් වන්නාවූ ආයුක්ෂය මරණයට උපමා වෙයි. තෙල් සහ පහන්වැටිය ද එකවර ගෙවීමෙන් පහන නිවීම ආයු කර්ම දෙදෙනාගේ ක්ෂය වීමෙන් වන්නාවූ උභයක්ෂය මරණයට උපමා වෙයි. තෙල් පහන් වැටි තිබිය දී බලවත් පවනින් පහන නිවීම, ආයු කර්ම දෙදෙනාම ශෙෂව තිබියදී උපඝාතක කර්මය කරණකොට ගෙණ වන්නාවූ උපච්ඡෙදක කර්මයට උපමා වෙයි.

# මරණාසන්නයෙහි ලැබෙන අරමුණු

එක් සත්ත්වයෙකු පිළිබඳ වූ චිත්ත පරම්පරාව, නිරොධ සමාපත්තියට සමවැද සිටින කාලයෙහි හා අසංඥා තලයෙහි වසන කාලයෙහි හැර, ස්කන්ධ පරිනිර්වාණය දක්වාම අතරක් නැතිවම, නො සිඳී පවතිමින්, ඒ සත්ත්වයා භවයෙන් භවයට පමුණුවමින් අනෙකවිධ සංසාර දුක්ඛයන්ට පමුණුවන්නේය. පටිසන්ධි කෘත්‍ය කරමින් උපදනා ප්‍රතිසන්ධි චිත්තයෙන් ආරම්භ වන භවය, ආයුක්ෂය වශයෙන් හෝ කර්මක්ෂය වශයෙන් හෝ උභයක්ෂය වශයෙන් හෝ උපච්ඡෙදක වශයෙන් හෝ මරණය සිද්ධවන කල්හි පහළ වන්නාවූ හෙවත් චුති කෘත්‍ය කරන්නාවූ චුති සිතින් අවසන් වේ. මේ සිත් දෙකට අතර, වීථි සිත් පහළ නොවන්නාවූ සැම කල්හිම, භවඞ්ග කෘත්‍ය සිද්ධකරන්නාවූ භවඞ්ග සිත්වලින්ම යුක්ත වන්නේය. එක් භවයකට අයිතිවූ ද, වීථිමුක්ත සිත් නම්වූ මේ ප්‍රතිසන්ධි, භවඞ්ග සහ චුති චිත්තයන් විසින් **කම්ම, කම්ම නිමිති, ගති නිමිති** යන ත්‍රිවිධ අරමුණුවලින් එකක්ම ගෙණ පහළවන්නේය. ඒ භවයෙහි පහළවීමත්, පැවැත්මත් එයින් චුතවීමත් සිදුකරන්නාවූ ද, මෙ වීථිමුක්ත චිත්තයන් විසින් ගණු ලබන්නාවූ ද, **කම්ම, කම්ම නිමිති, ගති නිමිති** යන ආරම්මණ යෝ එයට පූර්ව භවයෙහි මරණාසන්න ජවන චිත්තයන් විසින් ගන්නා ලද ආරම්මණයෝ යි. මරණාසන්න චිත්ත වීථියට හමු

වන්නාවූ මේ අරමුණු, මව්, පිය, නෑ මිතුරු, ආචාර්ය උපාධ්‍යාදීන් විසින් හෝ මහානුභාව සම්පන්න දෙවියෙකු හෝ බඹෙකු විසින් හෝ එළවනු ලබන්නක් නොව, කර්මානුභාවයෙන්ම වැටහෙන ආරම්මණයෝ යි. එක් සත්ත්වයෙකුට ඇත්තාවූ ප්‍රතිසන්ධිජනක ශක්තිය ඇති කුසලාකුසල කර්මයන් ගේ සඞ්ඛ්‍යාව අප්‍රමාණය. එයින් අනතුරු අත්බැව්හි ප්‍රතිසන්ධිය ඉපිදවීමට නියත වූ ප්‍රතිසන්ධිජනක කර්මය විසින් ම මේ අරමුණු උපදවනු ලබන බව දතයුතුයි.

## කම්ම අරමුණු

යම් පුද්ගලයෙකු විසින් පූර්වයෙහි කරණ ලද යම් කුසලාකුසල කර්ම පථයන් අතුරෙන් දෙවන ආත්මභාවයෙහි ප්‍රතිසන්ධි විපාක දීමට නියතව ඉදිරිපත් වූ කර්මය මරණාසන්න ජවනයන්ට අරමුණු වන්නේ **කම්ම අරමුණක්** වශයෙනි. අතීතයෙහි කරණ ලද සත්වඝාතන අදත්තාදන, කාමමිථ්‍යාචාර ආදී වූ යම් අකුසල කර්මයක් යද්ගරුක කර්මාදී වශයෙන් මරණාසන්න කාලයේදී විපාක ගෙණදීම සඳහා ඉදිරියට පැමිණියේ නම්, කර්මය සිද්ධ කළාවූ අවස්ථාවේ ඇතිවූවක් මෙන්ම එම අකුසල කර්මය අභිනව කරණයක් මෙන් මරණාසන්නයේ දි අරමුණු වෙමින් ඒ අවස්ථාවේදී ඇති වූ අකුසල් සිත් හා සමාන ජවන් සිත් පසක් මරණාසන්න ජවන් වශයෙන් චුති චිත්තයට පළමුව එම අවසාන චිත්ත වීථියෙහි පහළ වන්නේය. ඇතැම් විටෙක මේ අරමුණම මරණ අවස්ථාවට දින කිපයකට ප්‍රථමයෙන් වූවත් වරින්වර පහළ වන්නට ද බැරි කමක් නැත. මෙසේ අකුසල කර්මයක්, කම්ම අරමුණක් වශයෙන් පහළවන කල්හි දෙළොස් අකුසල් චිත්තයන් අතුරෙන් උද්ධච්චසම්ප්‍රයුක්ත සිත හැර ඉතිරි අකුසල් සිත් එකොළොසින් එකක් මරණාසන්න ජවන් වශයෙන් උපදී.

එමෙන්ම දන, සීල, භාවනාදී කුසල කර්මපථයන් අතුරෙන් යම් කුසල කර්මයක් නියත වශයෙන් අනතුරු අත්බැව්හි ප්‍රතිසන්ධි විපාක දීමට ඉදිරිපත් වීනම් එම කුසලය කරන්නාවූ කාලයේදී ඇතිවූ කුසල චිත්තයන්ට සමාන වූ සිත් මරණාසන්න ජවන් වශයෙන් උපදී. එසේ උපදින්නාවූ කුසල්, කාමාවචර මහා කුසල් සිත් අටෙන් එකක් ම විය යුතුයි.

රූපාවචර අරූපාවචර ප්‍රතිසන්ධිය ලබන්නාවූ පුද්ගලයන් හට කර්මය අරමුණු නොවන්නේය.

කර්මය වනාහි මනොද්වාරයටම වැටහෙන නාම ධර්මයකි. එය මරණයට පූර්වයෙහි දී කරණලද්දක් බැවින් අතීත අරමුණක්මය. වත්මන් හෝ අනාගත නොවේ.

## කම්ම නිමිත්ත

කුසලාකුසල කර්මයක් සිදුකරන්නාවූ කාලයෙහි ප්‍රධාන වශයෙන් හෝ අප්‍රධාන වශයෙන් හෝ උපකාර වූ යමක් මරණාසන්න කාලයේදී මරණාසන්න ජවනයන්ට අරමුණු වේ නම් එයට **කම්ම නිමිත්ත** යයි කියනු ලැබේ. අතීතයෙහි ප්‍රාණඝාතාදි යම් අකුසල කර්මයක් කිරීමේදී, යම් කිසි සත්ත්වයෙකු බැඳ තබා, දඬු මුගුරු ආයුධ ආදියකින් තලා පෙළා මැරුයේ නම්, මරණාසන්නයේදී මරණු ලැබූ ඒ සත්ත්වයා හෝ සත්ත්ව ඝාතන කර්මයට උපකාර වූ දඬු මුගුරු ආදිය හෝ **කම්ම නිමිත්ත** වශයෙන් වැටහෙන්නේය.

එමෙන්ම බුදුන් වැඳිම්, දන් දීම්, බණ ඇසීම් ආදි වූ කුසල කර්මයක් ප්‍රතිසන්ධි විපාක ගෙණදීමට එළඹියේ නම්, ඒ කුසල කර්මය සිදු කිරීමට උපකාර වූ බුද්ධ ප්‍රතිමා, වෙහෙර, විහාර, බෝරුක් ආදිය හෝ, මල් පහන්, සුවඳ දුම්, දනවස්තු ආදිය හෝ **කම්ම නිමිති** වශයෙන් මරණාසන්න ජවනයන්ට අරමුණු වන්නේය.

මේ කර්ම නිමිති, අතීත මෙන්ම වර්තමාන ද විය හැකි. එසේම ෂට් ද්වාරයටම අරමුණු වෙත්. වර්තමාන වශයෙන් අරමුණු වන කල්හි මරණාසන්නයේදී ලද්දක් වශයෙන්ම මනොද්වාරයට වැටහෙන්නේය.

මරණාසන්නයේ දි බුද්ධ ප්‍රතිමා, දන පිරිකර, මල් පහන් යනාදිය චක්ඛුද්වාරයට ද, ධර්මදෙශනා, පින් පොත් කියවීම, පිරිත් දෙසීම් ආදිය සොතද්වාරයටද, පූජා පිණිස සකස් කළ සුවඳ දුම් ආදිය අඝ්‍රාණය කරණ කල්හි ඝාණද්වාරයටද දිවගා බලා රස දන වස්තුවක් පිදීමට තැන් කරණ කල්හි ජිව්හාද්වාරයටද, පිරිකර අත

ගැසීම් ආදියෙහි දී කායද්වාරයටද, ඒ ඒ මොහොතේ දී ලත් යම් කිසි අරමුණක් මනොද්වාරයට ද, වර්තමාන අරමුණු වශයෙන් වැට හෙන්නේය. අතීත රූපාදී කර්ම නිමිති අරමුණු වන්නේ මනොද් වාරයට පමණය. අකුසල පක්ෂයෙහි ද මෙසේමය.

රූපාවචර අරූපාවචර ප්‍රතිසන්ධිය ලබන්නාවූ පුද්ගලයන්ටද මරණාසන්නයේදී අරමුණු වන්නේ කම්ම නිමිති පමණය. රූපා වචර ධ්‍යාන ලාභීන්ට මරණාසන්නයේදී ඔහුගේ ධ්‍යානය වැඩීමට පරිකර්ම වශයෙන් උපකාර වූ කසිණා දී වූ ප්‍රඥප්ති අරමුණු, කම්ම නිමිති වශයෙන් වැටහෙන්නේය.

අරූපාවචර ධ්‍යානලාභීන් හට ඒ ඒ ධ්‍යානයන්ට උපකාර වූ ප්‍රඥප්ති ආලම්බණ හෝ මහග්ගත ආලම්බණ හෝ කම්ම නිමිති වශයෙන් අරමුණු වෙත්.

## ගති නිමිත්ත

යම් කුසලාකුසල ප්‍රතිසන්ධිජනක කර්මයක් හේතුකොට ගෙණ මරණින් මතු යම් භවයක ඉපදීමට නියතව සිටිනා කල්හි, ඒ ලෝකය පිළිබඳ වූ යම් කිසි අරමුණක් මරණාසන්න ජවනයන්ට අරමුණු වේ නම් එයට **ගති නිමිත්ත** යයි කියනු ලැබේ.

අකුසල කර්මානුභාවයෙන් නිරයෙහි උපදනා පුද්ගලයන් හට නිරය ගිනි, නිරයපාල, කාළසුනඛාදීහු ද තිරිසන් යෝනියෙහි හෝ ප්‍රේත යෝනියෙහි හෝ උපදනා සත්ත්වයන්ට, වන, පර්වත ගල්ගුහා අසූචි වල ආදියද, මිනිස් ලොව පිළිසිඳ ගන්නා සත්ත්වයන් හට මාතෘකුක්ෂි වර්ණ කම්බිලි යාන වාහනාදිය ද, දෙව්ලොව උපදනා පුද්ගලයන් හට දෙව්ලොව, දෙව් විමන්, දෙව් රුක් දිව්‍ය සළු, දිව්‍ය මල්, දිව්‍ය සුවඳ, ආදිය ද ගති නිමිති වශයෙන් අරමුණු වන්නේය.

මේ ගති නිමිත්ත ෂට් ද්වාරයටම අරමුණු විය හැකියි. දිව්‍ය රථ, දිව්‍ය මල්, දෙවඟනන් ආදීහු චක්ෂුද්වාරයට ද, දිව්‍ය ගීතාදිය සෝතද්වාරයටද, අකුසල පක්ෂයෙහි ද, නිරා ගිනිආදිය කායද්වාර

යට ද, ගති නිමිති වශයෙන් වැටහේ. ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ ගති,නිමිති මනොද්වාරයට පමණක් වැටහෙන බව කියති.

රහතන් වහන්සේගේ පරිනිර්වාණයට පූර්වයෙහි හටගන්නා අවසාන චිත්ත වීථියෙහි ජවනයන් විසින් කම්ම, කම්ම නිමිති, ගති නිමිති යන ආලම්බණයන් අරමුණු නොකරනු ලැබේ. රහතන් වහන්සේගේ අන්තිම ජවනයන්ට අරමුණු වන්නේ, නාමරූප ධර්මයක් හෝ, කසිණ නිමිත්තක් හෝ ධ්‍යානාඞ්ගයක් හෝ මාර්ගාඞ්ගයෙක්මය. එයට අනතුරුව පහළවන්නාවූ චුති චිත්තය වනාහි එම අන්තිම භවයෙහිදී පටිසන්ධි, භවඞ්ග චිත්තයන්ට අරමුණු වූ කම්ම, කම්ම නිමිති, ගති නිමිති යන අරමුණු වලින් එකක් ගෙණ පහළ වන්නාවූ චිත්තයකි.

පටිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙන් හටගත් මේ භවයට අයත් නාමරූප සන්තතිය චුති චිත්තයාගේ භඞ්ගක්ෂණයෙන් අවසන් වූවත්, භව තෘෂ්ණාව නොසිඳී පවත්නා නෙක් සසර කෙළවර නොවන්නේය. එහෙයින් චුති චිත්තයට අනතුරුව අතරක් නොමැතිව අන්‍ය භවයෙක්හි ප්‍රතිසන්ධිය ලබන්නේමය. අකුසල ප්‍රතිසන්ධි ජනක කර්මයක්හුගේ විපාක වශයෙන් සතර අපායෙහි ප්‍රතිසන්ධිය ලබන්නාවූ කල්හි පූර්ව භවයට අයත් චුති චිත්තයට අනතුරුව අකුසල විපාක සන්තීරණ සිතින් දෙවන භවයෙහි ප්‍රතිසන්ධිය ලබන්නේය. කාමාවචර කුසල කර්මය කින් ප්‍රතිසන්ධි විපාක ගෙණදෙන්නාවූ කල්හි සප්තකාම සුගතියෙහි කාමාවචර මහා විපාක සිත් අටෙන් හෝ අහේතුක කුසල විපාක සන්තීරණ සිතින් හෝ ප්‍රතිසන්ධිය ලබා දෙන්නේය. රූපාවචර අරූපාවචර කුසල කර්මයක් හේතුකොට ගෙණ රූපාරූප භවයන්හි පිළිසිඳ ගැණීම රූපාවචර අරූපාවචර විපාක සිත් නවයෙන් සිදු වන්නේය.

පඤ්චවෝකාර භවයෙහි හෙවත් කාම භවයෙහි හා අසංඥ තලය හැර ඉතිරි රූප භවයන්හි **සවත්ථුකව** හෙවත් හෘදයවස්තු රූපය ඇසුරු කොටගෙණ ප්‍රතිසන්ධි චිත්ත පහළවේ.

චතුවොකාර භවයෙහි හෙවත් අරූප තලයන්හි රූප හටනොගන්නා හෙයින් පටිසන්ධි චිත්තය හටගන්නේ **අවත්ථුකවය** හෙවත් වස්තු රූපයක් ඇසුරුකොට නො ගෙණය.

අසංඥ තලයෙහි රූපස්කන්ධයෙන් පමණක් ප්‍රතිසන්ධිය ලබන හෙයින්, නාමස්කන්ධයට අයත් ප්‍රතිසන්ධි විපාක සිතක් පහළ නොවන්නේය.

මෙසේ **සවත්ථුකව** හෝ **අවත්ථුකව** හෝ අනතුරු භවයෙහි පහළවන්නාවූ පටිසන්ධි චිත්තය, එයට පූර්ව භවයෙහි මරණාසන්න චිත්ත වීථියෙහි මරණාසන්න ජවනයන් විසින් ගන්නා ලද කම්ම, කම්ම නිමිති, ගති නිමිති යන ත්‍රිවිධ අරමුණු අතුරෙන් යම් අරමුණක් වේද, එම අරමුණම ගෙණ පහළ වන්නේය. පූර්ව භවයෙහි මරණාසන්න ජවනයන් විසින් අකුසල කර්මයක් අරමුණු කෙළේ වීනම්, අනතුරු භවයෙහි ප්‍රතිසන්ධි සිතත් එම අකුසල කර්මයම අරමුණු කරමින් උපදී. අකුසල කර්ම නිමිත්තක් හෝ අකුසල ගති නිමිත්තක් හෝ අරමුණු කෙළේ වීනම්, ප්‍රතිසන්ධි චිත්තයද එම අකුසල කම්ම නිමිත්ත හෝ අකුසල ගති නිමිත්ත හෝ අරමුණු කරන්නේය. කුසල පක්ෂයෙහි ද එසේමය. මේ පටි සන්ධි චිත්තයාගේ හෙවත් නාමස්කන්ධයාගේ පහළවීමත් සමගම, එනම් එහි උත්පාදක්ෂණයේ දී ම, අළුත් භවයට අයත් කර්මජ රූප සන්තතිය එහි පාලනය සඳහා රූප ජීවිතේන්ද්‍රියයත් සමඟම, එම කර්මානු භාවයෙන්ම පහළ වන්නේය. පූර්ව භවයට අයත්, නාම ධර්මයක්වත්, රූප ධර්මයක්වත් අනතුරු භවයට ගෙණ නො යන බවත්, එම සත්ත්ව සන්තානයෙහි රැස් කරණ ලද කුසලා කුසල කර්මයක්හුගේ විපාක ශක්තියෙන්ම දෙවන භවයෙහි නාම රූප ධර්මයන් පහළ කරවන බවත් දත යුතුයි.

මෙසේ අළුත් භවයෙහි පටිසන්ධි චිත්තය ඉපිද නිරුද්ධ වූ කල්හි, එයට අනතුරුව එම පටිසන්ධි චිත්තය විසින් ගන්නා ලද අරමුණම ගෙණ භවඞ්ග චිත්තය පහළ වන්නේය. මිනිස් ලොව මව් කුස උපදනා පුද්ගලයන්ට ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව භවංග සිත් දහසයක් පමණ ඉපිද නිරුද්ධ වූ කල්හි මනොද්වාරාවජ්ජන සිතක් හා භවනිකාන්ති ලොභ ජවන් පයකින් යුක්තවූ චිත්ත

වීථියක් ඉපිද, එයට අනතුරුව භවංග සිත් උපදී. යම්තාක් කල් වීථී සිත් නූපදිද් ද, ඒතාක් කල් භවඞ්ග සන්තතිය ජලප්‍රවාහයක් මෙන් නොබිඳි පවත්නේය. මව් කුසින් නික්මුණු කල්හි පළමු කොට සූර්‍ය්‍යාලෝකය හෝ පහන් ආලෝකය ආදිය හෝ, දක්මෙන් චක්ෂුර්විඥනාදී වීථී සිත් ඉපදීමට පටන් ගනිති. එතැන් සිට ඒ සත්ත්වයාගේ ඉන්ද්‍රියයන් වැඩීම කරණකොටගෙණ භවඞ්ග චිත්ත පරම්පරාව ද ක්‍රමයෙන් අඩු වී රූපාදී ආරම්මණයන් එල්බ ගෙණ වීථී සිත් උපදී. වයස් ගත වන්නාවූ කල්හිද ඉන්ද්‍රියයන් ගේ දුර්වලත්වය නිසා නැවතත් භවඞ්ග සිත් වැඩි වැඩිව හටගනී. මෙසේ පැවත ආවාවූ මේ භවයට අයත් චිත්ත සන්තතිය භවඞ්ග සිතෙහි අරමුණම ගෙණ පහළවන්නාවූ චුති චිත්තයෙන් අවසන් වේ. එකම භවයෙක්හි පහළ වන්නාවූ පටිසන්ධි, භවඞ්ග චුති චිත්තයන්ගේ අරමුණ එකක්මය.

මෙතෙකින් පරිච්ඡෙද පසකින් යුත් අභිධර්මාර්ථප්‍රදීපිකායෙහි ප්‍රථම කාණ්ඩය නිමි.

"Wherever the Buddha's teachings have flourished,
either in cities or countrysides,
people would gain inconceivable benefits.
The land and pepole would be enveloped in peace.
The sun and moon will shine clear and bright.
Wind and rain would appear accordingly,
and there will be no disasters.
Nations would be prosperous
and there would be no use for soldiers or weapons.
People would abide by morality and accord with laws.
They would be courteous and humble,
and everyone would be content without injustices.
There would be no thefts or violence.
The strong would not dominate the weak
and everyone would get their fair share."

**※ THE BUDDHA SPEAKS OF THE INFINITE LIFE SUTRA OF ADORNMENT, PURITY, EQUALITY AND ENLIGHTENMENT OF THE MAHAYANA SCHOOL ※**

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

*** The Vows of Samantabhadra ***

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

*** The Vows of Samantabhadra Avatamsaka Sutra ***

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡文：ABHIDHARMARTHA PRADIPIKA Vol. I,
阿毗達摩 第一冊》
財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org
**This book is strictly for free distribution, it is not for sale.**
නොමිලයේ බෙදාදීම පිණිසයි.
Printed in Taiwan
1,500 copies; October 2015
SR041 - 13512